මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# දීඝ නිකාය

# 1

ධර්ම විනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පෑලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රී සුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

අම්බලම්ගොඩ සුනන්දාරාම මහා විහාරස්ථ විද්‍යාලෝක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්ම භාරතීශ්වර ධර්මකීර්ති ශ්‍රී පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද අමරපුර නිකායේ අධිකරණ නායක මහාස්ථවිරයන් වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

වැලිතර අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය ආර්යරත්න පේරුකාන මහතා

# දීඝ නිකාය

## 1

ධර්ම විනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
## ඒ. පී. ද සොයිසා මහතා
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1957
දෙවැනි මුද්‍රණය - 2012

**ත්‍රිපිටකය**
**දීඝ නිකාය 1**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.　http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක ‘පාළි’ නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඥාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2012 සැප්තැම්බර්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන

පිට

1. බ්‍රහ්මජාල සූත්‍රය 1
2. සාමඤ්ඤඵල සූත්‍රය 61
3. අම්බට්ඨ සූත්‍රය 115
4. සොණදණ්ඩ සූත්‍රය 170
5. කූටදන්ත සූත්‍රය 215
6. මහාලි සූත්‍රය 274
7. ජාලිය සූත්‍රය 304
8. කස්සප සීහනාද සූත්‍රය 323
9. පොට්ඨපාද සූත්‍රය 374
10. සුභ සූත්‍රය 421

## සංඥාපනය

ත්‍රිපිටක පාලි ධර්මය සිංහල භාෂාවෙන් ලියා නැති වීම මහත් පාඩුවක්සේ පෙනෙන බැවින් ඒ පාඩුව පිරිමැසීම සඳහා මේ ත්‍රිපිටක ධර්ම පොත් පෙළ ධර්ම විනයාදිය උගත් පණ්ඩිත මහා ස්ථවිරයන් වහන්සේලාගේත් ආධාර ඇතුව පටන් ගත්තෙමි. අපේ අදහස නම් බුද්ධ ධර්මය සියල්ලන්හට දැනගැනීමට පහසුවන ලෙස ලිහිල් භාෂාවෙන් ලිවීමට උත්සාහ කිරීම වේ. ත්‍රිපිටක ධර්මය මොනයම් භාෂාවකින් හෝ කොපමණ පරිවර්තන ගණනකින් පිටවුණත් එය සැලකිය යුතු උසස් ධර්ම ප්‍රචාරක ක්‍රියා මාර්ගයක් බව සඳහන් කරමි. බු:ව: 882 දී බුද්ධදාස රජ කාලයේදී මහා ධර්මකථික නම් ස්ථවිරයන් වහන්සේ විසින් සූත්‍ර ධර්ම සිංහල භාෂාවට නගා ලියා තිබෙන බව පෙනේ. බුද්ධ ධර්මය පුරාණ කාලයෙහි සංස්කෘත, බුරුම, සියම්, ටිබෙට්, චීන, ජපන්, කොරියන් ආදී භාෂාවන්ට නගා තිබේ. මෑත කාලයේදී ඉංග්‍රීසි, ජර්මන් සහ ප්‍රංශ භාෂාවන්ට නගා කොටස් වශයෙන් ප්‍රසිද්ධ කර තිබේ. මුළු ත්‍රිපිටක ධර්මය සිංහලට නගා ප්‍රසිද්ධ කිරීම අපේ බලාපොරොත්තුවයි, මේ වර සූත්‍ර පිටකයට අයත් දීඝනිකායේ කොටසක් මුද්‍රණය කර අවසන් කෙළෙමි. අනික් කොටස්ද මෙසේම නොකඩවා මුද්‍රණය කරවාගෙන යන බව දන්වමි. අපේ මේ බැරෑරුම් කටයුත්තට උපකාර වශයෙන් පොත් ගැනීමට බැඳීසිටින සාමාජික පින්වතුන්ට අපගේ අවංක ස්තුතිය පුද කරමි.

දීඝ නිකායේ බොහෝවිට එකම වාක්‍ය ඒ හැටියටම නොයෙක් තැන්වල සඳහන්වන බව පෙනේ, ඒ එසේ වීමට හේතුව කුමක්දයත්, (1) මෙය එකල පැවති ධර්ම දේශනා ක්‍රමයකි. (2) එකල පණ්ඩිතයන්ගේ වාද විවාදයන්ට ඇතුළත් තර්ක විතර්ක ක්‍රමයක් බවද පෙනේ. (3) යමක් දෙවරක් හෝ තුන්වරක් කීම එය සැලකිය යුතු බව පෙන්වීමේ යෙදුමක්ද වෙයි. ආමෙණ්ඩිත ප්‍රයෝග නම් යෙදුමෙහිද කීප වරක් කීම සිරිතයි. (4) කරුණක් කී පමණින් හිතේ තබා ගැනීමට පුරුදු වූ කාලයක ඒ ඒ කියන දෙයින් සුලු කොටසක් වත් කියන ක්‍රමයක්ද තිබුණු බව සිතිය හැකිය. අද දින පවා ඔප්පු තිරප්පු ආදි සැලකිය යුතු ලියකියවිලිවල නම් මායිම් ආදී විස්තර නොයෙක් වාරයක් සඳහන් කිරීම සිරිතක්ව පවතී.

මේ පොත සඳහා සියලු ආකාරයෙන්ම අපට ආධාරකාරීවූ ආචාර්ය ආයර්රත්න රේරුකාන මහත්මයාටද, ඒ. ඇස්. බී. ඩබ්ලිව්. නානායක්කාර මහත්මයාටද අප අවංක ස්තුතිය සඳහන් කරමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

3-10-58

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# දීඝ නිකාය

## 1 බ්‍රහ්මජාල සූත්‍රය

**නමොතසස භගවතො අරහතො සම්මා සම්බුධසස.**

1 මා විසින් මෙසේ අසනලදී. (නොහොත් මගේ ඇසීම මෙලෙසයි.) එක් කාලයකදී භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවරට හා නාලන්දා නුවරටත් අතර මහපාරට පන්සියයක් පමණවූ බොහෝ භික්ෂු සංඝයා හා සමග (වැඩියෝය.) පැමිණියෝය. සුප්පිය නම් පිරිවැජියාද (ශාසනයෙන් පිටත් පැවිද්දාද) බඹදත් නම් තරුණ අතවැසියා සමග රජගහ නුවරට හා නාලන්දා නුවරටත් අතර මහ පාරට පැමිණියේය. එහිදී සුප්පිය පිරිවැජියා නොයෙක් අයුරෙන් බුදුන් කෙරෙහි අගුණ කියයි. ධර්මය කෙරෙහි අගුණ කියයි. සංඝයා කෙරෙහි අගුණ කියයි. සුප්පිය නම් පිරිවැජියාගේ අතවැසියාවූ බඹදත් නම් මානවකයා නොයෙක් කරුණෙන් (ආකාරයෙන්) බුදුන්ගේ ගුණ කියයි, ධර්මයේ ගුණ කියයි, සංඝයාගේ ගුණ කියයි. මෙසේ මේ කරුණෙහි ඒ ඇදුරු-අතවැසි දෙදෙන ඔවුනොවුන් අතර සම්පූර්ණයෙන් විරුද්ධ කථා ඇත්තාහු භාග්‍යවතුන් වහන්සේගේද භික්ෂු සංඝයාගේද පසුපස්සේම ලුහුබැන්දෝය.

2 එවිට භාග්‍යවතුන් වහන්සේ අම්බලට්ඨිකා උයනෙහි රජුන්ගේ විඩා හැරීමාදියට පිළියෙළවූ රාජාගාරක නම් ශාලාවෙහි එක් රාත්‍රියක් විසීමට භික්ෂු සංඝයා සමග පැමිණියෝය. සුප්පිය නම් පිරිවැජියාද අම්බලට්ඨිකා උයනෙහි රාජාගාරක නම් ශාලාවෙහි එක් රාත්‍රියක් විසීමට බ්‍රහ්මදත්ත නම් තරුණ අතවැසි මානවකයා සමග පැමිණියේය. එහිදීද සුප්පිය පිරිවැජි නොයෙක් ආකාරයෙන් බුදුන් කෙරෙහි අගුණ කියයි. ධර්මය කෙරෙහි අගුණ කියයි. සංඝයා කෙරෙහි අගුණ කියයි. සුප්පිය

පිරිවැජියාගේ අතවැසි බඹදත් නම් මාණවකයා නොයෙක් ආකාරයෙන් බුදුගුණ කියයි. දහම් ගුණ කියයි. සඟ ගුණ කියයි. මෙසේ මේ කාරණයෙහි ඒ ගුරුවරයා සහ ඔහුගේ අතවැසියාද යන දෙදෙනා ඔවුනොවුන්ට හාත්පසින්ම විරුද්ධ මත ඇත්තෝව භාග්‍යවතුන් වහන්සේගේද, භික්ෂු සංඝයාගේද පසුපස්සේම ලුහුබැන්දෝය.

3 එකල රෑ පාන්දරින් මණ්ඩලමාල නම් රැස්වීම් ශාලාවෙහි එක්ව රැස්ව වැඩසිටි බොහෝ භික්ෂූන් අතරෙහි මේ කථා ධර්මය පහළවිය. "ඇවැත්නි, (පින්වත් භික්ෂුවරුනි) සියල්ල දන්නා භගවත් නම්වූ සියල්ල දක්නා අර්හත් නම්වූ සම්‍යක් සම්බුදුන් වහන්සේ විසින් සත්වයන්ගේ නොයෙක් අදහස් ඇති බව යම් පමණ හොඳින් අවබොධ කරණ ලද්දේද (අවබොධය) පුදුමය. මේ සුප්පිය පිරිවැජි නොයෙක් ආකාරයෙන් බුදුන්හට දොස් පවරයි, ධර්මයට දොස් පවරයි, සංඝයාහට දොස් පවරයි. සුප්පිය නම් පිරිවැජියාගේ අතවැසිවූ බ්‍රහ්මදත්තනම් මානවකයා නොයෙක් ආකාරයෙන් බුදුගුණ කියයි. දහම් ගුණ කියයි, සඟ ගුණකියයි මෙසේ මේ ගුරුවර අතවැසි දෙදෙන ඔවුනොවුන්ට සම්පූර්ණ විරුද්ධ මත ඇත්තෝ භාග්‍යවතුන් වහන්සේගේද භික්ෂු සංඝයාගේද පසුපස්සේ ලුහුබැන්දෝ වෙත්."

4 එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ගේ මේ කථාව දැන රැස්වී වැඩහිඳි ශාලාව යම් තැනෙකද එතනට පැමිණියෝය. පැමිණ පැණවූ ආසනයෙහි වැඩහුන්නෝය. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ (මෙසේ) භික්ෂූන්ගෙන් ඇසුවෝය. "මහණෙනි, දැන් මොනයම් කථාවකින් යුක්තව සිටියාහුද? තොපගේ මොනයම් කථාවක් පටන්ගෙන සිටියහුදැ"යි ඇසූහ. මෙසේ ඇසූ කල ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්නුවෝය. "ස්වාමීනි, රෑ පාන්දර මේ රැස්වීම් ශාලාවෙහි රැස්ව වැඩහුන් අපට මේ කථා ධර්මය පහළ විය. සියල්ල දන්නා සියල්ල දක්නා ඒ අර්හත් සම්මා සම්බුදුවූ භාග්‍යවතුන් වහන්සේ විසින් සත්ත්වයන්ගේ නොයෙක් නොයෙක් කල්පනා අදහස් ඇති බව යම් පමණ යහපත්සේ අවබොධ කරණ ලද්දේද, මේ වැටහීම පුදුමය. පෙර නුවූ දෙයක් වන්නේය. මේ සුප්පිය පිරිවැජියා

නොයෙක් ආකාරයෙන් බුදුරජුන්ට දොස් පවරයි. ධර්මයට දොස් පවරයි. සංඝයාට දොස් පවරයි. සුප්පිය නම් පිරිවැජියාගේ අතවැසිවූ බ්‍රහ්මදත්ත නම් මානවකයා නොයෙක් ආකාරයෙන් බුදුගුණ කියයි දහම් ගුණ කියයි, සඟ ගුණ කියයි. මෙසේ ගුරුවර අතවැසි දෙදෙනා ඔවුනොවුන්ට සම්පූර්ණ විරුද්ධ මත ඇත්තෝ භාග්‍යවතුන් වහන්සේද භික්ෂු සංඝයාද පසුපස්සේ ලුහුබැන්දෝ වෙත්. ස්වාමීන්වහන්ස, අපගේ මේ අතුරු කථාව පටන් ගත්තාය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පැමිණියෝය”යි කීහ.

**5** “මහණෙනි, අනුන් මාගේ හෝ නුගුණ කියද්ද, ධර්මය ගැන හෝ නුගුණ කියද්ද, සංඝයාගේ හෝ නුගුණ කියද්ද, ඒ නුගුණයෙහි තොප විසින් කෝප නොකට යුත්තේය. අමනාප නොඉපදවිය යුත්තේය, සිත් අසතුටු නොකට යුත්තේය. මහණෙනි, අනුන් මාගේ හෝ නුගුණ කියද්ද, ධර්මයේ හෝ නුගුණ කියද්ද, සංඝයාගේ හෝ නුගුණ කියද්ද, ඒ නුගුණ කියන්නන් කෙරෙහි ඉදින් තෙපි කිපෙන්නාහු නම් හෝ නොසතුටු වන්නාහු නම් එයින් තොපටම අන්තරාය වන්නේය. මහණෙනි, අනුන් මාගේ හෝ නුගුණ කියද්ද, ධර්මයේ හෝ නුගුණ කියද්ද, සංඝයාගේ හෝ නුගුණ කියද්ද, තෙපි කිපෙන්නාහු නම් හෝ නොසතුටු වන්නාහු නම් කිමෙක්ද තෙපි අනුන්ගේ සුභසිද්ධිය අසුභසිද්ධිය දන්නහුද?”

**6** “ස්වාමීනි, එසේ නැත්මය. (ඒ දැනීම නැත.)” මහණෙනි, අනුන් මාගේ හෝ නුගුණ කියද්ද, ධර්මයේ හෝ නුගුණ කියද්ද, සංඝයාගේ හෝ නුගුණ කියද්ද, එවිට තොප විසින් මෙය, මේ හෙයින් (අභූත) වෙන්ට නුපුළුවන. මෙය මේ නිසා අසත්‍යය. මෙය අප කෙරෙහි නැත, මෙය අප කෙරෙහි (අවිද්‍යමානය) දකින්නට නැත. බොරුව බොරුව මෙන් එළිදරව් කළ යුතුය.

“මහණෙනි, අනුන් මාගේ හෝ ගුණ කියද්ද, ධර්මයේ හෝ ගුණ කියද්ද, සංඝයාගේ හෝ ගුණ කියද්ද, ඒ ගුණ කීමෙහි තොප විසින් ප්‍රීති නොකට යුත්තේය. සිත් අසතුටු නොකට යුත්තේය. සිත්හි උඩඟු බව නොකට යුත්තේය. මහණෙනි, අනුන්

මාගේ හෝ ගුණ කියද්දද, ධර්මයේ හෝ ගුණ කියද්දද, සංඝයාගේ හෝ ගුණ කියද්දද තෙපි ඒ ගුණ කියන්නවුන් කෙරෙහි ඉදින් සතුටු වන්නාහු නම් සිත් අසතුටු වන්නෝවූ නම් උඩඟු වන්නෝවූ නම් තොපට එයින් අවැඩ (අනතුරු) වන්නේය

7 "මහණෙනි, අනුන් මාගේ හෝ ගුණ කියද්දද, ධර්මයේ හෝ ගුණ කියද්දද, සංඝයාගේ හෝ ගුණ කියද්දද, එවිට තොප විසින් ඒ කරුණ පිළිබඳව මෙය මේ හෙයින් (විද්‍යමානය) පැහැදිලිය. මෙය මේ නිසා සත්‍යය. මේ (ගුණය) අපකෙරෙහි ඇත්තේය. මෙය අප කෙරෙහි දකින්ට ලැබේ. (විද්‍යමානය) යයි ඇත්ත ඇත්ත මෙන් පහදා දියයුත්තේය. (ප්‍රතිඥා කළ යුත්තේයි.)

"මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා යම් කරුණකින් එය කියානම් එය ස්වල්ප මාත්‍රයකි. (සුළු දෙයකි) ලාමක මාත්‍රයකි, (සුළු ස්වභා ගතියෙකි,) ශීල මාත්‍රයෙකි, (අඩු දෙයකි) එසේ ස්වල්ප මාත්‍රවූ ලාමක මාත්‍රවූ ශීල මාත්‍රවූ ගුණ කියන පෘථග්ජනයෙක් යම් කරුණකින් තථාගතයන්ගේ ගුණ කියා නම් කුමක් කියාද?

8 "ශ්‍රමණ භවත් ගෞතමයෝ ප්‍රාණයට හිංසා කිරීම (ප්‍රාණඝාතය) අත්හැර දමා ප්‍රාණයකට හිංසා කිරීමෙන් සම්පූර්ණයෙන් වැළකුණාහ. (හිංසා කිරීමට) දඬු මුගුරු නොමැත්තෙක් වේ. පාපයට ලජ්ජා ඇත්තෙකි. දයාවන්ත බවට පැමිණියෙකි. සියලු සත්වයන් කෙරෙහි අනුකම්පාවෙන් වාසය කෙරෙයි. මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයෙක් මෙසේ හෝ කියන්නේය. 'ශ්‍රමණ භවත් ගෞතමයෝ (අන්සතු) නුදුන්දේ ගැනීම අත්හැරදමා නුදුන් දේ ගැනීමෙන් වැළකුණාහ. දුන් දෙයම ගන්නා ස්වභාව ඇත්තාහ. දුන් දෙය ගැනම කැමති වන්නෝය. වංචා රහිතව පිරිසිදු සිතින් වාසය කරන්නාහ'යි. මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන කෙලෙස් සහිත ජනයෙක් මෙසේ හෝ කියන්නේය.

"මහණෙනි, ශ්‍රමණ භවත් ගෞතමයෝ අබ්‍රහ්මචර්යාව (කාමසම්පත් දුරුකොට) කාම සැපයෙන් වැළකුණෝය.

දුරාචාරයයි කියන ලද කාම සම්පතෙන් ඉතාමත් ඈත්වූවෙකි. ස්ත්‍රීන් පාවා ගැනීම් ආදී නොහොබිනා සිරිතෙන් (ග්‍රාම්‍ය ධර්මයෙන්) වෙන්වූවෝය'යි මෙසේ හෝ කෙලෙස් සහිත ජනයෙක් තථාගතයන්ගේ ගුණ කියන්නේය.

**9** "ශ්‍රමණ ගෞතමයෝ බොරුකීමෙන් (මුසාවාදයෙන්) වැළකුණෝය. සත්‍යයම කියති. සත්‍යයම ගළපා කියති. ස්ථිරවූ ඇදහියයුතු කථා ඇත්තෝය. ලෝකයා මුළාකරන විෂම වාද නොකරන්නෝය. මහණෙනි, මෙසේ හෝ කෙලෙස් සහිත ජනයෙක් තථාගතයන්ගේ ගුණ කියන්නේය.

"ශ්‍රමණ ගෞතමයෝ පිසුනු බස් නමැති කේලාම් කීම අත්හැර කේලාම් කීමෙන් වැළකුණෝය. මෙතනින් අසා මොවුන්ගේ භෙදය පිණිස එතැන්හි නොකියයි. එතැනින් අසා ඔවුන්ගේ භෙදය පිණිස මොවුන්ට නොකියයි. මෙසේ බිඳුනවුන් ගළපන ස්වභාව ඇත්තාහ.

"මෙසේ භින්නවූවන් සම්බන්ධව හෝ ගළපන ස්වභාව ඇත්තෝය. සමගිවූවන්හට අනුබල දෙන්නෝය. සමගිවූවන් කෙරෙහි ඇලුනාහ (සමගි තන්හි වාසය ඇත්තෝය.) සමගි වූවන් කෙරෙහි සතුටු වෙති. සමගි කරණ වචන කියති.' මහණෙනි තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයෙක් මෙසේ හෝ කියන්නේය.

"ශ්‍රමණ ගෞතමයෝ පරුෂ වචනය අත්හැර පරුෂ වචනයෙන් වැළැක්කෝය. යම් වචනයක් නිදොස්ද, කණට සැපද පෙම් වඩාද, සිත් සතුටු කරයිද, මිහිරිද, බොහෝ දෙනාට ප්‍රියවේද, බොහෝදෙනාගේ හිත් ප්‍රිය කරන්නේද, එවැනි වචන කියන්නේය' මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ කියයි.

"ශ්‍රමණ භවත් ගෞතමයෝ සම්ඵප්‍රලාපය (වැඩ නැති කථා) අත්හැර (සම්ඵප්‍රලාපයෙන්) නිසරු හිස් බස් බිණීමෙන් වැළකෙන්නෝය. කියයුතු කාලය සලකා කියන්නෝය. සත්‍යයම කියන්නෝය. දියුණුව සලකා කියන්නෝය. ධර්මය කියන්නෝය.

(විනය) මනා හික්මීම ගැන කියන්නෝය. සුදුසු කල්හි උපමා කරුණු සහිතවූ යොග්‍ය ලෙස සීමාසහිතවූ අර්ථයෙන් යුක්තවූ හිතේ තබාගත යුතුවූ වචන කියන්නෝය. මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ කියන්නේය.

10 "ශ්‍රමණ ගෞතමයෝ තණ, ගස්, වැල් ආදීන්ගේ භෙදනයෙන් (කැඩීම් සිඳීම් වලින්) වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ රාත්‍රි කෑමෙන් වැළකී විකාලභොජනයයි කියන ලද නුසුදුසු කාලයේ කෑමෙන් වෙන්ව එක්වේලේ වළඳන්නෝය. ශ්‍රමණ ගෞතමයෝ නැටීම්, ගීකීම්, වැයීම්, කෝලම් බැලීම් ආදියෙන් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ මල්මාලා සුවඳ දැරීම් වැනි සැරසීම් වලින් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ නුසුදුසු උස් ආසන මහා ආසනයන් ගෙන් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ රන් රිදී මිළ මුදල් පිළිගැනීමෙන් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ අමු මාංශ පිළිගැනීමෙන් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ ස්ත්‍රීන් හෝ ගෑනු දරුවන් පිළිගැනීමෙන් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ දාසයින් හෝ දාසීන් පිළිගැන්මෙන් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ එළුවන් බැටළුවන් පිළිගැන්මෙන් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ කුකුළන් ඌරන් පිළිගැන්මෙන් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ ඇතුන් ගවයින් අශ්වයින් වෙළඹුන් පිළිගැන්මෙන් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ කුඹුරු වතු පිළිගැන්මෙන් වැළකුණෝය.

ශ්‍රමණ ගෞතමයෝ දූත ගමන් සහ ගෙන්ගෙට යන (පණිවුඩ පනත්) මෙහෙවරින් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ ගණුදෙනු කිරීම් ආදී වෙළහෙළඳාමෙන් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ හොර කිරුමෙන් හා මැනුමෙන්ද රත්රන් වංචා කිරීමාදියෙන්ද වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ අල්ලස් ගැනීම් වංචා මායම් යන නපුරු ප්‍රයෝගයන් ගෙන් වැළකුණෝය. ශ්‍රමණ ගෞතමයෝ කැපීම්, වදදීම්, බැඳීම්, වස්තු බලයෙන් ගැනීම්, ගම් ආදිය පැහැරීම්, බලාත්කාර ක්‍රියාවලින්ද වැළකුණෝය.' මහණෙනි,

මෙසේ හෝ තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත අය කියන්නෝය”යි වදාළසේක.

චූල ශීලය නිමි.

11 “සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙසේ හෝ තණගස් වැල් ආදිය විනාශ කිරීමෙහි යෙදී වාසය කරති. එවැනි තණ ගස් වැල්වල මුල්වලින් පැලවෙන, කඳ පැලවෙන, පුරුක් පැලවෙන, දලු පැලවෙන බීජයෙන් පැලවෙන, පහක් (පස් වර්ගයක්) වේ. මෙයාකාර තණ ගස් වැල් ආදිය විනාශ කිරීමෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය.’ මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

12 “සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙයාකාරවූ දේ රැස්කොට තබා ප්‍රයෝජන ගැනීමෙහි යෙදී වාසය කරති. එවැනි දේ නම් ආහාර වර්ග තබා ප්‍රයෝජන විඳීමය. පානවර්ග තබා ප්‍රයෝජන විඳීමය. රෙදිපිළි ආදී ඇඳුම් ලබා නගා තිබීමය. රථ වාහන තබා ප්‍රයෝජන විඳීමය. ඇඳ, පුටු ආදිය රැස්කොට තබා ප්‍රයෝජන විඳීමය. සුවඳ ද්‍රව්‍ය තබාගෙන ප්‍රයෝජන විඳීමය. (තල සහල් ආදිය) තබා ප්‍රයෝජන විඳීමාදී මෙසේ මෙබඳු සත් වැදෑරුම් දේ රැස්කොට තබා ප්‍රයෝජන විඳීමෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය.’ මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

13 “සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙවැනි විහිලු දේ දැක්මෙහි යෙදී වාසය කරති. එවැනි දේ නම්- නැටීමය, ගී කීමය, වීණා ආදිය වැයීමය, රඟමඬුලු බැලීමය, ගොතා රසකර කියන ලද බොරු කථා ඇසීමය, කංසතාලම් හෝ අත්තාලම්ය, මළමිනී නැංවීම නමැති විජ්ජා කිරීම, බෙර ගැහුම්ය, (ප්‍රතිභාන චිත්‍ර විචිත්‍රය) නෘත්‍යයේදී සිත් ඇලුම් කරන ශරීර චංචලය, සණදෙවුම් කෙළිය, උනගස් ඔසවා නැටුම, මිනී ඇට සෝදා තැබීමය, ඇත් පොරය, අශ්ව පොරය, මීවුන් පොරය, ගව පොරය, එළු පොරය, බැටළු පොරය, කුකුළු පොරය, වටුවන්

පොරය, පොලු හරඹය, මිටින් මිට ගැසීමේ පොරය, මල්ලව (නම් පොර ඇල්ලීම) යුද්ධ කිරීම, යුද සෙන් පිරික්සීමය, (සේනාසන්නිවෙස) කඳවුරුය, සතරාකාර යුද්ධ හමුදාව (සිවුරඟසේනාව) දැකීමය ආදියයි. මෙසේ මෙයාකාර විසුළු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය.' මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

14 "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ප්‍රමාදයට කාරණවූ මෙයාකාර සූදුකෙළියෙහි යෙදී වාසය කරති. එවැනි දේ නම්, අට මඬුලු (කොටු) කෙළිය, දස මඬුලු (කොටු) කෙළිය (ලනුපැනීම) අහස්කෙළිය (කොටු පැනීම) (කට්ටි පැනීම) එක්කොට තබන දේ නොසොල්වා ගැනීමේ ලම කෙළිය, සිංකෙළීම. (එනම් සැලුම්කෙළිය, කුරුගැසීමෙන් පින්තූර සෑදීමේ සෙල්ලම, බිම හෝ බිත්තිවල ලීකුරු ගසා ඇත් අස් ආදී රූප දක්වා ක්‍රීඩාකිරීම, පන්දුකෙළිය, පත් කුලල් (වස්දඬු) පිඹීමය, නඟුල්කෙළිය, කරනම්ගැසීම, කන්නන්ගුරු කෙළිය. එනම් තල් පත් ආදිය පෙන්නා මුළාකොට කරණ වංචනික ක්‍රීඩාවකි.) වැලි ආදිය මැනීමේ සෙල්ලම, රථවාහන යොදා කරන සෙල්ලම දුනුකෙළිය, අකුරුසෙල්ලම සිතුදේ කීමේ සෙල්ලම, දෝෂරූප දක්වා කරන සෙල්ලම යනුයි. මෙසේ ප්‍රමාදයට කරුණුවූ සූදු සෙල්ලමෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණගෞතමයෝය.' මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

15 "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙයාකාරවූ 'උස් ආසන' 'මහ ආසන'යන්හි වාඩිවීමෙන් යුක්තව වාසය කරති. එනම් දික්හඟලා පුටුය, පලඟය, අඟල් හතරකට වඩා දික් ලොම් ඇති ඇතිරිය (ඇතුරු ආසනය) එළු ලොමින් සැරසූ ඇතිරිය, එළු ලොමින් සෑදූ සුදු ඇතිරිය, එළුලොමින් සෑදූ ඝන මලින් යුත් ඇතිරිය, ගුදිරිය, සිංහාදී රූපයෙන් සැරසූ එළු ලොම් ඇතිරිය, දෙපිට ලොම් ඇති

එළුලොම් ඇතිරිය, එකපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය රත්තරණින් කැටයම්කළ පසතුරුණුය, (පලස්) පටනූලෙන් කළ පසතුරුණුය, නාටිකාවන් දහසය දෙනෙකුට නැටියහැකි එළුලොමින් කළ මහ ඇතිරිය, ඇතුන්පිට අතුරණ ඇතිරිය, අසුන්පිට අතුරණ ඇතිරිය, රථපිට අතුරණ ඇතිරිය, අඳුන් දිවිසමින් කළ පසතුරුණුය, කෙසෙල් මුව සම් වැනි සමෙන් කළ උතුම් පසතුරුණුය, මත්තෙහි බඳිනාලද රතු වියන් සහිතවූ දෙපැත්තෙහි තබන ලද රතු කොට්ටා ඇති ආසනය යනාදියයි. මෙබඳුවූ 'උස් ආසන' මහා ආසනයන්ගෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය,' මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

16 "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙයාකාරවූ (ශරීරයට සම්බන්ධවූ) සැරසීමය, අඩු තැන් පිරවීමය යන කරුණෙහි යෙදී වාසය කරති. එනම්: සුවඳකුඩු ඇඟ ගැල්වීමය, ඇඟ අතගෑමය, නෑවීමය, මිරිකීමය (කැඩපත්) මුහුණ බලන කන්නාඩි අඳුන්, ගෙතූ නොගෙතූ මල් හා (විලවුන්) එනම් මල් සහිත සුවඳ සුණුය, (මුවසුණුය) මුහුණේ ලන සුවඳ සුණු හා කටේ ගාන (ආලෙපය) සුවඳ කල්කය, අත්වල පළඳින ආභරණය, අතේ තබාගෙන යන දඬු කෝටු (සැරයටි) ආදිය, බෙහෙත් සුරං; කඩු, කුඩ, සැරසිලි සහිත සෙරෙප්පු, සපත්තු දමාගෙන ඇවිදීමය, නළල්පටි, හිස මුදුනේ පළඳින මැණික් සහිත ආභරණ, වල්විදුනා (පවන් සැලීමට ගන්නා චාමර) දැරීමය, දික්දාවලු වලින් යුත් සුදුරෙදි ඇඳීමය යනාදියයි. මෙබඳුවූ සැරසීම හා අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය.' මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

17 'සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙයාකාරවූ වැඩනැති කථාවෙහි යෙදී වාසය කරති. එනම්: රජුන් ගැන කථාය, සොරුන් ගැන කථාය, මහා ඇමතියන්

ගැන කථාය, සේනා ගැන කථාය, භය ගැන කථාය යුද්ධ ගැන කථාය, කෑම ගැන කථාය, බීම ගැන කථාය, ඇඳුම් පැළඳුම් ගැන කථාය, නිදාගැනීම් ගැන කථාය, මාලා ගැන කථාය, සුවඳ ද්‍රව්‍ය ගැන කථාය, නෑයන් ගැන කථාය, යාන (රථ) ගැන කථාය, ගම් ගැන කථාය, ගම් අසල නියම්ගම් ගැන කථාය, නුවර ගැන කථාය, ජනයා ගැවසීගත් පළාත් ගැන (ජනපද) කථාය, ස්ත්‍රීන් ගැන කථාය, පුරුෂයන් ගැන කථාය, වතුරගන්නා තැන්වලට හෝ තොටුපළවලට රැස්වූ අය කරණ කථාය, නැසීගිය නෑයන් ගැන කථාය, නොයෙක් (ප්‍රයෝජන නැති දේ) ගැන කථාය, ලෝකයේ මැවුම්කාරයා ආදී විනිශ්චය නැති දේ ගැන කථාය, මහමුහුද ගැන කථාය, ඇතිවීම නැතිවීම ගැන (සීමාරහිත) කථාය යන මේ කථායි. මෙබඳුවූ කථාවෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය.' මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

18. "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙයාකාරවූ දොස් පවරා නින්දාකරන කථාවෙහියෙදී වාසය කරති. එනම්: 'උඩගු ලෙස තෝ මේ ධර්මය අනුව හැසිරීම නොදන්නෙහිය. මම මේ ධර්මය දනිමි. තෝ මේ ධර්මය අනුව හැසිරීම කුමක්දැයි දන්නෙහිද? තෝ වරදවා පිළිගන්නෙහිය. යහපත් අන්දමින් මම මොනවට පිළිපන්මි. මගේ වචනය අර්ථ සහිතය. (සිලුටුය), තගේ වචනය අනර්ථයෙන් යුක්ත වෙයි (නොසිලුටුය), පළමුව කියයුතු දේ පසුව කීයෙහිය. පසුව කිය යුතු දේ පළමුව කීයෙහිය. තා විසින් පුරුදු කරන ලද්ද පෙරළී ගියේය. තට වාදාරොපණය (වාද නැගීම) කරණ ලද්දේය. නින්දා කරණ ලද්දේවෙහිය. වාදයෙන් මිදෙන පිණිස හැසිරෙව, ඉදින් සමර්ථයෙහි නම් දැන්ම තෝ වාදයෙන් ගැළවී යව' මෙසේ මෙබඳු දොෂාරෝපණ කථාවෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය. මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

19 "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙවැනි දූතකම් (වැඩකාරකම්) සහ පණිවුඩ ගෙන යෑමෙහි යෙදී වාසයකරති. එනම් රජුන්ගේ, රාජ මහා ඇමතියන්ගේ, ක්ෂත්‍රියයන්ගේ, බ්‍රාහ්මණයන්ගේ, ගෙදර ප්‍රධානයන්ගේ (ගෘහපතියන්ගේ), කුමාරයන්ගේ 'මෙහි එනු' (ඔහේ) 'එහාට යනු' 'මෙය ගෙන එනු' 'එහාට මෙය ගෙන යනු' ආදී වශයෙනි. එවැනි වැඩකාරකම් (දූතකම්) හා පණිවුඩ ගෙනයාමෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය.' මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

20 "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙවැනි කුහකයෝද වෙති. සිවුපසය (සිවුරු, දන්, අසුන්, ගිලන්පස) ලබාගැනීම පිණිස වචන කියන්නෝද, නිමිති දක්වන්නෝද, අනුන්ගේ ගුණ නැතිකිරීමට කථා කිරීමෙන් ලාභ ලබන්නෝද, ලාභයෙන් ලාභයක් සොයන්නෝද වෙති. මෙවැනි කුහක (ලාභයෙන්) සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය. මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

මධ්‍යම ශීලය නිමි.

21 "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙවැනි පහත් ලාමක විද්‍යාවෙන් මිථ්‍යා (වැරදි ඇදහීම් වලින් යුත්) ජීවිකාවෙන් ජීවිකාව කෙරෙත්. එනම්ඃ සාමුද්‍රිකා ශාස්ත්‍රය (අත්බැලීම හෝ ශරීරයේ අවයව බලා ශාස්ත්‍රකීම, නිමිතිකීම) අසනිපාතාදී මහත් නිමිත්තෙන් ශුභාශුභ කීම, උත්පාතය කීම, ස්වප්න (සිහින) ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, (රෙදි ආදිය මීයන් කැපූකල ශුභාශුභ කීම, මූෂික ශාස්ත්‍ර, (ගිනි දෙවියා පිදීම එනම්) ගිනිපිදීම, හැඳියාගය, (ගිනිපූජා මාර්ගයක්) දහවියා යාගය, කුඩුයාගය, හාල් යාගය, ගිතෙල් යාගය, තෙල් යාගය, මුව යාගය. (අබ ආදිය කටේ දමා මන්ත්‍ර කියා ගින්නට පිඹීම හෝ දැමීම). ලේ යාගය, අංග විද්‍යාය, (ශරීරය හෝ ඇඟිලි පුරුක් බලා ගුණ අගුණ කීම) වාස්තු විද්‍යාය, (ගෙයක

බඩු ආදියේ ගුණ දොස් පෙන්වීම), නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්තිකරණ විද්‍යාව (සිවල්රූත) භූත විද්‍යාව (යක්ෂයින් දමනය කරණ විද්‍යාව), බිමගෙයි වාසය කරන්නන් විසින් ඉගෙනගතයුතු මන්ත්‍රය, සර්ප මන්ත්‍ර විද්‍යාය, විෂ විද්‍යාය, ගෝනුසු විද්‍යාය, මීයන් කෑකල පිළියම් කිරීමේ විද්‍යාය, (පක්ෂි) කුරුලු විද්‍යාය, කපුටු ශාස්ත්‍රය, ආයුෂ මෙපමණ යැයි කීම, ඊ පහරින් වළකන විද්‍යාය, මෘග පක්ෂීන්ගේ ශබ්ද දැනීමේ ශාස්ත්‍රය යනුයි. එවැනි ලාමක පහත් විද්‍යාවෙන් කරණ මිථ්‍යා (වැරදි ඇදහීමෙන් යුත්) ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය 'මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

22 "සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙවැනි පහත් ලාමක විද්‍යාවෙන් (වැරදි ඇදහීම් වලින් යුත් ජීවිකාවෙන්) ජීවිකාව කෙරෙත්. එනම්: මාණික්‍යයන්ගේ ශුභ අශුභ කියන මණිලක්ෂණය, දඬු ගැනීමෙහි ශුභ අශුභ කියන දණ්ඩලක්ෂණය, ඇඳුම්වල ශුභ අශුභ කියන වස්ත්‍ර ලක්ෂණය, කඩු ලකුණුය, ඊ ලකුණුය, දුනු ලකුණුය, ආයුධ ලකුණුය, ස්ත්‍රීලකුණුය, පුරුෂ ලකුණුය, පිරිමි ළමයින්ගේ ලකුණුය, ගෑනු ළමයින්ගේ ලකුණුය, දාසයින්ගේ ලකුණුය, දාසීන්ගේ ලකුණුය, ඇතුන්ගේ ලකුණුය, අශ්ව ලකුණුය, මීහරක් ලකුණුය, ගොන් ලකුණුය, දෙනුන්ගේ ලකුණුය, එළුලකුණුය, බැටළු ලකුණුය, කුකුළු ලකුණුය, වටු ලකුණුය, කබරගොයින් ආදීන්ගේ (ගොධා) ලක්ෂණය - (කර්ණිකා ලක්ෂණය) හිස් කන් ආදී ආභරණ ලක්ෂණය, කැසුබුලක්ෂණය මෘග ලක්ෂණය යනුයි මෙවැනි පහත් ලාමක විද්‍යාවෙන් කරණ මිථ්‍යා ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය.' මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

23 "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මෙයාකාර පහත් ලාමක විද්‍යාවෙන් මිථ්‍යා ජීවිකාවෙන් ජීවිකා කෙරති. එනම්: (අසවල් දින) රජුගේ බැහැරයාම වෙයි,

රජුගේ ආපසු ඒම වෙයි, ඇතුළු නුවර උන් රජුගේ සමීපයට යාම වෙයි, පිට රජුන්ගේ ඉවත යෑම වෙයි, ඇතුළු නුවර රජුන්ට ජය වෙයි, පිට රජුන්ට පරාජය වෙයි, පිටරජුන්ට ජය වෙයි, ඇතුළු නුවර රජුන්ට පරාජය වෙයි, මෙසේ මොහුට ජය වන්නේය. මොහුට පරාජය වන්නේය. මෙවැනි පහත් ලාමක විද්‍යාවෙන් කරන මිථ්‍යා ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය' "මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

**24** "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මෙයාකාර පහත් ලාමක විද්‍යාවෙන් මිථ්‍යා ජීවිකාවෙන් ජීවිකා කෙරෙති. එනම්: (අසවල් දින) චන්ද්‍රග්‍රහණය වන්නේය. සූර්යග්‍රහණය වන්නේය. (ග්‍රහ) තාරකාවන්ගේ ග්‍රහණය වන්නේය, චන්ද්‍ර සූර්යයන්ගේ ගමන (ස්වකීය) මාර්ගයෙහි වන්නේය, චන්ද්‍ර සූර්යයන්ගේ ගමන අමාර්ගයෙහි වන්නේය. (ග්‍රහ) තාරකාවන්ගේ ගමන (ස්වකීය) මාර්ගයෙහි වන්නේය (ග්‍රහ) තාරකාවන්ගේ ගමන අමාර්ගයෙහි වන්නේය. උල්කාපාත (තාරකා වැටීම) වන්නේය. දිසාවන් දැවීම වන්නේය. භූමිකම්පා වන්නේය. අහස ගිගුරුම් වන්නේය. චන්ද්‍ර සූර්ය (ග්‍රහ) තාරකාවන්ගේ උදාවීම, බැහීම, කෙලෙසීම පිරිසිදුවීම වන්නේය. මෙබඳු විපාක ඇති චන්ද්‍ර ග්‍රහණයක් වන්නේය. මෙබඳු විපාක ඇති සූර්යග්‍රහණයක් වන්නේය. මෙබඳු විපාක ඇති (ග්‍රහ) තාරකා ග්‍රහණයක් වන්නේය. චන්ද්‍රසූර්යයන්ගේ මෙබඳු විපාක ඇති මාර්ග ගමන වන්නේය. චන්ද්‍රසූර්යයන්ගේ මෙබඳු විපාක ඇති අමාර්ග ගමන වන්නේය. (ග්‍රහ) තාරකාවන්ගේ මෙබඳු විපාක ඇති මාර්ග ගමන වන්නේය. මෙබඳු විපාක ඇති අමාර්ග ගමන වන්නේය, මෙබඳු විපාක ඇති උල්කාපාතයෙක් වන්නේය. මෙබඳු විපාක ඇති දිගුන් (දිසාවන්) දැවීමෙක් වන්නේය. මෙබඳු විපාක ඇති භූමිකම්පාවක් වන්නේය. මෙබඳු විපාක ඇති අහස ගිගිරුමක් වන්නේය. මෙබඳු විපාක ඇති චන්ද්‍ර සූර්ය (ග්‍රහ) තාරකාවන්ගේ මෙබඳු විපාක ඇති උදාවීම, බැහීම, කෙලෙසීම, පිරිසිදුවීම වන්නේය යනු දක්වන විද්‍යායි. මෙවැනි පහත් ලාමක විද්‍යාවෙන් කරන මිථ්‍යා

ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය.' මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

25 "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මෙයාකාර පහත් ලාමක විද්‍යාවෙන් මිථ්‍යා ජීවිකාවෙන් ජීවිකාව කෙරෙති. එනම්ඃ හොඳින් වැහි ඇති වන්නේය. නියඟ වන්නේය හෝ නපුරු වැහි ඇතිවන්නේය. ආහාර ආදිය සුලභ වන්නේය. ආහාර ආදිය හිඟවන්නේය. භය නැති වන්නේය. භය ඇති වන්නේය. ලෙඩ ඇති වන්නේය. ලෙඩ නැති වන්නේයයි කීමද හස්ත මුද්‍රා ආදී ලකුණු වලින් යම්දේ ප්‍රකාශ කිරීමේ ශාස්ත්‍රය, ගණිතශාස්ත්‍රය (පිණ්ඩගණිතය) සනප්‍රමාන දැනගැනීමේ ගණිතය, කාව්‍ය ශාස්ත්‍රය, ලෝකායත විතණ්ඩශාස්ත්‍රය, ලෝකස්වභා ශාස්ත්‍රය, යන මේ විද්‍යායි. මෙවැනි පහත් ලාමක විද්‍යාවෙන් කරන මිථ්‍යා ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය. මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය.

26 "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මෙයා කාර පහත් ලාමක විද්‍යාවෙන් මිථ්‍යාජීවිකාවෙන් ජීවිකාව කෙරෙති. එනම්ඃ විවාහ කැඩවීම, විවාහ කරවීම, හිත්දිනා ගැනීම පිණිස වචන කීම, වියෝග කරවීම, වස්තු රැස්කරවීම, වියදම් කරවීම යහපත් ශ්‍රීයාව ඇති කරවීම යහපත් ශ්‍රියාව නැති කරවීම, ගැප් (ගර්භය) නොනස්නාසේ රැකීම, දිව බැඳීම, හක්ක බැඳීම, අත් පෙරළවන පිණිස මන්ත්‍ර කිරීම, කන් නොඇසීමට මන්ත්‍ර කිරීම, (කැඩපත්හි) මූණ බලන කන්නාඩියක දේවතාවන් පිහිටුවා ප්‍රශ්න ඇසීම, (අංජනම්), ආවේසවූ ගෑණුදරුවන්ගෙන් ප්‍රශ්න ඇසීම දෙවිවරුන්ගෙන් ප්‍රශ්න ඇසීම, සූර්යයාට නමස්කාර කිරීම, බ්‍රහ්මයාට නමස්කාර කිරීම, කටින් ගිනිදැල් පිටකිරීමය, ශ්‍රීදෙවිය කැඳවීම යනුයි. එවැනි ලාමක පහත් විද්‍යායෙන් කරන මිථ්‍යා ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය.' මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නෝය.

27 "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මෙවැනි පහත් ලාමක විද්‍යාවෙන් මිථ්‍යා ජීවිකාවෙන් ජීවිකාව කෙරෙති. එනම්: බාරහාරවීම, බාරහාර ඔප්පු කිරීම බිම්ගෙයි සිට උගත් මන්ත්‍ර යොදා ක්‍රියා කිරීම, නපුංසකයා පුරුෂයෙකු කිරීම, පුරුෂයා නපුංසක කිරීම, ගෙවල් තැනීම, ගෙවල් සෑදීමට සුදුසු තැන බලියාග පැවැත්වීම, (අනුහස් ඇතැයි කියන) වතුරෙන් කට ශුද්ධ කරවීම, අනුන් නැහැවීම අනුන් සඳහා ගිනි පිදීම, වමනකරවීම, විරෙචන කරවීම, ඌර්ද්ධව විරෙචනය (ළය විරේකය) අධො (පහතින්) විරෙචනය සිරෝ (බෙල්ලෙන් උඩ) විරෙචනය, කනේ තෙල් දැමීම, ඇගේ බෙහෙත් දැමීම, නස්‍ය කිරීම, ඇසට අඳුන් ගෑම, අඳුන් ආදී සිහිල් බෙහෙත් ගෑම, (සැත්) කටු ආයුධ කටු ආදිය යොදා කරන වෙදකම, ශල්‍යකර්මය, දරු වෙදකම, බෙහෙත් මගින් කරන වෙදකම, (තද) බෙහෙතෙහි විෂ මැරීම යනුයි. එවැනි ලාමක පහත් විද්‍යාවෙන් කරන මිථ්‍යා ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළකුණෝ ශ්‍රමණ ගෞතමයෝය,' මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන්නාවූ කෙලෙස් සහිත ජනයා මෙසේ හෝ ගුණ කියන්නේය. මහණෙනි, ඉදින් කෙලෙස් සහිත ජනයා තථාගතයන්ගේ ගුණ වශයෙන් මෙබන්දක් කියාද එය සුළු දෙයකි, අඩු දෙයකි, සුළු ස්වභා ගතියකි.

මහා ශීලය අවසාන විය.

28 "මහණෙනි, අන්‍ය ධර්මයද ඇත්තාහ. ගැඹුරුවූ දුකසේ දැක්කාවූ, දුකසේ වටහා ගත්තාවූ, තර්කයෙන් දැන ගත නොහැකිවූ, සියුම්වූ පණ්ඩිතයින් විසින් ගරුකළ යුතුවූ යම් ධර්ම ඇත්තේද එය තථාගතයෝ තමන්ගේ උසස් ඥානයෙන් දැන පිඩු (පසක්) කොට දෙශනා කළෝද ඒ ධර්මයෙන් තථාගතයන්ගේ (විද්‍යමාන) ගුණ හොඳින් ප්‍රකාශවේ. (දැක්වේ) පැහැදිලිව පෙනේ. මහණෙනි, ගැඹුරුවූ දුකසේ දැක්කාවූ, දුකසේ වටහාගත්තාවූ, මිහිරිවූ තර්කයෙන් දැනගත නොහැකිවූ, සියුම්වූ, පණ්ඩිතයින් විසින් ගරුකළ යුතුවූ යම් ධර්ම ඇත්තේද, එය තථාගතයෝ තමන්ගේ උසස් ඥානයෙන් දැන පිඩුකොට දෙශනා

කළෝද ඒ ධර්මයෙන් තථාගතයන්ගේ පැහැදිලිව පෙනෙන ගුණ හොඳින් ප්‍රකාශවේ. ඒ ධර්ම කවරහුද,

**29** "මහණෙනි, සමහර පින්වත් මහණ බමුණෝ පෙර ස්කන්ධ කොටස් ගැන කල්පනා කරති. පෙර ස්කන්ධ කොටස් ගැන ඇදහීම ඇත්තෝ වෙති. ඔවුහු පෙර ස්කන්ධයන් ගැන නොයෙක් ආකාර ඇදහීම් දහ අට ආකාරයකින් ප්‍රකාශ කරති. ඒ පින්වත් මහණ බමුණෝ කවර කරුණක් පිළිගෙන කුමන දෙයක් උදෙසා පෙර ස්කන්ධ කොටස් ගැන කල්පනා කරත්ද? පෙර ස්කන්ධ ගැන ඇදහීම් ඇත්තෝ පෙර ස්කන්ධයන් ගැන නොයෙක් ආකාර මත ප්‍රකාශ කිරීම් දහඅට ආකාරයකින් කියත්ද?

**30** "සමහර ඒ පින්වත් මහණ බමුණෝ සදාකාලික බව විශ්වාස කර ආත්මයද ලොකයද සදාකාලිකයයි සතර ආකාරයකින් දක්වති. ඒ පින්වත් මහණ බමුණෝ කුමක් කරණ කොටගෙන කුමක් උදෙසා ආත්මයත් ලෝකයත් සදාකාලික යයි සතර කරුණකින් ප්‍රකාශ කරත්ද?

**31.** "මහණෙනි, යම් මහණෙක් හෝ බමුණෙක් හෝ (කෙලෙස් හීනකිරීමට) වීර්යයෙන් වීර්යය නිතර යෙදීමෙන්, වීර්යය නැවත නැවත යෙදීමෙන්, නොපමාවීමෙන්, යහපත් මෙනෙහි කිරීමෙන් යම් පරිද්දෙකින් සිත එකඟවූ කල නොයෙක් ආකාරවූ පෙර (ජාතිවල) සිටිතැන් සිහි කරත්ද? එනම්: එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතලිහක් ද, ජාති පනහක්ද, ජාති සියයක්ද, ජාති දාහක්ද, ජාති සියදහසක්ද, අසවල් තැන ඉපදුනෙමි. මෙබඳු නාමයක්, මෙබඳු ගොත්‍රයක්, මෙබඳු රූපයක් මෙබඳු ආහාරයක්, මෙබඳු සුව දුක්, මෙබඳු ආයුෂ ඇත්තෙක්වීමි. ඉන් චුතවී ගොස් අසවල් තැන ඉපදුනෙමි. එහිදී මෙබඳු නාමයක්, මෙබඳු ගොත්‍රයක්, මෙබඳු රූපයක්. මෙබඳු ආහාර, මෙබඳු සුව දුක්, මෙබඳු ආයුෂ ඇත්තෙක්වීමි. එයින් චුතවී මෙහි ඉපදුනෙමි.' මෙසේ යහපත්

ආකාරවූ උදෙසීම් (පුරුදු කිරීම) සහිතවූ නොයෙක් ආකාර පෙර ජීවත්වූ පිළිවෙළ සිහිකරති.

'ඒ (දෘෂ්ටි හීතතෙම)පෙර උත්පත්ති දකින්නා මෙසේ කියයි. 'ආත්මයද ලොකයද සදාකාලිකය. කිසිත් නූපදවයි, පර්වතයක් මෙන් සිටියේය. මන්දාර පර්වතය මෙන් සිටියේය. එහෙයින් ඒ ආත්මය ආශ්‍රය කළ සත්වයෝ භවයෙන් භවයට යති. ජීවත්වෙති, එයින් මිදී යති. උපදිත්, සදාකල් සිටිති. ඊට කරුණු කවරේද? මම කෙලෙස් හීනකරන වීර්යයෙන් වීර්ය නිතර යෙදීමෙන්, වීර්යය නැවත නැවත යෙදීමෙන්, නොපමාවීමෙන්, යහපත් මෙනෙහි කිරීමෙන්, යම් පරිද්දකින් සිත එකඟවූ කල නොයෙක් ආකාරවූ පෙර (ජාතිවල) සිටිතැන් සිහි කෙළෙම්ද, එලෙසින් පෙර උත්පත්ති සිහිකිරීමේ ඥානය ලැබුවෙමි. එනම්, එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතලිහක්ද, ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දාහක්ද, ජාති සියදහසක්ද, නොයෙක් සියගණන් ජාතිද, නොයෙක් දහස්ගණන් ජාතිද, නොයෙක් සියදහස් ගණන් ජාතිද, අසවල් තැන ඉපදුනෙමි. මෙබඳු නාමයක්, මෙබඳු ගොත්‍රයක්, මෙබඳු රූපයක්, මෙබඳු ආහාර, මෙබඳු සුව දුක්, මෙබඳු ආයුෂ ඇත්තෙක්වීමි, ඉන් චුතවී ගොස් අසවල් තැන ඉපදුනෙමි. එහිදී මෙබඳු නාමයක්, මෙබඳු ගොත්‍රයක්, මෙබඳු රූපයක්, මෙබඳු ආහාර, මෙබඳු සුව දුක්, මෙබඳු ආයුෂ ඇත්තෙක්වීමි. එයින් චුතව මෙහි ඉපදුනෙමි. මෙසේ යහපත් ආකාරවූ උදෙසීම් (පුරුදු කිරීම්) සහිතවූ නොයෙක් ආකාර පෙර ජීවත්වූ පිළිවෙළ සිහිකරමි ආත්මයද ලොකයද සදාකාලිකය. කිසිත් නූපදවයි. පර්වතයක් මෙන් සිටියේය. මන්දාර පර්වතය මෙන් සිටියේය. ඒ ආත්මය ආශ්‍රය කළ සත්වයෝ භවයෙන් භවයට යති. ජීවත් වෙති එයින් මිදී යති. උපදිත්. සදාකාලික වස්තු මෙන් නිතර නොවෙනස්ව ආත්මය ඇති බව ඒ කාරණයෙන් මම දනිමි'යි කියායි.

"මහණෙනි, මේ ඒ ප්‍රථම කාරණයයි, යම් කරුණක් නිසා යමක් හේතුකොටගෙන සමහර මහණ බමුණෝ සදාකාලික

බව ගැන ඇදහීම් ඇතුව ආත්මය හා ලොකය සදාකාලිකයයි ප්‍රකාශ කරයි.

32 "දෙවෙනි කාරණයෙහිද පින්වත් මහණ බමුණෝ කුමක් නිසා කුමක් හේතුකොටගෙණ සදාකාලික බව ගැන ඇදහීම් ඇතුව ආත්මය හා ලොකය සදාකාලිකයයි ප්‍රකාශ කරත්ද? 'මහණෙනි, යම් මහණෙක් හෝ බමුණෙක් (කෙලෙසුන් හීනකිරීමට) වීර්ය කොට, වීර්යය නිතර යොදා, වීර්යය නැවත නැවත යොදා, පමානොවී, යහපත් මෙනෙහි කිරීම කොට, යම්පරිද්දෙකින් සිත එකඟවූ කල, නොයෙක් ආකාරවූ පෙර (ජාතිවල) සිටිතැන් සිහිකෙරේද, එලෙසින් පෙර උත්පත්ති සිහිකිරීමේ ඥානය ලබයි. එනම්:- 'සංවට්ට* විවට්ට†' නම් එක් කල්පයක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප දෙකක්ද 'සංවට්ට විවට්ට' නම් කල්ප තුනක්ද 'සංවට්ට විවට්ට' නම් කල්ප සතරක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප පහක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප දහයක්ද, අසවල් තැන ඉපදුනෙමි. මෙබඳු නාමයක්, මෙබඳු ගොත්‍රයක්, මෙබඳු රූපයක්, මෙබඳු ආහාර, මෙබඳු සුවදුක් මෙබඳු ආයුෂ ඇත්තෙක් වීමි. ඉන් චුතවී අසවල් තැන ඉපදුනෙමි. එහිදී මෙබඳු නාමයක්, මෙබඳු ගොත්‍රයක්, මෙබඳු රූපයක්, මෙබඳු ආහාර, මෙබඳු සුව දුක්, මෙබඳු ආයුෂ ඇත්තෙක්වීමි. ඒ මම ඉන් චුතවීමෙහි ඉපදුනෙමි. මෙයාකාර තේරුම් කරදීම් සහිත නොයෙක් පෙර ජාතිවල උපන් තැන් සිහිකරයි.

"ඔහු මෙසේ කියයි;- 'ආත්මයද ලෝකයද සදාකාලිකය, එයින් යමක් නූපදී, පර්වතයක් මෙන් සිටියේය. මන්දාරපර්වතය මෙන් සිටියේය. ඒ සත්වයෝද භවයෙන් භවයට යති, ජාතියෙන් ජාතියට ගමන් කරති, චුතවෙත්, උපදිත්, සදාකාලික වස්තු මෙන් නොනැසී සිටිත්. ඊට කරුණු කුමක්ද? මම කෙලෙස් හීන කරන වීර්යයෙන් වීර්යය නිතර යෙදීමෙන්, වීර්ය නැවත නැවත යෙදීමෙන්, නොපමාවීමෙන්, යම් පරිද්දෙකින් සිත එකඟවූ කල

* සංවට්ට- අන්තඃකල්ප විස්සක් පමණවූ විනාශවේගන යන කාලය.

† විවට්ට- අන්තඃකල්ප විස්සක් පමණවූ වැඩීගන යන කාලය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොයෙක් ආකාරවූ පෙර (ජාතිවල) සිටිතැන් සිහිකෙළෙමි. එනම්:- 'සංවට්ට විවට්ට' නම් එක් කල්පයක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප දෙකක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප තුනක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප සතරක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප පහක්ද 'සංවට්ටවිවට්ට' නම් කල්ප දහයක්ද, අසවල් තැන ඉපදුනෙමි. මෙබඳු නාමයක්, මෙබඳු ගොත්‍රයක්, මෙබඳු රූපයක්, මෙබඳු ආහාර, මෙබඳු සැප දුක්, මෙබඳු ආයුෂ ඇත්තෙක්වීමි. ඉන් චුතවී මෙහි ඉපදුනෙමි. මෙයාකාර තේරුම්කරදීම් සහිත නොයෙක් පෙර ජාතිවල උපන් තැන් සිහිකෙරෙමි. ආත්මයද ලොකයද නිත්‍යය. එයින් යමක් නූපදී, පර්වතයක් මෙන් සිටියේය. මන්දාර පර්වතය මෙන් සිටියේය. ආත්මයෙන් යුත් සත්වයෝද භවයෙන් භවයට යති, ජාතියෙන් ජාතියට ගමන් කරති, චුතවෙත්, උපදිත් මහමෙර ආදිය මෙන් නොනැසී ඇත්තේ යයි මේ කරුණින්ද නිත්‍යභාවය දනිමි'යි කියායි.

"මහණෙනි, යම්කරුණක් උදෙසා ඇතැම් මහණබමුණෝ සදාකාලික බව අදහා ආත්මයද ලොකයද සදාකාලික මෙන් ප්‍රකාශ කරත්ද, මේ ඒ දෙවැනි කාරණයයි.

33 "තුන් වැනි කරුණෙහිද පින්වත් මහණ බමුණෝ කුමක් හේතුකොට කුමක් නිසා සදාකාලික බව අදහා ආත්මයද ලෝකයද සදාකාලිකයයි ප්‍රකාශ කරත්ද?

"මහණෙනි, යම් මහණෙක් හෝ බමුණෙක් (කෙලෙසුන් හීනකිරීමට) වීර්යකොට, වීර්යය නිතර යොදා, වීර්යය නැවත නැවත යොදා, නොපමාවී, යහපත් මෙනෙහි කිරීම් කොට යම් පරිද්දෙකින් සිත එකඟවූ කල නොයෙක් ආකාරවූ පෙර (ජාතිවල) සිටි තැන් සිහි කෙරේද, එලෙසින් පෙර උත්පත්ති සිහිකිරීමේ ඥානය ලබයි. එනම්:- 'සංවට්ට විවට්ට' නම් එක් කල්පයක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප දෙකක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප තුනක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප සතරක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප පහක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප දහයක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප විස්සක්ද,

සංවට්ට විවට්ට' නම් කල්ප තිහක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප හතලිහක්ද, අසවල් තැන ඉපදුනෙමි. මෙබඳු නමක්, මෙබඳු ගොත්‍රයක් මෙබඳු රූපයක්, මෙබඳු ආහාර, මෙබඳු සැපදුක්, මෙබඳු ආයුෂ ඇත්තේ වීමි. ඒ මම ඉන් චුතව ගොස් අසවල් තැන උපන්නෙමි. එහිදී මෙබඳු නාමයක්, මෙබඳු ගොත්‍රයක්, මෙබඳු රූපයක්, මෙබඳු සැප දුක්, මෙබඳු ආයුෂ ඇත්තෙක් වීමි. ඒ මම ඉන් චුතව ගොස් මෙහි උපනිමි'යි කියායි.

"මෙයාකාර තේරුම්කරදීම් සහිත නොයෙක් පෙර ජාතිවල උපන්තැන් සිහිකරයි. ඔහු මෙසේ කියයිඃ- ආත්මයද ලොකයද සදාකාලිකය, එයින් යමක් නූපදී, පර්වතයක් මෙන් සිටියේය. මන්දාර පර්වතය මෙන් සිටියේය. ඒ ආත්මයෙන් යුත් සත්වයෝද භවයෙන් භවයට යති, හැසිරෙති. චුතවෙත්, උපදිත්; සදාකාලික වස්තු මෙන් පවතිත්. ඊට කරුණු කුමක්ද මම කෙලෙස් හීන කරන වීර්යයෙන්, වීර්යය නිතර යෙදීමෙන් වීර්යය නැවත නැවත යෙදීමෙන්, නොපමාවීමෙන් මෙබඳු චිත්තසමාධියක් ලදිමි. කෙබඳුවූද යත්ඃ- යම්සේ සිත එකඟවූ කල නොයෙක් ආකාර පෙර (ජාතිවල) සිටිතැන් සිහි කෙළෙමි එනම්ඃ- 'සංවට්ට විවට්ට' නම් කල්ප දහයක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප විස්සක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප තිහක්ද, 'සංවට්ට විවට්ට' නම් කල්ප හතලිහක්ද, අසවල් තැන උපන්නෙමි. මෙබඳු නාමයක්, මෙබඳු ගොත්‍රයක් මෙබඳු රූපයක්, මෙබඳු ආහාර, මෙබඳු සැපදුක්, මෙබඳු ආයුෂ ඇත්තෙක්වීමි. ඉන් චුතවී මෙහි උපන්නෙමි. මෙයාකාර තේරුම් කරදීම් සහිත නොයෙක් පෙර ජාතිවල උපන් තැන් සිහි කෙළෙමි. මේ කරුණෙන්ද මෙය මම දනිමි. ඒ කුමක්ද? ආත්මයද ලෝකයද සදාකාලිකය, එයින් යමක් නූපදී, පර්වතයක් මෙන් සිටියේය. මන්දාර පර්වතය මෙන් සිටියේය. සත්වයෝද භවයෙන් භවයට යති, හැසිරෙති, චුත වෙත්, උපදිත්, සදාකාලික දේ සමව සිටිත් යනුයි. 'මහණෙනි, යම් කරුණක් උදෙසා ඇතැම් මහණ බමුණෝ සදාකාලික බව අදහා ආත්මයද ලෝකයද සදාකාලික මෙන් ප්‍රකාශ කරත්ද, මේ ඒ තුන්වැනි කාරණයයි.

34 "හතරවැනි කරුණෙහිද පින්වත් මහණ බමුණෝ සදාකාලික බවක් අදහා කුමක් හේතුකොට කුමක් නිසා සදාකාලික බව අදහා ආත්මයද ලෝකයද සදාකාලිකයයි ප්‍රකාශ කරත්ද? 'මහණෙනි, යම් මහණෙක් හෝ බමුණෙක් තර්ක ඥානයෙන් විමසයි. ඔහු තර්කයෙන් සම්පූර්ණයෙන් විමසීමෙන් ලබන ලද තමන්ගේ වැටහීම ලැබ මෙසේ කියයි. 'ආත්මයද ලෝකයද සදාකාලිකය, එයින් යමක් නූපදී, පර්වතයක් මෙන් සිටියේය. මන්දාර පර්වතය මෙන් සිටියේය. ඒ ආත්මයෙන් යුත් සත්වයෝද භවයෙන් භවයට යති, ජාතියෙන් ජාතියට ගමන් කරති, චුතවෙත්, උපදිත්, සදාකාලික වස්තු මෙන් නොනැසී සිටිත්' යනුයි.

"මහණෙනි, යම් කරුණක් උදෙසා ඇතැම් මහණ බමුණෝ සදාකාලික බව අදහා ආත්මයද ලෝකයද සදාකාලික මෙන් ප්‍රකාශ කරත්ද? මේ හතරවැනි කාරණයයි.

35 "මහණෙනි, සදාකාලික බව අදහන ඒ මේ මහණ බමුණෝ, මේ කරුණු සතරින් ආත්මයද ලෝකයද සදාකාලිකයයි ප්‍රකාශ කරති. "මහණෙනි, යම් මහණහු හෝ බමුණෝ හෝ සදාකාලික බව අදහා ආත්මයද ලෝකයද සදාකාලිකයයි ප්‍රකාශ කරත්ද ඒ සියල්ලෝ මෙකී හතර කාරණයෙන්ම හෝ එයින් එකකින් හෝ ප්‍රකාශ කරති. මේ හැර වෙන අනික් කාරණයක් නැත්තේමය.

36 "මහණෙනි, මේ ඒ කරුණු හතර තථාගතයෝ හොඳින් දනිති. මේ (මිසදිටු) වැරදි මතයෙන් යුත් කරුණු මෙසේ ගත් ඇත්තෝ වෙත්. මේ නැවත නැවත ගැණීම් වශයෙන් (තර්කයෙන්) තීරණ කරගත් ඇත්තෝ වෙත්. මේ මෙබඳු ගති ඇත්තෝ වෙත්. මෙබඳු පරලොව ඇත්තෝ වෙත් යනුයි. තථාගතයෝ එය හොඳින් දනිති. ඉන් මත්තෙහිවූ දේද හොඳින් දනිති. ඒ හොඳ දැනුම (තර්කයෙන්) තීරණය කර නොගනිති. කෙලෙස් නැතිකිරීම තථාගතයන් විසින් දන්නා ලද්දේ (තර්කයෙන්) ලැබූ තීරණයෙන් නොවේ. මහණෙනි, (දුක හෝ සැප) ආදී වේදනා ඇතිවීමේ හේතුවද, එය දුරුවීමේ හේතුවද,

රස විඳීමද, ප්‍රතිඵලද, හික්මීමද ඇතිසැටියෙන් දැන තථාගතයෝ කාමාදියෙන් තොරව කෙලෙසුන්ගෙන් මිදුනෝය.

37 "මහණෙනි, ගැඹුරුවූ දැක්මට දුෂ්කරවූ, දුකසේ අවබොධ කරගත්තාවූ, ශාන්තවූ, මිහිරිවූ තර්කයෙන්ම වටහා ගත නොහැකිවූ සියුම්වූ නුවණැත්තන් විසින් ගරු කළයුතුවූ යම් ධර්මයක් ඇත්ද, ඒ ධර්ම තථාගතයෝ උසස් ඥානයෙන් තමන්ම පැහැදිලි ලෙස දැන ප්‍රකාශ කළෝය. යම් ධර්මයන් කරණකොටගෙන තථාගතයන්ගේ ගුණය ඇතිහැටි හොඳාකාර කියනු කැමැත්තෝ කියති.

පළමුවැනි බණ වරයි.

## II

1 "මහණෙනි, එක් කොටසක් සදාකාලිකය, එක් කොටසක් සදාකාලික නොවේයයි අදහන්නාවූ සමහර මහණ බමුණෝ ආත්මය සහ ලොකය එක් කොටසක් සදාකාලිකය එක් කොටසක් සදාකාලික නොවේයයි කරුණු හතරකින් ප්‍රකාශ කරති.

"ඒ පින්වත් මහණ බමුණෝ එක් කොටසක් සදාකාලිකවූ එක් කොටසක් සදාකාලික නොවූ ආත්මයද, ලොකයද, එක් කොටසක් සදාකාලිකයයිද, එක් කොටසක් සදාකාලික නොවේයයිද, කුමක් හේතුකොට කුමක් නිසා සතර කරුණකින් ප්‍රකාශ කරත්ද?

2 "මහණෙනි, යම්කිසි කලක දීර්ඝ කාලයක් පසුවීමෙන් මේ ලොකය වැනසෙන කාලයක් වන්නේය. ලොව වැනසෙන කල බොහෝ සෙයින් සත්වයෝ ආභස්සර බඹලොව උපදිති. ඔව්හු එහි සිතින් ධ්‍යාන බලයෙන් ඉපිද, ප්‍රීතිය ආහාර කොටගෙන, තමාම බබළන්නෝ, අහසේ හැසිරෙමින්, හිත් ප්‍රිය කරන ඇඳුම් පැළඳුම් ඇතිව සිටින්නෝ වෙත්. ඔව්හු එහි බොහෝ කාලයක් සිටිති.

3 "මහණෙනි, යම්කිසි විටක දීර්ඝ කාලයක් පසුවීමෙන් මෙලොව නැවත හටගනීද ලොව හටගත් කල එහි හිස්වූ බඹ විමානයක් පහළවේ. එවිට එක්තරා සත්වයෙක් ආයුෂ ගෙවීමෙන් හෝ පින්ගෙවීමෙන්, ආභස්සර නම් බඹලොවින් චුතවී හිස් බඹ විමනෙහි උපදී. ඔහු එහි සිතින් ධ්‍යානයෙන් ඉපදී, ප්‍රීතිය ආහාර කොට තමන්ගේම ආලෝකයක් ඇතුව අහසේ හැසිරෙමින් ශුභ විමාන ඇත්තෙක් වේ. ඔහු එහි දීර්ඝ කාලයක් සිටී.

4 "ඔහු කලක් එහි තනිව විසූ බැවින්, පසුතැවීමක් හා කලකිරීමක් ඇතිවෙයි. 'වෙනත් සත්වයෝ ද මේ භවයට එත්නම් ඉතා හොඳය'යි පැතීමෙන්, සිතෙහි චංචල බවක්ද ඇතිවිය. ඉන් පසු ආයුෂ ගෙවීමෙන් හෝ පින් ගෙවීමෙන් වෙනත් සත්වයෝ ද ආභස්සර බඹලොවින් චුතව බඹ විමනෙහි උපදිත්. ඒ සත්වයාගේ සහාය බවට පැමිණෙත් ඔව්හුද එහි සිත හට ගෙන, ප්‍රීතිය ආහාර කොටගෙන, තමන්ගේම ආලෝක ඇතුව ශුභ විමානයෙහි සිට අහසේ හැසිරී දීර්ඝ කාලයක් සිටිති.

5 "මහණෙනි, එවිට යම් ඒ සත්වයෙක් මුලින් උපන්නේද ඔහුට මෙසේ සිතෙයි. 'මම බ්‍රහ්මවෙමි, මහා බ්‍රහ්මවෙමි. අනික් අය යටත් කර සිටින්නෙමි. අනුන් විසින් යටත් කළ නොහැකි වන්නෙමි. ඒකාන්තයෙන් සියල්ල දකිමි. අනුන් මා යටතට ගනිමි. ලොකයට ප්‍රධාන වෙමි. ලොක කර්තෘ වෙමි. ලොකය මැවුම්කාරයා වෙමි. ලොවට උතුම්වෙමි ලොව බෙදන්නෙක් වෙමි. වසඟ කරගන්නෙක් වෙමි. උපන්නාවූද උපදින්නාවූද, ලොකයාගේ පියා වෙමි. මේ සත්වයෝ මවිසින් මවන ලද්දෝය. කුමක් හෙයින්ද යත්, අහෝ තව සත්වයෝත් මේ භවයට එන්නෝ නම් යහපතැ'යි පූර්වයෙහි මට මෙසේ සිතක් ඇතිවිය, එබැවින් ඒ මගේ හිතේ ප්‍රර්ථනාවෙන් මේ සත්වයෝ මේ භවයට පැමිණියෝය'යනුයි. ඒ යම් සත්වයෙක් පසුව උපන් විට ඔහුටද මෙසේ සිතෙක් වෙයි- 'මේ පින්වත් අය බ්‍රහ්මය, මහාබ්‍රහ්මය, සෙස්සන් මැඩපවත්වන්නෙකි, අනුන් විසින් මැඩනොපවත්වන්නෙකි, ඒකාන්තයෙන් සියල්ල දකින්නෙකි,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වසවර්තියෙකි, ප්‍රධානයෙකි, ලොක කර්තෘය, ලොකය මැවුම්කාරයෙක, උත්තමයෙකි, ලොව බෙදන්නෙකි, වසඟකර ගන්නෙකි, උපන් ලොකයාගේ පියෙකි, මේ පින්වත් බඹහු විසින් අපි මවන ලද්දෙමු. එයට හේතුව කුමක්ද? අප මෙහි පැමිණ පළමු උපන්නාවූ මොහු දුටුවෙමු. අපි පසුව ඉපදුනෙමු’ යනුයි.

**6** “මහණෙනි, ඒ යම් පළමුව උපන් සත්වයෙක්වේද ඔහු ඉතා දීර්ඝ ආයුෂ ඇත්තෙක්ද, ඉතා උතුම් රූව ඇත්තෙක්ද, මහා පිරිවර ඇත්තෙක්ද වෙයි. ඒ යම් සත්වයෙක් පසුව උපන්නේද, ඔහු ඉතා අඩු ආයුෂද, ඉතා රුවෙන් අඩුවූද, පිරිවර නැත්තෙක්ද වේ. මහණෙනි, මේ කාරණය සිද්ධවේ. එනම් එක්තරා සත්වයෙක් ඒ බ්‍රහ්ම භවයෙන් චුතව මේ මිනිස් බවට පැමිණේ.

‘මේ භවයට ආවාවූ ඔහු ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වෙයි. ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිව කෙලෙස් හීන කිරීමේ වීර්ය කොට, එම වීර්ය පුහුණුකර, එම වීර්ය නැවත නැවත යෙදීමට පැමිණ, අප්‍රමාදයට පැමිණ, හොඳින් භාවනා කිරීමට පැමිණ, යම්සේ හිත එකඟ කරගත් විට තමන්ගේ පෙර ජාතිය සිහි කෙරේද, ඒ පෙර ජාතියෙන් මතු සිහි නොකෙරේද, ඔහු මෙසේ කියයි.

“යම් බ්‍රහ්මයෙක් වේද ඔහු මහා බ්‍රහ්මයාය. මැඩ පවත්වන්නෙක, මැඩපැවැත්විය නොහැක්කේය. අනුමානයක් නැතිව යමක් දන්නෙකි, යටත් කරන්නෙකි, ප්‍රධානයෙකි, සාදන්නෙකි, මවන්නෙකි, ඉතා උසස්ය. බෙදන්නෙකි, වසඟ කරගන්නෙකි, සත්වයින්ට පියෙකි. ඒ යම් යහපත් බඹකු විසින් අපි මවන ලද්දාහුවෙමුද, ඔහු නිත්‍යය, ඒකාන්තය, සදාකාලිකය, වෙනස් නොවන ගතියෙන් යුක්තය, සදාකාලික වස්තූන් සමග සම්බන්ධවූ කල එසේම සිටිනේය. ඒ යහපත් බඹු විසින් අපි මවන ලද්දාහුවෙමුද, ඒ අපි අනිත්‍යය, ස්ථිර නැත, ආයුෂ අඩුය, සිටි භවයෙන් චුතව මේ ආත්ම භාවයට ආවෙමු’යි.

“මහණෙනි, යම් කරුණකට පැමිණ, යමක් නිසා එක් කොටසක් සදාකාලිකය, එක් කොටසක් සදාකාලික නොවෙය

යන මතය ඇති සමහර මහණ බමුණෝ කොටසක් නිත්‍ය කොට කොටසක් අනිත්‍ය කොට ප්‍රකාශ කරත්ද මේ ඒ ප්‍රථම කරුණයි.

7 "දෙවැනිව, පින්වත් මහණ බමුණෝ එක් කොටසක් සදාකාලිකය එක් කොටසක් සදාකාලික නොවේය යන මතය ඇතුව ආත්මයද, ලොකයද, කොටසක් නිත්‍යකොට කොටසක් අනිත්‍යකොට කුමක් හේතු කොට ගෙන කුමක් නිසා ප්‍රකාශ කරත්ද?

"මහණෙනි, ක්‍රීඩාවෙන් නැසෙන්නා' නම් දෙවියෙක් ඇත්තේය. ඔහු බොහෝ වේලාවක් සිනාවෙහිත් ක්‍රීඩාවෙහිත් ඇලී වාසය කරයි. බොහෝ වේලාවක් සිනාවෙහි ක්‍රීඩාවෙහි ඇලී වාසය කිරීමෙන් ඔහුගේ සිත මුළාවේ. සිහි මුළාව නිසා ඒ දෙවියා දිව්‍ය ශරීරයෙන් චුතවේ.

8 "මහණෙනි, මේ කාරණය දකින්ට ලැබේ. එනම්:- එක්තරා සත්ත්වයෙක් ඒ දිව්‍ය ලොකයෙන් චුතව මේ මිනිස් බවට එයි. මේ ආත්මභාවයට ආ ඔහු ගිහිගෙය අත්හැර ගොස් ශාසනයෙහි පැවිදි වෙයි. ගිහිගෙයින් ගොස් ශාසනයට පැමිණි ඔහු කෙලෙස් හීන කිරීමේ වීර්ය කොට, එම වීර්ය පුහුණුකර, එම වීර්ය නැවත නැවත යෙදීමට පැමිණ, අප්‍රමාදයට පැමිණ, හොඳින් භාවනා කිරීමෙන් යම්සේ සිත එකඟකරගත් විට තමන්ගේ පෙර ජාතිය සිහි කෙරේද, ඉන් මතු සිහි නොකෙරේද, එසේවූ හිතේ තත්ත්වයක් ලබයි.

9 "ඔහු මෙසේ කියයි:- යම් ඒ පින්වත් දෙවි කෙනෙක් ක්‍රීඩාවෙන් නොවැනසුනේද, ඔහු ඉතා බොහෝ කාලයක් සිනාසීම් ක්‍රීඩා ආදියට නොපැමිණ වාසය කරයි. බොහෝ වේලාවක් සිනාසීම් ක්‍රීඩා ආදියෙහි නොයෙදී වාසය කරන ඔවුන්ගේ සිහිය මුළානොවේ. සිහි නොමුළාවීමෙන් ඒ දෙවියෝ ඒ ආත්මභාවයෙන් චුත නොවේ. ඔහු නිත්‍යවූවෝ, ඒකාන්ත වූවෝ, සදාකාලික වූවෝ, නොවෙනස්වන ගති ඇත්තෝව, සදාකාලිකවූ වස්තුමෙන් එසේම සිටිත්. යම්බඳුවූ අපි ඉතා වැඩිවූ ක්‍රීඩාවෙන් ක්ලාන්තවීමුද, ඒ අපි අධික වේලාවක් සිනාකෙළියෙහි ඇලී සැපයෙන් යුක්තව වාසය කරමු. වැඩි වේලාවක් සිනාසීම්

ක්‍රීඩා ආදියෙහි යෙදීවාසය කළාවූ අපේ සිහි මුළා විය. මුළා වීමෙන්ම අපි ඒ දිව්‍ය භාවයෙන් චුතවී අනිත්‍ය වීමු. ස්ථිර නැති වීමු. සුළු ආයුෂ ඇත්තෝ වුම්හ, මැරෙන ස්වභාව ඇතිවීමේ මිනිස් බවට ආවෙමු”යි කියායි.

“මහණෙනි, එක්කොටසක් සදාකාලිකය, එක් කොටසක් සදාකාලික නොවේය යන මතය ඇති සමහර මහණ බමුණෝ සමහර දේ නිත්‍යයයිද, සමහර දේ අනිත්‍යයයිද, යමක් හේතුකොට යමක් නිමිති කොට ප්‍රකාශ කරත් නම් ඒ දෙවැනි කරුණයි.

10 “තුන් වැනිවද පින්වත් මහණ බමුණෝ, එක් කොටසක් සදාකාලිකය, එක් කොටසක් සදාකාලික නොවේය යන මතය ඇතුව ආත්මයද ලෝකයද කොටසක් නිත්‍යකොට කොටසක් අනිත්‍යකොට කුමක් හේතු කොට කුමක් නිසා ප්‍රකාශ කරත්ද?

“මහණෙනි, ‘මනොපදොසික’ (සිත කිලුටුවීම) නම් දෙවියෙක් ඇත. ඔහු බොහෝ වේලා ක්‍රොධ සිතින් ඔවුනොවුන් දෙස බලයි. ඔහු බොහෝ වේලා ක්‍රොධයෙන් බලා ඔවුනොවුන් කෙරෙහි සිත කිලිටු කරගනී. ඔහු ඔවුනොවුන් කෙරෙහි කිලුටු සිත් ඇත්තේ වෙහෙසුනු ශරීර ඇත්තෙක් (වේ) වෙහෙසුනු සිත් ඇත්තේ ඒ දෙවියා ඒ දිව්‍යභාවයෙන් (සමූහයෙන්) චුතවේ.

11 “මහණෙනි, මෙවැනි දෙයක් සිදුවේ. එක්තරා සත්වයෙක් ඒ දිව්‍ය භාවයෙන් චුතව මෙලොවට එයි. මෙලොවට ඇවිත් ගිහිගෙයින් පිටව ශාසනයට ඇතුල්වේ. ගිහිගෙයින් නික්ම සස්නට පැමිණි (අය) ගේ කෙලෙසුන් හීනකරන වීර්ය කොට, භාවනා කොට, එය නිතර පුරුදු කොට අප්‍රමාදයට පැමිණ, යහපත් කල්පනාවට පැමිණ මෙවැනිවූ සිතෙහි සමාධිය ලබයි. ඒ සමාධියට ගිය සිතින් (සිත සමාධියට ගිය කල) පෙර විසූ ඒ ජාතිය සිහි කෙරේ, ඉන් ඈතට සිහි නොකෙරේ.

12 “ඔහු මෙසේ කියයිඃ- යම් ඒ පින්වත් දෙවියෝ සිත කිලුටු කරන්නෝ නොවෙත් නම් ඔව්හු දීර්ඝ කාලයක් ඔවුනොවුන් දෙස කෝප සිතින් නොබලත් නම් එවිට ඔව්හු වැඩිකලක්

ඔවුනොවුන් කෝප සිතින් නොබලා ඔවුනොවුන් කෙරෙහි සිත් දුෂ්ට නොකෙරෙත්. ඔවුනොවුන් කෙරෙහි දුෂ්ට සිත් නැති ඔවුහු වෙහෙස නුවූ ශරීර ඇත්තෝද වෙහෙස නුවූ සිත් ඇත්තෝද වෙත්. ඒ දෙවියෝ දිව්‍ය ආත්මභාවයෙන් චුත නොවෙත්. ඔව්හු නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය නොපෙරළෙන ස්වභාව ඇතියහ. සදාකාලික (දේ) මෙන් එසේම සිටිති. නුමුත් අපි යම් කරුණකින් සිත් කිලිටු කර ගනිමුද, ඒ අපි දීර්ඝ කාලයක් ඔවුනොවුන් කෝප සිතින් බැලුවෙමු. ඔවුනොවුන් දෙස කෝපව බලන ඒ අපි ඔවුනොවුන් කෙරෙහි හිත් කිලුටු කෙළෙමු. එසේවූ අපි ඔවුනොවුන් කෙරෙහි නපුරු සිත් ඇත්තෝ වෙහෙසෙන ශරීර සහසිත් ඇත්තෝ වෙමු. එවිට අපි ඒ දෙව් බවෙන් චුතව මෙසේ අනිත්‍ය, අස්ථිර, ආයුෂ අඩු, චුතවන ස්වභාව ඇති මේ මිනිසත් බවට පැමිණියෙමු.

"මහණෙනි, යම් කරුණක් හේතුකොටගෙන යමක් නිසා සමහර මහණ බමුණෝ එක් කොටසක් සදාකාලිකය එක් කොටසක් සදාකිලික නොවේය යන මතය ඇත්තේ ආත්මයත් ලොකයත් කොටසක් නිත්‍යයයිද කොටසක් අනිත්‍යයිද ප්‍රකාශ කරත්ද, මේ ඒ තුන්වැනි කරුණයි.

13 "හතරවැනිවත් පින්වත් මහණ බමුණෝ එක් කොටසක් සදාකාලිකය, එක් කොටසක් සදාකාලික නොවේ යයි යන මතය ඇතිව ආත්මයද, ලොකයද, කොටසක් නිත්‍ය යයිද, කොටසක් අනිත්‍යයයිද කුමක් හේතුකොට ගෙන කුමක් නිසා ප්‍රකාශ කරත්ද?

"මහණෙනි, මෙලොව ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ තර්ක කරන්නේය. පරීක්ෂා කරන්නේය. ඔහු ඒ ආකාර තර්ක කොට පරීක්ෂා සහිත විමසීමෙන් ලබාගත් තම වැටහීම (ඇතිවූ මතය) අනුව මෙසේ කියයි. ඇසද, කණද, නාසයද දිවද, ශරීරයද යන මේ වෙනස් කරුණුවලින් යුත් ආත්මය අනිත්‍යය, ස්ථිර නැත, සදාකාලික නොවේය, වෙනස්වන ස්වභාව ඇත්තේය. සිතද, මනසද, විඥානයද යනුවෙන් දක්වන

මේ ආත්මය නිත්‍යය, ස්ථිරය, සදාකාලිකය, වෙනස් නොවන ගති ඇත්තේය. සදාකාලික වූයේම ස්ථිරවම එසේම සිටින්නේය.”

“මහණෙනි, යම් කරුණක් හේතුකොට ගෙන, යමක් නිසා සමහර මහණ බමුණෝ එක් කොටසක් සදාකාලිකය එක් කොටසක් සදාකාලික නොවේය යන මතය ඇත්තෝ ආත්මයත් ලෝකයත් කොටසක් නිත්‍යයයිද කොටසක් අනිත්‍යයයිද ප්‍රකාශ කරත්ද, මේ ඒ හතර වැන්නයි.

14 “මහණෙනි, යම් ඒ මහණ බමුණෝ, එක්කොටසක් සදාකාලික එක් කොටසක් සදාකාලික නොවේය යන මතය ඇතුව කරුණු සතරකින් ආත්මයද ලොකයද කොටසක් නිත්‍යයයිද කොටසක් අනිත්‍යයයිද ප්‍රකාශ කරති.

“මහණෙනි, යම්කිසි මහණහුද බමුණෝද, එක්කොටසක් සදාකාලිකය එක් කොටසක් සදාකාලික නොවේය යන මතය ඇතුව ආත්මයද ලොකයද කොටසක් නිත්‍යකොට කොටසක් අනිත්‍ය කොට ප්‍රකාශ කරත්ද, ඒ සියල්ලෝ මේ කරුණු සතරින් හෝ මෙයින් එකකින් හෝ එකසේ ප්‍රකාශ කරති. මින් පිට නැත.

15 “මහණෙනි, මේ කරුණ තථාගතයෝ හොඳින් දනිත්. ‘මේ මිසදිටු (වැරදි මතයෙන් යුත්) කරුණු මෙසේ ගත්තෝය. මෙසේ තීරණය කරගත්තෝය. මෙවැනි ගති ඇත්තෝ වෙත්. ඔවුහු පරලෝ (මරණින් පසු) මෙසේ වෙති’ කියා තථාගතයෝ එයද දනිත්. ඉන් වැඩි උසස් ධර්මද දනිත්. ඒ දැනුම් එසේද තීරණය නොකෙරේ. එසේ තීරණය නොකරණ තථාගතයන් විසින් කෙලෙස් නැතිකිරීම (නිර්වාණය) තමන් විසින්ම අවබොධ කරණ ලදී. මහණෙනි, වේදනාවන්ගේ උත්පත්තියද, විනාශයද, රසවිඳීමද, විපතද, ඉන් මිදීමද ඇතිසැටි දැන, තථාගතයෝ එහි නොඇලී කෙලෙසුන්ගෙන් මිදුනෝය.

“මහණෙනි, මේ ධර්ම ගැඹුරුවූ, දැක්මට දුෂ්කරවූ දැනගැනීමට අමාරුවූ, ශාන්තවූ, මිහිරිවූ, තර්කයෙන්ම දැනගත හැකි නුවූ සියුම්වූ, නුවණ ඇත්තන් විසින් දතයුතු වෙත්. ඒ

ධර්ම තථාගතයෝ තමන්ගේම මහත් නුවණින් දැන ප්‍රකාශ කරති. ඒ ධර්මයන් කරණකොට ගෙන තථාගතයන්ගේ පැහැදිලිව පේන (විද්‍යමාන) ගුණය, කියන්නෝ හොඳින් කියති.

16 "මහණෙනි, කෙළවරක් ඇත කෙළවරක් නැතයයි අදහන සමහර මහණ බමුණෝ ලොකය කෙළවරක් ඇත කෙළවරක් නැතයයි කරුණු හතරකින් ප්‍රකාශ කරති. ඒ පින්වත් මහණ බමුණෝ කෙළවරක් ඇත කෙළවරක් නැත යයි අදහා ලොකය කෙළවරක් ඇතයයි කුමක් හේතුකොට ගෙන කුමක් නිසා කරුණු හතරකින් ප්‍රකාශ කරත්ද?

17 "මහණෙනි, මේ ලොකයෙහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ කෙලෙස් නැතිකරන වීර්යකොට, ඒ වීර්ය පුරුදුකොට නැවත නැවත පුහුණුකොට, අප්‍රමාදව, යහපත් කල්පනා ඇතිකොට, යම් සේ හිත එකඟකර ගත්කල (සක්වල කෙළවර කොට) සිතීමෙන් ලොකයේ කෙළවරක් ඇතැයි හිත එකඟකිරීමක් ඇතුව වාසය කරයි. ඔහු මෙසේ කියයි. 'හාත්පසින් වටවූ මේ ලොකය කෙළවරක් ඇත්තේය. එසේ කීමට හේතු කුමක්ද? මම කෙලෙස් නැති කරන වීර්ය කොට, ඒ වීර්ය නැවත නැවත පුහුණුකොට, අප්‍රමාදව යහපත් කල්පනාව ඇතිකොට, යම්සේ හිත එකඟ කරගත් කල කෙළවරක් ඇති ලොකයෙහි වාසය කෙරෙම්ද, එබඳු හිත් එකඟවීමක් ලබාගත්තෙමි. මේ හේතුවෙන් මම ලොකය කෙළවරක් ඇතුව හාත්පසින් වටවූ බව දනිමි.'

"මහණෙනි, සමහර මහණ බමුණෝ යමක් හේතුකොට ගෙන යමක් නිසා ලොකය කෙළවරක් ඇත කෙළවරක් නැතැයි මේ පළමුවැනි කරුණ මෙන් ප්‍රකාශ කරති.

18 "දෙවැනිවද සමහර පින්වත් මහණ බමුණෝ කෙළවරක් ඇත කෙළවරක් නැත යන ඇදහීම ඇතුව, ලොකය කෙළවරක් ඇත කෙළවරක් නැතයයි කුමක් හේතු කොට ගෙන කුමක් නිසා ප්‍රකාශ කරත්ද?

"මහණෙනි, මේ ලෝකයෙහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ කෙලෙස් නැති කරන වීර්ය කොට, ඒ වීර්ය නැවත නැවත

පුහුණුකොට, අප්‍රමාදව, යහපත් කල්පනාව ඇති කොට යම්සේ හිත එකඟ කරගත් කල (සක්වළ කෙළවර කොට) සිතීමෙන් ලෝකයේ කෙළවරයක් නැතැයි හිත එකඟ කිරීමක් ඇතුව වාසය කරයි. ඔහු මෙසේ කියයි. මේ ලොකය අනන්තය, කෙළවරක් නැත්තේය. එසේ කීමට හේතු කුමක්ද? මම කෙලෙස් නැතිකරන වීර්යකොට, ඒ වීර්ය නැවත නැවත පුහුණුකොට, අප්‍රමාදව, යහපත් කල්පනාව ඇතිකොට, යම්සේ හිත එකඟ කරගත් කල යම්සේ ලොව කෙළවරක් නැතැයි දැනීමක් ඇතුව ලොකයේ වාසය කෙරෙම්ද එබඳු හිත එකඟවීමක් ලබාගත්තෙමි. මෙයින් ලොකය අනන්තය කෙළවරක් නැත්තේයයි දනිමි.'

"මහණෙනි, සමහර මහණ බමුණෝ යමක් හේතුකොට ගෙන යමක් නිසා ලොකය අනන්තය, කෙළවරක් නැතැයි දෙවෙනි කරුණ මෙන් ප්‍රකාශ කරති.

19 "තුන්වැනිවද පින්වත් මහණ බමුණෝ කෙළවරක් ඇත කෙළවරක් නැත යන ඇදහීම ඇතුව ලොකය කෙළවරක් නැතයයි කුමක් හේතුකොටගෙන කුමක් නිසා ප්‍රකාශ කරත්ද?

"මහණෙනි, මේ ලොකයෙහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ කෙලෙස් නැතිකරන වීර්යකොට, ඒ වීර්ය නැවත නැවත පුහුණුකොට, අප්‍රමාදව යහපත් කල්පනාව ඇතිකොට යම්සේ හිත එකඟ කරගත් කල සමාධිගත සිත උඩින් යටින් නොවඩා හරහට වැඩූ බැවින් ලොකයේ උඩින් යටින් කෙළවරක් ඇතැයි හරයට කෙළවරක් නැතැයි යන චිත්ත සමාධියක් ලබා වාසය කරයි. ඔහු මෙස් කියයි;- 'මේ ලොකය කෙළවරක් ඇත්තේද කෙළවරක් නැත්තේද වෙයි. 'මේ ලොකය කෙළවරක් ඇත හාත්පසින් මං ඇතියි' මෙසේ යම් මහණ බමුණෝ කියත්ද ඔවුන්ගේ ඒ කීම බොරුවේ. 'මේ ලොකය කෙළවරක් ඇත හාත්පසින් වටවී ඇතැයි'- මෙසේ මහණ බමුණෝ කියත්ද ඔවුන්ගේ ඒ කීමද බොරුවේ. 'මේ ලොකය කෙළවරක් ඇත්තේද, කෙළවරක් නැත්තේද, වෙයි, එසේ කීමට හේතු කුමක්ද? මම කෙලෙස් නැතිකරන වීර්යකොට, ඒ වීර්ය නැවත නැවත පුහුණුකොට, අප්‍රමාදව, යහපත් කල්පනාව ඇතිකොට යම්සේ

හිත එකඟ කරගත් කල ලොව උඩ යට කෙළවරක් ඇති බවට ලකුණු ඇත්තේ යයි ද හරහට කෙළවරක් නැති බවට ලකුණු ඇත්තේයයිද එබඳු ධ්‍යානයක් ලැබ වාසය කරමි. මෙයින් මම ලොකය කෙළවරක් ඇතැයිද නැතැයිද දනිමි.'

"මහණෙනි, සමහර මහණ බමුණෝ යමක් හේතුකොට ගෙන යමක් නිසා ලොකය කෙළවරක් ඇත කෙළවරක් නැතැයි මේ තුන්වැනි කරුණ මෙන් ප්‍රකාශ කරති.

20 "හතරවැනිවද පින්වත් මහණ බමුණෝ කෙළවරක් ඇත කෙළවරක් නැත' යන ඇදහීම ඇතුව, ලොකය කෙළවරක් ඇත කෙළවරක් නැතයයි කුමක් හේතුකොට ගෙන කුමක් නිසා ප්‍රකාශ කරත්ද?

"මහණෙනි, මෙහි තර්කයෙන් විමසීම කර බලන්නාවූ යම් මහණෙක් හෝ බමුණෙක් ඇත්ද ඔහු තර්ක මාර්ගයෙන් විමසා බැලීමෙන් තමන්ගේ වැටහීම අනුව මෙසේ කියයි. මේ ලොකය කෙළවරක් ඇත්තේ නැත, කෙළවරක් නැත්තේ නැත. යම් ඒ මහණ බමුණෝ මේ ලොකය කෙළවරක් ඇතැයිද හාත්පසින් වටවී තිබේයයිද කියත් නම් ඔවුන්ගේ ඒ කීම බොරුය. යම් ඒ මහණ බමුණෝ මේ ලොකය කෙළවරක් නැතැයිද හාත්පසින් වටවී නැතැයිද කියත් නම් ඒ කීමත් බොරුය.

"යම් ඒ මහණ බමුණෝ මේ ලොකය කෙළවරක් ඇතැයිද, කෙළවරක් නැතැයිද, කියත්ද ඔවුන්ගේ කීම බොරුය මෙලොව කෙළවරක් ඇත්තේ නැත, කෙළවරක් නැත්තේ නැත.'

"මහණෙනි, සමහර මහණ බමුණෝ, 'කෙළවරක් ඇත කෙළවරක් නැත' යන බව අදහා යමක් හේතු කොට ගෙන යමක් නිසා ලොකය ගැන කෙළවරක් ඇත කෙළවරක් නැත යන මතය ප්‍රකාශ කරත්ද මේ ඒ හතරවැනි කරුණයි.

21 "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ කෙළවරක් ඇත කෙළවරක් නැත'යයි අදහා 'කෙළවරක් ඇත කෙළවරක් නැත' යන බව මේ කරුණු සතරින් ප්‍රකාශ කරති. මහණෙනි, යම්කිසි මහණහු හෝ බමුණෝ හෝ කෙළවරක් නැතයයි අදහා

කෙළවරක් ඇත කෙළවරක් නැත යන බව ප්‍රකාශ කරත්ද, ඒ සියල්ලෝ මේ කරුණු සතරින් හෝ මින් එක් කරුණකින් හෝ එසේ ප්‍රකාශ කරත්. මේ ප්‍රකාශයට මින් පිටත් අනික් කරුණක් ඇත.

22 "මහණෙනි, ඒ මේ කරුණ තථාගතයෝ දනිති. මේ වැරදි මත මෙසේ ගත් අය මෙසේ තීරණය කර ගත් අය මෙබඳු ගති ඇත්තෝ වෙත්. මෙබඳු පරලොවක් ඇත්තෝ වෙත් යනුයි. තථාගතයෝ එයද දනිති. ඊට වඩා උසස් ධර්මයන්ද දනිති. ඒ දැනුම (ලොභ, ද්වේෂ, මෝහයෙන් ඇතිවූ) තීරණයක් නොවේ. (තර්ක ආදියෙන්) තීරණයක් නොකරණ තථාගතයන්ගේ කෙලෙස් නිවීම තමන් විසින්ම අවබොධ කරනලදී.

"මහණෙනි, වේදනාවන්ගේ නැගීමද, බැහීමද, භුක්ති විඳීමද, ප්‍රතිඵලද, හික්මීමද ඇතිහැටි දැන තථාගතයෝ ඇල්මක් නොකොට කෙලෙසුන්ගෙන් මිදුනෝය.

"මහණෙනි, මේ (බුද්ධ) ධර්මය ගැඹුරුය. දුකසේ දැක්ක යුතුය, අමාරුවෙන් අවබොධ කටයුතුය, ශාන්තය, මිහිරිය තර්කයෙන් දැනගත නොහැකිය. සියුම්ය, පණ්ඩිතයින් විසින් දතයුතුය. එය තථාගතයෝ උසස් ඥාණයෙන් තමන්ම දැන වදාරති. එයින් (ඒ ධර්මයෙන්) තථාගතයන්ගේ ගුණ ඇතිහැටි කියන්නෝ හොඳින් කියත්.

23. "මහණෙනි, සමහර මහණ බමුණෝ 'අමරා වික්ෂේප' (අතට අසුනොවන ආඳුන්) නම් ඇදහීමක් ඇත්තෝ වෙත්. ඒ ඒ තැනදී ප්‍රශ්න ඇසූ කල කරුණු සතරකින් 'අමරා වික්ෂේප' වූවෝ වචන දමාගැසීමෙන් 'අමරා වික්ෂේප'යට පැමිණෙත්. ඒ පින්වත් මහණ බමුණෝ 'අමරා වික්ෂේපික'ව ඒ ඒ තැනදී ප්‍රශ්න ඇසූ කල කුමක් හේතුකොටගෙන කුමක් නිසා කරුණු සතරකින් 'අමරා වික්ෂේප' නම් වචන දමා ගැසීමට පැමිණෙත්ද?

24. "මහණෙනි, මේ ලොකයෙහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ මේ කුසල්යයි ඇතිහැටි නොදනියි. මේ අකුසල් යයි ඇතිහැටි නොදනියි. ඔහුට මෙසේ සිතෙයි 'මම මේ

කුසල්යයි හරිහැටි නොදනිමි. මේ අකුසල්යයි හරිහැටි නොදනිමි. මම මේ කුසල්යයි හරිහැටි නොදන්නෙමි, මේ අකුසල්යයි හරි හැටි නොදන්නෙමි. මේ කුසල යයි කියා හෝ පවසන්නේ නම් මේ අකුසලයයි හෝ පවසන්නේ නම් ඒ පැවසීමෙහිදී මට ලෝභය හෝ රාගය හෝ කෝපය හෝ ක්‍රෝධය හෝ වන්නේය. යම් කරුණකදී මට ලෝභය හෝ රාගය හෝ කෝපය හෝ ක්‍රෝධය හෝ වේද ඒ මාගේ පැවසීම බොරු වේ. මගේ යමක් බොරු වේ නම් එය මට දුකක් වේ යමක් මට දුකක් නම් ඒ මට අන්තරායකි.

"මෙසේ ඔහු බොරු කීමට භයින් බොරු කීමට ලජ්ජාවෙන් මේ කුසල්යයි නොපවසති, මේ අකුසලැයිද නොපවසති. ඒ ඒ තැන ප්‍රශ්න ඇසූ කල 'අමරා වික්ෂේප' නම් වචන දමා ගැසීමට පැමිණේ. 'එසේ ද මාගේ ගැන්මක් නැත, එසේයයිද මාගේ ගැන්මක් නැත. මේ වෙන ආකාරයයිද මාගේ ගැන්මක් නැත. එසේ නොවේයයිද මාගේ ගැන්මක් නැත. එසේ ගැන්මක් නැත්තේත් නැත.

"මහණෙනි, 'අමරා වික්ෂේපවූ සමහර මහණ බමුණෝ යමක් හේතුකොටගෙන යමක් නිසා ඒ ඒ තැනදී ප්‍රශ්න ඇසූ කල 'අමරා වික්ෂේපය' නම් වචන දමා ගැසීමට පැමිණෙත්ද මේ ඒ ප්‍රථම කරුණයි.

**25.** "දෙවෙනිවද පින්වත් මහණ බමුණෝ කුමක් කරණ කොටගෙන කුමක් නිසා 'අමරා වික්ෂේපව' ඒ ඒ තැනදී ප්‍රශ්න ඇසූ කල 'අමරා වික්ෂේපය' නම් වචන දමා ගැසීමට පැමිණෙත්ද?

"මහණෙනි, මේ ලොකයේ යම් මහණෙක් හෝ බමුණෙක් හෝ මේ කුසල්යයි හරිහැටි නොදනි. මේ අකුසල්යයි හරි ආකාර නොදනී. ඔහුට මෙසේ සිතේ: 'මම මේ කුසල්යයි හරි ලෙස නොදනිමි. මේ අකුසල්යි හරි ලෙස නොදන්නෙමි. මේ කුසල්යයි හෝ පවසම් නම් මේ අකුසල්යයි හෝ පවසම් නම් ඒ පැවසීමෙහිදී මට ලෝභය හෝ රාගය හෝ කෝපය හෝ ක්‍රෝධය

හෝ වේ නම් ඒ මට තද ඇල්මක් වේ. යමක් තද ඇල්මක් නම් ඒ මට දුකක් වේ. යමක් මට දුකක් නම් ඒ මට අන්තරායකි.”

“මෙසේ ඔහු තද ඇල්මට භයින්, තද ඇල්මට ලජ්ජාවෙන් මේ කුසල්යයි නොපවසයි. මේ අකුසල්යයි නොපවසයි. ඒ ඒ තැනදී ප්‍රශ්න ඇසූ කල ‘අමරා වික්ෂේපය’ නම් වචන දමා ගැසීමට පැමිණේ. මෙසේ ගැන්ම මගේ නැත. එසේ යයිද මට නැත වෙන අනික් මාර්ගයක්ද මට නැත. මට එසේ නැත්තේ නොවේය. මට නැත්තේ නොවන්නේත් නොවේය.”

“මහණෙනි, ‘අමරා වික්ෂේපිකවූ’ සමහර මහණ බමුණෝ යමක් කරණකොටගෙන යමක් නිසා ඒ ඒ තැනදී ප්‍රශ්න ඇසූ කල ‘අමරා වික්ෂේපය’ නම්වූ වචන දමා ගැසීමට පැමිණෙත්ද මේ ඒ දෙවැනි කරුණයි.

**26.** “තුන්වැනිවද ‘අමරා වික්ෂේපය’ ඇතිවූ පින්වත් මහණ බමුණෝ කුමක් හේතු කොට ගෙන කුමක් නිසා, ඒ ඒ තැනදී ප්‍රශ්න ඇසූ කල ‘අමරා වික්ෂේපය’ නම්වූ වචන දමා ගැසීමට පැමිණෙත්ද?

“මහණෙනි, මෙහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ මේ කුසල්යයි හරි ආකාර නොදනී. මේ අකුසල්යයි හරි ආකාර නොදනී. ඔහුට මෙසේ සිතේ. ‘මම මේ කුසල්යයි හරිලෙස නොදනිමි. මේ අකුසල්යයි හරිලෙස නොදනිමි එසේ මම මේ කුසල්යයි හරි ලෙස නොදන්නෙමි, මේ අකුසල්යයි හරිලෙස නොදන්නෙමි මේ කුසල්යයි හෝ පවසම් නම්’ මේ අකුසල්යයි හෝ පවසම් නම්, පණ්ඩිතවූ, සියුම් ලෙස තේරුම් ගැනීමේ බලය ඇති, වාදකොට පුරුදු ඇති, වාළවෙධි, නම් දුනුවායන් (දුනුවලින් විදින්නන්) සමානව තමන්ගේ ඥානයෙන් අනුන්ගේ ඇදහීම් බිඳිමින් මෙන් හැසිරෙන මහණ බමුණෝ ලොකයෙහි ඇත්තාහුමය. ඔව්හු ඒ කුසල් අකුසල් ගැන ‘ඔබේ ඇදහීම කෙසේදැයි, මගෙන් ඇසුවෝ නම් කරුණු දක්වා ඇසුවෝ නම්, මාගේ වාදයෙහි දොස් දක්වා මා තැතිගන්වන්නෝ නම් ඔවුන්ට හොඳින් වැටහෙන ලෙස උත්තරදීමට මම සමත් නොවෙමි. එසේ යම් කෙනෙකුට උත්තරදීමට සමත් නොවෙම්ද

එය මට දුකක් වේ. යමක් මට දුකක් වේද එය මට අන්තරාය පිණිස වේ.' මෙසේ අනුන් විසින් ගුණ දොස් කීම ගැන භයින් අනුන් විසින් ගුණ දොස් කීම ගැන ලජ්ජාවෙන් මේ කුසල්යයි නොකියා මේ අකුසල් යයි නොකියා ඒ ඒ තැන්වලදී ප්‍රශ්න ඇසූ කල 'අමරා වික්ෂේප' නම්වූ වචන දමාගැසීමට පැමිණේ. මෙසේද මට හැඟීමක් නැත. එසේත් මට නැත වෙන ආකාරයෙනුත් නැත, නැතැයිද මට නැත, නැත්තේ නොවේයි ද මට නැතැ'යි කියායි.

"මහණෙනි, අමරා වික්ෂේපිකවූ සමහර මහණ බමුණෝ යම් කරුණකට පැමිණ, යමක් හේතුකොට ගෙන ඒ ඒ තැනදී ප්‍රශ්න කළ කල වචන දමාගැසීම නම්වූ අමරා වික්ෂේපයට පැමිණෙත්ද, මේ ඒ තුන් වැනි කරුණයි.

27. "හතරවැනිවද පින්වත් මහණ බමුණෝ 'අමරා වික්ෂේපය ඇත්තෝ කුමක් හේතුකොටගෙන කුමක් නිසා ඒ ඒ තැනදී ප්‍රශ්න ඇසූ කල වචන දමාගැසීම් නම් අමරා වික්ෂේපයටද පැමිණෙත්ද?

"මහණෙනි, මෙහි යම් මහණෙක් හෝ බමුණෙක් නුවණ නැතිව ලොකු මෝඩයෙක් වේ. ඔහු අනුවණ බැවින් බොහෝ මෝඩ බැවින් ඒ ඒ තැනදී ප්‍රශ්න කළ කල 'අමරා වික්ෂේප' නම්වූ වචන දමාගැසීමට පැමිණේ. 'මොන යම් පරලොවක් ඇත්දැයි මා මෙසේ විචාළේ නම් එය මෙසේ ඔබට කියමි. මෙසේත් මට නැත, එසේත්, මට නැත, වෙන යම් ආකාරයයිද මට නොසිතේ. නැතැයිද මට නොසිතේ. නැත්තේත් නැතැයිද මට නොසිතේ.' ඒ මන්ද? පරලෝ නැත්දැයි මා විචාලෙහි නම් එය මෙසේ ඔබට කියමි. 'මෙසේත් මට නැත, එසේත් මට නැත, වෙනයම් ආකාරයයිද මට නොසිතේ නැතැයිද මට නොසිතේ. නැත්තේත් නැතැයිද මට නොසිතේ.' නොම නැත්තේ වේද? ඒ මන්ද? පරලොවක් ඇත්තේත් වේද නැත්තේත් වේදැයි මා විචාළොත් එය මෙසේ ඔබට කියමි. 'මෙසේත් මට නැත, එසේත් මට නැත, වෙන යම් ආකාරයයිද මට නොසිතේ. නැතැයිද මට නොසිතේ, නැත්තේත් නැතැයිද මට නොසිතේ,

නොම නැත්තේත් වේද, ඒ මන්ද? පරලොවක් ඇත්තේත් නොවේද නැත්තේත් නොවේදැයි මා විචාළොත් එය මෙසේ ඔබට කියමි. 'මෙසේත් මට නැත, එසේත් මට නැත, වෙනයම් ආකාරයයි මට නොසිතේ. නැතැයිද මට නොසිතේ. නොමනැත්තේද වේද? ඕපපාතික* 'සත්වයෝ ඇත්ද? ඕපපාතික සත්වයෝ නැත්ද? ඕපපාතික සත්වයෝ ඇත්තාහුත් නැත්තාහුත් වෙත්ද? ඕපපාතික සත්වයෝ නොම ඇත්තාහුත් නොම නැත්තාහුත් වෙත්ද? හොඳ හෝ නරක කර්මයන්ගේ ඵල විපාක ඇත්ද? හොඳ හෝ නරක කර්මයන්ගේ ඵල විපාක නැත්ද? හොඳ හෝ නරක කර්මයන්ගේ ඵල විපාක ඇත්තේත් නැත්තේත් වේද? හොඳ හෝ නරක කර්මයන්ගේ ඵල විපාක නොම ඇත්තේත් නොම නැත්තේත් වේද? තථාගතයෝ මරණින් මතුවෙත්ද? තථාගතයෝ මරණින් මතු නොවෙත්ද? මරණින් මතු තථාගතයෝ ඇත්තේත් වෙත්ද? නැත්තේත් වෙත්ද? තථාගතයෝ මරණින් මතු නොම ඇත්තේත් වෙත්ද නොම නැත්තේත් වෙත්දැයි විචාළොත් මට මෙසේ සිතේ නම් 'තථාගතයෝ මරණින් මතු නොම ඇත්තේත් වෙත්. නොම නැත්තේ වෙත්'යයි ඔබට කියන්නෙමි. මෙසේත් මට (සිතෙන්නේ) නැත, එසේත් මට නැත. වෙනත් ආකාරයයිද මට නැත. නැතැයිද මට නොසිතේ. නොම නැතැයිද මට නොසිතේ.'

"මහණෙනි, 'අමරා වික්ෂේපික'වූ සමහර මහණ බමුණෝ යම් කරුණකට පැමිණ යමක් හේතුකොටගෙන ඒ ඒ තැනදී ප්‍රශ්න කළ කල වචන දමාගැසීම නම්වූ අමරා වික්ෂේපයට පැමිණෙත්ද, මේ ඒ හතරවැනි කරුණයි.

28. "මේ ඒ 'අමරා වික්ෂේපික'වූ මහණ බමුණෝ ඒ ඒ තැනදී ප්‍රශ්න ඇසූ කල මේ හතර ආකාරයෙන් වචන දමාගැසීම නම් අමරා වික්ෂේපයට පැමිණෙත්. 'මහණෙනි අමරා වික්ෂේපිකවූ යම් මහණෙක් හෝ බමුණෙක් හෝ ඒ ඒ කරුණෙහි

* ඉබේ ඉපදුන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රශ්න ඇසූ කල වචන දමා, ගැසීම නම් අමරා වික්ෂේපයට පැමිණෙද්ද, ඒ සියල්ලෝම මේ හතරින් හෝ එයින් එකකින් හෝ එසේ පැමිණෙත් මෙයින් පිටත කිසි කරුණකින් නොවේ.

**29.** "මහණෙනි, මේ කරුණ තථාගතයෝ දනිති. එනම් 'මේ වැරදි මත මෙසේ ගත්තාවූ මෙසේ 'පරාමර්ශනය කළාහු මෙබඳු ගති ඇත්තෝ වෙත්. මෙබඳු පරලොවක් ඇත්තෝ වෙත්" තථාගතයෝ එයද දනිති. ඊට වඩා උසස් ධර්මයන්ද දනිති ඒ දැනුම් (ලොභ, ද්වේෂ, මොහයෙන් ඇතිවූ) තීරණයක් නොවේ. (තර්ක ආදියෙන් තීරණයක් නොකරන තථාගතයන්ගේ කෙලෙස් නිවීම තමන් විසින්ම අවබොධ කරන ලදී. 'මහණෙනි, වේදනාවන්ගේ නැගීමද, බැහීමද, භුක්ති විඳීමද, ප්‍රතිඵලද, හික්මීමද, ඇතිහැටි දැන තථාගතයෝ ඇල්මක් නොකොට කෙලෙසුන්ගෙන් මිදුනෝය.

"මහණෙනි, මේ (බුද්ධ) ධර්මය ගැඹුරුය, දුකසේ දැක්ක යුතුය, දුරවබොධ කටයුතුය, ශාන්තය, මිහිරිය, තර්කයෙන් දැනගත නොහැකිය, සියුම්ය. නුවණ ඇත්තන් විසින් දත යුතුය. එය තථාගතයෝ උසස් ඥානයෙන් තමුන්ම දැන වදාරති. එයින් (ඒ ධර්මයෙන්) තථාගතයන්ගේ ගුණ ඇති හැටි කියන්නෝ හොඳින් කියත්.

**30.** "මහණෙනි, සමහර මහණ බමුණෝ අහේතුක (ඉබේ) උත්පත්තිය ඇතැයි විශ්වාස කරත්. ඔව්හු කරුණු දෙකකින් ආත්මයද ලොකයද (ඉබේ) අහේතුකව උපන්නේ යයි ප්‍රකාශ කරති. ඒ පින්වත් මහණ බමුණෝ අහේතුක උත්පත්තිය අදහන්නෝව ආත්මයද ලොකයද හේතුවක් නැතුව (ඉබේ) හටගත්තේයයි කුමන කරුණකින් කුමක් නිසා ප්‍රකාශ කරත්ද?

**31.** "මහණෙනි, 'රූපය පමණක් ඇත්තා' නම් දෙවියෙක් වේ. ඔහු (ප්‍රතිසන්ධි චිත්තය) ජීවිතයක් ඊළඟ ජීවිතයත් එකතු කරන හිත පහළවීමෙන්ම ඒ දේව භාවයෙන් චුතවෙත්. 'මහණෙනි, මේ කාරණය පැහැදිලිව පෙනේ. එනම් එක්තරා සත්වයෙක් ඒ ශරීරයෙන් චුතව මේ මිනිස් බවට පැමිණේ. ඒ භවයට පැමිණ ගිහිගෙන් නික්ම මහණ වෙයි. ගිහිගෙන් නික්ම

පිට ශාසනයකට ඇතුල්වූ ඔහු කෙලෙස් නසන වීර්යයට පැමිණ, ඒ වීර්යය නැවත නැවත දියුණුකර භාවනාවට පටන්ගෙන, අප්‍රමාදයට පැමිණ, යහපත් සිහිකිරීමට පැමිණ, හිත එකඟ කරගත් කල හිතෙහි ඉහත ආත්මයේ උත්පත්තිය සිහිකරන හිතේ එකඟකමක් ලබයි. එයින් ඔබ සිහි නොකෙරෙයි. ඔහු මෙසේ කියයි. ආත්මයද ලොකයද හේතුවක් නැතුව (ඉබේ) උපන්නේය. එසේ කියන්නේ මන්ද? මම 'පූර්වයෙහි නොවීමි. ඒ මම පෙර නොවී (නොසිට) දැන් සත්වභාවයට පැමිණියෙමි.'

"මහණෙනි, යමක් කරණකොටගෙන යමක් නිසා හේතුවක් නැතිව උත්පත්තියක් ලැබේයයි යන මත ඇති සමහර මහණ බමුණෝ ආත්මයද ලොකයද ඉබේ පහළවීයයි කියත්ද මේ එහි පළමුවැනි කාරණයයි.

32. "දෙවැනිවද ඒ පින්වත් මහණ බමුණෝ කුමක් කරණකොටගෙන කුමක් නිසා හේතුවක් නැති උත්පත්ති ඇතැයි විස්වාස කරන්නෝව ආත්මයද ලොකයද හේතුවක් නැතුව හටගත්තේයයි කියද්ද?

"මහණෙනි, මේ ලෝකයෙහි යම්කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ තර්ක කරන්නෙක්ව, විමසන්නෙක්ව, තර්කයෙන් සහ විමසීමෙන් වටහාගෙන මෙසේ කියයි: 'ආත්මයද ලොකයද අහේතුවකව (ඉබේම) උපන්නේය."

"මහණෙනි, ඇතැම් මහණ බමුණෝ යමක් කරණකොට ගෙන යමක් නිසා හේතුවක් නැති උත්පත්ති ඇතැයි විස්වාස කර ආත්මයද ලොකයද අහේතුකව උපන්නේයයි ප්‍රකාශ කරති. මේ එහි දෙවැනි කාරණයයි.

33. "මහණෙනි, ඒ මහණ බමුණෝ හේතුවක් නැති උත්පත්ති ඇතැයි විස්වාස කර මේ කරුණු දෙකින් ආත්මයද ලොකයද හේතුවක් නැතුව (ඉබේම) උපන්නේයයි ප්‍රකාශ කරති. ඒ සියල්ලෝම මේ කරුණු දෙකින් හෝ එයින් එකකින් හෝ එසේ ප්‍රකාශ කරති. මෙයින් පිට කරුණකින් නොවේ.

34. "මහණෙනි, මේ (බුද්ධ) ධර්මය ගැඹුරුය, දුකසේ දැක්ක යුතුය, දුරවබොධය, ශාන්තය, මිහිරිය, තර්ක මාර්ගයෙන් දැනගත

නොහැක. සියුම්ය, නුවණ ඇත්තන් විසින් දැනගත යුතුය. තථාගතයෝ එය තමන්ගේම උසස් ඥානයෙන් දැක ප්‍රකාශ කළෝය. එයින් තථාගතයන්ගේ ඇතිසැටිවූ ගුණ කියන්නෝ හොඳින් කියති.

**35.** "මහණෙනි, ඒ මේ මහණ බමුණෝ අතීතය ගැන කල්පනා කරන්නෝව, අතීතය ගැන ඇදහීම් ඇත්තෝව, අතීතය ගැන කරුණු දහඅටකින් නොයෙක් මත දක්වන වචන කියති. මහණෙනි, ඒ යම් මහණෙක් හෝ බමුණෙක් හෝ අතීතය ගැන කල්පනා කරන්නෝව, අතීතය ඇදහීම් ඇත්තෝව, අතීතය ගැණ නොයෙක් මත දක්වන වචන කියද්ද? ඒ සියල්ලෝම මේ කරුණු දහඅටෙන් හෝ මොවුන් අතුරෙන් එකකින් හෝ කියති. මෙයින් පිටත වූවකින් නොකියති.

**36.** "මේ මත මෙසේ ගත්තාහුය, මෙසේ තීරණයකට පැමිණියාහුය, මෙබඳු ගති ඇතිවන්නාහුය, මෙබඳු පරලොවගෙන දෙන්නාහුයයි මෙයද තථාගතයෝ දනිති. මෙයින් මත්තෙහිවූද දනිති, ඒ දැනීම (රාග ද්වේෂ මෝහයෙන්) තීරණය නොකෙරෙති එසේ තීරණය නොකරන තථාගතයන් විසින් තමන්ගේ උසස් ඥානයෙන්ම කෙලෙස් නැති කිරීම දැනගන්නා ලද්දේය, 'මහණෙනි. වේදනා ඉපදීමද, බැසීමද, භුක්තිවිඳීමද, ප්‍රතිඵලද, නිවනද ඇතිහැටි දැන තථාගතයෝ කෙලෙසුන්ගෙන් මිදුනෝය.

"මහණෙනි, මේ (බුද්ධ) ධර්මය ගැඹුරුය, දුකසේ දැක්ක යුතුය, දුරවබොධය, ශාන්තය, මිහිරිය, තර්කයෙන් දැනගත නොහැකිය, සියුම්ය, නුවණ ඇත්තන් විසින් දැනගත යුතුය, එය තථාගතයෝ තමන්ගේම උසස් ඥානයෙන් දැක ප්‍රකාශ කළෝය. එයින් තථාගතයන්ගේ ඇතිසැටිව ගුණ කියන්නෝ හොඳින් කියති.

**37.** "මහණෙනි, අනාගතය කල්පනා කරන්නාවූ අනාගතය ගැන විස්වාස ඇති, අනාගතය ගැන කරුණු හතලිස් හතරකින් නොයෙක් මත දක්වන වචන කියන්නාවූ මහණ බමුණෝ ඇත්තාහුය. ඒ පින්වත් මහණ බමුණෝ කුමක් කරණ කොට ගෙන කුමක් නිසා අනාගතය කල්පනා කරන්නෝව අනාගතය

ගැන මත ඇත්තෝව අනාගතය ගැන කරුණු හතලිස් හතරකින් නොයෙක් මත ප්‍රකාශ කරණ වචන කියද්ද?

38. "මහණෙනි, මරණින් මතු ආත්මයෙහි ලකුණු (සංඥා) ඇත්තේයයි මත ඇති සමහර මහණ බමුණෝ ඇත්තාහුය. මරණින් මත්තෙහි සංඥා ඇති ආත්මය දහසය ආකාරයකින් ඔවුහු ප්‍රකාශ කරත්. ඒ පින්වත් මහණ බමුණෝ කුමක් කරණ කොට ගෙන කුමක් නිසා දහසය ආකාරයකින් මත්තෙහි ආත්මය ලකුණු ඇත්තේය යන විස්වාසය ඇත්තෝ මරණින් මත්තෙහි ආත්මය ලකුණු ඇත්තේයයි ප්‍රකාශ කරත්ද?

"ආත්මය රූප සහිතය, නිත්‍යය, මරණින් මතු ලකුණු ඇත්තේයයි ප්‍රකාශ කරති. ආත්මය අරූපීය, නිත්‍යය, මරණින් මතු ලකුණු ඇත්තේයයි ප්‍රකාශ කරති. ආත්මය රූප ඇත්තේද රූප නැත්තේද වෙයි. නිත්‍යය, මරණින් මතු ලකුණු ඇත්තේයයි ප්‍රකාශ කරති. ආත්මය රූපයක් නැත්තේමද අරූප නැත්තේ නොවෙද වෙයි.

"ආත්මය කෙළවරක් (අන්තයක්) ඇත්තේ වෙයි. ආත්මය කෙළවරක් නැත්තේ වෙයි. ආත්මය කෙළවරක් ඇත්තේද නැත්තේද වෙයි. ආත්මය කෙළවරක් නැත්තේද නොම නැත්තේද වෙයි ආත්මය එකම ලකුණුවලින් යුතු වෙයි. ආත්මය නොයෙක් ලකුණුවලින් යුතුවෙයි. ආත්මය ඉතා කුඩා ලකුණුවලින් යුතුවෙයි. ආත්මය සීමාවක් නැති ලකුණෙන් යුතු වෙයි, ආත්මය නොඅනුමාන සැපයෙන් යුතු වෙයි. ආත්මය නොඅනුමාන දුකින් යුතු වෙයි. ආත්මය දුක් සැප දෙකෙන් යුතුවෙයි. ආත්මය නො දුකින් යුතු නො සැපෙන් යුතු වෙයි. ඒ ආත්මය නිත්‍යයයි මරණින් මතු සංඥා (ලකුණු ඇත්තේයයි ප්‍රකාශ කරති.

39. "මහණෙනි, ඒ මහණ බමුණෝ මරණින් මතු සංඥා ඇතැයි අදහන්නෝව මේ කරුණු දහසයෙන් මරණින් මතු ආත්මය ලකුණු ඇත්තක් කොට ප්‍රකාශ කරති. මහණෙනි, යම්කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ මරණින් මතු සංඥා ඇතැයි අදහන්නෝව, මරණින් මතු ආත්මය ලකුණු ඇත්තක් කොට

ප්‍රකාශ කරත්ද, ඒ සියල්ලෝ මේ සොළොස් වස්තුවෙන් එසේ ප්‍රකාශ කරත්. නැතහොත් මෙයින් එකකින් ප්‍රකාශ කරත්. මෙයින් පිටතවූ එකකින් ප්‍රකාශ නොකරත්.

**40.** "මේ මත මෙසේ ගත්තාහුය, මෙසේ තීරණයකට පැමිණියාහුය. මෙබඳු ගති ඇතිවන්නාහුය, මෙබඳු පරලොව ගෙන දෙන්නාහුයයි මෙයද තථාගතයෝ දනිති මෙයින් මත්තෙහිවූද දනිති. ඒ දැනීම (රාග ද්වෙෂ මොහයෙන්) තීරණය නොකෙරෙති. එසේ තීරණය නොකරණ තථාගතයන් විසින් තමන්ගේ උසස් ඥාණයෙන්ම කෙලෙස් නැතිකිරීම දැනගන්නා ලද්දේය. මහණෙනි, වේදනා ඉපදීමද, බැසීමද, භුක්තිවිඳීමද, ප්‍රතිඵලද, නිවනද ඇතිහැටි දැන තථාගතයෝ කෙලෙසුන්ගෙන් මිදුනෝය.

"මහණෙනි, මේ (බුද්ධ) ධර්මය ගැඹුරුය, දුකසේ දැක්ක යුතුය. දුරවබොධය, ශාන්තය, මිහිරිය, තර්කයෙන් දැනගත නොහැකිය සියුම්ය, නුවණ ඇත්තන් විසින් දැනගත යුතුය. එය තථාගතයෝ තමන්ගේම උසස් ඥානයෙන් දැන ප්‍රකාශ කළෝය. එයින් තථාගතයන්ගේ ඇතිසැටි ගුණ කියන්නෝ හොඳින් කියති.

(දෙවැනි බණ වරයි.

## III

**1.** "මහණෙනි, සමහර මහණ බමුණෝ මරණින් මතු ලකුණු නැතැයි අදහන්නෝව කරුණු අටකින් මරණින් මතු ආත්මය මරණින් මතු ලකුණු නැත්තක් කොට ප්‍රකාශ කරත්. ඒ පින්වත් මහණ බමුණෝ කුමක් කරණ කොටගෙන කුමක් නිසා මරණින් මතු ලකුණු නැතැයි අදහන්නෝව කරුණු අටකින් මරණින් මතු ආත්මය ලකුණු නැත්තක් කොට පෙන්වත්ද?

**2.** "මරණින් මතු රූප ඇති නිත්‍ය ආත්මයක් වෙයි. එය ලකුණු නැත්තේයයි ප්‍රකාශ කරත්. රූපය නැති ආත්මයක්වෙයි. එය ලකුණු නැත්තේයයි ප්‍රකාශ කරත් රූපය ඇත්තාවූද රූපය නැත්තාවූද ආත්මයක් වෙයි. රූපය නැත්තාවුද අරූපය

නැත්තාවූද ආත්මයක් වෙයි, අන්තයක් ඇත්තාවූද ආත්මයක් වෙයි. අන්තයක් නැත්තාවූද ආත්මයක් වෙයි. අන්තයක් ඇත්තාවූද අන්තයක් නැත්තා වූද ආත්මයක් වෙයි. අන්තයක් නොම ඇත්තාවූද අන්තයක් නොම නැත්තාවූද ආත්මයක් වෙයි. එය මරණින් මතු නිත්‍යවූ බැවින් ලකුණ නැත්තේයයි ප්‍රකාශ කරත්.

3. "මහණෙනි, ඒ මහණ බමුණෝ මරණින් මතු ලකුණු නැතැයි අදහන්නෝව, මේ කරුණු අටෙන් මරණින් මතු ආත්මය ලකුණු නැත්තක් කොට ප්‍රකාශ කරති. මහණෙනි, සමහර මහණහු හෝ බමුණෝ හෝ මරණින් මතු ලකුණු නැතැයි අදහන්නෝව මරණින් මතු ආත්මය ලකුණු නැත්තක් කොට ප්‍රකාශ කරත්ද ඒ සියල්ලෝම මේ කරුණු අටෙන් ප්‍රකාශ කරත් මෙයින් එකකින් හෝ ප්‍රකාශ කරත්. මෙයින් පිටත එකකින් ප්‍රකාශ නොකරත්.

4. "මහණෙනි, මේ මතය මෙසේ ගත්තාහුය, මෙසේ තීරණයකට පැමිණියාහුය, මෙබඳු ගති ඇති වන්නාහුය, මෙබඳු පරලොව ගෙනදෙන්නාහුයයි මෙයද තථාගතයෝ දනිති ඒ දැනීම (රාග ද්වෙෂ මෝහයෙන්) තීරණය නො කෙරෙති. එසේ තීරණය නොකරන තථාගතයන් විසින් තමන්ගේ උසස් ඥානයෙන්ම කෙළෙස් නැති කිරීම දැන ගන්නා ලද්දේය. 'මහණෙනි, වේදනා ඉපදීමද, බැසීමද, භුක්ති විඳීමද, ප්‍රතිඵලද, නිවනද ඇතිහැටි දැන තථාගතයෝ කෙළෙසුන් ගෙන් මිදුනෝය.

"මහණෙනි, මේ (බුද්ධ) ධර්මය ගැඹුරුය, දුකසේ දැක්ක යුතුය. දුරවබෝධය, ශාන්තය, මිහිරිය, තර්කයෙන් දැනගත නොහැකිය, සියුම්ය නුවණ ඇත්තන් විසින් දැනගත යුතුය. එය තථාගතයෝ තමන්ගේම උසස් ඥානයෙන් දැන ප්‍රකාශ කළෝය. එයින් තථාගතයන්ගේ ඇතිසැටි ගුණ කියන්නෝ හොඳින් කියති.

5. "මහණෙනි, සමහර මහණ බමුණෝ මරණින් මතු නොම සංඥා (ලකුණු) ඇති නොම අසංඥා (ලකුණක් නුවූදේ) ඇති මත ඇත්තෝ වෙති. ඔහු කරුණු අටකින් මරණින් මතු ආත්මය

නොම සංඥා නොම අසංඥා කොට පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ කුමක් කරණ කොට ගෙන කුමක් නිසා කරුණු අටකින් මරණින් මතු නොම සංඥා ඇති නොම අසංඥා ඇති මත ඇත්තෝව මරණින් මතු ආත්මය නොම සංඥා ඇත්තේය, නොම අසංඥා ඇත්තේයයි කරුණු අටකින් ප්‍රකා කරද්ද?

**6.** "මරණින් මතු ආත්මය නිත්‍යය, රූප ඇත්තක්ය නොම සංඥා ඇති නොම අසංඥා ඇතියයි ප්‍රකාශ කරත්. මරණින් මතු අරූපීවූ ආත්මය නිත්‍යය නොම සංඥා ඇතිවූ නොම අසංඥා ඇතිවූයයි ප්‍රකාශ කරත්. රූපිවූද අරූපිවූද ආත්මය නිත්‍යය නොම සංඥා ඇතිවූ නොම අසංඥා ඇතිවූයයි ප්‍රකාශ කරත්. නොම රූප ඇති නොම අරූප ඇති ආත්මය නිත්‍යය නොම සංඥා ඇතිවූ නොම අසංඥා ඇතිවූයයි ප්‍රකාශ කරත්. කෙළවරක් ඇති ආත්මයක් වෙයි. එය නිත්‍යය මරණින් මතු නොම සංඥා ඇති නොම අසංඥා ඇතියයි ප්‍රකාශ කරත්. කෙළවරක් නැති ආත්මයක් වෙයි. එය නිත්‍යය මරණින් මතු නොම සංඥා ඇති නොම අසංඥා ඇතියයි ප්‍රකාශ කරත්. කෙළවරක් ඇත්තාවූද කෙළවරක් නැත්තාවූද ආත්මයක් වෙයි එය නිත්‍යය මරණින් මතු නොම සංඥා ඇති නොම අසංඥා ඇතියයි ප්‍රකාශ කරත්. කෙළවරක් නැත්තා වූද කෙළවරක් නොම ඇත්තාවූද ආත්මයක් වෙයි. එය නිත්‍යය මරණින් මතු නොම සංඥා ඇති නොම අසංඥා ඇති යයි ප්‍රකාශ කරත්.

**7.** "මහණෙනි, ඒ මහණ බමුණෝ මරණින් මතු ආත්මය ප්‍රකාශ කරන්නාහු නොම සංඥා ඇති නොම අසංඥා ඇතියයි මත අදහන්නෝ කරුණු අටකින් මරණින් මතු ආත්මය නොම සංඥා ඇති නොම අසංඥා ඇතියයි ප්‍රකාශ කරත්. මහණෙනි, යම්කිසි මහණහු හෝ බමුණෝ හෝ මරණින් මතු ආත්මය ගැන නොම සංඥා ඇති නොම අසංඥා ඇතියයි අදහා මරණින් මතු ආත්මය නොම සංඥා ඇති නොම අසංඥා ඇතියයි, ප්‍රකාශ කරද්ද, ඒ සියල්ලෝම මේ කරුණු අටෙන් හෝ එයින් එකකින් හෝ ප්‍රකාශ කරත්. මෙයින් පිටත එකකින් ප්‍රකාශ නොකරත්.

8. "මේ මත මෙසේ ගන්නාහුය, මෙසේ තීරණයකට පැමිණියාහුය, මෙබඳු ගති ඇති වන්නාහුය, මෙබඳු පරලොව ගෙන දෙන්නාහුයයි මෙයද තථාගතයෝ දනිති. මෙයින් මත්තෙහිවූද දනිති. ඒ දැනීම (රාග ද්වෙෂ මෝහයෙන්) තීරණය නොකෙරෙති. මෙසේ තීරණය නොකරණ තථාගතයන් විසින් තමන්ගේ උසස් ඥානයෙන්ම කෙලෙස් නැති කිරීම දැනගන්නා ලද්දේය. මහණෙනි, වේදනා ඉපදීමද, බැසීමද, භුක්තිවිඳීමද, ප්‍රතිඵලද නිවනද ඇතිසැටි දැන තථාගතයෝ කෙලෙසුන්ගෙන් මිදුනෝය.

"මහණෙනි, මේ (බුද්ධ) ධර්මය ගැඹුරුය, දුකසේ දැක්ක යුතුය, දුරවබෝධය, ශාන්තය, මිහිරිය, තර්කයෙන් දැනගත නොහැකිය, සියුම්ය නුවණ ඇත්තන් විසින් දැනගත යුතුය. එය තථාගතයෝ තමන්ගේ උසස් ඥානයෙන් දැන ප්‍රකාශ කළෝය. එයින් තථාගතයන්ගේ ඇතිසැටි ගුණ කියන්නෝ හොඳින් කියති.

9. "මහණෙනි, සමහර මහණ බමුණෝ සංසාරයක් නැතැයි විස්වාසකර සත්ත්වයාගේ නැතිවීම විනාශය සහ භවය නැතිවී යෑම කරුණු හතකින් ප්‍රකාශ කරත්. ඒ පින්වත් මහණ බමුණෝ කුමක් කරණ කොට ගෙන කුමක් නිසා සංසාරයක් නැතැයි විස්වාසකර සත්ත්වයාගේ නැතිවීම විනාශය සහ භවය නැතිවී යෑම කරුණු හතකින් ප්‍රකාශ කරද්ද?

10. "මහණෙනි, මේ ලොකයෙහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙබඳු මත ඇත්තේ මෙබඳු ඇදහීම් ඇත්තෙක් වෙයි. 'පින්වත, සතර මහා භූතයන්ගෙන් හටගත් මවුපියන්ගේ සම්බන්ධයෙන් උපන් රූපයක් ඇති මේ ආත්මය ශරීරයෙන් වෙන්වීමෙන් නැතිවන්නේය, විනාශ වන්නේය, මරණින් මතු නොවන්නේය. පින්වත, මෙපමණකින් මේ ආත්මය හොඳින් නැතිවීයේය.' මෙසේ යම්කෙනෙක් සත්ත්වයාගේ නැතිවීම, විනාශය හා භවය නැතිවී යෑම ප්‍රකාශ කරත්.

11. "වෙන අයෙක් ඔහුට මෙසේ කියයි: 'පින්වත, ඔබ කියන ඒ ආත්මය ඇත්තේය. එය ඇත්තේ නැතැයි නොකියමි. 'පින්වත,

මෙතෙකින් ඒ ආත්මය හොඳාකාර නැතිවී ගියේ නැත. 'පින්වත, රූපයක් ඇති, කාම ලොකයෙහි හැසිරෙණ, කෑම කන අන්‍ය දිව්‍ය ආත්මයෙක් ඇත්තේය. එය ඔබ නොදනිහි, නොදකිහි. මම එය දනිමි, දකිමි. පින්වත, ඒ ආත්මය ශරීරයෙන් වෙන්වූ පසු නැතිවී යන්නේය, විනාශ වන්නේය, මරණින් මතු නොවන්නේය. පින්වත, එපමණකින් මේ ආත්මය නැතිවී ගියේ වෙයි." මෙසේ යම්කිසි කෙනෙක් සත්වයාගේ නැතිවී යෑම, විනාශය හා භවය නැතිවීම ප්‍රකාශ කරත්.

12. "වෙන අයෙක් ඔහුට මෙසේ කියයිඃ 'පින්වත, තා කියන ඒ ආත්මය ඇත. එය නැතැයි නොකියමි. 'පින්වත, ඒ ආත්මය මෙපමණකින් හොඳාකාර නැතිවී නොගියේය. පින්වත, රූපයක් ඇති, සිත් උපදවනලද සියලු අවයව ඇති දැනීමට උපකාරවන නොපිරිහුණු අවයවයන් ඇති අනික් දිව්‍ය ආත්මයක් ඇත. එය ඔබ නොදනිහි, නොදකිහි. එය මම දනිමි, දකිමි. 'පින්වත, යමකින් ඒ ආත්මය ශරීරයෙන් වෙන්වීමෙන් සිඳෙන්නේද විනාශ වන්නේද මරණින් මත්තෙහි නොවන්නේද, පින්වත, එපමණකින් මේ ආත්මය මනාකොට නැතිවී ගියේ වේ.' මෙසේ යම් කෙනෙක් සත්ත්වයාගේ නැතිවී යෑම, විනාශය, භවයෙන් නැතිවී යෑම ප්‍රකාශ කරත්.

13. "වෙන අයෙක් ඔහුට මෙසේ කියයි. 'පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැතැයි නොකියමි. 'පින්වත, ඒ ආත්මය මෙපමණකින් හොඳාකාර නැතිවී නොගියේය. පින්වත, අන්‍යවූ හැම කාරණයකින් රූප ලකුණු පිටකිරීමෙන් නැසෙන ලකුණු බැහීමෙන් නොයෙක් ආත්ම ලකුණු අමතක වීමෙන් ආකාශය නිමක් නැතැයි ආකාශානඤ්චායතන, නම් පළමුවැනි අරූප බ්‍රහ්ම ලොකයට පැමිණ ආත්මයක් ඇත. එය ඔබ නොදනිහි, නොදකිහි, එය මම දනිමි, දකිමි. 'පින්වත, යම් කලෙක ඒ ආත්මය ශරීරයෙන් වෙන්ව නැතිවී යන්නේද, විනාශ වී යන්නේද, මරණින් මතු නොවන්නේද, පින්වත' මෙපමණකින් ඒ ආත්මය හොඳාකාර නැතිවී ගියේ වේ.' මෙසේ යම් කෙනෙක් සත්ත්වයාගේ නැතිවී යෑම' විනාශය හා භවය නැතිවී යෑම ප්‍රකාශ කරයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

14. "වෙන අයෙක් ඔහුට මෙසේ කියයි. 'පින්වත, ඔබ කියන ඒ ආත්මය ඇත. එය නැතැයි නොකියමි. පින්වත, ඒ ආත්මය මෙතෙකින් හොඳාකාර නැතිවී නොගියේය. පින්වත, හැම ආකාරයෙන් 'ආකාශානඤ්චායතනය' නම් පළමුවැනි අරූප බ්‍රහ්ම ලොකයෙන් ඉක්මවී හිත කෙළවරක් නැතැයි 'විඤ්ඤාණඤ්චායතනය' නම් බ්‍රහ්ම ලොකයට පැමිණ ආත්මයක් ඇත. එය ඔබ නොදනිහී, නොදකිහි එය මම දනිමි, දකිමි. 'පින්වත, යම් කාලයකදී ආත්මය ශරීරයෙන් වෙන්ව නැතිවී යන්නේද, විනාශ වන්නේද, මරණින් මත්තෙහි නොවන්නේද, පින්වත, මෙපමණකින් ඒ ආත්මය හොඳාකාර නැතිවී ගියේයි' මෙසේ යම් කෙනෙක් සත්ත්වයන්ගේ නැතිවී යෑම, විනාශය හා භවය නැතිවී යෑම ප්‍රකාශ කරයි.

15. "වෙන අයෙක් ඔහුට මෙසේ කියයිඃ 'පින්වත ඔබ කියන ආත්මය ඇත. එය නැතැයි නොකියමි. පින්වත, ඒ ආත්මය මෙතෙකින් හොඳාකාර නැතිවී නොගියේය.

"පින්වත, හැම ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය නම් බ්‍රහ්ම ලෝකයෙන් ඉක්මවී කිසිවක් නැතැයි 'ආකිඤ්චඤ්ඤායතනය, නම්, බ්‍රහ්ම ලෝකයට පැමිණියාවූ ආත්මයක් ඇත. එය ඔබ නොදකිහි, නොදනිහි. මම එය දනිමි, දකිමි පින්වත, යම්කාලයකදී ඒ ආත්මය ශරීරයෙන් වෙන්වී නැතිවීයන්නේද මරණින් මතු නොවන්නේද, පින්වත, මෙපමණකින් ඒ ආත්මය නැතිවී ගියේයයි' මෙසේ යම් කෙනෙක් සත්ත්වයාගේ නැතිවීයාම, විනාශය, භවය නැතිවීයෑම ප්‍රකාශ කරයි.

16. "වෙන අයෙක් ඔහුට මෙසේ කියයි, 'පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැතැයි නොකියමි. පින්වත, ඒ ආත්මය මෙතෙකින් හොඳාකාර නැතිවී නොගියේය. පින්වත, හැම ආකාරයෙන් 'ආකිඤ්චඤ්ඤායතනය' නම් බ්‍රහ්මලොකය ඉක්මකොට මෙය ශාන්තය මෙය මිහිරියයි 'නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය' නම් බ්‍රහ්මලෝකයට පැමිණියාවූ අන්‍ය ආත්මයක් ඇත. එය ඔබ නොදකිහි, නොදනිහි. එය මම දනිමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දකිමි. 'පින්වත, යම් කලෙක ඒ ආත්මය ශරීරයෙන් වෙන්වී නැතිවී යන්නේද, විනාශ වන්නේද මරණින් මත්තෙහි නොවන්නේද, පින්වත, මෙපමණකින් ඒ ආත්මය හොඳාකාර නැතිවී ගියේයි" මෙසේ යම් කෙනෙක් සත්ත්වයාගේ නැතිවීයාම, විනාශය, භවය නැතිවීයෑම ප්‍රකාශ කරති.

17. "මහණෙනි, ඒ මහණ බමුණෝ නැතිවීයෑම (උච්ඡේදවාදය) විස්වාසකරන්නෝව මේ කරුණුහතෙන් සත්ත්වයින්ගේ නැතිවීයෑම විනාශය, භවය නැතිවීයෑම ප්‍රකාශ කරත්. මහණෙනි, යම්කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ නැතිවීයෑම විස්වාස කරන්නෝව සත්ත්වයින්ගේ නැතිවීයෑම විනාශය භවය නැතිවීයෑම ප්‍රකාශ කරයිද ඒ සියල්ලෝ මේ කරුණු හතෙන් හෝ මෙයින් එකකින් හෝ එසේ ප්‍රකාශ කරති. මෙයින් පිටත එකකින් ප්‍රකාශ නොකරත්.

18. "මේ මත මෙසේ ගන්නාහුය, මෙසේ තීරණයකට පැමිණියාහුය, මෙබඳු ගති ඇති වන්නාහුය, මෙබඳු පරලොව ගෙනදෙන්නාහුයයි මෙයද තථාගතයෝ දනිති, මෙයින් මත්තෙහිවුවද දනිති. ඒ දැනීම (රාග ද්වෙෂ මොහයෙන්) තීරණය නොකරති. මෙසේ තීරණය නොකරණ තථාගතයන් විසින් තමන්ගේ උසස් ඥානයෙන්ම කෙලෙස් නැති කිරීම දැනගන්නා ලද්දේය. මහණෙනි, වේදනා ඉපදීමද, බැසීමද, භුක්ති විඳීමද, ප්‍රතිඵලද නිවනද ඇති සැටි දැන තථාගතයෝ කෙලෙසුන්ගෙන්ද මිදුනෝය.

"මහණෙනි, මේ බුද්ධ (ධර්මය) ගැඹුරුය, දුකසේ දැක්ක යුතුය, දුරවබෝධය, ශාන්තය, මිහිරිය, තර්කයෙන් දැන ගත නොහැකිය. එය තථාගතයෝ තමන්ගේම උසස් ඥානයෙන් දැන ප්‍රකාශ කළෝය. එයින් තථාගතයන්ගේ ඇති සැටි ගුණ කියන්නෝ හොඳින් කියති.

19. "මහණෙනි, සමහර මහණ බමුණෝ (දිට්ඨධම්මනිබ්බාන වාද) මේ ආත්ම භාවයේදීම නිර්වාණය අත්වේයයි අදහන්නෝ වෙති. ඔව්හු සත්ත්වයාගේ මේ ආත්මයෙහිම නිර්වාණය කරුණු පහකින් ප්‍රකාශ කරති. ඒ පින්වත් මහණ බමුණෝ කුමක්

කරණකොටගෙන කුමක් නිසා මේ ආත්මයෙහිම නිර්වාණය කරුණු පහකින් ප්‍රකාශ කරත්ද?

**20.** "මහණෙනි, මේ ලොකයෙහි යම් කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ මෙබඳු මත ඇත්තෙක් මෙබඳු ඇදහීම් ඇත්තෙක් වෙයි. 'පින්වත, යම්දිනක මේ ආත්මය පඤ්චකාම ගුණයෙන් යුත්වූයේ, අත්වූයේ ඉන්ද්‍රියයන් පිනවාද, මෙපමණකින්, මේ ආත්මය මේ ආත්ම භාවයේදීම නිර්වාණයට පැමිණියේ වෙයි,' කියායි. මෙසේ යම් කෙනෙක් සත්ත්වයාගේ මේ ආත්ම භාවයේදීම නිර්වාණය ප්‍රකාශ කරයි.

**21.** "වෙන අයෙක් ඔහුට මෙසේ කියයිඃ 'ඔබ කියන ඒ ආත්මය ඇත. ඒ නැතැයි නොකියමි. පින්වත, මේ ආත්මය එපමණකින් මේ ආත්මයෙහිම නිවනට නොපැමිණියේ වෙයි. ඊට හේතු කුමක්ද? 'පින්වත, කම් සැප අනිත්‍යය, දුකය, පෙරළෙන ආකාරය - (කාම සැපයේ) පෙරළීම, වෙනස්වීම නිසා, සෝක, වැලපීම්, දුක්, කණගාටු සහ තද ශෝකය උපදින්නෝය. පින්වත, යම් කාලයක මේ ආත්මය කාමයෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව, සිත අරමුණට නගා අරමුණෙහි සිත හසුරුවා විවේකයෙන් හටගත් ප්‍රීති සහිත සැප ඇති පළමුවැනි ධ්‍යානයට පැමිණ වාසය කෙරේද? පින්වත, එපමණකින් මෙ ආත්මය මේ ආත්මයේදීම නිවනට පැමිණියේ වෙයි.' මෙසේ යම් කෙනෙක් සත්ත්වයාගේ මේ ආත්මයේම නිවනට පැමිණීම ප්‍රකාශ කරයි.

**22.** "වෙන අයෙක් ඔහුට මෙසේ කියයිඃ 'පින්වත, ඔබ කියන ඒ ආත්මය ඇත. එය නැතැයි නොකියමි. 'පින්වත, පෙමණකින් ඒ ආත්මය මේ ආත්මයේදී නිවනට පැමිණියේ නැත. ඊට හේතු කුමක්ද? එහි යම් විසඳා බලන විචාරයෝ වෙත්ද ඔවුන් නිසා ඒ ධ්‍යානය ලාමක සේ පෙනෙයි. පින්වත, යම් කලක මේ ආත්මය විසඳා බලන විචාරයින්ගේ සතුටුවීමෙන් හිතේ විශේෂ සතුටු ගතිය සහ එකඟකමින් යුක්තවූ, විසඳා බැලීමෙන් තොරවූ විචාර රහිතවූ සමාධියෙන් ඇතිවූ ප්‍රීතිය සහ සැප ඇති දෙවැනි ධ්‍යානයට පැමිණ වාසය කෙරේද? පින්වත, මෙපමණකින් මේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ආත්මය මේ ආත්මයේදී නිවනට පැමිණියේ වෙයි.' මෙසේ යම්කෙනෙක් සත්ත්වයාගේ මේ ආත්මයේම නිවන ප්‍රකාශ කරයි,

**23.** "වෙන අයෙක් ඔහුට මෙසේ කියති 'ඔබ කියන ඒ ආත්මය ඇත. එය නැතැයි නොකියමි. පින්වත, මෙපමණකින් ඒ ආත්මය මේආත්මයේදී නිවනට පැමිණියේ නොවේ. ඊට හේතු කුමක්ද? එහි ප්‍රීතියද, හිතේ උඩඟු බවද, හේතු කොට ගෙන ඒ ධ්‍යානය ළාමකයයි පෙනේ. පින්වත, යම් කලක මේ ආත්මය ප්‍රීතියෙහි නොඇලීමෙන්, සිහිඇතුව, නුවණ ඇතුව උනන්දුවක් නැතුව වාසය කරයිද, ශරීරයෙන් සැප විඳීද, උත්තමයෝ යම් ධ්‍යානයකට උනන්දු නැති බව ඇත්තෝය, සිහි ඇත්තෝය, සැප විවේකය ඇත්තෝයයි කියත්ද, ඒ තුන්වැනි ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, පින්වත, මෙපමණකින් මේ ආත්මය මේ ආත්මයේදී නිවනට පැමිණියේ වෙයි.' මෙසේ යම් කෙනෙක් සත්ත්වයාගේ මේ ආත්මයේදී නිවන ප්‍රකාශ කරයි.

**24.** "වෙන අයෙක් ඔහුට මෙසේ කියති. 'පින්වත, ඔබ කියන ඒ ආත්මය ඇත. එය නැතැයි නොකියමි. පින්වත, මෙපමණකින් ඒ ආත්මයත් මේ ආත්මයේදී නිවනට පැමිණියේ නොවේ. ඊට හේතු කුමක්ද? එහි සැපයයි සිතෙහි ධ්‍යානයෙන් නැගිට නැගිට සැපය නැවත සිහිකිරීම වේද, එයින් එය ළාමකයයි හැඟේ. පින්වත, යම් කලක මේ ආත්මය සැප නැති කිරීමෙන්ද, දුක නැති කිරීමෙන්ද, පළමුවෙන්ම සතුට අසතුට නැතිව යෑමෙන් දුක් නැති සැප නැති, උපෙක්ෂාව නිසා ඇතිවූ සිහියේ හරි ශුද්ධිය ඇති හතරවැනි ධ්‍යානයට පැමිණ වාසය කෙරේද, පින්වත, මෙපමණකින්ම මේ ආත්මය මේ ආත්මයේදී නිවනට පැමිණියේ වෙයි.' මෙසේ යම් කෙනෙක් මේ ආත්මයේදී නිවන ප්‍රකාශ කරයි.

**25.** "මහණෙනි, ඒ මහණ බමුණෝ මේ ආත්මයේදී නිවන කියන්නෝ මේ කරුණු පහෙන් සත්ත්වයන්ගේ මේ ආත්මයේදී නිවන ප්‍රකාශ කරත් මහණෙනි, යම්කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ මේ ආත්මයේදී නිවන විශ්වාස කරන්නෝව

සත්ත්වයාගේ මේ ආත්මයේදී නිවන ප්‍රකාශ කරයිද ඒ සියල්ලෝම මේ කරුණු පහෙන් හෝ මෙයින් එකකින් හෝ ප්‍රකාශ කරත්. මෙයින් පිටත එකකින් ප්‍රකාශ නොකරත්.

**26.** "මහණෙනි, තථාගතයෝ මේ දනිත්. මේ මත මෙසේ ගත්තාහුය. මෙසේ තීරණයකට පැමිණියාහුය, මෙබඳු ගති ඇති වන්නාහුය, මෙබඳු පරලොව ගෙනදෙන්නාහුයයි මෙයද තථාගතයෝ දනිති. මෙයින් මත්තෙහිවූද, දනිති ඒ දැනීම (රාග ද්වෙෂ මෝහයෙන්) තීරණය නොකරති. මෙසේ තීරණය නොකරණ තථාගතයන් විසින් තමන්ගේ උසස් ඥානයෙන්ම කෙළෙස් නැති කිරීම දැනගන්නා ලද්දේය. මහණෙනි, වේදනා ඉපදීමද, බැසීමද, භුක්තිවිඳීමද, ප්‍රතිඵලද නිවනද, ඇතිසැටි දැන තථාගතයෝ කෙලෙසුන්ගෙන් මිදුනෝය. 'මහණෙනි, මේ (බුද්ධ) ධර්මය ගැඹුරුය, දුකසේ දැක්ක යුතුය, දුරවබෝධය, ශාන්තය, මිහිරිය, තර්කයෙන් දැනගත නොහැකිය, සියුම්ය, නුවණ ඇත්තන් විසින් දැනගත යුතුය. එය තථාගතයෝ තමන්ගේම උසස් ඥානයෙන් දැන ප්‍රකාශ කළෝය. එයින් තථාගතයන්ගේ ඇතිසැටි ගුණ කියන්නෝ ඒ ධර්මයන් හේතුකොටගෙන එසේ කියති.

**27.** "මහණෙනි, ඒ මහණ බමුණෝ (ලොක) අවසානය ගැන කල්පනා කර (ලොක) අවසානය ගැන මත ඇති කර ගෙන කරුණු හතලිස් හතරකින් (ලොක) අවසානය ගැන නොයෙක් මත දක්වන වචන කියති. මහණෙනි, යම්කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ (ලොක) අවසානය කල්පනා කර, (ලොක) අවසානය ගැන මත ඇතිකරගෙන, (ලොක) අවසානය ගැන නොයෙක් මත දක්වන වචන කියත්ද, ඒ සියල්ලෝ මේ කරුණු හතලිස් හතරෙන් හෝ එයින් අනික් කරුණකින් හෝ කියති. මෙයින් පිටත කරුණක් නොකියති.

**28.** "මහණෙනි, තථාගතයෝ මේ දනිති. මේ මත මෙසේ ගත්තාහුය. මෙසේ තීරණයකට පැමිණියාහුය, මෙබඳු ගති ඇතිවන්නාහුය, මෙබඳු පරලොව ගෙනදෙන්නාහුයයි මෙයද තථාගතයෝ දනිති. මෙයින් මත්තෙහිවූද දනිති. ඒ දැනීම (රාග

ද්වේෂ මෝහයෙන්) තීරණය නොකරති. මෙසේ තීරණය නොකරන තථාගතයන් විසින් තමන්ගේ උසස් ඥානයෙන්ම කෙලෙස් නැතිකිරීම දැනගන්නා ලද්දේය. මහණෙනි, වේදනා ඉපදීම, බැසීම, භුක්තිවිඳීමද, ප්‍රතිඵලද, නිවනද ඇතිසැටි දැක තථාගතයෝ කෙලෙසුන්ගෙන් මිදුනෝය. මහණෙනි, මේ (බුද්ධ) ධර්මය ගැඹුරුය, දුකසේ දැක්ක යුතුය, දුරවබෝධය, ශාන්තය, මිහිරිය, තර්කයෙන් දැනගත නොහැකිය, සියුම්ය, නුවණ ඇත්තන් විසින් දැනගත යුතුය. එය තථාගතයෝ තමන්ගේම උසස් ඥානයෙන් දැන ප්‍රකාශ කළෝය. එයින් තථාගතයන්ගේ ඇතිසැටි ගුණ කියන්නෝ මේ ධර්මය හේතුකොටගෙන එසේ කියති.

**29.** "මහණෙනි, යම්කිසි මහණ බමුණෝ (ලෝකයේ) පටන්ගැන්ම කල්පනා කරත්ද (ලොක) අවසානය කල්පනා කරත්ද, (ලෝකයේ) පටන්ගැන්ම අවසානය කල්පනා කරත්ද, (ලොකය) පටන්ගැන්ම අවසානය ගැන මත ඇත්තෝ වෙද්ද, (ලොකයේ) පටන් ගැන්ම අවසානය ගැන කරුණු හැටදෙකකින් නොයෙක් ආකාර මත දක්වන වචන කියති. ඒ සියල්ලෝ මේ කරුණු හැටදෙකින් හෝ එයින් අනිකකින් කියති. මෙයින් පිටත කරුණක් නොකියති.

**30.** "මහණෙනි, ඒ පිළිබඳ තථාගතයෝ දනිති. මේ මත ඇත්තෝ මෙසේ ගන්නා ලද්දෝය, මෙසේ තීරණය කරණ ලද්දෝය. මෙවැනි ගති මෙවැනි පරලොව ඇත්තෝ වෙති යන කරුණද ඊට ඇත්වූ (ගැඹුරු) දේද තථාගතයෝ දනිති. ඒ දැනීම (තෘෂ්ණාවෙන්) තීරණය නොකරති. (තෘෂ්ණා සහිත) තීරණය නොකරන්නාවූ තථාගතයන් විසින් තමන්ගේම ඥානයෙන් නිර්වාණය අවබෝධ කරණලදී. මහණෙනි, තථාගතයෝ වේදනා ඉපදීමද, බැසීමද, භුක්තිවිඳීමද, ප්‍රතිඵලද, නිවනද ඇතිසැටි දැන තථාගතයෝ කෙලෙසුන්ගෙන් මිදුනෝය.

**31.** "මහණෙනි, මේ (බුද්ධ) ධර්මය ගැඹුරුය, දුකසේ දැක්ක යුතුය, දුරවබෝධය, ශාන්තය, මිහිරිය, තර්කයෙන් දැනගත නොහැකිය, සියුම්ය, නුවණ ඇත්තන් විසින් දැනගත යුතුය.

එය තථාගතයෝ තමන්ගේම උසස් ඥානයෙන් දැන ප්‍රකාශ කළෝය. එයින් තථාගතයන්ගේ ඇතිසැටි ගුණ කියන්නෝ ඒ ධර්මයන් කරණකොටගෙන එසේ කියති.

**32.** "මහණෙනි, මේ කාරණයෙහි මත හැටදෙක අතුරෙන් යමකින් ඒ මහණ බමුණෝ සදාකාලික බවක් අදහන්නෝ කරුණු හතරකින් ආත්මයද ලොකයද සදාකාලික කොට ප්‍රකාශ කරත්ද, එයද තත්වූ පරිදි නොදන්නාවූ නොදක්නාවූ හැඟීමෙකි. ඒ පින්වත් මහණ බමුණන්ගේ තණ්හාවන්ගේ තැතිගැනීමෙන් කම්පාවීමක්ය.

**33.** "මහණෙනි, මේ කාරණයෙහි, යම් මහණ බමුණෝ කොටසක් සදාකාලිකය, කොටසක් සදාකාලික නොවේය යන මත ඇත්තෝව කරුණු සතරකින් ආත්මයද ලොකයද කොටසක් සදාකාලිකයයිද කොටසක් සදාකාලික නොවේයයිද ප්‍රකාශ කරත්ද එයද ඇති සැටි නොදන්නාවූ නොදක්නාවූ ඒ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමෙකි. තණ්හාවන්ගේ පිපාසාවෙන් කම්පාවීමක්ය.

**34.** "මහණෙනි, ඒ කාරණයෙහි යම් ඒ මහණ බමුණෝ 'නිමක් ඇත නිමක් නැත' යන මතය ඇත්තෝව කරුණු හතරකින් ලෝකයේ නිමක් ඇති බවද නැති බවද ප්‍රකාශ කරත්ද එයද ඇතිසැටි නොදන්නාවූ නොදක්නාවූ ඒ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමෙකි. තණ්හාවන්ගේ පිපාසාවෙන් කම්පාවීමක්ය.

**35.** "මහණෙනි, ඒ මතයන්හි යම් ඒ මහණ බමුණෝ (ආඳුන් මෙන්) අසුනොවන ගති ඇත්තෝව ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරණ ලද්දාහු කරුණු හතරකින් වචනයන්ගේ වියවුල් ගතියට කෙළවරක් නැති වියවුල් ගතියට පැමිණෙද්ද එයද ඇතිසැටි නොදන්නාවූ නොදක්නාවූ මේ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමකි. තණ්හාවන්ගේ පිපාසාවෙන් කම්පාවීමක්ය.

**36.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ අහේතුකව උපන්නේය යනමත ඇත්තෝව කරුණු දෙකකින් ආත්මයද

ලොකයද අහේතුකව උපන් බව ප්‍රකාශ කරත්ද, එයද ඇති සැටි නොදන්නාවූ නොදක්නාවූ ඒ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමෙකි. තණ්හාවන්ගේ පිපාසාවෙන් කම්පාවීමක්ය.

37. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ අවසානය කල්පනා කරන්නෝව අවසානය ගැන මත ඇත්තෝව කරුණු දහඅටකින් අවසානය ගැන මත ප්‍රකාශ කරත් ද, එයද නොදන්නාවූ නොදක්නාවූ ඒ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමෙකි. තණ්හාවන්ගේ පිපාසාවෙන් කම්පාවීමක්ය.

38. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ මරණින් මතු ආත්මය ලකුණු ඇත්තක් යයි මත ඇත්තෝව කරුණු දහසයකින් මරණින් මතු ආත්මය ලකුණු ඇත්තක් කොට ප්‍රකාශ කරද්ද, එයද ඇතිසැටි නොදන්නාවූ නොදක්නාවූ ඒ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමෙකි. තණ්හාවන්ගේ පිපාසාවෙන් කම්පාවීමක්ය.

39. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ මරණින් මතු ආත්මය ලකුණු නැත්තක්යයි මත ඇත්තෝව කරුණු අටකින් මරණින් මතු ආත්මය ලකුණු නැත්තක් කොට ප්‍රකාශ කරද්ද එයද නොදන්නාවූ නොදක්නාවූ ඒ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමෙකි. තණ්හාවන්ගේ පිපාසාවෙන් කම්පාවීමක්ය.

40. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ මරණින් මතු ආත්මය ගැණ (නෛවසංඥි නාසංඥි) ප්‍රකට සංඥාවක් නැත්තේය යන මත ඇත්තෝව කරුණු අටකින් මරණින් මතු ආත්මය ප්‍රකට සංඥාවක් නැති දෙයක් කොට ප්‍රකාශ කරත්ද, එයද ඇතිසැටි නොදන්නාවූ ඒ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමෙකි. තණ්හාවන්ගේ පිපාසයෙන් ඇතිවූ කම්පාවීමක්ය.

41. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ සංසාරයක් නැතැයි මත ඇත්තෝව කරුණු හතකින් සත්ත්වයාගේ (ජීවිතයෙන්) සිඳීම, විනාශය, භවය නැතිවීම ප්‍රකාශ කරද්ද, එයද ඇතිසැටි නොදන්නාවූ ඒ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමෙකි. තණ්හාවන්ගේ පිපාසයෙන් ඇතිවූ කම්පාවීමක්ය.

42. "මහණෙනි, යම් මහණ බමුණෝ මේ ජාතියේම නිවන් අත්වේයයි මත ඇත්තෝව කරුණු පහකින් සත්ත්වයාගේ මේ ජාතියේම නිවන් අත්වීම ප්‍රකාශ කරද්ද, එයද ඇතිසැටි නොදන්නාවූ නොදක්නාවූ ඒ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමෙකි. තණ්හාවන්ගේ පිපාසයෙන් ඇතිවූ කම්පාවීමක්ය.

43. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ලොක) අවසානය කල්පනා කරන්නෝව (ලොක) අවසානය ගැන මත ඇත්තෝව කරුණු හතලිස් හතරකින් (ලොක) අවසානය ගැන නොයෙක් මත ප්‍රකාශ කරත්ද, එයද ඇතිසැටි නොදන්නාවූ ඒ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමෙකි. තණ්හාවන්ගේ පිපාසයෙන් ඇතිවූ කම්පාවීමක්ය.

44. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ලෝකයේ) පටන්ගැන්ම කල්පනා කරත්ද, (ලොක) අවසානය කල්පනා කරත්ද, (ලොකයේ) පටන්ගැන්ම අවසානය කල්පනා කරත්ද, (ලෝකයේ) පටන්ගැන්ම අවසානය ගැන මත ඇත්තෝව කරුණු හැටදෙකකින් (ලොකයේ) පටන් ගැන්ම අවසානය ගැන නොයෙක් ආකාර මත ප්‍රකාශ කරත්ද, එයද ඇතිසැටි නොදන්නාවූ නොදක්නාවූ ඒ පින්වත් මහණ බමුණන්ගේ හැඟීමෙකි. තණ්හාවන්ගේ පිපාසයෙන් ඇතිවූ කම්පාවීමක්ය.

45. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ සදාකාලික බවක් අදහන්නෝව කරුණු හතරකින් ලොකයද ආත්මයද සදාකාලික කොට ප්‍රකාශ කරත්ද, එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසාවේ.

46. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ කොටසක් සදාකාලිකය, කොටසක් සදාකාලික නොවේය යන මතය ඇත්තෝව කරුණු හතරකින් ආත්මයද ලොකයද කොටසක් සදාකාලික කොට, කොටසක් සදාකාලික නොකොට ප්‍රකාශ කරත්ද, එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසා වේ.

47. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ 'නිමක් ඇත නිමක් නැත' යන මතය ඇත්තෝව කරුණු සතරකින් ලෝකයේ නිමක් ඇත නිමක් නැතයයි ප්‍රකාශ කරත්ද, එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසා වේ.

48. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ආදුන් මෙන්) අසුනොවන ගති ඇත්තෝව ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරණ ලද්දාහු කරුණු හතරකින් වචනයන්ගේ වියවුල් ගතියට කෙළවරක් නැති වියවුල් ගතියට පැමිණෙද්ද එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසාවේ.

49. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ආත්මයද ලොකයද) අහේතුකව උපන්නේය, යන මතය ඇත්තෝව කරුණු දෙකකින් ආත්මය ලොකයද අහෙතුකව උපන්නක් කොට ප්‍රකාශ කරද්ද, එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසාවේ.

50. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ලොක) අවසානය කල්පනා කර (ලොක) අවසානය ගැන මත ඇත්තෝව කරුණු දහඅටකින් ලොක අවසානය ගැන නොයෙක් ආකාර මත ප්‍රකාශ කරත්ද, එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසා වේ.

51. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ, මරණින් මතු ආත්මය ලකුණු ඇත්තක්යයි මත ඇත්තෝව කරුණු දහසයකින් මරණින් මතු ආත්මය ලකුණු ඇත්තක් කොට ප්‍රකාශ කරද්ද, එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසා වේ.

52. "මහණෙනි, යම් මහණ බමුණෝ, මරණින් මතු ආත්මය ලකුණු නැත්තක්යයි මත ඇත්තෝව කරුණු අටකින් ආත්මය ලකුණු නැත්තක් කොට ප්‍රකාශ කරත්ද, එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසා වේ.

53. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ආත්මය පිළිබඳ) මරණින් මතු (නෛවසංඥි නාසංඥි) ප්‍රකට සංඥාවක් නැත්තේය යන මත ඇත්තෝව කරුණු අටකින් මරණින් මතු ආත්මය (නෛවසංඥි නාසංඥි) ප්‍රකට සංඥාවක් නැති දෙයක් කොට ප්‍රකාශ කරත්ද එය ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසා වේ.

54. "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ආත්මය ගැන) සංසාරයක් නැතැයි මත ඇත්තෝව කරුණු හතකින් සත්ත්වයාගේ (ජීවිතයෙන්) කපාදැමීම, විනාශය, භවය නැති වීම ප්‍රකාශ කරද්ද එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසා වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**55.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ මේ ජාතියේම නිවන් අත්වේයයි මත ඇත්තෝව කරුණු පහකින් සත්ත්වයාගේ මේ ජාතියේම නිවන් අත්වීම ප්‍රකාශ කරත්ද, එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසා වේ.

**56.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ලොක) අවසානය කල්පනා කරන්නෝව (ලොක) අවසානය ගැන මත ඇත්තෝව කරුණු හතලිස් හතරකින් (ලොක) අවසානය ගැන නොයෙක් මත ප්‍රකාශ කරත්ද, එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසාවේ.

**57.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ලොකයේ) පටන්ගැන්ම කල්පනා කරත්ද (ලොක) අවසානය කල්පනා කරත්ද, (ලොකයේ) පටන්ගැන්ම අවසානය කල්පනා කරත්ද, (ලොකයේ) පටන්ගැන්ම අවසානය ගැන මත ඇත්තෝව කරුණු හැට දෙකකින් (ලොකයේ) පටන්ගැන්ම අවසානය ගැන නොයෙක් මත ප්‍රකාශ කරත්ද, එයද ඉන්ද්‍රියයන්ගේ ස්පර්ශය නිසා වේ.

**58.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ සදාකාලික බවක් අදහන්නෝව කරුණු හතරකින් ලොකයද ආත්මයද සදාකාලික කොට ප්‍රකාශ කරත්ද, ඔවුන්ගේ ඒ හැඟීම ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**59.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ කොටසක් සදාකාලිකය, කොටසක් සදාකාලික නොවේය යන මතය ඇත්තෝව, කරුණු හතරකින් ආත්මයද ලොකයද කොටසක් සදාකාලික කොට, කොටසක් සදාකාලික නොකොට ප්‍රකාශ කරත්ද, ඔවුන්ගේ ඒ හැඟීම ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**60.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ 'නිමක් ඇත, නිමක් නැත' යන මතය ඇත්තෝව කරුණු හතරකින් ලොකයේ නිමක් ඇත නිමක් නැත කියා ප්‍රකාශ කරත්ද, ඔවුන්ගේ ඒ හැඟීම් ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**61.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ආඳුන් මෙන්) අසුනොවන ගති ඇත්තෝව ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරණ ලද්දාහු කරුණු හතරකින් වචනයන්ගේ වියවුල් ගතියට කෙළවරක් නැති වියවුල් ගතියට පැමිණෙද්ද ඔවුන්ගේ ඒ හැඟීම ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**62.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ අහේතුකව උපන්නේය යන මත ඇත්තෝව කරුණු දෙකකින් ආත්මයද ලොකයද අහේතුකව උපන් බව ප්‍රකාශ කරත්ද, ඔවුන්ගේ ඒ හැඟීම ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**63.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ලොක) අවසානය කල්පනා කරන්නෝව අවසානය ගැන මත ඇත්තෝව කරුණු දහඅටකින් අවසානය ගැන මත ප්‍රකාශ කරත්ද, ඔවුන්ගේ ඒ හැඟීම ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**64.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ මරණින් මතු ආත්මය ලකුණු ඇත්තක්යයි මත ඇත්තෝව කරුණු දහසයකින් මරණින් මතු ආත්මය ලකුණු ඇත්තක් කොට ප්‍රකාශ කරද්ද, ඔවුන්ගේ ඒ හැඟීම ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**65.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ මරණින් මතු ආත්මය ලකුණු නැත්තක්යයි මත ඇත්තෝව කරුණු අටකින් මරණින් මතු ආත්මය ලකුණු නැත්තක් කොට ප්‍රකාශ කරත්ද, ඔවුන්ගේ ඒ හැඟීම ස්පර්ශයෙන් තොරවුවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**66.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ මරණින් මතු ආත්මය ගැන (නෛවසංඥි නාසංඥි) ප්‍රකට සංඥාවක් නැත්තේය යන මත ඇත්තෝව කරුණු අටකින් මරණින් මතු ආත්මය ප්‍රකට සංඥාවක් නැති දෙයක් කොට ප්‍රකාශ කරත්ද, ඔවුන්ගේ ඒ

හැඟීම ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**67.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ සංසාරයක් නැතැයි මත ඇත්තෝව කරුණු හතකින් සත්ත්වයාගේ (ජීවිතයෙන්) කපාදැමීම, විනාශය, භවය නැතිවීම ප්‍රකාශ කරත්ද? ඔවුන්ගේ ඒ හැඟීම ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**68.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ මේ ජාතියේම නිවන් අත්වේයයි මත ඇත්තෝව කරුණු පහකින් සත්ත්වයාගේ මේ ජාතියේම නිවන අත්වීම ප්‍රකාශ කරත්ද, ඔවුන්ගේ ඒ හැඟීම ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**69.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ලොක) අවසානය කල්පනා කරන්නෝව (ලොකය) අවසානය ගැන මත ඇත්තෝව කරුණු හතලිස් හතරකින් (ලොක) අවසානය ගැන නොයෙක් මත ප්‍රකාශ කරත්ද, ඔවුන්ගේ ඒ හැඟීම ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**70.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ (ලොකයේ) පටන්ගැන්ම කල්පනා කරත්ද (ලොක) අවසානය කල්පනා කරත්ද, (ලොකයේ) පටන්ගැන්ම අවසානය කල්පනා කරත්ද, (ලොකයේ) පටන්ගැන්ම අවසානය ගැන කරුණු හැට දෙකකින් (ලොකය) පටන්ගැන්ම අවසානය ගැන නොයෙක් ආකාර, මත ප්‍රකාශ කරත්ද, ඔවුන්ගේ ඒ හැඟීම ස්පර්ශයෙන් තොරවූවකැයි යන මේ කාරණය සැබෑ බව නොපෙනේ.

**71.** "මහණෙනි, යම් ඒ මහණ බමුණෝ සදාකාලික බවක් අදහන්නෝව කරුණු හතරකින් ලොකයද ආත්මයද සදාකාලික කොට ප්‍රකාශ කරත්ද, යම් ඒ මහණ බමුණෝ කොටසක් සදාකාලිකය කොටසක් සදාකාලික නොවේය යන මතය ඇත්තෝ වෙද්ද යම් ඒ මහණ බමුණෝ 'නිමක් ඇත නිමක් නැත' යන මතය ඇත්තෝ වෙද්ද, යම් ඒ මහණ බමුණෝ

(ආඳුන් මෙන්) අසුනොවන ගති ඇත්තෝ වෙත්ද, යම් ඒ මහණ බමුණෝ (ආත්මයද ලෝකයද) අහේතුකව උපන්නේය යන මතය ඇත්තෝ වෙත්ද, යම් ඒ මහණ බමුණෝ (ලොක) අවසානය කල්පනා කරන්නෝ වෙත්ද, යම් ඒ මහණ බමුණෝ මරණින් මතු ආත්මය ලකුණු ඇත්තක්යයි මත ඇත්තෝ වෙත්ද, යම් ඒ මහණ බමුණෝ මරණින් මතු ආත්මය ලකුණු නැත්තක්යයි මත ඇත්තෝ වෙත්ද, යම් ඒ මහණ බමුණෝ මරණින් මතු ආත්මය ගැන (නෛවසංඥි නාසංඥි) ප්‍රකට සංඥාවක් නැත්තේය යන මත ඇත්තෝ වෙත්ද, යම් ඒ මහණ බමුණෝ සංසාරයක් නැතැයි මත ඇත්තෝ වෙත්ද, යම් ඒ මහණ බමුණෝ මේ ජාතියේම නිවන් අත්වේයයි මත ඇත්තෝ වෙත්ද, යම් ඒ මහණ බමුණෝ (ලොක) අවසානය කල්පනා කරන්නෝ වෙත්ද, යම් ඒ මහණ බමුණෝ (ලොකයේ) පටන්ගැන්ම කල්පනා කරන්නෝ වෙත්ද, අවසානය කල්පනා කරත්ද, (ලොකයේ) පටන්ගැන්ම අවසානය කල්පනා කරත්ද, (ලොකයේ) පටන්ගැන්ම අවසානය ගැන මත ඇත්තෝව කරුණු හැටදෙකකින් පටන්ගැන්ම අවසානය ගැන නොයෙක් ආකාර මත ප්‍රකාශ කරත්ද, ඒ සියල්ලෝ හය ආකාර ස්පර්ශයන්ගේ වැයමෙන් ස්පර්ශකොට හැඟීම් ඇතිකර ගන්නාහුය. ඔවුන්ට 'වේදනා හේතුවෙන් තණ්හාව වෙයි. තණ්හා හේතුවෙන් තද ඇල්ම වෙයි. තද ඇල්ම හේතුවෙන් භවය වෙයි. භවය හේතුවෙන් (ජාතිය) ඉපදීම වෙයි. ඉපදීම හේතුවෙන් දිරීම, මරණ, ශෝක, වැලපීම්, දුක, කණගාටු තද වෙහෙස හටගනිත්

"මහණෙනි, යම් කලක මහණෙක් හය ආකාර, ස්පර්ශ (ස්පර්ශායතනයන්ගේ) උත්පත්තියද, බැහීමද, භුක්තිවිඳීමද ප්‍රතිඵලද මිදීමද තතුලෙස දනීද ඔහු මේ සියල්ලටම වඩා ඉතා උසස් ධර්මයන් දනී.

**72.** "මහණෙනි, යම් කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ (ලෝකයේ) පටන්ගැන්ම කල්පනා කරන්නෝව හෝ (ලෝක) අවසානය කල්පනා කරන්නෝව හෝ (ලොකයේ) පටන්ගැන්ම අවසානය කල්පනා කරන්නෝව හෝ පටන්ගැන්ම ගැන මත

ඇත්තෝව පටන්ගැන්ම අවසානය ගැන නොයෙක් ආකාර මත ප්‍රකාශ කරද්ද, ඒ සියල්ලෝ මේ කරුණු හැටදෙකෙන් (මිථ්‍යා) දැලෙහි ඇතුළත් කරණ අය එහිම මතුවෙන්නාහුය. පාවෙන්නාහුය-එහි ඇතුලත් වූවාහු (ජලය යටට ගියාහු) මතුවෙන්නාහු පාවෙන්නාහුය.

"මහණෙනි, යම්සේ දක්ෂ මසුන් මරන්නෙක් හෝ මසුන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ සියුම් හිල් ඇති දැලකින් යුක්තව මදක් වතුර ඇති විලකට බසින්නේද ඔහුට මෙසේ සිතක් ඇති වන්නේය. 'මේ දිය විලෙහි යම්කිසි විශාල (ප්‍රාණීහු) සත්තු වෙත්ද, ඒ සියල්ලෝ දැල ඇතුළත කරණ ලද්දාහු එහි බැඳුනාහු, කිඳෙන්නාහුය, පාවෙන්නාහුය. එහි මතුවෙන්නාහුය, (වතුර යටට) ගියාහු, කිඳෙන්නාහුය, පාවෙන්නාහුය.

"මහණෙනි, එලෙසින්ම යම්කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ (ලෝකයේ) පටන්ගැන්ම කල්පනා කරන්නෙක්ව හෝ (ලොක) අවසානය කල්පනා කරන්නෙක්ව හෝ පටන්ගැන්ම අවසානය කල්පනා කරන්නෙක්ව, පටන්ගැන්ම අවසානය ගැන මත ඇත්තෙක්ව පටන්ගැන්ම අවසානය ගැන නොයෙක් ආකාර මත ප්‍රකාශ කරද්ද, ඒ සියල්ලෝම මේ කරුණු හැටදෙකින් (මිථ්‍යා) දැලෙහි ඇතුළත කරණ ලද්දාහු එහිම මතුවෙන්නාහු කිඳෙන්නාහු පාවෙන්නාහුය. එහිම ඇතුළත් වූවාහුය, දැල ඇතුළත බැඳුනාහු මතුවෙන්නාහු පාවෙන්නාහුය.

73. "මහණෙනි, භවයට ඇති ආසාව සිඳින ලද තථාගතයන්ගේ ශරීරය පවතී. යම්තාක් ශරීරය පවතීද ඒතාක් දෙව් මිනිසුන් (එය) තථාගතයන් දකිති. ශරීරයේ බිඳී වෙන්වීමෙන් පසු ජීවිතය (ප්‍රතිසන්ධි රහිතව) පිරිහුන බැවින් දෙව්මිනිස්සු තථාගතයන් නොදකිත්.

"මහණෙනි, යම්සේ අඹවල්ලේ නටුව කැපුන කල නටුවේ බැඳුන සියලු අඹගෙඩි නටුව අනුව යන්නේද, මහණෙනි, එලෙසම භවයට ඇති ආසාව සිඳින ලද තථාගතයන්ගේ ශරීරය පවතී. යම්තාක් ශරීරය පවතීද එතාක් දෙව් මිනිස්සු ඒ ශරීරය

දකිති. ශරීරය බිඳී වෙන්වීමෙන් පසු ජීවිතය (ප්‍රතිසන්ධි රහිතව) පිරිහුණු බැවින් දෙව් මිනිස්සු තථාගතයන් නොදකිති.

**74.** "මෙසේ වදාළ කල ආයුෂ්මත් ආනන්ද ස්වාමීන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කියා සිටියෝය. 'ස්වාමීනි, පුදුමයි 'ස්වාමීනි, බොහෝ පුදුමයි. ස්වාමීනි, මේ ධර්ම ක්‍රමයට මොනයම් නමක් විය යුතුද?"

ආනන්දය, එසේ වීනම්, මේ ධර්ම ක්‍රමය 'අර්ථ ජාල'යයි (නම) දරව, 'ධර්ම ජාල'යයිද එය දරව. 'දෘෂ්ටි ජාල'යයිද එය දරව, නිරුත්තර සංසග්‍රාමවිජය'යයිද එය දරවැයි, භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දෙසූ ධර්මයට පැසසූහ. මේ ගාථා නැති සූත්‍රය (වෙය්‍යාකරණ ධර්මය)දේසනා කරණ කල දශදහසක් ලොකධාතුව කම්පාවිය.

**(පළමුවන බ්‍රහ්මජාල සූත්‍රය නිමියේය.)**

## 2 සාමඤ්ඤ ඵල සූත්‍රය.

මාගේ ඇසීම මෙසේය. (මා විසින් මෙසේ අසන ලදී.) එක් කාලයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර අසල කොමාර භච්ච ජීවකයන්ගේ අඹවනෙහි මහා භික්ෂු සංඝයාවූ භික්ෂූන් එක්දහස් දෙසිය පනහක් සමග වාසය කෙළේය. ඒ කාලයේදී විදෙහදේවීගේ පුත්‍රයාවූ මගධ රට අජාසත් රජ එදවස් පැමිණි පසළොස්වක් පොහොය දවසේ හොඳාකාර පිපිනු සුදු පියුම් (කුමුදු) ඇත්තාවූ (අවුරුද්දේ) මාස හතරක් අවසානව මාසයන්ගේ පිරීම ඇත්තාවූ සම්පූර්ණ හඳ එලියෙන් බබලන රාත්‍රියෙහි රජ ඇමතියන් විසින් පිරිවරණ ලදුව උසස් මාලිගාවේ උඩුමහල් තලයට පැමිණ උන්නේය. එවිට විදේහදේවීගේ පුත්‍රයාවූ මගධ රජ අජාසත් රජ ඒ දවසේ පොහෝ දිනයෙහි මෙසේ ප්‍රීති වාක්‍යයක් ප්‍රකාශ කෙළේය.

"පින්වත්නි, පිරිසිදු (සඳ රැසින් පිරුණු) රාත්‍රිය සැබවින්ම ප්‍රීති ගෙන දෙයි. පින්වත්නි, පිරිසිදු රාත්‍රිය සැබවින්ම ලස්සන පෙනුමකි. (උසස් රූ ඇත්තීය, පින්වත්නි, පිරිසිදු රාත්‍රිය සැබවින්ම දැකීමට ප්‍රියය. පින්වත්නි, පිරිසිදු රාත්‍රිය සැබවින්ම හිත් සතුටු කරන්නීය. පින්වත්නි, පිරිසිදු රාත්‍රිය සැබවින්ම මතක තබාගැනීමට සුදුසුය. ලඟට ගොස් ආශ්‍රය කිරීමෙන් අපගේ හිත් පහදවා ගැනීමට කුමණ මහණෙකු හෝ බමුණෙකු අද සොයා යන්නෙමුද?"

**2.** මෙසේ කී කල එක්තරා රජ ඇමතියෙක් විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජුට මෙසේ කීයඃ 'දෙවයන් වහන්ස, මේ පූරණ කාශ්‍යපයන්ට (මහණ) සමූහයා ඇත්තේය. පිරිස ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්ථක ධර්මදේශනා කරන්නේය. බොහෝදෙනා විසින් යහපත්යයි පිළිගෙන තිබේ. බොහෝ කල් පැවිදිව සිටින්නෙකි. බොහෝ කල් ගතවී ගොස් මහලු (අවසාන) වයසට පැමිණියේය. දෙවයන් වහන්සේ ඒ පූරණ කාශ්‍යප ආශ්‍රය කෙරෙත්වා. ඔහු ආශ්‍රය කරන ඔබගේ සිත හොඳින් පහදින්නේය."

මෙසේ කීකල විදෙහ දේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජ නිශ්ශබ්ද විය.

**3.** තවද එක්තරා රජ ඇමතියෙක් විදෙහදේවියගේ පුත්‍ර මගධරට අජාසත් රජුට මෙසේ කීය. "දෙවයන් වහන්ස, මේ මක්ඛලිගොසාලටද (මහණ) සමූහයා ඇත්තේය. පිරිස ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්ථක ධර්මදේශනා කරන්නේය. බොහෝ දෙනා විසින් යහපත්යයි පිළිගෙන තිබේ. පැවිදිව බොහෝ කල් ඇත්තේය. බොහෝ කල් ගතවී ගොස් මහලු (අවසාන) වයසට පැමිණියේය. දෙවයන්වහන්සේ ඒ මක්ඛලිගොසාලයන් ආශ්‍රය කෙරෙත්වා ඔහු ආශ්‍රය කරන ඔබගේ හිත හොඳින් පහදින්නේය.

මෙසේ කී කල විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජ නිශ්ශබ්ද විය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**4.** තවද එක්තරා රජ ඇමතියෙක් විදේහදෙවීගේ පුත්‍ර මගධරට අජාසත් රජුට මෙසේ කීය: "දෙවයන් වහන්ස, මේ අජිත කෙසකම්බලට (මහණ) සමූහයා ඇත්තේය. පිරිස ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්ථක ධර්මදේශනා කරන්නේය. බොහෝ දෙනා විසින් යහපත්යයි පිළිගෙන තිබේ. (රාත්‍රඥය) බොහෝ කල් දන්නෙකි. බොහෝ කල් පැවිදිව සිටින්නෙකි. බොහෝකල් ගතවී ගොස් මහලු (අවසාන) වයසට පැමිණියේය. දෙවයන් වහන්සේ ඒ අජිත කෙසකම්බලයන් ආශ්‍රය කෙරෙත්වා. ඔහු ආශ්‍රය කරන ඔබගේ සිත හොඳින් පහදින්නේය."

මෙසේ කී කලද විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජ නිශ්ශබ්ද විය.

**5.** තවද එක්තරා රජ ඇමතියෙක් විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජුට මෙසේ කීය: "දෙවයන් වහන්ස, මේ පකුධකච්චායනට (මහණ) සමූහයා ඇත්තේය. පිරිස ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්ථක ධර්මදේශනා කරන්නේය. බොහෝ දෙනා විසින් යහපත්යයි පිළිගෙන තිබේ. (රාත්‍රඥය) බොහෝ කල් දන්නෙකි. බොහෝ කල් පැවිදිව සිටින්නෙකි. බොහෝ කල් ගතවී ගොස් මහලු (අවසාන) වයසට පැමිණියේය. දෙවයන් වහන්සේ ඒ පකුධකච්චායන ආශ්‍රය කෙරෙත්වා. ඔහු ආශ්‍රය කරන ඔබගේ සිත හොඳින් පහදින්නේය."

මෙසේ කී කලද විදෙහදේවිගේ පුත්‍ර මගධරට අජාසත් රජ නිශ්ශබ්ද විය.

**6.** තවද එක්තරා රජ ඇමතියෙක් විදෙහදේවීගේ පුත්‍ර, මගධරට අජාසත් රජුට මෙසේ කීය: "දෙවයන් වහන්ස, මේ සඤ්ජය බෙලට්ඨ පුත්තට (මහණ) සමූහයා ඇත්තේය. පිරිස ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්ථක ධර්මදේශනා කරන්නේය. බොහෝ දෙනා විසින් යහපත්යයි පිළිගෙන තිබේ. (රාත්‍රඥය) බොහෝ කල් දන්නෙකි. බොහෝ කල් පැවිදිව සිටින්නෙකි. බොහෝ කල් ගතවී ගොස්

මහලු (අවසාන) වයසට පැමිණියේය. දෙවයන් වහන්සේ ඒ සඤ්ජය බෙලට්ඨ පුත්ත ආශ්‍රය කෙරෙත්වා. ඔහු ආශ්‍රය කරන ඔබගේ සිත හොඳින් පහදින්නේය."

මෙසේ කී කලද විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජ නිශ්ශබ්ද විය.

7. තවද එක්තරා රජ ඇමතියෙක් විදෙහදේවියගේ පුත්‍ර මගධරට අජාසත් රජුට මෙසේ කීයඃ "දෙවයන් වහන්ස, මේ නිගණ්ඨනාථ පුත්‍රට (මහණ) සමූහයා ඇත්තේය. පිරිස ඇත්තේය. පිරිසට ගුරුවරයෙකි. ප්‍රසිද්ධ කීර්තියක් දරන්නෙකි. තීර්ථක ධර්ම දේශනා කරන්නේය. බොහෝදෙනා විසින් යහපත්යයි පිළිගෙන තිබේ. (රාත්‍රඥය) බොහෝ කල් දන්නෙකි. බොහෝ කල් පැවිදිව සිටින්නෙකි. බොහෝ කල් ගතවී ගොස් මහලු (අවසාන) වයසට පැමිණියේය. දෙවයන් වහන්සේ ඒ නිගණ්ඨනාථ පුත්‍ර ආශ්‍රය කෙරෙත්වා. ඔහු ආශ්‍රය කරන ඔබගේ සිත හොඳින් පහදින්නේය."

මෙසේ කී කලද විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජ නිශ්බ්ද විය.

8. එකල්හි කොමාරභච්ච ජීවක නිශ්ශබ්දව අජාසත් රජ සමීපයෙහි උන්නේවිය. එවිට අජාසත් රජ, "යහලු ජීවකය, ඔබ කුමක් නිසා නිශ්ශබ්දව සිටින්නාහුදැයි" කොමාරභච්ච ජීවකයාගෙන් ඇසීය.

"දෙවයන් වහන්ස, මේ අරහත් සම්මා සම්බුදු භාග්‍යවතුන් වහන්සේ මහා භික්ෂු සංඝයාවූ එක්දහස් දෙසිය පණහක් පමණ භික්ෂූන්වහන්සේ සමග අපගේ අඹවනයෙහි වාසය කෙරෙත්. ඒ ගෞතම භාග්‍යවතුන් වහන්සේගේ මෙබඳු ස්තුති ඝොෂාව උස්ව නැංගේය. කෙසේද යත්, ඒ භාග්‍යවතුන් වහන්සේ (කෙලෙසුන්ගෙන් දුරුවීම නිසා) අරහත්ය. (සියලු ධර්ම තමන් විසින්ම අවබොධ කරගත් නිසා) සම්මා සම්බුදු විය. විද්‍යාවෙන් සහ චරණ ධර්මයෙන් යුත් බැවින්) විජ්ජාචරණ සම්පන්න විය. (යහපත් මාර්ගයේ ගමන් ඇති බැවින්) 'සුගත' විය. සියලු

ආකාරයෙන් ලොක පිළිබඳ දැනීම කළ බැවින් 'ලොකවිදූ විය. තමාට වඩා උසස් කෙනෙකු නැති බැවින්) 'අනුත්තර' විය. දමනය නොකොට හැක්කන් දමනය කිරීම නිපුණ බැවින්) 'පුරිස දම්ම සාරථී' විය. දෙව් මිනිසුන්ට උගන්වන බැවින් ගුරුවර' (ශාස්තෘ) විය 'චතුරාර්යසත්‍ය' නම්වූ සත්‍ය හතර අවබොධ කළ බැවින් 'බුද්ධ' නම් විය. (රාගාදී කෙලෙස් විනාශ කිරීමෙන්) භගවත් විය. එබැවින් දෙවයන් වහන්සේ ඒ භාග්‍යවතුන් වහන්සේ ආශ්‍රය කෙරෙත්වා. උන්වහන්සේ ආශ්‍රය කරන ඔබ වහන්සේගේ සිත සැකයක් නැතුව පහදින්නේමය."

"යහලු ජීවකය, එසේ නම් ඇත් යානාවක් සරසව"

**9.** "එහෙමයි, දෙවයන් වහන්ස" කියා කොමාරභච්ච ජීවක, විදෙහදේවිගේ පුත්‍ර මගධරට අජාසත් රජුට උත්තර දී, ඇතින්නියන් පන්සියයක් සහ රජුට නැගීමට ඇතෙකුද සරසවා, "දෙවයන් වහන්ස, ඇත් යානා පිළියෙළ කෙරුවේය. ගමනට කාලයයි සලකන්නේ නම් කැමැත්තක් කළ මැනව"යි- විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජුට දැන්විය.

එවිට විදෙහදේවිගේ පුත්‍ර මගධරට අජාසත් රජ පන්සියයක් ඇතිනි යානායන්හි එක් එක් ස්ත්‍රිය බැගින් නංවා තමන්ට සුදුසු ඇතුපිට නැගී පන්දම් දැල්වූ කල මහත්වූ රාජානුභාවයෙන් යුක්තව රජගහනුවරින් පිටත්ව කොමාරභච්ච ජීවකයාගේ අඹවනය යම් තැනකද එතැනට ගියේය.

**10.** එකල විදෙහදේවියගේ පුත්‍ර මගධරට අජාසත් රජුට අඹවනයට නුදුරු තැනකදී හිතට ලොකු බයක් ඇතිවිය තිගැස්වීමක් ඇති විය. ලොම් නැගී සිටියෝය. එවිට බයව තැතිගෙන ලොම් කෙලින්වී සිටි විදෙහදේවිගේ පුත්‍ර මගධරට අජාසත්රජ, "යහළු ජීවකය, මොකද? මා වඤ්චාකළා නොවේද? යහළු ජීවකය, මොකද! නැති දේ ඇතැයි කියා මා රැවටුවා නොවේද? යහළු ජීවකය මොකද! මා සතුරන්ට පාවාදෙනවා නොවේද? මක්නිසා එක් දහස් දෙසිය පනහක් පමණවූ මහා භික්ෂු සංඝයාගේ කිඹිසුම් ශබ්දයක් හෝ කැරැම් ශබ්දයක් හෝ

කථා ශබ්දයක් හෝ පණවත් ඇසෙන්නේ නැද්ද?" කොමාරභච්ච ජීවකයාගෙන් ඇසීය.

"මහරජ, බිය නොවන්න දේවයන් වහන්ස, ඔබ වඤ්චා නොකරමි. දෙවයන් වහන්ස, ඔබ බොරුවෙන් නොරවටමි. දෙවයන් වහන්ස, ඔබ සතුරන්ට පාවා නොදෙමි. මහරජ, ඉදිරියට යන්න. මහරජ, ඉදිරියට යන්න. චක්‍රාකාර ශාලාවෙහි අර පහන් දැල්වෙයි."

**11.** එවිට විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජ ඇතුපිටින් යන්ට හැකිතාක් දුර ගොස්, ඇතුපිටින් බැස පයින්ම චක්‍රාකාර ශාලාවේ දොර ලඟට පැමිණියේය. එසේ පැමිණ, 'යහළු ජීවකය, භාග්‍යවතුන්වහන්සේ කොතැනදැ'යි කොමාරභච්ච ජීවකයාගෙන් ඇසුවේය.

"ඒ භාග්‍යවතුන් වහන්සේය, මහරජ, ඒ භාග්‍යවතුන් වහන්සේය, මහරජ, මැද කණුව සමීපයෙහි නැගෙනහිර දෙස බලා භික්ෂු සංඝයා පිරිවරා වැඩහුන්නේ භාග්‍යවතුන් වහන්සේය."

**12.** එවිට විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජ භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳින තැනට පැමිණියේය. පැමිණ එක පැත්තකට වී සිටියේය. හැම පැත්තෙන් සන්සුන්වූ නිශ්ශබ්දවූ පිරිසිදු විලක් මෙන් සතුටු ඉන්ද්‍රියයන් ඇති භික්ෂු සංඝයා නැවත නැවත බලා, "දැන් මේ භික්ෂු සංඝයා යම් ආකාර සංසිඳීමකින් යුක්තද මාගේ උදයභද්ද කුමාරයාද ඒ ඉන්ද්‍රිය මැඩපවත්වා ගැනීමෙන් යුක්ත වේවා"යි ප්‍රීති වාක්‍යයක් ඒ විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජ පහළ කෙළේය.

"මහරජ, භික්ෂු සංඝයා බලා තොපගේ සිත ප්‍රේමය ඇති තැන කරා ගියේවේද?"

"ස්වාමීනි, උදයභද්ද කුමාරයා මට ප්‍රියය, ස්වාමීනි, දැන් මේ භික්ෂු සංඝයා යම් ඉන්ද්‍රිය මැඩපවත්වා ගැනීමකින් යුක්තද, උදයභද්ද කුමරුද ඒ ඉන්ද්‍රිය මැඩපවත්වා ගැනීමෙන් යුක්ත වේවා"

13. එවිට විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත් රජ භාග්‍යවතුන් වහන්සේ මනාකොට වැඳ, භික්ෂු සංඝයාට දෑත එකතු කොට වැඳ, එකපැත්තකට වී උන්නේය. එසේ උන්නාවූ විදෙහදේවීගේ පුත්‍ර මගධරට අජාසත්රජ, "ස්වාමීනි, භාග්‍යවතුන්වහන්ස, දැන් ප්‍රශ්නයක් ඇසීමට අවසර දෙන්නේ නම්, භාග්‍යවතුන්වහන්සේගෙන් කිසියම් ප්‍රශ්නයක් අසමි"යි කීයේය.

"මහරජ, තොපට යමක් කැමති නම් ඒ අසව."

14. "ස්වාමීනි, ඒ ඒ අයගේ ජීවත්වීමට හේතුවූ බොහෝ ශිල්පවෙත්. එනම්ඃ ඇතුන්පිට යැම් ආදියේ ශිල්පය, අශ්ව ශිල්පය, රථ ශිල්පය, දුනු ශිල්පය, යුද්ධයෙහි ජයකොඩි ගෙන පෙරටුව යන්නෝය. සේනාවේ ස්ථාන නියමාදිය කරන්නෝය, යුද්ධයට යන මහා යෝධයෝය. යුද්ධකරන ක්ෂත්‍රියයෝය, (ඔට්ටු අල්ලා) සතුරන්ගේ හිස් ආදිය ගෙන එන්නෝය, ඇතෙකුට වුවත් පසුනොබානා මහා යෝධයෝය, සංග්‍රාම ශූරයෝ නම් යුද්ධ දක්ෂයෝය, හම් හැට්ට ඇඳ හෝ පලිහගෙන යුද කරන්නෝය, දාසයෝ නම් මෙහෙකරුවෝය, කෑම සපයන්නෝය, රැවුල් කපන්නෝය, නාවන්නෝය, කෑම පිසන්නෝය, මල්කරුවෝය, රෙදි සෝදන්නෝය, රෙදි වියන්නෝය වේවැල් ආදියෙන් වැඩකරන්නෝ, වලන් සාදන්නෝ, නැකැත්කාරයෝ, හස්තමුද්‍රා ගණනින් ජීවත් වෙන්නෝය යන මොවුන්ගේ ශිල්පයි මේ හැර තවත් බොහෝ ශිල්පයෝ වෙත්ද, ඒ ශිල්පයන් දක්වා මේ ආත්මයේම තමා විසින් දැක්ක හැකි ශිල්ප ඵලය නිසා ජීවත් වෙති. ඔවුහු ඉන් තම ජීවිතය සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්, දරුවන් සහ භාර්යාව සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත් මිත්‍රයින් සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්. මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක ඇති සම්පත්ති ධර්මයන් උපදවන දානය මහණ බමුණන් කෙරෙහි පිහිටුවත් ඒ මන්ද? ස්වාමීනි, එමෙන්ම මේ ආත්ම භාවයෙහි දැක්ක හැකිවූ විපාක ඇති යහපත් මාර්ගඵලයක් ප්‍රකාශ කරන්නට පුළුවන්ද?"

15. "මහරජ, ඔබ මේ ප්‍රශ්නය අන් මහණ බමුණන් ගෙනුත් ඇසූ බව නොදන්නෙහිද?"

"ස්වාමීනි, මේ ප්‍රශ්නය වෙනත් මහණ බමුණන්ගෙන් මම ඇසූ බව දනිමි."

"මහරජ ඔවුහු එය කෙසේ විසඳුවාදැයි ඔබට අපහසු නොවේ නම් කියව"

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ හෝ භාග්‍යවතුන් වහන්සේ බඳු අන්‍යයෝ හෝ යම් තැනක වෙත්ද එතුමන් ඉදිරියෙහි කියන්නට අපහසු නොවේ."

"මහරජ, එසේ නම් කියනු මැනව."

16. "ස්වාමීනි, මම එක් දිනෙක පූරණ කාශ්‍යපයන් යම් තැනෙකද එතැනට පැමිණ, ඔහු සමග සතුටුසාමීචි කථා කෙළෙමි. සතුටු උපදවන්නාවූ, සිහිකටයුතු කථා නිමකොට එකත්පස්ව උන්නෙමි. ස්වාමීනි. එසේ උන් මම පූරණ කාශ්‍යපයන්ට මෙසේ කීවෙමි. පින්වත, කාශ්‍යපය, යම් අය ඒ ඒ ශිල්ප නිසා ජීවත් වෙත්ද, ඇතුන්පිට යාම ආදී බොහෝ ශිල්පිහු වෙත්ද, මෙයින් අන්‍යවූත් මෙසේම පැවති ශිල්ප වෙත්ද ඒ ශිල්පයන් දක්වා මේ ආත්ම භාවෙහිම තමා විසින්ම දැක්ක හැකිවූ ශිල්ප ඵලය නිසා ජීවත්වෙති. ඔව්හු එයින් තම ජීවිතය සුවපත් කෙරෙත්, පිනවත් මව්පියන් සුවපත් කෙරෙත්, පිනවත්. දරුවන් හා භාර්යාව සුවපත් කෙරෙත්, පිනවත්. මිත්‍රයන් සුවපත් කෙරෙත්, පිනවත්. මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක ඇති සම්පත්ති ධර්මයන් උපදවන, දානය මහණ බමුණන් කෙරෙහි පිහිටුවත් ඒ මන්ද? පින්වත කාශ්‍යපයෙනි, එමෙන්ම මේ ආත්මභාවයෙහි දැක්ක හැකිවූ විපාක ඇති යහපත් මාර්ගඵලයක් ප්‍රකාශ කරන්නට පුළුවන්ද?

17. "ස්වාමීනි, මා මෙසේ කී කල පූරණකාශ්‍යපයා මට මෙසේ කීයඃ කෙසේදයත්ඃ මහරජ, සිය අතින් කරන්නාහටද අණදී කරවන්නාහටද, කපන්නාහටද, කප්පවන්නාහටද, අනුන් දඬුවමින් පෙළන්නා හටද, එසේ පරපීඩා කරවන්නා හටද

තමන්ම ශොක ඇතිකරන්නා හටද, අනුන් ලවා ශොක කරවන්නා හටද, අනුන් කම්පා කරන්නාහටද, එසේම අනුන් කම්පා කරවන්නාහටද, ප්‍රාණ හිංසා කරන්නාහටද, එසේ කරවන්නාහටද, නුදුන් දෙය ගන්නාහටද, ගෘහසන්ධි බිඳින්නාහටද, කිසිවක් ඉතිරි නොකොට පැහැරගන්නා හටද, එකම ගෙයක් වටකොට උපද්‍රව කරන්නාහටද, පැමිණි පැමිණියන් මරා බඩු පැහැරගැණීම පිණිස මගසැඟවී සිටින්නා හටද, පර අඹුවන් කරා යන්නාහටද, බොරු කියන්නා හටද පවක් කරන්නාහටද, පවක් නැත්තේවේ. තවද යමෙක් (ඉතා තියුණුවූ) බුර නම් ආයුධයෙන් කරණ ලද මේ පොළොවෙහි වසන (සියලු) සත්වයන් මරා එකම මස් ගොඩක් එකම මස් පිඩක් කරන්නේද ඒ හේතුවෙන් පවක් නැත්තේය, පාපයාගේ පැවතීමක් නැත්තේය. (සත්වයන්) හිංසා කරමින්, කරවමින්, සිඳිමින්, සින්දවමින්, පීඩා කරමින්, කරවමින් ඒ හේතු කොටද පාපයක් නැත්තේය, පාපයාගේ පැමිණීමක් නැත්තේය (දන්) දෙමින්, දෙවමින්, යාග කරමින්, කරවමින් ගංගා නදියෙහි උතුරු තෙරට යන්නේ නමුත් ඒ හේතුවෙන්ද පිණක් නැත්තේය. පුණ්‍යයාගේ වැඩීමක් නැත්තේය. (දන්) දීමෙන්ද, ඉන්ද්‍රිය දමනයෙන් හෝ එක් වරුවේ කෑම ගන්නා දිනයෙන්ද, සීල-හික්මීමෙන්ද සැබෑ කීමෙන්ද පිණක් නැත්තේය. පුණ්‍යයාගේ පැමිණීමක් නැත්තේය' යනුයි.

"ස්වාමීනි, මෙසේ මා විසින් හොඳින් දුටුවාවූ යහපත් මාර්ග ඵලය අසන කල පූරණකාශ්‍යප නොකිරීම ප්‍රකාශ කෙළේය. 'ස්වාමීනි, අඹගස පිළිබඳ තොරතුරු විචාරණලද්දේ දෙල්ගස් පිළිබඳ තොරතුරු කියන්නේද, දෙල්ගස පිළිබඳ විචාළේ අඹගස පිළිබඳ කියන්නේ යම්සේද, ස්වාමීනි, එපරිද්දෙන්ම මවිසින් හොඳින් දුටුවාවූ යහපත් මාර්ගඵලය අසනලද පූරණකාශ්‍යප නොකිරීමම ප්‍රකාශ කළේය.

"ස්වාමීන් වහන්ස, එවිට මට මෙබඳු අදහසක් විය. එනම්: මා වැනි රජෙක් සියඅණ පවත්නා පෙදෙසෙහි වසන මහණෙකු හෝ බමුණෙකු වෙහෙසිය යුත්තකු (රටින්) නෙරපිය යුත්තකු

කොට කෙසේ නම් සිතන්නේද? යනුයි. ස්වාමීනි, එබැවින් මම පූරණකාශ්‍යපයන්ගේ කථාවට නොමසතුටුවීමි. ප්‍රශංසාත් නොකොට අස්කිරීමද, නොකොට නොසතුටු සිත් ඇතුව නොසතුටු වචන නොකියා (කාශ්‍යපයන්ගේ) ඒ වචනය සාරවශයෙන් නොගෙණ, ඒ සිතෙහි නොපිහිටුවා උන් ආසනයෙන් නැගිට ගියෙමි.

18. "ස්වාමීනි, මම එක් දිනෙක මක්ඛලිගොසාලයන් වෙතට පැමිණ ඔහු සමග සතුටු සාමීචියෙහි යෙදී සතුටු උපදවන සිහිකටයුතු කථා නිමකොට එකපැත්තකටවී හුන්නෙමි 'ස්වාමීන් වහන්ස, එසේ හුන් මම මක්ඛලිගොසාලයන්ට මෙසේ කීවෙමි. කෙසේද යත්: 'භවත් ගොසාලය, යම්සේ ඇතුන් පිට යන්නෝ ආදී ශිල්පියෝ ඒ ඒ ශිල්පයන් දක්වා මේ ආත්මයේම තමා විසින්ම දැක්ක හැකි ශිල්ප ඵලය නිසා ජීවත් වෙති. ඔව්හු ඉන් තම ජීවිතය සුවපත් කෙරෙත්, ශක්තිමත් කෙරෙත් මව්පියන් සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්. දරුවන් සහ භාර්යාව සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්. මිත්‍රයින් සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්. මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක ඇති සම්පත්ති ධර්මයන් උපදවන දානය මහණ බමුණන් කෙරෙහි පිහිටුවත්. එනම් භවත් ගොසාලයෙනි, එමෙන්ම මේ ආත්මභාවයෙහි දැක්කයුතු විපාක ඇති යහපත් මාර්ඵලයක් ප්‍රකාශකරන්නට පුළුවන්ද?

19. "ස්වාමීනි, මා මෙසේ කී කල මක්ඛලිගොසාල මට මෙය කීවේය. එනම්:- 'මහරජ, සත්ත්වයන්ගේ කෙලෙසීමට හේතුවක් ප්‍රත්‍යයක් නැත්තේය. හේතු රහිතව සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගෙ පිරිසිදුවීමට හේතු, ප්‍රත්‍යය නැත. හෙතු රහිතව ප්‍රත්‍යය රහිතව සත්ත්වයෝ පිරිසිදුවෙත්. තමා කළ කර්මයෙහි විපාක නැත. අනුන්ගේ අවවාදානු ශාසනා පරිදි කළ කර්මයෙහි ඵලය නැත. බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්වයෝද සියලු ප්‍රාණීහුද, සියලු භූතයෝද, සියලු ප්‍රාණීන්ද, යන සියල්ලෝම වසඟ නැත්තෝ බල නැත්තෝය, වීර්යනැත්තෝය. නියම ගති ඇති

බැවින් සය ආකාර උසස් ජාතීන් අතුරෙහි ඒ ඒ ගතිවලට පැමිණීමෙන්ද ස්වභාවයෙන්ද නොයෙක් ආකාරයට පැමිණියාහු ජාතියෙහිම සුවදුක් විඳිත්.

'යම්බඳු බාලයෝත් පණ්ඩිතයෝත් බොහෝ ලෙස හැසිර දුක් කෙළවර කෙරෙත් නම් එබඳුවූ මේ උතුම් යෝනි දහහතර ලක්ෂ සයදහස්සසියයක්ද, කර්ම පන්සියයක්ද, පඤ්චෙන්ද්‍රිය පසක්ද (තුනක්ද) කර්මයෝද අර්ධකර්මයද, දෙසැට ප්‍රතිපදාවෝද, දෙසැට අන්තර කල්පයෝද, ජාති සයක්ද, පුරිස්බිම් අටක්ද, නිර්වස්ත්‍රව හිඟමින් ආගම අදහන පැවතුම් එකසිය හතලිස් නවයක්ද, මහණ පැවිදි එකසිය හතලිස් නවයක්ද, නාගමණ්ඩල එක්සිය හතලිස් නවයක්ද, ඉන්ද්‍රිය එකසිය විස්සක්ද, නිරය එකසිය තිහක්ද, රාජොධාතු තිහක්ද, සංඥා ගර්භ තිස්හතක්ද, (හැල්ආදී) අසංඥගර්භ සතක්ද, (උක් හුණ) ආදී නිගණ්ඨිගර්භ සතක්ද, දිව්‍ය නිකාය සතක්ද, මිනිස්යොනි සතක්ද, පිසාච යොනි සතක්ද. විල්සතක්ද, මහගැටසතක්ද, කුඩාගැට එකසිය සතක්ද, මහා ප්‍රපාත සතක්ද, මහා ස්වප්න සතක්ද, කුඩා ස්වප්න එකසිය සතක්ද, මහාකල්ප සූවාසූ ලක්ෂයක්ද, වෙත්. අනුවණ අයද නුවණ ඇත්තෝද භවයෙන් භවයට ගොස් ජීවත්වෙමින් දුක් අවසන් කෙරෙති.

"එහි මම මේ ශීලයෙන් හෝ එබඳු වෙන ශීලයකින් හෝ එබඳු කලකට ආහාර නොගැනීම ආදී ආගම් කටයුත්තකින් හෝ එබඳුතපසින් හෝ බ්‍රහ්මචර්යනම් පිරිසිදු ජීවිතයෙන් හෝ දියුණු කිරීමට නොපැමිණි කර්මය කර්මය වන්නෙමි යි කියා හෝ නැත්තේය. මම දියුණුකර ගිය කර්මය හෝ විඳිමින් ගෙවීම කරන්නෙමියි කියාද නැත්තේය කුරුණි හතරෙන් මැන ප්‍රමාණ කළවුන් මෙන් සැප දුක් සීමාවූ කාලයෙන් කෙළවර කළ කල සංසාරයෙහි අඩුවීමක් හෝ වැඩිවීමක් නැත්තේය. උස් බවක් හෝ පහත් බවක නැත්තේය යම්සේ නූලෙන් වෙළා කළ පන්දක්-පර්වතයක් හෝ ගහක් මුදුනත හෝ සිට දමා ගසන්නේ නොපැකිල යේද අවසන්වූ කල නොයේද එසේම නුවණ අයද අනුවණ ඇත්තෝද භවයෙන් භවයට ගොස් ජීවත් වෙමින් දුක් අවසන් කරති.

"ස්වාමීනි, මෙසේ මා විසින් ආත්ම භාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ග ඵලයක් ඇසූකල මක්ඛලිගොසාල භවයෙන් භවයට යාමෙන් සත්වයා පිරිසිදුවන බව ප්‍රකාශකෙළේය. ස්වාමීන් වහන්ස, අඹරුක කෙසේදැයි ඇසූකල දෙල්ගස මෙබඳුයයි කියන්නේ හෝ දෙල්ගස කෙසේදැයි ඇසූකල අඹ රුක මෙබඳුයයි කියන්නේ හෝ යම්සේද, ස්වාමීන් වහන්ස, එපරිද්දෙන් මා විසින් මේආත්ම භාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ග ඵලයක් ඇසූකල මක්ඛලිගොසාල සංසාර සුද්ධිය ප්‍රකාශ කෙළේය. ස්වාමීනි මට එවිට මෙබඳු අදහසක් ඇතිවිය. එනම්: 'මා වැනි රජෙක් සිය අණ පැවති ප්‍රදෙශයෙහි වසන මහණකු හෝ බමුණකු හෝ කෙසේ නම් වෙහෙසිය යුත්තකු රටින් නෙරපිය යුත්තකු කොට කෙසේ නම් හිතන්නේද, යනුයි. ස්වාමීනි, මම මක්ඛලිගොසාලගේ වචනයට එනිසා සතුටු නූනෙමි. නින්දාද නොකලෙමි. ප්‍රශංසාත් නොකොට, අස්කිරීමද නොකොට, නොසතුටු සිත් ඇතිව, නොසතුටු වචන නොකියා ඔහු කී දේ සාර වශයෙන් නොගෙණ ඒ සිතෙහි නොපිහිටුවා උන් ආසනයෙන් නැගිට ගියමි.

**20.** 'ස්වාමීනි, දිනක් මම කෙස කම්බලධාරීවූ අජිතයන් වෙත පැමිණ ඔහු හා සතුටු සාමීචි පවත්වා සතුටු උපදවන සිහි කටයුතු කථා නිම කොට එකපැත්තකට හුන්නෙමි. ස්වාමීනි, එසේ හුන් මම කෙසලකම්බල අජිතයාට මෙසේ කීවෙමි. කෙසේදයත්: 'භවත් අජිතයෙනි, යමෙක් ඒ ඒ ශිල්පයන් නිසා ජීවත්වෙත්ද යම් සේ ඇතුන්පිට යෑම ආදී ශිල්පය..... යනාදී ඒ ශිල්පයන් දක්වා මේ ආත්මයේම තමා විසින් දැක්ක හැකි ශිල්පඵලය නිසා ජීවත්වෙති. ඔවුහු ඉන් තම ජීවිතය සුවපත් කෙරෙත්, ශක්තිමත් කෙරෙත්. මව්පියන්, සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්, දරුවන් සහ භාර්යාව සුවපත් කෙරෙත්, මත්තෙහි ඵලදෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක ඇති සම්පත්ති ධර්මයන් උපදවන දානය මහණ බමුණන් කෙරෙහි පිහිටුවත්. ඒ මන්ද? භවත් අජිතයෙනි, එපරිද්දෙන් මේ අත්බැව්හි දැක්කහැකි විපාක ඇති මාර්ගඵලයක් දක්වන්නට හැකිද?

"ස්වාමීනි, මා මෙසේ කී කල කෙසකම්බල අජිත මට මෙය කීයේය. මහරජ, දානයක් නැත, යාගයක් නැත, ගරු බුහුමන් කිරීමක් නැත, කුශලාකුල කර්මයන්ගේ ඵලයක් නැත, විපාකයක් නැත, මෙලෝ නැත, පරලොව නැත, මවෙක් නැත, පියෙක් නැත, මැරී උපදින සත්වයෝ නැත. යමෙක් මෙලෝ පරලෝ විශේෂ ඥානයෙන් දැන අවබෝධ කොට ප්‍රකාශ කෙරෙත්ද එබඳු ආර්යමාර්ගයට පැමිණි හොඳින් පිළිපැද්ද මහණ බමුණෝ ලෝකයේ නැත.

'හතර මහා මූලිකධාතු (චතුමහාභූතමය) වූ මේ පුරුෂ තෙමේ යම් කලක මැරුණේද එකල පෘථිවි ධාතුව පෘථිවිධාතු රැසට පැමිණෙයි, ඇතුලත් වෙයි. අපොධාතුව ආපොධාතු රැසට පැමිණෙයි, ඇතුළත් වෙයි. තෙජොධාතුව තෙජො ධාතු සමූහයට පැමිණෙයි. ඇතුළත් වෙයි. වායොධාතුව වායොධාතු සමූහයට පැමිණෙයි. එකවෙයි. ඉන්ද්‍රියයෝ හය අහසෙහි හැසිරෙත්. සයනය කළ ඇඳ පස්වැනි කොට ඇති ඇඳෙහි පාසතර ගත් පුරුෂයෝ සතරදෙන සොහොන දක්වා ගෙණ යත්, ගුණාගුණ වචන ප්‍රකාශ කරත්. එවිට ශරීරය පමණක් පෙණෙයි. ඇට පරෙවි පිහාටු වැනි පාට ඇතිවේ. පහනෙක සක්කරාදී (ගිනි පිදීම් ආදී) වශයෙන් දෙන ලද සියලු දානයෝ අලු කෙළවර කොට ඇත්තාහ, යම් (දන්) දීමක් වේ නම් එය අඥානයන් විසින් පණවන ලද්දකි. යමෙක් කර්ම විපාක ඇතැයි යන වාද ඇත්තෝද ඒ ඔවුන්ගේ හිස්වූ බොරුවූ වචන වේ. අනුවණ අයද නුවණ ඇත්තෝද මරණින් පසු සහමුලින් නැතිවෙත්, වැනසෙත්. මරණින් මතු ඔවුහු නොවෙත්, නැතිවෙත්, වැනසෙත්, මරණින් මතු ඔවුහු නොවෙත් (ඉපදීමෙක් නැත.)

"ස්වාමීන් වහන්ස, මෙසේ මා විසින් මේ ආත්ම භාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ග ඵලයක් ඇසූ කල අජිත තෙමේ උච්ඡේද වාදය* පැවසීය. 'ස්වාමීනි අඹගස කෙසේදැයි ඇසූ කල දෙල්ගස මෙසේ යයිද, දෙල්ගස කෙසේදැයි ඇසූ කල අඹගස මෙසේ යයිද යම්සේ කියාද එසේම මේ ආත්ම භාවයෙහි

* සංසාරයක් නැතැයි ඇදහීම

දැක්ක යුතු විපාක ඇති මාර්ග ඵලයක් ඇසූකල ස්වාමීනි, ඒ කෙසකම්බල අජිත තෙමේ උච්ඡේද වාදය පැවසීය.

"ස්වාමීන් වහන්ස, එවිට මට මෙබඳු අදහසක් ඇතිවිය. එනම්ඃ 'මා වැනි රජෙක් කෙසේ නම් සිය රාජ්‍යයෙහි වසන මහණෙකු හෝ බමුණෙකු වෙහෙසිය යුත්තකු නෙරපිය යුත්තකු කොට සිතන්නේද? ස්වාමීනි, එබැවින් මම කෙසකම්බල අජිතගේ වචනවලට සතුටු නොවී, නින්දාද නොකොට, ප්‍රශංසාද නොකොට, අස්කිරීමද නොකොට, නොසතුටු සිත් ඇතත් නොසතුටු වචන නොකියා, ඔහු කී දේම සාරයයි නොගෙන ඒ සිතෙහි නොපිහිටුවා උන් ආසනයෙන් නැගිට ගියෙමි.

21. "ස්වාමීන් වහන්ස, මම එක් දිනක් කච්චායන ගොත්‍රයෙහිවූ පකුධයන් වෙත ගියෙමි. ඔහු සමග සතුටු සාමීචි පවත්වා සතුටු උපදවන සිහිකටයුතු කථා නිමකොට එක පැත්තකටවී ඉඳ ඒ කාත්‍යායන ගොත්‍රික පකුධයන්ට මෙසේ කීවෙමි. කෙසේද යත්ඃ 'භවත් කච්චායනය, ඇතුන් පිට යන්නෝ ආදී ශිල්පියෝ ඒ ඒ ශිල්පයන් දක්වා මේ ආත්මයේම තමා විසින් දැක්ක හැකි ශිල්ප ඵලය නිසා ජීවත් වෙති. ඔවුහු ඉන් තම ජීවිතය සුවපත් කෙරෙත්. මව්පියන් සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්. දරුවන් සහ භාර්යාව සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්. මිත්‍රයන් සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්. මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක ඇති සම්පත්ති ධර්මයන් උපදවන දානය මහණ බමුණන් කෙරෙහි පිහිටුවත් ඒ මන්ද? භවත් කච්චායනය, එමෙන් මේ මේ ආත්මභාවයෙහි දැක්කයුතු යහපත් මාර්ග ඵලයක් ප්‍රකාශ කළ හැකිද?

"ස්වාමීනි, මා මෙසේ කී කල පකුධකච්චායන මට මෙසේ කීයඃ- 'මහරජ, නොකරණ ලද්දාහුද, මෙසේ කරවයි කිසිවකු ලවා නොකරවන ලද්දාවුද, නොමවන ලද්දාවූ වඳවූ හෙවත් කිසිවකු නූපදවන්නාවූ, පර්වතයක් මෙන් නොසෙලවී සිටියාවූ, තදින් පිහිටුවන ලද කණුවක් මෙන් නිශ්චලවූ (සමූහයෝ) සත් දෙනෙක් වෙත්. ඔවුහු කම්පා නොවෙත්, නොපෙරළෙත්.

ඔවුනොවුන්ගේ සැප පිණිස හෝ දුක් පිණිස හෝ කිසිවක් කිරීමට සමත් නොවෙත්. කවර (සමූහ) සතක්ද යත්: පඨවිය හෙවත් පඨවී සමූහය, ආපො සමූහය, තෙජො සමූහය, වායො සමූහය, සැපය, දුකය, සත්වැනිවූ ප්‍රාණය යන මොහුය මේ සමූහ සත කිසි හේතුවකින් නොකරණ ලදහ. මෙසේ කරවයි කිසිවකු ලවා නොකරවන ලදහ. කිසිවකු විසින් හෝ කිසිවකු ලවා නොමවන ලද්දෝය. කිසිවකු නූපදවන්නෝය. පර්වතයක් මෙන් ස්ථිරව සිටින්නෝය, මන්දාර පර්වතයක් මෙන් නොසෙල්වී සිටින්නෝය. කම්පා නොවන්නෝය. ස්වභාගතිය නොහරින්නෝය. ඔවුනොවුන් පීඩා නොකරන්නෝය. ඔවුනොවුන්ගේ සැප පිණිස හෝ දුක් පිණිස හෝ සමත් නොවන්නෝය. ඒ ප්‍රාණය සත්වැනි කොට ඇති සමූහයන්හි හිංසා කරන්නෙක් හෝ කරවන්නෙක් හෝ අසන්නෙක් හෝ අස්වන්නෙක් හෝ දන්නෙක් හෝ දන්වන්නෙක් හෝ නැත්තේය. යමෙක් තියුණු ආයුධයකින් හිස සිඳීද කිසිවෙක් කිසිවකු ජීවිතයෙන් තොර නොකරයි. පඨවි ආදී සත්වැදෑරුම් සමූහයන් අතරින් එහි සිදුරෙන් ආයුධයක් ඇතුළු වෙයි.

"ස්වාමීනි, මා මෙසේ මේ ආත්ම භාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ගඵලයක් ඇසූ කල කසයින් ගොත්හිවූ පකුධ තෙමේ අනිකකින් අනිකක් පැවසීය. ස්වාමීනි, අඹගස කෙසේ දැයි ඇසූ කල දෙල්ගස මෙසේ යයිද, දෙල්ගස කෙසේදැයි ඇසූ කල අඹගස මෙසේයයිද, යම්සේ ප්‍රකාශ කෙරේද, ස්වාමීන් වහන්ස, එපරිද්දෙන් මා විසින් මේ ආත්මභාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ග ඵලයක් ඇසූ කල පකුධකච්චායන තෙමේ අනිකකින් අනිකක් පැවසීය.

"ස්වාමීනි, එවිට මට මෙබඳු අදහසක් විය එනම්: 'මා වැනි රජෙක් සිය අණ පවත්නා රටෙහි වසන මහණකු හෝ බමුණෙකු හෝ කෙසේ නම් වෙහෙසිය යුත්තකු නෙරපිය යුත්තකු කොට සිතන්නේද? ස්වාමීනි, මම ඒ පකුධ කච්චායනගේ වචනයට සතුටුද නොවී, නින්දාද නොකොට ප්‍රශංසාද නොකොට අස්කිරීමද නොකොට, නොසතුටු සිත් ඇතත් නොසතුටු තෙපුල්

නොකියා ඒ කී දේම සාරයි නොගෙණ සිතෙහි නොපිහිටුවා උන් ආසනයෙන් නැගිට ගියෙමි.

22. "ස්වාමීන් වහන්ස, මම එක්කලෙක නිගණ්ඨනාථ පුත්‍රයන් යම් තැනකද එතැනට ගියෙමි. ඔහු සමග සතුටු සාමීචි පවත්වා, සතුටු උපදවන සිහි කටයුතු කථා නිමකොට එකපැත්තකටවී හිඳ ඒ නිගණ්ඨනාථ පුත්‍රයාට මෙසේ කීවෙමි. කෙසේද යත්: භවත් අග්ගිවෙස්සනය, ඇතුන්පිට යන්නෝ ආදී ශිල්පියෝ යමෙක් ඒ ඒ ශිල්පයන් නිසා ජීවත් වෙත්ද ඔවුහු ඉන් තම ජීවිතය සුවපත් කෙරෙත්, ශක්තිමත් කෙරෙත් මව්පියන් සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්. දරුවන් සහ භාර්යාව සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත් මිත්‍රයින් සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්. මත්තෙහි ඵලදෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක ඇති සම්පත්ති ධර්මයන් උපදවන දානය මහණ බමුණන් කෙරෙහි පිහිටුවත්. ඒ මන්ද? තවත් අග්ගිවෙස්සනය, එපරිද්දෙන් මේ ආත්මභාවයෙහි දැක්කයුතු විපාක ඇති යහපත් මාර්ග ඵලයක් දක්වන්නට හැකිද?'

"ස්වාමීනි, මා මෙසේ කී කල ඒ අග්ගිවෙස්සන තෙමේ මෙසේ කීයඃ- "මහරජ, මේ ලොකයෙහි නිගණ්ඨ තෙමේ හතර කොටසින් යුත් සංවරයෙන් යුක්ත වේ. මහරජ කෙසේ නම් නිගණ්ඨ තෙමේ හතර කොටසෙන් යුත් සංවරයෙන් යුක්තද? මහරජ, මේ ලොකයෙහි නිගණ්ඨ තෙමේ සියලු සිහිල් ජලයෙන් වැළකෙන්නේ සියලු පවින් වැළකීමෙන් යුක්ත වූයේ සියලු පව් පිඹ හැරියේ සියලු පව් වැළැක්මෙන් ස්පර්ශකරණ ලද්දේ වේ. මහරජ, නිගණ්ඨ තෙමේ සංවරයෙන් මෙසේ හතර කොටසෙන් යුක්ත වේ. මහරජ, යම් හෙයකින් නිගණ්ඨ තෙමේ මෙසේ හතර කොටසෙන් යුත් සංවරයෙන් යුක්ත වූයේ වේද, මහරජ, මේ නිගණ්ඨ තෙමේ කෙළවරට පත් සිත් ඇත්තේද, දමනය කරන ලද සිත් ඇත්තේද හොඳ ලෙස පිහිටි සිත් ඇත්තේද වෙයි.

"ස්වාමීනි, මා විසින් මෙසේ මේ ආත්මභාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ග ඵලය ඇසූ කල නිගණ්ඨනාථ පුත්‍ර

තෙමේ හතර කොටසින් යුත් සංවරය ප්‍රකාශ කෙළේය. ස්වාමීනි, යම්සේ අඹරුක කෙසේදැයි ඇසූ කල දෙල් ගහ මෙසේයයිද, දෙල්ගහ කෙසේදැයි ඇසූ කල අඹගහ මෙසේයයි කියාද, ස්වාමීනි, එමෙන් මා විසින් මේ ආත්මභාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ග ඵලය ඇසූ කල නිගණ්ඨනාථ පුත්‍ර තෙමේ හතර කොටසින් යුත් සංවරය පැවසීය.

"ස්වාමීන්වහන්ස, එවිට මට මෙබඳු අදහසක් විය. එනම්: 'මා වැනි රජෙක් සිය අණ පවත්නා රටෙහි වසන මහණකු හෝ බමුණකු හෝ කෙසේ නම් වෙහෙසිය යුත්තකු නෙරපිය යුත්තකු කොට සිතන්නේද? 'ස්වාමීනි, එබැවින් මම නිගණ්ඨ නාථ පුත්‍රයාගේ වචනයට සතුටු නොවීමි, නින්දාද නොකෙළෙමි, ප්‍රශංසාද නොකොට, අස්කිරීමද නොකොට, නොසතුටු සිත් ඇතත් නොසතුටු වචන නොකියා එයම සාරයයි නොගන්නේ, සිතෙහි නොපිහිටුවන්නේ උන් ආසනයෙන් නැගිට ගියෙමි.

23. "ස්වාමීන් වහන්ස, මම එක් දිනක් බෙලට්ඨපුත්තවූ සඤ්ජය වෙත ගියෙමි. ඔහු සමග සතුටුසාමීචි පවත්වා සතුටු උපදවන සිහි කටයුතු කථා නිම කොට එක පැත්තකටව ඒ සඤ්ජය නම් බෙලට්ඨපුත්‍රයාහට මෙසේ කීවෙමි. කෙසේද යත්: 'භවත් සඤ්ජයෙනි, ඒ ඒ ශිල්පයෙන් නිසා ජීවත්වන්නාවූ හත්ථාචාරියාදීහු වෙති. ඔව්හු ඉන් තම ජීවිතය සුවපත් කෙරෙත්, ශක්තිමත් කෙරෙත්, මවුපියන් සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්, දරුවන් සහ භාර්යාව සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්, මිත්‍රයින් සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්, මත්තෙහි ඵලදෙන ස්වර්ගයට පමුණුවන සැපවිපාක ඇති සම්පත්ති ධර්මයන් උපදවන දානය මහණ බමුණන් කෙරෙහි පිහිටුවත්. ඒ මන්ද?

"ස්වාමීනි, මා මෙසේ කී කල සඤ්ජය නම් බෙලට්ඨපුත්‍ර මෙසේ කීය: 'පරලොවක් ඇත්තේදැයි මා විචාරන්නෙහි නම් පරලොවක් ඇතැයි මෙසේ මට අදහස්වී නම්, පරලොවක් ඇතැයි මෙසේ එය ඔබට ප්‍රකාශ කරන්නෙමි. මට එසේත් අදහස් නොවෙයි, මට එපරිද්දෙනුත් නොවෙයි. මට අන් පරද්දෙකිනුත්

නොවෙයි. මට එසේ නැත්තේයයිද නොවෙයි, මට නැත්තේ නොවන්නේත් නොවෙයි, පරලොවක් නැතැයි කියාද, එසේද මාගේ ගැන්මක් නැත, එසේයයිද මාගේ ගැන්මක් නැත. මේ වෙන ආකාරයයිද මාගේ ගැන්මක් නැත. එසේ නොවේයයිද මාගේ ගැන්මක් නැත. එසේ ගැන්මක් නැත්තේත් නැත.

'පරලොව ඇත්තේත් වේ නැත්තේත් වේයයි කියාද, පරලොව නැතැයි කියාද නැත්තේත් නොවෙයි කියාද, එසේද මාගේ ගැන්මක් නැත. එසේයයිද මාගේ ගැන්මක් නැත. මේ වෙන ආකාරයයිද මාගේ ගැන්මක් නැත. එසේ නොවේයයිද මාගේ ගැන්මක් නැත. එසේ ගැන්මක් නැත්තේත් නැත.

'මැරී උපදින සත්වයෝ ඇතැයි කියාද, මැරී උපදින සත්වයෝ නැතැයි කියාද, මැරී උපදින සත්වයෝ නැතැයි කියාද, මැරී උපදින සත්වයෝ ඇත්තේත් නොවෙයි. නැත්තේත් නොවෙයි කියාද, එසේද මාගේ ගැන්මක් නැත. එසේයයිද මාගේ ගැන්මක් නැත. මේ වෙන ආකාරයයිද මාගේ ගැන්මක් නැත. එසේ නොවේයයිද මාගේ ගැන්මක් නැත. එසේ ගැන්මක් නැත්තේත් නැත.

කුශලාකුශල කර්මයන්ගේ ඵල හා විපාක ඇතැයි කියාද, කුශලාකුශල කර්මයන්ගේ ඵල හා විපාක නැතැයි කියාද, කුශලාකුශල කර්මයන්ගේ ඵල හා විපාක ඇත්තේත් වෙයි නැත්තේත් වෙයි කියාද, කුශලාකුශල කර්මයන්ගේ ඵලය හා විපාක ඇත්තේත් නොවෙයි නැත්තේත් නොවෙයි කියාද, එසේද මාගේ ගැන්මක් නැත. එසේයයිද මාගේ ගැන්මක් නැත. මේ වෙන ආකාරයයිද මාගේ ගැන්මක් නැත, එසේ නොවෙයයිද මාගේ ගැන්මක් නැත. එසේ ගැන්මක් නැත්තේත් නැත.

'සත්වතෙම මරණින් මතු වන්නේයයි කියාද සත්ව තෙමේ මරණින් මතු නොවන්නේයයි කියාද, සත්වයා මරණින් මතු වන්නේත් වෙයි නොවන්නේත් වෙයි. සත්ව තෙම මරණින් මතු වන්නේත් නොවෙයි නොවන්නේත් නොවෙයි කියාද, එසේද මාගේ ගැන්මක් නැත. එසේයයිද මාගේ ගැන්මක් නැත. මේ

වෙන ආකාරයයිද මාගේ ගැන්මක් නැත. එසේ නොවේයයිද මාගේ ගැන්මක් නැත. එසේ ගැන්මක් නැත්තේත් නැත.

'ඉදින් සත්වතෙම මරණින් මතු නොවන්නේ වේද නොවන්නේ නොවේද කියා මා විචාරන්නෙහි නම් සත්ත්වතෙම මරණින් මතු නොවන්නේද වෙයි. නොවන්නේද නොවෙයි. යන මේ අදහස ඉදින් මට වන්නේ නම් සත්ත්වතෙම මරණින් මතු නොවන්නේත්වෙයි. නොවන්නේත් නොවෙයි. කියා මෙසේ එය ඔබට කියන්නෙමි. එහෙත් මට එසේත් (අදහස්) නොවෙයි, මට එපරිද්දෙනුත් නොවෙයි. මට අන් පරිද්දෙකිනුත් නොවෙයි, මට එබන්දක් නැත්තේයයිද නොවෙයි, මට නැත්තේ නොවන්නේත් නොවෙයි, (කියා උත්තර දුන්නේය.)

"ස්වාමීන් වහන්ස, මෙසේ මා විසින් මේ ආත්ම භාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ග ඵලය ඇසූ කල බෙලට්ඨපුත්ත සඤ්ජය ප්‍රශ්නය ඉවතලෑම ඉදිරිපත් කළේය. ස්වාමීන් වහන්ස, යම්සේ අඹරුක කෙසේදැයි ඇසූ කල දෙල්ගස මෙසේයයි කියාද, දෙල්ගස කෙසේදැයි ඇසූකල අඹගස මෙසේයයි කියාද, ස්වාමීනි, එමෙන් මා විසින් මේ ආත්මභාවයෙහි දැක්ක යුතු විපාක ඇති මාර්ගඵලය ඇසූ කල බෙලට්ඨපුත්‍ර සඤ්ජය තෙමේ ප්‍රශ්නය ඉවතලෑම කෙළේය. ස්වාමීන් වහන්ස, එවිට මට මේ අදහස විය. මේ සඤ්ජය තෙමේ අන් ශ්‍රමණ බ්‍රාහ්මණ සියල්ලන්ටම වඩා අනුවණය, මෝඩය කෙසේ නම් මේ ආත්මභාවයෙහි දැක්කයුතු විපාක ඇති මාර්ග ඵලය ඇසූ කල ප්‍රශ්නය ඉවතලෑම කරන්නේදැයි' කියායි.

"ස්වාමීනි, මට මෙබඳු අදහසක් විය. එනම්: 'මා වැනි රජෙක් සිය අණ පවත්නා රටෙහි වසන මහණකු, හෝ බමුණකු කෙසේ නම් වෙහෙසිය යුත්තකු, නෙරපිය යුත්තකු, කොට සලකන්නේද? 'ස්වාමීනි, එබැවින් මම බෙලට්ඨපුත්තවූ සඤ්ජයගේ වචනයට සතුටු නොවීමි, නින්දාද නොකෙළෙමි. ප්‍රශංසාද නොකොට, අස්කිරීමද නොකොට, නොසතුටු සිත් ඇතත්, නොසතුටු වචන නොකියා, ඒ නොගන්නේ, ඒ සිතෙහි නොපිහිටුවන්නේ උන් ආසනයෙන් නැගිට ගියෙමි.

**24.** "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේද විචාරමි. ස්වාමීනි, යම්සේ ඇතුන් හික්මවන්නාදීහු ඒ ඒ ශිල්පයන් නිසා ජීවත්වෙත්ද ඔව්හු ඉන් තම ජීවිතය සුවපත් කෙරෙත්, ශක්තිමත් කෙරෙත්, මවුපියන් සුවපත් කෙරෙත්, දරුවන් සහ භාර්යාව සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්, මිත්‍රයින් සුවපත් කෙරෙත්, පිනවීම කෙරෙත්, මත්තෙහි ඵල දෙන ස්වර්ගයට පමුණුවන සැප විපාක ඇති සම්පත්ති ධර්මයන් උපදවන දානය මහණ බමුණන් කෙරෙහි පිහිටුවත්. ඒ මන්ද? ස්වාමීනි, එපරිද්දෙන්ම මේ ආත්ම භාවයෙහි දැක්කයුතු විපාක ඇති මාර්ග ඵලයක් දක්වන්නට හැක්කේද?"

"එසේ හැක්කේය, මහරජ, එසේ නම් මහ රජ මේ කරුණෙහිලා ඔබගෙන්ම අසන්නෙමි. යම් ලෙසකින් ඔබට රුචිවන්නේද එසේ ප්‍රකාශ කරව.

**25.** "මහරජ, මෙකරුණෙහි ඔබට කුමක් හැගෙන්නේද? එනම්ඃ ඔබට මෙහි අලස නොව කටයුතු කරණ, හැමට පළමු නින්දෙන් නැගිටින්නාවූ හැමට පසුව නිදන්නාවූ, කටයුතු සොයා කරණ ස්වාමියාට මනාප දෙයක්ම කරණ ප්‍රිය කථා ඇත්තාවූ, සතුටින් හිමියාගේ මුහුණ බලමින් හැසිරෙන්නාවූ වැඩකරු පුරුෂයෙක් වන්නේය. ඔහුට මෙවැනි අදහසක් ඇතිවන්නේය. 'පින්වත්නි, කුසලයන්ගේ ස්වභාවය, කුසලයන්ගේ විපාකය ඒකාන්තයෙන් පුදුමයි, පින්වත්නි, ඒකාන්තයෙන් බොහෝ පුදුමයි. මගධරට රජවූ වෛදෙහිපුත්‍රවූ මේ අජාසත් රජද මනුෂ්‍යයෙකි, මමද මිනිසෙක්මි. මගධරට රජුවූ වෙදෙහි පුත්‍රවූ මේ අජාසත් රජ පස්කම් ගුණයෙන් පිණාගියේ ඉන් යුක්ත වූයේ දෙවියෙකු මෙන් ඉඳුරන් පිනවයි. හෙතෙම දෙවියකු මෙනි. මම වනාහි නොමැලිව කටයුතු කරණ, හැමට පළමුව නින්දෙන් නැගී සිටින, පසුව නිදාගන්න, කටයුතු ඇත්දැයි සොයා බලා කරණ, ස්වාමියාගේ අදහස් ලෙස ක්‍රියා කරණ, ප්‍රිය කථා ඇති, සතුටු මුහුණින් හිමියාගේ මුහුණ බලමින් හැසිරෙණ ඔහුගේම වැඩකරුවෙක් වෙමි, එසේ වූ මම ද ඉදින් පින් කරන්නෙම් නම් ඒකාන්තයෙන් එවැනි කෙනෙක් වන්නෙමි. ඒකාන්තයෙන්

මම කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතියි' කියායි.

"ඔහු කලෙක කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නේය. ඔහු මෙසේ මහණ වූයේම, අකුසල් ඇතිවන ශරීරය නමැති දොරටුව වසා (කාය සංවරයෙන් යුක්තව) වසන්නේය. වචනයෙන් සංවරව වසන්නේය, සිතින් සංවරව වසන්නේය. යන්තමින් ලැබෙන ආහාරයෙන් හා සිවුරින් සතුටුවූයේ මහත්වූ විවේකයෙහි ඇලී වාසය කරන්නේය. එවිට ඔබගේ (රාජ) පුරුෂයෝ ඒ බව ඔබට මෙසේ දන්වන්නාහුය. 'අසනුමැන දෙවයන් වහන්ස, මෙය දන්නා සේක්වා. ඔබවහන්සේට අලස නොව කටයුතු කළ, පළමුව නින්දෙන් නැගී සිටි, පසුව නිදාගැනීම කළ, ඔබ අදහස් ලෙස ක්‍රියා කළ ප්‍රිය කථා ඇති සතුටු මුහුණින් යුක්තව වැඩෙහි යෙදුනු යම් ඒ වැඩකරු පුරුෂයෙක් වීද, දෙවයෙනි, හෙතෙම කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වූයේය. හෙතෙම මෙසේ මහණ වූයේම කයින් සංවරව වෙසෙයි, වචනයෙන් සංවරව වෙසෙයි, සිතින් සංවරව වෙසෙයි. යන්තමින් වූ ආහාර හා සිවුරු දැරීමෙන් සතුටු වූයේ මහත්වූ විවේකයෙහි ඇලී වෙසෙයි' කියායි.

"කිම, මහරජ? ඒ මාගේ වැඩකරුවා නැවතත් මාවෙත පැමිණේවා, ඔහු නැවතද අලසනොව කටයුතු කරණ, හැමට පළමුව නින්දෙන්නැගී සිටින පසුව නිදාගැනීම කරණ කටයුතු සොයා කරණ මාගේ සිත් පරිදි හැසිරෙන්නාවූ ප්‍රිය කථා ඇති, සතුටුව මුහුණ බලමින් හැසිරෙන්නාවූ වැඩකරුවෙක් වේවා'යි ඔබ මෙසේ කියන්නෙහිද?"

"නැත, ස්වාමීනි, එබන්දක් නොවේ. එසේ ඇති කල්හි ඔහුට අපිම වැඳීමද කරන්නෙමු. ඔහු දැක (අපිම) හුනස්නෙන්ද නැගිටින්නෙමු, ආසනයෙන්ද පවරන්නෙමු. සිවුරු පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පස, බෙහෙත් පිරිකර යන මෙයින් යමක් අවශ්‍යවූ විට ඒ බව අපට කිව මැනවැයි ද විශෙෂයෙන් පවරන්නෙමු. ධාර්මිකවූ ආරක්ෂාවෙන් රැකීම ද සලසන්නෙමු"

"කිම මහරජ? ඉදින් එසේ ඇති කල්හි මේ ආත්ම භාවයෙන් දැක්ක යුතු විපාක ඇති ඵලයක් වේද? නොවේද? ඒ ගැන ඔබ කුමක් සිතන්නෙහිද?"

"ස්වාමීන් වහන්ස, මෙසේ ඇති කල ඒකාන්තයෙන්ම මේ ආත්ම භාවයෙහි දැක්කයුතු විපාක ඵලය වේමය."

"මහරජ, මේ වනාහි මා විසින් ඔබට දක්වන ලද මේ ආත්මයෙහි ලැබෙන පළමු වැනිවූ මේ ආත්ම භාවයෙහි දැක්ක යුතු විපාක ඵලයයි."

**26.** "ස්වාමීනි, එපරිද්දෙන්ම මේ ආත්ම භාවයෙහි ලැබෙන අන්‍යවූද මේ ආත්ම භාවයෙහි දැක්කයුතු විපාක ඵලයක් ප්‍රකාශ කළ හැක්කේද?"

"හැක්කේය, මහරජ, එසේ නම් මහරජ මෙකරුණෙහිලා ඔබගෙන්ම අසන්නෙමි, යම් ලෙසකින් ඔබට රුච්වන්නේද එසේම ප්‍රකාශ කරමි. මහරජ, මතු දක්වන කරුණෙහිලා ඔබ කුමක් සිතන්නෙහිද? ඔබට සී සාන්නාවූ, ගෘහපතියෙක්ව සිටිමින් අයබදු ගෙවන්නාවූ, ධනධාන්‍ය සපයා දෙන්නා වූ පුරුෂයෙක් වන්නේය. ඔහුට මෙබඳු අදහසක් පහළ වෙයි. 'කුසලයන්ගේ ස්වභාවය, කුසලයන්ගේ විපාකය බලව ඒ ඒකාන්තයෙන් පුදුමයි, පින්වත, ඒකාන්තයෙන් ඉතා පුදුමයි මගධදේස රජවූ වෙදෙහපුත්වූ මේ අජාසත් රජ වනාහි මනුෂ්‍යයෙකි. මමද මිනිසෙක්මි. මගධදේස රජවූ වෙදෙහි පුත්වූ මේ අජාසත් රජ වූකලී පස්කම් ගුණයෙන් පිනාගියේ ඉන් යුක්තවූයේ දෙවියෙකු මෙන් ඉඳුරන් පිනවයි. හෙතෙම දෙවියෙකු මෙනි. මම වනාහි සී සාන්නාවූ ගෘහපතිවූ, අයබදු ගෙවන්නාවූ, ධන ධාන්‍ය රැස්කරන්නාවූ කෙනෙක් වූයේ ඔහුගේ වැඩකරුව වෙසෙමි. එසේවූ මමද පින්කරන්නෙම් නම් ඒකාන්තයෙන් ඔහු ආකාරකෙනෙක් වන්නෙමි. එබැවින් ඒකාන්තයෙන් මමද කෙස් දැලිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණවන්නෙම් නම් ඉතා යහපති, කියායි.

"හෙතෙම ඉන් මෑත කාලයෙක ස්වල්පවූ හෝ භොග රාශිය හැර, මහත්වූ හෝ භෝග රාශිය හැර, ස්වල්පවූ හෝ නෑ පිරිස්

හැර, බොහෝවූ හෝ නෑ පිරිස් හැර, කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නේය. හෙතෙම මෙසේ මහණ වූයේම කයින් සංවරව වසන්නේය, වචනයෙන් සංවරව වසන්නේය, සිතින් සංවරව වසන්නේය කෑම ඇඳීම ඕනෑ බැවින් යන්තමින් ලත් ආහාරයෙන් හා සිවුරින් සතුටුව විවේකයෙහි ඇලී වාසය කෙරෙයි. ඔබගේ (රාජ) පුරුෂ කෙනෙක් ඒ බව ඔබට මෙසේ දන්වයි. 'පින්වත්වූ දෙවයන් වහන්ස, අසන සේක්වා! ඔබවහන්සේගේ සී සාමින් සිටි ගෘහපතිවූ, අයබදුගෙවා ධනධාන්‍ය රැස්කළ යම් ඒ පුරුෂයෙක් වීද, දේවයනි, ඔහු කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වූයේය. හෙතෙම මෙසේ මහණ වූයේම කායසංවරයෙන් ජීවත්වේ. වචන සංවරයෙන් ජීවත්වේ. හිත පිළිබඳ සංවරයෙන් ජීවත්වේ. යම්තමින් ආහාර හා සිවුරු දැරීමෙන් සතුටු වූයේ, කායාදී (තෙවැදෑරුම්) විවේකයෙහි ඇලී වාසය කෙරෙයි කියායි.' කිම, මහරජ? ඒ මාගේ පුරුෂතෙමේ නැවතත් මවෙත පැමිණේවා හෙතෙම සී සාන්නාවූ ගෘහපතිවූ, අයබදු ගෙවන්නාවූ, ධනධාන්‍ය රැස්කරන්නාවූ, තැනැත්තෙක් වේවා'යි ඔබ මෙසේ කියන්නෙහිද?"

"නැත ස්වාමීනි, එසේ නොකියන්නෙමි. එසේ ඇති කල්හි අපිම ඔහුට නමස්කාර කරන්නෙමු. ඔහු දැක හුනස්නෙන්ද නැගිටින්නෙමු, ආසනයෙන්ද පවරන්නෙමු, සිවුරු ආහාර ඇඳන් බෙහෙත් පිරිකර යන මෙයින් යමක් අවශ්‍යවූ කල එය අපට කිව මැනවැයිද විශෙෂයෙන් ප්‍රකාශ කරන්නෙමු. ධාර්මික ආරක්ෂා ආවරණයෙන් රැකීමද සලස්වන්නෙමු."

"කිම, මහරජ? ඉදින් එසේ ඇති කල්හි මේ ආත්මභාවයෙහි දැක්කයුතු විපාක ඵලයක් වේද? නොවේද? මේ ගැණ ඔබ කුමක් කියන්නෙහිද?"

"ස්වාමීනි, මෙසේවූ කල ඒකාන්තයෙන්ම මේ ආත්මභාවයේ දැක්ක යුතු විපාක ඵලයක් වේමය."

"මහරජ, මේ වනාහි මා විසින් ඔබට දක්වන ලද මේ ආත්මයෙහි ලැබෙන දෙවැනිවූ මේ ආත්මභාවයේ දැක්ක යුතු විපාක ඵලය වේ."

**27.** ස්වාමීන් වහන්ස, මේ ආත්ම භාවයේ දැක්කයුතු විපාක ඵලයන්ට වඩා අතිශයින් හිත් පිනවන අතිශයින් උතුම්වූ මේ ආත්ම භාවයෙහි ලැබිය හැකි අන්‍යවූද විපාක ඵලයක් දක්වන්නට හැක්කේද?"

"හැක්කේය මහරජ, එසේ නම් අසව මහරජ, මනාකොට මෙනෙහි කරව, කියන්නෙමි."

"එසේය ස්වාමීන් වහන්සැයි මගධරට රජවූ වෙදෙහි පුත්‍රවූ අජාසත් රජ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය.

**28.** භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. "මහරජ අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනා ඥානය ආදී විද්‍යා අට සීල සංවරය ආදී හසුරුවන ධර්ම පහළොව යන අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙව් මිනිසුන්ට ගුරුවරයෙක්වූ, (චතුරාර්ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්ම සතර අවබෝධ කළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් සහ මිනිසුන් සහිතවූ, සත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැක පැහැදිලි කොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, අර්ථසහිතවූ, දස ආකාරයෙන් නියම විදියට වචන ශබ්ද කරන්නාවූ ව්‍යඤ්ජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ පිරිසිදුවූ, සියලු සාසනමාර්ග බ්‍රහ්මචර්යාව ගෙන හැර දක්වති.

**29.** "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන්කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය. 'ගෘහවාසය පීඩාසහිතයි. රාගාදී කෙලෙස් සහිත මාර්ගයෙකි. මහණකම වනාහී කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහි ගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ,

සියලු ආකාරයෙන් පිරිසිදුවූ ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැලිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි' කියායි.

ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාශිය හැර, ස්වල්පවූ හෝ බෙහෝවූ නෑපිරිස් හැර කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වේ. මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවරසීලයෙන් යුක්ත වූයේ, යහපත් හැසිරීමෙන් හා වරදනැති පැවැත්මෙන් යුක්ත වූයේ, ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භය දක්නා ගති ඇත්තෙක් වූයේ, යහපත්වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්තවූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ ජීවිත පැවතුම් ඇත්තේ වෙයි ශීලයෙන් යුක්ත වූයේ වෙයි. ඉන්ද්‍රිය විෂයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි. ආහාරයෙහි පමණ දන්නේ වෙයි. මනා සිහියෙන් හා හරි ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි. සන්තෝෂයෙන් යුක්තවෙයි.

**30.** "මහරජ, භික්ෂුනමක් කෙසේ නම් සීලසම්පන්න වේද? මහරජ, මේ සස්නෙහිවූ භික්ෂුනමක් ප්‍රාණවධය හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහාතබන ලද ආයුද ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ කරුණාවන්තවූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතුව වාසය කෙරේ, මෙයද ඔහුගේ සීලයක්වේ. නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ. දුන්දෙයම ගන්නේ, දුන්දෙයම කැමතිවන්නේ, සොර නොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේ' මෙයද ඔහුගේ සීලයෙකි අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගයනම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන්වූයේ බ්‍රහ්මචාරීවේ. මෙයද ඔහුගේ සීලයකි. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, සැබෑතෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ ඇදහිය යුතු වචන ඇත්තේ ලොකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ මෙයද ඔහුගේ සීලයෙකි. පිසුණු බස් හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතැනින් අසා

මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද' මෙසේ හෙද වූවන් ගළපන්නේ සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මේද ඔහුගේ සීලයෙකි, ඵරුෂ වචනය හැර සම්පූර්ණයෙන් වැළැක්කේ, යම් වචනයක් නිදොස් වේද, කණට සැපද, ප්‍රෙමණියද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේ වේ. මෙයද ඔහුගේ එක් සීලයෙකි. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ. කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ. මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්මද දියුණුවට හේතුවන වචන කීමද, මෙයද ඔහුගේ සීලයෙකි.

"තණ, ගස්, වැල්, සිඳීම් බිඳීම්, ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන කෑම ඇත්තේ, රාත්‍රි කෑමෙන් හා අවේලෙහි කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම්, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යනමෙයින් සම්පූර්ණයෙන්, වැළැක්කේය. උස්අසුන් මහඅසුන් යන මෙයින් වැළැක්කේය රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. අමුවූ ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේ. අමුමස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනු ළමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද වේ වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද,

සම්පූර්ණයෙන් තොරවූයේය. ගිහීන්ගේ දූත මෙහෙවරය. ගෙන්ගෙට යන පහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. ගනුදෙනු කිරීමය, තරාදි ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මිශ්‍ර වඤ්චා කිරීමය, වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය, යන මෙයින්ද සම්පූර්ණයෙන් වැළැක්කේය, මෙයද ඔහුගේ සීලය වේ.

## සුලු සීලය නිමියේය.

31. "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කාමූලබීජය, ඛන්ධබීජය, ඵළුබීජය, දලුබීජය, පස්වැනිවූ බීජබීජය යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්. මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, නොඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛ්‍යාත වහන්, දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත් කොට තබා ප්‍රයෝජන ගැන්මයයි කියනලද පසුවට තබා ප්‍රයෝජන ගැන්මෙහි යෙදී වාසය කරත්. මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේ නම් මෙයද ඔහුගේ සීලයෙක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟ මඩුලු සැරසීමය, වැඩක් නැති කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනි නැංවීමය, සතරැස් හෝ

කළ බෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණ්ඩොවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මීවුන් හා පොරය, ගවයින් හා පොරය, එළුපොරය මෙණ්ඩක එළුපොරය, කුකුළුපොරය, වටුපොරය, දඬු (පොලු) පොරය, තොරතුරු ඇනීමය, මල්ලව යුද්ධය, යුද්ධය, ඇත් අස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත්. මෙසේ මෙබඳු විසුලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකේ නම් මෙයද ඔහුගේ සීලයෙක් වේ,

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා (දූ පෝරු ආදියෙහි කෙළිම්වූ) ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටමිටි ගසා ඇත් අස් ආදී රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, නලා පිඹීමය, ක්‍රීඩා නඟුල් ගෙන සෙල්ලම් සීසෑම්ය. කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන්ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැණ කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය ඒ ඒ දෝෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ කෙළියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**32.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දික්හඟලා පුටුය, පලස්ය, සතරගුලෙන් දිග ලොම් ඇතිරිය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළු ලොම් සුදු ඇතිරිය, එළු ලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදී රූපයෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති ඇතිරිය. දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය. රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එක්විට නැට්ටුක්කාරියන් දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට

අතුරන ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබනලද රතුපාට කොට්ට ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කෙරෙත්. මෙසේ මෙබඳුවූ උස් අසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි,

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, මූනබලන කන්නාඩි, අඳුන් තෙල් පාවිච්චිය හා සුවඳ, මූණේ ගානා සුවඳ කුඩු, මූණේ ගානා සුවඳ ද්‍රව්‍ය, අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය, විසිතුරු දඬුගෙන හැසිරීමය, බෙහෙත් නල එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙනයෑම, විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය. නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය, දික්වූ දහවලු ඇති සුදුරෙදි ඇඳීමයයි මෙසේවූ සැරසීම් හා අඩුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

33. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය මහ ඇමතියන් පිළිබඳ කථාය, සෙනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය, මාලා පිළිබඳ කථාය, ගන්ධ ද්‍රව්‍යයන් පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි දරුවන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ තේරුම් නැති කථාය, ලොකය පිළිබඳ

කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

34. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි' 'ඔබ මේ ධර්ම විනය කුමකැයි දන්නෙහිද? ඔබ වරදවා පිළිපදින්නෙහිය, මම මනාකොට පිළිපදින්නේ වෙමි'. 'මාගේ වචන යහපත්ය, හෝ අර්ථ සහිතය, ඔබගේ වචන අර්ථ රහිතය' පළමු කිය යුත්ත පසුව කීයෙහිය. පසුව කිය යුත්ත පළමුව කීයෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණලද නම් ඒ සියල්ල නිෂ්ඵල විය. ඔබට වාදාරෝපනය කරණ ලදී. නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව' යන ආදී දෝෂාරෝපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු දෝෂාරෝපණ කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

35. "එසේ සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියන්ගේ, බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යව අසවල් තැනින් මෙහිඑව, මෙය ගෙණයව, එතැනින් අසවල් දෙය ගෙණෙවයි දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහියෙදී වෙසෙත්. මෙබඳු දූත භාවය, හසුන් ගෙණ යෑම යන මෙයින් වැළැක්කේ නම් මෙයද ඒ ඔහුගේ එක් සීලයෙකි.

36. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා කුහකයෝද, සිවුපසය උදෙසා කථා කරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන් කරන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද ලාභයකින් ලාභයක් සොයන්නෝද වෙත්. මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග ආදියෙන් වැළැක්මක් වේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි."

**මැදුම් සිල් නිමියේය.**

37. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, හෙන ගැසීම ආදී මහ නිමිති බලා කියනශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, මීයන් කැපූ වස්ත්‍රාදිය, බලාකියන ශාස්ත්‍රය, ගිනිදෙවියා පිදීමය, දබ්බිහොමය, ථුස හොය, තණ්ඩුල හොමය, කණ හොමය, සප්පි හොමය තෙල හොමය, මුඛ හොමය, ලේ හොමය, ශරීර විද්‍යා, වාස්තු විද්‍යා නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යා, භූත විද්‍යා, නාග විද්‍යා. විෂ විද්‍යා ගෝනුසු විද්‍යා, මූෂික විද්‍යා, කුරුලු විද්‍යා, කපුටු විද්‍යා, ජීවිත කාලය කීම, ආයුධ වැළැක්ම, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා හේතුකොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු පහත් විද්‍යා හේතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි.

38. "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මිණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය ස්ත්‍රීලක්ෂණය, පුරිස ලක්ෂණය, පිරිමිදරු ලක්ෂණය, ගෑණුදරු ලක්ෂණය, දාස ලක්ෂණය, දාසිලක්ෂණය, ඇත් ලක්ෂණය. අශ්ව ලක්ෂණය, කැස්බෑ ලක්ෂණය, එළු ලක්ෂණය, මීහරක් ලක්ෂණය ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය, කුකුළු ලක්ෂණය, වටු ලක්ෂණය, තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය මුව ලක්ෂණයයි, මෙබඳු පහත් විද්‍යාවන් කරණ කොට ගෙන වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයෙකි.

39. "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැර යෑම වන්නේය. අසවල් දින ඇතුළු නුවරට එන්නේය. අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය.

ඇතුළු නුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හේතුකොට ලාමක ජීවිකා කෙරෙත්. මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයක් වේ.

**40.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා චන්ද්‍රග්‍රහණය වන්නේය. සූර්ග්‍රහණය වන්නේය, තාරකා සමාගමය වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමග යෑම වන්නේය, තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය, තාරකාවන්ගේ නොමග යෑම් වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළොව කම්පාව වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ, හිරු තාරකාවන්ගේ නැගීම හා බැහීමද කෙළෙසීමද පිරිසිදු වීමද වන්නේය, චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය චන්ද්‍ර සූර්යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇති වන්නේය, ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය, දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම මෙබඳු විපාක ඇති වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටුවීම හා පිරිසිදු වීම මෙබඳු විපාක ඇතිවන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හේතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යා හේතු කොට ගෙණ කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

41. "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය, යහපත් ආහාරපාන ඇතිවන්නේය, ආහාර පාන නැති වන්නේය, නිර්භය ඇතිවන්නේය, භය ඇතිවන්නේය, රොග ඇතිවන්නේය, නිරෝගි බව ඇතිවන්නේයයි කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන්කිරීමය, කොටස්කර ගණන්කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණකොට වැරදි ජීවිකා කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යා හෙතුවෙන් වන වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

42. "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථාකිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇති කිරීමය, දුර්ගර්භ කරණය, ගර්භවිරොධි කරණය, දිව් තද කිරීමය, නූල් බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්න ඇසීමය, ගෑනුදරුවන්ගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණය කොට ප්‍රශ්න ඇසීමය, හිරු වැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම් කිරීමය, කටින් ගිනිදැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරෙත්. මෙබඳුවූ පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

43. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීම, කාර්යය සමෘද්ධි කටයුතු කර්මය, මන්ත්‍ර කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මූන සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩු කය විරේකය, යටිකය විරේකය, හිස විරේකය, කන්තෙලය,

ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍යකිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකමය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකම්ය, මූලික බෙහෙත් දීමය, සැරබෙහෙත් දී පසුව එහි බල හැරීමය කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට වැරදි ජීවත්වීමෙන් ජීවිකා කෙරෙත්. මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේනම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

**44.** "මහරජ, මෙසේ ශීල සම්පන්නවූ භික්ෂුහට භය කාරණයන් අතුරෙන් එක් පමණකුදු ඔහුගේ ශීලසංවරය හෙතු කොට ගෙණ කිසිතැනකදී නොඋපදන්නේ. කුමක් මෙන්ද යත්:- මහරජ, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම, මහරජ, ශීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ශීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය. ආර්යවූ (උතුම්වූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂු තෙම, තමන් තුළ පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. මහරජ, මෙසේ දැක්වූ ශීලයෙන් යුක්තවූ භික්ෂුව ශීලසම්පන්න නම් වේ.

**මහ සිල් නිමියේය.**

**45.** "මහරජ, භික්ෂුව කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේද? මහරජ, මේ සස්නෙහි භික්ෂු තෙමේ, ඇසින් රූපයක් දැක එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ඇස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ ඇස් ඉන්ද්‍රියය රකී, ඇස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය කන් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ කන් ඉන්ද්‍රියය රකී. කන් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. නාසයට ගඳ සුවඳ දැනී එහි නොඇලේ.

එහි නොපෙළඹෙන්නේය. නාස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ නාස් ඉන්ද්‍රියය රකී. නාස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. දිව් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ දිව් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ ස්පර්ශ ඉන්ද්‍රියය රකී. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. සිතින් (ධර්මයක්) අරමුණක් දැන එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. සිත් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් නිසා දැඩි ආසාව හා කලකිරීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. හෙතෙම සිත් ඉන්ද්‍රිය රකී. සිත් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ භික්ෂුව උතුම්වූ ශීල රාශියෙන් යුක්තවූයේ අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ අධිචිත්ත සැපය විඳියි. මහරජ, මෙසේවූ භික්ෂු තෙමේ ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තේ වේ.

**46.** "මහරජ, භික්ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද?

"මහරජ, මේ සස්නෙහි භික්ෂුතෙම ඉදිරියට යෑමෙහිද, ආපසු යාමෙහිද, නුවණින් දැන කරන්නේය. ඉදිරි බැලීමෙහිද, වටපිට බැලීමෙහිද නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහිද, දිගු කිරීමෙහිද, මනා නුවණින් දැන එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය, සිවුරැය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන එසේ කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, වැළඳීමය, රස විඳීමය යන මෙහිද මනා නුවණින් යෙදී එසේ

කරන්නේය. මළ මුත්‍ර පහකිරීමද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්දව සිටීම යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. මහරජ, මෙසේ කරන්නාවූ භික්ෂු තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි.

47. "මහරජ, භික්ෂු තෙමේ කෙසේ සතුටු වූයේ වේද?

"මහරජ, භික්ෂු තෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, ආරක්ෂාව ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු සිත් ඇත්තේවේ. ඔහු යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳවූ දේ) පමණක් ගෙන යයි. මහරජ, යම් සේ පක්ෂියෙක් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, මහරජ, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය ආරක්ෂාවට ප්‍රමාණවූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු වන්නේ වේ. ඔහු යම් තැනක යා නම් අටපිරිකර පමණක් රැගෙණ බැහැර යයි. මහරජ, මෙසේවූ භික්ෂු තෙමේ සන්තෝෂයෙන් යුක්ත වේ.

48. "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, මේ උතුම්වූ සන්තෝෂයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, කඳු පලාත්ද, කඳුරැලි ගල්ගුහාවන් හෝ මහා මගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ ඉඩකඩ ඇති තැන් සහ තණ ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළැක්කේ. පර්යංකය බැඳ කකුල් අකුලුවා හිඳ ශරීරයේ උඩු කොටස කෙලින් තබා නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවාගෙණ හිඳී.

49. "ඔහු ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභ සිත වෙන් කොට පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව පණඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව

වාසයකරයි. ක්‍රොධ දොෂයෙන් වෙන්ව සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේ. අලස බව දුරුකොට සිත පිරිසිදු කෙරේ. උඩඟු බව හා කුකුස දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, සිත උඩඟු බව හා කුකුසෙන් පිරිසිදු කෙරේ. විචිකිච්ඡාව සැකය දුරුකොට පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේ; විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

**50.** "මහරජ, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්තයන්හි යොදන්නේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණුවන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් ආරක්ෂා කරණ පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඕහට මෙබඳු අදහසක් ඇතිවේ. 'මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පොෂ්‍ය කිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය, කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

**51.** "මහරජ, යම්සේ රෝගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේද, ඕහට ආහාර රුචි නොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීර බලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳුද යත්: 'මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන් බව ඇති කෙනෙක් වීමි. මට බත් රුචියද නොවීය, ශරීර බලයද නැතිවිය, ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය. කාය බලයද තිබේය' කියායි. ඔහු ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසටද පැමිණෙන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

52. "මහරජ, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසු කලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්ඃ මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය. සතුටට පැමිණෙන්නේය.

53. "මහරජ, යම් සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි අනුන්ට යටත්වූ තමා කැමති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි, වැඩකරුවෙක් වන්නේද, ඔහු පසු කලක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්ඃ මම පෙර සිය කැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් මා අදහස් පරිදි කිසි තැනෙක යානොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපති කොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත්නූන කෙනෙක් වීමි. අනුන්ට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමති තැනෙක යා හැක්කේද වෙමි'යි කියායි. ඔහු ඒ දාසභාවයෙන් මිදීම හේතුකොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

54. "මහරජ, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේද, ඔහු මද කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොරසතුරන්ගෙන් පීඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්ඃ මම පෙර ධනවත් වූයෙමි. භොග සම්පත් සහිත වූයෙමි. දුර්ලභ භික්ෂා ඇති භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණියෙක් වූයෙමි. එසේවූ මම දැන් එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂයා

ඒ කාන්තාර මාර්ගය එතර කිරීම නිමිති, කොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සතුටටද පැමිණෙන්නේය.

**55.** "මහරජ ණය යම්සේද, රෝගය යම්සේද, හිරගේ යම්සේද, දාසභාවය යම්සේද, දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂු තෙමේ පහනොකළ (පඤ්චනීවරණ) කුසල් වලක්වන කරුණු පහ තමා කෙරෙහි ලා නුවණින් දකී. මහරජ, ණය නැති බව යම්සේද, නිරෝගී බව යම්සේද, සිරගෙන් මිදීම යම්සේද, අනුන්ට යටහත් නැති බව යම්සේද, භය නැති භූමිය යම්සේද, එපරිද්දෙන්ම මහරජ, භික්ෂු තෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ ලා දක්නේය.

**56.** "පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ භික්ෂුහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසහගත සිත් ඇත්තහුගේ නාම කය (වේදනාදී ස්කන්ධ හතර) සංසිඳෙයි සංසිඳිනු කය ඇති තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) පැමිණෙයි.

**57.** "ඒ භික්ෂු තෙමේ වස්තුකාම ක්ලෙශකාම යන්ගෙන් වෙන් වූයෙම්, අකුශල ධර්මයන් කෙරෙන්ද වෙන් වූයේම අරමුණෙහි සිත පැමිණෙවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම සහිතවූ, සිතෙහි විවේකයෙන් උපන් ප්‍රීතියම සැපකොට ඇති, පළමුවෙනි ධ්‍යාන කුසල චිත්තය තමා තුළ ඉපදීම් වසයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරේ. ඔහු විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ (සකල) ශරීරයම සැපවත් කෙරෙයි. සම්පූර්ණයෙන් පුරවයි. සැමතින්හි පතුරවයි. ඒ ඔහුගේ පළමුවෙනි විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන් සකල ශරීරයෙහිම පළමුවෙනි ධ්‍යානයෙන් යුත් සැපය පැතිරෙයි.

**58.** "මහරජ, යම්සේ දක්ෂවූ ස්නාන ද්‍රව්‍ය සපයන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ ස්නානයට ගන්නාවූ සුණු ලොහ තලියක බහා දිය ඉසිමින් අතින් අනමින් පිඩු කරන්නේද, එවිට ඒ මේ ස්නාන කුඩුගුලිය දියෙන් යුක්ත වේ, ජලය හාත්පසින් කාවැදුනේ වේ. එහි ඇතුළත හා පිටතද සියලු තන්හිම ජලයෙන්

පහස්නා ලද්දේ වේ. එහෙත් බින්දු වශයෙන් ජලය ඉන් නොවැගිරේද.

"මහරජ, එපරිද්දෙන් ඒ භික්ෂු තෙමේ, විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි, හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, සැමතන්හි පතුරුවයි. ඔහුගේ සියලු ශරීරයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් පැතිරෙයි. මහරජ, මෙයද මේ ආත්මයෙහි දැක්කයුතු විපාක ඇත ඵලයකි. මෙය ඉහතකී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා බොහෝ මනොඥය, බොහෝ ශ්‍රෙෂ්ඨද වෙයි.

**59.** "මහරජ, නැවතද භික්ෂු තෙමේ අරමුණෙහි සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම යන මොවුන්ගේ සන්සිඳීමෙන් අද්ධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති දෙවැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කරයි. ඒ මහණ තෙමේ මේ කය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි. හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශකරයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි දෙවැනි ධ්‍යානයෙන් සැප පැතිරේ.

**60.** "මහරජ, යම්සේ ඇතුළතම හටගත් ජලය ඇති දියවිලක් වේද ඒ විල පිළිබඳ පෙර දිගින්ද, අපර දිගින්ද, උතුරු දිගින්ද, දකුණු දිගින්ද, දිය එන මගක් නැත්තේ වේද වැස්සද කලින් කල මනාසේ වැසි වැසීම් නොකරන්නේද, එසේවූ ඒ විලෙන් සිහිල් දිය දහර පොළොව බිඳ නැඟී ඒ මුලු විලම සිහිල් දියෙන් පතුරුවයි, හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි. එහි හැම තැන දියෙන් ස්පර්ශ කෙරෙයි. ඒ සියලු විලෙහි සීත ජලය නොපැතිර පවත්නා තැනක් නම් නැත්තේය. මහරජ, එපරිද්දෙන් මේ භික්ෂු තෙමේ මේ මුලු ශරීරයම සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් සියලු තැන පතුරුවන ලද්දක් කෙරේ, ප්‍රීති සැපයෙන් හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, ඉන් සැමතැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි දෙවෙනි ධ්‍යාන සැපයෙන් පැතිරෙයි.

"මහරජ, මෙයද මේ ආත්මභාවයෙහි දැක්ක යුතු විපාක ඵලයෙකි, මෙය වනාහි ඉහතකී මේ ආත්මභාවයෙහි දැක්කයුතු විපාක ඵලයන්ට වඩා මනොඥය, බොහෝසේ ශ්‍රෙෂ්ඨය.

**61.** "නැවතද මහරජ, ඒ භික්ෂු තෙමේ ප්‍රීතියෙහි නො ඇල්මෙන් මැදහත් බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (උපේක්ෂා) සැප දුක් දෙකට මැදහත් විඳීම ඇත්තේ, සිහි ඇත්තේය. සැපයෙන් විසීම ඇත්තේයයි ආර්යයෝ කියත්ද ඒ තුන්වැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ භික්ෂු තෙමේ මේ සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේ. ඒ සැපතින් හාත්පසින් තෙමෙයි, සම්පූර්ණයෙන් පුරවයි, එයින් සැතැනම පැතිරෙයි. ඒ භික්ෂුහුගේ සියලු ශරීරයෙහි තුන්වැනි ධ්‍යාන සැපයෙන් පැතිරෙයි.

**62.** "මහරජ, යමසේ නිල්මානෙල් විලක හෝ සුදු නෙලුම් විලක හෝ රතු නෙලුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුනු දියෙන් උඩට නොනැගුනු, දියතුළම ගැලී වැඩෙන්නාවූ සමහර නිල් මානෙල් හෝ සමහර සුදු නෙලුම් හෝ සමහර රත් නෙලුම් හෝ වෙද්ද, ඒ නිල් මානෙල් ආදීහු අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, සම්පූර්ණයෙන් වැගුරුණාහු, හාත්පසින් ස්පර්ශ ලද්දාහු වෙත්ද, ඒ නිල්මානෙල් සුදු නෙලුම් රත් නෙලුම්, යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් නො පහස්නා ලද්දේ නොවේද මහරජ, එපරිද්දෙන් ඒ භික්ෂු තෙමේ මේ මුලු ශරීරයම දුරුකළ ප්‍රීතිය ඇති සැපයෙන් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරෙයි, ඉන් හාත්පසින් තෙමෙයි, සම්පූර්ණයෙන් පුරවයි. හාත්පසින් ස්පර්ශ කෙරෙයි. ඔහුගේ සම්පූර්ණ ශරීරයෙහි ප්‍රීතිනැති තුන්වැනි ධ්‍යානයෙන් පැතිරයයි.

'මහරජ, මේ ආත්මභාවයෙහි දැක්කයුතු මෙකී විපාක ඵලයද ඉහතකී මේ ආත්ම භාවයෙහි දැක්කයුතු විපාක ඵලයන්ට වඩා බොහෝසේ මනහර වෙයි, බොහෝසේ ශ්‍රෙෂ්ඨද වෙයි.

**63.** "නැවතද මහරජ, ඒ මහණ තෙමේ සැප දුරුකිරීමෙන්, දුක් දුරු කිරීමෙන්ද පළමුකොටම සැප දුක් වේදනා නැතිව යාමෙන් දුක්ද නොවූ, සැපද නොවූ, උපෙක්ඛා-සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, හතරවෙනි ධ්‍යාන (කුසල) චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම, පිරිසිදුවූ, අතිශයින් බබලන (ධ්‍යාන) සිතින් පතුරුවන්නේය. ඒ ධ්‍යානලාභී භික්ෂූහුගේ සම්පූර්ණ ශරීරයෙහි පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ හතරවැනි ධ්‍යාන සිතින් පැතිරයයි.

"මහරජ, යම්සේ කිසියම් පුරුෂයෙක් පිරිසිදුවූ සුදු ඇඳුමකින් හිස සිට පොරවා උන්නේ වේද, ඔහුගේ මුලු ශරීරයෙහි එකම තැනකුදු සුදුවතින් නොවසන ලද්දේ නොවේ. මහරජ, එපරිද්දෙන්ම ධ්‍යානලාභී භික්ෂු තෙමේ මේ සියලු ශරීරයම පිරිසිදුවූ, අතිශයින්ම බබලන්නාවූ හතර වැනි ධ්‍යාන සිතින් පතුරවා හුන්නේ වේ. ඒ භික්ෂූහුගේ සියලු ශරීරයෙහි පිරිසිදුවූ, බබලන්නාවූ හතර වැනි ධ්‍යාන සිතින් පැතිරයයි. (සතර වැනි ධ්‍යාන චිත්තයෙන් සකල ශරීරයම පතුරුවන ලද්දේය කී සේයි.)

"මහරජ, මේ ආත්මභාවයෙහි දැක්කයුතු මෙකී විපාක ඵලයද ඉහතකී ඵලයන්ට වඩා අතිශයින් මනහරයි බොහෝසේ ශ්‍රෙෂ්ඨයි.

**64.** "නැවතද, මහරජ, ඒ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි. ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඔහු මෙසේ දැනගණී. 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තය. *සතර මහාභූතයන්ගේ හේතුවෙන් හටගත්තේය. මව්පියන් නිසා හටගත්තේ. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය. ඇඟ ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ, ස්වභාවකොට

* පස, ජලය, ගින්න, සුලඟ

ඇත්තේය. මාගේ මේ විඤ්ඤාණය ශරීරය ආශ්‍රය කෙරේ. මෙහිම බැඳුනේ වෙයි, කියායි.

**65.** "මහරජ, යම්සේ යහපත්වූ, පිරිසිදු ආකාරයෙන් උපන්නාවූ, අටැස්වූ, ගල් ආදී දොස් බැහැර කිරීමෙන් හොඳ ලෙස සකස් කරණ ලද්දාවූ, නිර්මලවූ විශේෂයෙන් ප්‍රසන්නවූ, කැලැල් නැතිවූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෛඩූර්ය මැණිකක් වේද, එහි නිල්වූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේ, ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේයඃ 'මේ වෛඩූර්ය මැණික මනාසේ කාන්තිමත් හෙයින් යහපත් වේ, පිරිසිදු ආකරයෙන් උපන්නේය, අටැස් ඇත්තේය, දොස් දුරුකිරීමෙන් මනාකොට සකස් කරණ ලද්දේය, නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, කැලැල් නැත, සියලු ආකාරයෙන් සම්පූර්ණය. ඒ මැණිකෙහි මේ නීලවර්ණවූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණනලද්දේය, කියායි.

"මහරජ, එපරිද්දෙන්ම යෝගීවූ මේ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇතිවූ කල්හි මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස සිත එලවා තබයි, ඒ සඳහා විශෙෂයෙන් සිත නමයි. ඒ භික්ෂු තෙමේ මෙසේ දන්නේය, කෙසේද යත්ඃ 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තවේ. සතර මහාභූතයන්ගෙන් හටගත්තේය, මව්පියන් නිසා හටගත්තේය. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඤ්ඤාණය මේ ශරීරය ආශ්‍රය කෙළේ වෙයි, මෙහිම බැඳී සිටියේය' කියායි.

"මහරජ, මේ ආත්ම භාවයේදී දැක්ක යුතු මෙකී විපාක ඵලයන්ද, ඉහතකී මේ ආත්ම භාවයේදී දැක්ක යුතු විපාක

එලයන්ට වඩා බොහෝ සේ මනොඥය, බොහෝ සේ ශ්‍රෙෂ්ඨද වෙයි.

**66.** "ඔහු මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ රූපයක් මනා කොට නිපදවීම පිණිස සිත එලවා තබයි, වෙසෙසින් නමයි. ඔහු ආකාරවත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවනලද) ශරීරය හා අත පය ආදී අවයව ඇති, විකලනුවූ ඉඳුරන් ඇති, මේ ශරීරයෙන් අන්‍යවූ ශරීරයක් හොඳ ලෙස සාදයි.

**67.** "මහරජ, යම්සේ පුරුෂයෙක් මුදු තණ ගසින් තණබඩය උදුරා ගැනීම කරන්නේද, මේ තණ ගසය, මේ තණ බඩය, තණගස අනිකෙක, තණබඩය අනිකෙක, තණ ගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය, තනන ලද්දේය යන වැටහීම ඕහට පහල වන්නේය.

"මහරජ, යම්සේ පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේද ඔහුට මෙබඳු අදහසක් වන්නේය. මේ කඩුවය, මේ කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන් කඩුව ඉවත්කරණ ලද්දේය' කියායි.

"මහරජ, යම් පුරුෂයෙක් සර්පයෙකු සැවයෙන් පහ කරන්නේද ඕහට මේ සර්පයාය, මේ සැවය, සර්පයා එකෙකි. සැව අනිකකි, සැවයෙන් සර්පයා වෙන්කරණ ලද්දේයි වැටහීමක් ඇතිවන්නේය.

"මහරජ, එසේම භික්ෂුතෙමේ මෙසේ සිත සමාධිගතවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සිතින් උපදවන කය මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට ඊට නමයි. ඔහු මේ කයින් රූ ඇති, සිතින් මවනලද, සියලු ශරීරය සහ අතපය ආදී අවයව ඇති,

නොපිරිහුනු ඉන්ද්‍රිය ඇති වෙන කයක් මවයි. මහරජ, මෙයද පෙර කියන ලද මේ ආත්මයෙහිවූ භික්ෂූන් විසින් ලැබිය යුතු විපාක ඵලයන්ට වඩා උතුම්වූද බොහෝසේ මිහිරිවූද, භික්ෂූන් විසින් ලැබියයුතු විපාක ඵලයක් වෙයි.

**68.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි නැවතීමට පැමිණි කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි. එකෙක්ව බොහෝ සේ වෙයි. බොහෝ සේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට පර්වතය හරහට නොහැපෙමින් යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පරියන්කයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹ ලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වයි.

**69.** "මහරජ, දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරු අතවැසියෙක් හෝ යහපත් සේ පදම්කළ මැටියෙන් කැමති කැමති වලන් ආදී වර්ගයන් යම්සේ කරන්නේද, නිපදවන්නේද, මහරජ, දළ කැටයම් කරුවෙක් හෝ අතවැසියෙක් හෝ සකස්කළ දළයෙහි යම්සේ කැමති කැමති දළ කැටයම් වර්ගයක් කරන්නේද, නිපදවන්නේද, මහරජ, දක්ෂ රන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ පදම්කළ රණින් කැමති කැමති රන් අබරණ ජාතීන් යම්සේ කරන්නේද, නිපදවන්නේද- මහරජ, එසේම භික්ෂුව සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධි විධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් ඍද්ධි විධි

වෙන් වෙන් කොට අනුභව කෙරෙයි. එකෙක්ව බොහෝ සේ වෙයි, බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට අහසෙයි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වත හරහට නොහැපෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කරයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව කෙරෙයි.

"මහරජ, මෙයද මේ ආත්මයෙහිවූ, පෙර කියනලද භික්ෂූන් විසින් ලැබිය යුතු ඵලයන්ට වඩා උතුම්වූද, බොහෝ සේ මිහිරිවූද භික්ෂූන් විසින් ලැබියයුතු ඵලයෙක් වෙයි.

**70.** ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, දිව්‍ය කණ සම්බන්ධ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඒ භික්ෂුව පිරිසිදුවූ මිනිස් බව ඉක්මවූ දිව්‍ය කණ සම්බන්ධ ඥාණයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද, දෙයාකාර ශබ්දයන් අසයි.

**71.** "මහරජ, දික් මගට පැමිණි පුරුෂයෙක් බෙර කඬද මහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද, යම්සේ අසාද, ඔහුට මේ බෙරහඬ යයිද, මිහිඟු බෙරහඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬයයිද සිතෙන්නේය. මහරජ, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, දිව්‍ය කන සම්බන්ධ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. ඔහු මෙසේ මිනිස් කණ ඉක්මවූ දිව්‍ය කණ සම්බන්ධ ඥානයෙන් දිව්‍යමයවූද,

මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද දෙයාකාර ශබ්දයන් අසයි.

"මහරජ, මෙයද භික්ෂූන් විසින් ලැබියයුතු පෙර කියන ලද ඵලයන්ට වඩා උතුම්වූද, මිහිරිවූද, මේ ආත්මයෙහි භික්ෂූන් විසින් ලැබිය යුතු ඵලයෙකි.

**72.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශ ඇති කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුවූ කල්හි, ස්ථිර බවට පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පර සිත් දැනගන්නා ඤාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තම සිතින් පිරිසිඳ දනියි. රාග සහිත සිත රාග සිතයයි දනියි. රාගය පහවූ සිත රාගයෙන් තොරවූ සිතයි දනියි. ද්වෙෂ සහිත සිත දොස සිතයයි දනියි ද්වෙෂය පහවූ සිත ද්වෙෂයෙන් තොරවූ සිතයයි දනියි. මොහ සහිත සිත මොහ සිතයයි දනියි, මොහය පහවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුනු සිත හැකුලුනු සිතයයි දනියි, විසුරුණු සිත විසුරුණු සිතයයි දනියි මහත් බවට ගිය සිත, මහත් බවට ගිය සිතයයි දනියි. මහත් බවට නොගිය සිත, මහත් බවට නොගිය සිතයයි දනියි. කාම සහිත සිත, කාම සිතයයි දනියි. ලෞකික හිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනියි. සමාධිගතවූ සිත සමාධිගත සිතයයි දනියි, සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනියි, (ක්ලෙශයෙන්) මිදුනු සිත, මිදුනු සිතයයි දනියි. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දනියි.

**73.** "මහරජ, සැරසෙන ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළමාවයසෙහි සිටියෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු, නොකිළිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය භාජනයෙක්හි හෝ තමාගේ මූනේ ශොභාව පරීක්ෂා කරන්නේ යම්සේ කැලල් සහිත නම් කැලල් සහිතයයි දැනගනියිද කැලල් රහිත නම් කැලල් රහිතයයි දැනගනියිද,

"මහරජ, එසේම භික්ෂුතෙම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පරසිත් දැනගන්නා ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ, අන්‍ය පුත්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් දැන ගනියි. රාග සිත රාගසිතයයි දනියි. රාගයෙන් තොරවූ සිත රාගයෙන් තොරවූ සිතයයි දනියි. දොස සිත දොස සිතයයි දනියි. දොසයෙන් තොරවූ සිත දොසයෙන් තොරවූ සිතයයි දනියි. මොහසිත මොහ සිතයයි දනියි, මොහයෙන් තොරවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුණු සිත හෝ විසුරුණු සිත හෝ මහත් බවට ගිය සිත හෝ මහත් බවට නොගිය සිත හෝ කාම සහිත සිත හෝ අනුත්තර සිත හෝ එකඟවූ සිත හෝ එකඟ නොවූ සිත හෝ දනියි. මිදුණු සිත හෝ මිදුණු සිතයයි දනියි. නොමිදුණු සිත හෝ නොමිදුණු සිතයයි දනියි.

"මහරජ, මෙයද භික්ෂූන් විසින් ලැබිය යුතු පෙර කියන ලද ඵලයන්ට වඩා උතුම්වූද, අතිශයින් මිහිරිවූද, මේ ආත්මයෙහි ලැබෙන, භික්ෂූන් විසින් ලැබිය යුතු ඵලයෙකි.

**74.** "හේ තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ, කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේද යත්: 'එක් ජාතියක්ද, දෙ ජාතියක්ද, තුන් ජාතියක්ද, හතර ජාතියක්ද, පස් ජාතියක්ද, දස ජාතියක්ද, විසිජාතියක්ද, තිස් ජාතියක්ද, සතළිස් ජාතියක්ද, පණස් ජාතියක්ද, සියක් ජාතියක්ද, දහස් ජාතියක්ද, සියක් දහස් ජාතියක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන

හෝ හැදෙන කල්පයන්ද, 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි, අසුවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුත වූයෙමි, මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් විදියේ පෙර ජීවිත සිහි කෙරෙයි.

**75.** "මහරජ, පුරුෂයෙක් යම්සේ තම ගමන් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් තමන්ගේ ගමට එන්නේද, 'මම, සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. එගමිනිදු අසවල් ගමට ගියෙමි, එහිද මෙසේ සිටියෙමි. මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට පැමිණියෙමි'යි හෙතෙම දන්නේය.

"මහරජ, එපරිද්දෙන්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහි කිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් පෙරවිසීම් සිහි කෙරෙයි. කෙසේද යත්: එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද, නොයෙක් කල්ප විස්සකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්ප රාශියකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්පයන්ද, අසුවල් තැන වීමි. මෙ බඳු නම් ඇත්තෙමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු පාට ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සැප දුක් වින්දෙමි, මෙබඳු ආයුෂ කෙළවර

කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙම්, මෙබඳු ගොත්‍ර ඇත්තෙම්, මෙබඳු පාට ඇත්තෙම්, මෙබඳු ආහාර ඇත්තෙම්, මෙබඳු සුව දුක් වින්දෙමි, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිත, පෙරවිසූ පිළිවෙළ දැක්වීම් සහිත, නොයෙක් ආකාරවූ පෙර විසීම් සිහි කෙරෙයි.

"මහරජ, මෙයද මේ ආත්මයෙහි භික්ෂූන් විසින් ලැබිය යුතු පෙර කියනලද ඵලයන්ට වඩා උතුම්වූද, අතිශයින් මිහිරිවූද, භික්ෂූන් විසින් ලැබිය යුතු ඵලය වෙයි.

**76.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ මරණින් පසු උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ පිරිසුදුවූ, මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී, පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොව ගියාවූද නරකලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී. 'මේ පින්වත් සත්ත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය, වචන දුශ්චරිතයෙන් යුක්තය, හිතේ දුශ්චරිතයෙන් යුක්තය උත්තමයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය. මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ, නිරයට පැමිණෙත්. නැතහොත්, මේ පින්වත් සත්ත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබණින්නේය, සත්‍ය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. මරණින් මතු යහපත් පැමිණිමවූ, ස්වර්ග ලොකයට පැමිණියෝය'යි මෙසේ පිරිසුදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද, හොඳ ලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී.

77. "මහරජ, යම්සේ පාරේ හන්දියක ප්‍රාසාදයක් වේද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට ඇතුල්වෙන, ගෙයින් නික්මෙන, වීථියෙහි හැසිරෙණ පාර හන්දියේ හිඳින මනුෂ්‍යයන් දක්නේද, ඔහුට මෙසේ සිතෙයිඃ 'මේ මිනිස්සු ගෙට ඇතුළුවෙති. මොහු නික්මෙති. මොහු වීථියෙහි හැසිරෙති, මොහු පාර හන්දියේ ඉඳිති'යි කියායි. මහරජ, එසේම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, සිත ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනීඃ මේ පින්වත් සත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය, වචන දුශ්චරිතයෙන් යුක්තය, හිතේ දුශ්චරිතයෙන් යුක්තය, උත්තමයින්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු ශරීරයෙන් වෙන්ව, මරණින් මතු අපායවූ දුර්ගතියවූ, දුකවූ, නිරයට පැමිණෙත්.' නැතහොත්, මේ පින්වත් සත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබනින්නෝය. සත්‍යය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. ශරීරයෙන් වෙන්ව මරණින් මතු සුගතියවූ, ස්වර්ග ලෝකයට පැමිණියෝ'යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකීඃ පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද සුගතියට පැමිණියාවූද දුර්ගතියට පැමිණියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී.

"මහරජ, මෙයද මේ ආත්මයෙහිවූ භික්ෂූන් විසින් ලැබියයුතු පෙර කියන ලද ඵලයන්ට වඩා උතුම්වූද අතිශයින් මිහිරිවූද මේ ආත්මයෙහිවූ භික්ෂු භාවයේ ඵලයෙකි.

78. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදු කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි,

මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන භාවයට පැමිණි කල්හි සිතේ පැසවන කෙලෙස් පහකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයි තතුලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී, මේ පැසවන කෙලෙස්යයි තතු ලෙස දැනගණී, මේ පැසවන ක්ලේශයන්ගේ හේතුයයි තතු ලෙස දැනගණී, මේ ඒ කෙලෙස් නැතිකිරීමයයි තතු ලෙස දැනගණී, මේ ඒ කෙලෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ, සංසාරයට (භවයට) ඇති ආශාවන් කෙරෙන්ද සිත මිදේ, දැඩි මෝහය කෙරෙන්ද සිත මිදේ මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැතිවිය උතුම් හැසිරීමෙහි වසන ලදී. කටයුත්ත කරණලදී, මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ'යිද දැනගණී,

**79.** "මහරජ, යම්සේ පර්වත මුදුනක පිරිසිදු, සිත් සතුටු කරන නොකැළඹුනු, දිය විලක් වේද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ නැවතී තිබෙන්නාවූ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන්ද, කැබලිති කැටද, එහා මෙහා යන්නාවූ මසුන් රැන්ද, දක්නේද, ඔහුට මෙසේ සිතෙන්නේයඃ 'මේ දිය විල පිරිසිදුය, මනා සිත් ප්‍රිය කරන්නේය, නොකැළඹුනේය. එහි මේ සිප්පි බෙල්ලන් සක් බෙල්ලන්ද, කැටකැබලිතිද නැවතී තිබේ. මසුන් රැන් හැසිරෙත්ය' කියායි මහරජ, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, බොහෝ කල් සිට එන ක්ලෙශයන් නැතිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක්නැතිකිරීමේ මාර්ගයයි තතුලෙස දැනගනී. මේ කෙලෙස් යයි තතු ලෙස

දැනගණී, මේ කෙලෙස් හේතුයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ. භවයට ඇති ආශාවන් කෙරෙන්ද මිදේ, මෝහය කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැතිවිය, උතුම් හැසිරීමෙහි වසනලදී, කටයුත්ත කරනලදී. මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ'යිද දැනගණී.

"මහරජ, මේ වනාහි මේ ආත්මයෙහිවූ භික්ෂූන් විසින් ලැබිය යුතු පෙර කියනලද ඵලයන්ට වඩා බොහෝ උතුම්වූද, බොහෝ මිහිරිවූද, මේ ආත්මයෙහි භික්ෂූන් විසින් ලැබිය යුතු ඵලයකි. මහරජ, මේ ආත්මභාවයෙහි භික්ෂූන් විසින් ලැබිය යුතු මේ භික්ෂුභාවයේ ඵලයට වඩා බොහෝ උතුම්වූද, බොහෝ මිහිරිවූද, භික්ෂූන් ලැබියයුතු වෙන ඵලයෙක් නැත.

80. මෙසේ වදාළ කල්හි මගධ රට රජවූ වෛදෙහි පුත්‍රවූ අජාසත් රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය, "ස්වාමීනි, ඉතාම යහපති, ස්වාමීනි, ඉතාම යහපති ස්වාමීනි, (යමෙක්) යටිකුරු කරන ලද්දක් යම්සේ උඩුකුරු කරන්නේද, වැසුමක් එලිදරව් කරන්නේද, මුළාවූවෙකුට මග කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේද, එලෙසින්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය දේශනා කරණ ලද්දේය. ස්වාමීනි, (ඒ ඇසූ) මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, සංඝයාද සරණකොට ගණිමි. අද පටන් දිවිහිම් කොට සරණ ගිය උපාසකයෙකු කොට භාග්‍යවතුන් වහන්සේ මා සලකන සේක්වා බාලයෙකු මෙන්ද, අනුවණයෙකු මෙන්ද, අදක්ෂයකු මෙන්ද මම වරදට අසුවූයෙමි. ඒ මම ධාර්මිකවූ, ධර්මයෙන් යුත් රජෙකුවූ, මාගේ පියා සම්පත් ලොභ හෙතුවෙන් ජීවිතයෙන් තොර කෙළෙමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ඒ මාගේ වරද මත්තෙහි සංවරණය පිණිස ඒ වරදට මට ක්ෂමා කරණ සේක්වා."

81. "මහරජ, ඒකාන්තයෙන් බාලයකු මෙන්ද, අනුවණයෙකු මෙන්ද, අදක්ෂයෙකු මෙන්ද, වරද ඔබ ඉක්මවා ගියේය. ඒ

වරද නම්, ධාර්මිකවූ ධර්මයෙන් යුත් රජෙකුවූ පියා සම්පත් ලොභ හෙතුවෙන් ජීවිතයෙන් තොර කෙළෙහිය. මහරජ, ඔබ යම් හෙයකින් වරද වරද වසයෙන් දැක ධර්මය ලෙස වරද පිළිගැනීම කෙරෙහි නම් ඔබේ ඒ වරද අපි ඉවසමු. යමෙක් වරද වරද වශයෙන් දැක මත්තෙහි සංවරණයට පැමිණේද, ධර්මය ලෙස වරද පිළිගැනීම කෙරේද, එය උතුම් හැසිරීමෙහි දියුණුවයි."

**82.** මෙසේ වදාළ කල්හි මගධරට රජවූ වෙදෙහි පුත්‍රවූ අජාසත් රජතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේය. "ස්වාමීනි, දැන් ඉතින් අපියමු. අපි බොහෝ වැඩකටයුතු ඇත්තෝ වෙමු.

"මහරජ, එසේ නම්, ඔබට යාමට සුදුසු කාලය නම් ඒ බව දනුව."

එකල්හි මගධරට රජවූ වෙදෙහි පුත්‍ර රජාසත් රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුව, ඒ ගැණ ප්‍රීතිව අස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ දකුණු පැත්ත ඉදිරියට තිබෙන ලෙස ගෞරවයෙන් ගියේය.

**83.** එවිට භාග්‍යවත් තෙමේ මගධරට රජවූ වෙදෙහි පුත්‍ර අජාසත් රජ බැහැර ගිය නොබෝ වේලාවකින් භික්ෂූන්ට ආමන්ත්‍රණය කෙළේය. "මහණෙනි, මේ රජ තමන්ම වැනසුනේය; මහණෙනි, මේ රජ තමන්ම නැහුනේය. ඉදින් මේ රජ ධාර්මිකවූ ධර්මයෙන් යුක්ත රජෙකුවූ පියා දිවියෙන් තොර නොකළේ නම් මේ හුනස්නෙහිදීම පිරිසිදුවූ කෙලෙස් මල පහවූ ධර්ම ඇස (සෝවාන් මග) ඔහුට උපදින්නේය."

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. සතුටුවූ සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ.

**දෙවෙනිවූ සාමඤ්ඤඵල සූත්‍රය නිමි.**

# 3. අම්බට්ඨ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. (මාගේ ඇසීම මෙසේයි) එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් පමණවූ මහා භික්ෂු සංඝයා වහන්සේ සමග කොසොල් රටෙහි ඇවිදීමෙන් හැසිරෙනසේක් කොසොල් රට වැස්සන්ගේ ඉච්ඡානංගල නම් බමුණුගම යම් තැනෙක්හිද එහි වැඩියේය. භාග්‍යවතුන් වහන්සේ එහි ඉච්ඡානංගල වනයෙහි වාසය කෙළේය, එකල පොක්ඛරසාති බමුණු තෙමේ බොහෝ මිනිසුන්ගෙන් හා බොහෝ සතුන්ගෙන් ගහනවූ, තණ, දැවදඬු, දිය හා ධාන්‍ය ඇත්තාවූ, රජුන්ගෙන් ලබන ලද්දාවූ පසේනදී කොසොල් රජු විසින් දුන් හෙයින් රාජ දායාදයක්වූ උතුම් කොට දෙන ලද්දක්වූ උක්කට්ඨා නුවර වෙසෙයි.

2. 'එකල්හි පොක්ඛරසාති බමුණු තෙමේ (මේ පුවත) ඇසී, ශාක්‍යපුත්‍රවූ, ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ වූ කලී පන්සියයක් පමණවූ මහාභික්ෂු සමූහයක් සමග කොසොල් දනව්වෙහි චාරිකාවේ හැසිරෙනසේක් ඉච්ඡානංගලයට පැමිණ ඉච්ඡානංගල වනයෙහි වාසයකරයි. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ මෙබඳුවූ මනොඥවූ ස්තුති ඝොෂාවක් උස්ව නැංගේය. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කාරණයෙන්ද අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විදර්ශනාඥානය ආදී ඥාන අටෙන්ද සීල සංවරය ආදී (චරණ) හසුරුවන ධර්ම පහළොවෙන්ද යුක්තහ. යහපත් ගතිඇත්තාහ, සියලු ලොකයන් දන්නාහ, ශ්‍රෙෂ්ඨයහ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූහ, දිව්‍ය මනුෂ්‍යයන්ට ගුරුවරයෙක් වූහ. බුද්ධයහ, භාග්‍යවත්හ, ඒ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ රජුන් හා මිනිසුන් සහිතවූ සත්ව වර්ගයා ඇතුළු සියලු ලොකය තමන් වහන්සේම මනාව පැහැදිලි කොට දැන ප්‍රකාශ කරණසේක. උන්වහන්සේම මුල මැද අග යන තුන්තන්හි යහපත්වූ අර්ථ සහිතවූ, දස ආකාරයෙන් නියම විදියට වචන ශබ්ද කිරීම ඇත්තාවූ සම්පූර්ණවූ, පිරිසිදුවූ, ධර්මානුශාසනාව

ප්‍රකාශ කරණසේක. එබඳුවූ, රහතුන්ගේ දැකීමක් වේනම් ඒ යහපත්මැයි කියායි.

3. එකල පොක්ඛරසාති බමුණහට සිටි අම්බට්ඨ නම් තරුණ ශිෂ්‍යයා (තමා වෙතින්) මන්ත්‍ර කටපාඩමේ කියන්නාවූ, වේදමන්ත්‍ර දන්නාවූ, නාමනිඝණ්ටු යාග ආදී කටයුතු පිළිවෙළ ශික්ෂානිරුක්ති නම් වේදයෙහි කොටස යන ප්‍රභෙදයන් ඇති, ඉතිහාසය පස්වැනි කොට ඇති වෙදත්‍රයයේ කෙළවරට ගියාවූ, පද හා ව්‍යාකරණ කටපාඩමේ කියන්නාවූ *විතණ්ඩශාස්ත්‍රයේත් මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයේත් අති දක්ෂවූ, 'යමක් මම දනිම් නම් එය නුඹත් දනී. නුඹ යමක් දනී නම් එයම මමත් දනිමි' යන ගුරුන්ගේ ප්‍රකාශයට 'එසේමය'යි උත්තර දුන් ආචාර්යයන්ගේ ත්‍රිවෙදය පිළිබඳ ධර්මයෙහි සියල්ල දත්තා විය.

4. ඉක්බිති පොක්ඛරසාති බමුණු තෙමේ අම්බට්ඨ තරුණයා කැඳවා මෙසේ කීය. "දරුව අම්බට්ඨය, යව ශාක්‍ය පුත්‍රවූ, ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ, ශ්‍රමණගෞතමයන් වහන්සේ පන්සීයක් පමණවූ මහාභික්ෂු සමූහයක් සමග කොසල ජනපදයෙහි ඇවිදිමින් හැසිරෙන සේක් ඉච්ඡානංගලයට පැමිණ ඉච්ඡානංගල වනාන්තරයෙහි වාසය කරයි. ඒ භාග්‍යවතුන් වහන්සේගේ මෙබඳුවූ යහපත් කීර්තිරාවයක් උස්ව නැංගේය. (කෙබඳුවූද යත්:) මේ මේ කාරණයෙනුදු ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, සර්ව සම්පූර්ණවූ, පිරිසිදුවූ බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරයි. එබඳුවූ රහතුන්ගේ දැකීමක් වේනම් යහපත්මැයි" කියායි. "දරුව අම්බට්ඨය, එව, නුඹ මහණ ගොයුම්හු යම් තැනෙක්හි නම් එහි යව. ගොස් ඉඳින් ඒ භවත් ගෞතමයන්ගේ ඇතිසැටියක් නිසාම කීර්ති ශබ්දයක් පැතිර ගියේද නොවේ නම් එසේ නුවූවක් පිළිබඳවද, උන්වහන්සේ එබඳුද, නැත්නම් එබඳු නොවේදැයි, එපරිද්දෙන් ශ්‍රමණ ගෞතමයන් දනුව. අපි ඒභවත් ගෞතමයන් වහන්සේ දැනගනුම්හ."

* කරුණක් වරද බව ඔප්පු කිරීම නම් විතණ්ඩ ශාස්ත්‍රය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**5.** "පින්වත, ඉදින් ඒ භවත් ගෞතමයන් වහන්සේගේ ඇත්තාවූ ගුණයන් නිසාම මේ කීර්තිරාවය පැතිර ගියේ ද, ඉදින් එසේ නොවේද, ඉදින් ඒ භවත් ගෞතමයෝ එබඳුද, ඉදින් එසේ නොවේදැයි මම කෙසේ නම් දැනගන්නෙම්ද?"

**6.** "දරුව අම්බට්ඨය, අපගේ වෙද මන්ත්‍රයන්හි දෙතිස් මහපුරිස් ලකුණු සඳහන්වේමය. ඒ ලක්ෂණයන්ගෙන් යුක්තවූ මහා පුරුෂහට ගති දෙකෙක්ම වෙති. අනිකෙක් නැත. ඉදින් ගිහිගෙයි වසයි නම් ධාර්මිකවූ ධර්මරජෙක්වූ, හතර දීපයට අධිපතිවූ, දිනන ස්වභාව ඇතිවූ, ජනපදයන්හි ස්ථිරවූ සත් රත්නයන් අයිතිවූ සක්විති රජ වෙයි. මොවුහු ඔහුගේ සත්රත්නයෝ වෙති. එනම්: චක්‍රරත්නය, ඇත් රත්නය, අශ්වරත්නය, මාණික්‍යරත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපති රත්නය, සත්වැනිවූ පුත්‍ර රත්නයද යන සත්රත්නයෝයි. භය නැතිවූ දිව්‍යපුත්‍රයන්ට සමාන වීර්ය සම්පන්න ශරීර ඇත්තාවූ, සතුරු සේනාවන් මැඩපවත්වන්නාවූ, දහසකටත් අධිකවූ පුත්‍රයෝ ඒ සක්විති රජුට වෙත්. හෙතෙමේ සයුර කෙළවරකොට ඇති මේ පෘථිවිය දඬුවම් කිරීම් නැතුව යුද්ධ කිරීම් නැතුව ධර්මයෙන් දිනා අධිපතිව වෙසෙයි.

"ඉදින් හෙතෙම ගිහිගෙන් නික්මී අනගාරියවූ සාසනයේ පැවිදිවෙයි නම් ලෝකයේ කෙලෙස් වලින් යුත් ඝන අන්ධකාර වැස්ම දුරු කළාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධ වෙයි. දරුව අම්බට්ඨය, මම වනාහි වෙදමන්ත්‍ර උගන්වන්නා වෙමි, නුඹ වෙදමන්ත්‍රයන් කට පාඩමෙන් කියන්නා වෙයි."

"එසේය ස්වාමීනි"යි අම්බට්ඨ මාණවකයා පොක්ඛරසාති බමුණුහට උත්තරදී, හුනස්නෙන් නැගී, පොක්ඛරසාති බමුණා වැඳ දකුණුපැත්ත ඉදිරියට තිබෙන ලෙස ගෞරවයෙන් ගොස්, වෙළඹුන් යෙදූ, රථයකට නැගී, බොහෝ -තරුණයන් සමග ඉච්ඡානංගල වනාන්තරය 'යම්තැනෙක්හි -නම් එහි පිටත්ව ගියේය. රථයෙන් යාහැකි බිම යම්තාක් -නම් ඒතාක් රථයෙන් ගොස් රථයෙන් බැස පයින්ම ආරාමයට -ඇතුළු වූයේය.

**7.** එකල බොහෝ භික්ෂූහු එළිමහනේ සක්මන් කරති - අම්බට්ඨ නම් තරුණයා ඒ භික්ෂූන් වෙත ළඟාවූයේය. එළඹ - ඒ මහණුන්ට මෙසේ කීය.

"පින්වත්නි, භගවත් ගෞතමතෙමේ දැන් කොතැන්හි නම් වාසය කරයිද? අපි ඒ භගවත් ගෞතමයන් දැකීම පිණිස මෙහි පැමිණියෝ වෙමු."

**8.** එකල ඒ භික්ෂූන්ට මෙබඳු සිතක් පහළ විය. 'මේ අම්බට්ඨ මාණවක තෙමේ ප්‍රසිද්ධකුලයේ උපන්නේම ප්‍රකටවූ පොක්ඛරසාති බමුණුහට අතවැසිද වෙයි. මෙබඳු කුල පුත්‍රයන් සමග කරන කථා බස භාග්‍යවතුන් වහන්සේට බරෙක් නොවේමය' යනුයි. ඒ භික්ෂූහු අම්බට්ඨ මානවකයාහට මෙසේ කීහ: "අම්බට්ඨය, එතැන ගන්ධකුටිය වසනලද දොර ඇත්තේය. ශබ්ද නොකොට එහි ගොස් සෙමින් පිලට ඇතුලුව කාරා අගුළ නිය පිටින් තට්ටුකරව, නුඹට භාග්‍යවතුන් වහන්සේ දොර හරිනවා ඇත."

**9.** එවිට අම්බට්ඨ මාණවක තෙමේ වසනලද දොර ඇත්තාවූ ගන්ධකුටිය යම්තැනෙක නම් එහි ශබ්ද නොකර පැමිණියේය. සෙමින් පිලට ඇතුළුව, කාරා අගුළ නියපිටින් තට්ටු කෙළේය. භාග්‍යවතුන්වහන්සේ දොර හැරියේය. අම්බට්ඨ නම් තරුණයා ඇතුළුවූයේය. සෙසු තරුණයෝත් ඇතුළුව භාග්‍යවතුන් වහන්සේ සමග සුවදුක් විචාරීම් ආදියෙන් සතුටු වූහ. ඔවුහු සන්තෝෂ ගෙනදෙන සිහිකටයුතු කථාවන් කොට නිමවා එකත් පසෙක හුන්හ. අම්බට්ඨ නම් තරුණයා සක්මන් කරමිනුත් වැඩහුන්නාවූ භාග්‍යවතුන් වහන්සේ සමග ස්වල්ප කථාවන් කරයි. නැවතී සිටිමිනුත් වැඩහුන්නාවූ භාග්‍යවතුන් වහන්සේ සමග යම් යම් සුලු කථාකරයි.

**10.** එවිට භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ තරුණයාට මෙසේ කීයේය: "අම්බට්ඨය, ඔබ යම්සේ සක්මන් කරමිනුත් නැවතී සිටිමිනුත් හුන්නාවූ මා සමග යම් යම් නොවැදගත් කරුණු කථාව කරයිද, වයසින් වැඩිවූ මහලුවූ බ්‍රාහ්මණයන් හා

ගුරුවරුන්, ගුරුවරුන්ගේ ගුරුවරුන් සමග ඔබගේ කථාව මෙබඳු වේද?

"'නැත, භවත් ගෞතමය, යන්නාවූ බමුණු තෙමේ යන්නාවූ බමුණකු සමග කථා කරන්ට සුදුසුය. භවත් ගෞතමය, සිටින්නාවූ බමුණුතෙමේ සිටින්නාවූ බමුණකු සමග කථාකරන්නට සුදුසුය. භවත් ගෞතමය, හිඳින්නාවූ බමුණු තෙමේ හිඳින්නාවූ බමුණකු සමග කථාකරන්නට සුදුසුය. භවත් ගෞතමය, නිදන්නාවූ බමුණු තෙමේ නිදන්නාවූ බමුණකු සමග කථාකරන්නට සුදුසුය. එහෙත්, භවත් ගෞතමය, පිළිකුල් කටයුතුවූ, මුඩුවූ ශ්‍රමණවූ දාසභාවයෙහි පිහිටි, කළුපාටවූ, බ්‍රහ්මයාගේ පතුලින් උපන් පෙළපතක් ඇත්තාවූ යම් කෙනෙක් වෙද්ද, ඔවුන් සමග මාගේ කථාකිරීම වූකලී භවත් ගෞතමයන් සමග මාගේ කථාකිරීම යම්සේද එවැනිය."

11. "අම්බට්ඨය, වැඩක් ඇතිවම ඔබගේ මෙහි පැමිණීම විය. යම් ප්‍රයෝජනයක් පිණිස ආයේ නම් ඒ කාරණයම හොඳින් කල්පනාකර කරව.

"පින්වත්නි, මේ අම්බට්ඨ තරුණයා ගුරු ආශ්‍රයක නොවිසුවෙකි, නොවැඩුනෙකි. නමුත් එසේ විසුයේය, වැඩුනේයයි උඩඟු ඇත්තෙකි. මේ ගුරු ආශ්‍රයක නොවැඩුනු නොහික්මුනු නිසා මිස වෙනකවරක් නිසාද?"

12. එකල භාග්‍යවතුන් වහන්සේ විසින් නොවැඩුනෙක නොහික්මුනෙක යන කථාවෙන් හඳුන්වන ලද අම්බට්ඨ තරුණයා කිපුණේ නොසතුටු සිත් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේටම ගටා බනින්නේ, භාග්‍යවතුන් වහන්සේටම පහත් කොට කථා කරන්නේ, භාග්‍යවතුන් වහන්සේටම නින්දාකරන්නේ, "මට නම් ශ්‍රමණ භවත් ගෞතමයාම පාපියෙක් වන්නේය"යි මෙසේ කීයඃ "භවත් ගෞතමය, ශාක්‍ය ජාතිය චණ්ඩය. භවත් ගෞතමය, ශාක්‍යජාතිය එරුසය, භවත් ගෞතමය, ශාක්‍යජාතිය නොගරුය. භවත් ගෞතමය, ශාක්‍යජාතිය වාචාලය දාසියගේ දරුවෝ දාස ජනයාවූ බැවින් ඔව්හු බ්‍රාහ්මණයන්ට සත්කාර නොකෙරෙත්; බ්‍රාහ්මණයන්ට ගරු නොකරත්, බ්‍රාහ්මණයන්ට නම්බු නොකරත්, බ්‍රාහ්මණයන්ට

පූජා නොකරත්, බ්‍රාහ්මණයන් නොවඳිත්. භවත් ගෞතමය, ඉදින් මේ ශාක්‍යයෝ දාසවූවාහු දාස බැව්හි සිට බමුණන්ට සත්කාර නොකරත්ද, බමුණන්ට ගරු නොකරද්ද, බමුණන්ට බුහුමන් නොකරත්ද, බමුණන් නොපුදද්ද බමුණන් නොවඳිද්ද, ඒ මේ කාරණය මට රුචි නැත ඒ මේ කාරණය නුසුදුසුය.'' මෙසේ අම්බට්ඨ තරුණයා ශාක්‍යයන් කෙරෙහි මේ ප්‍රථම දාසවාදය හෙලුයේය.

13. ''කිමෙක්ද? අම්බට්ඨය, නුඹට ශාක්‍යයෝ අපරාධයක් කළාහුද?'

''භවත් ගෞතමය, මම එක් කලෙක මාගේ ගුරුවූ පොක්ඛරසාති බමුණාගේ යම් කටයුත්තක් හේතුකොට කපිලවස්තු නුවරට ගියෙමි. යම් තැනෙක ශාක්‍යයන්ගේ රැස්වීි විවේක ගන්නා ශාලාව වේද එහි ගියෙමි. එකල බොහෝවූ ශාක්‍යයෝත් ශාක්‍ය කුමාරවරුත් ඒ රැස්වීි විවේක ගන්නා ශාලාවෙහි මහා ආසනයන්හි ඔවුනොවුන් ඇඟිල්ලෙන් කිතිකැවීමෙන් මහත්සේ සිනාසෙන්නාහු, ඒකාන්තයෙන් මටම හෙලාදක්නාසේ හඬනඟා සිනාසෙන්නාහු, කිසිවෙක් මට ආසනයක්වත් නුදුන්නේය. භවත් ගෞතමය, ඉදින් මේ ශාක්‍යයෝ දාසයන්ව සිටිමින් බ්‍රාහ්මණයන්ට සත්කාර නොකරද්ද, බ්‍රාහ්මණයන්ට ගරු නොකරද්ද, බ්‍රාහ්මණයන්ට නම්බු නොකරද්ද, බමුණන් නොපුදත්ද, බමුණන්ට වැඳුම් නොකරද්ද, ඒ මේ කාරණය මට රුචි නැත, නුසුදුසුය."

මෙසේ අම්බට්ඨ තරුණයා ශාක්‍යයන් කෙරෙහි මේ දෙවැනි දාසවාදය හෙලුයේය,

14. "අම්බට්ඨය, කැටකිරිල්ලිත් තමාගේ කූඩුවෙහි කැමති යමක් කියන්නීය, අම්බට්ඨය, යම් මේ කපිලවස්තුපුරයක් වෙයි නම් එය ශාක්‍යයන්ගේ ස්වකීය නුවර වේ. ආයුෂ ඇති අම්බට්ඨය, මෙවැනි සුළු කරුණකින් කිපෙන්නට නුසුදුසුය."

15. "භවත් ගෞතමය, මේ ජාති සතරෙකි-ක්ෂත්‍රියය බ්‍රාහ්මණය, වෛශ්‍යය, ශුද්‍රය කියායි. මේ ජාති සතරින් ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන ජාති තුන ඒකාන්තයෙන් බ්‍රාහ්මණයාහට

සේවකයෝ වෙත්. මේ ශාක්‍යයෝ දාසයන්ව සිටිමින් බ්‍රාහ්මණයන්ට සත්කාර ගරුකාර නොකරති. නම්බු කිරීම, පිදීම, වැඳීම නොකරති. භවත් ගෞතමය, ඒ මේ කාරණය මට රුචි නොවේ. ඒ කාරණය නුසුදුසුය."

මෙසේ අම්බට්ඨ තරුණයා ශාක්‍යයන් කෙරෙහි මේ තුන් වැනි දාසවාදයත් හෙලුයේය.

**16.** එවිට භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතක් විය. මේ අම්බට්ඨ තරුණයා ඉතා දැඩිසේම ශාක්‍යයන් කෙරෙහි දාස වාදයෙන් නින්දාකරයි. මම (ඔහුගේ) ගොත්‍රය විචාරන්නෙම් නම් ඉතා යෙහෙක' භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ තරුණයාට මෙසේ කීයේයඃ "අම්බට්ඨය, නුඹ කවර ගොත්‍රයක වූයෙහිද?"

"භවත් ගෞතමය, මම කණ්හායන වෙමි."

"අම්බට්ඨය, පුරාණවූ මව්පියන්ට අයිති නාමගොත්‍රය සිහිකරන්නාවූ නුඹගේ ස්වාමිපුත්‍රයෝ ශාක්‍යයෝ වෙති. නුඹ ශාක්‍යයන්ගේ දාසියගේ පුත්‍රයෙක් වූයෙහිය. අම්බට්ඨය, ශාක්‍යයෝ ඔක්කාක රජු ඔවුන්ගේ මුල් පුරුෂයා කොට දක්වති.

"අම්බට්ඨය පූර්වයේ ඔක්කාක රජු තමාට යම් ඒ බිසවක් ප්‍රිය මනාපවූවාද, ඇගේ පුත්‍ර කුමාරයාට රජය පවරා දෙනු කැමැත්තෙන් ඔක්කා මුඛය, කරකණ්ඩුය, හත්ථිනිකය, සිනිසූරය යන වැඩිමහලු කුමාරවරුන් රටින් පිටකෙළේය. ඒ රාජ කුමාරවරු රටින් පිටවූවාහු හිමාලය කඳු ප්‍රදේශයේ පොකුණු තෙර මහා වනාන්තරයක වාසය කළාහුය. ඔහු ජාතිය නැතිවේය යන බියෙන් සොහොයුරියන් සමග එක්ව විසීම කළාහුය.

"අම්බට්ඨය එකල්හි ඔක්කාක රජ තෙමේ අමාත්‍යමණ්ඩලයෙන් (මෙසේ) ඇසීයඃ "පින්වත්නි, දැන් කුමාරවරු කොහි වෙසෙත්ද?"

"දෙවයිනි, හිමාලය කඳු ප්‍රදේශයේ පොකුණුතීරයේ මහා වනාන්තරයක් ඇත. දැන් කුමාරවරු එහි වෙසෙති. ඔහු ජාතිය මිශ්‍රවීමේ භයෙන් සිය සහෝදරියන් සමග සංවාසය කරති."

"අම්බට්ඨය, එවිට ඔක්කාක රජු ප්‍රීතියෙන් කියන මේ වචන කීයේය. 'භවත්නි, කුමාරවරු ඒකාන්තයෙන් (ශාක්‍යයෝයි) සමර්ථයෝයි. පින්වත්නි, කුමාරවරු ඒකාන්තයෙන්ම උත්තම ශාක්‍යයෝයි (සමර්ථයෝයි) අම්බට්ඨය, එතැන්පටන් ඔවුහු ශාක්‍ය නාමයෙන් හඳුන්වනු ලැබෙත්. ඒ ඔක්කාක රජු ශාක්‍යයන්ගේ මුල් පුරුෂයායි.

"අම්බට්ඨය, ඔක්කාක රජුට දිසා නම් දාසියක් වූවාය. ඕ තොමෝ කෘෂ්ණවර්ණවූ (කළුපාටවූ) පුත්‍රයකු ප්‍රසූත කළාය, උපන්නාවූ ඒ කෘෂ්ණ, මෑණියනි, මා සෝදනු මැනව, නහවනු මැනව, මේ අපවිත්‍රයෙන් මුදනු මැනව, ඔබට, උපකාරීවෙමි කියා මහත්සේ ශබ්ද කෙළේය.

"අම්බට්ඨය, යම්සේ දැන් මිනිස්සු පිශාචයන් දැක; පිශාච නමින් හඳුනත්ද, එසේම අම්බට්ඨය, ඒකාලයෙහි වනාහි මිනිස්සු පිශාචයන් කෘෂ්ණයන් නමින් හඳුනති. ඔව්හු මෙතෙම 'උපන් විගස කථාකෙළේය, මේ උපන්නේ කෘෂ්ණයෙක, මේ උපන්නේ පිශාචයෙකැ'යි කීවාහුය.

"අම්බට්ඨය, එතැන්පටන් කණ්හායනයෝ (කෘෂ්ණ ජාතිකයෝ) සඳහන් වෙත්. ඔහු කණ්හායනයන්ගේ මුල් පුරුෂයායි. අම්බට්ඨය, මෙසේ පුරාණ මව්පියන්ට අයිති නාම ගොත්‍රය සිහිකරන්නාවූ නුඹගේ ස්වාමීහු ශාක්‍යයෝ වෙති. නුඹ ශාක්‍යයන්ගේ දාසියගේ පුතා වෙහි."

17. මෙසේ කී කල්හි ඒ මාණවකයෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාහුයඃ "භවත් ගෞතම තෙමේ ඉතා දැඩිසේ අම්බට්ඨ මාණවකයා දාසි පුත්‍ර වාදයෙන් නිග්‍රහ නොකෙරේවා. අම්බට්ඨය මාණවක තෙමේ වංසවත්ය, අම්බට්ඨ මාණවක තෙමේ උතුම් ගති ඇති පුතෙකි. අම්බට්ඨ තරුණ තෙමේ බොහෝ ශිල්ප ශාස්ත්‍ර දන්නෙකි. අම්බට්ඨ තරුණ තෙමේ යහපත් වචන ඇත්තෙකි. අම්බට්ඨ තරුණ තෙමේ පණ්ඩිතය, අම්බට්ඨ තරුණ තෙමේ භවත් ගෞතමයන් සමග මේ වචනයෙහි (දාසපුත්‍ර චොදනායෙහි) පිළිතුරු දෙන්නට සමර්ථය."

**18.** එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඒ මාණවකයන්ට මෙසේ කීසේක: 'තරුණයෙනි' ඉදින් නුඹලාට අම්බට්ඨ තරුණයා වංශවත් නොවේය, පහත් ගති ඇති පුතෙකි, සුළු වසයෙන් ශිල්ප ශාස්ත්‍ර දත්තෙකි, නපුරු වචන ඇත්තේය අපණ්ඩිතය, අම්බට්ඨ තෙමේ ශ්‍රමණ ගෞතමයන් සමග මේ වචනයේලා පිළිතුරු දෙන්නට අසමර්ථයැයි සිතේ නම්, අම්බට්ඨ තරුණයා පැත්තකටවී සිටීවා. නුඹලා මා සමග මේ (දාසවාද) කථාවෙහි පිළිතුරු දෙව්. ඉදින් වනාහි තරුණයෙනි, නුඹලාට 'අම්බට්ඨ තරුණයා වංසවත්ය, අම්බට්ඨ තරුණයා උතුම් ගති ඇති පුතෙකි. අම්බට්ඨ තරුණයා බොහෝ ශිල්ප ශාස්ත්‍ර දත්තෙකි. අම්බට්ඨ තරුණයා යහපත් වචන ඇත්තේය, අම්බට්ඨ තරුණයා පණ්ඩිතය, ඔහු ශ්‍රමණ ගෞතමයන් සමග මේ වචනයෙහිලා පිළිතුරු කථා කරන්නට සමර්ථයයි සිතේ නම් නුඹලා පැත්තකටවී සිටිත්වා. අම්බට්ඨ තරුණයා මා හා පිළිතුරු කථා කෙරේවා."

**19.** "භවත් ගෞතමයිනි, අම්බට්ඨ තරුණයා වංශවත්ය අම්බට්ඨ තරුණයා උතුම් ගති ඇති පුතෙකි, අම්බට්ඨ තරුණයා බොහෝ ශිල්ප ශාස්ත්‍ර දන්නෙක්ය, අම්බට්ඨ තරුණයා යහපත් වචන ඇත්තෙක, අම්බට්ඨ තරුණයා පණ්ඩිතය, ඔහු භවත් ගෞතමයන් සමග මෙ (දාසිපුත්‍ර) වචන යෙහිලා උත්තර දෙන්නට සමර්ථය. අපි නිශ්ශබ්ද වමු. අම්බට්ඨ තරුණයා භවත් ගෞතමයන් සමග මේ වචනයට පිළිතුරුදීම කෙරේවා."

**20.** එවිට භාග්‍යවතුන්වහන්සේ අම්බට්ඨ තරුණයාට මෙසේ කීයේය: "අම්බට්ඨය, නුඹ ඉදිරියෙහි කරුණු සහිතවූ ප්‍රශ්නයක් මතුවිය. නොකැමැත්තෙන් නමුදු ඒ විසඳිය යුතුය. ඉදින් නුඹ නොවිසඳන්නෙහි නම්, වෙන කරුණකින් හෝ ඒ යටපත් කරන්නෙහි නම්, නිශ්ශබ්ද හෝ වන්නෙහි නම්, නැගිට හෝ යන්නෙහි නම් මෙහිම නුඹගේ හිස සත්කඩව පැළෙන්නේය. අම්බට්ඨය, ඒ කුමකැයි හඟිනෙහිද? කිම? වෘද්ධවූ මහළුවූ, ආචාර්ය ප්‍රාචාර්යවූ බ්‍රාහ්මණයන්ගෙන් කණ්හායන ගොත්‍ර ඇත්තෝ කොතැන් සිට පැවැත්තෝද, කණ්හායනයන්ගේ

මුල්පුරුෂයා කවරෙක්දැයි කියනු ලබන්නක් නුඹ විසින් අසනලදද?”

මෙසේ කීකල අම්බට්ඨ තරුණයා නිශ්ශබ්ද විය. දෙවනුවත් එසේ ඇසූ කල අම්බට්ඨ තරුණයා නිශ්ශබ්ද විය, එවිට භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ තරුණයාට මෙසේ කීයේය.

“අම්බට්ඨය, දැන් ප්‍රකාශ කරව. නුඹට මේ නිශ්ශබ්ද වන්නට කාලය නොවේ. අම්බට්ඨය’ යමෙක් වනාහි තථාගතයන් වහන්සේ විසින් තුන්වැනි වර තෙක් සහේතුක ප්‍රශ්නයක් අසනලදුව උත්තර නොදේද, මෙහිදීම ඔහුගේ හිස සත් කඩක්ව පැළෙන්නේය.”

21. එකල වජ්‍රපාණියක්ෂ තෙමේ (සක්දෙව් රජතෙමේ) ගිනිපාටවූ, දිලිසෙන්නාවූ එකම ගිනිගොඩක් මෙන්වූ මහත්වූ යහුලක් ගෙණ, අම්බට්ඨ තරුණයාට කෙලින් ආකාශයෙහි සිටියේය. “මේ අම්බට්ඨ තරුණයා භාග්‍යවතුන් වහන්සේ විසින් තුන්වැනි වර දක්වා ප්‍රශ්නයක් අසනලදුව උත්තර නොදෙන්නේ නම් මෙහිදීම ඔහුගේ හිස සත්කඩකොට පළමි” කියායි. ඒ වජ්‍රපාණි යක්ෂයා වනාහි භාග්‍යවතුන්වහන්සේත් දක්නාසේක. අම්බට්ඨ තරුණයාත් දකී.

ඉක්බිති අම්බට්ඨ තරුණයා භයවී සංවේගයට පැමිණියේ, මයිල් කෙලින්වී භාග්‍යවතුන් වහන්සේගේම ආරක්ෂාව සොයන්නේ, භාග්‍යවතුන් වහන්සේගේම පිහිට සොයන්නේ, භාග්‍යවතුන් වහන්සේගේම සරණ සොයන්නේ, ළඟට එළඹ, නිවාසනයෙක්හි හිඳ මෙසේ කීයः “මේ කුමක් භවත් ගෞතමයන් වහන්සේ මට කීසේක්ද? භවත් ගෞතමයන් වහන්සේ නැවතත් කියනසේක්වා.”

“අම්බට්ඨය, තෝ ඒ කුමකැයි හිතන්නෙහිද? කිම? වෘද්ධවූ මහළුවූ, ආචාර්ය ප්‍රාචාර්යවූ, බ්‍රාහ්මණයන් විසින් කණ්හායන ගොත්‍රිකයෝ කොතැන්සිට පැවැත්තෝද, කණ්හායනයන්ගේ මුල් පුරුෂයා කවරෙක්දැයි කියනු ලබන්නක් තා විසින් අසන ලදද?”

"භවත් ගෞතමයිනි, කණ්හායනයෝ මෙතැන් පටන් පැවතෙන්නෝය, අසුවලා කණ්හායනයන්ගේ මුල් පුරුෂයායි භවත් ගෞතමයන් වහන්සේ යම්ලෙස කීවේද එලෙසින්ම මාවිසින් අසන ලදී."

**22.** මෙසේ කී කල්හි ඒ තරුණයෝ "පින්වත්නි, අම්බට්ඨ තරුණයා වංශවත් නොවේ, අම්බට්ඨ තරුණයා පහත් ගති ඇති පුත්‍රයෙකි, අම්බට්ඨ තරුණයා ශාක්‍යයන්ගේ දාසියගේ පුත්‍රයාය. ශාක්‍යයෝ අම්බට්ඨ තරුණයාගේ ස්වාමිදරුවෝය. ධර්මවාදීවූ (ඇත්ත කියන්නාවූ) ශ්‍රමණ ගෞතමයන් වහන්සේ අපි විශ්වාස නොකොට යුත්තෙකු සේ සිතීමු"යි උස්හඬින් මහ හඬින් ශබ්දනගා කීහ.

**23.** එකල්හි භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතක් පහළ විය. 'ඉතා දරුණු සේ අම්බට්ඨ තරුණයාට මේ තරුණයෝ දාසි පුත්‍ර වාදයෙන් අවනම්බු කෙරෙත්. ඔහු එයින් මුදවන්නෙම් නම් යෙහෙකැ'යි කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ තරුණයන්ට මෙසේ කීයේය. "තෙපි අම්බට්ඨ තරුණයාට මෙසේ ඉතා දරුණු සේ දාසිපුත්‍ර වාදයෙන් අවනම්බු නොකරව්. ඒ කෘෂ්ණතෙම ශ්‍රේෂ්ඨවූ ඍෂිවරයෙක් වූයේය. ඒ ඍෂිතෙමේ දකුණු දේශයට ගොස් බ්‍රහ්ම (වේද) මන්ත්‍ර උගෙණ ඔක්කාක රජු වෙත පැමිණ මද්දරූපී නම්වූ දූ කුමරිය ඉල්වී. ඔක්කාක රජ තෙමේ 'බොල මේ කවරෙක්ද මාගේ දාසියගේ පුතා මද්දරූපී නම්වූ දූ කුමරිය ඉල්ලන්නේ යයි?' කිපුනේ, නොසතුටු වූයේ විදින්නට හීයක් යෙදූයේය. රජ තෙමේ ඒ හීය නිදහස් කරන්නට හෝ විදින්නට අසමර්ථවිය.

"තරුණයිනි, එකල ඇමතියෝත් පිරිසෙහිවූ සෙස්සෝත් කෘෂ්ණ ඍෂිවරයා වෙත එළඹ මෙසේ කීවාහුයඃ ස්වාමීනි, රජුට සැප වේවා (අනුරක් නොවේවා) 'ස්වාමීනි, රජුට සැප වේවා' කියායි.

"ඉතින් රජු පෘථිවියට හීය යවන්නේ නම් රජුට යහපතක් වන්නේය. යම්තාක් දුර රජුගේ රාජ්‍යයවේද ඒ තාක් පෘථිවිය පැළෙන්නේය."

"ස්වාමීනි රජුටත් ජනපදයටත් යහපතක් වේවා. ස්වාමීනි, රජුටත් ජනපදයටත් යහපතක් වේවා'යි

"ඉතින් රජතෙමේ හීය උඩට හරින්නේ නම් රජුට යහපතක් වන්නේය. යම්තාක් දුර රජුගේ රාජ්‍යයද ඒ තෙක් තැන් සත් අවුරුද්දක් වැසි නොවසින්නේය.'

"ස්වාමීනි, රජුටත් ජනපදයටත් යහපතක් වේවා වැසිද වසීවා.'

"රජුටත් ජනපදයටත් යහපතක් වන්නේය. වැසිද වසින්නේය. තවද (තමාගේ) වැඩිමහලු කුමාරයා කෙරෙහි නැගූ හීය විදීවා. ඔහුට මයිල් කෙලින් සිටීම පමණකුත් නොවී කුමාරතෙමේ සුවපත් වන්නේය.'

"තරුණයිනි, එකල අමාත්‍යයෝ ඔක්කාක රජුට මෙපවත් දැන්වූහ: 'ඔක්කාක රජතෙමේ ඒ යෙදූ හීය ජ්‍යෙෂ්ඨ කුමාරයාට විදීවා. මයිල් කෙලින් සිටීම පමණකුත් නොවී කුමාරයා සුවපත් වන්නේය.' ඉක්බිති ඔක්කාක රජු වැඩිමහලු කුමාරයා කෙරෙහි ඒ හීය යෙදුවේය. කුමාර තෙමේ සුවපත් විය, මයිල් ගසකට පවා හින්සාවක් නොවීය.

"ඉක්බිති ඔක්කාක රජ ඔහුට භයවී තැති ගැනීමට පැමිණ, මයිල් කෙලින් සිටීම ඇතිවී සාපයෙන් භයට පත්වූයේ මද්දරූපී නම්වූ දූ කුමරිය ඒ කෘෂ්ණ ඍෂිහට දුන්නේය තරුණයෙනි, තෙපි ඉතා දරුණු ලෙස අම්බට්ඨ මාණවකයාට දාසිපුත්‍ර වාදයෙන් නිග්‍රහ නොකරව්. ඒ කණ්හ තෙමේ ශ්‍රේෂ්ඨවූ ඍෂිවරයෙක් විය.

**24.** එවිට භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ තරුණයාට මෙසේ කීයේය. "අම්බට්ඨය, මේ කාරණා ගැණ කුමක් සිතන්නෙහිද? මේ ලොකයෙහි ක්ෂත්‍රිය කුමාරයෙක් බ්‍රාහ්මණ ස්ත්‍රියක් සමග සහවාසය කරන්නේය. ඔවුන්ගේ සංවාසයෙන් පුත්‍රයෙක් උපදින්නේය. ක්ෂත්‍රිය කුමාරයකු කරණකොට බ්‍රාහ්මණ කන්‍යාවගෙන් උපන් යම් ඒ පුත්‍රයෙක් වේ නම් ඔහු බ්‍රාහ්මණයන් අතුරෙන් අග්‍රාසනය හෝ අග්‍රොදකය හෝ ලබයිද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"භවත් ගෞතමයිනි, අග්‍රාසනයත්, අග්‍රෝදකයත් ලබයි."

"බ්‍රාහ්මණයෝ මතක, මංගල, යාග, පඬුරු ආදී බත් ඔහු වළඳන්නාහුද?"

"එසේය, භවත් ගෞතමයෙනි, වළඳවන්නාහුය."

"බ්‍රාහ්මණයෝ ඔහුට මන්ත්‍ර උගන්වත්ද? නොහොත් නොහදාරවන්නෝද?"

"භවත් ගෞතමයෙනි, උගන්වන්නෝය."

"ඔහුට බ්‍රාහ්මණ ස්ත්‍රියක් ලබාගත හැකිද? නැද්ද?"

"භවත් ගෞතමයෙනි, ඔහුට ලැබෙන්නේය."

"ක්ෂත්‍රියයෝ ඔහු ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක කරත්ද?"

"නැත, භවත් ගෞතමයෙනි."

"එයට හේතු කිම?"

"භවත් ගෞතමයිනි, මවුපසින් අසම්පූර්ණ හෙයිනි."

**25.** "අම්බට්ඨය, මේ ගැන තුඹ කුමක් සිතන්නෙහිද? මේ ලෝකයෙහි බ්‍රාහ්මණ කුමාරයෙක් ක්ෂත්‍රිය කන්‍යාවක හා සහවාසය කරන්නේය. ඔවුන්ගේ සහවාසය නිසා පුත්‍රයෙක් උපදින්නේය, බ්‍රාහ්මණ කුමාරයකු කරණකොට ක්ෂත්‍රිය කන්‍යාවකට උපන් යම් ඒ පුතෙක් වෙයි නම් හෙතෙම බ්‍රාහ්මණයන් අතරෙහි අග්‍රාසනය හෝ අග්‍රෝදකය ලබන්නේද?"

"භවත් ගෞතමයෙනි, ලබන්නේය."

"බ්‍රාහ්මණයෝ මතක, මංගල, යාග පඬුරු ආදී බත් ඔහු වළඳන්නාහුද?"

"භවත් ගෞතමයෙනි, වළඳවන්නාහුය."

"බ්‍රාහ්මණයෝ ඔහුට මන්ත්‍ර උගන්වන්නෝද? නොහොත් නූගන් වන්නෝද?"

"භවත් ගෞතමයෙනි, උගන්වන්නෝය."

"ඔහුට බ්‍රාහ්මණ කාන්තාවක් ලැබෙන්නේද? නොහොත් නොලැබෙන්නේද?"

"භවත් ගෞතමයෙනි, ලැබෙන්නේය."

"ක්ෂත්‍රියෝ ඔහු ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක කරත්ද?"

"නැත භවත් ගෞතමයෙනි,"

"එයට හේතුවකිම?"

"භවත් ගෞතමයෙනි, පියපසින් අසම්පූර්ණ හෙයිනි."

**26.** "මෙසේ, අම්බට්ඨය, (බ්‍රාහ්මණ) ස්ත්‍රියක් (ක්ෂත්‍රිය) පුරුෂයෙක් හා සහවාසවූවාද, (බ්‍රාහ්මණ) පුරුෂයෙක් (ක්ෂත්‍රිය) ස්ත්‍රියක් හා සහවාසවූයේද, ක්ෂත්‍රියයෝම උසස් වෙත්. බ්‍ර්මණයෝ හීනයහ.

"අම්බට්ඨය, මේ කාරණය ගැන කුමක් සිතෙන්නෙහිද? මෙහි බ්‍රාහ්මණයෝ යම් වරදක් නිසා බමුණකු හිසමුඩුකොට අමුඩයක් ගස්වා පහරදී රටින් හෝ නගරයෙන් හෝ පිට කරන්නාහුය. ඔහු බ්‍රාහ්මණයන් අතර අග්‍රාසනය හෝ අග්‍රොදකය හෝ ලබන්නේද?"

"නැත, භවත් ගෞතමයෙනි"

"බ්‍රාහ්මණයෝ මතක, මංගල, යාග, පඬුරු ආදී බත් ඔහු වළඳන්නෝද?"

"නැත, භවත් ගෞතමයෙනි."

"බ්‍රාහ්මණයෝ ඔහුට මන්ත්‍ර උගන්වන්නෝද? නොහොත් නූගන්වන්නෝද?"

"නූගන්වන්නෝය, භවත් ගෞතමයෙනි."

"ඔහුට, බ්‍රාහ්මණ ස්ත්‍රියක් ලැබෙන්නේද? නොහොත් නොලැබෙන්නේද?"

"නොලැබෙන්නේය, භවත් භවත් ගෞතමයෙනි"

**27.** "අම්බට්ඨය, මේ කාරණය ගැන කුමක් සිතන්නෙහිද? මෙහි ක්ෂත්‍රියයෝ යම් වරදක් නිසා ක්ෂත්‍රියයකු හිසමුඩු කොට හිසේ අළු වත්කොට රටින් හෝ නුවරින් හෝ පිට කරන්නාහුය. හෙතෙමේ බ්‍රාහ්මණයන් අතර අග්‍රාසනය හෝ අග්‍රෝදකය හෝ ලබන්නේද?"

"භවත් ගෞතමයෙනි, ලබන්නේය."

"බ්‍රාහ්මණයෝ මතක, මංගල, යාග, පඬුරු ආදී බත් ඔහුට වළඳවන්නෝද?"

"භවත් ගෞතමයෙනි, වළඳවන්නාහුය."

"බ්‍රාහ්මණයෝ ඔහුට මන්ත්‍ර උගන්වන්නෝද? නොහොත් නූගවන්නෝද?"

"භවත් ගෞතමයෙනි, උගන්වන්නෝය."

"ඔහුට බ්‍රාහ්මණ ස්ත්‍රියක් ලැබෙන්නේද? නොහොත් නොලැබෙන්නේද?"

"ලැබෙන්නේය; භවත් ගෞතමයෙනි."

"අම්බට්ඨය, ක්ෂත්‍රියයෝ යම් ක්ෂත්‍රියකු හිස මුඩුකොට හිසේ අළු වත්කොට රටින් හෝ නගරයෙන් හෝ පිට කරත්ද, මෙපමණකින්ම ඒ ක්ෂත්‍රිය තෙමේ ඉතා පහත් බවට පැමිණියේ වෙයි. අම්බට්ඨය, මෙසේ වූකලී ක්ෂත්‍රිය තෙමේ යම් කලෙක ඉතා පහත් බවට පැමිණියේ වෙයිද, එකල්හිත් ක්ෂත්‍රියයෝ උතුම්හ. බ්‍රාහ්මණයෝ පහත්ය.

**28.** "අම්බට්ඨය, සනංකුමාර නම් බ්‍රහ්මයා විසින්ද ගාථාවක් කියනලදී:-

"ලොකයේ ගොත්‍රයන් අතුරෙන් ක්ෂත්‍රියයෝ උතුම් වෙත්. දෙවියන් මිනිසුන් අතුරෙන් (විද්‍යාවෙන්) නුවණින් හා චරණයෙන්) සීලයෙන් සම්පූර්ණවූ තැනැත්තා ප්‍රධානයි."

"අම්බට්ඨය, සනංකුමාර නම් බ්‍රහ්මයා විසින් ඒ මේ ගාථාව හොඳාකාර කියන ලද්දීය. හොඳ නැති ලෙස කියන ලද්දී

නොවෙයි, හොඳින් ප්‍රකාශ කරණ ලද්දීය, නපුරු කොට ප්‍රකාශ කරණ ලද්දී නොවේ. එය අර්ථ සහිත වන්නීය. -අනර්ථ සහිත නොවන්නීය, මවිසින් අනුමත කරණ ලද්දීය. -අම්බට්ඨය මමත් මෙසේ කියමි:

"ලොකයේ ගොත්‍රයන් අතුරෙන් ක්ෂත්‍රියයෝ උතුම් වෙත්. දෙවියන් මිනිසුන් අතුරෙන් (විද්‍යාවෙන්) නුවණින් හා (චරණයෙන්) සීලයෙන් සම්පූර්ණවූ තැනැත්තා ප්‍රධානයි.'

**පළමු වැනි බණ වරයි.**

**29.** "භවත් ගෞතමයන් වහන්ස, ඒ (චරණ) සීල ධර්ම කවරේද? ඒ (විද්‍යාව) නුවණ කවරේද?"

"අම්බට්ඨය, අනුත්තරවූ විද්‍යාචරණ සම්පත්තියට ජාතිවාදය කියා හෝ ගෝත්‍ර වාදය කියා හෝ මාන්නවාදය කියා හෝ නොකියනු ලැබේ. නුඹ මට සුදුසුවෙයි කියා හෝ නුඹ මට සුදුසු නොවෙහි කියා හෝ යමක් එහි නැත අම්බට්ඨය, ස්ත්‍රියක් සරණපාවා ගැනීම හෝ සරණපාවාදීම හෝ පාවා ගැනීම් දීම් දෙකම හෝ වෙයිද එහි ජාතිවාදය හෝ කියාද, ගොත්තවාදය හෝ කියාද මාන්නවාදය හෝ කියාද ඇත්තේය, නුඹ මට සුදුසුවෙහි යන්නක් හෝ නුඹ මට සුදුසු නොවෙහි යන්නක් හෝ එහි ඇත, අම්බට්ඨය, යම් කෙනෙක් ජාති වාදයෙහි මහත්සේ බැඳුනෝ වෙත්ද, ගොත්‍රවාදයෙහි මහත්සේ බැඳුනෝ වෙත්ද, මාන්නවාදයෙහි මහත්සේ බැඳුනෝ වෙත්ද, ආවාහ විවාහයෙහි බැඳුනෝ වෙත්ද, ඔවුහු අනුත්තරවූ විද්‍යාචරණ සම්පත්තියෙන් දුරුවූවාහුය. අම්බට්ඨය, ජාතිවාදයෙහි තරව බැඳීමත්, ගොත්‍රවාදයෙහි තරව බැඳීමත්, මාන්න වාදයෙහි තරව බැඳීමත්, ආවාහ විවාහයෙහි තරව බැඳීමත්, පහකොට අනුත්තරවූ විද්‍යාචරණ සම්පත්තිය අවබොධ කිරීම වෙයි.

**30.** "භවත් ගෞතමයන් වහන්ස, ඒ (චරණ) සීලධර්මය කවරේද? ඒ (විද්‍යාව) නුවණ කවරේද?"

**31.** "අම්බට්ඨය, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනා ඥාන ආදී විද්‍යා අට සීලසංවරය ආදී හසුරුවන ධර්ම පහළොව යන

අෂ්ට විද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රේෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙවි මිනිසුන්ට ගුරුවරයෙක්වූ, (චතුරාර්ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්ම සතර අවබෝධකළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් සහ මිනිසුන් සහිතවූ, සත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැක පැහැදිලි කොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, අර්ථ සහිතවූ, දස ආකාරයෙන් නියම විදියට වචන ශබ්ද කරන්නාවූ ව්‍යඤ්ජන සහිත, සියලු ලෙසින් සම්පූර්ණවූ පිරිසිදුවූ, සියලු ශාසනමාර්ග බ්‍රහ්මචර්යාව ගෙන හැර දක්වති.

**32.** "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය. 'ගෘහවාසය පීඩා සහිතයි. රාගාදී කෙලෙස් සහිත මාර්ගයෙකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහි ගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්නට නොහැක්කේය. මම කෙස් දැලිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි' කියායි.

"ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාසිය හැර, ස්වල්පවූ හෝ බොහෝවූ නෑ පිරිස් හැර, කෙස් දැළි රැවුලු කපා දමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වේ. මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවර සීලයෙන් යුක්ත වූයේ, යහපත් හැසිරීමෙන් හා වරද නැති පැවැත්මෙන් යුක්ත වූයේ, ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භය දක්නා ගති ඇත්තෙක් වූයේ, යහපත් වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්තවූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි.

පිරිසිදුවූ ජීවිත පැවතුම් ඇත්තේ වෙයි. ශීලයෙන් යුක්ත වූයේ වෙයි. ඉන්ද්‍රිය විෂයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි. ආහාරයෙහි පමණ දන්නේ වෙයි. මනා සිහියෙන් හා හරි ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි. සන්තෝෂයෙන් යුක්තවෙයි.

33. "අම්බට්ඨය, භික්ෂුනමක් කෙසේ නම් සීලසම්පන්න වේද? අම්බට්ඨය, මේ සස්නෙහිවූ භික්ෂු නමක් ප්‍රාණවධය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද ආයුද ඇත්තේ. පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ කරුණාවන්තවූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතුව වාසය කෙරේ. මෙයද ඔහුගේ සීලයක්වේ. නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ දුන් දෙයම ගන්නේ. දුන් දෙයම කැමතිවන්නේ, සොරනොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේ. මෙයද ඔහුගේ සීලයෙකි. අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන්වූයේ බ්‍රහ්මචාරිවේ, මෙයද ඔහුගේ සීලයකි. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙයද ඔහුගේ සීලයෙකි. පිසුණු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද, මෙසේ භෙදවූවන් ගළපන්නේ සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මේද ඔහුගේ සීලයෙකි. ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, යම් වචනයක් නිදොස් වේද, කනට සැපද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රිය කරන්නේද, එබඳු වචනම කියන්නේ වේ. මෙයද ඔහුගේ එක් සීලයෙකි. හිස්වූ ප්‍රලාප කථාහැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, කාලයට සුදුසු කථා කරන්නේ,

සිදුවූ තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ. මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්මද දියුණුවට හේතුවන වචන කීමද, මෙයද ඔහුගේ සීලයෙකි.

"තණ, ගස්, වැල්, සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන කෑම ඇත්තේ, රාත්‍රි කෑමෙන් හා අවේලෙහි කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. අමුවූ ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේ අමු මස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනු ළමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද වේ. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොර වූයේ, එළුවන් හා තිරෙළුවන් පිළිගැනීමෙන් තොරවූයේ කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද, සම්පූර්ණයෙන් තොර වූයේය. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. ගනුදෙනු කිරීමය. තරාදි ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මිශ්‍ර වඤ්චා කිරීමය, වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයෝගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය, යන

මෙයින්ද සම්පූර්ණයෙන් වැළැක්කේය, මෙයද ඔහුගේ සීලය වේ.

34. "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මූලබීජය, ඛන්ධබීජය, ඵළුබීජය, දලුබීජය, පස්වැනිවූ බීජ බීජය යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්. මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේ නම් මෙයද ඔහුගේ එක් සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, නොඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛයාත වහන් දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත් කොට තබා ප්‍රයෝජන ගැන්මයයි කියන ලද පසුවට තබා ප්‍රයෝජන ගැන්මෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේ නම්, මෙද ඔහුගේ සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, වැඩක් නැති කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරැස් හෝ කළ බෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණ්ඩොවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනී ඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මීවුන් හා පොරය, ගවයින් හා පොරය, එළුපොරය, මෙණ්ඩක එළු පොරය, කුකුළුපොරය, වටුපොරය, දඬු (පොලු) පොරය, තොරතුරු ඇනීමය, මල්ලව යුද්ධය, යුද්ධය, ඇත් අස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත්. මෙසේ මෙබඳු විසුලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකේ නම් මෙයද ඔහුගේ සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙනලද කෑම කා (දූ පෝරු ආදියෙහි කෙළිම්වූ) ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ

පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම් මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරිමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටම්ටි ගසා ඇත් අස් ආදී රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, නලා පිඹීමය, ක්‍රීඩා නගුල් ගෙන සෙල්ලම් සීසෑමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන් ගුරුවා තනා ක්‍රීඩාකිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැණ කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය. ඒ ඒ දොෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

35. "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දිග්හඟලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇතිරිය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළුලොම් සුදු ඇතිරිය, එළුලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදී රූපයෙන් විසිතුරු එළුලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති ඇතිරිය, දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය, රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එකවිට නැට්ටුක්කාරියන් දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරන ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබන ලද රතුපාට කොට්ට ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කෙරෙත්. මෙසේ මෙබඳුවූ උස් අසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, මූනබලන කන්නාඩි, අඳුන් තෙල් පාවිච්චිය හා සුවඳ, මූණේ ගානා සුවඳ කුඩු, මූනේ ගානා සුවඳ ද්‍රව්‍ය, අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය,

විසිතුරු දඬුගෙන හැසිරීමය, බෙහෙත් නල එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙනයෑම විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය, නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය, දික්වූ දහවලු ඇති සුදුරෙදි ඇඳීමයයි මෙසේවූ සැරසීම් හා අඩුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්ද මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**36.** "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය, මහ ඇමතියන් පිළිබඳ කථාය, සේනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය, මාලා පිළිබඳ කථාය, ගන්ධ ද්‍රව්‍යයන් පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි දරුවන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ තේරුම් නැති කථාය, ලොකය පිළිබඳ කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**37.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි.' 'ඔබ මේ ධර්මවිනය කුමකැයි දන්නෙහිද? ඔබ වරදවා පිළිපදින්නෙහිය, මම මනාකොට පිළිපදින්නේ වෙමි.' මාගේ වචන යහපත්ය හෝ අර්ථ සහිතය, ඔබගේ වචන අර්ථ රහිතය' 'පළමු කිය යුත්ත පසුව කීයෙහිය පසුව කිය යුත්ත පළමුව කීයෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල නිෂ්ඵල විය. ඔබට වාදාරොපනය කරණ ලදී.

නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව' යන ආදී දොෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්ද මෙසේ මෙබඳු දොෂාරොපණ කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**38.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා, කුහකයෝද, සිවුපසය උදෙසා කථාකරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන් කරන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද ලාභයකින් ලාභයක් සොයන්නෝද වෙත්. මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග ආදියෙන් වැළැක්මක් වේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි."

**39.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, හෙනගැසීම ආදී මහ නිමිතිබලා කියන ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන ශාස්ත්‍රය, ගිනිදෙවියා පිදීමය, දබ්බිහොමය, ථුස හොමය, තණ්ඩුල හොමය, කණ හොමය, සප්පි හොමය, තෙල හොමය, මුඛ හොමය, ලේ හොමය, ශරීර විද්‍යා. වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි සාන්ති කරන්නාවූ විද්‍යා, භූත විද්‍යා, නාග විද්‍යා, විෂ විද්‍යා, ගෝනුසු විද්‍යා, මී විද්‍යා, කුරුලු විද්‍යා, කපුටු විද්‍යා, ජීවිත කාලය කීම, ආයුධ වැළැක්ම, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා හේතුකොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු පහත් විද්‍යා හේතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**40.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මිණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය දණ්ඩ, ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය ස්ත්‍රී ලක්ෂණය, පුරිස ලක්ෂණය, පිරිමි දරු ලක්ෂණය, ගෑණුදරු ලක්ෂණය, දාස ලක්ෂණය, දාසිලක්ෂණය, ඇත් ලක්ෂණය, අශ්ව ලක්ෂණය, කැස්බෑ ලක්ෂණය, එළු ලක්ෂණය, මීහරක් ලක්ෂණය

ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය, කුකුළු ලක්ෂණය, වටු ලක්ෂණය, තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය මුව ලක්ෂණයයි, මෙබඳු පහත් විද්‍යාවන් කරණ කොට ගෙන වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**41.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැර යෑම වන්නේය. අසවල් දින ඇතුළු නුවරට එන්නේය. අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හේතුකොට ලාමක ජීවිකා කෙරෙත් මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයක් වේ.

**42.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා 'චන්ද්‍රග්‍රහණය වන්නේය, සූර්යග්‍රහණය වන්නේය. තාරකා සමාගමය වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමග යෑම වන්නේය, තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය, තාරකාවන්ගේ නොමග යෑම වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළව කම්පාව වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම හා බැහීමද කෙළෙසීමද පිරිසිදු වීමද වන්නේය, චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය. සූර්යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය, චන්ද්‍ර සූර්යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇති වන්නේය,

ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇති වන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය. තාරකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය, දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම මෙබඳු විපාක ඇතිවන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටු වීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇතිවන්නේයයි' කියා මෙසේ පහත් විද්‍යා හේතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හේතුකොට ගෙණ කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයකි.

**43.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය, යහපත් ආහාරපාන ඇතිවන්නේය, ආහාර පාන නැති වන්නේය, නිර්භය ඇතිවන්නේය, භය ඇතිවන්නේය, රොග ඇතිවන්නේය, නිරෝගි බව ඇතිවන්නේයයි' කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන්කිරීමය කොටස්කර ගණන් කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණකොට වැරදි ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හෙතුවෙන් වන වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයකි.

**44.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථාකිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇති කිරීමය දුර්ගර්භ කරණය, ගර්භවිරොධි කරණය, දිව් තද කිරීමය, නූල් බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්න ඇසීමය, ගෑනුදරුවන්ගේ ශරීරයෙහි දෙවතාරෝපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණය කොට ප්‍රශ්න ඇසීමය, හිරු වැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම් කිරීමය, කටින් ගිනිදැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි

කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයකි.

**45.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීම, කාර්යය සමෘද්ධි කටයුතු කර්මය, මන්ත්‍ර කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මූන සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩුකය විරේකය, යටිකය විරේකය, හිස විරේකය, කන්තෙලය, ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍ය කිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකමය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකම්ය, මූලික බෙහෙත් දීමය, සැර බෙහෙත්දී පසුව එහි බල හැරීමය කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට වැරදි ජීවත්වීමෙන් ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්මක්නම් මෙයද ඔහුගේ එක් සීලයකි.

**46.** "අම්බට්ඨය, මෙසේ ශීල සම්පන්නවූ භික්ෂුහට භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතු කොට ගෙණ කිසි තැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:- අම්බට්ඨය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම, අම්බට්ඨය, සීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය. ආර්යවූ (උතුම්වූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂු තෙම, තමන් තුළ පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි අම්බට්ඨය, මෙසේ දැක්වූ සීලයෙන් යුක්තවූ භික්ෂුව සීලසම්පන්න නම් වේ.

**47.** "අම්බට්ඨය, භික්ෂුව කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේද? අම්බට්ඨය, මේ සස්නෙහි භික්ෂු තෙමේ,

ඇසින් රූපයක් දැක එහි නො ඇලේ එහි නොපෙළඹෙන්නේය. ඇස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ ඇස් ඉන්ද්‍රියය රකී, ඇස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. කන් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ කන් ඉන්ද්‍රියය රකී. කන් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. නාසයට ගඳ සුවඳ දැනී එහි නො ඇලේ. එහි නොපෙළඹෙන්නේය. නාස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ නාස් ඉන්ද්‍රියය රකී. නාස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ එහි නො ඇලේ. එහි නොපෙළඹෙන්නේය. දිව් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ දිව් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ ස්පර්ශ ඉන්ද්‍රියය රකී. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. සිතින් (ධර්මයක්) අරමුණක් දැන එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. සිත් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් නිසා දැඩි ආසාව හා කලකිරීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. හෙතෙම සිත් ඉන්ද්‍රිය රකී. සිත් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ භික්ෂුව උතුම්වූ සීල රාශියෙන් යුක්තවූයේ අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ අධිචිත්ත සැපය විඳියි. අම්බට්ඨය, මෙසේවූ භික්ෂු තෙමේ ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තේ වේ.

**48.** "අම්බට්ඨය, භික්ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද?

"අම්බට්ඨය, මේ සස්නෙහි භික්ෂුතෙම ඉදිරියට යෑමෙහිද, ආපසු යාමෙහිද, නුවණින් දැන කරන්නේය. ඉදිරි බැලීමෙහිද, වටපිට බැලීමෙහිද නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහිද, දිගු කිරීමෙහිද, මනා නුවණින් දැන එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන එසේ කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, වැළඳීමය, රස විඳීමය යන මෙහිද මනා නුවණින් යෙදී එසේ කරන්නේය. මල මුත්‍ර පහකිරීමද නුවණින් (ආදිනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්දව සිටීම යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. අම්බට්ඨය, මෙසේ කරන්නාවූ භික්ෂු තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි.

**49.** "අම්බට්ඨය, භික්ෂු තෙමේ කෙසේ සතුටු වූයේ වේද?

"අම්බට්ඨය, භික්ෂු තෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, ආරක්ෂාව ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු සිත් ඇත්තේවේ. ඔහු යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳවූ දේ) පමණක් ගෙන යයි. අම්බට්ඨය, යම් සේ පක්ෂියෙක් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, අම්බට්ඨය, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය ආරක්ෂාවට ප්‍රමාණවූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු වන්නේ වේ. ඔහු යම් තැනක යා නම් අටපිරිකර පමණක් රැගෙණ බැහැර යයි. අම්බට්ඨය, මෙසේවූ භික්ෂු තෙමේ සන්තෝෂයෙන් යුක්ත වේ.

**50.** "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, මේ උතුම්වූ සන්තෝෂයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, කඳු පලාත්ද, කඳුරැලි ගල්ගුහාවන් හෝ

මහා මගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ ඉඩකඩ ඇති තැන් සහ වන ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළැක්කේ. පර්යංකය බැඳ කකුල් අකුලුවා හිඳ ශරීරයේ උඩු කොටස කෙලින් තබා නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවාගෙණ හිඳී.

**51.** "ඔහු ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභ සිත වෙන් කොට පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව පණඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වාසයකරයි. ක්‍රොධ දොෂයෙන් වෙන්ව සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේ. අලස බව දුරුකොට සිත පිරිසිදු කෙරේ. උඩගු බව හා කුකුස දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, සිත උඩගු බව හා කුකුසෙන් පිරිසිදු කෙරේ. විචිකිච්ඡාව (සැකය) දුරුකොට, පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේ, විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

**52.** "අම්බට්ඨය, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්තයන්හි යොදන්නේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණුවන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් ආරක්ෂා කරණ පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඕහට මෙබඳු අදහසක් ඇතිවේ. 'මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹු දරුවන් පොෂ්‍ය කිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය, කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

**53.** "අම්බට්ඨය, යම්සේ රෝගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේද, ඕහට ආහාර රුචි

නොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීර බලය ඇතිවන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳුද යත්: 'මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන් බව ඇති කෙනෙක් වීමි. මට බත් රුචියද නොවීය, ශරීර බලයද නැතිවිය, ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය. කාය බලයද තිබේය' කියායි. ඔහු ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසටද පැමිණෙන්නේය.

**54.** "අම්බට්ඨය, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසු කලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය. සතුටට පැමිණෙන්නේය.

**55.** "අම්බට්ඨය, යම් සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත්වූ, තමා කැමති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි, වැඩකරුවෙක් වන්නේද, ඔහු පසු කලක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර සිය කැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපති කොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත්නූන කෙනෙක් වීමි. අනුන්ට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යා හැක්කේද වෙමි'යි කියායි. ඔහු ඒ දාසභාවයෙන් මිදීම

හේතුකොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

**56.** "අම්බට්ඨය, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේද, ඔහු මද කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොර සතුරන්ගෙන් පීඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්: 'මම පෙර ධනවත් වූයෙමි. භොග සම්පත් සහිත වූයෙමි, දුර්ලභ භික්ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණියෙක් වූයෙමි. එසේවූ මම දැන් එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගය එතර කිරීම නිමිති, කොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සතුටටද පැමිණෙන්නේය.

**57.** "අම්බට්ඨය, ණය යම්සේද, රෝගය යම්සේද, හිරගේ යම්සේද, දාසභාවය යම්සේද, දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂු තෙමේ පහනොකළ (පඤ්ච නීවරණ) කුසල් වළක්වන කරුණුපහ තමා කෙරෙහි ලා නුවණින් දකීද. අම්බට්ඨය, ණය නැති බව යම්සේද, නිරෝගී බව යම්සේද, සිරගෙන් මිදීම යම්සේද, අනුන්ට යටහත් නැති බව යම්සේද, භය නැති භූමිය යම්සේද, එපරිද්දෙන්ම අම්බට්ඨය, භික්ෂු තෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ ලා දක්නේය.

**58.** "පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ භික්ෂුහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසහගත සිත් ඇත්තහුගේ නාම කය (වේදනාදී ස්කන්ධ හතර) සංසිඳෙයි සංසිඳිනු කය ඇති තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) පැමිණෙයි.

**59.** "ඒ භික්ෂු තෙමේ වස්තුකාම ක්ලෙශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන්ද වෙන් වූයේම අරමුණෙහි

සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම සහිතවූ, සිතෙහි විවේකයෙන් උපන් ප්‍රීතියම සැපකොට ඇති, පළමුවෙනි ධ්‍යාන කුසල චිත්තය තමා තුළ ඉපදීම් වශයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරේද ඔහු විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ (සකල) ශරීරයම සැපවත් කෙරෙයි. සම්පූර්ණයෙන් පුරවයි. සැමතන්හි පතුරවයි. ඒ ඔහුගේ පළමුවෙනි විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන් සකල ශරීරයෙහිම පළමුවෙහිම පළමුවෙනි ධ්‍යානයෙන් යුත් සැපය පැතිරෙයි.

**60.** "අම්බට්ඨය, යම්සේ දක්ෂවූ ස්නාන ද්‍රව්‍ය සපයන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ ස්නානයට ගන්නාවූ සුණු ලොහ තලියක බහා දිය ඉසිමින් අතින් අනමින් පිඩු කරන්නේද, එවිට ඒ මේ ස්නාන කුඩුගුලිය දියෙන් යුක්ත වේ, ජලය හාත්පසින් කාවැදුනේ වේ. එහි ඇතුළත හා පිටතද සියලු තන්හිම ජලයෙන් පහස්නා ලද්දේ වේ. එහෙත් බින්දු වශයෙන් ජලය ඉන් නොවැගිරේද,

"අම්බට්ඨය, එපරිද්දෙන් ඒ භික්ෂු තෙමේ, විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි, හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, සැමතන්හි පතුරුවයි. ඔහුගේ සියලු ශරීරයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් පැතිරෙයි. අම්බට්ඨය, මෙයද මේ ආත්මයෙහි දැක්කයුතු විපාක ඇති ඵලයකි. මෙය ඉහතකී මේ ආත්ම භාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා බොහෝ මනොඥය, බොහෝ ශ්‍රෙෂ්ඨද වෙයි.

**61.** "අම්බට්ඨය, නැවතද භික්ෂු තෙමේ අරමුණෙහිසිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම යන මොවුන්ගේ සන්සිඳීමෙන් අද්ධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති දෙවැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කරයි. ඒ මහණ තෙමේ මේ කය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි. හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කරයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි දෙවැනි ධ්‍යානයෙන් සැප පැතිරේ.

**62.** "අම්බට්ඨය, යම්සේ ඇතුළතම හටගත් ජලය ඇති දියවිලක් වේද ඒ විල පිළිබඳ පෙර දිගින්ද, අපරදිගින්ද, උතුරු දිගින්ද, දකුණු දිගින්ද, දිය එන මගක් නැත්තේ වේද වැස්සද කලින් කල මනාසේ වැසි වැසීම නොකරන්නේද, එසේවූ ඒ විලෙන් සිහිල් දිය දහර පොළොව බිඳ නැගී ඒ මුළු විලම සිහිල් දියෙන් පතුරුවයි, හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි. එහි හැම තැන දියෙන් ස්පර්ශ කෙරෙයි. ඒ සියලු විලෙහි සීත ජලය නොපැතිර පවත්නා තැනක් නම් නැත්තේය. අම්බට්ඨය, එපරිද්දෙන් මේ භික්ෂු තෙමේ මේ මුළු ශරීරයම සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් සියලු තැන පතුරුවන ලද්දක් කෙරේ, ප්‍රීති සැපයෙන් හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, ඉන් සැම තැනම ස්පර්ශශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි දෙවෙනි ධ්‍යාන සැපයෙන් පැතිරෙයි.

මෙයද ඔහුගේ සීල ආදියෙහි වන්නකි.

**63.** "නැවතද අම්බට්ඨය, ඒ භික්ෂු තෙමේ ප්‍රීතියෙහි නොඇල්මෙන් මැදහත් බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (උපෙක්ෂා) සැප දුක් දෙකට මැදහත් විඳීම ඇත්තේය, සිහි ඇත්තේය. සැපයෙන් විසීම ඇත්තේයයි ආර්යයෝ කියත්ද ඒ තුන්වැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ භික්ෂු තෙමේ මේ සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේ. ඒ සැපතින් හාත්පසින් තෙමෙයි, සම්පූර්ණයෙන් පුරවයි, එයින් සැමතැනම පැතිරෙයි. ඒ භික්ෂුහුගේ සියලු ශරීරයෙහි තුන්වැනි ධ්‍යාන සැපයෙන් පැතිරෙයි.

**64.** "අම්බට්ඨය, යම්සේ නිල්මානෙල් විලක හෝ සුදු නෙළුම් විලක හෝ රතු නෙළුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුනු දියෙන් උඩට නොනැගුනු, දියතුලම ගැලී වැඩෙන්නාවූ සමහර නිල් මානෙල් හෝ සමහර සුදු නෙළුම් හෝ සමහර රත් නෙළුම් හෝ වෙද්ද, ඒ නිල් මානෙල් ආදීහු අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, සම්පූර්ණයෙන් වැගුරුණාහු, හාත්පසින් ස්පර්ශ ලද්දාහු වෙත්ද,

ඒ නිල්මානෙල් සුදු නෙළුම් රත් නෙළුම්, යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් නො පහස්නා ලද්දේ නොවේද අම්බට්ඨය, එපරිද්දෙන් ඒ භික්ෂුතෙමේ මේ මුළු ශරීරයම දුරුකළ ප්‍රීතිය ඇති සැපයෙන් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරෙයි, ඉන් හාත්පසින් තෙමෙයි, සම්පූර්ණයෙන් පුරවයි. හාත් පසින් ස්පර්ශ කෙරෙයි. ඔහුගේ සම්පූර්ණ ශරීරයෙහි ප්‍රීති නැති තුන්වැනි ධ්‍යානයෙන් පැතිරයයි.

මෙයද ඔහුගේ සීල ආදියෙහි වන්නකි,

**65.** "නැවතද අම්බට්ඨය, ඒ මහණතෙමේ සැප දුරුකිරීමෙන්, දුක් දුරු කිරීමෙන්ද පළමුකොටම සැප දුක් වේදනා නැතිව යාමෙන් දුක්ද නොවූ, සැපද නොවූ, උපෙක්ඛා-සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, හතරවෙනි ධ්‍යාන (කුසල) චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම, පිරිසිදුවූ, අතිශයින් බබලන (ධ්‍යාන) සිතින් පතුරුවන්නේය. ඒ ධ්‍යානලාභී භික්ෂුහුගේ සම්පූර්ණ ශරීරයෙහි පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ හතරවැනි ධ්‍යාන සිතින් පැතිරයයි.

"අම්බට්ඨය, යම්සේ කිසියම් පුරුෂයෙක් පිරිසිදුවූ සුදු ඇඳුමකින් හිස සිට පොරවා උන්නේ වේද, ඔහුගේ මුලු ශරීරයෙහි එකම තැනකුදු සුදුවතින් නො වසන ලද්දේ නොවේ. අම්බට්ඨය, එපරිද්දෙන්ම ධ්‍යානලාභී භික්ෂු තෙමේ මේ සියලු ශරීරයම පිරිසිදුවූ, අතිශයින්ම බබලන්නාවූ හතර වැනි ධ්‍යාන සිතින් පතුරවා හුන්නේ වේ. ඒ භික්ෂුහුගේ සියලු ශරීරයෙහි පිරිසිදුවූ, බබලන්නාවූ හතර වැනි ධ්‍යාන සිතින් පැතිරයයි. (සතර වැනි ධ්‍යාන චිත්තයෙන් සකල ශරීරයම පතුරුවන ලද්දේය කී සේයි.)

මෙයද ඔහුගේ සීල ආදියෙහි වන්නකි. අම්බට්ඨය මේ ඔහුගේ සීල ආදියයි.

**66.** "නැවතද, අම්බට්ඨය, ඒ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට සුදුසුව සිටි

කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි. ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඔහු මෙසේ දැනගණී. 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තය. *සතර මහාභූතයන්ගේ හේතුවෙන් හටගත්තේය. මව්පියන් නිසා හටගත්තේය. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඇඟ ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ, ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඥ්ඤාණය ශරීරය ආශ්‍රය කෙරේ. මෙහිම බැඳුනේ වෙයි' කියායි.

**67.** "අම්බට්ඨය, යම්සේ යහපත්වූ, පිරිසිදු ආකාරයෙන් උපන්නාවූ අටැස්වූ, ගල් ආදී දොස් බැහැර කිරීමෙන් හොඳ ලෙස සකස් කරණ ලද්දාවූ, නිර්මලවූ විශේෂයෙන් ප්‍රසන්නවූ, කැලැල් නැතිවූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෛඩූර්ය මැණිකක් වේද, එහි නිල්වූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේද, ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේය: 'මේ වෛඩූර්ය මැණික මනාසේ කාන්තිත් හෙයින් යහපත් වේ, පිරිසිදු ආකරයෙන් උපන්නේය, අටැස් ඇත්තේය, දොස් දුරුකිරීමෙන් මනාකොට සකස් කරණ ලද්දේය, නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, කැලැල් නැත, සියලු ආකාරයෙන් සම්පූර්ණය. ඒ මැණිකෙහි මේ නීලවර්ණවූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේය, කියායි.

"අම්බට්ඨය, එපරිද්දෙන්ම යෝගීවූ මේ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, පහවූ ක්ලෙෂයන් ඇතිවූ කල්හි මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස සිත එලවා තබයි, ඒ සඳහා විශෙෂයෙන් සිත නමයි. ඒ භික්ෂු තෙමේ මෙසේ දන්නේය, කෙසේද යත්: 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තවේ. සතර මහා භූතයන්ගෙන් හටගත්තේය, මව්පියන් නිසා

* පස, ජලය, ගින්න, හුළඟ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හටගත්තේය, ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඥ්ඤාණය මේ ශරීරය ආශ්‍රය කෙළේ වෙයි, මෙහිම බැඳී සිටියේය' කියායි.

මෙයද ඔහුගේ සීලාදියෙහි වන්නකි.

**68.** "ඔහු මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ රූපයක් මනා කොට නිපදවීම පිණිස සිත එලවා තබයි, වෙසෙසින් නමයි. ඔහු ආකාර වත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවන ලද) ශරීරය හා අත පය ආදී අවයව ඇති, විකලනුවූ ඉඳුරන් ඇති, මේ ශරීරයෙන් අන්‍යවූ ශරීරයක් හොඳ ලෙස සාදයි.

**69.** "අම්බට්ඨය, යම්සේ පුරුෂයෙක් මුදු තණ ගසින් තණබඩය උදුරා ගැනීම කරන්නේද, මේ තණ ගසය, මේ තණ බඩය, තණගස අනිකෙක, තණ බඩය අනිකෙක තණ ගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය, තනන ලද්දේය යන වැටහීම ඕහට පහල වන්නේය.

"අම්බට්ඨය, යම්සේ පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේද ඔහුට මෙබඳු අදහසක් වන්නේය. මේ කඩුවය, මේ කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන් කඩුව ඉවත්කරණ ලද්දේය' කියායි.

"අම්බට්ඨය, එසේම භික්ෂුතෙමේ මෙසේ සිත සමාධිගතවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සිතින් උපදවන කය මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට ඊට නමයි. ඔහු මේ කයින් රූ ඇති, සිතින් මවන ලද, සියලු ශරීරය සහ අතපය ආදී අවයව ඇති, නොපිරිහුනු ඉන්ද්‍රිය ඇති වෙන කයක් මවයි.

මෙයද ඔහුගේ සීලාදියෙහි වන්නකි.

**70.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, නැවතීමට පැමිණි කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි. එකෙක්ව බොහෝ සේ වෙයි. බොහෝ සේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට පර්වතය හරහට නොහැපෙමින් යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පරියන්කයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹ ලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වයි.

**71.** "අම්බට්ඨය, දක්ෂ කුඹල් කරුවෙක් හෝ කුඹල්කරු අතවැසියෙක් හෝ යහපත්සේ පදම් කළ මැටියෙන් කැමති කැමති වලන් ආදී වර්ගයන් යම්සේ කරන්නේද, නිපදවන්නේද, අම්බට්ඨය, දළ කැටයම් කරුවෙක් හෝ අතවැසියෙක් හෝ සකස්කළ දළයෙහි යම්සේ කැමති කැමති දළ කැටයම් වර්ගයක් කරන්නේද, නිපදවන්නේද, අම්බට්ඨය, දක්ෂ රන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ පදම්කළ රණින් කැමති කැමති රන් අබරණ ජාතීන් යම්සේ කරන්නේද, නිපදවන්නේද- අම්බට්ඨය, එසේම භික්ෂුව සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධි විධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් ඍද්ධි විධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි. එකෙක්ව බොහෝ සේ වෙයි, බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට අහසෙයි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වත

හරහට නොහැපෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කරයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව කෙරෙයි.

මෙයද ඔහුගේ විද්‍යාවෙහි වන්නෙකි.

72. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, දිව්‍ය කණ සම්බන්ධ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඒ භික්ෂුව පිරිසිදුවූ මිනිස් බව ඉක්මවූ දිව්‍ය කණ සම්බන්ධ ඥානයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද, දෙයාකාර ශබ්දයන් අසයි.

73. "අම්බට්ඨය, දික් මගට පැමිණි පුරුෂයෙක් බෙර හඬද, මහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද, යම්සේ අසාද, ඔහුට මේ බෙරහඬයයිද, මිහිඟු බෙර හඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬයයිද සිතෙන්නේය.

"අම්බට්ඨය, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇතිකල්හි, මෘදුවූකල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, ස්ථිරවූ බවට පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, දිව්‍ය කණෙන් ලබන ඥානය පිනිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. ඔහු මෙසේ මිනිස් කණ ඉක්මවූ පිරිසිදුවූ දිව්‍ය කණෙන් ලබන ඥානයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද දෙයාකාර ශබ්දයන් අසයි. මෙයද ඔහුගේ විද්‍යාවෙහි වූවකි.

74. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශ ඇති

කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුවූ කල්හි, ස්ථිර බවට පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පර සිත් දැනගන්නා ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තම සිතින් පිරිසිඳ දනියි. රාග සහිත සිත රාග සිතයයි දනියි. රාගය පහවූ සිත රාගයෙන් තොරවූ සිතයි දනියි. ද්වෙෂ සහිත සිත දොස සිතයයි දනියි ද්වෙෂය පහවූ සිත ද්වෙෂයෙන් තොරවූ සිතයයි දනියි. මොහ සහිත සිත මොහ සිතයයි දනියි, මොහය පහවූ සිත මොහයෙන් තොරවූ සිතයයිදනියි. හැකුලුනු සිත හැකුලුනු සිතයයි දනියි, විසුරුණු සිත විසුරුණු සිතයයි දනියි මහත් බවට ගිය සිත, මහත් බවට ගිය සිතයයි දනියි මහත් බවට නොගිය සිත, මහත් බවට නොගිය සිතයයි දනියි. කාම සහිත සිත, කාම සිතයයි දනියි. ලෞකික හිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනියි. සමාධිගතවූ සිත සමාධිගත සිතයයි දනියි, සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනියි, (ක්ලෙශයෙන්) මිදුනු සිත, මිදුනු සිතයයි දනියි. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දනියි.

**75.** "අම්බට්ඨය, සැරසෙන ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ලමාවයසෙහි සිටියෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු, නොකිළිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය භාජනයෙක්හි හෝ තමාගේ මූනේ ශොභාව පරීක්ෂා කරන්නේ යම්සේ කැලල් සහිත නම් කැලල් සහිතයයි දැනගනීද, කැලල් රහිත නම් කැලල් රහිතයයි දැනගනීද,

"අම්බට්ඨය, එසේම භික්ෂුතෙම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පරසිත් දැනගන්නා ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ, අන්‍ය පුත්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් දැන ගනියි. රාග සිත රාග සිතයයි දනියි. රාගයෙන් තොරවූ සිත රාගයෙන් තොරවූ සිතයයි දනියි. දොස සිත දොස සිතයයි දනියි. දොසයෙන්

තොරවූ සිත දොසයෙන් තොරවූ සිතයයි දනියි. මොහසිත මොහ සිතයයි දනියි, මොහයෙන් තොරවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුණු සිත හෝ විසුරුණු සිත හෝ මහත් බවට ගිය සිත හෝ මහත් බවට නොගිය සිත හෝ කාම සහිත සිත හෝ අනුත්තර සිත හෝ එකඟවූ සිත හෝ එකඟ නොවූ සිත හෝ දනියි. මිදුණු සිත හෝ මිදුණු සිතයයි දනියි. නොමිදුණු සිත හෝ නොමිදුණු සිතයයි දනියි.

මෙයද ඔහුගේ විද්‍යාවෙහි වූවෙකි.

**76.** "හේ තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙෂයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ, කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක්ද, දෙ ජාතියක්ද, තුන් ජාතියක්ද, හතර ජාතියක්ද, පස් ජාතියක්ද, දස ජාතියක්ද, විසි ජාතියක්ද, තිස් ජාතියක්ද, සතළිස් ජාතියක්ද, පණස් ජාතියක්ද, සියක් ජාතියක්ද, දහස් ජාතියක්ද, සියක්දහස් ජාතියක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි, අසුවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුත වූයෙමි, මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් විදියේ පෙර ජීවිත සිහි කෙරෙයි.

**77.** "අම්බට්ඨය, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් තමන්ගේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගමට එන්නේද, 'මම, සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. එගමිනිදු අසවල් ගමට ගියෙමි එහිද මෙසේ සිටියෙමි. මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට පැමිණියෙමි'යි හෙතෙම දන්නේය.

"අම්බට්ඨය, එපරිද්දෙන්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්තිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් පෙරවිසීම් සිහි කෙරෙයි. කෙසේදයත්ඃ එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද, නොයෙක් කල්ප විස්සකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්ප රාශියකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්පයන්ද, 'අසුවල් තැන වීමි, මෙබඳු නම් ඇත්තෙමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු පාට ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සැප දුක් වින්දෙමි, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු පාට ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සුව දුක් වින්දෙමි, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිත, පෙරවිසූ පිළිවෙළ දැක්වීම් සහිත, නොයෙක් ආකාරවූ පෙරවිසීම් සිහි කෙරෙයි.

මෙයද ඔහුගේ විද්‍යාවෙහි වූවෙකි.

78. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ

කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ මරණින් පසු උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ පිරිසුදුවූ, මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී, පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොව ගියාවූද නරකලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී. 'මේ පින්වත් සත්ත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය, වචන දුශ්චරිතයෙන් යුක්තය, හිතේ දුශ්චරිතයෙන් යුක්තය උත්තමයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ, නිරයට පැමිණෙත්. නැතහොත්, මේ පින්වත් සත්ත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබණින්නේය, සතය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. මරණින් මතු යහපත් පැමිණිමවූ, ස්වර්ග ලොකයට පැමිණියෝය,යි මෙසේ පිරිසුදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද, හොඳලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

**79.** "අම්බට්ඨය, යම්සේ පාරේ හන්දියක ප්‍රාසාදයක් වේද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට ඇතුල්වෙන, ගෙයින් නික්මෙන, වීථියෙහි හැසිරෙණ පාර හන්දියේ හිඳින මනුෂ්‍යයන් දක්නේද, ඔහුට මෙසේ සිතෙයි: 'මේ මිනිස්සු ගෙට ඇතුළු වෙති, මොහු නික්මෙති, මොහු වීථියෙහි හැසිරෙති, මොහු පාර හන්දියේ ඉඳිති'යි කියායි. මහරජ, එසේම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, සිත ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳලොව

ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී: මේ පින්වත් සත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය, වචන දුශ්චරිතයෙන් යුක්තය, හිතේ දුශ්චරිතයෙන් යුක්තය' උත්තමයින්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු ශරීරයෙන් වෙන්ව, මරණින් මතු අපායවූ දුගීතියවූ, දුකවූ, නිරයට පැමිණෙත්.' නැතහොත්, මේ පින්වත් සත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබනින්නෝය, සත්‍යය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. ශරීරයෙන් වෙන්ව මරණින් මතු සුගතියවූ, ස්වර්ග ලෝකයට පැමිණියෝ'යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී: පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද සුගතියට පැමිණියාවූද දුර්ගතියට පැමිණියාවූද කර්මයලෙස පැමිණි සත්ත්වයන් දනී.

මෙයද ඔහුගේ විද්‍යාවෙහි වූවෙකි.

**80.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන භාවයට පැමිණි කල්හි, හිතේ පැසවන කෙලෙස් පහකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි ඔහු මේ දුකයයි තතුලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හේතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී, මේ පැසවන කෙලෙස්යයි තතු ලෙස දැනගණී. මේ පැසවන ක්ලේශයන්ගේ හේතුයයි තතු ලෙස දැනගණී, මේ ඒ කෙලෙස් නැතිකිරීමයයි තතු ලෙස දැනගනී. මේ ඒ කෙළෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගනී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන්, කෙරෙන්ද මිදේ, සංසාරයට (භවයට) ඇති ආශාවන් කෙරෙන්ද සිත මිදේ. දැඩි මෝහය කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත

වෙයි. ඉපදීම නැතිවිය. උතුම් හැසිරීමෙහි වසන ලදී, කටයුත්ත කරණලදී, මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ'යි ද දැනගණී.

81. "අම්බට්ඨය, යම්සේ පර්වත මුදුනක පිරිසිදු, සිත් සතුටු කරන නොකැළඹුනු, දිය විලක් වේද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ නැවතී තිබෙන්නාවූ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන්ද, කැබලිති කැටද, එහා මෙහා යන්නාවූ මසුන් රැන්ද, දක්නේද, ඔහුට මෙසේ සිතෙන්නේයඃ මේ දිය විල පිරිසිදුය මනා සිත් ප්‍රිය කරන්නේය, නොකැළඹුනේය. එහි මේ සිප්පි බෙල්ලන් සක් බෙල්ලන්ද, කැටකැබලිතිද, නැවතී තිබේ. මසුන් රැන් හැසිරෙත්ය' කියායි අම්බට්ඨය, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, බොහෝ කල් සිට එන ක්ලෙශයන් නැතිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක්නැතිකිරීමේ මාර්ගයයි තතුලෙස දැනගනී. මේ කෙලෙස් යයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් හේතුයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ. භවයට ඇති ආශාවන් කෙරෙන්ද මිදේ, මෝහය කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැති විය, උතුම් හැසිරීමෙහි වසනලදී, කටයුත්ත කරනලදී. මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ'යිද දැනගණී.

අම්බට්ඨය, මේ ඔහුගේ විද්‍යාව වේ.

"අම්බට්ඨය, මේ භික්ෂු තෙමේ විද්‍යාවෙන් (නුවණින්) සම්පූර්ණයයි කියනු ලැබේ. එසේම චරණයෙන් (සීලාදියෙන්)

සම්පූර්ණයයිද එසේම විද්‍යාවෙන් හා චරණයෙන් සම්පූර්ණයයිද කියනු ලැබේ. අම්බට්ඨය, මේ විද්‍යාසම්පත්තියට හා චරණ සම්පත්තියට වඩා උතුම් හෝ මිහිරි හෝ අන් විද්‍යා සම්පත්තියක්ද චරණ සම්පත්තියක්ද නැත්තේය.

82. "අම්බට්ඨය ඉතා උතුම්වූ මේ විද්‍යාචරණ සම්පත්තියට විනාශ දොරටු සතරක් වෙත්. කවර සතරක්ද? අම්බට්ඨය, මෙහි ඇතැම් මහණෙක් හෝ බ්‍රාහ්මණයෙක් මේ ඉතා උතුම් විද්‍යාචරණ සම්පදාවට නොපැමිණෙනුයේ, තපස් පිරිකර ආදිය ගෙණ ගස්වලින් වැටුණු ගෙඩිම කන්නෙක් වන්නෙමි'යි ආරණ්‍යයෙහි වනයකට පැමිණෙයි. හෙතෙම ඒකාන්තයෙන් විද්‍යාචරණධර්මයෙන් යුක්තවූවහුගේ සේවය (වතාවත්) කරන්නෙක්ම බවට පැමිණේ. අම්බට්ඨය, ඉතා උතුම් විද්‍යාචරණ සම්පදායෙහි මේ පළමුවන විනාශ දොරටුව වේ.

83. "අම්බට්ඨය, නැවතද මෙහි ඇතැම් මහණෙක් හෝ බ්‍රාහ්මණයෙක් ඉතා උතුම්වූම මේ විද්‍යාචරණසම්පදාවට නොපැමිණෙනුයේ, ගස්වලින් වැටුණු ගෙඩිම භුක්තිවිඳීමටද නොපැමිණෙනුයේ, උදැල්ලක් හා කූඩයක් ගෙණ 'අල මුල් ගෙඩි කෑම කරන්නෙක් වන්නෙමි'යි අරණ්‍යයෙහි වන මැදට පැමිණෙයි. හෙතෙම ඒකාන්තයෙන් විද්‍යාචරණ ධර්මයෙන් යුක්ත වූවක්හුගේ මෙහෙකරු බවටම පැමිණේ. අම්බට්ඨය, ඉතා උතුම් මේ විද්‍යාචරණසම්පදායෙහි මේ දෙවෙනිවූ විනාශ දොරටුව වේ.

84. "අම්බට්ඨය, නැවතද මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් ඉතා උතුම්වූ මේ විද්‍යාචරණසම්පදාවට නොපැමිණෙනුයේ, ගස්වලින් වැටුණු ගෙඩිම භුක්තිවිඳීමටද නොපැමිණෙනුයේ අල මුල් ගෙඩි කෑමටද නොපැමිණෙන්නේ, ගමක් අසල හෝ නියම් ගමක් අසල හෝ ගිනිදෙවියා පුදන ගෙයක් කොට ගිනි දෙවියා පුදමින් සිටී. හෙතෙම ඒකාන්තයෙන් විද්‍යාචරණ ධර්මයෙන් යුක්තවූවහුගේ මෙහෙකරු බවටම පැමිණේ. අම්බට්ඨය, ඉතා උතුම් මේ විද්‍යාචරණසම්පදායෙහි මේ තුන්වන විනාශ දොරටුවයි.

**85.** "අම්බට්ඨය, නැවතද මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් ඉතා උතුම්වූ විද්‍යාචරණසම්පදාවට නොපැමිණෙනුයේ, ගස්වලින් වැටුණු ගෙඩි භුක්තිවිඳීමටද නොපැමිණෙනුයේ, අල මුල් ගෙඩි බුදීමටද නොපැමිණෙනුයේ, ගිනිදෙවියා පිදීමට නොපැමිණෙනුයේ, හතරමංහන්දියෙහි දොරටු හතරකින් යුත් ගෙයක් කොට මේ සිවුදිගින් යම් ශ්‍රමණයෙක් හෝ බමුණෙක් හෝ එන්නේ නම් මම ඔහු ශක්ති පරිද්දෙන් උපස්ථාන කරමි'යි වෙසෙයිද හෙතෙමේ ඒකාන්තයෙන් විද්‍යාචරණ ධර්ම ඇත්තහුගේ සේවය කරන්නෙක්ම වේ. අම්බට්ඨය, මේ වනාහි ඉතා උතුම් විද්‍යාචරණසම්පදායෙහි හතරවැනි විනාශ දොරටුවයි.

අම්බට්ඨය, මේ වනාහි ඉතා උතුම් විද්‍යාචරණසම්පදායෙහි විනාශ දොරටු හතර වෙත්.

**86.** "අම්බට්ඨය, මේ කාරණය ගැණ කුමක් සිතන්නෙහිද? මේ උතුම් විද්‍යාචරණ සම්පදායෙහි ගුරුන් සහිතවූ නුඹ පැමිනෙහිද? (ඔවුන් විසින් නුඹ) හික්මවන ලද්දෙහිද?"

"භවත් ගෞතමයන් වහන්ස, එබන්දක් නම් නැත, භවත් ගෞතමයන් වහන්ස, ආචාර්යයන් සහිතවූ මම, කවර නම් ඉතා උතුම් විද්‍යාචරණසම්පත්ති තොමෝ කවරීද?, භවත් ගෞතමයන් වහන්ස, ගුරුවරයෙක් සහිතවූ මම ඉතා උතුම් විද්‍යාචරණ සම්පදාවෙහි බොහෝ ඈත්වූයෙමි."

"අම්බට්ඨය, මේ කාරණා ගැන කුමක් සිතන්නෙහිද? නුඹ මේ අනුත්තරවූ විද්‍යාචරණසම්පදාවට නොපැමිණෙනුයේ තපස් පිරිකර ආදිය ගෙණ ගුරුන් සහිතව, ගස්වලින් වැටුණු ගෙඩි භුක්තිවිඳින්නෙක් වන්නෙමි'කියා අරණ්‍යයෙහි වනයකට පැමිණෙන්නෙහිද?"

"එබන්දක් නම් නැත, භවත් ගෞතමයන් වහන්ස."

"අම්බට්ඨය, මේ ඉතා උතුම් විද්‍යාචරණසම්පදාවට නොපැමිණෙනුයේ, ගස්වලින් වැටුණු ගෙඩි කෑමටද නොපැමිණෙනුයේ, උදැල්ලක් හා කුඩයක් ගෙණ නුඹ ගුරුන්

සහිතව 'අල මුල් ඵල කෑම කරන්නෙක් වන්නෙමැ'යි අරණ්‍යයෙහි වනයට පැමිණෙන්නෙහිද?"

"එසේත් නැත. භවත් ගෞතමයන් වහන්ස."

"අම්බට්ඨය, මේ ඉතා උතුම් විද්‍යාචරණසම්පදාවට නොපැමිණෙනුයේ, ගස්වලින් වැටුණු ගෙඩි කෑමටද නොපැමිණෙනුයේ, අල මුල් ගෙඩි කෑමටද නොපැමිණෙනුයේ, ගුරුන් සමගවූ නුඹ ගම් අසල හෝ නියම්ගම් අසල හෝ ගිනිපුදනා ගෙයක් කොට ගිනි පුදන්නෙක්ව සිටින්නෙහිද?"

"එසේ නම් නැත, භවත් ගෞතමයන් වහන්ස."

"අම්බට්ඨය, මේ ඉතා උතුම් විද්‍යාචරණසම්පදාවට නොපැමිණෙනුයේ ගස්වලින් වැටුණු ගෙඩි කෑමටද අල මුල් ගෙඩි කෑමටද, අග්නිපූජාවටද නොපැමිණෙනුයේ, ගුරුන් සමගවූ නුඹ හතරමංහන්දියෙහි දොරටු හතරකින් යුත් ගෙයක් කොට, "මේ හතරදිගින් යම් මහණෙක් හෝ බමුණෙක් හෝ එන්නේ නම් ඔහු ශක්තිපරිද්දෙන් උපස්ථාන කරන්නෙමි'යි සිටින්නෙහිද?"

"එසේත් නැත, භවත් ගෞතමයන් වහන්ස"

87. "අම්බට්ඨය, මෙසේ ගුරුන් සහිතවූ නුඹ මේ ඉතා උතුම් විද්‍යාචරණ සම්පදාවෙන් පිරිහුණෙහිය. ඉතා උතුම් විද්‍යාචරණසම්පදාවන්ගේ යම් මේ විනාශ දොරටු හතරක් වෙත්ද එයින්ද ගුරුන් සහිතවූ නුඹ පිරිහුණෙහිය. අම්බට්ඨය, නුඹේ ගුරුවර පොක්ඛරසාති බමුණා විසින් තමන් විද්‍යාචරණ සම්පදාව අඩු තරමින් වත් සම්පූර්ණ නොකරණුයේ "මේ පිළිකුල් කළයුතුවූ මුඩුවෝත් මහණෝත් දාසි පුත්‍රයෝත් හීන ජාතිකයෝත් බ්‍රහ්මගේ පාදයෙන් උපන්නොත් කවරහුද? ත්‍රිවිද්‍යා ඇති බමුණන්ගේ සාකච්ඡාව කවරිද?' යන්නකු කියන ලදුයේමය, අම්බට්ඨය, නුඹගේ ගුරුවූ පොක්ඛරසාතී බමුණා විසින් නුඹට කරණලද අපරාධයක මහත බලව.

88. "අම්බට්ඨය, පොක්ඛරසාති බමුණුතෙමේ පසේනදී කොසොල් රජු විසින් දුන් දෙය අනුභව කරයි. එහෙත් කොසොල්

රජ ඔහුට හමුවීමක් පවා නොදෙයි. රජු යම් කලෙක ඔහු හා යම් කරුණු ගැණ කතාකරයිද මුවහවූ රෙදිපට අතුරින් කථාකරයි.

"අම්බට්ඨය, පසෙනදී කොසොල් රජ ධාර්මිකවූ සිය කැමැත්තෙන් පවරා දෙනු ලබන දන් යමෙකුට පිළිගන්වාද එසේවූ පොක්ඛරසාති බමුණුහට කෙසේ නම් තමා හමුවීමට අවසර පවා නොදේද, අම්බට්ඨය, බලව, නුඹගේ ආචාර්යවූ පොක්ඛරසාති බමුණුහට මේ කොතරම් නොසැලකීමක්ද?"

"අම්බට්ඨය, මේ කාරණය ගැණ කුමක් සිතන්නෙහිද? මේ පසේනදී කෝශල රජ ඇතෙකු පිට හෝ අසකු පිට හෝ රථාසනයෙහි හෝ හුන්නේ උසස් අමාත්‍යයන් සමග හෝ රාජකුමාරයන් සමග හෝ කිසියම් සාකච්ඡාවෙක් කරන්නේය. ඒ බමුණු තෙමේ ඒ ප්‍රදේශයෙන් පිට ගොස් එක් පෙදෙසක සිටින්නේය. ඉක්බිති ශුද්‍රයෙක් හෝ ශුද්‍රදාසයෙක් හෝ එන්නේය. ඒ බමුණු තෙමේ එහි සිටියේ එවැනිවූම මන්ත්‍රණයක් කරන්නේය. කෙසේද? පසේනදී කොශල රජ තෙමේ මෙසේ කීයේය. මෙසේත් කීයේය'කියායි.

"ඔහු රජු කීවක්ම හෝ කියයිද? රජු හා සමග කරුණු විමසා බැලීමක් හෝ කරයිද? මෙපමණෙකින් හෙතෙමේ රජු හෝ රාජාමාත්‍යයෙක් වන්නේද?"

"නැත්මය, භවත් ගෞතමයන් වහන්ස"

**89.** "අම්බට්ඨය, එපරිද්දෙන්ම බමුණන්ගේ මුල් ඍෂිහු වූ මන්ත්‍ර කර්තෘහුවූ මන්ත්‍ර පැවැත්වූවා වූ යම් මුල්ගුරුවරයෝ වූවාහුද, වර්තමානයෙහි බමුණෝ යම් කෙනෙකුගේ පුරාණ වෙදමන්ත්‍රයන් (ඔවුන් විසින්) කටපාඩමේ කීම කරණලද සේ කටපාඩමේ කීම කරත්ද, කියවනලද සේ කියවත්ද, රැස්කොට තබන ලදසේ තබද්ද, ඒ අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගිය, අංගීරසය, භාරද්වාජය වාසෙට්ඨය, කස්සපය, භගුය, යන ආදී ඍෂිවරයන්ගේ මන්ත්‍රයන් කටපාඩම් කළමැයි ගුරුවරයා සහිතවූ නුඹ කට පාඩම් කරන්නෙහිය.

එපමණෙකින් නුඹ ඍෂිවරයෙක් හෝ ඍෂි බවට පැමිණියෙක් හෝ වෙහිද? මේ කාරණය නොවිය හැකිය.

**90.** "අම්බට්ඨය, මේ ගැණ නුඹ කුමකැයි සිතන්නෙහිද? මන්ත්‍රකර්තෘහුවූ මන්ත්‍ර පැවැත්වූවාවූ, බමුණන්ගේ මුල්වූ ඍෂීහු වූහ. මේ කාලයෙහි බමුණෝ යම් කෙනෙකුන් වෙද මන්ත්‍රයන් කටපාඩමේ කීම කළාසේ කටපාඩමේ කීම කරත්ද? කියවනලද සේ කියවත්ද, රැස්කොට තබනලදසේ තබද්ද? ඒ අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගිය අංගීරසය, භාරද්වාජය, වාසෙට්ඨය, කස්සපය, භගුය යන පූර්වඍෂීහු මනාකොට නෑම කර පිරිසිදු වූවාහු, කැපූ කෙස් හා රවුලු ඇත්තාහු, මිණිකොඩොල් අබරණ පැළැන්දාහු, සුදුපිළි හැන්දාහු, පස්කම් ගුණයන්ගෙන් සම්පූර්ණවූවාහු, ගුරුන් සහිතවූ නුඹ දැන් යම්සේද ඔවුහු එවකට එසේ වූහයි වයස්ගතවූ ගුරුවරයන්ගේ ගුරුවරවූ බමුණන්ගෙන් නුඹ අසනලදද?

"නැත, භවත් ගෞතමන් වහන්ස."

**91.** "ගුරුන් සහිතවූ නුඹ යම්සේද, එසේ ඔවුහු පහකළ කළුපාට ඇට ඇති පිරිසිදු මාංශ රසයෙන් යුක්තවූ නොයෙක් හොදි ව්‍යඤ්ජන ඇති ඇල්හාල් බත් කෑම කළහයි අසන ලදද?"

"නැත, භවත් ගෞතමයන් වහන්ස."

"ගුරුන් සහිතවූ නුඹ යම්සේද, එසේ ඔහු පටපිළි ආදියෙන් සැරසුණු, මෘදු කය ඇති ස්ත්‍රීන් විසින් උපස්ථාන කරණු ලබන්නෝවූහයි අසන ලදද?"

"නැත, භවත් ගෞතමයන් වහන්ස."

"ගුරුන් සහිතවූ නුඹ යම්සේද, එසේ ඔවුහුද දික් කැවිටිවලින් තළමින් පිළියෙලකොට කැපූ වල්ගා ඇති වෙළඹුන් යෙදූ රථයෙන් හැසිරෙන්නෝවූයයි අසනලදද?"

"නැත, භවත් ගෞතමයන් වහන්ස."

"ගුරුන් සහිතවූ නුඹ යම්සේද, එසේම ඔවුහු හැරුවාවූ අගල් ඇති, තැබූ දොරවල් ඇති, පවුරු පදනම් යොදා ඇති,

නගරයන්හිත් ආයුධ ගත් පුරුෂයන් විසින් රක්ෂා කරණ ලද්දාහු යයි අසනලදද?"

"නැත, භවත් ගෞතමයන් වහන්ස"

"මෙසේ හෙයින් අම්බට්ඨය, ගුරුන් සහිතවූ නුඹ ඍෂි නොවේ. ඍෂි බවට පිළිපැද්දෙත් නොවේ. අම්බට්ඨය, යමෙකුට වනාහි මාකෙරෙහි සැකයක් හෝ විමතියක් හෝ වේද, ඔහු මාගෙන් ප්‍රශ්න ඇසූකල, මම පිළිතුරු දීමෙන් සැක දුරු කරන්නෙමි."

**92.** එවිට භාග්‍යවතුන් වහන්සේ නිවාසයෙන් නික්මී සක්මනට වැඩිසේක. අම්බට්ඨ තරුණයා තෙමේත් (ගන්ධකුටි) නිවාසයෙන් නික්ම සක්මනට ගියේය. ඉක්බිති අම්බට්ඨ තරුණයා භාග්‍යවතුන් වහන්සේට අනුව සක්මන්කරණුයේ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙහි දෙතිස් මහපුරිස ලකුණු පරීක්ෂාකෙළේය. අම්බට්ඨ තරුණයා තෙමේ භාග්‍යවතුන් වහන්සේට අනුව සක්මන් කරණුයේ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙහි දෙකක් හැර සෙසු සියලු මහාපුරුෂ ලක්ෂණයන් දුටුයේය. එනම් "කොසොහිතවත්ථගුය්හ" 'පහූත ජිව්හතා" යන දෙකෙහි සැක කරයි, තීරණයකට නොපැමිණෙයි, ඔහුගේ සිත නොපහදී.

**93.** එකල භාග්‍යවතුන් වහන්සේට මෙසේ සිතක් පහළ විය. 'මේ අම්බට්ඨ තරුණයා 'කොශයෙහි සැඟවුනු පුරුෂ නිමිත්ත ඇති බවය, "පුළුල් දික් මෙළෙක් දිව ඇති බවය' යන දෙලකුණ හැර සෙසු සියලු මහා පුරුෂ ලක්ෂණයන් දකී. දැක ඒ දෙක්හි සැක කරයි, තීරණයකට නොපැමිණෙයි ඔහුගේ සිත නොපහදී යනුයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ තරුණයා යම්සේ 'කොසොහිත්ථගුය්හය" දකීද, එබඳුවූ ඍද්ධි විශෙෂයක් කළසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දිව බැහැර කොට දෙකන් සිදුරු හා දෙනාසා සිදුරු ස්පර්ශකෙළේය, නැවත නැවත ස්පර්ශකෙළේය, නළල් තලය සම්පූර්ණයෙන් දිවින් වැසුවේය.

එවිට අම්බට්ඨ තරුණයාහට මෙබඳු සිතක් පහළ විය. "ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දෙතිස් මහපුරිස් ලකුණින් යුක්තය, සම්පූර්ණය, අසම්පූර්ණ නොවේ.' මෙසේ සිතා තරුණයා "යහපත, භවත් ගෞතමයන් වහන්ස, දැන් අපි යමු. අපි අවශ්‍යයෙන් කළයුතු බොහෝ කටයුතු ඇත්තෝ වමු"යි භාග්‍යවතුන් වහන්සේට කීය.

"අම්බට්ඨය, ගමනකට කාලය නුඹම දනුව"යි බුදුහු කීයේය. එවිට අම්බට්ඨ තරුණයා වෙළඹුන් යෙදූ රථයට නැගී පිටත්ව ගියේය.

**94.** "එකල පොක්ඛරසාති බමුණු තෙමේ උක්කට්ඨාවෙන් නික්ම මහත් බ්‍රාහ්මණ සමූහයක් සමග තමන්ගේ ආරාමයෙහි අම්බට්ඨ තරුණයා ගැන බලාපොරොත්තු වෙමින් හුන්නේය. මේ වේලෙහි අම්බට්ඨ තරුණයාත් එහි පැමිණියේය. රථයෙන් යාහැකි තෙක් රථයෙන් ගොස් බැස පා ගමනින්ම පොක්ඛරසාති බමුණු වෙත ගොස් වැඳ එක පැත්තකටව හුන්නේය.

**95.** "කිම, දරුව අම්බට්ඨය, ඒ භවත් ගෞතමයන් දුටුයේද?"

"ස්වාමීනි, අපි ඒ භවත් ගෞතමයන් දුටුවමු."

"කිම, දරුව අම්බට්ඨය, ඒ භවත් ගෞතමයන්ගේ එසේ ඇත්තාවූම කීර්ති ශබ්දයක් උස්ව නැංගේද, නැත්නම් එසේ නොවේද? ඒ භවත් ගෞතම තෙමේ එබඳුද, නැත්නම් එබඳු නොවේද?"

"ස්වාමීනි, භවත් ගෞතමයන් වහන්සේගේ එබඳුවූ, ඇත්තාවූම කීර්ති ශබ්දයක් උස්ව නැංගේය. නැත්තාවූ එකක් නොවේ. ඒ භවත් ගෞතමයන් වහන්සේ එබඳුමය එබඳු නොවූයේ නොවේ. සම්පූර්ණවූ දෙතිස් මහපුරිස්ලකුණුවලින් ඒ භවත් ගෞතමයන් වහන්සේ යුක්තයහ, ඉන් අසම්පූර්ණවූයේ නොවේ."

"දරුව අම්බට්ඨය, ශ්‍රමණ ගෞතමයන් සමග නුඹගේ යම් ස්වල්ප කථාවක් වූයේද?"

"ස්වාමීනි, ශ්‍රමණ ගෞතමයන් සමග යම්කිසි කථාවක් වූයේය."

"දරුව අම්බට්ඨය, ශ්‍රමණ ගෞතමයන් සමග නුඹේ කෙබඳු කථාවක් නම් වූයේද?"

ඉක්බිති අම්බට්ඨ තරුණයා යම් කථාවක් භාග්‍යවතුන් වහන්සේ සමග වූයේ නම් ඒ සියල්ල පොක්ඛරසාති බමුණුහට කීයේය.

**96.** එසේ කී කල පොක්ඛරසාතී බමුණු තෙමේ අම්බට්ඨ තරුණයාහට මෙසේ කීයේයඃ- 'අනේ හොඳයි, අපගේ පණ්ඩිත නම්බුකාරයා, බොහෝ ශිල්ප ශාස්ත්‍ර දැනීමෙහි නම්බුකාරයා ත්‍රිවිද්‍යා නම්බුකාරයා මෙබඳුවූ හිතවතෙකු යම් මිනිසකුට ඇතිවුවොත් ඒ මිනිසා ශරීරය බිඳීමෙන් මරණින් පසු අපාය නම්වූ, නපුරු ගති ඇති, දුක්වූ නිරයෙහිම උපදින්නේය.

"අම්බට්ඨය, නුඹ ඒ භවත් ගෞතමයන් ගට ගටා බැන්නෙහිය. එවිට භවත් ගෞතම තෙමේත් අප පිළිබඳ යටගිය තතු සියල්ල මතුකොට කීය. අනේ! හොඳයි, අපගේ පණ්ඩිත නම්බුකාරයා, බහුස්සුත නම්බුකාරයා, ත්‍රිවිද්‍යා නම්බුකාරයා යමෙකුට මෙබඳුවූ හිතවතෙකු ඇතිකල්හි ඔහු මරණින් මතුයෙහි අපාය නම්වූ නපුරු ගති ඇති දුක්වූ නිරයෙහි උපදින්නේමය" කියා කිපුනේ නොසතුටු වූයේ අම්බට්ඨ තරුණයා පයින් ගසා බිමහෙළීය, එකෙණෙහිම භාග්‍යවතුන්වහන්සේ දකින්ට යෑමට ඔහු තුළ කැමැත්තක් විය.

**97.** එවිට ඒ බමුණෝ පොක්ඛරසාති බමුණුහට මෙසේ කිවහුයඃ- "පින්වත, ශ්‍රමණ ගෞතමයන් දකින්ට අද කිසිසේත් කාලය නොවේ. හෙට පොක්ඛරසාති බ්‍රාහ්මණ තෙම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දැකීම පිණිස යන සේක්වා.

එකල්හි පොක්ඛරසාති බමුණු තෙමේ ස්වකීය ගෘහයෙහි මිහිරි කෑ යුතු දේ පිළියෙල කරවා රථයක හිඳ පන්දම් එළියෙන් උක්කට්ඨාවෙන් පිටත්ව ඉච්ඡානංගල වනලැහැබට පැමිණියේය. යානයෙන් යා හැකි තෙක් එයින් ගොස් බැස පා ගමනින්

භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ භාග්‍යවතුන්වහන්සේ සමග සිහිකටයුතු සතුටුදායක කථාකොට පැත්තකින් හුන්නේය. එකපැත්තකින් හුන් පොක්ඛරසාති බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයඃ- 'භවත් ගෞතමයන්වහන්ස, අප යටතේ සිටින අම්බට්ඨ තරුණයා මෙහි ආවේද?" "බ්‍රාහ්මණය, නුඹ යටතේ සිටින අම්බට්ඨ තරුණයා මෙහි ආවේය."

"භවත් ගෞතමයන් වහන්ස, අම්බට්ඨ තරුණයා සමග ඔබ වහන්සේගේ කිසියම් කථා ස්වල්පයක් වීද?"

"බ්‍රාහ්මණය, අම්බට්ඨ තරුණයා සමග මාගේ කිසියම් කථා ස්වල්පයක් විය."

"භවත් ගෞතමයන් වහන්ස අම්බට්ඨ තරුණයා සමග කෙබඳුවූ කවර නම් කථාවක් වූයේද?"

එවිට භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ තරුණයා සමග යම් පමණ ප්‍රශ්නොත්තර කථාවක් වූයේ නම් ඒ සියල්ල පොක්ඛරසාති බ්‍රාහ්මණයාට කීහ. එසේ කී කල බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයඃ "භවත් ගෞතමයන් වහන්ස, අම්බට්ඨ තරුණයා බාලයෙකි. භවත් ගෞතමයන් වහන්සේ අම්බට්ඨ තරුණයාට ක්ෂමාවන සේක්වා."

"බ්‍රාහ්මණය, අම්බට්ඨය තරුණයා සුවපත් වේවා."

**98.** එවිට පොක්ඛරසාති බමුණුතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙහි දෙතිස් මහපුරිස් ලකුණු විමසීය. පොක්ඛරසාති බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙහි දෙකක් හැර සෙසු සියලු මහා පුරුෂ ලක්ෂණයන් දුටුයේය, 'කොසොහිතවත්ථගුය්හතා' 'පහුතජිව්හතා' යන ලක්ෂණ දෙකෙහි සැක කරයි, තීරණයකට නොබසී, (ඔහුගේ සිත) නොපහදී.

**99.** එකල භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතක් පහළ විය, 'මේ බමුණු තෙමේ 'කොෂයෙහි සැඟවුනු පුරුෂනිමිත්ත ඇති බවය,' 'පලල් දික් මොලොක් දිව ඇති බවය' යන ලකුණු දෙක

හැර සෙසු මහා පුරුෂ ලක්ෂණ දැක ඒ දෙක ගැන සැක කරයි, තීරණයකට නොබසී, (ඔහු සිත) නොපහදී.' එවිට භාග්‍යවතුන් වහන්සේ පොක්ඛරසාති බමුණු තෙමේ යම්සේ කොසොහිතවත්ථගුය්හය දකීද, එබඳු ඍද්ධි විශෙෂයක් කළේය. දිව බැහැර කොට දෙකන් සිදුරු හා දෙනාසා සිදුරු ස්පර්ශකළේය, නැවත නැවත ස්පර්ශකෙළේය, නළල්තලය සම්පූර්ණයෙන් දිවින් වැසුවේය. එකල පොක්ඛරසාති බමුණු හට මෙසේ සිතුනි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සම්පූර්ණ දෙතිස් මහපුරිස් ලකුණින් යුක්තයහ. අසම්පූර්ණයෙන් නොවේ." (එසේ සිතා) භාග්‍යවතුන් වහන්සේ. භික්ෂු සංඝයා සමග අද දානය පිළිගණිත්වා" භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවීමෙන් පිළිගත්තේය.

100. ඉක්බිති පොක්ඛරසාති බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පිළිගැනීම දැන, "භවත් ගෞතමන් වහන්ස, දානය සූදානම්ය, දැන් කාලයයි වළඳන්නට කාලය දැන්වීය. භාග්‍යවතුන් වහන්සේ උදය කාලයේ හැඳ පෙරව පාත්‍රා සිවුරු ගෙණ භික්ෂුසමූහයා සමග පොක්ඛරසාති බමුණාගේ භෝජන ස්ථානයට වැඩියේය. එහි පැමිණ, පැනවූ ආසනයෙහි වැඩ උන්නේය. එවිට පොක්ඛරසාතී බමුණු තෙමේ තමන්ගේ අතින්ම පිළිගන්වා හොඳින් මිහිරිවූ සුදුසු ආහාරයෙන් භාග්‍යවතුන් වහන්සේ වැළඳවීය. බමුණු මාණවකයෝත් භික්ෂු සංඝයා වැළඳවූහ. එවිට පොක්ඛරසාති බමුණුතෙමේ වළඳා අවසන්ව පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති භාග්‍යවතුන්වහන්සේ වෙත කුඩා ආසනයක් ගෙණ පැත්තකින් හුන්නේය.

101. භාග්‍යවතුන් වහන්සේ එසේ හුන් පොක්ඛරසාති බමුණාහට දාන කථාවය, සීලකථාවය, ස්වර්ග කථාවය, කාමයන්ගේ වැරැද්ද හා කෙලෙසන බවය, පහත් බවය, මහණ වීමේ උතුම්කමය, යන ධර්මදේශනා කිරීමේදී පළමුවෙන් කරන පිළිවෙළ කථාව දේශනා කළේය. භාග්‍යවතුන් වහන්සේ යම් ඇසිල්ලෙක පොක්ඛරසාති බමුණා තුළ සුදුසුවූ මෘදුවූ, බාධා නැති ප්‍රීතිය වැඩීගිය, ප්‍රසන්නවූ සිත ඇතිවීයයි දැනගත්තේ නම්, එකල දුකය, දුක ඉපදීමේ හේතුවය නිවනය මාර්ගය යන

බුදුවරයින් තමන් විසින්ම අවබොධ කළ උතුම් සත්‍ය ධර්ම හතර ප්‍රකාශ කෙළේය. යම්සේ කළුපාට නුවූ පිරිසිදුවූ වස්ත්‍රයක් මනාකොට සායම් පිළිගන්නේද එපරිද්දෙන්ම පොක්ඛරසාති බමුණාහට ඒ හුන් ආසනයෙහිම 'යම් කිසිවක් උපදනා ස්වභාව ඇත්තේද ඒ සියල්ල වැනසෙන ස්වභාවකොට ඇත්තේය' යන පහවූ කෙලෙස් දූවිලි ඇති සෝවාන් මාර්ගඥානය (දහම් ඇස) උපන්නේය.

**102.** එවිට පොක්ඛරසාති බමුණු තෙමේ ලබාගත් ධර්ම ඇතියේ, අවබෝධකළ ධර්ම ඇතියේ, දැඩිව ගත් ධර්ම ඇතියේ, දුරුකළ සැක ඇතියේ, මහත් දැනීම් ඇතිවූයේ, වෙන අනුශාසනාවක් නොපිලිගන්නේ, භාග්‍යවතුන්වහන්සේට මෙසේ කීය: "භවත් ගෞතමයන් වහන්ස, පැහැදුනෙමි, ඉතා පැහැදුනෙමි. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේද, වසා තබන ලද්දක වැස්ම ඉවත් කරන්නේද, මුලාවූවකුට මාර්ගය කියන්නේද, ඇස් ඇත්තෝ වස්තූන් දකිත්වායි අන්ධකාරයෙහි තෙල්පානක් දල්වන්නේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ලෙසින් ධර්මය දෙශනා කරණලදී. භවත් ගෞතමයන් වහන්ස, මේ මම දරුවන් සහ භාර්යාවද, පිරිස් හා අමාත්‍යයන්ද සමග භවත් ගෞතමයන් වහන්සේද, ධර්මය හා සංඝයාද සරණකොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිතෙක් සරණ ගිය උපාසකයකු කොට පිළිගන්නා සේක්වා. මෙසේ භවත් ගෞතමයන් වහන්සේ උක්කට්ඨා නුවර සෙසු උපාසක කුලයන් වෙත වඩිනසේක් නම් එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ පොක්ඛරසාතී පවුලටත් වඩිත්වා එහි යම් ඒ තරුණයෝ හෝ තරුණියෝ හෝ භවත් ගෞතමයන් වහන්සේට වැඳ ගෞරව හෝ කරත්ද, දැක හුනස්නෙන් නැගිටීම හෝ කරත්ද, ආසන හෝ දිය හෝ දෙත්ද, සිත හෝ පහදවත්ද, ඔවුන්ට එය බොහෝ කාලයක් මුළුල්ලෙහි හිත පිණිස සුව පිණිස වන්නේය."

"බමුණ, (ඔබ විසින්) යහපත් කාරණයක් කියනලදී."

**තුන්වෙනි අම්බට්ඨ සූත්‍රය නිමියේය.**

## 4. සොණදණ්ඩ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් පමණවූ මහත් භික්ෂු සංඝයාවහන්සේ සමග (අංග) අඟු රටෙහි හැසිරෙන කල චම්පා නුවරට වැඩියෝය. එහි භාග්‍යවතුන් වහන්සේ චම්පා නගරයෙහිවූ ගග්ගරා නම් පොකුණු තෙර වාසය කරති.

එකල සොණදණ්ඩ නම් බ්‍රාහ්මණයෙක් මගධ දෙශයෙහි රජවූ බිම්බිසාර මහරජතුමන් විසින් උසස් පරිත්‍යාගයක් ලෙස රජුගෙන් ලබන ලද්දාවූ, උතුම්කොට දෙනලද, බොහෝ පිරිවර ජනයාගෙන් හා ඇතුන් අශ්වයින් ආදී සත්වසමූහයාගෙන් ගැවසුනු, තණ, දර දිය බොහෝසේ ඇතිවූ ධාන්‍ය සම්පත්තීන් යුත් චම්පා නගරයෙහි ප්‍රධානියාව වාසය කළේය.

2. එකල්හි චම්පානුවර වැසි බමුණු පවුල්හි ප්‍රධානියෝ මෙපවත් ඇසූහ. "(ශ්‍රමණ) භවත් ගෞතමයන් වහන්සේ ශාක්‍යපුත්‍රයෙක, ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූවෙක, පන්සියයක් පමණවූ මහත් භික්ෂුසංඝයා වහන්සේ සමග අඟුරටෙහි හැසිරෙන්නේ පිළිවෙළින් චම්පා නගරයට පැමිණ එහි ගග්ගරා නම් පොකුණු තෙර වාසය කරයි. ඒ (ශ්‍රමණ) භවත් ගෞතමයන් වහන්සේ පිළිබඳ මෙබඳු හිත් ප්‍රියකරණ කීර්තිරාවයක් පැනනැංගේය.

"ඒ භගවත්හු අර්හත්හ, හැමලෙසින් දතයුතු දේ තමන්ම දත්හ; නුවණ අටෙන් හා (පසළොස්) සීල ධර්මයන්ගෙන් යුත්හ; හොබනා ගමන් ඇතිහ, (ති) ලොව මැනවින් දත්හ; සීලාදි ගුණයෙන් ප්‍රධානයහ; පුරිසයන් දැමුමෙහි සමත්හ; දෙවි මිනිසුන්ට අනුශාසකහ; (සිවුසස්දත් හෙයින්) බුද්ධයහ, (සවුකෙලෙස් බුන් හෙයින්) භගවත් නම් වූහ. උන්වහන්සේ දෙවියන්, මරුන්, බඹුන් සහිතවූ මේ ලොකයද, මහණ බමුණන් හා දෙවිමිනිසුන් සහිත ප්‍රජාවද, තෙමේ ඉතා උසස් ඥාණයෙන් දැන, හොඳින් දැන දන්වනසේක. මුල මැද අග යන තුන් තැනම යහපත්වූ අර්ථයෙන් සහ නියම වචන ශබ්දකිරීමෙන් යුත් සර්ව

සම්පූර්ණ දහමක් දෙසති. පිරිසිදු බ්‍රහ්මචරියාව පවසති. එබඳු රහතුන්ගේ දැකීම මැනව' එවිට ඒ චම්පානුවර වැසි බමුණු පවුල් ප්‍රධානියෝ චම්පා නුවරින් නික්ම නොයෙක් දෙසින් රැස්වූවාහු මහත් සමූහ ඇත්තාහු එක්ව රැස්ව ගග්ගරා පොකුණු තෙරට පැමිණෙත්.

3. එකල්හි සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ ප්‍රාසාදයෙහි මතු මහල් තලයෙහි හාන්සිවී විවේක ගැනීමට පැමිණියේය. චම්පා නුවරවැසි බමුණු පවුල් ප්‍රධානීන් චම්පානුවරින් පිටත්ව රංචුගැසී නොයෙක් දෙසින් රැස්ව, එකතුවී ගග්ගරා පොකුණු තෙරට පැමිණෙන්නන් සොණදණ්ඩ බමුණු දුටුවේය. දැක තමන්ගේ දැන ගත යුතු ප්‍රශ්න විසඳන ඇමතියාට කථාකර "ඇමතියෙනි, චම්පා නුවර වැසි බමුණු පවුල්වල ප්‍රධානියෝ චම්පානුවරින් පිටත්ව, නොයෙක් පලාත් වලින් පැමිණ රංචු ගැසී ගග්ගරා පොකුණු තෙරට මක් නිසා පැමිණෙත්දැ"යි ඇසීය. "පින්වත, මෙනම් කරුණක් ඇත්තේය: ශාක්‍ය පුත්වූ, ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ, මහණ ගෞතම තෙමේ පන්සියයක් පමණ මහා භික්ෂු සංඝයා සමග අඟුරට ගමන් කරන්නේ පිළිවෙලින් චම්පාවට වැඩ ගග්ගරා පොකුණු තෙර වාසය කරයි. 'ඒ භාග්‍යවතුන් වහන්සේ අරහත්හ; සම්මාසම්බුද්ධයහ: විද්‍යා චරණසම්පන්නයහ: ලොකවිදූහ, අනුත්තරයහ, පුරිසදම්මසාරථිහ; දෙවිමිනිසුන්ගේ ශාස්තෘහ; බුද්ධයහ, භාග්‍යවත්හ, යි ඒ භවත් ගෞතමයන් ගැන මෙබඳු යහපත් ගුණ ඝොෂාවක් උස්ව පැනනැංගේය. ඔවුහු ඒ භවත් ගෞතමයන් වහන්සේ දැකීම පිණිස පැමිණෙති."

"එසේනම් පින්වත් ඇමතියනි, චම්පෙය්‍යක බමුණු ගෙවල් ප්‍රධානින් වෙත යව. ගොස් ඔවුනට මෙසේ කියව: 'සොණදණ්ඩ බමුණු තොපට මෙසේ කියයි. සොණදණ්ඩ බමුණු තෙමේද ශ්‍රමණ භවත් ගෞතමයන් දැකීමට පැමිණෙන්නේය. පින්වත්හුද ඒ තාක් නවතිත්වා" ඇමති තෙමේ, 'පින්වත, එසේ යහපතැ'යි සොණදණ්ඩ බමුණහට උත්තර දී චම්පෙය්‍යක බමුණු පවුල්වල ප්‍රධානීන් වෙත පැමිණියේය. එහි පැමිණ මෙසේ කීය:

"සොණදණ්ඩ බමුණුද ශ්‍රමණ භවත් ගෞතමයන් දැකීමට පැමිණෙන්නේය. එතෙක් පින්වත්හු නවතිත්වා."

4. එකල නොයෙක් රාජධානීන්ගෙන් පැමිණි බමුණන්ගෙන් පන්සියයක් පමණවූ බමුණෝ කිසියම් කටයුත්තක් සඳහා ඒ චම්පාවෙහි වාසය කරති. "සොණදණ්ඩ තෙම පින්වත් මහණ ගෞතමයන් දැකීමට පැමිණෙන්නේය" යනු ඒ බමුණෝ ඇසූහ. අසා ඔව්හු සොණදණ්ඩ වෙත පැමිණියෝය. පැමිණ, "පින්වත් සොණදණ්ඩ තෙම මහණ ගෞතමයන් දැකීමට පැමිණෙන්නේය යනු සත්‍යයක් දැ"යි ඇසුවෝය.

"පින්වත්නි, එසේ කිරීම මා අදහසය, මහණ ගෞතමයන් දැකීමට මමද පැමිණෙන්නෙමි."

5. "භවත් සොණදණ්ඩයෝ මහණ ගෞතමයන් දැකීමට නොපැමිණෙත්වා! පින්වත් සොණදණ්ඩ තෙමේ මහණ ගෞතමයන් දැකීම පිණිස පැමිණීම නුසුදුසුය. ඉදින් පින්වත් සොණදණ්ඩ තෙමේ මහණ ගෞතමයන් දැකීමට පැමිණෙන්නේය. නම්, පින්වත් සොණදණ්ඩගේ කීර්තිය පිරිහෙන්නේය, මහණ ගෞතමයන්ගේ කීර්තිය වැඩෙන්නේය. යම්හෙයකින් පින්වත් සොණදණ්ඩගේ කීර්තිය පිරිහෙන්නේද, මහණ ගෞතමයන්ගේ කීර්තිය වැඩෙන්නේද මේ කාරණයෙනුදු පින්වත් සොණදණ්ඩ තෙමේ මහණ ගෞතමයන් දැකීමට පැමිණීම නුසුදුසුය, මහණ ගෞතම තෙමේ පින්වත් සොණදණ්ඩ දැකීමට පැමිණීම සුදුසුය, භවත් සොණදණ්ඩයෝ මවු පස, පිය පස, යන දෙපසින් යහපත්ව උපන්හ. පිරිසිදු මව්කුසින් උපන්හ. සත්වන පරම්පරාව දක්වා අවමන් නොකරණ ලදහ. ජාතිවාදයෙන් නින්දා නොකරණ ලදහ. මේ කරුණෙන්ද භවත් සොණදණ්ඩයන් මහණ ගෞතමයන් දැකුමට පැමිණීම නුසුදුසුය. මහණ ගෞතමයෝම පින්වත් සොණදණ්ඩයන් දැකීමට එනු සුදුසුය.

"භවත් සොණදණ්ඩ තෙමේ අධිපතිය, ධනවත්ය, කෑම් බීම් ආදියට ගන්නා බොහෝ දේ ඇත්තේය. පින්වත් සොණදණ්ඩ තෙමේ වේද කටපාඩමෙන් කියන්නේය, වේද මන්ත්‍ර දන්නේය,

වචන අර්ථ ශාස්ත්‍රය හා කාව්‍ය අලංකාර ශාස්ත්‍රයද සහිත අකුරු, ශබ්දධාතු විස්තරය, නීති, ඉතිහාසය පස්වැනි කොට ඇති ත්‍රිවේදයෙහි අවසානයට පැමිණියේය. භාෂාව දන්නේ, වියරණ කටපාඩමෙන් කියන්නේය. ලෝකය පිළිබඳ කරුණු දක්වන ශාස්ත්‍රය හා මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණ දැනුම ඇත්තේය. පින්වත් සොණදණ්ඩ තෙමේ දැකීමට ප්‍රිය මනා රූප ඇත්තේය, පහදවන ගති හා යහපත් පාටද ශරීර ලකුණුද ඇත්තේය. ඉතා උසස්වූ බ්‍රාහ්මයාගේ පාට වැනි රන්වන් පාටින් හා බඹහුගේ ශරීරය වැනි ශරීරයකින් යුතුය. ශරීරයෙහි දැකුම් කටයුතු දේ බොහෝය.

"පින්වත් සොණදණ්ඩ තෙම වඩනලද සිල් ඇති සම්පූර්ණ සීලයෙන් යුත්, සිල්වතෙක. පින්වත් සොණදණ්ඩ තෙමේ යහපත් වචන ඇති, ප්‍රිය උපදවන වචන ඇති. නාගරික ස්ත්‍රීන්ගේ සිලිටු වචන මෙන් මනහරවූ, අදහස් ප්‍රකාශයෙහි සමත් යහපත් වචන ඇති තැනැත්තෙක.

"භවත් සොණදණ්ඩයෝ බොහෝ දෙනාගේ ගුරුවරයාද ගුරුවරයින්ගේ ගුරුවරයාද වූහ. තුන්සියයක් මෙණෙවියනට වෙදමන්ත්‍රය කියවති. පින්වත් සොණදණ්ඩයන් වෙත වේදමන්ත්‍ර ඉගෙන ගැනීමටකැමති බොහෝ තරුණයෝ නොයෙක් රටින් හා නොයෙක් ජනපදයෙන් පැමිණෙති.

"භවත් සොණදණ්ඩ තෙමේ පැරණි කුලයෙන් පැවතෙන, ශීලාචාරාදියෙන් වැඩුණු බොහෝකල් ඉක්මවූ දෙතුන් රජපරම්පරාවක් ඉක්ම ගිය පැසුනු වයසට පැමිණියෙක.

"මහණ ගෞතම තෙමේ තරුණවූයේ, තරුණ පැවිද්දෙක්ද වේ."

"පින්වත් සොණදණ්ඩයෝ මගධ රට රජවූ සෙනීය බිම්බිසාර මහරාජයන් විසිනුත් සත්කාර කරණ ලදහ. ගරු කරණ ලදහ, බුහුමන් කරණ ලදහ, උසස්සේ සලකන ලදහ, නැමදුම් පෙරටුව පුදන ලදහ. පින්වත් සොණදණ්ඩයෝ පොක්ඛරසාතී බ්‍රාහ්මණයා විසින් සත්කාර කරණ ලදහ. ගරු කරණ ලදහ, බුහුමන් කරණ

ලදහ, පුදන ලදහ, නැමදුම් කරණ ලදහ. පින්වත් සොණදණ්ඩයෝ මගධරට සෙනිය බිම්බිසාර රජ විසින් උසස් තෑග්ගක් ලෙස, රාජසම්මාන වශයෙන් පමුණු කොට දෙන ලද, බොහෝ පිරිවර ජනයාගෙන් හා ඇතුන් අශ්වයින් ආදී සත්වසමූහයාගෙන් ගැවසුනු, තණ දර දිය අඩුනැති, ධාන්‍ය සම්පත්තියෙන් යුත්, චම්පා නගරයෙහි අධිපතිව වාසය කරති.

"මෙකී කරුණු නිසාද භවත් සොණදණ්ඩයෝ මහණ ගෞතමයන් දැකුම් පිණිස පැමිණීමට නුසුදුස්සෝය. මහණ ගෞතමයෝම සොණදණ්ඩයන් දැකීමට එනු සුදුසුය."

**6.** (ඒ බමුණන්) මෙසේ කීකල සොණදණ්ඩ බමුණුතෙම ඔවුන්ට මෙසේ කීය. "පින්වත්නි, යම්සේ භවත් ගෞතමයන් දකිනු පිණිස පැමිණෙන්ට අපිම සුදුස්සෝ වෙමුද, ඒ පින්වත් ගෞතමයන් වහන්සේ අප දකිනු පිණිස පැමිණෙන්ට නුසුදුසු වේද, ඒ පිළිබඳවූ මාගේ මේ කථාවද අසව්.

"පින්වත් මහණ ගෞතම තෙමේ මව් පාර්ශ්වයෙන් පිය පාර්ශ්වයෙන් යන දෙපාර්ශවයෙන් මැනවින් උපන්නේය. පිරිසිදු මව්කුසින් උපන්නේය; සත්වැනි පරම්පරාව දක්වා අවනම්බුවෙන් තොරවන ලද්දේය, ජාතිවාදයෙන් නින්දා නොකරණ ලද්දේය. පින්වත්නි, යම්හෙයින් මහණ ගෞතමයෝ මවුපිය දෙපාර්ශ්වයෙන් යහත් සේ උපන්නෝද, පිරිසිදු මවුකුසින් පහළවූවෝද, සත්වැනි පරම්පරාව දක්වා අවනම්බුවෙන් තොරවන ලද්දෝද, ජාති වාදයෙන් නින්දා නොකරණ ලද්දේද. මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල අපිම ඒ භවත් ගෞතමයන් වහන්සේ දැකුමට පැමිණෙන්නට සුදුස්සෝ වෙමු.

"පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මහත්වූ නෑදෑ සමූහයා හැර මහණ වූවෙක. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයෝ භූමිගතවූද, බොහෝ රන් රුවන් හැර මහණ වූවෙක, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ තරුණ වූයේම, හොඳ තරුණ භාවයෙන් හා පළමුවන වයසින් යුතුවූයේම, හොඳ කලු කෙස් ඇත්තේ, ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වූයේය.

"පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ නොකැමැති මවුපියන් කඳුලු පිරි මුහුනින් යුතුව හඬද්දී කෙස් දැලිරැවුලු කපාදමා සිවුරු හඳවා, ගිහිගෙන් පිටත්ව සස්නෙහි මහණවූ කෙනෙක. දැකුමට ප්‍රිය මනා රූප ඇතිවූ, පහදවන ගති ඇතිව යහපත් පාට සහ ශරීර ලක්ෂණ සහිත ඉතා උසස්වූ රන්වන් පාටින් හා බඹහුගේ ශරීරය වැනි ශරීරයෙන් යුක්තයහ; ශරීරයෙහි දැකුම් කටයුතු දෑ නිමක් නැත.

"පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ උතුම් නිදොස් සිල් ඇති සම්පූර්ණ ශීලයෙන් යුත්, සිල්වත් කෙනෙක. පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ යහපත් වචන ඇති, මිහිරි වචන ඇති, යහපත්, නිදොස්වූ, පැහැදිළිව අර්ථ ප්‍රකාශ කිරීමෙහි සමත් මිහිරි වචන ඇත්තෝය.

"පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ බොහෝ දෙනාගේ ගුරුවරයෙක්ද ගුරුවරයින්ගේ ගුරුවරයෙක්ද වෙති. පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ පහකළ කාමරාග ඇත්තෝ අලංකාර කිරීම් නැත්තෝද වෙති. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ 'කර්ම විපාක ඇත, කුසල් දහම් කිරීම යහපත යන කථා ඇත්තෙක. පවුකම් පෙරටුකොට හැසුරුම් නැත්තෙක, බ්‍රාහ්මණ සමූහයාට හිත සැප සලසන්නෙක.

"පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ මිශ්‍රනුවූ, ක්ෂත්‍රිය නම් උසස්කුලයෙන් ගොස් මහණවූ කෙනෙක. පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ මහා ධන, මහා භොග ඇති, උසස් කුලයෙන් නික්ම මහණවූ කෙනෙක, ශ්‍රමණ භවත් ගෞතමයන්ගෙන් යම් මේ දේ අසා දැනගන්නට අන්රටවලින්ද ජනපදවලින්ද ජනයෝ එති. බොහෝ දහස් ගණන් දෙවිවරු ශ්‍රමණ ගෞතමයන් ජීවිතය ඇතිතෙක් සරණ කොට ගියහ.

"ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ මෙබඳු මහත්වූ කීර්ති ශබ්දයක් විශෙෂයෙන් උස්ව පැනනැංගේය, කෙබඳුද යත්, 'උන්වහන්සේ සංසාරචක්‍රයෙහි බැම් සින්දහ. අර්හත්හ; හැමලෙසින් දතයුතුදේ තමන්ම දත්හ; නුවණ අටෙන් හා සීලධර්ම පහලොවින් යුත්හ; හරිමාර්ගයේ ගියහ. ලෝකය

හොඳාකාර දත්හ; සිල් ආදී ගුණෙන් ප්‍රධානය; මිනිසුන් දමනය කිරීමෙහි සමත්හ; දෙවිමිනිසුන්ට ගුරුවරයෙක්ය; සියල්ල දත්හ; කෙලෙස් නැතිකළහ'යි කියායි.

"පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ දෙතිස් මහපුරිස් ලකුණින් යුත්ය. ශ්‍රමණ ගෞතමයෝ යම් කෙනෙක් තමන්වහන්සේගේ සමීපයට පැමිණියේ නම් ඔවුන්ට ආසිරිවාද වචන හා කණට මිහිරි මොළොක් වචන ඇත්තාහ. සතුටුවන කථා ඇත්තෙක. මුහුන පහත් කොට ගෙන සිටින්නෙක් නොවේය, පළමුකොට කරණ කථා ඇත්තෙක. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ (භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන) සිවුපිරිස විසින් සත්කාර ගරු බුහුමන් පුද පූජා පවත්වන ලද්දෙක. ශ්‍රමණ භවත් ගෞතමයන් කෙරෙහි බොහෝ දෙවි මිනිස්සු විශෙෂයෙන් පැහැදුනහ. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යම් ගමක වාසය කරයිද, ඒ ගමෙහි හෝ නියම් ගමෙහි අමනුෂ්‍යයෝ හිංසා පීඩා කිරීමෙන් නොවෙහෙසත්.

"පින්වත්නි, ශ්‍රමණ ගෞතමයන් මහත් මහණ සමූහයා ඇත්තෙක, සමූහයකට ගුරුවරවූයේ ගුරුවරයින් අතුරෙන් ඉතා උසස්යයි කියනු ලැබේ. පින්වත්නි, ඇතැම් මහණ බමුණන්ගේ කීර්තිය කිසියම් සුළු කරුණකින් උසස් බවට පැමිණෙන්නේද, එබඳු කරුණකින් ශ්‍රමණ ගෞතමයන්ගේ කීර්තිය නම් වැඩීමට නොපැමිණියේය. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ කීර්තිය වැඩීමෙන් උසස් බවට පැමිණියේ ශ්‍රෙෂ්ඨවූ නුවණ හා සීල සම්පත්තිය නිසාය.

"අඹුදරුවන් හාඇමතියන් හා බොහෝ සේනා සහිතවූ මගධරට රජවූ බිම්බිසාර රජතෙමේ භවත් ගෞතමයන් වහන්සේ දිවිකෙළවර තෙක්ම සරණ ගියේය. එලෙසින්ම අඹුදරුවන් හා පිරිස් හා ඇමතියන් සහිත පසේනදී කොසොල් රජුද පොක්ඛරසාතී බමුණු තෙමේද, අඹු දරුවන් හා පිරිස් සහිතව ඇමතියන් සහිතව ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ජීවිතාන්තය තෙක්ම සරණ ගියේය.

"ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ බිම්බිසාර රජු විසිනුදු, කොසොල් රජු විසිනුදු පොක්ඛරසාතී බමුණා විසිනුදු සත්කාර ගරු බුහුමන් පුද සැලකිලි දක්වන ලද්දේය.

"ඒ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ චම්පාවට පැමිණ චම්පායෙහි ගග්ගරා පොකුණු තෙර වාසය කරති. යම්කිසි මහණ බමුණු කෙනෙක් අපගේ ගමට එත්නම් ඔවුහු අපේ ආගන්තුගයෝ වෙති. ආගන්තුගයෝ අප විසින් සත්කාර ගරු බුහුමන් පුදසැලකිලි දැක්විය යුත්තෝ වෙත්.

"චම්පාවට පැමිණ චම්පාවෙහි ගග්ගරා පොකුණුතෙර වාසය කරණ ශ්‍රමණ භවත් ගෞතමයෝද අපට ආගන්තුග වෙති. ආගන්තුගව පැමිණි තැනැත්තේ අප විසින් සත්කාර ගරු බුහුමන් පුද සැලකිලි පැවැත්විය යුත්තේ වේ. මේ කරුණෙන්ද ඒ භවත් ගෞතමයන් වහන්සේ අප දැකුමට එන්නට නුදුසුස්සෝය, අපිම උන්වහන්සේ ළඟට පැමිණිය යුත්තෝ වෙමු.

"පින්වත්නි, ඒ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ගුණ මෙපමණක්ම දනිමි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ මෙපමණ ගුණ ඇත්තෙක් නොවේ, ශ්‍රමණ භවත් ගෞතමයෝ අප්‍රමාණ ගුණ ඇති කෙනෙක."

7. මෙසේ කී කල්හි ඒ බමුණෝ සොණදණ්ඩ බමුණාට මෙසේ කීවෝය. "යම්සේ පින්වත් සොණදණ්ඩතෙමේ මහණ ගෞතමයන්ගේ ගුණ වර්ණනා කරයි, ඒ පින්වත් ගෞතමයන් වහන්සේ මින් සියක් යොදුනකින් ඈත වාසය කළ නමුත් යහපත් උතුම්ගති ඇති කෙනෙක් විසින් උන්වහන්සේ දැකීම පිණිස ගමනට වුවමනා දේ ගෙනද එළඹෙන්නට සුදුසුය. පින්වත්නි, එහෙයින් අපි සියල්ලෝම භවත් ගෞතමයන් වහන්සේ දැකීම පිණිස පැමිණෙන්නෙමුය."

එවිට සොණදණ්ඩ බමුණුතෙමේ මහත් වූ බමුණු සමූහයා සමග ගග්ගාර පොකුණ ළඟට පැමිණියේය.

8. ඊටපසු වනාන්තරයේ කැලෑ කොටස අතරට පැමිණ සොණදණ්ඩ බමුණහට මෙබඳු අදහසක් හිතට ආවේය. "මම

ශ්‍රමණ ගෞතමයන්ගෙන් ප්‍රශ්න විචාරන්නෙම් නම්, එවිට එහිදී ශ්‍රමණ ගෞතමයන් වහන්සේ "බ්‍රාහ්මණය, මේ ප්‍රශ්නය මෙසේ නොවිචාළ යුතුය,යි මට කීවොත් ඒ හේතු කොටගෙන මේ පිරිස සොණදණ්ඩ බමුණා අඥානයෙක, අසමර්ථයෙක, ශ්‍රමණ ගෞතමයන්ගෙන් නුවණින් යුතුව ප්‍රශ්න විචාරන්ට නොහැක්කෙකැ'යි මට නින්දා කරන්නේය. මේ පිරිස යමෙකුට නින්දා කරන්නේ නම් ඔහුගේ යසස පිරිහෙන්නේය. යමෙකුගේ යසස පිරිහේනම් ඔහුගේ වස්තුවද පිරිහෙයි. අපගේ වස්තුව යසස හේතුකොටගෙනම ලබන ලදහ. ඉදින් ශ්‍රමණ ගෞතමයෝ මගෙන් ප්‍රශ්න විචාරන්නාහු නම් මමද ප්‍රශ්නය විසඳීමෙන් උන්වහන්සේගේ සිත් නොගන්නෙම් නම්, එවිට ශ්‍රමණ ගෞතමයෝ මට මෙසේ කියන්නාහ; 'බමුණා අඥානයෙක, අසමර්ථයෙක, ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රශ්නය විසඳීමෙන් ඔහු සිත් ගන්නට අපොහොසත් වීය'යි මට නින්දා කරන්නේය. මේ පිරිස යමෙකුට නින්දා කරන්නේද, ඔහුගේ යසසද පිරිහෙන්නේය. යමෙකුගේ යසස පිරිහෙන්නේද, ඔහුගේ වස්තුවද පිරිහෙන්නේය. අපගේ වස්තුව යසස නිසාම ලබන ලද්දාහුය. මෙසේ සමීපයට පැමිණි මම ශ්‍රමණ ගෞතමයන් නොදැක නවතින්නෙම් නම් ඒ හෙතුවෙන්ද මට මේ පිරිස 'සොණදණ්ඩ බමුණු බාලයෙක, අසමර්ථයෙක, මානයෙන් තද වූවෙක, බය වූවෙක, ශ්‍රමණ ගෞතමයන් දැකීම සඳහා පැමිණෙන්ට අපොහොසත් විය. ඔහු භවත් ගෞතමයන් වහන්සේ නොදැක මක්නිසා නවතින්නේදැ?'යි නින්දා කරන්නේය. යමෙකුට මේ පිරිස නින්දා කරන්නේ නම් ඔහුගේ යසසද පිරිහෙන්නේය. යමෙකුගේ යසස පිරිහෙන්නේද ඔහුගේ වස්තුවද පිරිහෙයි. අපගේ වස්තුව යසස හේතුකොටගෙණ ලබන ලදී."

**9.** එවිට සොණදණ්ඩ තෙම භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු, සිහිකටයුතු කථා අවසන් කොට එක පැත්තකින් හුන්නේය. චම්පානුවර වැසි ඇතැම් බමුණු කෙනෙක් භගවත්හට වැඳ එක පැත්තකට වී හුන්හ. ඇතැම් කෙනෙක් උන්වහන්සේ සමග සතුටු වූහ සතුටු විය යුතු, සිහි කටයුතු කථා අවසන්

කොට පැත්තකින් හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් දෙසට නමස්කාරකර පැත්තකින් හුන්හ. ඇතැම් කෙනෙක් නාමය හා ගොත්‍රය ප්‍රකාශ කොට පැත්තකින් හුන්හ. ඇතමෙක් නිශ්ශබ්ද වූවාහු එක පැත්තකටවී හුන්හ.

**10.** එහිදීද සොණදණ්ඩ බ්‍රාහ්මණයා බොහෝසේ නැවත නැවතත් මෙසේ සිතා බැලීම කරමින් උන්නේය. "මම ශ්‍රමණ භවත් ගෞතමයන්ගෙන් ප්‍රශ්න විචාරන්නෙම් නම්, ඉදින් එහිදී ශ්‍රමණ ගෞතමයෝ, 'බමුණ, මේ ප්‍රශ්නය මෙසේ නොවිචාළ යුතුය, යි මට කීවොත්, ඒ හේතුකොට ගෙණ මේ පිරිස, සොණදණ්ඩ බමුණා අඥානයෙක, අසමර්ථයෙක, ශ්‍රමණ ගෞතමයන්ගෙන් නුවණින් යුතුව ප්‍රශ්න විචාරන්නට නොහැක්කෙකැ'යි මට නින්දා කරනවා ඇත. මේ පිරිස යමෙකුට නින්දා කළොත් ඔහුගේ කීර්තිය පිරිහෙන්නේය. යමෙකුගේ කීර්තිය පිරිහේ නම් ඔහුගේ වස්තු පිරිහෙත්. අපගේ වස්තු වනාහි යසස හේතුකොට ම ලබන ලදහ. ඉදින් ශ්‍රමණ ගෞතමයෝ මගෙන් ප්‍රශ්න විචාරන්නාහු නම් මම ද ප්‍රශ්න විසඳීමෙන් උන්වහන්සේගේ සිත් නොගන්නෙම් නම්, එවිට ශ්‍රමණ ගෞතමයෝ මට මෙසේ කියන්නාහ. 'බමුණ, මේ ප්‍රශ්නය මෙසේ නොවිසඳිය යුතු බමුණ, මේ ප්‍රශ්නය මෙසේ නම් විසඳිය යුතුය' එයින් මේ පිරිස, "සොණදණ්ඩ බමුණා අඥාණයෙක, අසමර්ථයෙක, ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රශ්නය විසඳීමෙන් සිත් ගන්නට අපොහොසත්වීයැ'යි මට නින්දා කරන්නේය. මේ පිරිස යමෙකුට නින්දා කළොත් ඔහුගේ කීර්තියද පිරිහෙන්නේය. යමෙකුගේ කීර්තිය පිරිහේ නම් ඔහුගේ වස්තුවද පිරිහෙයි. අපගේ වස්තුව කීර්තිය නිසාම ලබන ලදහ. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මාගේ ගුරු බව ඇති තුන් විද්‍යාව පිළිබඳව මාගෙන් ප්‍රශ්න විචාරන්නේ නම් ඉතා යහපති. ඒකාන්තයෙන් මම උන්වහන්සේගේ සිත ඒ ප්‍රශ්න විසඳීමෙන් සතුටු කරන්නෙමි."

**11.** එවිට භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේගේ සිතින් සොණදණ්ඩ බමුණාගේ සිත දැන මෙසේ සිතුවේය, මේ බමුණු තෙමේ මාගේ සිත කරණකොට ගෙණ වෙහෙසට පැමිණේ. ඒකාන්තයෙන් මම සොණදණ්ඩ බ්‍රාහ්මණයාගෙන් තමාගේ ගුරු

බව ඇති තුන් විද්‍යාවයේ විෂයෙහි ප්‍රශ්න විචාරන්නෙම් නම් ඉතා යෙහෙක."

එවිට භාග්‍යවතුන් වහන්සේ සොණදණ්ඩ බමුණුහට මෙසේ කීයේය, 'බ්‍රාහ්මණය, 'මම බමුණු වෙමි'යි කියන තැනැත්තේ (එය) හරි ආකාර කීමට නම්, බොරුනොවෙන්නට නම්, එසේ කියන බ්‍රාහ්මණයා කරුණු කීයකින් යුක්තවිය යුතුයයි බ්‍රාහ්මණයෝ ප්‍රකාශ කරත්ද?"

12. එවිට සොණදණ්ඩ බමුණුහට මෙබඳු අදහසක් ඇතිවිය: "ශ්‍රමණ ගෞතමයන් විසින් මාගේ ගුරු බව ඇති තුන් විද්‍යාව මාගෙන් ප්‍රශ්න විචාරන්නේ නම් යහපති. ඒකාන්තයෙන් ඒ ප්‍රශ්න විසඳීමෙන් උන්වහන්සේගේ සිත 'සතුටු කරන්නෙමි'යි අප විසින් යමක් කැමතිවන ලදද, යමක් බලාපොරොත්තුවන ලදද, යමක් මහත්සේ පතන ලදද, එහි ලා ශ්‍රමණ ගෞතමයෝ මාගේ ගුරු බව ඇති තුන් විද්‍යාව පිළිබඳ (එබඳු) ප්‍රශ්නයක්ම මගෙන් විචාරති මම (ඒ) ප්‍රශ්නය විසඳීමෙන් උන්වහන්සේගේ සිත ඒකාන්තයෙන්ම සතුටු කරන්නෙමි."

13. එවිට සොණදණ්ඩයෝ උස්ව හිස නමා, පිරිස නැවත නැවත බලා භගවත්හට මේ කාරණය කීහ. "පින්වත් ගෞතමයන් වහන්ස, යමෙක් මම බ්‍රාහ්මණ වෙමි'යි හරිආකාර කියන්නට නම්, එය බොරු නොවෙන්නට නම් එබඳු බ්‍රාහ්මණයා ගති ගුණ පහකින් සම්පූර්ණ විය යුතුයයි. බමුණෝ ප්‍රකාශ කරති. ඒ පහ කුමක්දයත්: පින්වත් ගෞතමයන් වහන්ස, ඒ බ්‍රාහ්මණ තෙමේ මවුපිය දෙපසින් යහපත්ව උපන්නේ වේ. පිරිසිදු මවුකුසින් බිහිවූයේ වේ, සත්වන පරම්පරාව දක්වා අවනම්බු නොලබන ලද්දේ වේ. ජාතිවාදයෙන් අවනම්බු නොකරන ලද්දේ වේ.

"ඔහු වේදමන්ත්‍ර කටපාඩමේ කියන්නෙක් වේ, වේද මන්ත්‍ර දරන්නේ වේ, වචන අර්ථ ශාස්ත්‍ර හා කාව්‍යඅලංකාර ශාස්ත්‍රයද, අකුරු, ශබ්ද ධාතු විස්තරය සහිතවූ, ඉතිහාසය පස්වනකොට ඇති, තුන්වේදය පිළිබඳ පරතෙරට පැමිණියේ වේ. භාෂාව දන්නේ වේ, ව්‍යාකරණ ශාස්ත්‍ර කටපාඩමේ කියන්නේ වේ,

ලෝකය පිළිබඳ කරුණු දක්වන ශාස්ත්‍රය හා මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණ දැනගැණීමට පැමිණියේ වේ.

'ඔහු උතුම් රූප ඇත්තේ, දැකුම් කටයුත්තේ, හිත් ප්‍රියකරන්නේ, උත්තම හිත් පිනවන පාටින් යුක්ත වූයේ, උතුම් රන්වන් පාට ඇත්තේ මහබඹුගේ ශරීරය වැනි ශරීරයක් ඇත්තේවේ. ඔහුගේ ශරීරයෙහි දැකුම් කටයුතුදේ අප්‍රමාණවේ.

"ඔහු සිල්වත් වූයේ වඩනලද සිල් ඇත්තේ, සම්පූර්ණ ශීලයෙන් යුත්ත වූයේය.

"ඔහු නුවණැති පණ්ඩිතවූයේ, යාග කරන්නන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක් හෝ වේ.

"පින්වත් ගෞතමයන් වහන්ස, මේ අංග පහෙන් යුත්' බමුණුතෙම 'මම බමුණු වෙමි'යි කියන්නේ (හරිආකාර) කියයිද, එසේ කීමෙන් මුසාවාදයට නොපැමිණෙන්නේයිද බමුණෝ ප්‍රකාශ කරති."

**14.** "බමුණ, මේ අංග පහෙන් එක් අංගයක් හැර අංග හතරකින් යුත්වූ බමුණෙක් 'මේ බමුණු වෙමි'යි කියතොත් (තෙතෙම) හරිආකාර කියන්නේය, එසේ කීමෙන් බොරු කීමකට නොපැමිණන්නේයයි ප්‍රකාශ කළ හැකිද?"

"හැකිය පින්වත් ගෞතමයන් වහන්ස, භවත් ගෞතමයෙනි, මේ අංග පහෙන් ජාතිය වෙන්කර තබමු. ජාතිය කුමක් නම් කරන්නේද? පින්වත, යම් හෙයකින් (ඒ) බමුණු තෙමේ මවුපිය දෙපක්ෂයෙන් යහපත්ව උපන්නේ වේද, පිරිසිදු මවුකුසින් බිහිවූයේ වේද, සත්වන පරම්පරාව දක්වා අවනම්බුවක් නොලබන ලද්දේද, ජාතිවාදයෙන් අවමන් නොකරණ ලද්දේද, වේද මන්ත්‍ර කටපාඩමේ කියන්නේ, වේද මන්ත්‍ර දරන්නේද, වචන අර්ථ ශාස්ත්‍රයද, කාව්‍ය අලංකාර ශාස්ත්‍රය හා අකුරු ශබ්ද ධාතු විස්තරය සහිතවූ ඉතිහාසය පස්වැනි කොට ඇති තුන් වේදය පිළිබඳ පරතෙරට පැමිණියේ වේද භාෂාව දන්නේද, ව්‍යාකරණ ශාස්ත්‍ර කටපාඩමෙන් කියන්නේද, ලෝකය පිළිබඳ කරුණු දක්වන ශාස්ත්‍රය හා මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයන්හි

සම්පූර්ණ දැන ගැනීමට පැමිණියේ වේද, සිල්වත් වූයේ, වඩනලද සිල් ඇත්තේ, සම්පූර්ණ ශීලයෙන් යුක්තවූයේද, සමත් පණ්ඩිත වූයේ, යාග කරන්නන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක් හෝ වේද - භවත් ගෞතමයන් වහන්ස, මේ අංග හතරෙන් යුත්වූ බමුණු 'මම බමුණුවෙමි' කියන්නේ නම් ඔහු හරිආකාර කියන්නේය, (එසේ කීමෙන්) ඔහු බොරු නොකියන්නේයයි බමුණෝ ප්‍රකාශ කරති."

**15.** "බමුණු, මේ අංග හතරෙන් එක් අංගයක් හැර අංග තුනකින් යුත්වූ බමුණුතෙම 'මම බමුණු වෙමි'යි කියන්නේ නම් හෙතෙම හරිආකාර කියන්නේය, එයින් බොරු කීමට නොපැමිණෙන්නේයයි ප්‍රකාශ කළ හැකිද?"

"හැකිය, භවත් ගෞතමයන් වහන්ස, භවත් ගෞතමයෙනි, මේ කරුණු සතරින් මන්ත්‍රයන් පැත්තකින් තබමු. මන්ත්‍රයෝ නම් කුමක් කරන්නාහුද? පින්වත, යම් හෙයකින් බ්‍රාහ්මණ තෙමේ මව්පිය දෙපසින් යහපත්ව උපන්නේ වේද පිරිසිදු මව්කුස ඇත්තේ වේද, සත්වැනි පරම්පරාව දක්වා අවනම්බුවක් නොලබන ලද්දේද, ජාතිවාදයෙන් අවනම්බු නොකරණ ලද්දේද; සිල්වත්වූයේ, වඩන ලද සිල් ඇත්තේ, සම්පූර්ණ ශීලයෙන් යුක්තවේද; සමත් පණ්ඩිත වූයේ, යාග කරන්නන් අතුරෙන් පළමුවැනියෙක් හෝ දෙවැනියෙක් වේද, භවත් ගෞතමයන් වහන්ස, මේ තුන් අංගයෙන් යුත්වූ බ්‍රාහ්මණ තෙම 'මම බමුණුවෙමි'යි කියන්නේ නම් ඔහු හරිආකාර කියන්නේය, එයින් බොරුකීමට නොපැමිනෙන්නේයයි බ්‍රාහ්මණයෝ ප්‍රකාශ කරති.'

**16.** "බමුණ, මේ අංගතුනෙන් එක් අංගයක් තබා අංගදෙකකින් යුත්වූ බ්‍රාහ්මණ තෙමේ' මම බමුණු වෙමි'යි කියන්නේ නම් ඔහු හරිආකාර කියන්නේය, (එසේ කීමෙන්) බොරුකීමට නො පැමිණෙන්නේයයි ප්‍රකාශ කළ හැකිද?"

"හැකිය, භවත් ගෞතමයන් වහන්ස, පින්වත් ගෞතමයෙනි, මේ අංග තුනෙන් ජාතිය පැත්තකින් තබමු. ජාති තොමෝ කුමක් කරන්නීද? පින්වත්නි, (ඒ) බ්‍රාහ්මණ තෙම යම් හෙයකින් සිල්වත් වූයේ, වඩන ලද සිල් ඇත්තේ, සම්පූර්ණ ශීලයෙන්

යුක්තවේද; සමත් පණ්ඩිත වූයේ, යාග කරන්නන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක් හෝ වේද; භවත් ගෞතමයන් වහන්ස, මේ අංග දෙකින් යුක්තවූ බමුණු තෙම 'මම බමුණු වෙමි'යි කියන්නේ නම් එහු හරිආකාර කියන්නේය, එයින් බොරුකීමට නොපැමිණෙන්නේයයි බ්‍රාහ්මණයෝ ප්‍රකාශකරති."

17. මෙසේ කී කල්හි ඒ බමුණෝ සොණදණ්ඩ බමුණා හට මෙලෙසින් කීහ:- 'පින්වත් සොණදණ්ඩ, මෙසේ නොකියන්න, පින්වත් සොණදණ්ඩ, මෙසේ නොකියන්න. පින්වත් සොණදණ්ඩ තෙමේ ජාතියට නින්දා කෙරේ, මන්ත්‍රයන්ට නින්දා කෙරේ, පවුලට (මව්පියන්ට) නින්දා කෙරේ. එකාන්තයෙන්ම පින්වත් සොණදණ්ඩ තෙමේ පිළිවෙළින් මහණ ගෞතමයන්ගේ මතයටම පැමිණෙන්නේය."

18. එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ බමුණන්ට මෙසේ කීහ. "බ්‍රාහ්මණයෙනි, 'සොණදණ්ඩ බමුණු ස්වල්ප වශයෙන් යමක් කමක් දන්නෙක, යහපත් වචන කථා නොකරන්නෙක, සොණදණ්ඩ බමුණු මහත් නුවනක් නැත්තෙක, සොණදණ්ඩ බමුණු මහණ ගෞතමයින් හා විරුද්ධව කථා කරන්ට අසමර්ථයෙකැ'යි යන මේ අදහස දැන් නුඹලාට ඇතිවේද, එසේ නම් සොණදණ්ඩ බ්‍රාහ්මණ තෙමේ පැත්තක සිටීවා, නුඹලා මා සමග සාකච්ඡා කරව්, බ්‍රාහ්මණයෙනි, 'සොණදණ්ඩ බමුණු බොහෝ දේ දන්නෙකි, සොණදණ්ඩ බමුණු යහපත් වචන කථා කරන්නෙක, සොණදණ්ඩ බමුණු මහා නුවණැත්තෙක, සොණදණ්ඩ බමුණු මහණ ගෞතමයින් හා විරුද්ධ කථා කරන්ට සමර්ථයෙකැ'යි යන මේ අදහස දැන් නුඹලාට ඇතිවේද, (එසේ නම්) නුඹලා සිටිව්, සොණදණ්ඩ බ්‍රාහ්මණ තෙමේ මා සමග සාකච්ඡාව කෙරේවා."

19. මෙසේ කී කල සොණදණ්ඩ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවේය. "භවත් ගෞතමයන් වහන්සේ සිටින සේක්වා, භවත් ගෞතමයන්

වහන්සේ නිශ්ශබ්ද වන සේක්වා, මම ම ඔවුන්ට කරුණු සහිතව විරුද්ධ කථා කරන්නෙමි.”

එවිට සොණදණ්ඩ බ්‍රාහ්මණ තෙමේ ඒ බමුණන්ට මෙසේ කීය:- “පින්වත්හු මෙසේ නොකියව, පින්වත්හු මෙසේ නොකියව්:- (එනම්) ‘සොණදණ්ඩ තෙමේ ජාතියට නින්දා කෙරේමය. මන්ත්‍රයට නින්දා කෙරේමය. පවුලට (මවුපියන්ට) නින්දා කෙරේමය, එකාන්තයෙන් පින්වත් සොණදණ්ඩ තෙම ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ මතයට පිළිවෙළින් බැසගනිය.’ පින්වත්නි, මම ජාතියට හෝ මන්ත්‍රයට හෝ පවුලට නින්දා නොකරමි.”

**20.** එකල්හි සොණදණ්ඩගේ බෑණනුවන්වූ අංගක නම් මෙණෙවියා ඒ පිරිසෙහි සිටියේය. එවිට සොණදණ්ඩ තෙමේ ඒ බමුණන්ට මෙසේ කීය:

“පින්වත්නි, අපගේ බෑණනුවන්වූ මේ අංගක නම් මෙණෙවියා නුඹලා දකින්නහුද?”

“එසේය, පින්වත.”

“පින්වත්නි, අංගක නම් තරුණයා උතුම් රූප ඇත්තේය, දක්නවුන්ගේ හිත ප්‍රිය කරන්නේය. හිත් සතුටු කරන්නේය. උත්තම හිත් පිනවන පාටින් යුක්තය, උතුම්වූ රන්වන් පාට ඇත්තේය, මහබඹහුගේ ශරීරය වැනි ශරීරයක් ඇත්තේය, ඔහුගේ ශරීරයෙහි දැකුම් කටයුතුවූදේ බොහෝය මේ පිරිසෙහි ශ්‍රමණ ගෞතමයන් වහන්සේ හැර ශරීර වර්ණයෙන් මොහට සියලු අයුරින් සමාන කෙනෙක් නැත්තේය.

“පින්වත්නි, අංගක තරුණ තෙම වෙදමන්ත්‍ර කටපාඩමේ කියන්නේය. වචන අර්ථශාස්ත්‍රය හා කාව්‍ය අලංකාර ශාස්ත්‍රයද, අකුරු, ශබ්දධාතු විස්තර සහිතවූ ඉතිහාසය පස්වනුකොට අති තුන්වෙදය පිළිබඳ පරතෙරට පැමිණයේය. ඔහු භාෂාව දන්නේය, ව්‍යාකරණ ශාස්ත්‍ර කටපාඩමේ කියන්නේය, කරුණු වරද බව ඔප්පු කරන්නන් විසින් දෙවියෙක් හෝ පරලොවක් නැතැයි

යන ශාස්ත්‍රය හා මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණ දැනගැණීම් ඇත්තේය. මම ඔහුට මන්ත්‍ර කියන්නෙමි.

"පින්වත්නි, අංගක තරුණ තෙමේ මව් පක්ෂයෙන්ද පිය පක්ෂයෙන්ද යන පක්ෂදෙකින් යහපත්සේ උපන්නේය, පිරිසිදු මවු කුසින් බිහිවූයේය. සත්වන පරම්පරාව දක්වා අවනම්බු නොලබන ලද්දේය. ජාතිවාදයෙන් අවනම්බු නොකරණ ලද්දේය. මම ඔහුගේ මව්පියන් දනිමි.

පින්වත්නි, අංගක තරුණයා ප්‍රාණඝාත කරන්නේය. නුදුන්දෙයද ගන්නේය, අන් භාර්යාවන් වෙතටද යන්නේය. බොරුද කියන්නේය. රහ මෙරද පානය කරන්නේය. පින්වතිනි, දැන් මෙසේ ඇති කල්හි, ජාතිය කුමක් කරන්නේද? මන්ත්‍ර හෝ වංශය කුමක් කරන්නේද?

"පින්වත්නි, බ්‍රාහ්මණ තෙමේ යම් කලෙක පටන් සිල්වත්වූයේ, වඩන ලද සිල් ඇත්තේ, සම්පූර්ණ ශීලයෙන් යුක්තවේද, නුවණ ඇති පණ්ඩිත වූයේ, යාග කරන්නන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක් වේද, පින්වත්නි මේ අංගදෙකින් යුක්තවූ බමුණුවෙමි'යි කියන්නේ නම් ඔහු හරිආකාර කියන්නේය, බොරුකීමට නොපැමිණෙන්නේයයි බ්‍රාහ්මණ යෝ ප්‍රකාශකරති."

**21.** "බ්‍රාහ්මණය, මේ අංගදෙකෙන් එක් අංගයක් හැර එක් අංගයකින් යුත්වූ බමුණු තෙම 'මම බමුණෙුවෙමියි, කියන්නේ නම් ඔහු හරිආකාරයෙන් කියන්නේය, (එසේ කීමෙන්) බොරුකීමට නොපැමිණෙන්නේයයි ප්‍රකාශකළ හැකිද?

"භවත් ගෞතමයන් වහන්ස, මේ කාරණය නම් නොහැකිය. භවත් ගෞතමයෙනි, නුවණ ශීලයෙන් පිරිසිදු කරණ ලද්දීය. ශීලය නුවණින් පිරිසිදුකරණ ලද්දේය. යමෙකු කෙරෙහි ශීලයවේද, ඔහු කෙරෙහි නුවණවේ; යමෙකු කෙරෙහි නුවණ වේද ඔහු කෙරෙහි ශීලයවේ. ශීලය ඇත්තාහට නුවණ ඇතිවේ. නුවණ ඇත්තාහට ශීලය ඇතිවේ. ශීල-නුවණ දෙක ලොකයෙහි ඉතා උතුම්යයි කියනු ලැබේ. භවත් ගෞතමයෙනි, යම්සේ එක්

අතකින් අනිත් අත සෝදන්නේද, එක් පයින් අනිත් පය අතුල්ලා සෝදන්නේද, එමෙන්ම, භවත් ගෞතමයෙනි, නුවණ ශීලයෙන් පිරිසිදු කරණ ලද්දීය, ශීලය නුවණින් පිරිසිදු කරණ ලද්දේය. යමෙකු කෙරෙහි ශීලය වේද, ඔහු කෙරෙහි නුවණවේ. යමෙකු කෙරෙහි නුවණවේද, ඔහු කෙරෙහි ශීලයවේ. සිල්වතාට නුවණ ඇතිවේ; නුවණැත්තාට ශීලය ඇතිවේ. ශීල නුවණ දෙක ලොකයෙහි ඉතා උසස්යයි කියනු ලැබේ.

**22.** "බ්‍රාහ්මණය, මේ කාරණය මෙසේ මය, නුවණ ශීලයෙන් පිරිසිදු කරණ ලද්දීය. යමෙකු කෙරෙහි සිල් ඇත්තේද ඔහු කෙරෙහි නුවණ ඇත්තේ වේ. යමෙකු කෙරෙහි නුවණ ඇත්තේ වේද, ඔහු කෙරෙහි සිල් ඇත්තේ වේ. සිල් ඇත්තාහට නුවණ ඇත්තේය. නුවණ ඇත්තාහට සිල් ඇත්තේය. ශීල නුවණ දෙක ලොකහෙි ඉතා උසස්යයි කියනු ලැබේ.

"බ්‍රාහ්මණය, ඒ ශීලය කවරේද? ඒ නුවණ කවරීද?"

"භවත් ගෞතමයන් වහන්ස, අපි මේ කරුණෙහි ශීල නුවණ දෙක පමණක්ම ප්‍රධාන කොට ඇත්තෝ වම්හ. භාග්‍යවතුන් වහන්සේ ශීල නුවණ දෙක විස්තර කරණ සේක්වා."

**23.** "එසේ නම් බමුණ, හොඳින් කල්පනා කරව, දේශනා කරන්නෙමි."

සොණදණ්ඩ බ්‍රාහ්මණ තෙමේ "එසේය, පින්වතුන් වහන්සැ"යි භාග්‍යවතුන්හට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

**24.** "බ්‍රාහ්මණය, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනා ඥාන ආදී විද්‍යා අට සීලසංවරය ආදී හසුරුවන ධර්ම පහළොව යන අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙව් මිනිසුන්ට ගුරුවරයෙක්වූ, (චතුරාර්ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්මසතර අවබොධකළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ,

බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් සහ මිනිසුන් සහිතවූ, සත්ත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැක පැහැදිලි කොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ, දස ආකාරයෙන් නියම විදියට වචන ශබ්ද කරන්නාවූ ඛ්‍යඤ්ජන සහිත, සියලු ලෙසින් සම්පූර්ණවූ පිරිසිදුවූ සියලු ශාසනමාර්ග බ්‍රහ්මචර්යාව ගෙන හැර දක්වති.

**25.** 'ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි, ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය. 'ගෘහවාසය පීඩා සහිතයි. රාගාදී කෙලෙස් සහිත මාර්ගයකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශයමෙන් නිදහස්ය. ගිහි ගෙයි වසන්නාහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැලිරැවුලු කපාදමා සිව්රු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි' කියායි.

'ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාසිය හැර, ස්වල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණවේ. මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවරසීලයෙන් යුක්ත වූයේ, යහපත් හැසිරීමෙන් හා වරද නැති පැවැත්මෙන් යුක්ත වූයේ, ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භය දක්නා ගති ඇත්තෙක් වූයේ, යහපත්වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්තවූයේ ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ ජීවිත පැවතුම් ඇත්තේ වෙයි. ශීලයෙන් යුක්ත වූයේ වෙයි.

**26.** "බමුණ, භික්ෂුනමක් කෙසේ නම් සීලසම්පන්න වේද? බමුණ, මේ සස්නෙහිවූ භික්ෂුනමක් ප්‍රාණවධය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහාතබන ලද ආයුද ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ

කරුණාවන්තවූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතුව වාසය කෙරේද මෙයද ඔහුගේ සීලයක්වේ. නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන්දෙයම කැමතිවන්නේ, සොරනොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේද මෙයද ඔහුගේ සීලයෙකි. අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන්වූයේ බ්‍රහ්මචරිවේද මෙයද ඔහුගේ සීලයකි. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකරේද මෙයද ඔහුගේ සීලයෙකි. පිසුණු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතැනින්, අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද, මෙසේ හෙද වූවන් ගළපන්නේ සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇතිකරණ තෙපුල් කියන්නේවේද මේද ඔහුගේ සීලයෙකි. ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, යම් වචනයක් නිදොස් වේද, කනට සැපද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේද මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්මද දියුණුවට හේතුවන වචන කීමද, මෙයද ඔහුගේ සීලයෙකි.

"තණ, ගස්, වැල්, සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන කෑම ඇත්තේ, රාත්‍රි කෑමෙන්

හා අවේලෙහි කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. මල් ගඳ විලවුන් පැළඳීම ඉන් සැරසීම, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. අමුවූ ධාන්‍යවර්ග පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේ, අමුමස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනුලමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද වේ. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේ, එළුවන් හා තිරෙළුවන් පිළිගැනීමෙන් තොරවූයේ කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද, සම්පූර්ණයෙන් තොරවූයේය. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. ගනුදෙනු කිරීමය, තරාදි ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මිශ්‍ර වඤ්චා කිරීමය, වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය, යන මෙයින්ද සම්පූර්ණයෙන් වැළැක්කේය, මෙයද ඔහුගේ සීලයක්වේ.

**27.** "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මූලබීජය, ඛන්ධබීජය, ඵළුබීජය, දළුබීජය, පස්වැනිවූ බීජබීජය යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේ නම් මෙයද ඔහුගේ එක් සීලයක්වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙනලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, නොඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛයාත වහන් දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත් කොට තබා ප්‍රයෝජන ගැන්මයයි කියන ලද පසුවට තබා ප්‍රයෝජන ගැන්මෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේ නම්, මෙද ඔහුගේ සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, වැඩක් නැති කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරැස් හෝ කළ බෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණ්ඩොවුන් කෙළියය, හුණගස් ඔසවා නැටීමය, මිනී ඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මීවුන් හා පොරය, ගවයින් හා පොරය, එළුපොරය, මෙණ්ඩක එළුපොරය, කුකුළුපොරය, වටුපොරය, දඬු (පොලු) පොරය, තොරතුරු ඇනීමය, මල්ලව යුද්ධය, යුද්ධය, ඇත් අස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත් මෙසේ මෙබඳු විසූලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකේ නම් මෙයද ඔහුගේ සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙනලද කෑම කා (දූ පෝරු ආදියෙහි කෙළිම්වූ) ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය බිම් මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරිමය, දූකැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටමිටි ගසා ඇත් අස් ආදී රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, නලා පිඹීමය, ක්‍රීඩා නගුල් ගෙන සෙල්ලම් සීසෑමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන්ගුරුවා තනා ක්‍රීඩාකිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැණ කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම්

ආදියෙන් කෙළීමය. ඒ ඒ දොෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්ද මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

28. "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දික්හඟලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇතිරිය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළුලොම් සුදු ඇතිරිය, එළු ලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදී රූපයෙන් විසිතුරු එළුලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති ඇතිරිය. දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය, රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එකවිට නැට්ටුක්කාරියන් දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහ ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරන ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබනලද රතුපාට කොට්ට ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කෙරෙත්ද මෙසේ මෙබඳුවූ උස් අසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි,

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, මූනබලන කන්නාඩි, අඳුන් තෙල් පාවිච්චිය හා සුවඳ, මූණේ ගානා සුවඳ කුඩු, මූණේ ගානා සුවඳ ද්‍රව්‍ය, අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය, විසිතුරු දඬුගෙන හැසිරීමය, බෙහෙත් නල එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙනයෑම, විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය. නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය, දික්වූ දහවලු ඇති සුදුරෙදි ඇඳීමයයි මෙසේවූ සැරසීම් හා අඬුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්ද මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**29.** "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය මහ ඇමතියන් පිළිබඳ කථාය, සෙනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය, මාලා පිළිබඳ කථාය, ගන්ධ ද්‍රව්‍යයන් පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි දරුවන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ තේරුම් නැති කථාය, ලොකය පිළිබඳ කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්ද මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**30.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි' 'ඔබ මේ ධර්ම විනය කුමකැයි දන්නෙහිද?' ඔබ වරදවා පිළිපදින්නෙහිය, මම මනාකොට පිළිපදින්නේ වෙමි'. 'මාගේ වචන යහපත්ය, හෝ අර්ථ සහිතය, ඔබගේ වචන අර්ථ රහිතය' 'පළමු කිය යුත්ත පසුව කීයෙහිය. පසුව කිය යුත්ත පළමුව කීයෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල නිෂ්ඵල විය. ඔබට වාදාරොපනය කරණ ලදී. නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව' යන ආදී දෝෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්ද මෙසේ මෙබඳු දෝෂාරොපණ කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**31.** "එසේ සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියන්ගේ,

බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙන, ‘මෙතනින් අසවල් තැනට යව අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණයව, එතැනින් අසවල් දෙය ගෙණෙව’යි දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්ද මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැළැක්කේ නම් මෙයද ඒ ඔහුගේ එක් සීලයෙකි.

**32.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා කුහකයෝද, සිව්පසය උදෙසා කථා කරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන් කරන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද ලාභයකින් ලාභයක් සොයන්නෝද වෙත්. මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග ආදියෙන් වැළැක්මක් වේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි."

**33.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, හෙනගැසීම ආදී මහ නිමිතිබලා කියන ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය ලක්ෂණ ශාස්ත්‍රය, මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන ශාස්ත්‍රය, ගිනිදෙවියා පිදීමය, දබ්බිහොමය, ථුස හොමය, තණ්ඩුල හොමය, කණ හොමය, සප්පි හොමය තෙල හොමය, මුඛ හොමය, ලේ හොමය, ශරීර විද්‍යා වාස්තු විද්‍යා නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යා, භූත විද්‍යා, නාග විද්‍යා විෂ විද්‍යා ගෝනුසු විද්‍යා මී විද්‍යා, කුරුලු විද්‍යා, කපුටු විද්‍යා, ජීවත කාලය කීම, ආයුධ වැළැක්ම, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා, හේතුකොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු පහත් විද්‍යා හේතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**34.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මිණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය ස්ත්‍රී ලක්ෂණය, පුරිස ලක්ෂණය, පිරිමිදරු ලක්ෂණය, ගෑනුදරු ලක්ෂණය, දාස ලක්ෂණය, දාසි ලක්ෂණය, ඇත් ලක්ෂණය,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අශ්ව ලක්ෂණය, කැස්බෑ ලක්ෂණය, එළුලක්ෂණය, මීහරක් ලක්ෂණය, ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය, කුකුළු ලක්ෂණය, වටු ලක්ෂණය, තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය, මුව ලක්ෂණයයි, මෙබඳු පහත් විද්‍යාවන් කරණ කොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයෙකි.

**35.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැර යෑම වන්නේය. අසවල් දින ඇතුළු නුවරට එන්නේය. අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඒම වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හේතුකොට ලාමක ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයක් වේ.

**36.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'චන්ද්‍රග්‍රහණය වන්නේය, සූර්ග්‍රහණය වන්නේය, තාරකා සමාගමය වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමග යෑම වන්නේය, තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය, තාරකාවන්ගේ නොමග යෑම් වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළොව කම්පාව වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ, හිරු තාරකාවන්ගේ නැගීම හා බැහීමද කෙළෙසීමද පිරිසිදු වීමද වන්නේය, චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය චන්ද්‍ර සූර්යයන්ගේ මාර්ගයෙහි

ගමන මෙබඳු විපාක ඇති වන්නේය, ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇති වන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය, දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම මෙබඳු විපාක ඇති වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටුවීම හා පිරිසිදු වීම මෙබඳු විපාක ඇතිවන්නේයයි' කියා මෙසේ පහත් විද්‍යා හේතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හේතු කොට ගෙණ කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

37. "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය, යහපත් ආහාරපාන ඇතිවන්නේය, ආහාර පාන නැති වන්නේය, නිර්භය ඇතිවන්නේය, භය ඇතිවන්නේය, රෝග ඇතිවන්නේය, නිරෝගී බව ඇතිවන්නේයයි' කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන් කිරීමය, කොටස්කර ගණන් කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණ කොට වැරදි ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හෙතුවෙන් වන වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

38. "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථාකිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇති කිරීමය, දුර්ගර්භකරණය, ගර්භවිරොධි කරණය, දිව් තද කිරීමය, නූල් බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්න ඇසීමය, ගෑනුදරුවන්ගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණය කොට ප්‍රශ්න ඇසීමය, හිරු වැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම්

කිරීමය, කටින් ගිනිදැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරේත්ද මෙබඳුවූ පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

**39.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීම, කාර්යය සමෘද්ධි කටයුතු කර්මය, මන්ත්‍ර කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මූන සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩු කය විරේකය, යටිකය විරේකය, හිස විරේකය, කන්තෙලය, ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍ය කිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකමය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකම්ය, මූලික බෙහෙත් දීමය, සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට, වැරදි ජීවත්වීමෙන් ජීවිකා කෙරේත්ද මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්මක් නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

**40.** "බමුණ, මෙසේ ශීල සම්පන්නවූ භික්ෂුහට භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ ශීලසංවරය හෙතු කොට ගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:- බමුණ ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම, අම්බට්ඨය, සීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ශීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය. ආර්යවූ (උතුම්වූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂු තෙම, තමන් තුළ පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. බමුණ, මෙසේ දැක්වූ ශීලයෙන් යුක්තවූ භික්ෂුව ශීලසම්පන්න නම් වේ.

**41.** "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන්

යුක්තවූද, මේ උතුම්වූ සන්තෝෂයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, කඳු පලාත්ද, කඳුරැලි ගල්ගුහාවන් හෝ මහා මගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ ඉඩකඩ ඇති තැන් සහ තණ ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළැක්කේ, පර්යංකය බැඳ කකුල් අකුලුවා හිඳ ශරීරයේ උඩු කොටස කෙලින් තබා නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවාගෙණ හිඳී.

**42.** "ඔහු ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභ සිත වෙන් කොට පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව පණඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වාසයකරයි. ක්‍රොධ දොෂයෙන් වෙන්ව සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේ. අලස බව දුරුකොට සිත පිරිසිදු කෙරේ. උඩඟු බව හා කුකුස දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, සිත උඩඟු බව හා කුකුසෙන් පිරිසිදු කෙරේ. විචිකිච්ඡාව (සැකය) දුරුකොට පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේ; විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

**43.** බමුණ යම්සේ පුරුෂයෙක් ණයගෙණ කර්මාන්තයන්හි යොදන්නේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණුවන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹු දරුවන් ආරක්ෂා කරණ පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඔහට මෙබඳු අදහසක් ඇතිවේ. 'මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹු දරුවන් පොෂ්‍යය කිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය, කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

**44.** "බමුණ, යම්සේ රොගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේද, ඕහට ආහාර රුචි නොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීර බලය ඇතිවන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳුද යත්: 'මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන් බව ඇති කෙනෙක් වීමි. මට බත් රුචියද නොවීය, ශරීර බලයද නැතිවිය, ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය. කාය බලයද තිබේය' කියායි. ඔහු ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසටද පැමිණෙන්නේය.

**45.** "බමුණ, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසු කලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සතුටට පැමිණෙන්නේය.

**46.** "බමුණ, යම් සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත්වූ, තමා කැමති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි වැඩකරුවෙක් වන්නේද, ඔහු පසු කලක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර සිය කැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාසභාවයෙන් මිදුනෙක්මි. තමා අධිපති කොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත්නූන කෙනෙක් වීමි. අනුන්ට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමති තැනෙක යා හැක්කේද වෙමි'යි

කියායි. ඔහු ඒ දාසභාවයෙන් මිදීම හේතුකොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

47. "බමුණ, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේද, ඔහු මද කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොර සතුරන්ගෙන් පීඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්:- 'මම පෙර ධනවත් වූයෙමි, භොග සම්පත් සහිත වූයෙමි, දුර්ලභ භික්ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණියෙක් වූයෙමි. එසේවූ මම දැන් එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගය එතර කිරීම නිමිති, කොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සතුටටද පැමිණෙන්නේය.

48. "බමුණ, ණය යම්සේද, රෝගය යම්සේද, හිරගේ යම්සේද, දාසභාවය යම්සේද, දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂු තෙමේ පහනොකළ (පඤ්චනීවරණ) කුසල් වළක්වන කරුණුපහ තමා කෙරෙහි ලා නුවණින් දකී. බමුණ, ණය නැති බව යම්සේද, නිරෝගී බව යම්සේද, සිරගෙන් මිදීම යම්සේද, අනුන්ට යටහත් නැති බව යම්සේද, භය නැති භූමිය යම්සේද, එපරිද්දෙන්ම බමුණ, භික්ෂු තෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ ලා දක්නේය.

49. "පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ භික්ෂුහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසහගත සිත් ඇත්තහුගේ නාම කය (වේදනාදී ස්කන්ධ හතර) සංසිඳෙයි සංසිඳිනු කය ඇති තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) පැමිණෙයි.

50. "ඒ භික්ෂු තෙමේ වස්තුකාම ක්ලෙශකාමයන්ගෙන් වෙන් වූයෙම්, අකුල ධර්මයන් කෙරෙන්ද වෙන් වූයේම අරමුණෙහි

සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම සහිතවූ, සිතෙහි විවේකයෙන් උපන් ප්‍රීතියම සැපකොට ඇති, පළමුවෙනි ධ්‍යාන කුසල චිත්තය තමා තුළ ඉපදීම් වසයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරේද ඔහු විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ (සකල) ශරීරයම සැපවත් කෙරෙයි. සම්පූර්ණයෙන් පුරවයි. සැමතන්හි පතුරවයි. ඒ ඔහුගේ පළමුවෙනි විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන් සකල ශරීරයෙහිම පළමුවෙනි ධ්‍යානයෙන් යුත් සැපය පතුරුවයි.

**51.** "බමුණ, යම්සේ දක්ෂවූ ස්නාන ද්‍රව්‍ය සපයන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ ස්නානයට ගන්නාවූ සුණු ලොහ තලියක බහා දිය ඉසිමින් අතින් අනමින් පිඩු කරන්නේද, එවිට ඒ මේ ස්නාන කුඩුගුලිය දියෙන් යුක්ත වේ, ජලය හාත්පසින් කාවැදුනේ වේ. එහි ඇතුළත හා පිටතද සියලු තන්හිම ජලයෙන් පහස්නා ලද්දේ වේ. එහෙත් බින්දු වශයෙන් ජලය ඉන් නොවැගිරේද,

"බමුණ, එපරිද්දෙන් ඒ භික්ෂු තෙමේ, විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි, හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, සැමතන්හි පතුරවයි. ඔහුගේ සියලු ශරීරයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් පැතිරෙයි. බමුණ, මෙයද මේ ආත්මයෙහි දැක්කයුතු විපාක ඇත ඵලයකි මෙය ඉහතකී මේ ආත්මභාවයෙහි දැකිය යුතු විපාක ඵලයන්ට වඩා බොහෝ මනොඥය, බොහෝ ශ්‍රෙෂ්ඨද වෙයි.

**52.** "බමුණ, නැවතද භික්ෂු තෙමේ අරමුණෙහි සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම යන මොවුන්ගේ සන්සිඳීමෙන් අද්ධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති දෙවැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කරයි. ඒ මහණ තෙමේ මේ කය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි. හාත්පසින් තෙමයි. සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කරයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි දෙවැනි ධ්‍යානයෙන් සැප පැතිරේ.

53. "බමුණ, යම්සේ ඇතුළතම හටගත් ජලය ඇති දියවිලක් වේද ඒ විල පිළිබඳ පෙර දිගින්ද, අපරදිගින්ද, උතුරු දිගින්ද, දකුණු දිගින්ද, දිය එන මගක් නැත්තේවේද වැස්සද කලින් කල මනාසේ වැසි වැසීම නොකරන්නේද, එසේවූ ඒ විලෙන් සිහිල් දිය දහර පොළොව බිඳ නැගී ඒ මුළු විලම සිහිල් දියෙන් පතුරුවයි, හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි. එහි හැම තැන දියෙන් ස්පර්ශකෙරෙයි. ඒ සියලු විලෙහි සීත ජලය නොපැතිර පවත්නා තැනක් නම් නැත්තේය. බමුණ, එපරිද්දෙන් මේ භික්ෂු තෙමේ මේ මුළු ශරීරයම සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් සියලු තැන පතුරුවන ලද්දක් කෙරේ, ප්‍රීති සැපයෙන් හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, ඉන් සැමතැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි දෙවෙනි ධ්‍යාන සැපයෙන් පැතිරෙයි.

මෙයද ඔහුගේ සීල ආදියෙහි වන්නකි.

54. "නැවතද බමුණ, ඒ භික්ෂු තෙමේ ප්‍රීතියෙහි නොඇල්මෙන් මැදහත් බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (උපේක්ෂා) සැප දුක් දෙකට මැදහත් විඳීම ඇත්තේය, සිහි ඇත්තේය. සැපයෙන් විසීම ඇත්තේයයි ආර්යයෝ කියත්ද ඒ තුන්වැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ භික්ෂු තෙමේ මේ සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේ. ඒ සැපතින් හාත්පසින් තෙමෙයි, සම්පූර්ණයෙන් පුරවයි, එයින් සැතැනම පැතිරෙයි. ඒ භික්ෂුහුගේ සියලු ශරීරයෙහි තුන්වැනි ධ්‍යාන සැපයෙන් පැතිරෙයි.

55. "බමුණ, යම්සේ නිල්මානෙල් විලක හෝ සුදු නෙලුම් විලක හෝ රතු නෙලුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුනු දියෙන් උඩට නො නැගුනු, දියතුලම ගැලී වැඩෙන්නාවූ සමහර නිල් මානෙල් හෝ සමහර සුදු නෙළුම් හෝ සමහර රත් නෙළුම් හෝ වේද්ද, ඒ නිල් මානෙල් ආදීහු අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, සම්පූර්ණයෙන් වැගුරුණාහු, හාත්පසින් ස්පර්ශ ලද්දාහු වෙත්ද,

ඒ නිල්මානෙල් සුදු නෙළුම් රත් නෙළුම්, යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් නො පහස්නා ලද්දේ නොවේද බමුණ, එපරිද්දෙන් ඒ භික්ෂු තෙමේ මේ මුළු ශරීරයම දුරුකළ ප්‍රීතිය ඇති සැපයෙන් සියලුතැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරෙයි, ඉන් හාත්පසින් තෙමෙයි, සම්පූර්ණයෙන් පුරවයි. හාත්පසින් ස්පර්ශ කෙරෙයි. ඔහුගේ සම්පූර්ණ ශරීරයෙහි ප්‍රීති නැති තුන්වැනි ධ්‍යානයෙන් පැතිරයයි.

මෙයද ඔහුගේ සීල ආදියෙහි වන්නකි.

**56.** "නැවතද බමුණ, ඒ මහණතෙමේ සැප දුරුකිරීමෙන්, දුක් දුරු කිරීමෙන්ද පළමුකොටම සැප දුක් වේදනා නැතිව යාමෙන් දුක්ද නොවූ, සැපද නොවූ, උපෙක්ඛා-සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, හතරවෙනි ධ්‍යාන (කුසල) චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම, පිරිසිදුවූ, අතිශයින් බබලන (ධ්‍යාන) සිතින් පතුරුවන්නේය. ඒ ධ්‍යානලාභී භික්ෂුහුගේ සම්පූර්ණ ශරීරයෙහි පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ හතරවැනි ධ්‍යාන සිතින් පැතිරයයි.

"බමුණ, යම්සේ කිසියම් පුරුෂයෙක් පිරිසිදුවූ සුදු ඇඳුමකින් හිස සිටපොරවා උන්නේ වේද, ඔහුගේ මුලු ශරීරයෙහි එකම තැනකුදු සුදුවතින් නො වසන ලද්දේ නොවේ. බමුණ, එපරිද්දෙන්ම ධ්‍යානලාභී භික්ෂු තෙමේ මේ සියලු ශරීරයම පිරිසිදුවූ, අතිශයින්ම බබලන්නාවූ හතර වැනි ධ්‍යාන සිතින් පතුරවා හුන්නේ වේ. ඒ භික්ෂුහුගේ සියලු ශරීරයෙහි පිරිසිදුවූ, බබලන්නාවූ හතර වැනි ධ්‍යාන සිතින් පැතිරයයි. (සතර වැනි ධ්‍යාන චිත්තයෙන් සකල ශරීරයම පතුරුවන ලද්දේයයි කී සේයි.)

මෙයද ඔහුගේ සීල ආදියෙහි වන්නකි. බමුණ, මේ ඔහුගේ සීල ආදියයි.

**57.** "නැවතද, බමුණ, ඒ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පා

නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි. ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඔහු මෙසේ දැන ගණී. 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තය. *සතර මහාභූතයන්ගේ හේතුවෙන් හටගත්තේය. මව්පියන් නිසා හටගත්තේය. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඇඟ ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ, ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඤ්ඤාණය ශරීරය ආශ්‍රය කෙරේ. මෙහිම බැඳුනේ වෙයි' කියායි.

58. "බමුණ, යම්සේ යහපත්වූ, පිරිසිදු ආකාරයෙන් උපන්නාවූ, අටැස්වූ, ගල් ආදී දොස් බැහැර කිරීමෙන් හොඳ ලෙස සකස් කරණ ලද්දාවූ, නිර්මලවූ, විශේෂයෙන් ප්‍රසන්නවූ, කැලැල් නැතිවූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෛඩූර්ය මැණිකක් වේද, එහි නිල්වූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේ, ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේය. 'මේ වෛඩූර්ය මැණික මනාසේ කාන්තිමත් හෙයින් යහපත් වේ, පිරිසිදු ආකරයෙන් උපන්නේය, අටැස් ඇත්තේය, දොස් දුරුකිරීමෙන් මනාකොට සකස් කරණ ලද්දේය, නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, කැලැල් නැත, සියලු ආකාරයෙන් සම්පූර්ණය. ඒ මැණිකෙහි මේ නීලවර්ණවූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේය' කියායි.

"බමුණ, එපරිද්දෙන්ම යෝගීවූ මේ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇතිවූ කල්හි මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස සිත එලවා තබයි, ඒ සඳහා විශෙෂයෙන් සිත නමයි. ඒ භික්ෂු තෙමේ මෙසේ දන්නේය, කෙසේද යත්: 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තවේ. සතර මහාභූතයන්ගෙන් හටගත්තේය, මව්පියන් නිසා

* පස, ජලය, ගින්න, හුළඟ

හටගත්තේය. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඥ්ඥාණය මේ ශරීරය ආශ්‍රය කෙළේ වෙයි, මෙහිම බැඳී සිටියේය' කියායි.

මෙයද ඔහුගේ ශීලාදියෙහි වන්නකි.

**59.** "ඔහු මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ රූපයක් මනා කොට නිපදවීම පිණිස සිත එලවා තබයි. වෙහෙසින් නමයි. ඔහු ආකාර වත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවන ලද) ශරීරය හා අත පය ආදී අවයව ඇති, විකලනුවූ ඉඳුරන් ඇති, මේ ශරීරයෙන් අන්‍යවූ ශරීරයක් හොඳ ලෙස සාදයි.

**69.** "බමුණ, යම්සේ පුරුෂයෙක් මුදු තණ ගසින් තණබඩය උදුරා ගැනීම කරන්නේද, මේ තණ ගසය, මේ තණ බඩය, තණගස අනිකෙක, තණබඩය අනිකෙක, තණ ගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය, තනන ලද්දේය යන වැටහීම ඕහට පහල වන්නේය.

"බමුණ, යම්සේ පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේද ඔහුට මෙබඳු අදහසක් වන්නේය. 'මේ කඩුවය මේ කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන් කඩුව ඉවත්කරණ ලද්දේය' කියායි.

"බමුණ, යම් පුරුෂයෙක් සර්පයෙකු සැවයෙන් පහ කරන්නේද ඕහට මේ සර්පයාය, මේ සැවය, සර්පයා එකෙකි. සැව අනිකකි, සැවයෙන් සර්පයා වෙන්කරණ ලද්දේයයි, වැටහීමක් ඇතිවන්නේය.

"බමුණ, එසේම භික්ෂුතෙමේ මෙසේ සිත සමාධිගතවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි

කල්හි, සිතින් උපදවන කය මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. ඔහු මේ කයින් රූ ඇති, සිතින් මවනලද, සියලු ශරීරය සහ අතපය ආදී අවයව ඇති, නොපිරිහුනු ඉන්ද්‍රිය ඇති වෙන කයක් මවයි.

මෙයද ඔහුගේ සීලාදියෙහි වන්නකි.

**61.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, නැවතීමට පැමිණි කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට දක්වයි. එකෙක්ව බොහෝ සේ වෙයි. බොහෝ සේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට පර්වතය හරහට නොහැපෙමින් යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පරියන්කයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වයි.

**62.** "බමුණ, දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරු අතවැසියෙක් හෝ යහපත්සේ පදම් කළ මැටියෙන් කැමති කැමති වලන් ආදී වර්ගයන් යම්සේ කරන්නේද, නිපදවන්නේද, බමුණ, දළ කැටයම් කරුවෙක් හෝ අතවැසියෙක් හෝ සකස්කළ දළයෙහි යම්සේ කැමති කැමති දළ කැටයම් වර්ගයක් කරන්නේද, නිපදවන්නේද, බමුණ, දක්ෂරන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ පදම්කළ රණින් කැමති කැමති රන් අබරණ ජාතීන් යම්සේ කරන්නේද නිපදවන්නේද-බමුණ, එසේම භික්ෂුව සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධි විධි පිණිස සිත ඉදිරිපත්

කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් ඍද්ධි විධි වෙන් වෙන් කොට දක්වයි. එකෙක්ව බොහෝ සේ වෙයි, බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට අහසෙයි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වත හරහට නොහැපෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කරයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව කෙරෙයි.

මෙයද ඔහුගේ ශීලාදියෙහි වන්නකි.

**63.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, දිව්‍ය කණ සම්බන්ධ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඒ භික්ෂුව පිරිසිදුවූ මිනිස් බව ඉක්මවූ දිව්‍ය කණ සම්බන්ධ ඥානයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද, දෙයාකාර ශබ්දයන් අසයි.

**64.** "බමුණ, දික් මගට පැමිණි පුරුෂයෙක් බෙර හඬද, මිහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද, යම්සේ අසාද, ඔහුට මේ බෙරහඬයයිද, මිහිඟු බෙරහඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬයයිද සිතෙන්නේය.

"බමුණ, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇතිකල්හි, මෘදුවූකල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, ස්ථිර බවට පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, දිව්‍ය කණෙන් ලබන ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. ඔහු මෙසේ පිරිසිදුවූ මිනිස් කණ ඉක්මවූ දිව්‍ය කණෙන් ලබන ඥානයෙන් දිව්‍යමයවූද,

මනුෂ්‍යමයවූද දුරෙහිවූද, සමීපයෙහිවූද දෙයාකාර ශබ්දයන් අසයි. මෙයද ඔහුගේ විද්‍යාවෙහි වූවකි.

**65.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශ ඇති කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුවූ කල්හි, ස්ථිර බවට පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පර සිත් දැනගන්නා ඤාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තම සිතින් පිරිසිඳ දනියි. රාග සහිත සිත රාග සිතයයි දනියි. රාගය පහවූ සිත රාගයෙන් තොරවූ සිතයි දනියි. ද්වෙෂ සහිත සිත දොස සිතයයි දනියි ද්වෙෂය පහවූ සිත ද්වෙෂයෙන් තොරවූ සිතයයි දනියි. මොහ සහිත සිත මොහ සිතයයි දනියි, මොහය පහවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුනු සිත හැකුලුනු සිතයයි දනියි, විසුරුණු සිත විසුරුණු සිතයයි දනියි. මහත් බවට ගිය සිත, මහත් බවට ගිය සිතයයි දනියි. මහත් බවට නොගිය සිත, මහත් බවට නොගිය සිතයයි දනියි. කාම සහිත සිත, කාම සිතයයි දනියි. ලෞකික හිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනියි. සමාධිගතවූ සිත සමාධිගත සිතයයි දනියි, සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනියි, (ක්ලෙශයෙන්) මිදුනු සිත, මිදුනු සිතයයි දනියි. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දනියි.

**66.** "බමුණ, සැරසෙන ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළමාවයසෙහි සිටියෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු, නොකිළිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය භාජනයෙක්හි හෝ තමාගේ මූනේ ශොභාව පරීක්ෂා කරන්නේ යම්සේ කැලල් සහිත නම් කැලල් සහිතයයි දැනගනීද, කැලල් රහිත නම් කැලල් රහිතයයි දැනගනීද,

"බමුණ, එසේම භික්ෂුතෙම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පරසිත් දැනගන්නා ඤාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් දැන ගනියි. රාග සිත රාග සිතයයි දනියි. රාගයෙන් තොරවූ සිත රාගයෙන් තොරවූ සිතයයි දනියි. දොස සිත දොස සිතයයි දනියි. දොසයෙන් තොරවූ සිත දොසයෙන් තොරවූ සිතයයි දනියි. මොහසිත මොහ සිතයයි දනියි, මොහයෙන් තොරවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුණු සිත හෝ විසුරුණු සිත හෝ මහත් බවට ගිය සිත හෝ මහත් බවට නොගිය සිත හෝ කාම සහිත සිත හෝ අනුත්තර සිත හෝ එකඟවූ සිත හෝ එකඟ නොවූ සිත හෝ දනියි. මිදුණු සිත හෝ මිදුණු සිතයයි දනියි. නොමිදුණු සිත හෝ නොමිදුණු සිතයයි දනියි.

මෙයද භික්ෂුගේ ප්‍රඥාවෙහි වූවෙකි.

**67.** "හේ තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ, කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහිකෙරෙයි. කෙසේදයත් 'එක් ජාතියක්ද, දෙ ජාතියක්ද, තුන් ජාතියක්ද, හතර ජාතියක්ද, පස් ජාතියක්ද, දස ජාතියක්ද, විසි ජාතියක්ද, තිස් ජාතියක්ද, සතළිස් ජාතියක්ද, පණස් ජාතියක්ද, සියක් ජාතියක්ද, දහස් ජාතියක්ද, සියක් දහස් ජාතියක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි, අසුවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර

කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙම්, මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් විදියේ පෙර ජීවිත සිහි කෙරෙයි.

68. "බමුණ, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් තමන්ගේ ගමට එන්නේද, ''මම, සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. එගමිනිදු අසුවල් ගමට ගියෙමි, එහිද මෙසේ සිටියෙමි. මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට පැමිණියෙමි'යි හෙතෙම දන්නේය.

"බමුණ, එපරිද්දෙන්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. හේ නොයෙක් පෙරවිසීම් සිහිකෙරෙයි. කෙසේද යත්: 'එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද, නොයෙක් කල්ප විස්සකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්ප රාශියකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්පයන්ද, 'අසුවල් තැන වීමි, මෙබඳු නම් ඇත්තෙමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු පාට ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සැප දුක් වින්දෙමි මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු පාට ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සුව දුක් වින්දෙමි, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිත, පෙරවිසූ පිළිවෙළ දැක්වීම් සහිත, නොයෙක් ආකාරවූ පෙරවිසීම් සිහි කෙරෙයි.

මෙයද ඔහුගේ ප්‍රඥාවෙහි වූවෙකි.

**69.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ මරණින් පසු උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ පිරිසුදුවූ, මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී, පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොව ගියාවූද නරකලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී. 'මේ පින්වත් සත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය වචන දුශ්චරිතයෙන් යුක්තය. හිතේ දුශ්චරිතයෙන් යුක්තය. උත්තමයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය. මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ, නිරයට පැමිණෙත්. නැතහොත්, මේ පින්වත් සත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබණින්නෝය, සත්‍යය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. මරණින් මතු යහපත් පැමිණීමවූ, ස්වර්ග ලොකයට පැමිණියෝය'යි මෙසේ පිරිසුදුවූ මිනිස්ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද, හොඳලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී.

**70.** "බමුණ, යම්සේ පාරේ හන්දියක ප්‍රාසාදයක් වේද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට ඇතුල්වෙන, ගෙයින් නික්මෙන, වීථියෙහි හැසිරෙණ පාර හන්දියේ හිඳින මනුෂ්‍යයන් දක්නේද, ඔහුට මෙසේ සිතෙයිඃ 'මේ මිනිස්සු ගෙට ඇතුළු වෙති, මොහු නික්මෙති, මොහු වීථියෙහි හැසිරෙති, මොහු පාර හන්දියේ ඉඳිති'යි කියායි. බමුණ, එසේම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට යොග්‍යවූ

කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, සිත ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්මවූ දිවඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී: මේ පින්වත් සත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය, වචන දුශ්චරිතයෙන් යුක්තය, හිතේ දුශ්චරිතයෙන් යුක්තය, උත්තමයින්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු ශරීරයෙන් වෙන්ව, මරණින් මතු අපායවූ, දුර්ගතියවූ, දුකවූ, නිරයට පැමිණෙත්.' නැතහොත්, 'මේ පින්වත් සත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබනින්නෝය, සත්‍යය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. ශරීරයෙන් වෙන්ව මරණින් මතු සුගතියවූ, ස්වර්ග ලෝකයට පැමිණියෝ'යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද සුගතියට පැමිණියාවූද දුර්ගතියට පැමිණියාවූද කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

මෙයද භික්ෂුවගේ ප්‍රඥාවෙහි වූවෙකි.

71. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන භාවයට පැමිණි කල්හි සිතේ පැසවන කෙලෙස් පහකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයි තතුලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හේතුවයයි තතුලෙස දැනගණී, මේ දුක් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී, මේ පැසවන කෙලෙස්යයි තතු ලෙස දැනගණී, මේ පැසවන ක්ලේශයන්ගේ හේතුයයි තතු ලෙස දැනගණී, මේ ඒ කෙලෙස් නැතිකිරීමයයි තතු ලෙස දැනගනී,

මේ ඒ කෙළෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගනී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ, සංසාරයට (භවයට) ඇති ආශාවන් කෙරෙන්ද සිත මිදේ, දැඩි මෝහය කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැතිවිය උතුම් හැසිරීමෙහි වසන ලදී, කටයුත්ත කරණලදී, මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ'යිද දැනගණී,

**72.** "බ්‍රාහ්මණය, යම්සේ පර්වත මුදුනක පිරිසිදු, සිත් සතුටු කරන නොකැළඹුනු, දිය විලක්වේද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ නැවතී තිබෙන්නාවූ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන්ද, කැබලිති කැටද, එහා මෙහා යන්නාවූ මසුන් රැන්ද, දක්නේද, ඔහුට මෙසේ සිතෙන්නේයඃ 'මේ දිය විල පිරිසිදුය, මනා සිත් ප්‍රිය කරන්නේය, නොකැළඹුනේය. එහි මේ සිප්පි බෙල්ලන් සක් බෙල්ලන්ද, කැටකැබලිතිද, නැවතී තිබේ. මසුන් රැන් හැසිරෙත්ය' කියායි බ්‍රාහ්මණය, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, බොහෝ කල් සිට එන ක්ලෙශයන් නැතිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තතුලෙස දැනගණී. මේ කෙලෙස් යයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් හේතුයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ. භවයට ඇති ආශාවන් කෙරෙන්ද මිදේ, මෝහය කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැතිවිය, උතුම් හැසිරීමෙහි වසනලදී, කටයුත්ත කරනලදී. මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ"යිද දැනගණී.

මෙයද ඔහුගේ ප්‍රඥාවෙහි වූවකි.

73. මෙසේ දේසනා කළ කල සොණදණ්ඩ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවේය. "භවත් ගෞතමයන් වහන්ස, දේසනාව යහපත, භවත් ගෞතමයන්වහන්ස එය ඉතා යහපත. පින්වත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කොට තබන්නේද, වසන ලද්දක් වැසුම හැර දක්වන්නේද, මං මුළාවෙකුට මග කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි කරුවලෙහි පහනක් දල්වන්නේද, එසේම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දේශනාකරණ ලද්දේය. ඒ මම ධර්මය හා සංඝයා සහිත භවත් ගෞතමයන් වහන්සේ සරණකොට යමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් ජීවත්ව සිටිනතුරු සරණගිය උපාසකයෙකැයි මා දරා ගන්නාසේක්වා. භවත් ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමග හෙටදින මාගේ දානය භාරගන්නාසේක්වා." භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් එය භාරගත්තේය.

74. ඉක්බිති සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේ ආරාධනාව භාරගත් බව දැන, හුනස්නෙන් නැගිට උන්වහන්සේ යුතු ලෙස වැඳ දකුණුපැත්ත ඉදිරියට තිබෙන ලෙස ගෞරවකිරීමෙන් ගියේය. ඒ රැය ගතවීමෙන් පසු සොණදණ්ඩ බ්‍රාහ්මණ තෙමේ තමාගේ ගෙදර මිහිරිවූ කෑමබීම ආදිය පිළියෙළ කරවා, "පින්වත් ගෞතමයන් වහන්ස, (දානය පිණිස) කාලය පැමිණියේය. දානය පිළියෙළ කොට නිමවන ලද්දේය"යි භාග්‍යවතුන් වහන්සේට කාලය දැන්වූයේය.

75. එවිට භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳපොරවා පාත්‍රා සිවුරු ගෙණ භික්ෂු සංඝයා වහන්සේ සමග සොණදණ්ඩ බ්‍රාහ්මණයාගේ ගෙදොරට වැඩිසේක. එහි වඩමවා පැණවූ ආසනයෙහි වැඩහුන්සේක. එකල්හි සොණදණ්ඩ බ්‍රාහ්මණ තෙමේ බුදුරජාණන් වහන්සේ ප්‍රධානව මහා සංඝයා වහන්සේ මිහිරි කෑම බීම ආදී දානවස්තූන් තමන්ගේ අතින්ම පිළිගන්වා දානය වළඳවා අවසානද කරවූයේය.

**76.** එවිට සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේ වළඳා නිමවූ බව දැන එක්තරා නිචාසනයක් ගෙණ එකපැත්තකටවී හුන්නේය. හිඳ, භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවේය.

"භවත් ගෞතමයන් වහන්ස, පිරිස් අතරට පැමිණි මම හුන් ආසනයෙන් නැගිට භවත් ගෞතමයන් වහන්සේට වඳින්නෙම් නම් ඒ කාරණකොටගෙණ මට පිරිස නින්දා කරන්නීය. යමෙකුට ඒ පිරිස නින්දා කරන්නීද, ඔහුගේ කීර්තියද පිරිහෙන්නේය. යමෙකුගේ කීර්තිය පිරිහේ නම් ඔහුගේ වස්තුද පිරිහෙති. අපගේ වස්තු කීර්තිය කරණකොට ගෙණ ලබන ලද්දාහුමය.

"භවත් ගෞතමයන් වහන්ස, පිරිස් අතරට පැමිණි මම ඉදින් දෑත එකතුකොට වැන්දේ නම් ඒ කරණකොට ගෙණ භවත් ගෞතමයන් වහන්සේ මා හුන් ආසනයෙන් නැගිට ගෞරව කළසේ සලකන සේක්වා භවත් ගෞතමයන් වහන්ස, පිරිස් මැදට පැමිණි මම ඉදින් හිස්වෙළුම් ඉවත් කරන්නෙම් නම් පින්වත් ගෞතමයන් වහන්සේ එය මාගේ හිසින් නමස්කාරයයි සලකන සේක්වා. භවත් ගෞතමයන් වහන්ස, ඉදින් රථයක නැඟී සිටි මම රථයෙන් බැස භවත් ගෞතමයන් වහන්සේ වඳින්නෙම් නම් ඒ නිසා පිරිස මට නින්දා කෙරේ. යමෙකුට පිරිස නින්දා කෙරේද ඔහුගේ කීර්තියද පිරිහෙන්නේය. යමෙකුගේ කීර්තිය පිරිහේ නම් ඔහුගේ වස්තුද පිරිහෙත්. අපගේ වස්තු කීර්තිය නිසාම ලබන ලද්දාහුය. භවත් ගෞතමයන් වහන්ස, ඉතින් රථයට නැගුණු මම කෙවිට ඉදිරියට නමන්නෙම් නම් එය මාගේ රථයෙන් බැස ගෞරව කිරීමයයි සලකන සේක්වා භවත් ගෞතමයන් වහන්ස, ඉදින් රථයක සිට මම (මාගේ) අත නමන්නෙම් නම් එය මාගේ වැඳීමයයි සලකන සේක්වා.'

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කාලොචිත ධර්මකථාවකින් සොණදණ්ඩ බ්‍රාහ්මණයා කුශලධර්මයෙහි සමාදන් කරවා, උත්සාහවත් කරවා, සතුටුකරවා, හුන් ආසනයෙන් නැගිට වැඩිසේක.

**සතරවන සොණදණ්ඩ සූත්‍රය නිමියේය.**

# 5 කූටදන්ත සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් පමණවූ මහත් භික්ෂු සංඝයාවහන්සේ සමග මගධ දෙශයෙහි හැසිරෙන කල ඛාණුමත නම් බමුණු ගමට වැඩියෝය. එහි භාග්‍යවතුන් වහන්සේ අම්බලට්ඨිකා නම් උයනෙහි වාසය කරති.

එකල කූටදන්ත නම් බ්‍රාහ්මණයෙක් මගධ දෙශයෙහි රජවූ සේනිය (සේනා ඇති) බිම්බිසාර මහරජතුමන් විසින් උසස් පරිත්‍යාගයක් ලෙස උතුම්කොට දෙනලද, බොහෝ පිරිවර ජනයාගෙන් හා ඇතුන් අශ්වයන් ආදී සත්ත්ව සමූහයාගෙන් ගැවසුනු, තණ, දර, දිය බොහෝසේ ඇතිවූ ධාන්‍ය සම්පත්තීන් යුත් ඛාණුමත නම් බමුණු ගමෙහි ප්‍රධානියාව වාසය කරයි.

එකල කූටදන්ත බ්‍රාහ්මණයාගේ මහත් යාගයක් ළඟා විය. ගොනුන් සත්සියයක්ද, නහඹු වස්සන් සත්සියයක්ද, නාඹු වැස්සියන් සත්සියයක්ද, තිරළුවන් සත්සියයක්ද, එළුවන් සත්සියයක්ද, යාගය පිණිස යාග කණුව වෙත පමුණුවන ලද්දාහු වෙත්.

**2.** එකල්හි ඛාණුමත ගම්වැසි බමුණු පවුල්හි ප්‍රධානයෝ මෙපවත් ඇසූහ. '(ශ්‍රමණ) භවත් ගෞතමයන් වහන්සේ ශාක්‍යපුත්‍රයෙක, ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූවෙක, පන්සියයක් පමණවූ මහත් භික්ෂුසංඝයා වහන්සේ සමග මගධරටෙහි හැසිරෙන්නේ ඛාණුමත ගමට පැමිණ එහි අම්බලට්ඨිකා උයනෙහි වාසය කරයි ඒ (ශ්‍රමණ) භවත් ගෞතමයන් වහන්සේ පිළිබඳ හිත් ප්‍රියකරන කීර්ති රාවයක් පැනනැංගේය.

"ඒ භගවත්හු අර්හත්හ. හැමලෙසින් දතයුතුදේ තමන්ම දත්හ; නුවණ අටෙන් හා (පසළොස්) සීල ධර්මයන්ගෙන් යුත්හ; හොබනා ගමන් ඇතියහ, (ති) ලොව මැනවින් දත්හ; සීලාදී ගුණයෙන් ප්‍රධානයහ; පුරුසයන් දැමුමෙහි සමත්හ; දෙවි මිනිසුන්ට අනුශාසකහ; (සිවුසස් දත් හෙයින්) බුද්ධයහ,

(සවුකෙලෙස් බුන් හෙයින්) භගවත් නම් වූහ. උන්වහන්සේ දෙවියන්, මරුන්, බඹුන් සහිතවූ මේ ලොකයද, මහණ බමුණන් හා දෙවිමිනිසුන් සහිත ප්‍රජාවද, තෙමේ ඉතා උසස් ඥානයෙන් දැන, හොඳින් දැන දන්වනසේක. මුල මැද අග යන තුන් තැනම යහපත්වූ අර්ථයෙන් සහ නියම වචන ශබ්දකිරීමෙන් යුත් සර්ව සම්පූර්ණ දහමක් දෙසති. පිරිසිදු බ්‍රහ්මචරියාව පවසති. එබඳු රහතුන්ගේ දැකීම යහපත්ය.’ එවිට ඒ ඛාණුමත ගම්වැසි බමුණු පවුල් ප්‍රධානයෝ ඛාණුමත ගමින් නික්ම රංචු රංචුගැසී මහත් සමූහ ඇත්තාහු එක්ව රැස්ව අම්බලට්ඨිකා උයනට පැමිණෙත්.

3. එකල්හි කූටදන්ත බ්‍රාහ්මණ තෙමේ ප්‍රාසාදයෙහි මතු මහල් තලයෙහි දවල් හාන්සිවී විවේක ගැනීමට පැමිණියේය. ඛාණුමත ගම්වැසියන් බමුණු පවුල් ප්‍රධානීන්, ඛාණුමත ගමින් පිටත්ව රන්චුගැසී එකතුවී අම්බලට්ඨිකා උයනට පැමිණෙන්නන් කූටදන්ත බමුණු දුටුවේය. දැක තමන්ගේ දැන ගත යුතු ප්‍රශ්න විසඳන ඇමතියාට කථාකර “ඇමතියෙනි, ඛාණුමත ගම වැසි බමුණු පවුල්වල ප්‍රධානියෝ ඛාණුමත ගමින් පිටත්ව, රංචුගැසී අම්බලට්ඨිකා උයන කරා මක්නිසා පැමිණෙත්දැ”යි ඇසීය. “පින්වත, මෙනම් කරුණක් ඇත්තේය: ශාක්‍ය පුත්‍රවූ, ශාක්‍ය කුලෙන් නික්ම පැවිදිවූ, මහණ ගෞතම තෙමේ පන්සියයක් පමණ මහා භික්ෂු සංඝයා සමග මගධ රට ගමන් කරන්නේ පිළිවෙලින් ඛාණුමතයට වැඩ අම්බලට්ඨිකා උයනෙහි වාසය කරති. ‘ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ; සම්‍යක් සම්බුද්ධයහ; විද්‍යාචරණසම්පන්නයහ; සුගතයහ; ලොකවිදූහ; අනුත්තරයහ; පුරිසදම්මසාරථීහ, දෙවිමිනිසුන්ගේ ගුරුවරයාහ, බුද්ධයහ, භාග්‍යවත්හ’යි ඒ භවත් ගෞතමයන් ගැන මෙබඳු යහපත් ගුණ ඝොෂාවක් උස්ව පැනනැංගේය. ඔවුහු ඒ භවත් ගෞතමයන් වහන්සේ දැකීම පිණිස පැමිණෙති”යි කීහ.

4. එවිට කූටදන්ත බමුණාට මෙබඳු සිතෙක් විය. ‘මහණ භවත් ගෞතම තෙමේ දහසය ආකාර පිරිවර ඇති ත්‍රිවිධ යාග සම්පත්තිය දන්නේය, යන මේ කාරණය මවිසින් අසන ලද්දේමය. මම දහසය ආකාර පිරිවර ඇති ත්‍රිවිධ යාග සම්පත්තිය නොදනිමි. මම මහායාගයක් කරන්ටද කැමැත්තෙමි. මම මහණ

ගෞතමයන් වෙත ගොස් සොළොස් ආකාර පිරිවර ඇති යාග සම්පත්තිය ශ්‍රමණ ගෞතමයන්ගෙන් අසන්නෙම් නම් ඉතා යහපති.

එවිට එසේ සිතා, "එසේනම්, පින්වත් ඇමතියෙනි, ඛාණුමත වැසි බමුණු ගෙවල් ප්‍රධානීන් වෙත යව. ගොස් ඔවුන්ට මෙසේ කියව. 'කූටදන්තතෙම තොපට මෙසේ කියයි. කූටදන්ත බමුණු තෙමේද, ශ්‍රමණ භවත් ගෞතමයන් දැකීමට පැමිණෙන්නේය. පින්වත්හුද ඒ තාක් නවතිත්වා" ඇමති තෙමේ, "පින්වත, එසේ යහපතැ"යි කූටදන්ත බමුණුහට උත්තරදී, ඛාණුමතයෙහි බමුණු පවුල්වල ප්‍රධානීන් වෙත පැමිණියේය. එහි පැමිණ මෙසේ කීයඃ "කූටදන්ත බමුණුද ශ්‍රමණ භවත් ගෞතමයන් දැකීමට පැමිණෙන්නේය. එතෙක් පින්වත්හු නවතිත්වා."

**6.** එකල බොහෝ සියගණන් බමුණෝ 'කූටදන්ත බමුණුගේ මහායාගය පිළිගනිමු'යි ඛාණුමතයට පැමිණ වාසය කරති. කූටදන්ත බමුණුතෙම පින්වත් මහණ ගෞතමයන් දැකීමට පැමිණෙන්නේය." යනු ඒ බමුණෝ ඇසූහ. අසා ඔව්හු කූටදන්ත වෙත පැමිණියෝය. පැමිණ, "පින්වත් කූටදන්ත තෙම මහණ ගෞතමයන් දැකීමට පැමිණෙන්නේය යනු සත්‍යයක දැ"යි ඇසුවෝය.

"පින්වත්නි, එසේ කිරීම මා අදහසය, මහණ ගෞතමයන් දැකීමට මමද පැමිණෙන්නෙමි.'

**6.** පින්වත් කූටදන්තයෝ මහණ ගෞතමයන් දැකීමට නොපැමිණෙත්වා! පින්වත් කූටදන්ත තෙමේ මහණ ගෞතමයන් දැකීම පිණිස පැමිණීම නුසුදුසුය. ඉදින් පින්වත් කූටදන්ත තෙමේ මහණ ගෞතමයන් දැකීමට පැමිණෙන්නේ නම්, පින්වත් කූටදන්තගේ කීර්තිය පිරිහෙන්නේය, මහණ ගෞතමයන්ගේ කීර්තිය වැඩිවන්නේය. යම් හෙයකින් පින්වත් කූටදන්තගේ කීර්තිය පිරිහෙන්නේද, මහණ ගෞතමයන්ගේ කීර්තිය වැඩිවන්නේද, මේ කාරණයෙන්ද පින්වත් කූටදන්ත තෙමේ මහණ ගෞතමයන් දැකීමට පැමිණීම නුසුදුසුය, මහණ ගෞතම

තෙමේ පින්වත් කූටදන්ත දැකීමට පැමිණීම සුදුසුය, පින්වත් කූටදන්තයෝ මවු පස, පිය පස, යන දෙපසින් යහපත්ව උපන්නහ. පිරිසිදු මව්කුසින් උපන්හ. සත්වන පරම්පරාව දක්වා අවමන් නොකරණ ලදහ. ජාතිවාදයෙන් නින්දා නොකරණ ලදහ. මේ කරුණෙන් පින්වත් කූටදන්තයන් මහණ ගෞතමයන් දැකුමට පැමිණීම නුසුදුසුය, මහණ ගෞතමයෝම පින්වත් කූටදන්තයන් දැකීමට එනු සුදුසුය.

"භවත් කූටදන්ත තෙමේ අධිපතිය, ධනවත්ය, කෑම් බීම් ආදියට ගන්නා බොහෝ දේ ඇත්තේය. පින්වත් කූටදන්ත තෙමේ වේද කටපාඩමෙන් කියන්නේය, වේද මන්ත්‍ර දන්නේය, වචන අර්ථ ශාස්ත්‍රය හා කාව්‍ය අලංකාර ශාස්ත්‍රයද සහිත අකුරු, ශබ්දධාතු විස්තරය, නීති, ඉතිහාසය පස්වැනි කොට ඇති ත්‍රිවේදයෙහි අවසානයට පැමිණියේය. භාෂාව දන්නේ, ව්‍යරණ කටපාඩමෙන් කියන්නේය. ලෝකය පිළිබඳ කරුණු දක්වන ශාස්ත්‍රය හා මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණ දැනුම ඇත්තේය. පින්වත් කූටදන්ත තෙමේ දැකීමට ප්‍රිය මනා රූප ඇත්තේය, පහදවන ගති හා යහපත් පාටද ශරීර ලකුණුද ඇත්තේය. ඉතා උසස්වූ බ්‍රාහ්මයාගේ පාට වැනි රන්වන් පාටින් හා බඹහුගේ ශරීරය වැනි ශරීරයකින් යුතුය. ශරීරයෙහි දැකුමට සුළු වරදක් ද නැත.

"පින්වත් කූටදන්ත තෙම වඩන ලද සිල් ඇති සම්පූර්ණ සීලයෙන් යුත්, සිල්වතෙක. පින්වත් කූටදන්ත තෙමේ යහපත් වචන ඇති, ප්‍රිය උපදවන වචන ඇති, නාගරික ස්ත්‍රීන්ගේ සිලිටු වචන මෙන් මනහරවූ, මිහිරිවූ සිහිකටයුතුවූ, නිදොස්වූ, මුල මැද අග පැහැදිළිව කී, අදහස් ප්‍රකාශයෙහි සමත් යහපත් වචන ඇති තැනැත්තෙක.

"පින්වත් කූටදන්තයෝ බොහෝ දෙනාගේ ගුරුවරයාද ගුරුවරයින්ගේ ගුරුවරයාද වූහ. තුන්සියයක් තරුණයින්ට වෙදමන්ත්‍රය කියවති. පින්වත් කූටදන්තයන් වෙත වේද මන්ත්‍ර ඉගෙන ගැනීමට කැමති බොහෝ තරුණයෝ නොයෙක් රටින් හා නොයෙක් ජනපදයෙන් පැමිණෙති.

"පින්වත් කූටදන්ත තෙමේ පැරණි කුලයෙන් පැවතෙන, ශීලාචාරාදියෙන් වැඩුණු බොහෝකල් ඉක්මවූ දෙතුන් රජ පරම්පරාවක් ඉක්ම ගිය පැසුනු වයසට පැමිණියෙක.

ඔහු මහත් සම්පත්තියෙන් යුක්තය. සමාදන්වූ සීල කඩනොකිරීමෙන් මාර්ගයට පැමිණියේය. අන්තිම වයසට පැමිණියේය.

"මහණ ගෞතම තෙමේ තරුණවූයේ, තරුණ පැවිද්දෙක්ද වේ.

"පින්වත් කූටදන්තයෝ මගධ රට රජවූ සෙනිය බිම්බිසාර මහරාජයන් විසිනුත් සත්කාර කරණ ලදහ. ගරු කරණ ලදහ, බුහුමන් කරණ ලදහ. උසස්සේ සලකණ ලදහ. නැමදුම් පෙරටුව පුදන ලදහ. පින්වත් කූටදන්තයෝ පොක්ඛරසාති බ්‍රාහ්මණයා විසින් සත්කාර කරණ ලදහ. ගරු කරණ ලදහ, බුහුමන් කරණ ලදහ, පුදන ලදහ, නැමදුම් කරණ ලදහ. පින්වත් කූටදන්තයෝ මගධරට සෙනිය බිම්බිසාර රජ විසින් උසස් තෑග්ගක් ලෙස, රාජ තෑග්ගක් වශයෙන් පමුණුකොට දෙනලද, බොහෝ පිරිවර ජනයාගෙන් හා ඇතුන් අශ්වයන් ආදී සත්වසමූහයාගෙන් ගැවසුනු, තණ දර දිය අඩුනැති, ධාන්‍ය සම්පත්තියෙන් යුත්, ඛාණුමත නම් ගමෙහි අධිපතිව වාසය කරති.

"මෙකී කරුණු නිසාද පින්වත් කූටදන්තයෝ මහණ ගෞතමයන් දැකුම් පිණිස පැමිණීමට නුසුදුස්සෝය. මහණ ගෞතමයෝම කූටදන්තයන් දැකීමට එනු සුදුසුය."

7. (ඒ බමුණන්) මෙසේ කී කල, කූටදන්ත බමුණුතෙම ඔවුන්ට මෙසේ කීය. 'පින්වත්නි, යම්සේ භවත් ගෞතමයන් දකිනු පිණිස පැමිණෙන්නට අපිම සුදුස්සෝ වෙමුද, ඒ පින්වත් ගෞතමයන් වහන්සේ අප දකිනු පිණිස පැමිණෙන්ට නුසුදුසු වේද, ඒ පිළිබඳවූ මාගේ මේ කථාවද අසව්.

"පින්වත් මහණ ගෞතම තෙමේ මවු පාර්ශ්වයෙන්, පිය පාර්ශවයෙන් යන දෙපාර්ශවයෙන් මැනවින් උපන්නේය; පිරිසිදු මවුකුසින් උපන්නේය; සත්වැනි පරම්පරාව දක්වා අවනම්බුවෙන්

තොරවන ලද්දේය, ජාතිවාදයෙන් නින්දා නොකරණ ලද්දේය. පින්වත්නි, යම්හෙයින් මහණ ගෞතමයෝ මවුපිය දෙපාර්ශවයෙන් යහපත් සේ උපන්නෝද, පිරිසිදු මවුකුසින් පහළවූවෝද, සත්වැනි පරම්පරාව දක්වා අවනම්බු වෙන් තොරවන ලද්දෝය, ජාති වාදයෙන් නින්දා නොකරණ ලද්දේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල අපිම ඒ භවත් ගෞතමයන් වහන්සේ දැකුමට පැමිණෙන්නට සුදුස්සෝ වෙමු.

"පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මහත්වූ නෑදෑ සමූහයා හැර මහණ වූවෙක. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයෝ භූමිගතවූද, බොහෝ රන්රුවන් හැර මහණ වූවෙක. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ තරුණ වූයේම, හොඳ තරුණ භාවයෙන් හා පළමුවන වයසින් යුතුවූයේම, හොඳ කලු කෙස් ඇත්තේ, ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වූයේය.

"පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ නොකැමැති මවුපියන් කඳුලු පිරි මුහුනින් යුතුව හඬද්දී කෙස් දැලිරැවුලු කපාදමා සිවුරු හැඳ, ගිහිගෙන් පිටත්ව සස්නෙහි මහණවූ කෙනෙක. දැකුමට ප්‍රිය මනා රූප ඇතිවූ, පහදවන ගති ඇතිව යහපත් පාට සහ ශරීර ලක්ෂණ සහිත ඉතා උසස්වූ රන්වන් පාටින් හා බ්‍රඹහුගේ ශරීරය වැනි ශරීරයෙන් යුක්තයහ, ශරීරයෙහි දැකුමට සුලු වරදක්ද නැත.

"පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ උතුම් නිදොස් සිල් ඇති සම්පූර්ණ ශීලයෙන් යුත්, සිල්වත් කෙනෙක. පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ යහපත් වචන ඇති, මිහිරි වචන ඇති, යහපත්, නිදොස්වූ, පැහැදිළිව අර්ථ ප්‍රකාශ කිරීමෙහි සමත් මිහිරි වචන ඇත්තෝය.

"පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ බොහෝ දෙනාගේ ගුරුවරයෙක්ද ගුරුවරයින්ගේ ගුරුවරයෙක්ද වෙති. පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ පහකළ කාමරාග ඇත්තෝ අලංකාර කිරීම් නැත්තෝද වෙති. පින්වත්, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ

'කර්ම විපාක ඇත, කුසල් දහම් කිරීම යහපත යන කථා ඇත්තේක. පවුකම් පෙරටුකොට හැසුරුම් නැත්තේක.

"පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ මිශ්‍රනුවූ, ක්ෂත්‍රිය නම් උසස්කුලයෙන් ගොස් මහණවූ කෙනෙක. පින්වත්නි, ශ්‍රමණ ගෞතමයෝ මහත් ධන, මහා භොග ඇති, උසස් කුලයෙන් නික්ම මහණවූ කෙනෙක, ශ්‍රමණ භවත් ගෞතමයන්ගෙන් යම් මේ දේ අසා දැනගන්නට අන් රටවලින්ද ජනපදවලින්ද ජනයෝ එති. බොහෝ දහස් ගණන් දෙවිවරු ශ්‍රමණ ගෞතමයන් ජීවිතය ඇතිතෙක් සරණකොට ගියහ.

"ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ මෙබඳු මහත්වූ කීර්ති ශබ්දයක් විශෙෂයෙන් උස්ව පැනනැංගේය, කෙබඳුද යත්, උන්වහන්සේ සංසාරචක්‍රයෙහි බැමි සින්දහ. අර්හත්හ, හැමලෙසින් දතයුතුදේ තමන්ම දත්හ, නුවණ අටෙන් හා සීලධර්ම පසළොවින් යුත්හ; හරිමාර්ගයේ ගියහ. ලෝකය හොදාකාර දත්හ; සිල් ආදී ගුණෙන් ප්‍රධානය; මිනිසුන් දමනය කිරීමෙහි සමත්හ; දෙවිමිනිසුන්ට ගුරුවරයෙක්ය; සියල්ල දත්හ; කෙලෙස් නැතිකළහ'යි කියායි.

"පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ දෙතිස් මහපුරිස් ලකුණින් යුත්ය. ශ්‍රමණ ගෞතමයෝ යම් කෙනෙක් තමන්වහන්සේගේ සමීපයට පැමිණියේ නම් ඔවුන්ට ආසිරිවාද වචන හා කණට මිහිරි මොළොක් වචන ඇත්තාහ. සතුටුවන කථා ඇත්තේක. මුහුන පහත් කොට ගෙන සිටින්නෙක් නොවේය. පළමුකොට කරණ කථා ඇත්තේක. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ (භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන) සිවුපිරිස විසින් සත්කාර ගරු බුහුමන් පුද පූජා පවත්වන ලද්දෙක. ශ්‍රමණ භවත් ගෞතමයන් කෙරෙහි බොහෝ දෙවි මිනිස්සු විශෙෂයෙන් පැහැදුනහ. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යම් ගමක හෝ නියම්ගමක වාසය කරයිද, ඒ ගමෙහි හෝ නියම්ගමෙහි අමනුෂ්‍යයෝ හිංසා පීඩා කිරීමෙන් මිනිසුන් නොවෙහෙසත්.

"පින්වත්නි, ශ්‍රමණ ගෞතමයන් මහත් මහණ සමූහයා ඇත්තෙක, සමූහයකට ගුරුවරවූයේ ගුරුවරයින් අතුරෙන් ඉතා උසස්යයි කියනු ලැබේ. පින්වත්නි, ඇතැම් මහණ බමුණන්ගේ කීර්තිය කිසියම් සුළු කරුණකින් උසස් බවට පැමිණෙන්නේද, එබඳු කරුණකින් ශ්‍රමණ ගෞතමයන්ගේ කීර්තිය නම් වැඩීමට නොපැමිණියේය. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ කීර්තිය වැඩීමෙන් උසස් බවට පැමිණියේ ශ්‍රෙෂ්ඨවූ නුවණ හා සීල සම්පත්තිය නිසාය.

"අඹුදරුවන් හා ඇමතියන් හා බොහෝ සේනා සහිතවූ මගධරට රජවූ බිම්බිසාර රජතෙමේ භවත් ගෞතමයන් වහන්සේ දිවිකෙළවර තෙක්ම සරණ ගියේය. එලෙසින්ම අඹුදරුවන් හා පිරිස් හා ඇමතියන් සහිත පසේනදී කොසොල් රජුද පොක්ඛරසාතී බමුණු තෙමේද, අඹු දරුවන් හා පිරිස් සහිතව ඇමතියන් සහිතව ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ජීවිතාන්තය තෙක්ම සරණ ගියේය.

"ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ බිම්බිසාර රජු විසිනුදු, කොසොල් රජු විසිනුදු, පොක්ඛරසාතී බමුණා විසිනුදු සත්කාර ගරු බුහුමන් පුද සැලකිලි දක්වන ලද්දෝය.

"ඒ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ඛාණුමත ගමට පැමිණ ඛාණුමතයෙහි අම්බලට්ඨිකා උයනෙහි වාසය කරති. යම්කිසි මහණ බමුණු කෙනෙක් අපගේ ගමට එත්නම් ඔවුහු අපේ ආගන්තුකයෝ වෙති. ආගන්තුකයෝ අප විසින් සත්කාර ගරු බුහුමන් පුදසැලකිලි දැක්විය යුත්තෝ වෙත්.

"ඛාණුමතයට පැමිණ අම්බලට්ඨිකා උයනෙහි වාසය කරණ ශ්‍රමණ භවත් ගෞතමයෝද අපට ආගන්තුක වෙති. ආගන්තුකව පැමිණි තැනැත්තේ අප විසින් සත්කාර ගරු බුහුමන් පුද සැලකිලි පැවැත්විය යුත්තේ වේ. මේ කරුණෙන්ද ඒ භවත් ගෞතමයන් වහන්සේ අප දැකුමට එන්නට නුදුසුස්සෝය, එසේවූ කල අපිම අපිම උන්වහන්සේ ළඟට පැමිණිය යුත්තෝ වෙමු.

"පින්වත්නි, ඒ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ගුණ මෙපමණක්ම දනිමි. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ

මෙපමණ ගුණ ඇත්තෙක් නොවේ, ශ්‍රමණ භවත් ගෞතමයෝ අප්‍රමාණ ගුණ ඇති කෙනෙක."

8. මෙසේ කී කල්හි ඒ බමුණෝ කූටදන්ත බමුණාට මෙසේ කීවෝය. "යම්සේ පින්වත් කූටදන්ත තෙමේ මහණ ගෞතමයන්ගේ ගුණ වර්ණනා කරයි. ඒ පින්වත් ගෞතමයන් වහන්සේ මින් සියක් යොදුනකින් ඈත වාසය කළ නමුත් යහපත් උතුම්ගති ඇති කෙනෙක් විසින් උන්වහන්සේ දැකීම පිණිස ගමනට වුවමනා දේ ගෙනද පැමිණෙන්නට සුදුසුය. පින්වත්නි, එහෙයින් අපි සියල්ලෝම භවත් ගෞතමයන් වහන්සේ දැකීම පිණිස පැමිණෙන්නෙමුය."

එවිට කූටදන්ත බමුණු තෙමේ මහත් වූ බමුණු සමූහයා සමග අම්බලට්ඨිකා උයනෙහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනක වාසය කෙරෙත් නම් ඒ ස්ථානය කරා ගියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතු සිහිකටයුතු කථා අවසන්කොට එකපැත්තකින් හුන්නේය. බාණුමත බමුණු පවුල්හි ප්‍රධානියෝද භගවත්හට වැඳ එක පැත්තකටවී හුන්හ, ඇතැම් කෙනෙක් උන්වහන්සේ සමග සතුටු වූහු, සතුටු වියයුතු, සිහිකටයුතු කථා අවසන්කොට පැත්තකින් හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දෙසට නමස්කාර කර පැත්තකින් හුන්හ. ඇතැම් කෙනෙක් නාමය හා ගොත්‍රය ප්‍රකාශකොට පැත්තකින් හුන්හ. ඇතමෙක් නිශ්ශබ්ද වූවාහු එකපැත්තකටවී හුන්හ.

9. එකපැත්තකට වී හුන් කූටදන්ත බ්‍රාහ්මණයා භගවත්හට මෙසේ කීවේයඃ "ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ දහසය ආකාර පිරිවර ඇති ත්‍රිවිධ යාග සම්පත්තිය දන්නා බව මා විසින් අසන ලදී. මම වනාහි දහසය ආකාර පිරිවර ඇති ත්‍රිවිධ යාග සම්පත නොදනිමි, මමද මහායාගයක් කරනු කැමැත්තෙමි භවත් ගෞතමයන් වහන්සේ දහසය ආකාර පිරිවර සහිත ත්‍රිවිධ යාගසම්පත්තිය කියාදෙන්නේ නම් යහපති."

"එසේනම් බ්‍රාහ්මණය, හොඳින් අසව, කල්පනා කරව, කියාදෙන්නෙමි" කූටදන්ත බ්‍රාහ්මණ තෙමේද "එසේය, පින්වතුන්

වහන්සැ"යි භාග්‍යවතුන් වහන්සේට උත්තර දිනි. භගවත්හු මෙසේ කීවාහ.

**10.** බ්‍රාහ්මණය, අතීතයෙහි තමාට අයිති ධනයෙන් උසස්වූ කාම සැප වශයෙන් උතුම් වස්තු සම්පත් ඇති බොහෝ රන් රුවන් හා සිත් සතුටුකරණ අලංකාරවත් බොහෝ උපකරණ ඇති, බොහෝ ධන ධාන්‍ය හා නිධාන කොට තැබූ ධනයෙන් හා ධාන්‍යයෙන් පිරුණු භාණ්ඩාගාර හා කොෂ්ඨාගාර ඇති මහාවිජිත නම්වූ රජෙක් විය. බ්‍රාහ්මණය, ඉක්බිති රහසිගතව විවේකයට පැමිණි මහා විජිත රජහට මෙබඳු කල්පනාවක් පහළවිය: 'මා විසින් මහත්වූ වස්තු සම්පත්තීහු ලබන ලද්දාහුය, මම සියලු පොළෝ මණ්ඩලය හැම ආකාරයෙන්ම ජයගෙන ප්‍රධානව වාසය කරමි. යමක් මට බොහෝ කාලයක් හිත සැප පිණිස පවතී නම් එබඳු මහා යාගයක් කළොත් මැනව. (කියායි)

"බ්‍රාහ්මණය, එවිට රජ මෙසේ සිතා පුරෝහිත බමුණාට කථාකොට මෙලෙසින් කීය: 'බ්‍රාහ්මණය රහසිගතව විවේකීවූ, මට මෙබඳු අදහසක් පහළවිය: එනම් මා විසින් මහත්වූ වස්තු සම්පත්තීහු ලබන ලද්දාහුය. මම සියලු පොළෝ මණ්ඩලය හැම ආකාරයෙන් ජයගෙණ ප්‍රධානියාව වසමි. යම් යාගයක් මට බොහෝ කාලයක් හිත සැප පිණිස පවතින්නේ නම් එබඳු මහා යාගයක් කළොත් ඉතා යහපතියි, කියායි. බ්‍රාහ්මණය, මම මහා යාගයක් කරන්නට කැමැත්තෙමි. යමක් මට බොහෝ කාලයක් හිත සැප පිණිස පවතින්නේ නම් (එබඳු මහා යාගයක් කිරීමට) පින්වත් තෙමේ මට අවවාද කෙරේවා."

**11.** "බ්‍රාහ්මණය, මෙසේ කීකල්හි පුරෝහිත බමුණු තෙම මහවිජිත රජුට මෙසේ කීයේය: 'පින්වත් රජුගේ ජනපදය සොරකම් වැනි කටු සහිතය. බොහෝ සෙයින් (වැසියාට) පීඩා සහිතය. ගම් කොල්ලකෑම් දකින්නට ලැබේ. නුවර වැනසුම්ද දකින්නට ලැබේ. මංකොල්ලකෑමද දකින්නට ලැබේ. ඉතින් පින්වත් රජ තෙමේ මෙබඳු (සොර) කටු සහිතවූ (සතුරු) පීඩා සහිතවූ ජනපදයෙහි අයබඳු අයකරන්නේ නම් ඒ නිසා පින්වත් රජතෙමේ නොකටයුත්තක් කරන්නෙක් වන්නේය. ඇතැම්විට

මෙබඳු අදහසක් පින්වත් රජහට ඇතිවිය හැකියි: 'මම මේ සොර උවදුර වධ කිරීමෙන් හෝ රටින් බැහැර කිරීමෙන් හෝ වනසා ලන්නෙමි.' මේ සොර උවදුර පිළිබඳ වැනසීම මෙලෙසින් හොඳාකාර සිදු නොවේමය. යමෙක් ඒ නැසීමෙන් ඉතිරි වන්නෝද පසුව ඔවුහු රජුගේ ජනපදයන් පෙළන්නාහුය. එසේ වූවත් මේ කියනු ලබන කටයුතු මාර්ගයෙන් නම් සොර උවදුර සම්පූර්ණයෙන් නැති කළ හැකිවේ. එසේ (කිරීමට) නම් පින්වත් රජහුගේ ජනපදයෙහි යමෙක් සීසෑමෙහි හා ගවයින් රැකීමෙහි උත්සාහවත් වෙත් නම් ඔවුන්ට පින්වත් රජතෙම ධාන්‍යද, බත්ද, බීජ ආදියද දානය කෙරේවා. පින්වත් රජහුගේ ජනපදයෙහි යමෙක් වෙළඳාම් පිණිස උත්සාහ කෙරෙත් නම් ඔවුන්ට පින්වත් රජ තෙම අඩුව ඇති මුල් බඩු දානය කෙරේවා. පින්වත් රජහුගේ ජන පදයෙහි යම් කෙනෙක් රාජකාර්යයෙහි උත්සාහ කෙරෙත්ද පින්වත් රජතෙමේ ඔවුන්ට බත් වැටුප් දානය කෙරේවා ඒ මනුෂ්‍යයෝද තම තමන්ගේ කටයුතුවල යෙදුනාහු, රජහුගේ ජනපදය නොවෙහෙසන්නාහ, රජරට බොහෝ ධන ධාන්‍යද රැස් වන්නේ වේ. සොර නැමැති කටු නැති, පීඩා නැති, ජනපදයෝ උවදුරු රහිතව සිටියාහු වෙති. මිනිස්සුද ඔවුනොවුන් කෙරෙහි සතුටු සිත් ඇත්තාහු වෙති. මිනිස්සුද ඔවුනොවුන් කෙරෙහි සතුටු සිත් ඇත්තාහු, නොවසන ලද ගේ දොර ඇත්තන් මෙන්, ළයෙහි දරුවන් නටමින් වාසය කරත්."

12. "එසේය, පින්වත් බ්‍රාහ්මණය"යි පුරෝහිත බමුණුහට මහාවිජිත රජතෙමේ උත්තරදී, රජුගේ ජනපදයෙහි සීසෑමෙහි හා ගවයින් රැකීමෙහි යමෙක් යෙදුනාහුනම් ඔවුන්ට මහාවිජිත රජතෙම බීජ ආදිය දෙවීය; රජුගේ ජනපදයෙහි යමෙක් වෙළඳාමෙහි යෙදුනාහු නම් ඔවුන්ට මහා විජිත රජතෙම අඩුපාඩු මූල බඩු දෙවීය; රජුගේ ජනපදයෙහි යමෙක් රාජකාර්යයෙහි යෙදුනාහු නම් මහාවිජිත රජතෙම ඔවුන්ට බත් වැටුපද දෙවීය. ඒ මිනිස්සුද තමා අයත් කටයුතුවල යෙදුනාහු රජුගේ රට නොපෙළූහ. රජහට බොහෝ ආදායම්ද විය. සොර නැමති කටුනැති, පීඩානැති ජනපදයෝ සමාදානයෙහි පිහිටියහ. මිනිස්සුද හැරදමන ලද දොරවල් ඇත්තවුන් මෙන්, සතුටු නිදහස්

සිත් ඇත්තාහු, ඔවුනොවුන් කෙරෙහි සතුටු වන්නාහු, ළයෙහි දරුවන් නටවමින් වාසයකරත්.

13. "බ්‍රාහ්මණය, ඉක්බිති මහාවිජිත රජතමෙ පුරෝහිත බමුණා කැඳවා මෙසේ කීයඃ පින්වත, මා විසින් පින්වතාගේ කටයුතු යොදා කරවීම අනුව සොර උවදුරු සම්පූර්ණයෙන් නැතිකරණ ලදී. මාගේ ආදායමද බොහෝය. සොරු නැමැති කටු නැති, පීඩානැති ජනපදයෝ බිය රහිතය. මිනිස්සුද නිදහස් සිත් ඇතිව ඔවුනොවුන් කෙරෙහි සතුටු වන්නාහු නොවසනලද ගෙදොර ඇත්තවුන් මෙන් ළයෙහි දරුවන් නටවමින් වාසය කරත්. බ්‍රාහ්මණය, මම දැන් මහායාගය කරන්නට කැමති වෙමි. යම්බඳුවූවක් මට බොහෝ කල් හිත සැප පිණිස පවතී නම්, පින්වත් තෙමේ එසේ මට අනුශාසනා කෙරේවා."

'එසේ නම් පින්වත් රජුගේ ජනපදයෙහි යටත්වූ ක්ෂත්‍රියෝද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, වෙත්නම්, පින්වත් රජතෙමේ ඔවුන්ට දැනුම්දීම කෙරේවා. පින්වත්නි, මම මහායාගයක් කරණු කැමැත්තෙමි. යමක් මට බොහෝ කල් හිත සැප පිණිස පවතීනම් ඒ පිළිබඳව මට දැනුම්දීම කෙරෙත්වා. පින්වත් රජහුගේ ජනපදයෙහි ඇමතියෝද, සෙසු පිරිසද, නියම්ගම් වැස්සෝද දනවු වැස්සෝද, වෙත්නම් මෙසේ දැනුම්දීම කෙරේවා! 'පින්වත්නි, මම මහා යාගයක් කරණු කැමැත්තෙමි. යමක් මට බොහෝ කල් හිත සැප පිණිස පවතී නම් මට දැනුම්දීම කෙරෙත්වා. බමුණු මහසල් කුලයෝද, නියම් ගම් වැස්සෝද දනවු වැස්සෝද වෙත් නම්, පින්වත් රජතෙමේ ඔවුන්ට මෙසේ දැනුම්දීම කෙරේවා! 'පින්වත්නි, මම මහා යාගයක් කරුණු කැමැත්තෙමි. යමක් මට බොහෝ කල් හිත සැප පිණිස පවතී නම් ඒ පිළිබඳව මට දැනුම්දීම කෙරෙත්වා, වස්තු රැස්කරණ පවුල් ප්‍රධානීහුද නියම්ගම් වැස්සෝද දනවු වැස්සෝද වෙත් නම් පින්වත් රජතෙම ඔවුන්ට මෙසේ දැනුම්දීම කෙරෙත්වා. 'මම මහායාගයක් කරණු කැමැත්තෙමි. යමක් මට බොහෝ කල් හිත සැප පිණිස පවතී නම් ඒ මට දැනුම්දීම කෙරෙත්වා!'

"බ්‍රාහ්මණය, 'එසේය, මහාපින්වතැ'යි මහාවිජිත රජ පුරොහිත බමුණාට උත්තරදී රජුගේ ජනපදහෙි යම් යටත්වූ ක්ෂත්‍රියයෝද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, වෙත්නම්, මහාවිජත රජු ඔවුන්ට මෙසේ දැන්විය. 'පින්වත්නි, මම මහායාගයක් කරණු කැමැත්තෙමි. යමක් බොහෝකල් මගේ හිතසැප පිණිස වේනම් පින්වත්හු එය දැනුම් දෙත්වා (කියායි)

'පින්වත් රජතෙමේ යාග කෙරේවා. මහරජ, (මේ) යාගයට කාලය'යි.

රජුගේ ජනපදයෙහි යම් ඇමතියෝද, සෙසු පිරිස්ද, නියම්ගම් වැස්සෝද, ජනපද වැස්සෝද, වෙත්නම්, මහවිජිත රජු ඔවුන්ට මෙසේ දැන්වීය. 'පින්වත්නි, මම මහායාගයක් කරණු කැමැත්තෙමි. යමක් බොහෝකල් මගේ හිත සැප පිණිස වේනම් පින්වත්හු එය දන්වත්වා.' 'පින්වත් රජ තෙම යාග කෙරේවා. මහරජ මේ යාගයට කාලයයි.' බමුණු මහසල් කුලයෝද, නියම්ගම් වැස්සෝද, දනවු වැස්සෝද වස්තු රැස්කරණ පවුල් ප්‍රධානියෝද, නියම්ගම් වැස්සෝද, ජනපද වැස්සෝද, වෙත්නම් මහාවිජිත රජ ඔවුන්ට මෙසේ දැන්වීය. 'පින්වත්නි, මම මහායාගයක් කරණු කැමැත්තෙමි, යමක් මට බොහෝකල් හිත සැප පිණිස වේනම් පින්වත්හු ඒ දැනුම් දෙත්වා.

'පින්වත් රජ තෙමේ යාග කෙරේවා. මහරජ, මේ යාගයට කාලය'යි

"මෙසේ මේ කැමැත්ත දැනුම්දුන් කොටස් සතර ඒ යාගයට පිරිවර වෙත්.

14. "මහාවිජිත රජතෙමේ කරුණු අටකින් යුක්තවේ. ඔහු මවුපිය දෙපක්ෂයෙන් යහපත්ව උපන්නේය. පිරිසිදු මවු කුස ඇත්තේය. සත්වන පරම්පරාව දක්වා අවනම්බුවක් නොලද්දේය. ජාතිවාදයෙන් නින්දා නොකරණ ලද්දේය. දැකීමට ප්‍රිය යහපත් රූපයක් ඇත්තේය, හිත් ප්‍රියකරණ පාට ඇත්තේය. උතුම් රන්වන් පාටින් හා බඹහුගේ ශරීරය වැනි ශරීරයෙන් යුතුය. ඔහුගේ සිරුරෙහි දැකුමට සුළු වරදකුදු නැති ඔහු මහත් ධන හා වස්තු

ඇත්තේය. බොහෝ රන්රිදී හා සිත් සතුටු කරණ උපකරණද ධන ධාන්‍යද ඇත්තේය, සම්පූර්ණවූ ධන නිධාන හා කොටුගුල් ඇත්තේය, ඔහු බලවත් හතර ආකාර යුද්ධ සේනාවෙන් යුක්තය, ඒ සෙනඟද යටහත්ය, අවවාදයට අනුව ක්‍රියා කරන්නේ, කීර්තියෙන් හතුරන් මර්දනය කරන්නාක් වැනිවේ. ඔහු මහණ බමුණන්ටද, දුගියන්ට මගියන්ට හිඟනුන්ට හා යාචකයන්ටද මහත් පොකුණක් වූයේ, නොවසනලද දොර ඇත්තේ, දාන පතිව ශ්‍රද්ධාවත්ව දෙන්නේ, පින්කරයි. ඔහු නොයෙක් ශාස්ත්‍රයන් සම්බන්ධව බොහෝ දේ අසා දැනගත්තෙක. ඔහු 'මේ දෙසූ ධර්මය පිළිබඳ අර්ථය මෙසේය, මේ දෙසූ ධර්මය පිළිබඳ අර්ථය මෙසේය'යි ඒ ඒ ධර්මයන් පිළිබඳ අර්ථ දනී. ඔහු අතීත අනාගත වර්තමාන යන කාල තුනෙහි පවත්නා අර්ථයන් සිතන්ට සමත්වූ උගත් ඥානවන්ත, පණ්ඩිතයෙක, මහා විජිත රජතෙමේ මේ කරුණු අටින් යුක්තය. මෙසේ මේ කරුණු අට ද ඒ යාගයටම පිරිවර වෙත්.

**15.** "පුරෝහිත බමුණු තෙමේද අංගසතරකින් යුක්ත වේ. ඔහු මව්පිය දෙපක්ෂයෙන් යහපත්ව උපන්නේ, පිරිසිදු මවුකුස ඇත්තේ, සත්වන පරම්පරාව දක්වා අවනම්බුවක් නොලද්දේය. ජාතිවාදයෙන් නින්දා නොකරණ ලද්දේය. ඔහු වේදමන්ත්‍ර කටපාඩමේ කියන්නේය, වේදමන්ත්‍ර දරන්නේය. වචන අර්ථ ශාස්ත්‍රය, කාව්‍යඅලංකාර ශාස්ත්‍රය හා ශික්ෂා නිරුක්ති ශාස්ත්‍රය සහිත ඉතිහාසය පස් වැනි කොට ඇති තුන් වේදයෙහි පරතෙරට පැමිණියේ වේ. ඔහු සිල්වත්වූයේ, වඩන ලද සිල් ඇත්තේ, සම්පූර්ණ ශීලයෙන් යුක්තවේ. ඔහු නුවණැති පණ්ඩිතවූයේ, යාග කරන්නන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක් වේ. පුරොහිත බමුණු තෙමේ මේ අංග සතරෙන් යුක්තවේ. මෙසේ මේ අංග සතරද ඒ යාගයට සම්බන්ධවූ පිරිවර වෙත්.

**16.** "බ්‍රාහ්මණය, ඉක්බිති පුරොහිත බමුණු තෙමේ මහා විජිත රජහට යාගයට පළමුව යාග විධි තුන දැක්වීය, 'මහා යාගයක් කරනු කැමති පින්වත් රජහට 'ඒකාන්තයෙන් මාගේ මහත් වස්තු රාශිය විනාශවන්නේය'යි කිසියම් පසුතැවීමක් වන්නේද,

පින්වත් රජ විසින් ඒ පසුතැවීම නොකටයුතුයි, මහායාගය කරන කල්හි පින්වත් රජුහට 'ඒකාන්තයෙන් මාගේ මහත් වස්තු රාශිය විනාශ වන්නේය'යි කිසියම් පසුතැවීමක් වන්නේද, පින්වත් රජු විසින් ඒ පසුතැවීම නොකට යුතුයි. මහායාගය කළ පසු පින්වත් රජහට ඒකාන්තයෙන් මාගේ මහත් වස්තු රාශිය විනාශ වූයේය'යි කිසියම් පසුතැවීමක් වන්නේද, පින්වත් රජහු විසින් ඒ පසුතැවීම නොකොට යුතුයි, බ්‍රාහ්මණය, පුරොහිත බමුණු තෙමේ මහාවිජිත රජහට යාගයෙන් පළමුකොට මේ යාග විධි තුන දැන්විය.

17. "බ්‍රාහ්මණය, ඉක්බිති පුරොහිත බමුණු තෙමේ මහා විජිත රජුහුගේ යාගයට පළමුවම යාගය පිළිගන්නවුන් කෙරෙහි ඇති විය හැකි පසුතැවිල්ල දස ආකාරයකින් දුරු කෙළේය. 'පින්වත්හුගේ යාගයට ප්‍රාණඝාත කරන්නෝද ඉන් වැළැක්කාහුද පැමිණෙන්නාහ. එහි යම් කෙනෙක් ප්‍රාණඝාත කරන්නාහු නම් ඔවුන්ට එහි විපාක ඇතිවන්නේය. එහි යම් කෙනෙක් ප්‍රාණඝාතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කෝද ඔවුන් උදෙසා පින්වත්තෙමේ යාග කෙරේවා. පින්වත් තෙමේ ඇල්ම කෙරේවා, පින්වත් තෙමේ සතුටු වේවා, පින්වත් තෙමේ සිත තුළ පැහැදීම කෙරේවා. තමන්ට හිමිනැති වස්තු ගන්නාහුද, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කෝද පැමිණෙන්නාහ. එහි යම් කෙනෙක් තමන්ට හිමි නැති වස්තු ගැනීම කරන්නාහු නම් ඔවුන්ට එහි විපාක ඇති වන්නේය. එහි යම කෙනෙක් තමන්ට හිමි නැති වස්තුව ගැනීමෙන් සම්පූණයෙන් වැළැක්කෝද ඔවුන් උදෙසා පින්වත් තෙමේ යාග කෙරේවා, පින්වත් තෙමේ සිත තුළ පැහැදීම කෙරේවා, කාමයෙහි වරදවා හැසිරෙන්නෝද ඉන් සම්පූර්ණයෙන් වැළැක්කෝද බොරු කියන්නෝද ඉන් සම්පූර්ණයෙන් වැළැක්කෝද, කේළාම් කියන්නෝද ඉන් සම්පූර්ණයෙන් වැළැක්කෝද රළු වචන කියන්නෝද ඉන් සම්පූර්ණයෙන් වැළැක්කෝද, හිස්වචන කියන්නෝද ඉන් සම්පූර්ණයෙන් වැළැක්කෝද, විෂම ලොභ ඇත්තෝද විෂම ලොභ නැත්තෝද, ක්‍රොධාදි වශයෙන් යහපත් ගති විනාශයට පැමිණි සිත් ඇත්තෝද, එසේ විනාශයට පැමිණි සිත් නැත්තෝද,

වැරදි දැකීම් ඇත්තෝද, හරිදැකීම් ඇත්තෝද එන්නාහ. එයින් යම් කෙනෙක් මිථ්‍යාදෘෂ්ටික නම් (අදින්නාදානාදී පවුකම් කරන්නෝනම්) ඔවුන්ටම ඉන් විපාක ඇතිවන්නේය. යම් කෙනෙක් සම්‍යක් දෘෂ්ටික නම්, පවින් සම්පූර්ණයෙන් වැළැක්කෝ වෙත් නම් ඔවුන් උදෙසා පින්වත් තෙමේ යාග කෙරේවා. පින්වත් තෙමේ සිත තුළ පැහැදීම කෙරේවා' (කියායි) බ්‍රාහ්මණ පුරොහිත බමුණු තෙමේ මේ කරුණු දශයෙන් මහාවිජිත රජහුගේ යාගයට පළමුවම ප්‍රතිග්‍රාහකයන් කෙරෙහි ඇතිවිය හැකි පසුතැවීම දුරු කෙළේය.

18. "බ්‍රාහ්මණය, ඉක්බිති ඒ පුරෝහිත බ්‍රාහ්මණ තෙමේ යාගයෙහි යෙදුනාහු මහාවිජිත රජහුගේ සිත දහසය ආකාරයකින් සතුටු කෙළේය, උත්සාහවත් කෙළේය, ප්‍රබොධ කරවිය, පැහැදවිය. 'මහා යාගයක් කරන්නාවූ පින්වත් රජහට මෙසේ කියන්නෙක්ද ඇතිවිය හැකිය. (එනම්) මහා විජිත රජ යාගයක් කෙරේ, එහෙත් යටහත් ක්ෂත්‍රියයෝද; නියම්ගම් වැසියෝද, ජනපද වැසියෝද, නොකැඳවන ලද්දහුය. එහෙත් පින්වත් රජතෙම මෙබඳුවූ මහා යාගයක් කෙරේ කියායි. පින්වත් රජුට මෙබන්දක් කියන්නා කරුණු සහිතව කියන්නෙක් නොවේ: පින්වත් රජහු විසින් යටහත් ක්ෂත්‍රියයෝද, නියම්ගම්වැසියෝද, දනවුවැසියෝද කැඳවනලද්දාහුමය.

"මේ කාරණය පිළිබඳවද පින්වත් රජතෙමේ මෙසේ දැනගනීවා පින්වත් රජතෙමේ යාග කෙරේවා, පින්වත් තෙම (යාගයෙහි) ඇලේවා, පින්වත් තෙමේ සතුටු වේවා' පින්වත් රජ තෙමේ සිත තුළ පැහැදීම ඇතිකෙරේවා, (කියායි)

'මහායාගයක් කරන්නාවූ පින්වත් රජහට මෙසේ කියන්නෙක්ද ඇතිවිය හැකිය. 'මහා විජිත රජ මහා යාගයක් කරයි. එහෙත් ඔහු විසින් ඇමතියෝද, සෙසු පිරිස්ද, නියම් ගම් වැස්සෝද, ජනපද වැස්සෝද නොකැඳවන ලද්දාහුය. එසේවී නමුත් පින්වත් රජු මෙබඳු මහායාගයක් කෙරේ' කියායි පින්වත් රජුට මෙබන්දක් කියන්නා කරුණු සහිතව කියන්නෙක් නොවේ

පින්වත් රජහු විසින් ඇමතියෝද සෙසු පිරිස්ද නියම්ගම් වැසියෝද ජනපද වැසියෝද කැඳවන ලද්දාහුමය.'

"මේ කාරණය පිළිබඳවද පින්වත් රජතෙමේ මෙසේ දැන ගනීවා. 'පින්වත් රජතෙමේ යාග කෙරේවා, පින්වත් රජතෙම (යාගයෙහි) ඇලේවා, පින්වත් තෙමේ සතුටු වේවා, පින්වත් රජතෙමේ සිත තුළ පැහැදීම ඇතිකෙරේවා' (කියායි)

"මහායාගයක් කරන්නාවූ පින්වත් රජුට මෙසේ කියන්නෙක්ද ඇතිවිය හැකිය. 'මහාවිජිත රජ මහා යාගයක් කරයි. ඒ නමුත් ඔහු විසින් බමුණු මහාසාර කුලයෝද, නියම්ගම් වැසියෝද, ජනපද වැසියෝද නොකැඳවන ලද්දාහුය. එසේවී නමුත් පින්වත් රජු මෙබඳු මහායාගයක් කෙරේය' කියායි. පින්වත් රජු මෙබන්දක් කියන්නා කරුණු සහිතව කියන්නෙක් නොවේ. පින්වත් රජහු විසින් බමුණු මහසල් කුලයෝද නියම්ගම් වැසියෝද, ජනපද වැසියෝද කැඳවන ලද්දාහුමය.

"මේ කාරණය පිළිබඳවද පින්වත් රජතෙම් මෙසේ දැනගනීවා. පින්වත් රජතෙමේ යාග කෙරේවා. පින්වත් තෙම (යාගයෙහි) ඇලේවා, පින්වත් තෙමේ සතුටු වේවා, පින්වත් රජ තෙමේ සිතතුළ පැහැදීම ඇතිකෙරේවා' (කියායි)

'මහා යාගයක් කරන්නාවූ පින්වත් රජුට මෙසේ කියන්නෙක්ද ඇතිවිය හැකිය. 'මහාවිජිත රජ මහායාගයක් කරයි. එසේවීනමුත් ඔහු විසින් වස්තු රැස්කරණ පවුල් ප්‍රධානියෝද, නියම් ගම් වැසියෝද ජනපද වැසියෝද නොකැඳවන ලද්දාහුය. එසේවී නමුත් පින්වත් රජු මෙබඳු මහායාගයක් කෙරේ' කියායි. පින්වත් රජුට මෙබන්දක් කියන්නා කරුණු සහිතව කියන්නෙක් නොවේ, පින්වත් රජු විසින් රැස්කරණ පවුල්, ප්‍රධානියෝද, නියම්ගම් වැසියෝද, ජනපද වැසියෝද කැඳවන ලද්දාහුමය.

"මේ කාරණය පිළිබඳව පින්වත් රජතෙමේ මෙසේ දැනගනීවා. පින්වත් රජතෙමේ යාග කෙරේවා, පින්වත් රජතෙම (යාගයෙහි) ඇලේවා, පින්වත් තෙමේ සතුටු වේවා, පින්වත් තෙමේ සිතතුළ පැහැදීම ඇතිකෙරේවා' (කියායි)

"මහායාග කරන්නාවූ පින්වත් රජහට මෙසේ කියන්නෙක්ද ඇතිවිය හැකිය. 'මහාවිජිත රජතෙමේ මහා යාගයක් කරයි. එහෙත් හෙතෙම මවුපිය, දෙපක්ෂයෙන් යහපත් සේ නූපන්නේය. පිරිසිදු මවුකුසින් නූපන්නේය. සත්වැනි පරම්පරාව දක්වා අවනම්බු නොලබන ලද්දේ නොවේ. ජාතිවාදයෙන් නින්දා නොකරණ ලද්දේ නොවේ. එසේවූ නමුත් පින්වත් රජ මෙබඳු මාහායාගයක් කෙරේ' පින්වත් රජුට මෙසේ කියන්නාද කරුණු සහිතව කියන්නෙක් නොවේ. පින්වත් රජතෙමේ මවුපිය දෙපක්ෂයෙන් යහපත් සේ උපන්නේය, පිරිසිදු මවුකුසින් උපන්නේය, සත්වැනි පරම්පරාව දක්වා අවනම්බු නොලබන ලද්දේය, ජාතිවාදයෙන් නින්දා නොකරණ ලද්දේය. මේ කරුණ ගැනද පින්වත් රජ මෙසේ දනීවා, පින්වත් තෙමේ යාග කෙරේවා, පින්වත් තෙම (යාගයෙහි) ඇලේවා, පින්වත් තෙමේ සතුටුවේවා, පින්වත් තෙමේ සිත්තුළ පැහැදේවා.

"මහායාගයක් කරන්නාවූ පින්වත් රජුට යමෙක් මෙසේද කියන්නේය. 'මහා විජිත රජ මහා යාගයක් කෙරේ. එසේවූ නමුත් ඔහු උත්තම රුව නැත්තෙකි. දැකුම් කටයුත්තේ නොවේ, හිත් සතුටු කරන්නෙක්ද නොවේ, උත්තම පාටෙන් යුක්තද නොවේ, උත්තම රන්වන් පාට නැත්තේය. බඹහුගේ ශරීරය වැනි ශරීරයක් නැත්තෙකි, (ඔහුගේ ශරීරයෙහි) දැකුම් කටයුතු දේද බොහෝ නොවේ' එසේවූ නමුත් පින්වත් රජ මෙබඳු මහායාගයක් කෙරේ' පින්වත් රජුට මෙසේ කියන්නාද කරුණු සහිතව කියන්නෙක් නොවේ. පින්වත් රජ උත්තම රුව ඇත්තෙකි, දැකුම් කටයුත්තේය, හිත් සතුටු කරන්නෙකි, උත්තම පාටෙන් යුක්තයි, උත්තම රන්වන් පාට ඇත්තෙකි, බඹහුගේ ශරීරය මෙන් ශරීරයක් ඇත්තෙකි ඔහුගේ ශරීරයෙහි දැකුම් කටයුතු දේ බොහෝ වේ.

'මේ කරුණු ගැනද පින්වත් රජ මෙසේ දැනගනීවා, පින්වත් තෙමේ යාග කෙරේවා, පින්වත් තෙමේ යාගයෙහි ඇලේවා. පින්වත් තෙමේ සතුටු වේවා, පින්වත් තෙමේ සිත් තුළ පැහැදේවා.

මහායාගයක් කරන්නාවූ පින්වත් රජුට යමෙක් මෙසේද කියන්නේය, මහාවිජිත රජ මහායාගයක් කෙරේ. එසේවූ නමුත් ඔහු ධනයෙන් උසස් නොවේ. මහත් ධන නැත්තේය. මහත් වස්තු සම්පත් නැත්තේය. බොහෝ මිල මුදල් නැත්තේය, බොහෝ කෑම් බීම් ආදියට ගන්නා දේ සහ ඇඳ පුටු ආදී සම්පත් නැත්තේය, බොහෝ ධන ධාන්‍ය නැත්තේය, පිරුණු ධන නිධාන හා කොටුගුළු නැත්තේය. එසේවූ නමුත් පින්වත් රජ මෙබඳු මහායාගයක් කෙරේ.' පින්වත් රජුට මෙසේ කියන්නාද කරුණු සහිතව කියන්නෙක් නොවේ. පින්වත් රජ ධනයෙන් උසස් වේ, මහත් ධන ඇත්තෙකි, මහත් වස්තු සම්පත් ඇත්තෙකි, බොහෝ මිල මුදල් ඇත්තෙකි, බොහෝ කෑම බීම්වලට ගන්නා දේ සහ ඇඳ පුටු ආදී සම්පත් ඇත්තෙකි. බොහෝ ධන ධාන්‍ය ඇත්තෙකි; පිරුණු ධන නිධාන හා කොටුගුළු ඇත්තෙකි.

'මේ කාරණය පිළිබඳවද පින්වත් රජතෙමේ මෙසේ දැන ගනීවා. පින්වත් තෙමේ යාග කෙරේවා. පින්වත් තෙමේ යාගයෙහි ඇලේවා: පින්වත් තෙමේ සිත තුළ පැහැදීම ඇති කෙරේවා.'

මහායාගයක් කරන්නාවූ පින්වත් රජුට යමෙක් මෙසේද කියන්නේය. 'මහාවිජිත රජ මහා යාගයක් කෙරේ. එසේවූ නමුත් ඔහුට අවනතවූ, තමන්ගේ අවවාදය අනුව ක්‍රියාකරන්නාවූ පිරිසක් නැත. කීර්තියෙන් හතුරන් මර්දනය කරන්නවුන් වැනිවූ, බලවත්වූ, හතර ආකාර සේනාවෙන් යුක්තවූ රජෙක් නොවේ. එසේවීනමුත් පින්වත් රජ මහා යාගයක් කෙරේ' කියායි. පින්වත් රජුට මෙබන්දක් කියන්නා කරුණු සහිතව කියන්නෙක් නොවේ. පින්වත් රජුට අවනතවූ, තමන්ගේ අවවාද අනුව ක්‍රියාකරන්නාවූ පිරිස් ඇත්තේය. කීර්තියෙන් හතුරන් මර්දනය කරන්නවුන් වැනි වූ, බලවත් හතර ආකාර සේනාවෙන් යුක්තවූ රජෙක් වේ.

"මේ කාරණය පිළිබඳවද පින්වත් රජතෙමේ මෙසේ දැනගනීවා, පින්වත් තෙමේ යාගකෙරේවා, පින්වත් තෙමේ

යාගයෙහි ඇලේවා, පින්වත් තෙමේ සතුටු වේවා, පින්වත් තෙමේ සිත තුළ පැහැදීම ඇති කෙරේවා.”

“මහායාගයක් කරන්නාවූ පින්වත් රජුට යමෙක් මෙසේද කියන්නේය. ‘මහාවිජිත රජ මහායාගයක් කෙරේ. එසේවූ නමුත් ඔහු ශ්‍රද්ධාසම්පන්න නිතර දන් දෙන දානපතියෙක් නොවේ. මහණ බමුණු, දුගී, මගී යාචකාදීන්ට නොවසනලද දොර ඇතිව ඔවුන්ට මහත් පොකුණක් වැනිව පින් නොකෙරෙයි. එසේවූ නමුත් පින්වත් රජ මහා යාගයක් කෙරේ’ කියායි. පින්වත් රජුට මෙබන්දක් කියන්නා කරුණු සහිතව කියන්නෙක් නොවේ. පින්වත් රජ ශ්‍රද්ධාසම්පන්න නිතර දන්දෙන දානපතියෙක් වේ. මහණ, බමුණු, දුගී, මගී, යාචක ආදීන්ට නොවසනලද දොර ඇතිව ඔවුන්ට මහත් පොකුණක් වැනිව පින් කෙරෙයි.’

“මේ කාරණය පිළිබඳවද පින්වත් රජතෙමේ මෙසේ දැනගනීවා, පින්වත් තෙමේ යාග කෙරේවා, පින්වත් තෙමේ යාගයෙහි ඇලේවා, පින්වත් තෙමේ සතුටු වේවා, පින්වත් තෙමේ සිත තුළ පැහැදීම ඇතිකෙරේවා.”

“මහායාගයක් කරන්නාවූ පින්වත් රජුට යමෙක් මෙසේද කියන්නේය. ‘මහාවිජිත රජ මහා යාගයක් කෙරේ. එසේවූ නමුත් ඔහු ඒ ශාස්ත්‍රයන් පිළිබඳව; මේ වනාහි මේ දෙසූ ධර්මය සම්බන්ධ අර්ථය, මේ වනාහි මේ දෙසූ ධර්මය සම්බන්ධ අර්ථය’යි ඒ ඒ දෙසූ ධර්මයෙහි අර්ථ දන්නා බොහෝ දැනීමක් ඇත්තෙක්ද නොවේ. එසේවූ නමුත් පින්වත් රජ මහා යාගයක් කෙරේ’ කියායි. පින්වත් රජුට මෙබන්දක් කියන්නා කරුණු සහිතව කියන්නෙක් නොවේ. පින්වත් රජ ඒ ශාස්ත්‍රයන් පිළිබඳව, ‘මේ වනාහි මේ දෙසූ ධර්මය සම්බන්ධ අර්ථය, මේ වනාහි මේ දෙසූ ධර්මය සම්බන්ධ අර්ථය’යි ඒ ඒ දෙසූ ධර්මයෙහි අර්ථ දන්නා බොහෝ දැනීමක් ඇත්තෙක්ද වේ.

“මේ කාරණය පිළිබඳවද පින්වත් රජතෙමේ මෙසේ දැනගනීවා, පින්වත් තෙමේ යාග කෙරේවා, පින්වත් තෙමේ යාගයෙහි ඇලේවා, පින්වත් තෙමේ සතුටු වේවා, පින්වත් තෙමේ සිත තුළ පැහැදීම ඇතිකෙරේවා.”

"මහායාගයක් කරන්නාවූ පින්වත් රජුට යමෙක් මෙසේද කියන්නේය. ඔහු අතීතානාගත වර්තමාන යන කාලත්‍රය පිළිබඳ අර්ථයන් සිතන්නට සමර්ථවූ පණ්ඩිතවූ, සමත්වූ ඥානවන්තයෙක්ද නොවේ. එහෙත් පින්වත් රජතෙමේ මෙබඳු මහත් යාගයක් කෙරෙයි,'

"පින්වත් රජුට මෙසේ කියන්නාද කරුණුසහිතව කියන්නෙක් නොවේ. 'පින්වත් රජතෙම මේ කාරණය පිළිබඳවද මෙසේ දැනගනීවා. පින්වත් රජ තෙමේ අතීතානාගත වර්තමාන යන කාල තුන පිළිබඳ අර්ථයන් සිතන්නට හැකිවූ, සමත්වූ ඥානවන්තයෙකි. මේ කරුණ ගැනද පින්වත් රජතෙම මෙසේ සලකාවා. පින්වත් තෙමේ යාග කෙරේවා. පින්වත් තෙම යාගයෙහි ඇල්වා; පින්වත් තෙමේ සතුටු වේවා, පින්වත් තෙමේ සිත්තුළ පැහැදේවා.'

"මහා යාගයක් කරන්නාවූ පින්වත් රජුට යමෙක් මෙසේද කියන්නේය: 'මහාවිජිත රජ යාගයක් කෙරේ. එහෙත් ඔහුගේ පුරොහිත බමුණා මවුපිය දෙපක්ෂයෙන් යහපත්සේ නූපන්නෙක, පිරිසිදු මවුගැබ නැත්තෙක, සත්වන පරම්පරාව දක්වා අවනම්බුවක් නොලද්දේ නොවේ. ජාතිවාදයෙන් නින්දා නොකරණ ලද්දේ නොවේ. එසේ නමුත් පින්වත් රජ මෙවැනි මහා යාගයක් කෙරේ. පින්වත් රජුට මෙසේ කියන්නාද කරුණු සහිතව කියන්නෙක් නොවේ. පින්වත් රජුගේ පුරොහිත බමුණා මව්පිය දෙපක්ෂයෙන් යහපත්ව උපන්නෙක, පිරිසිදු මව්ගැබ ඇත්තෙක. සත්වන පරම්පරාව දක්වා අවනම්බුවක් නොලද්දෙක. ජාතිවාදයෙන් නින්දා නොකරණ ලද්දෙක. මේ කරුණු ගැනද පින්වත් රජ තෙම මෙසේ සලකාවා. පින්වත් තෙම යාග කෙරේවා පින්වත් තෙම සතුටු වේවා, පින්වත් තෙම ඇතුලතවූ සිත පහදාවා.'

"මහා යාගයක් කරන්නාවූ රජුට කිසිවෙක් මෙසේද කියන්නේය. 'මහාවිජිත රජ මහා යාගයක් කෙරේ. එහෙත් ඔහුගේ පුරොහිත බමුණු වේද මන්ත්‍ර කටපාඩමෙන් කියන්නාවූ වේද මන්ත්‍ර දරන්නාවූ කෙනෙක් නොවේ. ඔහු ශාස්ත්‍රය හා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කාව්‍යඅලංකාර ශාස්ත්‍රයද සහිතවූ, ශික්ෂානිරුක්ති සහිතවූ, ඉතිහාසය පස්වෙනිකොට ඇති වෙදතුන පිළිබඳ පරතෙරට පැමිණියෙක් නොවේ. භාෂාව දන්නෙක්ද, ව්‍යාකරණ දන්නෙක්ද තර්ක ශාස්ත්‍රය හා මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණ දැනගැනීම් ඇත්තෙක්ද නොවේ. ඔහුගේ පුරොහිත බමුණු වඩනලද සිල් ඇති, සම්පූර්ණ කළ සිල් ඇති සිල්වතෙක්ද නොවේ. ඔහුගේ පුරොහිත බමුණු සමත්වූ, ඥානවත්වූ, යාගහෝමාදිය කරන්නවුන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවැනියෙක්වන පණ්ඩිතයෙක්ද නොවේ. එසේ නමුත් පින්වත් රජතෙම මෙබඳු මහා යාගයක් කෙරේ.' (කියායි)

"පින්වත් රජුට මෙසේ කියන්නාද කරුණු සහිතව කියන්නෙක් නොවේ. 'පින්වත් රජුගේ පුරොහිත බමුණු වනාහි පණ්ඩිතය, සමත්වූ ඥානවන්තය, යාගහෝමාදිය කරන්නවුන්ගෙන් පළමුවැනියෙක, නොහොත් දෙවැනියෙක මේ කරුණු ගැනද පින්වත් රජ මෙසේ සලකාවා, (මෙසේ සලකා) පින්වත් තෙම යාගකෙරේවා, පින්වත් තෙම යාගයෙහි යෙදේවා. පින්වත් තෙම සතුටු වේවා, පින්වත් තෙම ඇතුලතවූ සිත පහදාවා.'

"බ්‍රාහ්මණය, පුරොහිත බමුණු තෙමේ මහායාග කරන්නාවූ මහා විජිත රජුගේ සිත මේ කරුණු දහසයකින්ද උත්සාහවත් කළේය, පැහැදවිය, ප්‍රබොධ කළේය, ප්‍රීතිමත් කෙළේය.

**19.** 'බ්‍රාහ්මණය, ඒ යාගයෙහි ගවයන් නොමැරූහ; එලුවන් තිරලුවන් නොමැරූහ; කුකුලන්, ඌරන් නොමැරූහ; නොයෙක් ආකාර පණඇති සතුන් මරුමුවට නොපැමිණියහ. කණු පිණිස ගස් නොකැපූහ. කුසතණ නොකැපූහ. ඒ රජුගේ දාසයෝ හෝ වැඩකරන මෙහෙකරුවෝ හෝ කම්කරුවෝ හෝ දඬු ලන්ස ආදිය ගෙණ තර්ජනය නොකරණ ලද්දාහු, බය ගන්වනු නොලද්දාහු කඳුලු පිරි මුහුණින් නොහඬන්නාහු, යාගයෙහි කටයුතු කළාහුය. ඔවුන් අතුරෙන් වැඩකරණු කැමැත්තෝ වැඩ කළහ, නොකරුණු කැමැත්තෝ වැඩ නොකළහ. යමක් කරණු කැමැති අයනම් ඒ කළහ, යමක් නොකැමති අයනම් ඒ

නොකළහ. ගිතෙල්, තලතෙල්, වෙඬරු දී, මී පැණි යන මෙයින්ද ඒ යාගය අවසානයට පැමිණියේය.

**20.** "බ්‍රාහ්මණය, එවිට ඊට අනුව යෙදුනාවූ යටත් ක්ෂත්‍රියයෝද, නියම්ගම්වැසියෝද ජනපදවැසියෝද, ඇමතියෝද, අවශෙෂ පිරිස්ද, නියම්ගම්වැසියෝද, ජනපදවැසියෝද, බමුණු මහසල් කුලයෝද, නියම්ගම්වැසියෝද, ජනපද වැසියෝද, වස්තු රැස්කරණ පවුල් ප්‍රධානියෝද, නියම්ගම් වැසියෝද ජනපද වැසියෝද, බොහෝවූ ධනය රැගෙණ මහා විජිත, රජහුවෙතට පැමිණ මෙස් කීහ. 'දෙවයන් වහන්ස, මේ (ධනය දෙවයන් වහන්සේ උදෙසාම ගෙණ එන ලද්දේය දෙවයන් වහන්සේ ඒ (ධනය) පිළිගන්නා සේක්වා.'

"පින්වත්නි, මට මෙයින් කම්නැත. මාගේ බොහෝවූ ධනය ධාර්මිකවූ අයබදු ගැණිීමෙන් යහපත්ලෙස රැස්කරණ ලද්දේය. ඒ ධනයද තොපටම වේවා, මේ ධනයෙන්ද වැඩියක් හැරගණිව්.

"රජ විසින් නොපිළිගත් ධනය ඇති ඒ ක්ෂත්‍රියාදීහු ඉවත්ව ගොස් එක්තැනකට රැස්ව මෙසේ මන්ත්‍රණය කළහුයඃ මේ ධනය නැවත තමන්ගේ ගෙදරට ගෙණ යමු නම් ඒ අපට මදිකමකි. මහාවිජිත රජ තෙමේ මහා යාගයක් කෙරේ. අපිදු ඒ රජුට අනුව යාග කරමු' (යි කියායි.)

**21.** "බ්‍රාහ්මණය, එවිට (රජහුගේ) දානශාලාවට නැගෙනහිර දිසාවෙන් පැමුණුනාවූ ක්ෂත්‍රියයෝද, නියම්ගම් වැසියෝද, ජනපද වැසියෝද, දානයන් පිහිටුවූහ. යාගාවාටයට දකුණින් ඇමතියෝද, සෙසු පිරිස්ද, නියම්ගම් වැසියෝද, ජනපද වැසියෝද දානයන් පිහිටුවූහ. දානශාලාවට බස්නාහිර දිගින් බමුණු මහසල්කුලයෝද, නියම්ගම් වැසියෝද, ජනපද වැසියෝ ද දානයන් පිහිටුවූහ. බ්‍රාහ්මණය, ඒ යාගයන්හිද ගවයන් නොමැරූහ; කුකුළන්, ඌරන්, නොමැරූහ. නොයෙක් පණඇති සතුන් විනාශයට නොපැමිණියහ. යාග කණු පිණිස ගස්නොකපන ලදහ. ඔවුන්ගේ දාසයෝද, මෙහෙකරුවෝද, කම්කරුවෝද තරවටු කිරීම් ආදියෙන් කඳුළු මුසු මුහුණු නැතිව

නොහඬා, (සතුටින්) වැඩ කළහ; නොකරනු කැමැත්තෝ නොකළහ. යමක් කැමති නම් ඒ කළහ, ගිතෙල්, තලතෙල්, වෙඬරු, මී, පැණි යන මෙයින් ඒ යාගයෝ අවසානයට ගියහ.

'බ්‍රාහ්මණය, මෙසේ අංග සතරකින් යුත් සහභාගිවූ පිරිසද අංග අටකින් යුත් මහා විජිත රජතෙමේද, අංග සතර පිරිවර හා තුන් තැනකින් යුත් පුරොහිත බමුණු තෙමේද යන දහසය වර්ගයේ සිත පැහැදවීම නම් වූ යාග සම්පත්තියද දත යුතුයි"

**22.** මෙසේ කී කල්හි ඒ බමුණෝ 'යාගය යහපති, යාග සම්පත්තිය යහපතැයි මහත් ශබ්ද පැවැත්වූහ, උසස් කොට හඬ නැගූහ, මහත්සේ නාද කළහ. කූටදන්ත බ්‍රාහ්මණ තෙමේ නිශ්ශබ්දවම හුන්නේ වේ. එවිට ඒ බ්‍රාහ්මණයෝ "කිම පින්වත කූටදන්ත තෙමේ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ යහපත් කථාව යහපත් කථාවක් සේ පිළිගෙණ වැඩියක් සතුටු නොවේදැ'යි කූටදන්තගෙන් ඇසූහ.

"පින්වත්නි, මම ශ්‍රමණ ගෞතමයන්ගේ සුභාෂිතය සුභාෂිතයක්සේ පිළිගෙණ වැඩියක් සතුටුවෙමි. යමෙක් ඒ යහපත් කථාව යහපත් සේ පිළිගෙණ වැඩියක් සතුටු නොවන්නේ නම් ඔහුගේ හිසද පැළෙන්නේය. යලි මට මෙබඳු අදහසක් වේ, ශ්‍රමණ ගෞතම තෙමේ 'මා විසින් මෙසේ අසන ලදැයි කියා හෝ 'මෙසේ වන්නට සුදුසුය'යි කියා හෝ කිසිත් නොකියයි එහෙත් උන්වහන්සේ 'එකල්හි මෙසේ වීය; මෙබඳු ලෙසින් වීය'යි දක්වනසේක. ඒකාන්තයෙන් ශ්‍රමණ ගෞතම තෙම එකල යාග ස්වාමීවූ මහා විජිත රජ හෝ යාග කරවන්නාවූ පුරොහිත බමුණා හෝ වූයේය' යනු මා අදහසයයි. කිම, භවත් ගෞතමන් වහන්සේ මෙබඳු යාගයක් කොට හෝ යාගයක් කරවා මරණින් මතු ස්වර්ගලොකයෙහි උපන්නේයයි පිළිගන්නාසේක්ද?"

"එසේය, බ්‍රාහ්මණය, මම මෙබඳු යාගයක් කොටද, කරවාද මරණින් මතු ස්වර්ගයෙහි උපන්නෙමියි පිළිගනිමි. මම ඒ කාලයෙහි ඒ යාගය කරවූ පුරොහිත බමුණු වූයෙමි."

**22.** "භවත් ගෞතමයන් වහන්ස, මේ දහසය පිරිවර හා තුන් ආකාර යාග සම්පත්තියට වඩා ස්වල්ප කටයුතු ඇති ස්වල්ප

පීඩා ඇති එහෙත් එයට වඩා අතිශයින් මහත් ඵල ඇති, මහත් අනුසස් ඇති, අනික් යාගයක් ඇද්ද?”

“බමුණ, මේ දහසය පිරිවර හා තුන් ආකාර යාග සම්පත්තියට වඩා ස්වල්ප කටයුතු ඇති, ස්වල්ප පීඩා ඇති එහෙත් ඊට වඩා මහත්ඵල ඇති, මහත් අනුසස් ඇති අනික් යාගයක් ඇත්තේය.”

“භවත් ගෞතමයන් වහන්ස, මේ දහසය පිරිවර හා තුන් ආකාර යාග සම්පත්තියට වඩා ස්වල්ප කටයුතු ඇති, ස්වල්ප පීඩා ඇති, එහෙත් ඊට වඩා මහත් ඵල ඇති, මහත් අනුසස් ඇති ඒ යාගය කුමක්ද?

“බ්‍රාහ්මණය, යාගවූ නිරන්තරයෙන් දියයුතු ඒ දානය සිල්වත් පැවිද්දන් උදෙසා දෙත් නම්, බ්‍රාහ්මණය, එය මේ සොළොස් පිරිවර හා ත්‍රිවිධ යාග සම්පත් ඇති දානයට වඩා ස්වල්ප කටයුතු ඇත්තේ, ස්වල්ප පීඩා ඇත්තේ මහත් ඵලදායී මහත් අනුසස් ඇත්තේද වේ.”

**24.** “භවත් ගෞතමයන් වහන්ස යම්හෙයකින් යාගවූ නිරන්තරයෙන් දියයුතු ඒ දානය දහසය පිරිවර ඇති මේ තුන් ආකාර යාග සම්පත්තියට වඩා අතිශයින් ස්වල්ප කටයුතු ඇත්තේ වේද, අතිශයින් ස්වල්ප උපකරණ ඇත්තේ වේද, අතිශයින් මහත් ඵල ඇත්තේ වේද, මහානිශංස ඇත්තේ වේද ඊට හේතු කවරේද, ඊට ප්‍රත්‍යය කවරේද?”

“බ්‍රාහ්මණය, මෙබඳු යාගයකට රහතුන් වහන්සේලා හෝ රහත් මගට පැමිණි ඇත්තෝ නොපැමිණෙත්. ඊටහේතු කවරේද, යත්ඃ මෙහි දඬු පහර දීම්ද, බෙල්ලෙන් අල්ලා සෙලවීම්ද දක්නට ලැබෙත්. එබැවින් මෙබඳු යාගයට රහතුන්ද රහත්මගට පැමිණි ඇත්තෝද නොපැමිණෙත්. සිල්වත් මහණුන් උදෙසා යම් යාගයක්වූ යම් නිත්‍ය දානයක් දෙනු ලැබේද, බමුණ, එබඳු යාගයට රහත්හුද රහත් මගට පැමිණි ඇත්තෝද පැමිණෙත්. ඊට කරුණු කියත්ම, බමුණ, එහි දන්ඩෙන් පහරදීම්ද, බෙල්ලෙන් අල්ලාගැනීම්ද නැත. එහෙයින් රහත්හුද රහත් මගට පැමිණි ඇත්තෝද එබඳු යාගයට පැමිණෙත් මේ දහසය පිරිවර සහිත

තුන් ආකාර යාග සම්පත්තියට වඩා අනුකූල, යාගයවූ නොකඩවා දෙන දානය ස්වල්ප කටයුතු ඇත්තේ, ස්වල්ප හිරිහැර ඇත්තේ, එහෙත් අතිශයින් ඵලවත් වූයේ අතිශයින් ආනිසංස ඇත්තේද වේ. බමුණ රහතුන්ගේ එහි පැමිණීම ඊටහේතුවයි. ඊට ප්‍රත්‍යයයි.”

**25.** “භවත් ගෞතමයන් වහන්ස, මේ දහසය පිරිවර හා තුන් ආකාර සම්පත් ඇති දානයටත් අනුකූල යාගයවූ මේ නිත්‍ය දානයටත් වඩා ස්වල්ප කටයුතු ඇති ස්වල්ප හිරිහැර ඇති එහෙත් අතිශයින් මහත්ඵලදායී අතිශයින් ආනිසංස ඇති අන්‍ය යාගයක් ඇත්තේද?”

“බ්‍රාහ්මණය, මේ දහසය පිරිවර සහිත තුන් ආකාර යාග සම්පත්තියටත් මේ අනුකූල යාගයවූ නිත්‍ය දානයටත් වඩා ස්වල්ප කටයුතු ඇති, ස්වල්ප හිරිහැර ඇති, එහෙත් ඉතා මහත් ඵලදායක, මහත් අනුසස් ඇති අනික් යාගයන් ඇත්තේය.”

“භවත් ගෞතමයන් වහන්ස, දහසය පිරිවර ඇති මේ තුන් ආකාර යාග සම්පත්තියටත් අනුකූල යාගයවූ නිත්‍ය දානයටත් වඩා ස්වල්පවූ හිරිහැර ඇති, එහෙත් මහත්ඵල ඇති මහානිසංස ඇති යාගය කවරේද?”

“බ්‍රාහ්මණය, යමෙක් සිවුදිගින් පැමිණෙන සංඝයා උදෙසා විහාරයක් කෙරේද, ඒ මහත් තෑග්ග දහසය පිරිවර හා තුන් ආකාර සම්පත්තීන් යුත් යාගයටද, අනුකූල යාගයවූ නිත්‍ය දානයටද වඩා ස්වල්ප කටයුතු ඇති, ස්වල්ප හිරිහැර ඇති එහෙත් මහත් ඵලදායක මහා ආනිසංස ඇති යාගයක් වේ.”

**26.** “භවත් ගෞතමයන් වහන්ස, මේ දහසය පිරිවර හා තුන් ආකාර යාග සම්පත් ඇති දානයටද, අනුකූල යාගයවූ නිත්‍ය දානයටද මේ විහාර දානයටද වඩා ස්වල්ප කටයුතු ඇති එහෙත් මහත්ඵල මහා ආනිසංස ඇති අනික් දානයක් ඇත්තේද?”

“මේ දහසය පිරිවර සහිත තුන් ආකාර යාග සම්පත්තියටද, අනුකූල යාගයවූ නිත්‍ය දානයටද, මේ විහාර දානයටද වඩා ස්වල්ප කටයුතු ඇති, ස්වල්පවූ හිරිහැර ඇති, එහෙත් මහත් ඵලදායී මහා ආනිසංස ඇති අනික් යාගයක් ඇත්තේය.”

"භවත් ගෞතමයන් වහන්ස, මේ දහසය පිරිවර ඇති තුන් ආකාර යාග සම්පත්තියටද මේ අනුකූල යාගයවූ නිත්‍ය දානයටද මේ විහාර දානයටද වඩා ස්වල්ප කටයුතු ඇති, ස්වල්ප හිරිහැර ඇති, එහෙත් මහත් ඵලදායි, මහා ආනිසංස ඇත්තේ ඒ කිනම් යාගයක්ද?"

**27.** "බ්‍රාහ්මණය, යමෙක් තෙම පැහැදුන සිත් ඇත්තේ බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රය සරණ ගියේ වේද, බමුණ මේ යාගය ඒ දහසය පිරිවර සහිත තුන් ආකාර යාග සම්පත්තියටද, අනුකූල යාගයවූ නිත්‍ය දානයටද මේ විහාර දානයටද වඩා ස්වල්ප කටයුතු ඇත්තේ ස්වල්ප හිරිහැර ඇත්තේ එහෙත් ඉතා මහත්ඵල ඇත්තේ මහා ආනිසංස ඇත්තේද වේ."

"භවත් ගෞතමයන්වහන්ස, දහසය පිරිවර ඇති ඒ තුන් ආකාර යාග සම්පත්තියටද, අනුකූල වස්තු දීමවූ ඒ නිත්‍ය දානයටද, ඒ විහාර දානයටද, ඒ සරණාගමනයටද වඩා ස්වල්ප කටයුතු ඇති, ස්වල්ප හිරිහැර ඇති. මහත් ඵලදායි මහත් ආනිසංස ඇති අනික් යාගයක් ඇද්ද?"

"බමුණ, දහසය පිරිවර සහිත මේ තුන් ආකාර යාග සම්පත්තියටද, අනුකූල යාගයවූ මේ නිත්‍ය දානයටද, මේ විහාරදානයටද, මේ සරණ ගමනයටද, වඩා ස්වල්පවූ කටයුතු ඇති, මඳවූ හිරිහැර ඇති, මහත් ඵලදායි, මහා ආනිසංස ඇති අනික් යාගයෙක් ඇත්තේය."

"පින්වත් ගෞතමයන් වහන්ස, මේ දහසය පිරිවර සහිත තුන් ආකාර යාග සම්පත්තියටද, මේ අනුකූල යාගයවූ නිත්‍ය දානයටද, මේ විහාර දානයටද, මේ සරණාගමනයටද වඩා මඳ කටයුතු ඇති, මඳවූ හිරිහැර ඇති එහෙත් මහත් ඵල ඇති මහත් ආනිසංස ඇති ඒ යාගය කවරේද?"

"බ්‍රාහ්මණය, යමෙක් පැහැදුන සිත් ඇතිව ශික්ෂාපදයන් සමාදන් වේද එනම් ප්‍රාණඝාතයෙන් වැළකීම, අනුන්ට අයිති දෙයක් වැරදිලෙස ගැනීමෙන් වැළකීම, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම, මද ප්‍රාමාද දෙකට

කරුණුවූ මත්පැන් පානයෙන් වැළකීමවේ, බ්‍රාහ්මණය මේ යාගය දහසය පිරිවර සහිත ත්‍රිවිධ යාග සම්ත්තියටද, මේ අනුකූල යාගයවූ නිත්‍ය දානයටද, මේ විහාර දානයටද මේ සරණ ගමනයටද වඩා මඳවූ කටයුතු ඇත්තේ, මඳවූ හිරිහැර ඇත්තේ එහෙත් මහත් ඵලදායී, මහානිසංස ඇත්තේවේ; වඩා ස්වල්ප කටයුතු ඇත්තේද මහත් ඵලදායිද වේ."

**28.** "භවත් ගෞතමයන් වහන්ස, මේ කී දහසය පිරිවර සහිත තුන් ආකාර යාග සම්පත්තියටද, අනුකූල යාගයවූ නිත්‍ය දානයටද, විහාර දානයටද, සරණගමනයටද ශික්ෂාපද සමාදානයටද වඩා මඳවූ කටයුතු ඇති, මඳ පීඩා ඇති, එහෙත් මහත් ඵලදායී මහා ආනිසංස ඇති අනික් යාගයක් ඇත්තේද?"

"බ්‍රාහ්මණය, දහසය පිරිවර සහිත ත්‍රිවිධ යාග සම්පත්තියටද අනුකූල යාගයවූ නිත්‍ය දානයටද විහාර දානයටද, සරණගමණයටද, ශික්ෂාපද සමාදානයටද වඩා මඳවූ කටයුතු ඇති, මඳවූ පීඩා ඇති, එහෙත් මහත්ඵලදායි මහා ආනිසංස ඇති අනිත් යාගයක් ඇත්තේය."

"පින්වත් ගෞතමයන් වහන්ස, මේ දහසය පිරිවර සහිත ත්‍රිවිධ යාග සම්පත්තියටද, අනුකූල යාගයවූ නිත්‍ය දානයටද සරණගමනයටද, ශික්ෂාපද සමාදානයටද වඩා මඳවූ කටයුතු ඇති, මඳවූ පීඩා ඇති එහෙත් අතිශයින් ඵලදායී මහා ආනිසංස ඇති යාගය කවරේද?"

**29.** "බ්‍රාහ්මණය, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනා ඥාන ආදී විද්‍යාඅට සීලසංවරය ආදී හසුරුවන ධර්ම පසළොස යන අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙවි මිනිසුන්ට ගුරුවරයෙක්වූ, (චතුරාර්ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්මසතර අවබොධකළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ' මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් සහ මිනිසුන්

සහිතවූ, සත්ත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැක පැහැදිලි කොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙලවර යහපත්වූ, අර්ථ සහිතවූ, (දස ආකාරයෙන්) නියම විදියට වචන ශබ්ද කරන්නාවූ ඛ්‍යඤ්ජන සහිත, සියලු ලෙසින් සම්පූර්ණවූ පිරිසිදුවූ, සියලු ශාසනමාර්ග බ්‍රහ්මචර්ය ගෙන හැර දක්වති.

**30.** "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි, ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය. 'ගෘහවාසය පීඩා සහිතයි. රාගාදී කෙලෙස් සහිත මාර්ගයෙකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැලිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි' කියායි.

"ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාශිය හැර, ස්වල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වේ. මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවරසීලයෙන් යුක්ත වූයේ, යහපත් හැසිරීමෙන් හා වරද නැති පැවැත්මෙන් යුක්ත වූයේ, ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භය දක්නා ගති ඇත්තෙක් වූයේ, යහපත්වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්තවූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි පිරිසිදුවූ ජීවිත පැවතුම් ඇත්තේ වෙයි. ශීලයෙන් යුක්ත වූයේ වෙයි. ඉන්ද්‍රියයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි, කෑමෙහි පමණ දන්නේ වෙයි, යහපත් සිහියෙන් හා නුවණින් යුක්ත වූයේ වෙයි, සන්තෝෂයෙන් යුක්තවෙයි.

**31.** "බමුණ, භික්ෂුනමක් කෙසේ නම් සීලසම්පන්න වේද? බමුණ, මේ සස්නෙහිවූ භික්ෂුනමක් ප්‍රාණවධය හැර ඉන්

සම්පූර්ණයෙන් වැළැක්කේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහාතබන ලද ආයුද ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ කරුණාවන්තවූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතිව වාසය කෙරේද මෙයද ඔහුගේ සීලයක්වේ. නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමතිවන්නේ, සොරනොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේද මෙයද ඔහුගේ සීලයෙකි. අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන්වූයේ බ්‍රහ්මචාරිවේද මෙයද ඔහුගේ සීලයකි. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකරේද මෙයද ඔහුගේ සීලයෙකි. පිසුණු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතැනින්, අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද, මෙසේ භෙද වූවන් ගළපන්නේ සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ තෙපුල් කියන්නේවේද මේද ඔහුගේ සීලයෙකි. ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, යම් වචනයක් නිදොස් වේද, කනට සැපද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේද මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්මද දියුණුවට හේතුවන වචන කීමද, මෙයද ඔහුගේ සීලයෙකි.

"තණ, ගස්, වැල්, සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන කෑම ඇත්තේ, රාත්‍රි කෑමෙන් හා අවේලෙහි කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. අමුවූ ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේ. අමුමස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනුලමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද වේ. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේ, එළුවන් හා තිරෙළුවන් පිළිගැනීමෙන් තොරවූයේ කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්; වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද, සම්පූර්ණයෙන් තොරවූයේය. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන පහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. ගනුදෙනු කිරීමය, තරාදි ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මිශ්‍ර වඤ්චා කිරීමය, වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය, යන මෙයින්ද සම්පූර්ණයෙන් වැළැක්කේය, මෙයද ඔහුගේ සීලයක්වේ.

## සුළු සිල් නිමියේ.

32. "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මූලබීජය, ඛන්ධබීජය, ඵළුබීජය, දළුබීජය, පස්වැනිවූ බීජබීජය යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්ද

මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේ නම් මෙයද ඔහුගේ එක් සීලයක්වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙනලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, නොඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛ්‍යාත වහන් දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත් කොට තබා ප්‍රයෝජන ගැන්මයයි කියනලද පසුවට තබා ප්‍රයෝජන ගැන්මෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේ නම්, මෙද ඔහුගේ සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, වැඩක් නැති කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරැස් බෙර හෝ කළ බෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණදොවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනී ඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මීවුන් හා පොරය, ගවයින් හා පොරය, එළුපොරය, මෙණ්ඩක එළුපොරය, කුකුළුපොරය, වටුපොරය, දඬු (පොලු) පොරය, තොරතුරු (අත මිට මොලවා) ඇනීමය, මල්ලව යුද්ධය, යුද්ධය, ඇත් අස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත් ද මෙසේ මෙබඳු විසුලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකේ නම් මෙයද ඔහුගේ සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙනලද කෑම කා (දූ පෝරු ආදියෙහි කෙළිම්වූ) ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම් මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටමිටි ගසා ඇත් අස් ආදී රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, නළා පිඹීමය, ක්‍රීඩා නගුල් ගෙන සෙල්ලම්

සීසෑමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන්ගුරුවා තනා ක්‍රීඩාකිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැණ කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය. ඒ ඒ දොෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්ද මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

33. "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දික්හඟලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇතිරිය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළුලොම් සුදු ඇතිරිය, එළුලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදී රූපයෙන් විසිතුරු එළුලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති ඇතිරිය දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය, රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එක්විට නැට්ටුක්කාරියන් දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරන ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබනලද රතුපාට කොට්ට ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කෙරෙත්ද මෙසේ මෙබඳුවූ උස් අසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි,

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, මූනබලන කන්නාඩි, අඳුන් තෙල් පාවිච්චිය හා සුවඳ, මූණේ ගානා සුවඳ කුඩු, මූණේ ගානා සුවඳ ද්‍රව්‍ය, අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය, විසිතුරු දඬුගෙන හැසිරීමය, බෙහෙත් නළ එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙනයෑම, විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය. නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය, දික්වූ දහවලු ඇති සුදුරෙදි

ඇදීමයයි මෙසේවූ සැරසීම් හා අඩුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්ද මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**34.** "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය මහ ඇමතියන් පිළිබඳ කථාය, සෙනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය, මාලා පිළිබඳ කථාය, ගන්ධ ද්‍රව්‍යයන් පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි දරුවන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ තේරුම් නැති කථාය, ලොකය පිළිබඳ කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්ද මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**35.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි' 'ඔබ මේ ධර්මවිනයකුමකැයි දන්නෙහිද?' ඔබ වරදවා පිළිපදින්නෙහිය, මම මනාකොට පිළිපදින්නේ වෙමි'. 'මාගේ වචන යහපත්ය, හෝ අර්ථ සහිතය, ඔබගේ වචන අර්ථ රහිතය' 'පළමු කියයුත්ත පසුව කීයෙහිය. පසුව කිය යුත්ත පළමුව කීයෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදුකරණ ලද නම් ඒ සියල්ල නිෂ්ඵල විය. ඔබට වදාරොපනය කරණ ලදී. නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව' යන ආදී දෝෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්ද මෙසේ මෙබඳු දෝෂාරොපණ කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**36.** "එසේ සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියන්ගේ, බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යව අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යව, එතැනින් අසවල් දෙය ගෙණෙව'යි දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්ද මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැළැක්කේ නම් මෙයද ඒ ඔහුගේ එක් සීලයෙකි.

**37.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා කුහකයෝද, සිව්පසය උදෙසා කථා කරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන් කරන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද ලාභයකින් ලාභයක් සොයන්නෝද වෙත්. මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග ආදියෙන් වැළැක්මක් වේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි."

**මැදුම් සිල් නිමියේය.**

**38.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, හෙනගැසීම ආදී මහ නිමිතිබලා කියන ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය ලක්ෂණ ශාස්ත්‍රය, මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන ශාස්ත්‍රය, ගිනිදෙවියා පිදීමය, දබ්බිහොමය, ථුස හොමය, තණ්ඩුල හොමය, කණ හොමය, සප්පි හොමය තෙල හොමය, මුඛ හොමය, ලේ හොමය, ශරීර විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි සාන්ති කරන්නාවූ විද්‍යා, භූත විද්‍යා, නාග විද්‍යා, විෂ විද්‍යා, ගෝනුසු විද්‍යා, මී විද්‍යා, කුරුලු විද්‍යා, කපුටු විද්‍යා, ජීවිත කාලය කීම, ආයුධ වැළැක්ම, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා හේතුකොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු පහත් විද්‍යා හේතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**39.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මිණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ

ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය, ස්ත්‍රී ලක්ෂණය, පුරිස ලක්ෂණය, පිරිමිදරු ලක්ෂණය, ගෑනුදරු ලක්ෂණය, දාස ලක්ෂණය, දාසි ලක්ෂණය, ඇත් ලක්ෂණය, අශ්ව ලක්ෂණය, කැස්බෑ ලක්ෂණය, එළු ලක්ෂණය, මීහරක් ලක්ෂණය, ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය, කුකුළු ලක්ෂණය, වටු ලක්ෂණය, තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය, මුව ලක්ෂණයයි, මෙබඳු පහත් විද්‍යාවන් කරණ කොට ගෙන වැරදි ජීවිකාව කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**40.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැර යෑම වන්නේය. අසවල් දින ඇතුළු නුවරට එන්නේය. අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ ආපසු යෑමවන්නේය. ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හෙතුකොට ලාමක ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයක් වේ.

**41.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'චන්ද්‍රග්‍රහණය වන්නේය, සූර්ග්‍රහණය වන්නේය, තාරකා සමාගමය වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමග යෑම වන්නේය, තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය, තාරකාවන්ගේ නොමග යෑම් වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළොව කම්පාව වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ, හිරු තාරකාවන්ගේ නැගීම හා බැහීමද කෙළෙසීමද පිරිසිදු

වීමද වන්නේය, චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය. චන්ද්‍ර සූර්යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇති වන්නේය, ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇති වන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය, දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම මෙබඳු විපාක ඇති වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටුවීම හා පිරිසිදු වීම මෙබඳු විපාක ඇතිවන්නේයයි' කියා මෙසේ පහත් විද්‍යා හේතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හේතු කොට ගෙණ කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

**42.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය, යහපත් ආහාරපාන ඇතිවන්නේය, ආහාර පාන නැති වන්නේය, නිර්භය ඇතිවන්නේය, භය ඇතිවන්නේය, රෝග ඇතිවන්නේය, නිරෝගී බව ඇතිවන්නේයයි' කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන්කිරීමය, කොටස්කර ගණන් කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණකොට වැරදි ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හෙතුවෙන් වන වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

**43.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා අවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථාකිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇතිකිරීමය, දුර්ගර්භකරණය, ගර්භවිරොධි කරණය, දිව් තද කිරීමය, නූල් බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර

ජපකිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්න ඇසීමය, ගෑනුදරුවන්ගේ ශරීරයෙහි දෙවතා රොපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණය කොට ප්‍රශ්න ඇසීමය, හිරු වැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම් කිරීමය, කටින් ගිනිදැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

44. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීමය, කාර්යය සමෘද්ධි කටයුතු කර්මය, මන්ත්‍ර කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මූන සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩු කය විරේකය, යටිකය විරේකය, හිස විරේකය, කන්තෙලය, ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍ය කිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකමය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකම්ය, මූලික බෙහෙත් දීමය, සැර බෙහෙත්දී පසුව එහි බල හැරීමය කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට, වැරදි ජීවත්වීමෙන් ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

45. "බමුණ, මෙසේ ශීල සම්පන්නවූ භික්ෂුහට භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ ශීලසංවරය හෙතු කොට ගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:- බමුණ ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම, බමුණ, සීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ශීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය. ආර්යවූ (උතුම්වූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂු තෙම, තමන් තුළ පිරිසිදුවූ

(කායික චෛතසික) සැපය විඳියි. බමුණ, මෙසේ දැක්වූ ශීලයෙන් යුක්තවූ භික්ෂුව ශීලසම්පන්න නම් වේ.

## මහ සිල් නිමියේය

**46.** "බමුණ, භික්ෂුව කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේද? බමුණ, මේ සස්නෙහි භික්ෂු තෙමේ, ඇසින් රූපයක් දැක එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ඇස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ ඇස් ඉන්ද්‍රියය රකී, ඇස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ: කනින් ශබ්දයක් අසා එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. කන් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ කන් ඉන්ද්‍රියය රකී. කන් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. නාසයට ගඳ සුවඳ දැනී එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. නාස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදි අකුසල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ නාස් ඉන්ද්‍රියය රකී. නාස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. දිව් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ දිව් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී තමාගේ ස්පර්ශ ඉන්ද්‍රියය රකී. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. සිතින් (ධර්මයක්) අරමුණක් දැන එහි නොඇලේ, එහි නොපෙළඹෙන්නේය. සිත් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් නිසා දැඩි ආසාව හා කලකිරිම

ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. හෙතෙම සිත් ඉන්ද්‍රිය රකී. සිත් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ භික්ෂුව උතුම්වූ ශීල රාශියෙන් යුක්තවූයේ අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ අධිචිත්ත සැපය විඳියි. බමුණ, මෙසේවූ භික්ෂු තෙමේ ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තේ වේ.

47. "බමුණ, භික්ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද?

"බමුණ, මේ සස්නෙහි භික්ෂුතෙම ඉදිරියට යෑමෙහිද, ආපසු යෑමෙහිද, නුවණින් දැන කරන්නේය. ඉදිරි බැලීමෙහිද, වටපිට බැලීමෙහිද නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහිද, දිගු කිරීමෙහිද, මනා නුවණින් දැන එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිද මනා නුවණින් දැන එසේ කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, වැළඳීමය, රස විඳීමය යන මෙහිද මනා නුවණින් යෙදී එසේ කරන්නේය. මල මුත්‍ර පහකිරීමද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්දව සිටීම යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. බමුණ, මෙසේ කරන්නාවූ භික්ෂු තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි.

48. "බමුණ, භික්ෂු තෙමේ කෙසේ සතුටු වූයේ වේද?

"බමුණ, භික්ෂු තෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද, සතුටු සිත් ඇත්තේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳවූ දේ) පමණක් ගෙන යයි බමුණ, යම් සේ පක්ෂියෙක් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, බමුණ, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය ආරක්ෂාවට ප්‍රමාණවූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු වන්නේ වේ. ඔහු යම් තැනක යා නම් අටපිරිකර පමණක් රැගෙණ

බැහැර යයි. බමුණ, මෙසේවූ භික්ෂු තෙමේ සන්තොෂයෙන් යුක්ත වේ.

**49.** "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, මේ උතුම්වූ සන්තෝෂයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, කඳු පලාත්ද, කඳුරැලි ගල්ගුහාවන් හෝ මහා මගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ ඉඩකඩ ඇති තැන් සහ තණ ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළැක්කේ. පර්යංකය බැඳ, කකුල් අකුලුවා හිඳ ශරීරයේ උඩු කොටස කෙලින් තබා නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවාගෙණ හිඳී.

**50.** "ඔහු ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභ සිත වෙන් කොට පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව පණඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වාසයකරයි. ක්‍රොධ දොෂයෙන් වෙන්ව සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේ. අලස බව දුරුකොට සිත පිරිසිදු කෙරේ. උඩගු බව හා කුකුස දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, සිත උඩගු බව හා කුකුසෙන් පිරිසිදු කෙරේ. විචිකිච්ඡාව (සැකය) දුරුකොට පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේ; විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

**51.** "බමුණ, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්තයන්හි යොදන්නේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණුවන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් ආරක්ෂා කරණ පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඔහට මෙබඳු අදහසක් ඇතිවේ. 'මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ

දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි; අඹුදරුවන් පොෂ්‍ය කිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය, කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

**52.** "බමුණ, යම්සේ රොගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේද, ඕහට ආහාර රුචි නොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීර බලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳුද යත්: 'මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන් බව ඇති කෙනෙක් වීමි. මට බත් රුචියද නොවීය, ශරීර බලයද නැතිවිය, ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය. කාය බලයද තිබේය' කියායි. ඔහු ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසටද පැමිණෙන්නේය.

**53.** "බමුණ, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසු කලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය. සතුටට පැමිණෙන්නේය.

**54.** "බමුණ, යම් සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි අනුන්ට යටත්වූ, තමා කැමති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි, වැඩකරුවෙක් වන්නේද, ඔහු පසු කලක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර සිය කැමැති පරිදි යමක් කරන්ට නොහැකි,

අනුන්ට යටත් මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපති කොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත්නූන කෙනෙක් වීමි. අනුන්ට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමති තැනෙක යා හැක්කේද වෙමි'යි කියායි. ඔහු ඒ දාසභාවයෙන් මිදීම හේතුකොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

**55.** "බමුණ, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේද, ඔහු මඳ කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොර සතුරන්ගෙන් පීඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්:- 'මම පෙර ධනවත් වූයෙමි, භොග සම්පත් සහිත වූයෙමි, දුර්ලභ භික්ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණියෙක් වූයෙමි. එසේවූ මම දැන් එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගය එතර කිරීම නිමිති, කොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සතුටටද පැමිණෙන්නේය.

**56.** "බමුණ, ණය යම්සේද, රෝගය යම්සේද, හිරගේ යම්සේද, දාසභාවය යම්සේද, දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂු තෙමේ පහනොකළ (පඤ්චනීවරණ) කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි ලා නුවණින් දකිද බමුණ, ණය නැති බව යම්සේද, නිරෝගී බව යම්සේද, සිරගෙන් මිදීම යම්සේද, අනුන්ට යටහත් නැති බව යම්සේද, භය නැති භූමිය යම්සේද, එපරිද්දෙන්ම බමුණ, භික්ෂු තෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ ලා දක්නේය.

**57.** පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ භික්ෂුහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසහගත සිත් ඇත්තහුගේ නාම කය (වේදනාදී ස්කන්ධ හතර) සංසිඳෙයි. සංසිඳිනු කය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඇති තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) පැමිණෙයි.

**58.** "ඒ භික්ෂු තෙමේ වස්තුකාම ක්ලෙශකාමයන්ගෙන් වෙන් වූයේම, අශකුල ධර්මයන් කෙරෙන්ද වෙන් වූයේම අරමුණෙහි සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම සහිතවූ, සිතෙහි විවේකයෙන් උපන් ප්‍රීතියම සැපකොට ඇති, පළමුවෙනි ධ්‍යාන කුසල චිත්තය තමා තුළ ඉපදවීම් වසයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරේද ඔහු විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ (සකල) ශරීරයම සැපවත් කෙරෙයි. සම්පූර්ණයෙන් පුරවයි. සැමතන්හි පතුරුවයි. ඒ ඔහුගේ පළමුවෙනි විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන් සකල ශරීරයෙහිම පළමුවෙනි ධ්‍යානයෙන් යුත් සැපය පතුරුවයි.

**59.** "බමුණ, යම්සේ දක්ෂවූ ස්නාන ද්‍රව්‍ය සපයන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ ස්නානයට ගන්නාවූ සුණු ලොහ තලියක බහා දිය ඉසිමින් අතින් අනමින් පිඩු කරන්නේද, එවිට ඒ මේ ස්නාන කුඩුගුලිය දියෙන් යුක්ත වේ, ජලය හාත්පසින් කාවැදුනේ වේ. එහි ඇතුළත හා පිටතද සියලු තන්හිම ජලයෙන් පහස්නා ලද්දේ වේ. එහෙත් බින්දු වශයෙන් ජලය ඉන් නොවැගිරේද,

"බමුණ, එපරිද්දෙන් ඒ භික්ෂු තෙමේ, විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි, හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, සැමතන්හි පතුරුවයි. ඔහුගේ සියලු ශරීරයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් පැතිරෙයි.

"බ්‍රාහ්මණය, මේ යාගය වූ කලී පළමු කී යාගයන්ට වඩා ස්වල්පවූ කටයුතු ඇත්තේ, ස්වල්පවූ පීඩා ඇත්තේ අතිශයින් මහත් ඵලදායිද, මහානිසංස ඇත්තේද වේ.

**60.** "බමුණ, නැවතද භික්ෂු තෙමේ අරමුණෙහි සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම යන මොවුන්ගේ සන්සිඳීමෙන් අද්ධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, සමාධියෙන් හටගත්

ප්‍රීති සැපය ඇති දෙවැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කරයි. ඒ මහණ තෙමේ මේ කය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි. හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශකරයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි දෙවැනි ධ්‍යානයෙන් සැප පැතිරේ.

**61.** "බමුණ, යම්සේ ඇතුළතම හටගත් ජලය ඇති දියවිලක් වේද ඒ විල පිළිබඳ පෙර දිගින්ද, අපර දිගින්ද, උතුරු දිගින්ද, දකුණු දිගින්ද, දිය එන මගක් නැත්තේ වේද වැස්සද කලින් කල මනාසේ වැසි වැසීම නොකරන්නේද, එසේවූ ඒ විලෙන් සිහිල් දිය දහර පොළොව බිඳ නැගී ඒ මුළු විලම සිහිල් දියෙන් පතුරුවයි, හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි. එහි හැම තැන දියෙන් ස්පර්ශ කෙරෙයි. ඒ සියලු විලෙහි සීත ජලය නොපැතිර පවත්නා තැනක් නම් නැත්තේය. බමුණ, එපරිද්දෙන් මේ භික්ෂු තෙමේ මේ මුළු ශරීරයම සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, ඉන් සැමතැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි දෙවෙනි ධ්‍යාන සැපයෙන් පැතිරෙයි.

"බ්‍රාහ්මණ; මේ යාගය වූකලී පළමු කී යාගයන්ට වඩා ස්වල්පවූ කටයුතු ඇත්තේ, ස්වල්පවූ පීඩා ඇත්තේ, අතිශයින් මහත්ඵලදායීද මහානිසංස ඇත්තේද වේ.

**62.** "නැවතද බමුණ, ඒ භික්ෂු තෙමේ ප්‍රීතියෙහි නොඇල්මෙන් මැදහත් බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (උපේක්ෂා) සැප දුක් දෙකට මැදහත් විඳීම ඇත්තේය, සිහි ඇත්තේය. සැපයෙන් විසීම ඇත්තේයයි ආර්යයෝ කියත්ද ඒ තුන්වැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ භික්ෂු තෙමේ මේ සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේ. ඒ සැපතින් හාත්පසින් තෙමෙයි, සම්පූර්ණයෙන් පුරවයි, එයින් සැමතැනම පැතිරෙයි. ඒ භික්ෂුහුගේ සියලු ශරීරයෙහි තුන්වැනි ධ්‍යාන සැපයෙන් පැතිරෙයි.

**63.** "බමුණ, යම්සේ නිල්මානෙල් විලක හෝ සුදු නෙළුම් විලක හෝ රතු නෙළුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුනු දියෙන් උඩට නොනැගුනු, දියතුලම ගැලී වැඩෙන්නාවූ සමහර නිල් මානෙල් හෝ සමහර සුදු නෙළුම් හෝ සමහර රත් නෙළුම් හෝ වේද්ද, ඒ නිල් මානෙල් ආදීහු අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, සම්පූර්ණයෙන් වැගුරුණාහු, හාත්පසින් ස්පර්ශ ලද්දාහු වෙත්ද, ඒ නිල්මානෙල් සුදු නෙළුම් රත් නෙළුම් යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් නො පහස්නා ලද්දේ නොවේද බමුණ, එපරිද්දෙන් ඒ භික්ෂු තෙමේ මේ මුළු ශරීරයම දුරුකළ ප්‍රීතිය ඇති සැපයෙන් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරෙයි, ඉන් හාත්පසින් තෙමෙයි, සම්පූර්ණයෙන් පුරවයි. හාත්පසින් ස්පර්ශ කෙරෙයි. ඔහුගේ සම්පූර්ණ ශරීරයෙහි ප්‍රීති නැති තුන්වැනි ධ්‍යානයෙන් පැතිරයයි.

"බ්‍රාහ්මණය, මේ යාගය වූකලී පළමු කී යාගයන්ට වඩා ස්වල්පවූ කටයුතු ඇත්තේ, ස්වල්පවූ පීඩා ඇත්තේ, අතිශයින් මහත්ඵලදායීද මහානිසංස ඇත්තේද වේ.

**64.** "නැවතද බමුණ, ඒ මහණ තෙමේ සැප දුරුකිරීමෙන්, දුක් දුරු කිරීමෙන්ද පළමුකොටම සැප දුක් වෙදනා නැතිව යාමෙන් දුක්ද නොවූ, සැපද නොවූ, උපෙක්ඛා-සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, හතරවෙනි ධ්‍යාන (කුසල) චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම, පිරිසිදුවූ, අතිශයින් බබලන (ධ්‍යාන) සිතින් පතුරුවන්නේය. ඒ ධ්‍යානලාභී භික්ෂුහුගේ සම්පූර්ණ ශරීරයෙහි පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ හතරවැනි ධ්‍යාන සිතින් පැතිරයයි.

"බමුණ, යම්සේ කිසියම් පුරුෂයෙක් පිරිසිදුවූ සුදු ඇඳුමකින් හිස සිට පොරවා උන්නේ වේද, ඔහුගේ මුලු ශරීරයෙහි එකම තැනකුදු සුදුවතින් නොවසන ලද්දේ නොවේ. බමුණ, එපරිද්දෙන්ම ධ්‍යානලාභී භික්ෂු තෙමේ මේ සියලු ශරීරයම පිරිසිදුවූ, අතිශයින්ම බබලන්නාවූ හතර වැනි ධ්‍යාන සිතින්

පතුරුවා හුන්නේ වේ. ඒ භික්ෂුහුගේ සියලු ශරීරයෙහි පිරිසිදුවූ, බබලන්නාවූ හතර වැනි ධ්‍යාන සිතින් පැතිරයයි. (සතර වැනි ධ්‍යාන චිත්තයෙන් සකල ශරීරයම පතුරුවන ලද්දේයයි කී සේයි.)

"බ්‍රාහ්මණය, මේ යාගය වූකලී පළමු කී යාගයන්ට වඩා ස්වල්පවූ කටයුතු ඇත්තේ, ස්වල්පවූ පීඩා ඇත්තේ, අතිශයින් මහත්ඵලදායීද මහානිසංස ඇත්තේද වේ.

**65.** "නැවතද, බමුණ, ඒ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි. ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඔහු මෙසේ දැනගණී. 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තය. *සතර මහාභූතයන්ගේ හේතුවෙන් හටගත්තේය. මව්පියන් නිසා හටගත්තේය. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඇඟ ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ, ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඥ්ඥාණය ශරීරය ආශ්‍රය කෙරේ. මෙහිම බැඳුනේ වෙයි' කියායි.

**66.** "බමුණ, යම්සේ යහපත්වූ, පිරිසිදු ආකාරයෙන් උපන්නාවූ, අටැස්වූ, ගල් ආදී දොස් බැහැර කිරීමෙන් හොඳ ලෙස සකස් කරණ ලද්දාවූ, නිර්මලවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ, කැලැල් නැතිවූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෛඩූර්ය මැණිකක් වේද, එහි නිල්වූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේ, ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේයඃ 'මේ වෛඩූර්ය මැණික මනාසේ කාන්තිමත් හෙයින් යහපත් වේ, පිරිසිදු ආකරයෙන් උපන්නේය, අටැස් ඇත්තේය, දොස් දුරුකිරීමෙන් මනාකොට සකස් කරණ ලද්දේය, නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, කැලැල් නැත, සියලු ආකාරයෙන් සම්පූර්ණය. ඒ මැණිකෙහි මේ නීලවර්ණවූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේය' කියායි.

"බමුණ, එපරිද්දෙන්ම යෝගීවූ මේ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇතිවූ කල්හි මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස සිත එලවා තබයි, ඒ සඳහා විශෙෂයෙන් සිත නමයි. ඒ භික්ෂු තෙමේ මෙසේ දන්නේය, කෙසේද යත්: 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තවේ. සතර මහාභූතයන්ගෙන් හටගත්තේය, මව්පියන් නිසා හටගත්තේය. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඤ්ඤාණය මේ ශරීරය ආශ්‍රය කෙළේ වෙයි, මෙහිම බැඳී සිටියේය' කියායි.

"බ්‍රාහ්මණය, මේ යාගය වූකලී පළමු කී යාගයන්ට වඩා ස්වල්පවූ කටයුතු ඇත්තේ, ස්වල්පවූ පීඩා ඇත්තේ, අතිශයින් මහත්ඵලදායීද මහානිසංස ඇත්තේද වේ.

**67.** "ඔහු මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ රූපයක් මනා කොට නිපදවීම පිණිස සිත එලවා තබයි, වෙසෙසින් නමයි. ඔහු ආකාරවත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවනලද) ශරීරය හා අත පය ආදී අවයව ඇති, විකලනුවූ ඉඳුරන් ඇති, මේ ශරීරයෙන් අන්‍යවූ ශරීරයක් හොඳ ලෙස සාදයි.

**68.** "බමුණ, යම්සේ පුරුෂයෙක් මුදු තණ ගසින් තණබඩය උදුරා ගැනීම කරන්නේද, මේ තණ ගසය, මේ තණ බඩය, තණගස අනිකෙක, තණබඩය අනිකෙක, තණ ගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය, තනන ලද්දේය යන වැටහීම ඕහට පහල වන්නේය.

"බමුණ, යම්සේ පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේද ඔහුට මෙබඳු අදහසක් වන්නේය. මේ කඩුවය, මේ

කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන් කඩුව ඉවත්කරණ ලද්දේය' කියායි.

"බමුණ, යම් පුරුෂයෙක් සර්පයෙකු සැවයෙන් පහ කරන්නේද ඕහට මේ සර්පයාය, මේ සැවය, සර්පයා එකෙකි. සැව අනිකකි, සැවයෙන් සර්පයා වෙන්කරණ ලද්දේයි වැටහීමක් ඇතිවන්නේය.

"බමුණ, එසේම භික්ෂුතෙමේ මෙසේ සිත සමාධිගතවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සිතින් උපදවන කය මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. ඔහු මේ කයින් රූ ඇති, සිතින් මවනලද, සියලු ශරීරය සහ අතපය ආදී අවයව ඇති, නොපිරිහුනු ඉන්ද්‍රිය ඇති වෙන කයක් මවයි.

බ්‍රාහ්මණය, මේ යාගය වූකලී පළමු කී යාගයන්ට වඩා ස්වල්පවූ කටයුතු ඇත්තේ, ස්වල්පවූ පීඩා ඇත්තේ අතිසයින් මහත් ඵලදායීද මහානිසංස ඇත්තේද වේ.

**69.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, නැවතීමට පැමිණි කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට දක්වයි. එකෙක්ව බොහෝ සේ වෙයි. බොහෝ සේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට පර්වතය හරහට නොහැපෙමින් යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පරියන්කයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹ ලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වයි.

70. "බමුණ, දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරු අතවැසියෙක් හෝ යහපත් සේ පදම්කළ මැටියෙන් කැමති කැමති වලන් ආදී වර්ගයන් යම්සේ කරන්නේද, නිපදවන්නේද, බමුණ, දළ කැටයම් කරුවෙක් හෝ අතවැසියෙක් හෝ සකස්කළ දළයෙහි යම්සේ කැමති කැමති දළ කැටයම් වර්ගයක් කරන්නේද, නිපදවන්නේද, බමුණ, දක්ෂ රන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ පදම්කළ රණින් කැමති කැමති රන් අබරණ ජාතීන් යම්සේ කරන්නේද, නිපදවන්නේද-බමුණ, එසේම භික්ෂුව සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් ඍද්ධිවිධි වෙන් වෙන් කොට දක්වයි. එකෙක්ව බොහෝ සේ වෙයි, බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට අහසෙයි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වත හරහට නොහැපෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කරයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව කෙරෙයි.

"බ්‍රාහ්මණය, මේ යාගය වූකලී පළමු කී යාගයන්ට වඩා ස්වල්පවූ කටයුතු ඇත්තේ, ස්වල්පවූ පීඩා ඇත්තේ අතිශයින් මහත් ඵලදායිද මහානිසංස ඇත්තේද වේ.

71. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, දිව්‍ය කණ සම්බන්ධ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඒ භික්ෂුව පිරිසිදුවූ මිනිස් බව ඉක්මවූ දිව්‍ය කණ

සම්බන්ධ ඥාණයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද, දෙයාකාර ශබ්දයන් අසයි.

72. "බමුණ, දික් මගට පැමිණි පුරුෂයෙක් බෙර හඬද, මිහිගු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද, යම්සේ අසාද, ඔහුට මේ බෙරහඬයයිද, මිහිගු බෙරහඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬයයිද සිතෙන්නේය. බමුණ, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකගවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇති කල්හි, මෘදුවූ කල්හි, ස්ථිරබවට පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, දිව්‍ය කණෙන් ලබන ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. ඔහු මෙසේ පිරිසිදුවූ, මිනිස් කණ ඉක්මවූ දිව්‍ය කණෙන් ලබන ඥානයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද, දෙයාකාර ශබ්දයන් අසයි.

"බ්‍රාහ්මණය, මේ යාගය වූකලී පළමු කී යාගයන්ට වඩා ස්වල්පවූ කටයුතු ඇත්තේ, ස්වල්පවූ පීඩා ඇත්තේ අතිශයින් මහත් ඵලදායිද මහානිසංස ඇත්තේද වේ.

73. "ඔහු මෙසේ සිත එකගවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශ ඇති කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුවූ කල්හි, ස්ථිර බවට පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පරසිත් දැනගන්නා ඤාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත තමසිතින් පිරිසිඳ දනියි. රාග සහිත සිත රාග සිතයයි දනියි. රාගය පහවූ සිත රාගයෙන් තොරවූ සිතයි දනියි. ද්වෙෂ සහිත සිත දොස සිතයයි දනියි. ද්වෙෂය පහවූ සිත ද්වෙෂයෙන් තොරවූ සිතයයි දනියි. මොහ සහිත සිත මොහ සිතයයි දනියි, මොහය පහවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුනු සිත හැකුලුනු සිතයයි දනියි, විසුරුණු සිත විසුරුණු සිතයයි දනියි. මහත් බවට ගිය සිත, මහත් බවට ගිය සිතයයි දනියි. මහත් බවට නොගිය සිත, මහත් බවට නොගිය සිතයයි දනියි

කාම සහිත සිත, කාම සහිත සිතයයි දනියි. ලෞකික හිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනියි. සමාධිගතවූ සිත සමාධිගත සිතයයි දනියි, සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනියි, (ක්ලෙශයෙන්) මිදුනු සිත මිදුනු සිතයයි දනියි. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දනියි.

**74.** "බමුණ, සැරසෙන ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළමාවයසෙහි සිටියෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු, නොකිළිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය භාජනයෙක්හි හෝ තමාගේ මූනේ ශොභාව පරීක්ෂා කරන්නේ යම්සේ කැලල් සහිත නම් කැලල් සහිතයයි දැනගනීද, කැලල් රහිත නම් කැලල් රහිතයයි දැනගනීද,

"බමුණ, එසේම භික්ෂුතෙම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පරසිත් දැනගන්නා ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් දැන ගනියි. රාග සිත රාග සිතයයි දනියි. රාගයෙන් තොරවූ සිත රාගයෙන් තොරවූ සිතයයි දනියි. දොස සිත දොස සිතයයි දනියි. දොසයෙන් තොරවූ සිත දොසයෙන් තොරවූ සිතයයි දනියි, මොහසිත මොහ සිතයයි දනියි, මොහයෙන් තොරවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුණු සිත හෝ විසුරුණු සිත හෝ මහත් බවට ගිය සිත හෝ මහත් බවට නොගිය සිත හෝ කාම සහිත සිත හෝ අනුත්තර සිත හෝ එකඟවූ සිත හෝ එකඟ නොවූසිත හෝ දනියි. මිදුණු සිත හෝ මිදුණු සිතයයි දනියි. නොමිදුණු සිත හෝ නොමිදුණු සිතයයි දනියි.

"බ්‍රාහ්මණය, මේ යාගය වූකලී පළමු කී යාගයන්ට වඩා ස්වල්පවූ කටයුතු ඇත්තේ, ස්වල්පවූ පීඩා ඇත්තේ අතිශයින් මහත් ඵලදායිද මහානිසංස ඇත්තේද වේ.

**75.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ, කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේද යත්ඃ එක් ජාතියක්ද, දෙ ජාතියක්ද, තුන් ජාතියක්ද, හතර ජාතියක්ද, පස් ජාතියක්ද, දස ජාතියක්ද, විසිජාතියක්ද, තිස් ජාතියක්ද, සතළිස් ජාතියක්ද, පණස් ජාතියක්ද, සියක් ජාතියක්ද, දහස් ජාතියක්ද, සියක් දහස් ජාතියක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි, අසුවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුත වූයෙමි, මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් විදියේ පෙර ජීවිත සිහි කෙරෙයි.

**76.** "බමුණ, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් තමන්ගේ ගමට එන්නේද, 'මම, සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. එගමිනිදු අසවල් ගමට ගියෙමි, එහිද මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට පැමිණියෙමි'යි හෙතෙම දන්නේය.

"බමුණ, එපරිද්දෙන්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශ

පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහි කිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් පෙරවිසීම් සිහි කෙරෙයි. කෙසේද යත්: "එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතලිසක්ද ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද, නොයෙක් කල්ප විස්සකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්ප රාශියකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්පයන්ද, අසුවල් තැන' වීමි. මෙබඳු නම් ඇත්තෙමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු පාට ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සැප දුක් වින්දෙමි මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙමි. මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු පාට ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සුව දුක් වින්දෙමි, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙමි, වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිත, (පෙරවිසූ පිළිවෙළ) දැක්වීම් සහිත, නොයෙක් ආකාරවූ පෙර විසීම් සිහි කෙරෙයි.

"බ්‍රාහ්මණය, මේ යාගය වූකලී පළමු කී යාගයන්ට වඩා ස්වල්පවූ කටයුතු ඇත්තේ, ස්වල්පවූ පීඩා ඇත්තේ අතිශයින් මහත් ඵලදායිද මහානිසංස ඇත්තේද වේ.

77. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සත්වයන්ගේ මරණින් පසු උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ පිරිසුදුවූ මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොව ගියාවූද නරකලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී. 'මේ පින්වත්

සත්තවයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය, වචන දුශ්චරිතයෙන් යුක්තය; හිතේ දුශ්චරිතයෙන් යුක්තය. උත්තමයන්ට බණින්නෝය, මිථ්‍යදෘෂ්ටිකයෝය. මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ, නිරයට පැමිණෙත්. නැතහොත්, මේ පින්වත් සත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබණින්නෝය, සත්‍ය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. මරණින් මතු යහපත් පැමිණීමවූ, ස්වර්ග ලොකයට පැමිණියෝය'යි මෙසේ පිරිසුදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද, උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොවට ගියාවූද නරක ලොවට ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී.

78. "බමුණ, යම්සේ පාරේ හන්දියක ප්‍රාසාදයක් වේද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට ඇතුල්වෙන, ගෙයින් නික්මෙන, වීථියෙහි හැසිරෙණ පාර හන්දියේ හිඳින මනුෂ්‍යයන් දක්නේද, ඔහුට මෙසේ සිතෙයි: 'මේ මිනිස්සු ගෙට ඇතුළු වෙති, මොහු නික්මෙති, මොහු වීථියෙහි හැසිරෙන, මොහු පාර හන්දියේ ඉඳිති'යි කියායි. බමුණ, එසේම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිත කල්හි ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි සත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, සිත ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස් ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී: මේ පින්වත් සත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය, වචන දුශ්චරිතයෙන් යුක්තය, හිතේ දුශ්චරිතයෙන් යුක්තය, උත්තමයින්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු ශරීරයෙන් වෙන්ව, මරණින් මතු අපායවූ, දුර්ගතියවූ, දුකවූ, නිරයට පැමිණෙත්.' නැතහොත්, 'මේ පින්වත්

සත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබනින්නෝය, සත්‍යය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය ශරීරයෙන් වෙන්ව මරණින් මතු සුගතියවූ ස්වර්ග ලෝකයට පැමිණියෝ'යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද සුගතියට පැමිණියාවූද දුර්ගතියට පැමිණියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී.

බ්‍රාහ්මණය, මේ යාගය වූකලී පළමු කී යාගයන්ට වඩා ස්වල්පවූ කටයුතු ඇත්තේ, ස්වල්පවූ පීඩා ඇත්තේ අතිශයින් මහත් ඵලදායිද මහානිසංස ඇත්තේද වේ.

**79.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන භාවයට පැමිණි කල්හි සිතේ පැසවන කෙලෙස් පහකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයි තතුලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හේතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී, මේ පැසවන කෙලෙස්යයි තතු ලෙස දැනගණී, මේ පැසවන ක්ලේශයන්ගේ හේතුයයි තතු ලෙස දැනගණී, මේ ඒ කෙලෙස් නැතිකිරීමයයි තතු ලෙස දැනගණී, මේ ඒ කෙළෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ, සංසාරයට (භවයට) ඇති ආශාවන් කෙරෙන්ද සිත මිදේ, දැඩි මෝහය කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැතිවිය. උතුම් හැසිරීමෙහි වසන ලදී, කටයුත්ත කරණලදී, මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ'යිද දැනගණී.

**80.** බ්‍රාහ්මණය, යම්සේ පර්වත මුදුනක පිරිසිදු, සිත් සතුටු කරන නොකැළඹුනු, දිය විලක් වේද, එහි ඉවුරේ ඇස් ඇති

පුරුෂයෙක් සිටියේ නැවතී තිබෙන්නාවූ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන්ද, කැබලිති කැටද, එහා මෙහා යන්නාවූ මසුන් රැන්ද, දක්නේද, ඔහුට මෙසේ සිතෙන්නේයඃ 'මේ දිය විල පිරිසිදුය, මනා සිත් ප්‍රිය කරන්නේය, නොකැළඹුනේය. එහි මේ සිප්පි බෙල්ලන් සක් බෙල්ලන්ද, කැටකැබලිතිද, නැවතී තිබේ. මසුන් රැන් හැසිරෙත්ය' කියායි. බ්‍රාහ්මණය, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිත කල්හි. ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, බොහෝ කල් සිට එන ක්ලෙශයන් නැතිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී. මේ දුක් නැතිකිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තතුලෙස දැනගණී, මේ කෙලෙස් යයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් හේතුයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී, මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ, භවයට ඇති ආශාවන් කෙරෙන්ද මිදේ. මෝහය කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැතිවිය, උතුම් හැසිරීමෙහි වසනලදී, කටයුත්ත කරනලදී. මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ'යිද දැනගණී.

"මෙසේ දක්නා, මෙසේ දන්නා ඔහුගේ සිත කාමාශ්‍රවයන් කෙරෙන්ද, භවාශ්‍රවයන් කෙරෙන්ද, මිදේ. අවිද්‍යාශ්‍රවයන් කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ජාතිය ක්ෂය වීය, බ්‍රහ්මචර්යාවෙහි වසන ලදී. කටයුතු කරන ලදී. මේ ආත්මභාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ'යිද දැනගණී.

"බ්‍රාහ්මණය, මේ යාගය වූකලී පළමු කී යාගයන්ට වඩා මඳ කටයුතු ඇත්තේ, මඳ හිරිහැර ඇත්තේ අතිශයින් මහත් ඵලදායීද

මහානිසංස ඇත්තේද වේ. බ්‍රාහ්මණය, මේ යාග සම්පත්තියට වඩා අතිශයින් උසස්වූ හෝ අතිශයින් ශ්‍රෙෂ්ඨ වූ හෝ අන්‍යවූ යාග සම්පත්තියක් නැත්තේය.”

81. මෙසේ දේශනාකළ කල කූටදන්ත බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේයඃ “භවත් ගෞතමයන් වහන්ස, දේශනාව ඉතායහපත්ය, භවත් ගෞතමයන්වහන්ස, දේශනාව ඉතා යහපත්ය. පින්වත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කොට තබන්නේ හෝ යම්සේද, වසන ලද්දක් විවෘතකොට දක්වන්නේ හෝ යම්සේද, මංමුලා වූවකුට මග කියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තකුට රූපයන් දැකීම පිණිස අන්ධකාරයෙහි පහනක් දල්වන්නේ හෝ යම්සේද, භාග්‍යවත් ගෞතමයන් වහන්සේ විසින් එසේම නොයෙක් ආකාරයෙන් ධර්මය, දෙශනා කරණලදී. මම භවත් ගෞතමයන් වහන්සේද, ධර්මයද, මහාසංඝයාද සරණකොට යමි. පින්වත් ගෞතමයන් වහන්සේද මා අද පටන් ජීවත්ව සිටින තෙක් සරණගිය උපාසකයෙකැයි භාරගන්නා සේක්වා. භවත් ගෞතමයන් වහන්ස, මම ගවයන් සත්සියයද, නාඹුවස්සන් සත්සියයද, නාඹු වැස්සියන් සත්සියයද, තිරෙළුවන් සත්සියයද, එළුවන් සත්සියයද මුදවමි. ඔවුන්ට ජීවිත දානය කරමි. ඔවුහු නිල් තණද කෑම කෙරෙත්වා’ සිසිල් වතුරද බීම කෙරෙත්වා ඔවුන්ට සිසිල් සුළඟද හමාවා.

82. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කූටදන්ත බ්‍රාහ්මණයාහට අනුපිළිවෙළ කථාව වදාළ සේක. කෙසේදයත්; දාන කථාය, ශීලකථාය, ස්වර්ගකථාය, කාමයන්ගේ ආදීනවය, ලාමක බවය, කෙලෙසෙන බවය, මහණකමෙහි අනුසස්ය යන මේයි. කූටදන්ත බ්‍රාහ්මණයාගේ සිත යහපත්ය, මෘදුය, ක්ලේශයන්ගෙන් පහව සිටියේය, ප්‍රීතිය වැඩී ගියේය. පැහැදුනේයයි දැනගත් විගස භාග්‍යවතුන් වහන්සේ බුදුවරයන්ගේම ඥානයෙන් අවබොධ කළ ධර්මයවූ දුකය, සමුදය, නිරොධය, මාර්ගය යන චතුස්සතය දේශනා කළසේක. යම්සේ පහවූ කළු පාට ඇති පිරිසිදු වස්ත්‍රයක් මනාකොට සායම් අල්ලාගන්නේද,

එපරිද්දෙන්ම බ්‍රාහ්මණයාට එම ආසනයෙහිදීම පහවූ කාම ආශා ඇති, පහවූ (රාගාදී) මල ඇති ධර්මචක්ෂුස (හෙවත් ශ්‍රොතාපත්ති මාර්ග ඥානය) පහළ වූයේය. යමක් ඉපදීම් ස්වභාවය ඇත්තේද ඒ සියල්ල වැනසීම් ස්වභාව ඇත්තේයයි ඔහුට අවබොධ විය.

83. එවිට දන්නා ලද ධර්ම ඇති, පැමිණි මාර්ග ධර්ම ඇති, අවබොධ කළ ධර්ම ඇති, ඥානයෙන් බැසගත් ධර්ම ඇති තරණය කළ සැක ඇති, පහවූ විචිකිච්ඡා ඇති විසාරද භාවයට එළඹි අන්‍ය ගුරුවරයෙකු කෙරෙහි ඇදහීමක් නැති කූටදන්ත බ්‍රාහ්මණ තෙමේ ‘භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සහිතව සෙට දවසට මාගේ දානය පිළිගත මැනවැ’යි ආරාධනා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවීමෙන් එය පිළිගත් සේක.

84. එවිට භාග්‍යවතුන් වහන්සේගේ පිළිගැණීම දත් කූටදන්ත බ්‍රාහ්මණ තෙමේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ හොඳින් වැඳ පැදකුණුකොට ගියේය. එවිට කූටදන්ත බ්‍රාහ්මණ තෙමේ එම රෑ පසුවීමෙන් පසු දින ස්වකීය යාගාවාටයෙහි මිහිරි කෑම බීම හොඳාකාර පිළියෙළ කරවා ‘භාග්‍යවතුන් වහන්ස, දානය පිළියෙළ කරණලදී. දැන් වැඩීමට කාලය’යි කාලය දැන්වී.

85. භාග්‍යවතුන් වහන්සේද භික්ෂු සංඝයා වහන්සේ සහිතව හොඳින් හැඳ පොරවා පාසිවුරු ගෙන පෙරවරුයෙහි කූටදන්ත බමුණාගේ දානශාලාව කරා වැඩ පණවන ලද අස්නෙහි වැඩහුන්සේක. කූටදන්ත බ්‍රාහ්මණයා බුදුහාමුදුරුවන් ප්‍රධාන කොට ඇති භික්ෂු සංඝයා මිහිරි කෑම බීම ආදියෙන් වැළඳවීය, තමන්ගේ අතින්ම පිළිගැන්වීම කෙළේය. මනාකොට පැවරීය. එවිට කූටදන්ත බමුණු භාග්‍යවතුන් වහන්සේ වළඳා අවසානයෙහි පාත්‍රයෙන් අත ඉවත්කළ බව දැන පහත් ආසනයක් ගෙණ එක පැත්තකටවී හුන්නේය. භාග්‍යවතුන් වහන්සේද ධර්ම කථාවෙන් එසේ හුන් කූටදන්ත බමුණාහට යහපත් ලෙස කරුණු දක්වා කුශල ධර්ම කිරීමෙහි උත්සාහවත් කරවා, පුබුදු කරවා, වැඩියක් සතුටු කරවා හුනස්නෙන් නැගිට වැඩිසේක.

පස්වැනිවූ කූටදන්ත සූත්‍රය නිමියේය.

# 6 මහාලි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. (මාගේ ඇසීම මෙසේයි) එක්කාලයක භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර අසල මහවනහෙි පිහිටි කූටාගාර ශාලානම් විහාරයෙහි වාසය කළෝය. ඒ කාලයේදී කොසොල් රටවැසි බොහෝවූ බ්‍රාහ්මණ දූතයෝද, මගධ රටවැසි බ්‍රාහ්මණ දූතයෝද කිසියම් අවශ්‍ය කටයුත්තක් සඳහා විශාලා මහනුවර වාසය කරති. ඒ කොසොල් රටවැසි බ්‍රාහ්මණ දූතයෝද මගධරට වැසි බ්‍රාහ්මණ දූතයෝද මේ කරුණු ඇසුවෝය. එනම් ශාක්‍ය පුත්‍රවූ ශ්‍රමණ භවත් ගෞතමයන්වහන්සේ ශාක්‍ය කුලයෙන් නික්ම මහණව විශාලාමහනුවර සමීපයේ මහාවනයෙහි කූටාගාර ශාලානම් විහාරෙහි වාසය කරති. ඒ භවත් ගෞතමයන් පිළිබඳව මෙසේ යහපත් කීර්ති ඝොෂාවක් උසස්ව නැංගේය. ඒ කෙසේද? අර්හත් සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනාඥානය ආදී විද්‍යා අට සීලසංවරය ආදී හසුරුවන ධර්ම පසළොස යන අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් මාර්ගයෙහි ගමන්කළාවූ සියලුලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙව් මිනිසුන්ට ගුරුවරයෙක්වූ, (චතුරාර්ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්ම සතර අවබොධකළාවූ ඒ තථාගතතෙමේ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් හා මිනිසුන් සහිතවූ, සත්ත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැන පැහැදිලි කොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, අර්ථ සහිතවූ, දස ආකාරයෙන් නියම විදියට වචන ශබ්ද කරන්නාවූ ව්‍යඤ්ජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ පිරිසිදුවූ, බ්‍රහ්මචර්යාව ගෙන හැර දක්වති. එබඳුවූ රහතුන්ගේ දැකීම යහපත්ම වේයයි' සිතුවෝය.

2. එවිට ඒ කොසොල්රට වැසි බ්‍රාහ්මණ දූතයෝද, මගධ රටවැසි බ්‍රාහ්මණ දූතයෝද, කූටාගාර ශාලාවිහාරය යම් තැනකද එතනට පැමුණුනාහ. ඒ කාලයේදී ආයුෂ්මත් නාගිත

තෙරුන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නේ වෙයි.

එවිට ඒ කොසොල් රටවැසි බ්‍රාහ්මණ දූතයෝද මගධරට වැසි බ්‍රාහ්මණ දූතයෝද ආයුෂ්මත් නාගිත ස්ථවිරයන් යම් තැනෙක්හිද, එතනට පැමුණුනාහ. ආයුෂ්මත් නාගිත තෙරුන් වහන්සේට මෙසේ දැන්වූහ. "පින්වත් නාගිත තෙරුන්වහන්ස, ප්‍රසිද්ධවූ භවත් ගෞතමයන් වහන්සේ දැන් කොතන වැඩවසන්නෝද? අපි භවත් ගෞතමයන් වහන්සේ දකිනු කැමැත්තෙමු."

"භාග්‍යවතුන් වහන්සේ දැකීමට මේ සුදුසු කාලය නොවේමය. භාග්‍යවතුන් වහන්සේ නොයෙක් අරමුණු ගැනීම් වලින් තුරන්ව සම්පූර්ණ විවේකයෙහි යෙදී ධ්‍යාන සැපවිඳින්නෝය'යි කීයේය.

එවිට ඒ කොසොල් රටවැසි බ්‍රාහ්මණ දූතයෝද, මගධ රටවැසි බ්‍රාහ්මණ දූතයෝද 'අපි ඒ භවත් ගෞතමයන් වහන්සේ දැකලාම යන්නෙමුය'යි සිතා ඒ විහාරයෙහිම එක පැත්තකටවී උන්හ.

3. ඔට්ඨද්ධ (අඩ උඩු තොල් ඇත්තා) නම් මහාලි ලිච්ඡවි උපාසක තෙමේද මහත් ලිච්ඡවි පිරිසක් සමග මහා වනයෙහි කූටාගාරශාලා විහාරය යම් තැනෙක්හිද ආයුෂ්මත් නාගිත තෙරුන්වහන්සේ යම් තැනෙකහිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් නාගිත තෙරුන් වහන්සේ වැඳ එක පැත්තකටවී සිටියේය. එක පැත්තකටවී සිටියාවූ ඔට්ඨද්ධ තෙමේ ආයුෂ්මත් නාගිත තෙරුන් වහන්සේට මෙසේ කීයේය.

"ස්වාමීනි, නාගිත තෙරුන්වහන්ස, ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ දැන් කොතන වැඩ සිටිත්ද? අපි ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ දැකීමට කැමැත්තෙමු."

"මහාලිය; භාග්‍යවතුන් වහන්සේ දැකීමට මේ නුසුදුසු කාලයයි. භාග්‍යවතුන් වහන්සේ ධ්‍යාන සැප විඳිනසේකැයි"

දැන්වීය. එවිට ඔට්ඨද්ධ ලිච්ඡවිතෙමේද "මම ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදු රජාණන් වහන්සේ දැකලාම යන්නෙමියි ඒ විහාරයෙහිම එකපැත්තකටවී උන්නේය.

4. එවිට නාගිතතෙරුන්ට බෑනාවූ සිංහ නම් සාමණේර තෙමේ ආයුෂ්මත් නාගිත තෙරුන් වහන්සේ යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් නාගිත තෙරුන් වහන්සේ වැඳ එකපැත්තකටවී සිටියේය. එක පැත්තකටවී සිටියාවූ සිංහ නම් සාමණේර තෙමේ ආයුෂ්මත් නාගිත තෙරුන් වහන්සේට මේ කාරණය දැන්විය.

"ස්වාමීනි, කාශ්‍යප නාගිත තෙරුන් වහන්ස, මේ බොහෝවූ කොසොල් රටවැසි බ්‍රාහ්මණ දූතයෝද මගධරට වැසි බ්‍රාහ්මණ දූතයෝද, භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස මෙහි පැමිණියෝය. ඔට්ඨද්ධ ලිච්ඡවි තෙමේද මහත් ලිච්ඡවි පිරිසක් සමග භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස මෙහි පැමිණියේය. ස්වාමීනි, කාශ්‍යප නාගිත තෙරුන් වහන්ස, මේ ජනසමූහයාට භාග්‍යවතුන් වහන්සේ දැකීමට ඉඩ ලබා දෙත්වා."

"එහෙනම් සිංහය, ඔබම භාග්‍යවතුන් වහන්සේට මේ බව දන්වන්න"යයි කීයේය.

"එසේය, ස්වාමීන් වහන්ස"යි සිංහ සාමණේරතෙම නාගිත තෙරුන්වහන්සේට උත්තරදී, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හොඳාකාර වැඳ එක පැත්තකටව සිටියේය. එක පැත්තකටවී සිටි සිංහ සාමණේර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්නුවේය. ස්වාමීන් වහන්ස, මේ බොහෝවූ කොසොල් රටවැසි බ්‍රාහ්මණ දූතයෝද මගධ රට වැසි බ්‍රාහ්මණ දූතයෝද භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස මෙහි පැමිණියාහ. ඔට්ඨද්ධ ලිච්ඡවි තෙමේද මහත් ලිච්ඡවි පිරිසක් සමග භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස මෙහි පැමිණියේය. ස්වාමීන් වහන්ස, මේ පිරිසට භාග්‍යවතුන් වහන්සේ දැකීමට ඉඩ දෙත්වා."

"එසේ නම්, සිංහය, විහාරයෙහි සෙවනැල්ලෙහි ආසනයක් පණවවයි" කීසේක.

"එසේය ස්වාමීන් වහන්ස"යයි සිංහ සාමණේර තෙමේ භාග්‍යවතුන් වහන්සේට උත්තරදී විහාරයෙහි සෙවනැල්ලෙහි ආසනයක් පැණවීය. එවිට භාග්‍යවතුන් වහන්සේ විහාරයෙන් නික්ම විහාරයෙහි සෙවනැල්ලෙහි පැණවූ ආසනයෙහි වැඩ උන්සේක.

**5.** එවිට ඒ කොසොල් රටවැසි බ්‍රාහ්මණ දූතයෝද, මගධ රටවැසි බ්‍රාහ්මණ දූතයෝද භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට පැමිණියාහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූහ, සතුටුවිය යුතු සිහිකටයුතු කථා අවසන් කොට පැත්තකින් උන්නාහ. ඔට්ඨද්ධ නම් ලිච්ඡවි මහාලි මහත් ලිච්ඡවි පිරිසක් සමග භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක පැත්තකින් උන්නේය. එක පැත්තකින් උන්නාවූ ඔට්ඨද්ධ ලිච්ඡවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළේය.

"ස්වාමිනි, පූර්වවූද, ඉතා පූර්වවූද දවස්හි (පසුගිය දවස්වල) සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ මම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, මට මෙසේ කීය "මහාලිය, මම නම් යම් දවසක පටන් මේ තුන් අවුරුද්දක් මුළුල්ලෙහි භාග්‍යවතුන් වහන්සේ ආශ්‍රය කොට වාසයකළෙම්ද ඒ කාලයෙහිදී, ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් පමණක් දුටුවෙමි. එසේවූ නමුත් ප්‍රිය උදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් ඇසුවේ නැතැයි' කීයේය. ස්වාමීන්වහන්ස, සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා ඇත්තාවූම ප්‍රිය උපදන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් නොඇසුවේද නැතහොත් නැත්තාවූ දිව්‍ය ශබ්දයන් නොඇසුවේදැයි" යන මේ කාරණය විචාළේය. "මහාලිය සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍රයා ඇත්තාවූම ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූම දිව්‍ය ශබ්දයන් නො ඇසුවේය. නැත්තාවූ දිව්‍ය ශබ්දයන් නොම ඇසුවේ නොවේ යයි කීසේක.

**6.** ස්වාමීන් වහන්ස, යම් හේතුවකින් සුනක්ඛත්ත ලිච්ඡවී පුත්‍ර ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ ඇලීම ඇති කරන්නාවූ

නැත්තාවූ නොව ඇත්තාවූම දිව්‍ය ශබ්දයන් නොඇසුයේ නම් ඊට හේතුව කුමක්ද ඊට හේතු මාර්ගය (ප්‍රත්‍යය) කුමක්දැ”යි ඇසුවේය.

“මහාලිය, මේ ශාසනයෙහි යම් භික්ෂුනමකට නැගෙනහිර දිසාවෙහි එක කොටසක් සම්බන්ධව වඩනාලද්දාවූ, ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය රූපයන් දැකීම පිණිස වඩන ලද්දාවූ, ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිස නොවඩන ලද්දාවූ සමාධියක් වේද ඒ භික්ෂුතෙමේ නැගෙනහිර දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇති කරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසනු පිණිස නොව ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිස යන එක කොටසක් සම්බන්ධව වඩනලද සමාධියෙහි නැගෙනහිර දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දකී. එහෙත් ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් නොම අසයි. ඊට හේතුව කුමක්ද?

“මහාලිය, ඒ භික්ෂුවට ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය ශබ්දයන් අසන පිණිස නොව ප්‍රිය උපදවන්නාවූ, කැමතිවන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දකින පිණිසය යන එක කොටසක් සම්බන්ධව වඩනලද සමාධියෙහි මේ කාරණය මෙසේමය.

7. “මහාලිය, තවද අන් කාරණයක් ඇත්තේය. මේ ශාසනයෙහි යම් භික්ෂු නමකට දකුණු දිසාවෙහි එක කොටසක් සම්බන්ධව වඩනා ලද්දාවූ, ප්‍රිය උපදවන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය රූපයන් දැකීම පිණිස වඩන ලද්දාවූ ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම ඇති කරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිස නොවඩන ලද්දාවූ සමාධියෙක් වේද, ඒ භික්ෂු තෙමේ දකුණු දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය ශබ්දයන් අසන පිණිස නොවඩන ලද්දාවූ සමාධියෙක් වේද, ඒ භික්ෂු තෙම දකුණු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම් ඇතිකරන්නාවූ, දිව්‍ය ශබ්දයක් අසනු පිණිස නොව, ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය රූපයක් දැකීම පිණිස යන එක කොටසක් සම්බන්ධව වඩනලද සමාධියෙහි දකුණු දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම ඇති කරන්නාවූ, දිව්‍ය රූපයන් දකී. එසේ නමුත් ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය ශබ්දයන් නොම අසයි. ඊට හේතුව කුමක්ද? මහාලිය, ඒ භික්ෂුවට ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිස නොව ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දකින පිණිසය යන එක කොටසක් සම්බන්ධව වඩනලද සමාධියෙහි මෙය මෙසේම වේ.

යම් භික්ෂු නමකට බස්නාහිර, උතුර, උඩ, යට අනුදිසාවන්හි එක කොටසක් සම්බන්ධව වඩන ලද්දාවූ, ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම කරන්නාවූ, දිව්‍ය රූප දකිණු පිණිස වඩනා ලද්දාවූ, ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම කරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිස නොවඩන ලද්දාවූ, සමෘධියෙක් වේද ඒ භික්ෂුතෙම බස්නාහිර, උතුරු, උඩ, යට අනු දිශාවන්හි එක කොටසක ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම කරන්නාවූ, දිව්‍ය ශබ්දයන් අසන පිණිස නොව ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම කරන්නාවූ, දිව්‍ය රූපයන් දැකීම පිණිස වඩන ලද්දාවූ, සමාධියෙක් වේද, ඒ භික්ෂුතෙම බස්නාහිර, උතුර, උඩ, යට අනු දිසාවන්හි එක කොටසක් සම්බන්ධව ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ ඇලීම කරන්නාවූ, ශබ්දයන් අසනු පිණිස නොව ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම කරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිසය යන එක කොටසක් සම්බන්ධව වඩන ලද සමාධියෙහි බස්නාහිර, උඩ යට අනුදිසාවන්හි ප්‍රිය උපදවන්නාවූ, කැමතිවන්නාවූ, ඇලීම කරන්නාවූ, දිව්‍ය රූපයන් දකී. එසේ නමුත් ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, දිව්‍ය ශබ්දයන් නොම අසයි. ඊට හේතුව කුමක්ද? මහාලිය, ඒ භික්ෂුවට ප්‍රිය උපදවන්නාවූ, කැමති

වන්නාවූ, ඇලීම වන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිස නොව ප්‍රිය උපදවන්නාවූ, කැමතිවන්නාවූ, ඇලීම කරන්නාවූ දිව්‍ය රූපයන් දකින පිණිසය යන එක කොටසක් සම්බන්ධව වඩනලද සමාධියෙහි මෙය මෙසේම වේ.

8. "මහාලිය, මේ ශාසනයෙහි යම් භික්ෂු නමකට නැගෙනහිර දිසාවෙහි එක කොටසක් සම්බන්ධව වඩනා ලද්දාවූ, ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ, ඇලීම ඇතිකරගන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිස වඩන ලද්දාවූ, ප්‍රියඋපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය රූපයන් දැකීම පිණිස නොවඩන ලද්දාවූ, සමාධියක් වේද, ඒ භික්ෂුතෙමෙ නැගෙනහිර දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයත් දැකීම පිණිස නොව ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය ශබ්දයන් අසන පිණිසය යන එක කොටසක් පිළිබඳව වඩනලද සමාධියෙහි දිව්‍ය ශබ්දයන් අසයි. එසේ නමුත් ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය රූපයන් නොදකී. ඊට හේතුව කුමක්ද?

"මහාලිය, ඒ භික්ෂුවට නැගෙනහිර දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇති කරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිසනොව, ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසය යන එක කොටසක් පිළිබඳව වඩනලද සමාධියෙහි මෙය මෙසේම වේ

9. "මහාලිය, තවද වෙනත් කරුණක් ඇත්තේය. යම් භික්ෂුනමකට දකුණු දිසාවෙහි එක කොටසක් සම්බන්ධව වඩනා ලද්දාවූ ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිස වඩන ලද්දාවූ ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයක් දැකීම පිණිස නොවඩන ලද්දාවූ සමෘධියෙක් වේද ඒ භික්ෂුතෙම දකුණු දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය රූපයන් දැකීම පිණිස නොව ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය

ශබ්දයන් අසන පිණිසය යන එක කොටසක් පිළිබඳව වඩනලද සමාධියෙහි දිව්‍ය ශබ්දයන් අසයි. එසේ නමුත් ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරවන්නාවූ, දිව්‍ය රූපයන් නොදකී. ඊට හේතුව කුමක්ද? මහාලිය, ඒ භික්ෂුවට දකුණු දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇල්ම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිස නොප ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසය යන එක කොටසක් සම්බන්ධව වඩනලද සමාධියෙහි මෙය මෙසේම වේ.

"මහාලිය, තවද අන් කාරණයක් ඇත්තේය, යම් භික්ෂු නමකට බස්නාහිර දිසාවෙහි, උතුරු දිසාවෙහි, උඩ, යට අනුදිසාවන්හි එකකොටසක් පිළිබඳව වඩනලද්දාවූ, ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය ශබ්දයන් අසන පිණිස වඩනා ලද්දාවූ, ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිස නොවඩන ලද්දාවූ සමාධියෙක් වේද, ඒ භික්ෂුතෙම බස්නාහිර දිසාවෙහි උතුරු දිසාවෙහි, උඩ යට, අනුදිසාවන්හි එක කොටසෙක්හි ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිවන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිස නොව ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිවන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසය යන එක කොටසක් පිළිබඳව වඩනලද සමාධියෙහි දිව්‍ය ශබ්දයන් අසයි. එසේ නමුත් ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ; දිව්‍ය රූපයන් නොදකී. ඊට හේතුව කුමක්ද? මහාලිය, ඒ භික්ෂුවට බස්නාහිර දිසාවෙහි උතුරු දිසාවෙහි, උඩ, යට අනුදිසාවන්හි එකකොටසක් පිළිබඳව ප්‍රිය උපදවන්නාවූ, කැමතිවන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ, දිව්‍ය රූපයන් දැකීම පිණිස නොව, ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසය යන එක කොටසක් පිළිබඳව වඩනලද සමාධියෙහි මෙය මෙසේම වේ.

10. "මහාලිය, මේ ශාසනයෙහි යම් භික්ෂු නමකට නැගෙනහිර දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිසද, ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසද යන දෙකොටසම පිණිස වඩන ලද්දාවූ සමාධියෙක් වේද, ඒ භික්ෂු තෙමේ නැගෙනහිර දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දකිනු පිණිසද දිව්‍ය ශබ්දයන් අසනු පිණිසද යන දෙකොටසම පිණිස වඩන ලද්දාවූ සමාධියෙහි නැගෙනහිර දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන්ද දකී. ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන්ද අසයි. ඊට හේතුව කුමක්ද? මහාලිය; ඒ භික්ෂුනමට නැගෙනහිර දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිසද ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසද යන දෙකොටසම පිණිස වඩනලද සමාධිය හේතු කොටගෙන මෙය මෙසේම වේ.

11. "මහාලිය, තවද වෙනත් කරුණක් ඇත්තේය. යම් භික්ෂුනමකට දකුණු දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිසද ප්‍රිය උපදවන්නාවූ, කැමති වන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසද යන දෙකොටසම පිණිස වඩන ලද සමාධියෙක්වේද, ඒ භික්ෂුතෙමේ දකුණු දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ, කැමතිවන්නාවූ, ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිසද, ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසනු පිණිසද යන දෙකොටසම පිණිස වඩනලද්දාවූ සමාධියෙහි දකුණු දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන්ද දකී. ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ දිව්‍ය ශබ්දයන්ද අසයි. ඊට හේතුව කුමක්ද?

"මහාලිය, ඒ භික්ෂුනමට දකුණු දිසාවෙහි ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිසද ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ

දිව්‍ය ශබ්දයන් අසන පිණිසදැයි යන දෙකොටසම පිණිස වඩනලද සමාධිය හේතුකොට ගෙන මෙය මෙසේම වේ.

"මහාලිය, තවද වෙනත් කරුණක් ඇත්තේය. යම් භික්ෂු නමකට බස්නාහිර දිසාවෙහි, උතුරු දිසාවෙහි, උඩ, යට අනුදිසාවන්හි එක කොටසක් පිළිබඳව වඩන ලද්දාවූ ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිසද, ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසනු පිණිසද යන දෙකොටසම පිණිස වඩන ලද්දාවූ සමාධියෙක් වේද, ඒ භික්ෂු තෙමේ බස්නාහිර දිසාවෙහි, උතුරු දිසාවෙහි, උඩ,යට අනුදිසාවන්හි එක කොටසෙක්හි, ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිසද ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසනු පිණිසද යන දෙකොටසම පිණිස වඩනලද්දාවූ සමාදියෙහි බස්නාහිර දිසාවෙහි උතුරුදිසාවෙහි උඩ යට අනුදිසාවන්හි එක් කොටසක ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිය රූපයන්ද දකී. ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන්ද අසයි ඊට හේතුව කුමක්ද? මහාලිය, ඒ භික්ෂුනමට බස්නාහිර දිසාවෙහි, උතුරු දිසාවෙහි, උඩ, යට අනුදිසාවන්හි එක කොටසෙක්හි ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය රූපයන් දැකීම පිණිසද ප්‍රිය උපදවන්නාවූ කැමතිවන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසද යන දෙකොටසම පිණිස වඩනලද සමාධිය හේතු කොටගෙන මෙය මෙසේම වේ.

"මහාලිය, යම් හේතුවකින් සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ, නැත්තාවූ නොව ඇත්තාවූම ප්‍රිය උපදවන්නාවූ කැමති වන්නාවූ ඇලීම ඇතිකරන්නාවූ දිව්‍ය ශබ්දයන් නෑසීද ඊට හේතුව නම්, මේ දිව්‍යරූපයන් දැකීම පිණිස පමණක්වූ එක කොටසක් පිණිස වඩනලද සමාදියමය. ඊට හේතු මාර්ගය (ප්‍රත්‍ය) නම් එක කොටසක්වූ සමාධියමය"යි ප්‍රකාශ කළහ.

12. "ස්වාමීන් වහන්ස, මේ දෙකොටසම පුරුදුවූ සමාධීන් අවබොධ කරගැනීම හේතුකොට ගෙණම භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ නිසා බ්‍රහ්මචර්ය කෙරෙත්දැයි" ඇසීය.

"මහාලිය මේ සමාධීන් අවබෝධ කරගැනීම හේතුකොට ගෙණම භික්ෂූහු මා නිසා බ්‍රහ්මචර්ය නොකෙරෙති. මහාලිය යම් ධර්මයක් අවබෝධ කරගැනීම හේතුකොට ගෙණ භික්ෂූහු මා කෙරෙහි බ්‍රහ්මචර්ය කෙරෙත්ද, එසේවූ මීට වඩා ඉතා උසස්වූද ඉතා මිහිරිවූද වෙනත් ධර්ම ඇත්තාහුමය"යි කීවාහුය.

"ස්වාමීන් වහන්ස, යම් ධර්මයක් අවබෝධ කරගැනීම හේතු කොට ගෙණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි පිළිපැදීමක් කෙරෙද්ද? මීට වඩා ඉතා උසස්වූද ඉතා මිහිරිවූද ඒ ධර්ම මොනවාදැ"යි ඇසීය.

13. යම් කරුණකින් භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි භික්ෂූහු උතුම් හැසිරීමෙහි පිළිපැදීමක් කෙරෙත් නම් උසස් ධර්මවලින් උසස්වූ ඒ ධර්ම මොනවාදැ"යි අසනලදී.

"මහාලිය, මේ ශාසනයෙහි භික්ෂු තෙමේ (සංයොජන) බන්ධන තුනක් සම්පූර්ණයෙන් නැති කිරීමෙන් සෝවාන් වේද, සතර අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තේද මාර්ග ධර්ම නියමයෙන් ස්ථිර වූයේ වේද, රහත් වීමට නියත වූයේ වේද, මහාලිය, භික්ෂූහු මාගේ ශාසනයෙහි යම් ධර්මයක් අවබොධ කිරීම සඳහා උතුම් හැසිරීමෙහි පිළිපැදීමක් කරද්ද, එසේවූ මේ ධර්මය සමාධීන්ට වඩා අතිශයින් උසස් වේ, අතිශයින් ශ්‍රෙෂ්ඨ වේ.

මහාලිය, තවද වෙනත් කරුණක් ඇත්තේය. භික්ෂු තෙමේ තුන් ආකාර බන්ධනයන් සම්පූර්ණයෙන් නැතිකිරීමෙන් රාග, ද්වෙෂ, මොහයන් තුනී කිරීමෙන් සකෘදාගාමි වේද, එක වරක් මේ ලොකයට පැමිණෙන ස්වභාව ඇත්තේ සසර දුක කෙළවර කෙරේද, මහාලිය, භික්ෂූහු මාගේ ශාසනයෙහි යම් ධර්මයක් අවබොධ කිරීම සඳහා උතුම් හැසිරීමෙහි පිළිපැදීමක් කරද්ද,

එසේවූ ධර්මය සමාධීන්ට වඩා අතිශයින් උසස් වේ, අතිශයින් ශ්‍රෙෂ්ඨ වේ.

"මහාලිය, තවද වෙනත් කරුණක් ඇත්තේය. භික්ෂු තෙමේ පස් ආකාර බන්ධනයන් සම්පූර්ණයෙන් නැතිකිරීමෙන් බඹ ලොව උපදින ස්වභාව ඇත්තේවේද, මහාලිය භික්ෂූහු මාගේ ශාසනයෙහි යම් ධර්මයක් අවබොධ කිරීම සඳහා උතුම් හැසිරීමෙහි පිළිපැදීමක් කරද්ද, එසේවූ, මේ ධර්මය සමාධීන්ට වඩා අතිශයින් උසස් වේ, අතිශයින් ශ්‍රෙෂ්ඨ වේ.

මහාලිය, තවද වෙනත් කරුණක් ඇත්තේය. භික්ෂු තෙමේ ක්ලෙශයන් සම්පූර්ණයෙන් නැති කිරීමෙන් ක්ලෙශ බන්ධනයන්ගෙන් මිදුනාවූ අර්හත් ඵල චිත්තයද අර්හත්ඵල ඥානයද මේ ආත්ම භාවයෙහි තමන්ම උසස් ඥානයෙන් අවබෝධකොට ලබාගෙණ වාසය කෙරේද, මහාලිය, භික්ෂූහු මාගේ ශාසනයෙහි යම් ධර්මයක් සඳහා උතුම් හැසිරීමෙහි පිළිපැදීමක් කරත්ද, එසේවූ මේ ධර්මය ඒ සමාධීන්ට වඩා අතිශයින් උසස් වේ. අතිශයින් ප්‍රධාන වේ.

"මහාලිය, භික්ෂූහු මාගේ ශාසනයෙහි යම් ධර්මයක් සඳහා උතුම් හැසිරීමෙහි පිළිපැදීමක් කරද්ද, එසේවූ මේ ධර්මය ඒ සමාධීන්ට වඩා අතිශයින් උසස්වූද ශ්‍රෙෂ්ඨවූද ධර්මයෝමය"යි කීසේක.

14. "ස්වාමීන් වහන්ස, මේ සෝවාන් ඵල ආදී ධර්මයන් අවබොධ කරගැණීමට මාර්ගයක් ඇද්ද, පිළිපැදීමක් ඇද්දැ"යි ඇසීය.

"මහාලිය,මේ සෝවාන් ඵල ආදී ධර්මයන් අවබොධ කරගැණීම පිණිස මාර්ගයක් ඇත්තේමය. පිළිපැදීමක් ඇත්මැයි" කීසේක.

"ස්වාමීන් වහන්ස, මේ ධර්මයන් අවබොධ කිරීම පිණිසවූ ඒ මාර්ගය කවරේද? ඒ පිළිපැදීම කවරීදැයි" ඇසුවේය.

"මේ උතුම් අංග අටකින් යුත් මාර්ගය (ආර්ය අෂ්ටාංගික මාර්ගය) මැයි. එනම්:- හරි අවබොධය, හරි කල්පනාව හරි

වචනය හෝ කථාව, හරි ක්‍රියාව, හරි ජීවත්වීම හරි උත්සාහය, හරි සිහිකිරීම, හරි සමාධිය, මහාලිය, ඒ ධර්ම අවබොධ කිරීමට මේ මාර්ගයවේ. මෙයම පිළිපැදීම වේ.

**15.** "මහාලිය, මම එක් කලක කොසොඹෑ නුවර ඝෝසිතාරාමයෙහි වාසය කෙළෙමි. එවිට මණ්ඩිස්ස නම් පරිබ්‍රාජක* තෙමේද පරිබ්‍රාජකයෙකුගේ අතවැසියෙකුවූ ජාලිය නම් පරිබ්‍රාජක තෙමේද යන මහණුන් දෙදෙන මම යම් තැනෙක්හිද එතනට පැමිණියාහුය. පැමිණ මා හා සමග සතුටුවූහ. සතුටුවිය යුතු කථා අවසානකොට එක පැත්තකටව සිටියෝය, එක පැත්තකටව සිටියාවූ ඒ මහණුන් දෙදෙනා මාගෙන් මෙසේ ඇසුවාහ.

"ඇවැත් ගෞතමයාණෙනි, ජීවයත් ශරීරයත් එකද නොහොත් ජීවය අනිකෙක්ද ශරීරය අනිකෙක්ද?" ඒ පැවිද්දන්ට මම මෙසේ කීවෙමි.

**16.** "මහාලිය, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනා ඥාන ආදී විද්‍යාඅට සීලසංවරය ආදී හසුරුවන ධර්ම පසළොස යන අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙවි මිනිසුන්ට ගුරුවරයෙක්වූ, (චතුරාර්ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්ම සතර අවබොධකළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් සහ මිනිසුන් සහිතවූ, සත්ත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැක පැහැදිලි කොට ප්‍රකාශ කෙරේ ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, අර්ථ සහිතවූ, (දස ආකාරයෙන්) නියම විදියට වචන ශබ්ද කරන්නාවූ ව්‍යඤ්ජන සහිත, සියලු ලෙසින් සම්පූර්ණවූ පිරිසිදුවූ සියලු ශාසනමාර්ග බ්‍රහ්මචර්ය ගෙන හැර දක්වති.

* මහණුන් වර්ගයක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

17. "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය.' ගෘහවාසය පීඩා සහිතයි, රාගාදී කෙලෙස් සහිත මාර්ගයෙකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්නට නොහැක්කේය. මම කෙස් දැලිරැවුලු කපාදමා සිව්රු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි' කියායි.

"ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාසිය හැර, ස්වල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වේ. මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවරසීලයෙන් යුක්තවූයේ, යහපත් හැසිරීමෙන් හා වරද නැති පැවැත්මෙන් යුක්තවූයේ, ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භය දක්නා ගති ඇත්තෙක් වූයේ, යහත්වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්තවූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි පිරිසිදුවූ ජීවන පැවැතුම් ඇත්තේ වෙයි. ශීලයෙන් යුක්තවූයේ වෙයි. ඉන්ද්‍රියයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි, කෑමෙහි පමණ දන්නේ වෙයි, යහපත් සිහියෙන් හා නුවණින් යුක්තවූයේ වෙයි, සන්තෝෂයෙන් යුක්තවෙයි.

18. "මහාලිය, භික්ෂුනමක් කෙසේ නම් සීලසම්පන්න වේද? මහාලිය, මේ සස්නෙහිවූ භික්ෂුනමක් ප්‍රාණවධය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද ආයුද ඇත්තේ. පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ කරුණාවන්තවූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතිව වාසය කෙරේද මෙයද ඔහුගේ සීලයක්වේ. නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමතිවන්නේ, සොරනොවූ

පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේද මෙයද ඔහුගේ සීලයෙකි. අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාමධර්මයෙන් වෙන්වූයේ බ්‍රහ්මචාරිවේද මෙයද ඔහුගේ සීලයෙකි. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේද මෙයද ඔහුගේ සීලයෙකි. පිසුණු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගතිඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද, මෙසේ භෙදවූවන් ගළපන්නේ සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ. සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ තෙපුල් කියන්නේවේද මේද ඔහුගේ සීලයෙකි. ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ යම් වචනයක් නිදොස් වේද, කණට සැපද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේ වේද මෙයද ඔහුගේ එක් සීලයකි. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කිින්නේ, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේද මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්මද දියුණුවට හේතුවන වචන කීමද මෙයද ඔහුගේ සීලයෙකි.

"තණ, ගස්, වැල්, සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන කෑම ඇත්තේ, රාත්‍රි කෑමෙන් හා අවේලෙහි කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින්

සම්පූර්ණයෙන් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේය. අමුමස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනුළමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද වේ වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොර වූයේය. එළුවන් හා තිරෙළුවන් පිළිගැන්මෙන් තොරවූයේය. කුකුළන්, හූරන්, ඇතුන් ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද, සම්පූර්ණයෙන් තොර වූයේය. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන පහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. ගනුදෙනු කිරීමය තරාදි ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මිශ්‍ර වඤ්චා කිරීමය, වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය, යන මෙයින්ද සම්පූර්ණයෙන් වැළැක්කේය, මෙයද ඔහුගේ සීලයක්වේ.

## සුලු සිල් නිමියේය.

**19.** "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කාමූලබීජය, ඛන්ධබීජය, ඵළුබීජය, දලුබීජය, පස්වැනිවූ බීජබීජය යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, නොඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛ්‍යාත වහන් දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත් කොට

තබා ප්‍රයෝජන ගැන්මයයි කියනලද පසුවට තබා ප්‍රයෝජන ගැන්මෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේ නම්, මෙයද ඔහුගේ සීලයෙක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, වැඩක් නැති කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනි නැංවීමය, සතරැස් බෙර හෝ කළබෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණදොවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මීවුන් හා පොරය, ගවයින් හා පොරය, එළුපොරය, මෙණ්ඩක එළුපොරය, කුකුළුපොරය, වටුපොරය, දඬු පොලු) පොරය, තොරතුරු (අත මිට මොලවා) ඇනීමය, මල්ලව යුද්ධය, යුද්ධය, ඇත් අස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත්ද මෙසේ මෙබඳු විසුලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකේ නම් මෙයද ඔහුගේ සීලයෙක් වේ,

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා (දූ පෝරු ආදිහි කෙළිම්වූ) ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටම්ටි ගසා ඇත් අස් ආදී රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, නළා පිඹීමය, ක්‍රීඩා නඟුල් ගෙන සෙල්ලම් සීසෑම්ය. කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන්ගුරුවා තනා ක්‍රීඩාකිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැණ කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතු දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය ඒ ඒ දෝෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්ද. මෙසේ මෙබඳුවූ කෙළියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**20.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දික්හඟලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇතිරිය, විසිකුරු එළුලොම් ඇතිරිය, එළුලොම් සුදු ඇතිරිය, එළු ලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදී රූපයෙන් විසිතුරු එළුලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති ඇතිරිය. දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය, රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එක්විට නැට්ටුක්කාරියන් දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරන ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබනලද රතුපාට කොට්ට ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කෙරෙත්ද මෙසේ මෙබඳුවූ උස් අසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි,

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, මූනබලන කන්නාඩි, අඳුන් තෙල් පාවිච්චිය හා සුවඳ, මූණේ ගානා සුවඳ කුඩු, මූණේ ගානා සුවඳ ද්‍රව්‍ය, අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය, විසිතුරු දඬුගෙන හැසිරීමය, බෙහෙත් නළ එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙනයෑම, විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය. නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය, දික්වූ දහවලු ඇති සුදුරෙදි ඇඳීමයයි මෙසේවූ සැරසීම් හා අඩුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්ද මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**21.** "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය මහ ඇමතියන් පිළිබඳ කථාය, සෙනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය,

මාලා පිළිබඳ කථාය, ගන්ධ ද්‍රව්‍යයන් පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි දරුවන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ තේරුම් නැති කථාය, ලොකය පිළිබඳ කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්ද මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**22.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි' 'ඔබ මේ ධර්ම විනය කුමකැයි දන්නෙහිද? ඔබ වරදවා පිළිපදින්නෙහිය, මම මනාකොට පිළිපදින්නේ වෙමි'. 'මාගේ වචන යහපත්ය, හෝ අර්ථ සහිතය, ඔබගේ වචන අර්ථ රහිතය' 'පළමු කිය යුත්ත පසුව කියෙහිය. පසුව කිය යුත්ත පළමුව කීයෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදුකරණලද නම් ඒ සියල්ල නිෂ්ඵල විය. ඔබට වාදාරොපනය කරණ ලදී. නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව' යන ආදී දෝෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්ද මෙසේ මෙබඳු දෝෂාරොපණ කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**23.** "එසේ සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියන්ගේ, බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේද හසුන්ගෙණ, 'මෙතනින් අසවල් තැනට යව අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යව, එතැනින් අසවල් දෙය ගෙණෙව'යි දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්ද මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැළැක්කේ නම් මෙයද ඒ ඔහුගේ එක් සීලයෙකි.

**24.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා කුහකයෝද, සිවුපසය උදෙසා කථා කරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන් කරන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද ලාභයකින් ලාභයක් සොයන්නෝද වෙත්. මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග ආදියෙන් වැළැක්මක් වේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි."

**මැදුම් සිල් නිමියේය.**

**25.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, හෙනගැසීම ආදී මහ නිමිතිබලා කියන ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන ශාස්ත්‍රය, ගිනිදෙවියා පිදීමය, දබ්බිහොමය, ථුස හොමය, තණ්ඩුල හොමය, කණ හොමය, සප්පි හොමය, තෙල හොමය, මුඛ හොමය, ලේ හොමය, ශරීරවිද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යා, භූත විද්‍යා, නාග විද්‍යා. විෂ විද්‍යා, ගෝනුසු විද්‍යා, මී විද්‍යා, කුරුලු විද්‍යා, කපුටු විද්‍යා, ජීවිත කාලය කීම, ආයුධ වැළැක්ම, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා හේතුකොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු පහත් විද්‍යා හේතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**26.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය, ස්ත්‍රීලක්ෂණය, පුරිස ලක්ෂණය, පිරිමිදරු ලක්ෂණය, ගෑනුදරු ලක්ෂණය, දාස ලක්ෂණය, දාසිලක්ෂණය, ඇත් ලක්ෂණය. අශ්ව ලක්ෂණය, කැස්බෑ ලක්ෂණය, එළු ලක්ෂණය, මීහරක් ලක්ෂණය, ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය, කුකුළු ලක්ෂණය, වටු ලක්ෂණය, තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය, මුව ලක්ෂණයයි, මෙබඳු පහත් විද්‍යාවන් කරණ කොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි

ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයෙකි.

27. "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැර යෑම වන්නේය. අසවල් දින ඇතුළු නුවරට එන්නේය. අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හේතුකොට ලාමක ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයක් වේ.

28. "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'චන්ද්‍රග්‍රහණය වන්නේය. සූර්යග්‍රහණය වන්නේය තාරකා සමාගමය වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමග යෑම වන්නේය, තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය. තාරකාවන්ගේ නොමග යෑම් වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළොව කම්පාව වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ, හිරු තාරකාවන්ගේ නැගීම හා බැහීමද කෙළෙසීමද පිරිසිදු වීමද වන්නේය, චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය චන්ද්‍ර සූර්යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇති වන්නේය, ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි

කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම මෙබඳු විපාක ඇති වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටුවීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇතිවන්නේයයි' කියා මෙසේ පහත් විද්‍යා හේතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හේතු කොට ගෙණ කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

**29.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය, යහපත් ආහාරපාන ඇතිවන්නේය, ආහාර පාන නැති වන්නේය, නිර්භය ඇතිවන්නේය, භය ඇතිවන්නේය, රොග ඇතිවන්නේය, නිරෝගි බව ඇතිවන්නේයයි' කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන්කිරීමය, කොටස්කර ගණන්කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණකොට වැරදි ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හෙතුවෙන් වන වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයකි.

**30.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථාකිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇතිකිරීමය, දුර්ගර්භකරණය, ගර්භවිරොධි කරණය, දිව් තදකිරීමය, නූල් බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්න ඇසීමය, ගෑනුදරුවන්ගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණය කොට ප්‍රශ්න ඇසීමය, හිරුවැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම් කිරීමය, කටින් ගිනිදැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයකි.

31. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීම, කාර්යය සමෘද්ධි කටයුතු කර්මය, මන්ත්‍ර කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මූන සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩු කය විරේකය, යටිකය විරේකය, හිස විරේකය, කන්තෙලය, ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍ය කිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකමය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකම්ය, මූලික බෙහෙත් දීමය, සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට වැරදි ජීවත්වීමෙන් ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයකි.

32. "මහාලිය, මෙසේ ශීල සම්පන්නවූ භික්ෂුහට භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ ශීලසංවරය හෙතුකොට ගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:- මහාලිය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයකුත් නොදක්නේද, එපරිද්දෙන්ම, මහාලිය, සීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය. ආර්යවූ (උතුම්වූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂු තෙම, තමන් තුළ පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. මහාලිය, මෙසේ දැක්වූ ශීලයෙන් යුක්තවූ භික්ෂුව සීලසම්පන්න නම් වේ.

### මහ සිල් නිමියේය.

33. "මහාලිය, භික්ෂුව කෙසේ නම් ඉන්ද්‍රියන්හි වැසූ දොරටු ඇත්තේද? මහාලිය, මේ සස්නෙහි භික්ෂු තෙමේ, ඇසින් රූපයක් දැක එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ඇස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී

අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ ඇස් ඉන්ද්‍රියය රකී, ඇස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. කන් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ කන් ඉන්ද්‍රියය රකී කන් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. නාසයට ගඳ සුවඳ දැනී එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. නාස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ නාස් ඉන්ද්‍රියය රකී. නාස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. දිව් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ දිව් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ ස්පර්ශ ඉන්ද්‍රියය රකී. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. සිතින් (ධර්මයක්) අරමුණක් දැන එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. සිත් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් නිසා දැඩි ආසාව හා කලකිරීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. හෙතෙම සිත් ඉන්ද්‍රිය රකී. සිත් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ භික්ෂුව උතුම්වූ ශීල රාශියෙන් යුක්තවූයේ අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ අධිචිත්ත සැපය විඳියි. මහාලිය, මෙසේවූ භික්ෂු තෙමේ ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තේ වේ.

34. "මහාලිය, භික්ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද?

"මහාලිය, මේ සස්නෙහි භික්ෂුතෙම ඉදිරියට යෑමෙහිද, ආපසු යෑමෙහිද, නුවණින් දැන කරන්නේය. ඉදිරි බැලීමෙහිද, වටපිට බැලීමෙහිද නුවණින් දැන බලන්නේය අත් පා හැකිලීමෙහිද, දිගු කිරීමෙහිද, මනා නුවණින් දැන එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන එසේ කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, වැළඳීමය, රස විඳීමය යන මෙහිද මනා නුවණින් යෙදී එසේ කරන්නේය. මල මුත්‍ර පහකිරීමද නුවණින් (ආදිනව) සලකා කරන්නේය. යෑම් සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්දව සිටීම යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. මහාලිය, මෙසේ කරන්නාවූ භික්ෂු තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි.

**35.** "මහාලිය, භික්ෂු තෙමේ කෙසේ සතුටු වූයේ වේද?

"මහාලිය, භික්ෂුතෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද, සතුටු සිත් ඇත්තේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳවූ දේ) පමණක් ගෙන යයි. මහාලිය, යම් සේ පක්ෂියෙක් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, මහාලිය, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය ආරක්ෂාවට ප්‍රමාණවූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු වන්නේ වේ. ඔහු යම් තැනක යා නම් අටපිරිකර පමණක් රැගෙණ බැහැර යයි. මහාලිය, මෙසේවූ භික්ෂු තෙමේ සන්තොෂයෙන් යුක්ත වේ.

**36.** "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, මේ උතුම්වූ සන්තොෂයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, කඳු පලාත්ද, කඳුරැලි ගල්ගුහාවන් හෝ මහා මගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ ඉඩකඩ ඇති තැන් සහ තණ ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය

කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළැක්කේ, පර්යංකය බැඳ, කකුල් අකුලුවා හිඳ ශරීරයේ උඩු කොටස කෙලින් තබා නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවාගෙණ හිඳී.

37. "ඔහු ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභ සිත වෙන් කොට පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව පණඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වාසයකරයි. ක්‍රොධ දොෂයෙන් වෙන්ව සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේ. අලස බව දුරුකොට සිත පිරිසිදු කෙරේ. උඩඟු බව හා කුකුස දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, සිත උඩඟු බව හා කුකුසෙන් පිරිසිදු කෙරේ. විචිකිච්ඡාව (සැකය) දුරුකොට, පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේ; විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

38. "මහාලිය, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්තයන්හි යොදන්නේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණුවන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් ආරක්ෂා කරණ පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඕහට මෙබඳු අදහසක් ඇතිවේ. 'මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පොෂ්‍ය කිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය, කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

39. "මහාලිය, යම්සේ රොගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව, ඇති පුරුෂයෙක් වන්නේද, ඕහට ආහාර රුචි නොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ

නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම් ඔහුගේ ශරීර බලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳුද යත්ඃ 'මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන් බව ඇති කෙනෙක් වීමි. මට බත් රුචියද නොවීය, ශරීර බලයද නැතිවිය, ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය. කාය බලයද තිබේය' කියායි. ඔහු ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසටද පැමිණෙන්නේය.

**40.** "මහාලිය, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසු කලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්ඃ 'මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සතුටටද පැමිණෙන්නේය.

**41.** "මහාලිය, යම් සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි. අනුන්ට යටත්වූ, තමා කැමති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි වැඩකරුවෙක් වන්නේද, ඔහු පසු කලක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේද අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්ඃ 'මම පෙර සිය කැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් මා අදහස් පරිදි කිසි තැනෙක යානොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපති කොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත්නූන කෙනෙක් වීමි. අනුන්ට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමති තැනෙක යා හැක්කේද වෙමි'යි කියායි. ඔහු ඒ දාසභාවයෙන් මිදීම හේතුකොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

**42.** "මහාලිය, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේද, ඔහු මද කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොරසතුරන්ගෙන් පීඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්:- 'මම පෙර ධනවත් වූයෙම්, භොග සම්පත් සහිත වූයෙම්, දුර්ලභ භික්ෂා ඇති භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණියෙක් වූයෙමි. එසේවූ මම දැන් එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගය එතර කිරීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සතුටටද පැමිණෙන්නේය.

**43.** "මහාලිය, ණය යම්සේද, රෝගය යම්සේද, හිරගේ යම්සේද, දාසභාවය යම්සේද, දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂු තෙමේ පහනොකළ (පඤ්චනීවරණ) කුසල් වලක්වන කරුණු පහ තමා කෙරෙහි ලා නුවණින් දකීද මහාලිය, ණය නැති බව යම්සේද, නිරෝගී බව යම්සේද, සිරගෙන් මිදීම යම්සේද, අනුන්ට යටහත් නැති බව යම්සේද, භය නැති භූමිය යම්සේද, එපරිද්දෙන්ම මහාලිය, භික්ෂු තෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ ලා දක්නේය.

**44.** "පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ භික්ෂුහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසහගත සිත් ඇත්තහුගේ නාම කය (වේදනාදී ස්කන්ධ හතර) සංසිඳෙයි. සංසිඳිනු කය ඇති තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) පැමිණෙයි.

**45.** "ඒ භික්ෂු තෙමේ වස්තුකාම ක්ලෙශයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන්ද වෙන් වූයේම අරමුණට සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම සහිතවූ, සිතෙහි විවේකයෙන් උපන් ප්‍රීතියම සැපකොට ඇති, පළමුවෙනි ධ්‍යාන කුසල චිත්තය තමා තුළ ඉපදීම් වසයෙන් ඊට පැමිණ

එම ධ්‍යානයෙහි වාසය කෙරේද ඇවැත්නි, යම් භික්ෂුනමක් මෙසේ දනී නම්, මෙසේ දකී නම් ඒ මහණ හට ජීවයත් ශරීරයත් එකම හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ භික්ෂුවක් මෙසේ දනීද, මෙසේ දකීද ඔහුට ජීවයත් ශරීරයත් එකමයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතු යැයි ඒ මහණුන් දෙදෙන කීහ. ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එසේ වුවත් මම ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

**46.** "ඇවැත්නි, නැවතද භික්ෂු තෙමේ අරමුණට සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම යන මොවුන්ගේ සන්සිඳීමෙන් අද්ධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති දෙවැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කරයිද, ඇවැත්නි, යම් භික්ෂුනමක් මෙසේ දනී නම් මෙසේ දකී නම් ඒ මහණ හට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ භික්ෂු නමක මෙසේ දනීද, මෙසේ දකීද, ඔහුට ජීවයත්, ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුයයි කීහ. ඇවැතිනි, මම මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එසේ වුවත් මම ජීවයත් ශරීරයත් එකය හෝ ජීවය අනෙකක, ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

**47.** "නැවතද ඇවැත්නි, ඒ භික්ෂු තෙමේ ප්‍රීතියෙහි නො ඇල්මෙන් මැදහත් බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි යම් ධ්‍යානයක් පිළිබඳව (උපේක්ෂා) සැප දුක් දෙකට මැදහත් විඳීම ඇත්තේය, සිහි ඇත්තේය, සැපයෙන් විසීම ඇත්තේ යයි ආර්යයෝ කියත්ද ඒ තුන්වැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේද ඒ ඇවැත්නි, යම් භික්ෂුනමක් මෙසේ දනී නම්, මෙසේ දකීනම්,

ඒ මහණහට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ භික්ෂු නමක් මෙසේ දනීද, මෙසේ දකීද, ඔහුට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුයයි කීහ. ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එසේ වුවත් මම ජීවයත් ශරීරයත් එකය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

48. "නැවතද ඇවැත්නි, ඒ මහණතෙමේ සැප දුරු කිරීමෙන්ද, දුක් දුරු කිරීමෙන්ද පළමුකොටම සැප දුක් වේදනා නැතිව යාමෙන් දුක්ද නොවූ සැපද නොවූ, උපේක්ඛා-සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, හතරවෙනි ධ්‍යාන (කුසල) චිත්තයට පැමිණ වාසය කෙරේද, ඇවැත්නි, යම් භික්ෂු නමක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඒ මහණහට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ භික්ෂුනමක් මෙසේ දනීද, මෙසේ දකීද ඔහුට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුයයි කීහ. ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එසේ වුවත් මම ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

49. "ඥාන දර්ශනය පිණිස විදර්ශනා චිත්තය එළවා තබාද ඥානදර්ශනයට සිත නමාද, ඇවැත්නි, යම් භික්ෂු නමක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහුට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ භික්ෂුනමක් මෙසේ දනීද, මෙසේ දකීද, එබඳු ඥාන දර්ශනයක් ඇති මහණකුට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුනොවේයයි කීහ. ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එසේවූ නමුත් මම ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

**50.** "ඇවැත්නි, මෙයින් පසු කෙලෙස් නැතිකිරීම සඳහා කළයුත්තක් නැතැයි දනීද, යම් භික්ෂු නමක් මෙසේ දනීද, මෙසේ දකීද, එබඳුවූ විදර්ශනා ඥානයෙන් (සත්‍යය ඇතිසැටි දැකීම) දැක්කාවූ රහත්භික්ෂු නමට ජීවයත් ශරීරයත් එකමය ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ භික්ෂුනමක් මෙසේ දනීද මෙසේ දකීද. ඒ රහත් භික්ෂුනමට ජීවයත් ශරීරයත් එකමයයි හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට නොවටීයයි කීහ. ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි, එසේවූ නමුත් මම ජීවයත් ශරීරයත් එකයයි හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි."

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රධර්මය දේශනා කළසේක. මෙයින් සතුටු සිත් ඇත්තාවූ ඔට්ඨද්ධ නම් මහාලි ලිච්ඡවි රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්තේය.

**හයවෙනිවූ මහාලි සූත්‍රය නිමියේය.**

## 7 ජාලිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී (මාගේ ඇසීම මෙසේය.) එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවර ඝොෂිතාරාමයෙහි වාසය කරණසේක. ඒ කාලයෙහිදී 'මණ්ඩිස්ස' නම් පරිබ්‍රාජක* තෙමේද දරුපත්තික නම් පරිබ්‍රාජකයෙකුගේ ශිෂ්‍යයෙක්වූ ජාලිය නම් පරිබ්‍රාජක තෙමේද යන දෙදෙන, භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතනට පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාකොට එකපැත්තකටවී සිටියාහුය. එකපැත්තකටවී සිටි

* මහණුන් වර්ගයක්

ඔවුන් දෙදෙන භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැන්නුවාහුය.

"කිමෙක්ද ඇවැත්නි, ගෞතමයාණෙනි, ජීවයත් ශරීරයත් එකමද නොහොත් ජීවය අනෙකක්ද ශරීරය අනෙකෙක්ද?"

"ඇවැත්නි, එහෙනම් අසව්. හොඳින් කල්පනා කරව්. කියන්නෙමි'යි

"ඇවැත්නි, එසේය. ඒ මහණුන් දෙදෙනා භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළෝය.

**2.** "ඇවැත්නි, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනා ඥාන ආදී විද්‍යාඅට සීලසංවරය ආදී හසුරුවන ධර්ම පහළොව යන අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙවි මිනිසුන්ට ගුරුවරයෙක්වූ, (චතුරාර්ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්මසතර අවබොධකළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් සහ මිනිසුන් සහිතවූ, සත්ත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැක පැහැදිලි කොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ, (දස ආකාරයෙන්) නියම විදියට වචන ශබ්ද කරන්නාවූ බ්‍යඤ්ජන සහිත, සියලු ලෙසින් සම්පූර්ණවූ පිරිසිදුවූ සියලු ශාසනමාර්ග බ්‍රහ්මචර්යය ගෙන හැර දක්වති.

**3.** "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි, ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි, ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය. ගෘහවාසය පීඩා සහිතයි රාගාදී කෙලෙස් සහිත මාර්ගයෙකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගිහි ගෙයි වසන්නාහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැලිරැවුලු කපාදමා සිව්රු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි' කියායි.

"ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාසිය හැර, ස්වල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වේ. මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවරසීලයෙන් යුක්තවූයේ, යහපත් හැසිරීමෙන් හා වරද නැති පැවැත්මෙන් යුක්තවූයේ, ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භය දක්නා ගති ඇත්තෙක් වූයේ, යහපත්වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්තවූයේ ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ ජීවිත පැවතුම් ඇත්තේ වෙයි. ශීලයෙන් යුක්තවූයේ වෙයි. ඉන්ද්‍රියයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි, කෑමෙහි පමණ දන්නේ වෙයි, යහපත් සිහියෙන් හා නුවණින් යුක්තවූයේ වෙයි, සන්තෝෂයෙන් යුක්තවෙයි.

4. "ඇවැත්නි, භික්ෂුනමක් කෙසේ නම් සීලසම්පන්න වේද? ඇවැත්නි, මේ සස්නෙහිවූ භික්ෂුනමක් ප්‍රාණවධය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, බහා තබන ලද දඬු ඇත්තේ, බහාතබන ලද ආයුධ ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ කරුණාවන්තවූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතිව වාසය කෙරේද මෙයද ඔහුගේ සීලයක්වේ. නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කමතිවන්නේ, සොරනොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේද මෙයද ඔහුගේ සීලයෙකි. අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන්වූයේ බ්‍රහ්මචාරීවේද මෙයද ඔහුගේ සීලයකි. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකරේද මෙයද ඔහුගේ සීලයෙකි.

පිසුණු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතැනින්, අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගතිඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද, මෙසේ භෙදවූවන් ගළපන්නේ සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ. සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ තෙපුල් කියන්නේවේද මේද ඔහුගේ සීලයෙකි. ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ යම් වචනයක් නිදොස් වේද, කනට සැපද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේද මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්මද දියුණුවට හේතුවන වචන කීමද, මෙයද ඔහුගේ සීලයෙකි.

"තණ, ගස්, වැල්, සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන කෑම ඇත්තේ, රාත්‍රී කෑමෙන් හා අවේලෙහි කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම ඉන් සැරසීම, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. අමුවූ ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේය. අමුමස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනුලමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද වේ. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේය. එළුවන් හා තිරෙළුවන්

පිළිගැනීමෙන් තොරවූයේය. කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද, සම්පූර්ණයෙන් තොරවූයේය. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන පහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. ගනුදෙනු කිරීමය, තරාදි ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මිශ්‍ර වඤ්චා කිරීමය, වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය, යන මෙයින්ද සම්පූර්ණයෙන් වැළැක්කේය, මෙයද ඔහුගේ සීලයක් වේ.

**සුලු සිල් නිමියේය.**

5. "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මූලබීජය, ඛන්ධබීජය, ඵළුබීජය, දළුබීජය, පස්වැනිවූ බීජබීජය යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේ නම් මෙයද ඔහුගේ එක් සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙනලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, නොඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛ්‍යාත වහන්, දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත් කොට තබා ප්‍රයොජන ගැන්මයයි කියනලද පසුවට තබා ප්‍රයොජන ගැන්මෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේ නම්, මේද ඔහුගේ සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය,

වැඩක් නැති කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරැස් හෝ කළබෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණ්ඩොවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනී ඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මීවුන් හා පොරය, ගවයින් හා පොරය, එළුපොරය, මෙණ්ඩක එළුපොරය, කුකුළුපොරය, වටුපොරය, දඬු (පොලු) පොරය. තොරතුරු (අත මිටමොලවා) ඇනීමය, මල්ලව යුද්ධය යුද්ධය, ඇත් අස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත්ද මෙසේ මෙබඳු විසුලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකේ නම් මෙයද ඔහුගේ සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙනලද කෑම කා (දූ පෝරු ආදියෙහි කෙළිම්වූ) ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම් මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටමිටි ගසා ඇත් අස් ආදී රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, නලා පිඹීමය, ක්‍රීඩා නගුල් ගෙන සෙල්ලම් සීසෑමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන්ගුරුවා තනා ක්‍රීඩාකිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැණ කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය. ඒ ඒ දොෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්ද මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**6.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දික්හගලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇතිරිය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළුලොම් සුදුඇතිරිය, එළු ලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදී රූපයෙන් විසිතුරු එළුලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති, ඇතිරිය, දෙපිට ලොම්

ඇති එළුලොම් ඇතිරිය, රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එක්විට නැට්ටුක්කාරියන් දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරන ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබනලද රතුපාට කොට්ට ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කෙරෙත්ද මෙසේ මෙබඳුවූ උස් අසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි,

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, මූනබලන කන්නාඩි, අඳුන් තෙල් පාවිච්චිය හා සුවඳ, මූණේ ගානා සුවඳ කුඩු, මූණේ ගානා සුවඳ ද්‍රව්‍ය, අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය, විසිතුරු දඬුගෙන හැසිරීමය, බෙහෙත් නළ එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙනයෑම, විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය. නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය, දික්වූ දහවලු ඇති සුදුරෙදි ඇඳීමයයි මෙසේවූ සැරසීම් හා අඩුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්ද මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

7. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය මහ ඇමතියන් පිළිබඳ කථාය, සෙනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය, මාලා පිළිබඳ කථාය, ගන්ධ ද්‍රව්‍යයන් පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි දරුවන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ

කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ තේරුම් නැති කථාය, ලොකය පිළිබඳ කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්ද මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

8. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි' 'ඔබ මේ ධර්ම විනය කුමකැයි දන්නෙහිද? ඔබ වරදවා පිළිපදින්නෙහිය, මම මනාකොට පිළිපදින්නේ වෙමි'. 'මාගේ වචන යහපත්ය, හෝ අර්ථ සහිතය, ඔබගේ වචන අර්ථ රහිතය' 'පළමු කිය යුත්ත පසුව කීයෙහිය. පසුව කිය යුත්ත පළමුව කීයෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදුකරණ ලද නම් ඒ සියල්ල නිෂ්ඵල විය. ඔබට වාදාරොපනය කරණ ලදී. නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව' යන ආදී දෝෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්ද මෙසේ මෙබඳු දෝෂාරොපණ කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

9. එසේ සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියන්ගේ, බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙන, මෙතනින් අසවල් තැනට යව අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණයව, එතැනින් අසවල් දෙය ගෙණෙව'යි දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්ද මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැළැක්කේ නම් මෙයද ඒ ඔහුගේ එක් සීලයෙකි.

10. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා කුහකයෝද, සිව්පසය උදෙසා කථා කරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන් කරන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද ලාභයකින්

ලාභයක් සොයන්නෝද වෙත්. මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග ආදියෙන් වැළැක්මක් වේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.”

**මැදුම් සිල් නිමියේය.**

11. “එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, හෙනගැසීම ආදී මහ නිමිති බලා කියන ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, මීයන් කැපූ වස්ත්‍රාදිය බලාකියන ශාස්ත්‍රය, ගිනිදෙවියා පිදීමය, දබ්බිහොමය, ථුස හොමය, තණ්ඩුල හොමය, කණ හොමය, සප්පි හොමය, තෙල හොමය, මුඛ හොමය, ලේ හොමය, ශරීර විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යා, භූත විද්‍යා, නාග විද්‍යා, විෂ විද්‍යා, ගෝනුසු විද්‍යා, මී විද්‍යා, කුරුලු විද්‍යා, කපුටු විද්‍යා, ජීවිත කාලය කීම, ආයුධ වැළැක්ම, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා, හේතුකොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු පහත් විද්‍යා හේතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි.

12. “එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මිණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය, ස්ත්‍රී ලක්ෂණය, පුරිස ලක්ෂණය, පිරිමිදරු ලක්ෂණය, ගැනුදරු ලක්ෂණය, දාස ලක්ෂණය, දාසි ලක්ෂණය, ඇත් ලක්ෂණය, අශ්ව ලක්ෂණය, කැස්බෑ ලක්ෂණය, එළුලක්ෂණය, මීහරක් ලක්ෂණය, ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය, කුකුළු ලක්ෂණය, වටු ලක්ෂණය, තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය, මුව ලක්ෂණයයි, මෙබඳු පහත් විද්‍යාවන් කරණකොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

13. “එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැර යෑම වන්නේය.

අසවල් දින ඇතුළු නුවරට එන්නේය. අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හේතුකොට ලාමක ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයක් වේ.

**14.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'චන්ද්‍රග්‍රහණය වන්නේය, සූර්ග්‍රහණය වන්නේය, තාරකා සමාගමය වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමග යෑම වන්නේය, තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය, තාරකාවන්ගේ නොමග යෑම් වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළොව කම්පාව වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම හා බැහීමද කෙළෙසීමද පිරිසිදු වීමද වන්නේය, චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය, චන්ද්‍ර සූර්යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇති වන්නේය, ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇති වන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය, දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම මෙබඳු විපාක ඇති වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටුවීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇතිවන්නේයයි' කියා මෙසේ පහත් විද්‍යා හේතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හේතු කොට ගෙණ කරණ

ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයකි.

**15.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය, යහපත් ආහාරපාන ඇතිවන්නේය, ආහාර පාන නැති වන්නේය, නිර්භය ඇතිවන්නේය, භය ඇතිවන්නේය, රොග ඇතිවන්නේය, නිරෝගී බව ඇතිවන්නේයයි' කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන් කිරීමය, කොටස්කර ගණන් කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණකොට වැරදි ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හෙතුවෙන් වන වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

**16.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථාකිරීමය, වියෝගය පිළිබඳ කථාකිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇතිකිරීමය, දුර්ගර්භකරණය, ගර්භවිරොධි කරණය, දිව් තද කිරීමය, නූල් බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්න ඇසීමය, ගෑනුදරුවන්ගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණය කොට ප්‍රශ්න ඇසීමය, හිරු වැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම් කිරීමය, කටින් ගිනිදැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

**17.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීම, කාර්යය සමෘද්ධි කටයුතු කර්මය, මන්ත්‍ර කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මූන සුද්ධ කිරීමය,

නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩු කය විරේකය, යටිකය විරේකය, හිස විරේකය, කන්තෙලය, ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍ය කිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකමය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකම්ය, මූලික බෙහෙත් දීමය, සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට වැරදි ජීවත්වීමෙන් ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් ශීලයකි.

18. "ඇවැත්නි, මෙසේ ශීල සම්පන්නවූ භික්ෂුහට භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ ශීලසංවරය හෙතුකොට ගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:- ඇවැත්නි, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම, මහාලිය, සීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ශීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය. ආර්යවූ (උතුම්වූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂු තෙම, තමන් තුළ පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. ඇවැත්නි, මෙසේ දැක්වූ ශීලයෙන් යුක්තවූ භික්ෂුව ශීලසම්පන්න නම් වේ.

**මහ සිල් නිමියේය.**

19. "ඇවැත්නි, භික්ෂුව කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේද? ඇවැත්නි, මේ සස්නෙහි භික්ෂු තෙමේ, ඇසින් රූපයක් දැක එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ඇස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කළකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ ඇස් ඉන්ද්‍රියය රකී, ඇස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. කන් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම

පිණිස ඔහු පිළිපදී. තමාගේ කන් ඉන්ද්‍රියය රකී. කන් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. නාසයට ගඳ සුවඳ දැනී එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. නාස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ නාස් ඉන්ද්‍රියය රකී. නාස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ එහි නො ඇලේ. එහි නොපෙළඹෙන්නේය. දිව් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ දිව් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ ස්පර්ශ ඉන්ද්‍රියය රකී. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. සිතින් (ධර්මයක්) අරමුණක් දැන එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. සිත් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් නිසා දැඩි ආසාව හා කළකිරීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. හෙතෙම සිත් ඉන්ද්‍රිය රකී. සිත් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ භික්ෂුව උතුම්වූ ශීල රාශියෙන් යුක්තවූයේ අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ අධිචිත්ත සැපය විඳියි. ඇවැත්නි, මෙසේවූ භික්ෂු තෙමේ ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තේ වේ.

**20.** "ඇවැත්නි, භික්ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද?

"ඇවැත්නි, මේ සස්නෙහි භික්ෂුතෙම ඉදිරියට යෑමෙහිද, ආපසු යාමෙහිද, නුවණින් දැන කරන්නේය. ඉදිරි බැලීමෙහිද, වටපිට බැලීමෙහිද නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහිද, දිගු කිරීමෙහිද, මනා නුවණින් දැන එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය, සිවුරැය යන මේ දේ

දැරීමෙහිදී මනා නුවණින් දැන එසේ කරන්නේය. අනුභව කිරීමය, පානය කිරිමය, වැළඳීමය, රස විඳීමය යන මෙහිද මනා නුවණින් යෙදී එසේ කරන්නේය. මල මුත්‍ර පහකිරීමද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්දව සිටීම යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. ඇවැත්නි, මෙසේ කරන්නාවූ භික්ෂු තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි.

21. "ඇවැත්නි, භික්ෂු තෙමේ කෙසේ සතුටු වූයේ වේද?

"ඇවැත්නි, භික්ෂු තෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු සිත් ඇත්තේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳවූ දේ) පමණක් ගෙන යයි. ඇවැත්නි, යම්සේ පක්ෂියෙක් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, ඇවැත්නි, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය ආරක්ෂාවට ප්‍රමාණවූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු වන්නේ වේ. ඔහු යම් තැනක යා නම් අටපිරිකර පමණක් රැගෙණ බැහැර යයි. ඇවැත්නි, මෙසේවූ භික්ෂු තෙමේ සන්තෝෂයෙන් යුක්ත වේ.

22. "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, මේ උතුම්වූ සන්තෝෂයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, කඳු පලාත්ද, කඳුරැලි ගල්ගුහාවන් හෝ මහා මගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ ඉඩකඩ ඇති තැන් සහ වන ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය කෙරේද, ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළැක්කේ, පයර්යංකය බැඳ, කකුල් අකුලුවා හිඳ ශරීරයේ උඩු කොටස කෙලින් තබා නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවාගෙණ හිඳී.

23. "ඔහු ලෝකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේද ලොභ සිත වෙන් කොට පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව පණඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වාසය කෙරේද ක්‍රොධ දොෂයෙන් වෙන්ව සිත පිරිසිදු කෙරේද කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේද, අලස බව දුරුකොට සිත පිරිසිදු කෙරේද, උඩඟු බව හා කුකුස දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේද, ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, සිත උඩඟු බව හා කුකුසෙන් පිරිසිදු කෙරේද, විචිකිච්ඡාව (සැකය) දුරුකොට, පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේද; විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේද,

24. "ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්තයන්හි යොදන්නේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණුවන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් ආරක්ෂා කරණ පිණිස වැඩි යමක් ඉතුරුවූයේ නම් ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. "මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹු දරුවන් පොෂ්‍යය කිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

25. "ඇවැත්නි, යම්සේ රොගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේද, ඔහුට ආහාරරුචි නොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීර බලය ඇතිවන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳුද යත්: 'මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන්බව ඇති කෙනෙක් වීමි. මට බත් රුචියද නොවීය, ශරීර

බලයද නැතිවිය, ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය. කාය බලයද තිබේය' කියායි. ඔහු ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසටද පැමිණෙන්නේය.

**26.** "ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසු කලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සතුටටද පැමිණෙන්නේය.

**27.** "ඇවැත්නි, යම් සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත්වූ, තමා කැමති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි වැඩකරුවෙක් (දාසයෙක්) වන්නේද, ඔහු පසු කලක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර සිය කැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපති කොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත්නූන කෙනෙක් වීමි. අනුන්ට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යා හැක්කේද වෙමි'යි කියායි. ඔහු ඒ දාස භාවයෙන් මිදීම හේතුකොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

**28.** "ඇවැත්නි, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේද, ඔහු මද කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොර සතුරන්ගෙන් පීඩා නැති

ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්:- "මම පෙර ධනවත් වූයෙමි, භොග සම්පත් සහිත වූයෙමි, දුර්ලභ භික්ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණියෙක් වූයෙමි. එසේවූ මම දැන් එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්:- "මම පෙර දනවත් වූයෙමි, භෝග සම්පත් සහිතවූයෙමි, දුර්ලභ භික්ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණියෙක් වූයෙමි. එසේ වූ මම දැන් එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගය එතෙර කිරීම නිමිතිකොට බලවත් සතුටුක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

**29.** "ඇවැත්නි, ණය යම්සේද, රෝගය යම්සේද, හිරගේ යම්සේද, දාසභාවය යම්සේද, දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂු තෙමේ පහනොකළ (පඤ්ච නීවරණ) කුසල් වලක්වන කරුණු පහ තමා කෙරෙහි ලා නුවණින් දකීද, ඇවැත්නි, ණය නැති බව යම්සේද, නිරෝගී බව යම්සේද, සිරගෙන් මිදීම යම්සේද, අනුන්ට යටහත් නැති බව යම්සේද භය නැති භූමිය යම්සේද, එපරිද්දෙන්ම ඇවැත්නි, භික්ෂු තෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ නැති බව නුවණින් දක්නේය.

**30.** "පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ භික්ෂුහට සතුටු ආකාරය උපදී. සතුටු වුවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසහගත සිත් ඇත්තහුගේ නාම කය (වේදනාදී ස්කන්ධ හතර) සංසිඳෙයි, සංසිඳුනු කය ඇති තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) පැමිණෙයි.

**31.** "ඒ භික්ෂු තෙමේ වස්තුකාම ක්ලෙශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන්ද වෙන් වූයේම අරමුණට සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම සහිතවූ,

සිතෙහි විවේකයෙන් උපන් ප්‍රීතියම සැපකොට ඇති, පළමුවෙනි ධ්‍යාන කුසල චිත්තය තමා තුළ ඉපදවීම් වසයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරේද ඇවැත්නී, යම් භික්ෂුනමක් මෙසේ දනී නම්, මෙසේ දකී නම් ඒ මහණහට ජීවයත් ශරීරයත් එකම හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීම්. ඇවැත්නි, යම් ඒ භික්ෂුවක් මෙසේ දනීද, මෙසේ දකීද ඔහුට ජීවයත් ශරීරයත් එකමයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුයයි ඒ මහණුන් දෙදෙන කීහ. ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එසේ වුවත් මම ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

32. "ඇවැත්නි, නැවතද භික්ෂු තෙමේ අරමුණට සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම යන මොවුන්ගේ සන්සිඳීමෙන් අද්ධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති දෙවැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කරයිද, ඇවැත්නි, යම් භික්ෂුනමක් මෙසේ දනී නම් මෙසේ දකී නම් ඒ මහණහට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ භික්ෂුනමක මෙසේ දනීද, මෙසේ දකීද, ඔහුට ජීවයත්, ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුයයි කීහ. ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එසේ වුවත් මම ජීවයත් ශරීරයත් එකය හෝ ජීවය අනෙකක, ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

33. "නැවතද ඇවැත්නි, ඒ භික්ෂු තෙමේ ප්‍රීතියෙහි නොඇල්මෙන් මැදහත් බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (උපේක්ෂා) සැප දුක් දෙකට මැදහත් විඳීම ඇත්තේය, සිහි ඇත්තේය, සැපයෙන් විසීම ඇත්තේයයි ආර්යයෝ කියත්ද, ඒ

තුන්වැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේද, ඇවැත්නි, යම් භික්ෂුනමක් මෙසේ දනී නම්, මෙසේ දකීනම්, ඒ මහණහට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ භික්ෂු නමක් මෙසේ දනීද, මෙසේ දකීද, ඔහුට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුයයි කීහ. ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එසේ වුවත් මම ජීවයත් ශරීරයත් එකය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

34. "නැවතද ඇවැත්නි, ඒ මහණතෙමේ සැප දුරු කිරීමෙන්ද, දුක් දුරු කිරීමෙන්ද පළමුකොටම සැප දුක් වේදනා නැතිව යාමෙන් දුක්ද නොවූ සැපද නොවූ, උපේක්ඛා-සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, හතරවෙනි ධ්‍යාන (කුසල) චිත්තයට පැමිණ වාසය කෙරේද, ඇවැත්නි, යම් භික්ෂු නමක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඒ මහණහට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ භික්ෂුනමක් මෙසේ දනීද, මෙසේ දකීද ඔහුට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුයයි කීහ. ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එසේ වුවත් මම ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

35. "ඥාන දර්ශනය පිණිස විදර්ශනා චිත්තය එළවා තබාද ඥානදර්ශනයට සිත නමාද, ඇවැත්නි, යම් භික්ෂු නමක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහුට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ භික්ෂුනමක් මෙසේ දනීද, මෙසේ දකීද, එබඳු ඥාන දර්ශනයක් ඇති මහණකුට ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතු නොවේයයි කීහ.

ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එසේවූ නමුත් මම ජීවයත් ශරීරයත් එකමය හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

36. "ඇවැත්නි, මෙයින් පසු කෙලෙස් නැතිකිරීම සඳහා කළයුත්තක් නැතැයි දනීද, යම් භික්ෂු නමක් මෙසේ දනීද, මෙසේ දකීද, එබඳුවූ විදර්ශනා ඥානයෙන් (සත්‍යය ඇතිසැටි දැකීම) දැක්කාවූ රහත් භික්ෂු නමට ජීවයත් ශරීරයත් එකමය, ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ භික්ෂුනමක් මෙසේ දනීද, මෙසේ දකීද, ඒ රහත් භික්ෂුනමට ජීවයත් ශරීරයත් එකමයයි හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට නොවටීයයි කීහ. ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එසේවූ නමුත් මම ජීවයත් ශරීරයත් එකයයි හෝ ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි."

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රධර්මය දේශනා කළසේක. මෙයින් සතුටු සිත් ඇත්තාවූ ඒ පැවිද්දෝ දෙදෙන භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්තේය.

**හත්වෙනිවූ ජාලිය සූත්‍රය නිමියේය.**

## 8. කස්සප සීහනාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ උජුඤ්ඤා නම් නුවර සමීපයෙහිවූ කණ්ණකත්ථල මිගදාය නම්වූ තැනක වාසය කළහ. එකල කාශ්‍යප නම්වූ නිර්වස්ත්‍ර මහණෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතුවූ සිහි කටයුතු කථාව අවසාන කර එකපැත්තකටවී සිටියේය. එකපැත්තකටවී සිටියාවූ නිර්වස්ත්‍ර පරිව්‍රාජක කාශ්‍යප තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය.

2. "පින්වත් ගෞතමය, ශ්‍රමණ ගෞතම තෙමේ සියලු තපස්කම්වලට ගරහයි, නිර්වස්ත්‍රව හිඳීම, කෑම කා අත ලෙවකෑම ආදීවූ කටුක ජීවිත ඇති සියලු තපසුන්ට එකාන්තයෙන් අවමන් කරයි, චෝදනා කරයි, යන මේ කාරණය මා විසින් අසනලදී. පින්වත් ගෞතම මහණතෙමේ සියලු තපස්කම්වලට ගරහයි. නිර්වස්ත්‍ර හිඳීම අත ලෙවකෑම ආදීවූ කටුක ජීවිත ඇති සියළු තපසුන්ට ඒ කාන්තයෙන් හෙළාදකියි, අපවාද කෙරේයයි යම් ඒ කෙනෙක් මෙසේ කියත්ද, කිමෙක්ද ඔව්හු පින්වත් ගෞතමයන් විසින් කියන ලද්දක් කියන්නෝද? නැතහොත් පින්වත් ගෞතමයින්ට නැති නූපන් බොරු ගොතා කියා නින්දා වසයෙන් කියන්නෝද, පින්වත් ගෞතමයන් විසින් කියනලද කාරණයට අනුව කරුණු කියත්ද, නැතහොත් කරුණු සහිතව කියන අන්‍යයන්ගේ කීමකින් ඔබගේ කීම ගැරහිය යුතු කරුණකට සුලු වසයෙන්වත් නොපැමිණේද, අපි පින්වත් ගෞතමයන්ට බොරුවෙන් චොදනා කිරීමට නොකැමැත්තෝ වෙමු.

3. "කාශ්‍යපය, ශ්‍රමණ ගෞතම තෙමේ සියලු තපස්කම්වලට ගරහයි, කටුක ජීවිත ගතකරණ සියලු තපසුන්ට ඒකාන්තයෙන් අවමන් කෙරේයයි යම් ඒ කෙනෙක් කියත්ද, ඔව්හු මා කීවක් කියන්නෝ නොවෙත්. ඔව්හු මට නැති නූපන් බොරුවෙන් නින්දා කොට කියන්නෝ වෙත්. කාශ්‍යපය, මම මේ ලෝකයෙහි කටුක ජීවිතයක් ගතකරණ ඇතැම් තපසෙකු මරණින් මතු නරකයෙහි උපන්නා, මිනිස් ඇස ඉක්ම පවත්නා පිරිසිදුවූ දිව්‍ය ඇසින් දකිමි. කාශ්‍යපය, මම මේ ලොකයෙහි කටුක ජීවිත ගත කරණ ඇතැම් තපසෙකු මරණින් මතු සැප ඇති සුගතියෙහි උපන්නා, මිනිස් ඇස ඉක්ම පවත්නාවූ පිරිසිදු දිව්‍ය ඇසින් දකිමි. කාශ්‍යපය, මම මේ ලොකයෙහි අඩුවූ දුක් ඇතිව වාසය කරන ඇතැම් තපසෙකු මරණින් මතු නිරයෙහි උපන්නා, මිනිස් ඇස ඉක්ම පවත්නාවූ පිරිසිදු දිව්‍ය ඇසින් දකිමි. කාශ්‍යපය, මම මේ ලොකයෙහි අඩුවූ දුක් ඇතිව වාසයකරන ඇතැම් තාපසයෙකු මරණින් මත්තෙහි සැප ඇති සුගතියෙහි උපන්නා, මිනිස් ඇස ඉක්ම පවත්නා පිරිසිදු දිව්‍ය ඇසින් දකිමි. කාශ්‍යපය,

යම් බඳුවූ මම මෙසේ මේ තපසුන්ගේ මතු ජාතියෙන් මේ ජාතියට පැමිණීමද, දැන් මෙයින් යායුතු තැනද එයින් චුතවීමද, එයින් චුතවූවන්ගේ නැවත ඉපදීමද තත්වූ පරිද්දෙන් දනිම්ද, ඒ මම කුමට සියලු තපස්කම්වලට ගරහන්නෙම්ද, කටුක ජීවිතයක් ගතකරණ සියලු තපසුන්ට ඒ කාන්තයෙන් කුමට අවමන් කරන්නෙම්ද?

4. "කාශ්‍යපය, පණ්ඩිතවූ, දක්ෂවූ' අන්‍යයන් සමග කරණලද වාද ඇත්තාවූ තියුණු නුවණ ඇත්තාවූ තමන්ගේ නුවණින් අනුන්ගේ වැරදි ඇදහීම බිඳින්නෝයයි සිතාසිටින සමහර මහණ බමුණෝ ඇත්තාහ. සමහර කරුණුවලින් මාගේ ධර්මය ඔවුන්ගේ ධර්මයට සමවෙයි. සමහර කරුණුවලින් සමනොවෙයි. ඔව්හු සමහර ධර්ම යහපත්යයි කියත්ද අපිද ඒ සමහර ධර්ම යහපත්යයි කියමු. ඔව්හු සමහර ධර්ම යහපත් නොවේයයි කියත්ද, අපිද ඒ සමහර ධර්ම යහපත් නොවේයයි කියමු ඔව්හු සමහර ධර්ම යහපත්යයි කියත්ද අපි ඒ ධර්ම යහපත් නොවේයයි කියමු. ඔව්හු සමහර ධර්ම යහපත් නොවේයයි කියත්ද, අපි ඒ සමහර ධර්ම යහපත්යයි කියමු. අපි සමහර ධර්ම යහපත්යයි කියමුද, අනික් අයද ඒ සමහර ධර්ම යහපත්යයි කියත්. අපි සමහර ධර්ම යහපත් නොවේයයි කියමුද, අනික් අයද ඒ සමහර ධර්ම යහපත් නොවේයයි කියත් අපි යම් සමහර ධර්ම යහපත් නොවේයයි, කියමුද, අනික් අයද ඒ සමහර ධර්ම යහපත් යයි කියත්.

5. "මම ඔවුන් වෙත පැමිණ මෙසේ කියමි. 'කාශ්‍යපය, අපේ මේ කාරණයන්හි යමක් සම නොවේද, ඒ කරුණු තිබෙත්වා මේ කාරණයන්හි යමක් සමවේද, කාශ්‍යපය, මේ කාරණයන් පිළිබඳ ගුරුවරුන් හා ගුරුවරුන් ශ්‍රාවකයන් හා ශ්‍රාවකයන් යම් නුවණැති කෙනෙක් විමසන්නාහු පරීක්ෂා කරන්නාහු සසඳා බලන්නාහු මේ පින්වතුන්ගේ යම් ධර්ම කෙනෙක් අකුසල්ද අකුසල්යයි වෙන්කොට තබනලද්දාහුද, වරද සහිතද වරද සහිතයයි වෙන්කොට තබන ලද්දාහුද, සේවනය නොකොට යුතුද සේවනය නොකොට යුතුයයි වෙන්කොට තබන ලද්දාහුද,

නිදොස් අයට නුසුදුසුද නිදොස් අයට නුසුදුසුයයි වෙන්කොට තබන ලද්දාහුද, අපිරිසිදු ධර්මයෝද අපිරිසිදු ධර්මයෝයයි වෙන් කොට තබන ලද්දාහුද, කවරෙක් මේ ධර්මයන් දුරුකොට පවතීද, ශ්‍රමණ ගෞතමයෝ හෝ වේද්ද, අන්‍යවූ පින්වත් ගුරුවරයෝ හෝ වෙත්දැයි මෙසේ නුවණැත්තෝ ගුරුන් ගුරුන් හා, ගෝලයන් ගෝලයන් හා සමානකර බලන්නාහු කවරෙක් මේ ධර්ම සහමුලින් දුරුකොට පවතීද, ශ්‍රමණ ගෞතම හෝ වේද අන්‍යවූ පින්වත් ගුරුවරු හෝ වෙත්දැයි මෙසේ නුවණැත්තෝ ගුරුවරුන් හා ගුරුවරුන් ගෝලයන් හා ගෝලයන් විමසා බලන්නහුද?

**6.** "කාශ්‍යපය, ඒ කරුණු විමසා සසඳා බලන්නාවූ නුවණ ඇත්තෝ භවතුන්ගේ මේ යම් ධර්ම අකුසල්ද අකුසල්යයි වෙන් කොට තබන ලද්දාහුද, වරද සහිතද වරද සහිතයයි වෙන්කොට තබන ලද්දාහුද නිවැරදි අයට නුසුදුසුද නිවැරදි අයට නුසුදුසු යයි වෙන් කොට තබන ලද්දාහුද, අපිරිසිදු ධර්මය අපිරිසිදු ධර්මයයි වෙන් කොට තබන ලද්දාහුද, ඒ ධර්ම ගෞතම ශ්‍රමණ තෙමේ දුරුකොට පවතී. පින්වත් අන්‍ය ගුරුවරයෝ ස්වල්ප වශයෙන් දුරුකොට පවතිත්යයි මෙසේ කියන්නාහුය යන යම් කාරණයක් ඇද්ද මේ කාරණය ඇත්තේමය. කාශ්‍යපය, මෙසේ කරුණු විමසන්නාවූ නුවණැත්තෝ අපටම ඒ කාරණයෙහි බොහෝ සේ ප්‍රශංසා කරන්නෝය.

**7.** "කාශ්‍යපය, අනික් කාරණයක්ද ඇත. නුවණැත්තෝ ගුරුවරුන් හා ගුරුවරුන්ද ගෝලයන් හා ගෝලයන්ද විමසා බලත්වා.

"මේ භවතුන්ගේ යම් ධර්ම කුසල්ද කුසල්යයි වෙන්කොට තබන ලද්දාහුද, දොස් නැත්තේද, දොස් නැත්තේයයි, වෙන් කොට තබන ලද්දාහුද, සේවනය කටයුත්තේද, සේවනය කටයුත්තේයයි වෙන් කොට තබන ලද්දාහුද, නිවරද අයට සුදුසුය නිවරදි අයට සුදුසුයයි, වෙන්කොට තබන ලද්දාහුද පිරිසිදු ධර්මය පිරිසිදු ධර්මයයි වෙන්කොට තබන ලද්දාහුද, කවරෙක් මේ ධර්ම සම්පූර්ණයෙන් සමාදන්ව පවතීද, ශ්‍රමණ ගෞතමයෝ හෝ වෙත්ද පින්වත්වූ අන්‍ය ගුරුවරයෝ හෝ වෙත් දැයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. "කාශ්‍යපය, මෙසේ විමසා බලන්නාවූ ඒ නුවණැත්තෝ මේ පින්වතුන්ගේ යම් ධර්මයක් කුසල්ද, කුසල්යයි වෙන්කොට තබන ලද්දාහුද, දොස් නැත්තේද දොස් නැත්තේයයි වෙන්කොට තබන ලද්දාහුද, සේවනය කටයුත්තේද සේවනය කටයුත්තේයයි වෙන් කොට තබන ලද්දාහුද, නිදොස් අයට සුදුසුද නිදොස් අයට සුදුසුයයි වෙන් කොට තබන ලද්දාහුද, පිරිසිදුද පිරිසිදු ධර්මයෝයයි වෙන් කොට තබන ලද්දාහුද ශ්‍රමණ ගෞතම තෙමේ මේ ධර්ම සම්පූර්ණයෙන් සමාදන්ව පවතී. පින්වත්වූ අන්‍ය ගුරුවරයෝ ස්වල්ප කොටසක් සමාදන්ව පවතීයයි මෙසේ කියන්නාහුය. යන යම් කාරණයෙක් ඇත්ද, මේ කාරණය ඇත්තේමය. කාශ්‍යපය, මෙසේ මේ කාරණයෙහි කරුණු විමසන නුවණැත්තෝ අපටම බොහෝසේ ප්‍රසංශා කරන්නෝය.

9. "කාශ්‍යපය, අනික් කරුණක්ද ඇත. නුවණැත්තෝ මේ භවතුන්ගේ යම් ධර්මයක් අකුසල්ද, අකුසල්යයි වෙන් කොට තබන ලද්දාහුද, වරද සහිතද වරද සහිතයයි වෙන් කොට තබන ලද්දාහුද සේවනය නොකොට යුත්තේද සේවනය නොකොට යුත්තේයයි වෙන්කොට තබන ලද්දාහුද, නිවැරදි අයට නුසුදුසුය නිවැරදි අයට නුසුදුසුයයි වෙන්කොට තබන ලද්දාහුද, අපිරිසිදුය අපිරිසිදුයයි වෙන් කොට තබන ලද්දාහුද, කවරෙක් මේ ධර්මයන් සම්පූර්ණයෙන් දුරුකොට පවත්නේද ශ්‍රමණ ගෞතමයන්ගේ ගෝලයෝ හෝ වෙද්ද, අන්‍ය ගුරුවරයන්ගේ ගෝලයෝ හෝ වෙත්දැයි ගුරුවරුන් ගුරුවරුන් හා සමගද ගෝලයන් ගෝලයන් හා සමගද සසඳා කරුණු විමසා බලත්වා.

10. "කාශ්‍යපය, කරුණු විමසා බලන නුවණැත්තෝ මේ පින්වතුන්ගේ යම් ධර්මයක් අකුසල්ද අකුසල්යයි වෙන්කොට තබන ලද්දාහුද, වරද සහිතද වරද සහිතයයි වෙන්කොට තබන ලද්දාහුද, සේවනය නොකොට යුතුද සේවනය නොකොට යුතුයයි වෙන්කොට තබන ලද්දාහුද, නිදොස් අයට නුසුදුසුද නිදොස් අයට නුසුදුසුයයි, වෙන්කොට තබන ලද්දාහුද, අපිරිසිදුය අපිරිසිදුයයි වෙන්කොට තබන ලද්දාහුද, ශ්‍රමණ ගෞතමයන්ගේ ගෝලයෝ මේ ධර්මයන් සම්පූර්ණයෙන් දුරුකොට පවතී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පින්වත්වූ අන්‍ය ගුරුවරයන්ගේ ගෝලයෝ ස්වල්ප කොටසක් දුරුකොට පවතීය යන කාරණය ඇත්තේමය. කාශ්‍යපය, මෙසේ මේ කාරණයෙහි කරුණු විමසන නුවණැත්තෝ අපටම බොහෝසේ ප්‍රශංසා කරන්නාහුය.

11. "කාශ්‍යපය, අනික් කරුණක්ද ඇත. මේ භවතුන්ගේ යම් ධර්මයක් කුසල්ද කුසල්යයි වෙන්කොට තබන ලද්දාහුද, දොස් නැත්තේද දොස්නැත්තේයයි වෙන්කර තබන ලද්දාහුද, සේවනය කටයුත්තේය, සේවනය කටයුත්තේයයි වෙන් කොට තබනලද්දාහුද, නිදොස් අයට සුදුසුය. නිදොස් අයට සුදුසුයයි වෙන්කොට තබන ලද්දාහුද, පිරිසිදු ධර්මයෝය. පිරිසිදු ධර්මයෝයයි වෙන්කොට තබන ලද්දාහුද, කවරෙක් මේ ධර්මයන් සම්පූර්ණයෙන් සමාදන්ව පවතිද්ද, ශ්‍රමණ ගෞතමයන්ගේ ගෝලයෝ හෝ වෙද්ද, පින්වත්වූ අන්‍ය ගුරුවරයන්ගේ ගෝලයෝ හෝ වෙද්ද, මෙසේ ගුරුවරුන් ගුරුවරුන් හා ද ගෝලයන් ගෝලයන් හා ද සසඳා කරුණු විමසා බලත්වා.

12. "කාශ්‍යපය, කරුණු විමසා බලන නුවණැත්තෝ 'මේ පින්වතුන්ගේ යම් ධර්මයක් කුසල්ද කුසල්යයි වෙන්කොට තබන ලද්දාහුද, දොස් නැත්තේද දොස් නැත්තේයයි, වෙන්කොට තබන ලද්දාහුද, සේවනය කටයුත්තේද, සේවනය කටයුත්තේ යයි වෙන්කොට තබන ලද්දාහුද, නිදොස් අයට සුදුසුද නිදොස් අයට සුදුසුයයි වෙන්කොට තබන ලද්දාහුද, පිරිසිදුද පිරිසිදු ධර්මයයි වෙන්කොට තබන ලද්දාහුද, ශ්‍රමණ ගෞතමයන්ගේ ගෝලයෝ මේ ධර්මයන් සම්පූර්ණයෙන් සමාදන්ව පවතිත්. පින්වත්වූ අන්‍ය ගුරුවරයන්ගේ ගෝලයෝ ස්වල්ප කොටසක් සමාදන්ව පවතිත්යයි මෙසේ කියන්නාහුය යන මේ කාරණයක් ඇද්ද මේ කාරණය සැබෑවේමය. කාශ්‍යපය මෙසේ මේ කාරණයෙහි නුවණැත්තෝ අපටම බොහෝසේ ප්‍රශංසා කරන්නාහුය.

13. "කාශ්‍යපය, යම් පිළිපැදීමක් හේතුකොටගෙන ශ්‍රමණ ගෞතමයෝ කියයුතු කල් සලකා කියන්නෝය, සත්‍යය

කියන්නෝය; අර්ථ යුක්තව කියන්නෝය, ධර්ම යුක්තව කියන්නෝය, (විනය) යහපත් හැසිරීමක් කියන්නෝයයි යම්සේ තමන්ම දන්නේද, තමන්ම දකින්නේද, එබඳු උතුම් මාර්ගයක් ඇත්තේය. එබඳු (පූර්වභාග ප්‍රතිපදාවක්) කලින් පුරුදු කළයුතු පිළිපැදීමක් ඇත්තේය.

"කාශ්‍යපය, යම් පිළිපැදීමක් හේතුකොටගෙන ශ්‍රමණ ගෞතම තෙමේ කියයුතු කල් දැන කියන්නේය, සත්‍යය කියන්නේය, අර්ථ යුක්තව කියන්නේය, ධර්ම යුක්තව කියන්නේය, (විනය) යහපත් හැසිරීමෙන් යුක්තව කියන්නේයයි, යම්සේ තමන්ම දන්නේද, තමන්ම දකින්නේද, එබඳු උතුම් මාර්ගය කවරේද, එබඳු (පූර්වභාග ප්‍රතිපදාව) කලින් පුරුදු කළයුතු පිළිපැදීම කවරේද, මේ උතුම් කරුණු අටකින් යුත් (ආර්ය අෂ්ටාංගික) මාර්ගය වෙයි. ඒ කවරේද? හරි දැකීම, හරි කල්පනාව, හරි කථාව (වචනය) හරි ක්‍රියාව, හරි ජීවත්වීම හරි උත්සාහය, හරි සිහිකිරීම, හරි (සමාධිය) හිත එකඟ කරගැනීම වේ.

"කාශ්‍යපය, යම් පිළිපැදීමක් හේතුකොටගෙන ශ්‍රමණ ගෞතමයෝ කියයුතු කල් සලකා කියන්නේය, සත්‍යය කියන්නේය, අර්ථ යුක්තව කියන්නේය, ධර්ම යුක්තව කියන්නේය, (විනය) යහපත් හැසිරීම කියන්නේයයි යම්සේ තමන්ම දන්නේද, තමන්ම දකින්නේද මේ ඒ මාර්ගය වේ. මේ (පූර්වභාග ප්‍රතිපදාව) කලින් පුරුදු කළයුතු පිළිපැදීම වෙයි" කීසේක.

14. මෙසේ කීකල අචෙල කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට මේකාරණය කීයේය. "ආයුෂ්මත් ගෞතමය, සමහර මහණ බමුණන්ගේ මහණ ධර්ම අනුව වෙන්කරන ලද්දාවූද, බ්‍රාහ්මණ ධර්ම අනුව වෙන්කරන ලද්දාවූද තාපස කර්මයෝ වෙත් එනම්, නිර්වස්ත්‍රවූයේ වෙයි. පහකරනලද හොඳසිරිත් ඇත්තේ වෙයි, කෑම කා අත ලෙවින්නේ වෙයි. කෑමට කැඳවූ කල නොඑන්නේ වෙයි, සිටින්නට කීකල නොසිටින්නේ වෙයි, කාලයට පළමු ගෙණදුන් කෑම නොගනී, තමන් උදෙසා සෑදූ කෑම නොගණී,

ආරාධනා කොට දුන් කෑම නොගණී. සැලියේ කටින් ගෙනදෙන කෑම නොපිළිගණී. කූඩයේ කටින් ගෙන දෙන කෑම නොපිළිගණී. එළිපත්ත අතරෙහි සිට දෙන දේ, දණ්ඩක් අතර කොට දෙන දේ, මෝලක් අතරෙහි කොට දෙන දේ, නොගණී. කෑම කන්නාවූ දෙදෙනෙක් අතුරෙන් එක්කෙනෙක් නැගිට කෑම දෙන කල නොගණී. ගර්භනියගෙන්, කිරි පොවන්නියගෙන්, පුරුෂයෙකු අතරට පැමිණි ස්ත්‍රියගෙන් නොගණී. සම්මාදම් කොට පිසූ කල එයින් නොගණී. බල්ලෙකුට දීමට අදහස් කළ කෑම නොගණී. මැස්සන් වසාසිටි කෑමද, මස් මාංශ මත් පැන් මත්ද්‍රව්‍ය, නොපිළිගණී. කාඩි බීම නොකෙරෙයි. ඔහු එක් ගෙයකම කෑම ලැබ නවතින්නේ හෝ එක් පිඩකින් හෝ ගෙවල් දෙකක හෝ පිඩු දෙකකින් හෝ ගෙවල් හතක කෑම ලැබ නවතින්නේ හෝ පිඩුහතකින් ජීවත්වන්නේ හෝ වෙයි, පිණ්ඩ පාත්‍ර බතින් ද යැපෙයි, දත්ති නම් කුඩා පිණ්ඩ පාත්‍ර බතින්ද යැපෙයි. දත්ති නම් පාත්‍ර දෙකක බතින් යැපෙයි. දවසක් හැර දවසක් කෑම කයි දවස් දෙකක් හැර දවසක් කෑම කයි. දවස් හතක් හැර දවසක් කෑම කයි. මෙසේ මාස බාගයක් හැර දවසක් කෑම කයි. මෙබඳුවූ වාර බත් කෑමෙහි යෙදෙමින් ජීවත් වෙයි.

'ආයුෂ්මත් ගෞතමය, මේ ක්‍රියාවෝද මහණ බමුණන්ගේ මහණ ධර්ම අනුව වෙන්කරණ ලද්දාවූ බ්‍රාහ්මණ ධර්ම අනුව වෙන්කරන ලද්දාවූද තාපස කර්මයෝ වෙත්. නොපිසූ පලා කන්නේ හෝ වෙයි. බඩහමු නම් තණ ධාන්‍ය කන්නේ හෝ වෙයි. ඉබේ හටගත් ධාන්‍ය කන්නේ හෝ වෙයි. (හම් වැඩ කරන්නන් කපාදැමූ) සම් කැබලි කන්නේ හෝ වෙයි. මැලියම් කන්නේ හෝ වෙයි, කුඩු කන්නේ හෝ වෙයි. දඹුබත් කන්නේ හෝ වෙයි. (මුරුවට) පුනක්කු කන්නේ හෝ වෙයි. තණ කන්නේ හෝ වෙයි. ගොම කන්නේ හෝ වෙයි. කැලෑ මුල් ගෙඩි කෑම ඇත්තේ ඉබේ වැටුන ගෙඩි කෑමෙන් හෝ යැපෙයි.

"ආයුෂ්මත් ගෞතමය, මේ ක්‍රියාවෝද සමහර මහණ බමුණන්ගේ මහණ ධර්ම අනුව වෙන්කරන ලද්දාවූද, බ්‍රාහ්මණ ධර්ම අනුව වෙන් කරන ලද්දාවූද, තාපස කර්මයෝ වෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හණපතුරු රෙදිද දරයි, හණ පතුරු මිශ්‍ර රෙදිද දරයි, එරුතණ ආදියෙන් කළ රෙදිද දරයි, බිමලු රෙදි මාලුද දරයි, (රිටිසුඹුලු) ගස් පතුරුද දරයි, අඳුන් දිවිසම්ද දරයි, මැද පැලූ අඳුම් දිවිසම්ද දරයි, කුස වැහැරිද දරයි, නියඳ (හණ) වැහැරිද දරයි, ලෑලි වැහැරිද දරයි, ඉසකෙසින් කළ කම්බිලිද දරයි. අස් ලොමින් කළ කම්බිලිද දරයි, බකමූණු පිහාටුවලින් කළ ශරීරයේ යට කොටසේ ඇඳුම්ද දරයි, ඉසකෙස් රැවුල් ඉදිරීමෙහි යෙදුනේ ඉසකෙස් රැවුල් උදුරන්නේද වෙයි, ආසන ඉවත්කොට නැගිට සිටින්නේද වෙයි, උක්කුටිකව හිඳීමේ (ඇනතියාගන හිඳීම) වීර්යයෙහි යෙදුනේ වෙයි. කටු උඩ නිදාගන්නේ කටු උඩ හැසිරීම කරන්නේ වෙයි (පොරු) ලෑලිඋඩ නිදාගන්නේද වෙයි, කුඩා තාප්පය උඩ නිදාගන්නේද වෙයි, එකපැත්තකට හැරී නිදාගන්නේද වෙයි, දූවිලිදැලි දරන්නේද වෙයි. එළියේ වසන්නේද වෙයි, පළමුව, එලූ ආකාරයටම වෙනස් නොකොට ආසනයක ඉන්නේද වෙයි, අසුචි අනුභවයෙහි යෙදුනේ අසුචි අනුභව කරන්නේද වෙයි, ඇල්වතුර නොබීමෙහි යෙදුනේ ඇල්වතුර නොබොන්නේද වෙයි, උදය දවල් සහ සවස (පාප ප්‍රවාහය) පවු පාකර හරින්නේමැයි දියේ ගැලී වාසය කරයි” කීයේය.

**15.** “කාශ්‍යපය, ඉදින් නිර්වස්ත්‍ර වූයේ හෝ වේද, පහ කරණලදහොඳ සිරිත් ඇත්තේ වේද, කෑම කා අතලෙවින්නේ වේද, කැඳවූ කල නොඑන්නේ වෙයිද, සිටින්නට කීකල නොසිටින්නේ වෙයිද, කාලයට පළමු ගෙනා කෑම නොගනීද තමන් උදෙසා සෑදූකෑම නොගනීද, ආරාධනාකොට දුන්කෑම නොගනීද, සැලියේ කටින් ගෙන දෙන කෑම නොපිළි ගනීද, කුඩයේ කටින් ගෙනදෙන කෑම නොපිළිගනීද, එලිපත්ත අතරකොට දෙන දේ, දණ්ඩක අතරකොට දෙන දේ, මෝලක් අතරෙහි කොට දෙන දේ නොගනීද, කෑම කන්නාවූ දෙදෙනෙක් අතුරෙන් එක්කෙනෙක් නැගිට කෑම දෙන කල නොගනීද, ගර්භණියගෙන්, කිරි පොවන්නියගෙන් පුරුෂයෙකු අතරට පැමිණි ස්ත්‍රියගෙන් නොගනීද, සම්මාදම්කොට පිසූකල එයින්

නොගනීද; බල්ලෙකුට දීමට අදහස් කළ කෑම නොගනීද, මැස්සන් වැහීසිටි කෑමද මස්මාංශ, මත්පැන් (මත්ද්‍රව්‍ය) නොගනීද, කාඩිබීම් නොකෙරෙයිද ඔහු එක්ගෙයකම කෑම ලැබ නවතින්නේ හෝ එක් පිඩකින් හෝ ගෙවල් දෙකක හෝ පිඩු දෙකක් හෝ ලැබ නවතින්නේ වෙයි. ගෙවල් හතක කෑම ලැබ නවතින්නේ හෝ පිඩු හතකින් ජීවත්වන්නේ හෝ වෙයි. පිණ්ඩපාත්‍ර හතකින්ද යැපෙයි. දත්ති නම් කුඩා පිණ්ඩ පාත්‍රයක බතින්ද යැපෙයි. දත්ති නම් පාත්‍ර දෙකක බතින්ද යැපෙයි දවසක් හැර දවසක් කෑම කයි. දවස් දෙකක් හැර දවසක් කෑම කයි. දවස් හතක් හැර දවසක් කෑම කයි. මෙසේ මාස බාගයක් හැර දවසකවූ කෑම කයි. මෙබඳුවූ වාර බත් කෑමෙහි යෙදුනේ වාසය කෙරේද. ඔහු විසින් මේ ශීල සම්පත්තියද මේ සමාධි (සිතේ එකඟකම) සම්පත්තියද, මේ ඥාණ සම්පත්තියද නොවඩන ලද්දී අවබෝධ නොකරණලද්දී වෙයි. කුමක් වේද? ඔහු මහණකමින් දුරුවූයේම වෙයි. බ්‍රාහ්මණකමින් දුරු වූයේම වෙයි. කාශ්‍යපය, යම් ගෙයකින් භික්ෂුතෙම වෛර නැතිවූ දොම්නස් නැතිවූ මෛත්‍රී සිත වඩාද, කාම ආශාව ආදී (ආශ්‍රව) කෙලෙසුන් නැතිවූ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද මේ ආත්ම භාවයෙහිම තමන් විශෙෂ ඥානයෙන් දැන අවබෝධ කොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, මේ භික්ෂුතෙම මේ කාරණයෙන් ‘මහණ’ යයිද ‘බ්‍රාහ්මණ’යයිද කියනු ලැබේ.

“කාශ්‍යපය, ඉදින් නොපිසූ පලා කන්නේ හෝ වේද, බඩහමු (නම් තණ ධාන්‍ය) කන්නේ හෝ වෙයි. ඉබේ හටගත් ධාන්‍ය කන්නේ හෝ වෙයි. (හම් වැඩ කරන්නෝ කපාදැමූ) හම්කැබලි කන්නේ හෝ වෙයි. මැලියම් කන්නේ හෝ වෙයි. කුඩු කන්නේ හෝ වෙයි. (මුරුවට) පුනක්කු කන්නේ හෝ වෙයි. තණ කන්නේ හෝ වෙයි. ගොම කන්නේ හෝ වෙයි. කැලෑ මුල් ගෙඩි කෑම ඇත්තේ ඉබේ වැටුණ ගෙඩි කෑමෙන් යැපේද, ඔහු විසින් මේ ශීල සම්පත්තියද, මේ චිත්ත සම්පත්තියද, මේ ප්‍රඥා සම්පත්තියද, නොවඩන ලද්දී අවබෝධ නොකරණ ලද්දී වෙයි. කුමක් වේද? ඔහු මහණකමින් දුරු වූයේම වෙයි. බ්‍රාහ්මණකමින් දුරු වූයේම

වෙයි. කාශ්‍යපය, යම් හෙයකින් භික්ෂුතෙම වෛර නැත්තාවූ දොම්නස් නැත්තාවූ මෛත්‍රී සිත් වඩාද, (ආශ්‍රව) ක්ලෙශයන් පහකිරීමෙන් කෙලෙස් නැතිවූ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද මේ ආත්මභාවයෙහිම ඔහු විශෙෂ ඥානයෙන් දැන අවබෝධකොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, මේ භික්ෂුතෙමේ "මහණය'යිද 'බ්‍රාහ්මණ'යයිද කියනු ලැබේ.

"කාශ්‍යපය, ඉදින් හණ පට්ටා රෙදි දරාද, හණ පට්ටා මිශ්‍ර රෙදි දරාද, එරුතණ ආදියෙන් කළ රෙදි දරයිද, බිම ලූ රෙදිමාලු දරාද, (රිටි සුඹුලු) ගස්පතුරු දරයිද, අඳුන් දිවිසම් දරයිද, මැදින් පැලූ අඳුන් දිවිසම් දරයිද, කුස වැහැරි දරයිද නියඳ (පන්) දරයිද; ලෑලි පතුරු දරයිද, ඉසකෙසින් කළ කම්බිලි දරයිද, අශ්ව ලොමින් කළ කම්බිලි දරයිද, බකමූණු පිහාටුවලින් කළ ශරීරයේ යට කොටසේ ඇඳුම් දරයිද, ඉසකෙස් රැවුල් ඉදිරීමෙහි යෙදුනේ ඉසකෙස් රැවුල් උදුරන්නේද වෙයි. ආසන ඉවත්කොට නැගිට සිටින්නේද වෙයි. ඇණතියාගෙන ඉඳීමේ වීර්යයෙහි යෙදුනේ ඇණතියාගෙන ඉඳීම කරන්නේද වෙයි. කටුඋඩ නිදාගන්නේ කටුඋඩ හැසිරීම කරන්නේ වෙයි. ලෑලිඋඩ නිදාගන්නේ වෙයි. කුඩා තාප්ප උඩ නිදාගන්නේද වෙයි. එක පැත්තට හැරී නිදාගන්නේද වෙයි. දූවිලි දැලි දරන්නේද වෙයි. එලියේ වසන්නේද වෙයි. පළමුව එලූ ආකාරයටම වෙනස් නොකොට ආසනයක ඉන්නේද වෙයි. අසූචි කෑමෙහි යෙදුනේ අසූචි කෑම කරන්නේද වෙයි, ඇල්වතුර නොබීමෙහි යෙදුනේ ඇල්වතුර නොබොන්නේ වෙයි. උදය දවල් සවස පාප සෝදා පා කර හැරීම කරන්නෙමැයි දියේ ගැලීමෙහි යෙදුනේ වාසය කෙරෙයි ඔහු විසින් මේ ශීල සම්පත්තියද, මේ චිත්ත සම්පත්තියද, මේ ප්‍රඥා සම්පත්තියද, නොවඩන ලද්දී අවබෝධ නොකරණ ලද්දී වෙයි. කුමක්වේද? ඔහු මහණ කටයුතු වලින් දුරුවූයේම වෙයි. බ්‍රාහ්මණ කටයුතු වලින් දුරුවූයේම වෙයි. කාශ්‍යපය, යම් හෙයකින් භික්ෂුතෙම වෛර නැතිවූ දොම්නස් නැති මෛත්‍රී සිත්වඩාද, (ආශ්‍රව) ක්ලෙශයන් පහකිරීමෙන් කෙලෙස් නැතිවූ අර්හත් ඵල සමාධියද, අර්හත් ඵල ප්‍රඥාවද ඉහාත්ම භාවයෙහිම

තමන්ම විශෙෂ ඥානයෙන් දැන අවබෝධකොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, මේ භික්ෂු තෙමෙ මේ කාරණයෙන් 'මහණ'යයිද, මේ කාරණයෙන්, 'බ්‍රාහ්මණ'යයිද කියනු ලැබේ."

**16.** "මෙසේ කී කල්හි අචෙල කාශ්‍යප, "පින්වත් ගෞතමය, මහණ පැවැත්ම අපහසු වෙයි. බ්‍රහ්මණ පැවැත්ම දුෂ්කර වෙයි" මෙසේ භාග්‍යවතුන් වහන්සේට කීවේය.

"කාශ්‍යපය, 'මහණ පැවැත්ම දුෂ්කරය' බ්‍රාහ්මණ පැවැත්ම දුෂ්කරය' යන යම් කථාව ලොකයෙහි ස්වභාව වෙයි. කාශ්‍යපය, ඉදින් නිර්වස්ත්‍ර වේද, අත්හරිනලද සිරිත් ඇත්තේ කෑම කා අතලොවින්නේ වේද, කෑමට කැඳවූකල නොඑන්නේ වෙයි. සිටින්ට කීකල නොසිටින්නේ වෙයි. කාලයට පළමු ගෙනා කෑම නොගනී. තමන් උදෙසා සෑදූ කෑම නොගනී. ආරාධනාකොට දුන් කෑම නොගනී. සැළියේ කටින් ගෙන දෙන කෑම නොපිළිගනී. කුඩයේ කටින් ගෙන දෙන කෑම නොපිළිගනී, එළිපත්ත අතර කොට දෙනදේ, දණ්ඩක් අතර කොට දෙනදේ, මෝලක් අතරෙහි කොට දෙනදේ නොගනී කෑම කන්නාවූ දෙදෙනෙක් අතුරෙන් එක්කෙනෙක් නැගිට කෑම දෙනකල නොගනී ගර්භණියගෙන්, කිරි පොවන්නියගෙන්, පුරුෂයෙකු අතරට පැමිණි ස්ත්‍රියගෙන් නොගනී. සම්මාදම්කොට පිසූ කල එයින් නොගනී. බල්ලෙකුට දීමට අදහස් කළ කෑම නොගනී. මැස්සන් වැහීසිටි කෑමද, මස් මාංශ, මත්පැන්, මත්ද්‍රව්‍ය නොගනී. කාඩි බීම නොකෙරෙයි. ඔහු එක් ගෙයකම කෑම ලැබ නවතින්නේ හෝ එක් පිඩකින් හෝ ගෙවල් දෙකක හෝ පිඩු දෙකක් හෝ ගෙවල් හතක කෑම ලැබ නවතින්නේ හෝ පිඩු හතකින් ජීවත් වන්නේ හෝ වෙයි. පිණ්ඩ පාත්‍ර හතකින්ද යැපෙයි. දත්ති නම් කුඩා පිණ්ඩ පාත්‍රයක බතින්ද යැපෙයි. දත්ති නම් පාත්‍ර දෙකක බතින්ද යැපෙයි. දවසක් හැර දවසක් කෑම කයි. දවස් දෙකක් හැර දවසක් කෑම කයි. දවස් හතක් හැර දවසක් කෑම කයි.

"මෙසේ මාස බාගයක් හැර දවසකවූ කෑම කයි. මෙබඳුවූ වාර බත් කෑමෙහි යෙදුනේ වාසය කෙරේද, කාශ්‍යපය, මේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අඩුවූ පැවතුම් ක්‍රමයෙන්ද, මේ තපස් පැවතුමෙන්ද, මේ මහණ පැවතුමෙන්ද, බ්‍රාහ්මණ පැවතුමෙන්ද, දුෂ්කර වූයේ, ඉතා දුෂ්කර වූයේ වන්නේද, එපමණකින්, ‘මහණ පැවතුම් දුෂ්කරය.’ ‘බ්‍රාහ්මණ පැවතුම දුෂ්කරය’ යන මේ වචනය කීමට සුදුසු නොවේ.

“ගෘහපතියෙකු (පවුල් ප්‍රධානියෙකු) හෝ ගෘහපති පුත්‍රයෙකු විසින් හෝ යටත් පිරිසෙයින් දියඅදින දාසියක් විසින් හෝ ‘මම හරනලද සිරිත් ඇත්තේ කෑම කා අතලොවින්නාවූ නිර්වස්ත්‍ර කෙනෙක් වෙමි. කැඳවූකල නොඑන්නේ වෙමි සිටින්ට කී කල නොසිටින්නේ වෙමි. කාලයට පළමු ගෙනා කෑම නොගනිමි. තමන් උදෙසා සැදූ කෑම නොගනිමි. ආරාධනා කොට දුන් කෑම නොගනිමි. සැළියේ කටින් ගෙනදෙන කෑම නොපිළිගනිමි. කූඩයේ කටින් ගෙන දෙන කෑම නොපිළිගනිමි. එළිපත්ත අතරකොට දෙන දේ, දණ්ඩක් අතරකොට දෙනදේ මෝලක් අතරෙහිකොට දෙනදේ නොගනිමි. කෑම කන්නාවූ දෙදෙනෙක් අතුරෙන් එක්කෙනෙක් නැගිට කෑම දෙන කල නොගනිමි. ගර්භණියගෙන්, කිරි පොවන්නියගෙන්, පුරුෂයෙකු අතරට පැමිණි ස්ත්‍රියගෙන් නොගනිමි. සම්මාදම් කොට පිසූ කල එයින් නොගනිමි බල්ලෙකුට දීමට අදහස් කළ කෑම නොගනිමි, මැස්සන් වැහීසිටි කෑමද, මස් මාංශ මත්පැන්, මත්ද්‍රව්‍ය නොගනිමි. කාඩි බීම නොකරමි. එක් ගෙයකම කෑම ලැබ නවතින්නේ හෝ එක් පිඩකින් හෝ ගෙවල් දෙකක හෝ පිඩු දෙකකින් හෝ ගෙවල් හතක කෑම ලැබ නවතින්නේ හෝ පිඩුහතකින් ජීවත් වන්නේ හෝ වෙමි. පිණ්ඩ පාත්‍ර හතකින් ද යැපෙමි, දත්ති නම් කුඩා පිණ්ඩ පාත්‍රයක බතින්ද යැපෙමි, දත්ති නම් පාත්‍ර දෙකක බතින් යැපෙමි. දවසක් හැර දවසක් කෑම කමි. දවස් දෙකක් හැර දවසක් කෑම කමි.

“මෙසේ මාස බාගයක් හැර දවසක්වූ කෑම කමි. මෙබඳුවූ වාරබත් කෑමෙහි යෙදුනේ වාසය කරමි”යි කියා ඔවුන් විසින් මේ මහණ පැවතුම් හෝ බ්‍රාහ්මණ පැවතුම් හෝ කරණු හැකිද වන්නේය. කාශ්‍යපය, යම් හෙයකින් මේ අඩුවූ පැවතුම් ක්‍රමයෙන්

තොරවම මේ තපස් පැවතුම් වලින් තොරව මහණ පැවතුම් හෝ බ්‍රාහ්මණ පැවතුම් දුෂ්කර වූයේ ඉතා දුෂ්කර වූයේ වේ නම්, එහෙයින් ‘මහණ පැවතුම් දුෂ්කරය.’ ‘බ්‍රාහ්මණ පැවතුම් දුෂ්කරය’යි මේ වචන කීමට සුදුසු වෙයි. කාශ්‍යපය, යම් හෙයකින් භික්ෂු තෙම වෛෂ (වෛර) නැතිවූ දොම්නස් නැතිවූ මෛත්‍රී සිත් වඩාද, කෙලෙස් පහ කිරීමෙන් කෙලෙස් නැති සමාධියද, ප්‍රඥාවද, මේ ආත්මභාවයෙහිම ඔහු උසස් ඥානයෙන් දැන, අවබොධකොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය මේ භික්ෂුතෙම මේ කාරණයෙන් ‘මහණ’ යයිද ‘බ්‍රාහ්මණ’යයිද කියනු ලැබේ.

"කාශ්‍යපය, ඉඳින් නොපිසූ පලා කන්නේ හෝ බඩහමු (නම්වූ තණ ධාන්‍ය) කන්නේ හෝ ඉබේ හටගත් ධාන්‍ය කන්නේ හෝ වෙයි. (හම්වැඩ කරන්නෝ කපා දැමූ) සම්කැබලි කන්නේ හෝ කුඩු කන්නේ හෝ වෙයි. (මුරුවට) පුනක්කු කන්නේ හෝ වෙයි. තණ කන්නේ හෝ වෙයි. ගොම කන්නේ හෝ වෙයි. කැලෑ මුල් ගෙඩි කෑම ඇත්තේ ඉබේ වැටුන ගෙඩි කෑමෙන් යැපේද, කාශ්‍යපය, මේ අඩුවූ පැවතුම් ක්‍රමයෙන්ද, මේ තපස් පැවතුමෙන්ද, මහණ පැවතුම හෝ බ්‍රාහ්මණ පැවතුම් අමාරු වූයේ ඉතා අමාරු වූයේ වන්නේද, එපමණකින් මහණ පැවතුම අමාරුය, බ්‍රාහ්මණ පැවතුම අමාරුයයි මේ වචන කීමට සුදුසු නොවේ.

"එසේ නම්, මම නොපිසූ පලා කන්නේ හෝ බඩහමු (නම් තණ ධාන්‍ය) කන්නේ හෝ ඉබේ හටගත් ධාන්‍ය කන්නේ හෝ වෙයි. (හම්වැඩ කරන්නෝ කපා දැමූ) සම්කැබලි කන්නේ හෝ කුඩු කන්නේ හෝ වෙමි. (මුරුවට) පුනක්කු කන්නේ හෝ වෙමි. තණ කන්නේ හෝ වෙමි, ගොම කන්නේ හෝ වෙමි. කැලෑ මුල් ගෙඩි කෑම ඇත්තේ ඉබේ වැටුන ගෙඩි කෑමෙන් යැපෙමි’ කියා (ගෘහපතියෙකු) පවුල් ප්‍රධානියෙකු විසින් හෝ ගෘහපති පුත්‍රයෙකු විසින් හෝ යටත්පිරිසයෙන් දිය අදින දාසියක විසින්ද මේ තපස් පැවතුම කරණු හැකි වන්නේය,

"කාශ්‍යපය, යම් හෙයකින් මේ අඩුවූ පැවතුම් ක්‍රමයෙන් තොරවම මේ තපස් පැවතුමෙන් තොරවම මහණ පැවතුම හෝ බ්‍රාහ්මණ පැවතුම අමාරුවූයේ ඉතා අමාරුවූයේ නම් එහෙයින් 'මහණ පැවතුම අමාරුය, බ්‍රාහ්මණ පැවතුම අමාරුය'යි මේ වචන කීමට සුදුසු වෙයි. කාශ්‍යපය, යම් හෙයකින් භික්ෂුතෙම වෛෂ (වෛර) නැතිවූ දොම්නස් නැතිවූ මෛත්‍රීසිත් වඩාද, කෙලෙස් පහකිරීමෙන් කෙලෙස් නැතිවූ සමාධියද, ප්‍රඥාවද, මේ ආත්මභාවයෙහිම ඔහු උසස් ඥානයෙන් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, මේ භික්ෂු තෙම ශ්‍රමණයයිද, බ්‍රාහ්මණයයිද කියනු ලැබේ.

"කාශ්‍යපය, ඉදින් හණ පට්ටා රෙදි දරාද, හණ පට්ටා මිශ්‍ර රෙදි දරාද, එරුතණ ආදියෙන් කළ රෙදි දරාද, බිම ලූ රෙදිමාලු දරාද, ගස්පතුරු දරාද, අඳුන් දිවිසම් දරාද, මැදින් පැලූ අඳුන් දිවිසම් දරාද, කුස පට්ටා දරයිද නියඟ (හණ) පට්ටා දරයිද, ලෑලි පටි දරයිද, ඉසකෙසින් කළ කම්බිලි දරයිද, අශ්ව ලොමින් කළ කම්බිලි දරයිද, බකමූණු පිහාටුවලින් කළ ශරීරයේ යට කොටසේ ඇඳුම් දරයිද, ඉසකෙස් රැවුල් ඉදිරීමෙහි යෙදුනේ ඉසකෙස් රැවුල් උදුරන්නේදවෙයි. ආසන ඉවත්කර නැගිට සිටින්නේද, ඇණතියාගෙන ඉඳීමේ වීර්යයෙහි යෙදුනේ ඇණතියාගෙන ඉඳීම කරන්නේද වෙයි කටුඋඩ නිදාගන්නේ කටුඋඩ හැසිරීම කරන්නේ වෙයි. ලෑලි උඩ නිදාගන්නේ වෙයි. කුඩා තාප්ප උඩ නිදාගන්නේ වෙයි. දූවිලි දැලි දරන්නේද වෙයි එලියේ වසන්නේද වෙයි. පළමුව එලූ ආකාරයටම වෙනස් නොකොට ආසනයක ඉන්නේ වෙයි. අසුචි කෑමෙහි යෙදුනේ අසූචි කෑම කරන්නේද වෙයි, ඇල්වතුර නොබීමෙහි යෙදුනේ ඇල්වතුර නොබීම ඇත්තේද වෙයි. උදය දවල් සවස පාප සෝදා පාකරන්නෙමියි දියේ ගැලීමෙහි යෙදුනේ වාසය කෙරේද, කාශ්‍යපය, මේ අඩුවූ පැවැත්මෙන්, මේ තපස් පැවැත්මෙන්, මහණ පැවැත්ම හෝ බ්‍රාහ්මණ පැවැත්ම හෝ අමාරු වූයේ ඉතා අමාරු වූයේද, එහෙයින් 'මහණ පැවැත්ම අමාරුය, බ්‍රාහ්මණ පැවැත්ම අමාරුය'යි මේ වචන කීමට සුදුසු නොවන්නේය.

"එසේනම් මම හණ වැරහැලි රෙදිද දරමි, හණ වැරහැලි මිශ්‍ර රෙදිද දරමි, එරුතණ ආදියෙන් කළරෙදිද දරමි, බිම් ලූ රෙදිමාලුද දරමි, ගස්පතුරුද දරමි, අඳුන් දිවිසම්ද දරමි. පැලූ අඳුන් දිවි සම්ද දරමි, කුස වැහැරිද දරමි, නියද (පන්) වැහැරිද දරමි, පෝරු වැහැරිද දරමි ඉසකෙසින් කළ කම්බිලිද දරමි, අශ්ව ලොමින් කළ කම්බිලිද දරමි. බකමූණු පිහාටුවලින් කළ ශරීරයේ යට කොටසේ ඇඳුම්ද දරමි, ඉසකෙස් රැවුල් ඉදිරීමෙහි යෙදුනේ ඉසකෙස් රැවුල් උදුරන්නේද වෙමි, ආසන ඉවත්කොට නැගිට සිටිමි, ඇණතියාගෙන ඉඳීමේ වීර්යයෙහි යෙදී ඇණතියාගෙන ඉඳීම කරමි, කටු උඩ නිදාගන්නේ කටු උඩ හැසිරීම කරමි. ලෑලි උඩ නිදාගනිමි, කුඩා තාප්ප උඩ නිදාගනිමි. දූවිලි දැලි දරන්නෙමි, එලියේ වසන්නේද වෙමි, පළමුව එලූ ආකාරයටම වෙනස් නොවී ආසනයක ඉන්නේද වෙමි. අසුචි කෑමෙහි යෙදුනේ අසුචිකෑම කරන්නේද වෙමි, ඇල්වතුර නොබීමෙහි යෙදුනේ ඇල්වතුර නොබීම ඇත්තේද වෙමි, උදය දවල් සවස පාප සෝදා පාකරන්නෙමැයි දියේ ගැලීමෙහි යෙදෙමින් වාසය කෙරෙමි'යි කියා (ගෘහපතියෙකු) පවුල් ප්‍රධානියෙකු විසින් හෝ ගෘහපති පුත්‍රයෙකු විසින් හෝ යටත් පිරිසයෙන් දියඅදින දාසියක විසින්ද මේ මහණ පැවතුම කරුණු හැකි වන්නේය.

"කාශ්‍යපය යම් කරුණකින් මේ අඩුවූ පැවතුම් ක්‍රමයෙන් තොරවම මේ තපස් පැවතුමෙන් තොරව මහණ පැවතුම හෝ බ්‍රාහ්මණ පැවතුම අපහසු වූයේ ඉතා අපහසු වූයේ වේ. නම් එහෙයින් 'මහණ පැවතුම අපහසුය, බ්‍රාහ්මණ පැවතුම අපහසුය'යි මේ වචන කීමට සුදුසු වෙයි. කාශ්‍යපය, යම් කරුණකින් භික්ෂුතෙම වෛෂ (වෛර) නැතිවූ දොම්නස් නැතිවූ මෛත්‍රී සිත් වඩාද, කෙලෙස් පහකිරීමෙන් කෙලෙස් නැතිවූ සමාධියද, ප්‍රඥාවද, මේ ආත්ම භාවයෙහි තමන්ගේම උසස් ඥානයෙන් අවබෝධකොට දැන ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, මේ භික්ෂුතෙම 'මහණයයිද බ්‍රාහ්මණය'යිද කියනු ලැබේ.

17. මෙසේ කීකල අචෙල කාශ්‍යප,"පින්වත් ගෞතමය, මහණතෙම දුකසේ දැනගත යුතු වෙයි, බ්‍රාහ්මණ තෙම දුකසේ දැනගත යුතු වේය'යි, භාග්‍යවතුන් වහන්සේට මේ වචන කීයේය.

"කාශ්‍යපය, මහණතෙම දුකසේ දැනගත යුතුය, බ්‍රාහ්මණ තෙම දුකසේ දැනගත යුතුයයි මේ කථා ලොකයෙහි ව්‍යවහාර කථාවෙයි. කාශ්‍යපය, ඉදින්, නිර්වස්ත්‍ර චේද, අත්හරිනලද සිරිත් ඇත්තේ කෑම කා අතලෙවින්නේද, කැඳවූ කල නොඑන්නේ වෙයි, සිටින්ට කීකල නොසිටින්නේ වෙයි. කාලයට පළමු ගෙනා කෑම නොගණී, තමන් උදෙසා සෑදූ කෑම නොගණී, ආරාධනාකොට දුන් කෑම නොගණී, සැළියේ කටින් ගෙන දෙන කෑම නොපිළිගණී, එළිපත්ත අතරකොට දෙන, දේ දණ්ඩක් අතරකොට දෙන දේ, මෝලක් අතර කොට දෙන දේ නොගණී, කෑම කන්නාවූ දෙදෙනෙක් අතුරෙන් එක්කෙනෙක් නැගිට කෑම දෙන කල නොගණී, ගර්භණීයගෙන්, කිරි පොවන්නියගෙන් පුරුෂයෙකු අතරට පැමිණි ස්ත්‍රීයගෙන් නොගනී, සම්මාදම් කොට පිසූ කල එයින් නොගනී. බල්ලෙකුට දීමට අදහස් කළ කෑම නොගනී. මැස්සන් වැහීසිටි කෑමද, මස් මාංස, මත්පැන්, මත් ද්‍රව්‍ය නොගනී. කාඩි බීම නොකෙරෙයි. ඔහු එක් ගෙයකම කෑම ලැබ නවතින්නේ හෝ එක් පිඩකින් හෝ ගෙවල් දෙකක හෝ පිඩු දෙකකින් හෝ ගෙවල් හතක කෑම ලැබ නවතින්නේ හෝ පිඩු දෙකකින් ජීවත් වෙන්නේ හෝ වෙයි. පිණ්ඩ පාත්‍ර හතකින්ද යැපෙයි. දත්ති නම් කුඩා පිණ්ඩ පාත්‍රයක බතින්ද යැපෙයි. දත්ති නම් පාත්‍ර දෙකක බතින්ද යැපෙයි. දවසක් හැර දවසක් කෑමකයි. දවස් දෙකක් හැර දවසක් කෑම කයි. දවස් හතරක් හැර දවසක් කෑම කයි. මෙසේ මාස බාගයක් හැර දවසක් කෑම කයි. මෙබඳුවූ වාර බත් කෑමෙහි යෙදෙමින් වාසය කෙරේද කාශ්‍යපය, මෙබඳුවූ පැවතුම් ක්‍රමයෙන්ද, මේ තපස් පැවතුමෙන්ද, මහණ තෙම හෝ බ්‍රා්මණ තෙම දුකසේ දැන ගතයුත්තේද, ඉතා දුකසේ දැනගත යුත්තේද එපමණකින් මහණ තෙම දුකසේ දැනගත යුත්තේය, බ්‍රාහ්මණතෙම දුකසේ දැනගත යුත්තේයයි, මේ වචන කීමට සුදුසු නොවෙයි.

"මොහු අත්හරින ලද සිරිත් ඇත්තේ, කෑම කා අත ලෙවින්නේ, කැඳවූ කල නොඑන්නේ වෙයි. සිටින්නට කී කල නොසිටින්නේ වෙයි. කාලයට පළමු ගෙණදුන් කෑම නොගණී. තමන් උදෙසා සෑදූ කෑම නොගණිනී, ආරාධනා කොට දුන් කෑම නොගනී. සැලියේ කටින් ගෙනදෙන කෑම නොපිළිගනී. එලිපත්ත අතර කොට දෙනදේ, දණ්ඩක් අතර කොට දෙනදේ, මෝලක් අතර කොට දෙනදේ, නොගනී. කෑම කන්නාවූ දෙදෙනෙක් අතුරෙන් එක්කෙනෙක් නැගිට කෑම දෙනකල නොගනී. ගර්භනියගෙන්, කිරි පොවන්නියගෙන්, පුරුෂයෙකු අතරට පැමිණි ස්ත්‍රියගෙන් නොගනී. සම්මාදම් කොට පිසූ කල එයින් නොගනී. බල්ලෙකුට දීමට අදහස් කළ කෑම නොගනී. මැස්සන් වැහීසිටි කෑමද, මස් මාංස, මත්පැන් මත්ද්‍රව්‍ය නොගනී. කාඩි බීම නොකෙරෙයි. ඔහු එක් ගෙයකම කෑම ලැබ නවතින්නේ හෝ එක් පිඩකින් හෝ ගෙවල් දෙකක හෝ පිඩු දෙකක හෝ ගෙවල් හතක කෑම ලැබ නවතින්නේ හෝ පිඩු හතකින් ජීවත් වන්නේ හෝ වෙයි. පිණ්ඩ පාත්‍ර හතකින්ද යැපෙයි, දත්ති නම් කුඩා පිණ්ඩ පාත්‍රයක බතින්ද යැපෙයි. දත්ති නම් පාත්‍ර දෙකක බතින්ද යැපෙයි. දවසක් හැර දවසක් කෑම කයි දවස් දෙකක් හැර දවසක් කෑම කයි. මෙසේ මාස බාගයක් හැර දවසක් කෑම කයි. මෙබඳුවූ වාරබත් කෑමෙහි යෙදෙමින් වාසය කෙරෙයි. නිර්වස්ත්‍ර වෙයි, කියා ඔහු පවුල් ප්‍රධානියෙකු විසින් හෝ පවුල් ප්‍රධානියෙකුගේ පුත්‍රයෙකු විසින් හෝ යටත්පිරිසෙයින් දිය අදින දාසියක් විසින්ද දැනගත හැකි වන්නේය. කාශ්‍යපය, යම් කරුණකින් මේ අඩුවූ පැවතුමෙන් තොරවම මේ තපස් පැවතුමෙන් තොරව මේ මහණ හෝ බ්‍රාහ්මණ හෝ දුකසේ දැනගත යුත්තේද ඉතා දුකසේ දැනගත යුත්තේද වේ නම් එහෙයින් 'මහණ තෙම දුකසේ දැනගත යුතුය. බ්‍රාහ්මණ තෙම දුකසේ දැනගත යුතුයයි' මේ වචන කීම සුදුසුයි.

"කාශ්‍යපය, යම් කරුණකින්, භික්ෂු තෙම වෛෂ (වෛර) නැතුව, දොම්නස් නැතිව මෛත්‍රී සිත් වඩාද, කෙළෙස් පහ කිරීමෙන් කෙලෙස් නැතිවූ සමාධියද, ප්‍රඥාවද, මේ ජීවිතයෙහිම

තමන් උසස් ඥානයෙන් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, මේ භික්ෂු තෙම 'මහණ' යයිද 'බ්‍රාහ්මණ' යයිද කියනු ලැබේ.

'කාශ්‍යපය, ඉදින් නොපිසූ පලා කන්නේ හෝ බඩ හමු (නම්වූ තණ ධාන්‍ය) කන්නේ හෝ ඉබේ හටගත් ධාන්‍ය කන්නේ හෝ වෙයි. (හම් වැඩකරුවෝ කපා දැමූ) හම් කැබලි කන්නේ හෝ කුඩු කන්නේ හෝ වෙයි. (මුරුවට) පුනක්කු කන්නේ හෝ වෙයි. තණ කන්නේ හෝ වෙයි. ගොම කන්නේ හෝ වෙයි. කැලෑ මුල් ගෙඩි කෑම ඇත්තේ ඉබේ වැටුන ගෙඩි කෑමෙන් යැපේද, කාශ්‍යපය, මේ අඩුවූ පැවතුම් ක්‍රමයෙන් මේ තපස් පැවතුමෙන් මහණ තෙම හෝ බ්‍රාහ්මණ තෙම හෝ දුකසේ දැනගත යුත්තේ ඉතා දුකසේ දැනගත යුත්තේද, එපමණකින් මහණ තෙම දුකසේ දැනගත යුත්තේය, බ්‍රාහ්මණ තෙම දුකසේ දැනගත යුත්තේයයි මේ වචන කියන්ට සුදුසු නොවෙයි. හෙතෙම නොපිසූ පලා කන්නේ හෝ බඩහමු නම්වූ තණ ධාන්‍ය කන්නේ හෝ ඉබේ හටගත් ධාන්‍ය කන්නේ හෝ වෙයි. හම්වැඩ කරුවන් කපා දැමූ හම් කැබලි කන්නේ හෝ කුඩු කන්නේ හෝ වෙයි. (මුරුවට) පුනක්කු කන්නේ වෙයි. තණ කන්නේ හෝ වෙයි. ගොම කන්නේ හෝ වෙයි කැලෑමුල් ගෙඩි කෑම ඇත්තේ ඉබේ වැටුනු ගෙඩි කෑමෙන් යැපෙයි' කියා එය පවුල් ප්‍රධානියෙක් විසින් හෝ පවුල් ප්‍රධානියෙකුගේ පුත්‍රයෙක් විසින් හෝ යටත් පිරිසෙයින් දිය අදින දාසියක විසින්ද දැනගත හැකි වන්නේය.

"කාශ්‍යපය, යම් කරුණකින් මේ අඩුවූ පැවතුම් ක්‍රමයෙන් තොරව මහණ හෝ බ්‍රාහ්මණ හෝ දුකසේ දැනගත යුත්තේද ඉතා දුකසේ දැනගත යුත්තේද වේ නම් 'මහණ තෙම දුකසේ දැනගත යුතුය' 'බ්‍රාහ්මමණ තෙමේ දුකසේ දැනගත යුතුය'යි මේ වචන කියන්නට සුදුසු වේ. කාශ්‍යපය, යම් කරුණකින් භික්ෂු තෙම වෛෂ (වෛර) නැතිව දොම්නස් නැතුව මෛත්‍රී සිත් වඩාද කෙලෙස් පහකිරීමෙන් කෙලෙස් නැතිවූ සමාධියද ප්‍රඥාවද මේ ජීවතයෙහිම තමන්ගේ උසස් ඥානයෙන් දැන

අවබොධ කොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, මේ භික්ෂුතෙම 'මහණ'යයිද 'බ්‍රාහ්මණ' යයිද කියනු ලැබේ.

"කාශ්‍යපය, ඉදින්, හණ පට්ටා රෙදි දරාද, හණ පට්ටා මිශ්‍ර රෙදි දරාද, එරුතණ ආදියෙන් කළ රෙදි දරාද, බිම ලූ රෙදිමාලු දරාද, ගස්පතුරු දරාද, අඳුන්දිවි සම් දරාද, මැදින් පැලූ අඳුම්දිවි සම් දරාද, කුසතණ දරයිද, නියඥ (පන්) දරයිද, ලෑලිපටි දරයිද, ඉසකෙසින් කළ කම්බිලි දරයිද, අශ්ව ලොමින් කළ කම්බිලි දරයිද, බකමූණු පිහාටුවලින් කළ ශරීරයේ යට කොටසේ ඇඳුම් දරයිද, ඉසකෙස් රැවුල් ඉදිරීමෙහි යෙදුනේ ඉසකෙස් රැවුල් උදුරන්නේ වෙයිද, ආසන ඉවත් කොට නැගිට සිටින්නේද, ඇනතියා ඉඳීමේ වීර්යයෙහි යෙදුනේ ඇණතියා ඉඳීම කරයිද, කටු උඩ නිදාගන්නේ, කටු උඩ හැසිරීම කරන්නේ වෙයි, ලෑලි උඩ නිදාගන්නේ වෙයි, කුඩා තාප්ප උඩ නිදාගන්නේ වෙයි, දූවිල දැලි දරන්නේද වෙයි, එලියේ වසන්නේද වෙයි, පළමුව එලූ ආකාරටම වෙනස් නොකර ආසනයක ඉන්නේද වෙයි, අසුචි කෑමෙහි යෙදුනේ අසුචි කෑම කරන්නේද වෙයි, ඇල්වතුර නොබීමෙහි යෙදුනේ ඇල්වතුර නොබීම ඇත්තේ වෙයි, උදය දවල් සවස පාප සෝදා පාකරන්නෙමැයි දියේ ගැලීමෙහි යෙදී වාසය කෙරේද, කාශ්‍යපය, මේ අඩුවූ පැවතුම් ක්‍රමයෙන්ද මේ තපස් පැවතුමෙන්ද, මහණ හෝ බ්‍රාහ්මණ හෝ දුකසේ දැනගත යුත්තේද, ඉතා දුකසේ දැනගත යුත්තේද එපමණකින් 'මහණ තෙම දුකසේ තේරුම්ගත යුත්තේය, බ්‍රාහ්මණතෙම දුකසේ තේරුම්ගත යුත්තේය'යි මේ වචන කියන්නට සුදුසු නොවේ හෙතෙම හණ පට්ටා රෙදි දරයි. හණ පට්ටා මිශ්‍ර රෙදි දරයි එරුතණ ආදියෙන් කළ රෙදි දරයි. බිම ලූ රෙදිමාලු දරයි. ගස්පත්රු දරයි. අඳුන්දිවි සම් දරයි. මැදින් පැලූ අඳුන්දිවි සම් දරයි. කුසපට්ටා දරයි. නියඥ (පන්) පට්ටා දරයි. ලෑලි පටි දරයි. ඉසකෙසින් කළ කම්බිලි දරයි. අස්ලොමින් කළ කම්බිලි දරයි. බකමූණු පිහාටුවලින් කළ ශරීරයේ යට කොටසේ ඇඳුම් දරයි. ඉසකෙස් රැවුල් ඉදිරීමෙහි යෙදුනේ ඉසකෙස් රැවුල් උදුරන්නේද වෙයි. ආසන ඉවත්කොට නැගිට සිටින්නේද, උක්කුටික වීර්යයෙහි යෙදුනේ, උක්කුටිකව හිඳින්නේ, කටු උඩ නිදාගන්නේ

කටු උඩ හැසිරීම කරන්නේ වෙයි. ලෑලි උඩ නිදා ගන්නේ වෙයි. කුඩා තාප්ප උඩ නිදාගන්නේ වෙයි. දූවිලි දැලි දරන්නේද වෙයි. එලියේ වසන්නේද වෙයි. පළමුව එලූ ආකාරයටම වෙනස් නොකර ආසනයක ඉන්නේද වෙයි. අසුචි කෑමෙහි යෙදෙන්නේ අසූචි කෑම කරන්නේද වෙයි. ඇල්වතුර නොබීමෙහි යෙදුනේ ඇල් වතුර නොබීම ඇත්තේද වෙයි. උදය දවල් සවස පාප සෝදා පාකරන්නෙමැයි දියේ ගැලීමෙහි යෙදී වාසකෙරේයයි, මෙතරම් ස්වල්ප දෙයකින් අපසුවෙන් දැනගත යුතු ඉතා අපහසුවෙන් දැනගත යුතු මහණෙක් හෝ බමුණෙක් වෙයි නම් ඔහු පවුල් ප්‍රධානියකු විසින් හෝ පවුල් ප්‍රධානියෙකුගේ පුත්‍රයෙක විසින් හෝ යටත් පිරිසෙයින් දිය අදින දාසියක විසින්ද දැනගත හැකි වන්නේය.

"කාශ්‍යපය, යම් කරුණකින් මෙතරම් අඩුවූ පැවතුම් ක්‍රමයෙන් තොරවම මෙතරම් අඩුවූ තපස් පැවතුමෙන් තොරවම මහණ තෙම හෝ බ්‍රාහ්මණ තෙම දුකසේ දැනගත යුත්තෙක් ඉතා දුකසේ දැනගත යුත්තෙක් වේනම් මහණ තෙම දුකසේ දැනගත යුත්තෙක, බ්‍රාහ්මණතෙම දුකසේ දැනත යුත්තෙකැයි මේ වචන කියන්ට සුදුසුයි කාශ්‍යපය, යම් කරුණකින් භික්ෂුතෙම වෛෂ (වෛර) නැතිව, දොම්නස් නැතිව, මෛත්‍රි සිත් වඩාද, කෙලෙස් පහකිරීමෙන් කෙලෙස් නැතිවූ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවද මේ ජීවිතයෙහිම තමන්ගේ උසස් ඥානයෙන් අවබෝධකොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, මේ භික්ෂුතෙම මහණයයිද බ්‍රාහ්මණයයිද කියනු ලැබේ.

18. මෙසේ කී කල්හි අචෙල කාශ්‍යප, "පින්වත් ගෞතමය, ඒ සීල සම්පදාව කුමක්ද? චිත්තසම්පදාව කුමක්ද? ප්‍රඥා සම්පදාව කුමක්ද?"යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසුවේය.

"කාශ්‍යපය, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනා ඥාන ආදී විද්‍යා අට සීලසංවරය ආදී හසුරුවන ධර්ම පසළොස යන අෂ්ට විද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙවි

මිනිසුන්ට ගුරුවරයෙක්වූ, (චතුරාර්ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්මසතර අවබොධකළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් සහ මිනිසුන් සහිතවූ, සත්ත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැන පැහැදිලි කොට ප්‍රකාශ කෙරේද, ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූද, මැද යහපත්වූද, කෙළවර යහපත් වූද, අර්ථ සහිතවූද, (දස ආකාරයෙන්) නියම විදියට වචන ශබ්ද කරන්නාවූ ඛ්‍යඤ්ජන සහිත, සියලු ලෙසින් සම්පූර්ණවූ පිරිසිදුවූ, සියලු ශාසනමාර්ග බ්‍රහ්මචර්යය ගෙන හැර දක්වත්.

**19.** "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයිද ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. ඔහු ඒ ශ්‍රද්ධායෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය. 'ගෘහවාසය පීඩා සහිතයි. රාගාදී කෙලෙස් සහිත මාර්ගයෙකි මහණ කම වනාහී කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහි ගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැලිරැවුලු කපාදමා සිවුරු හැඳ පොරවා ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි' කියායි.

"ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාශිය හැර, ස්වල්පවූ හෝ බෙහෝවූ නෑපිරිස් හැර, හිසකෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වේද, මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවරසීලයෙන් යුක්ත වූයේ, යහපත් හැසිරීමෙන් හා වරදනැති පැවැත්මෙන් යුක්ත වූයේ, ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භය දක්නා ගති ඇත්තෙක් වූයේ, යහපත්වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්තවූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ ජීවිත නැවතුම් ඇත්තේ වෙයි. ශීලයෙන් යුක්තවූයේ වෙයි. ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේ වෙයි. කෑමෙහි පමණ දන්නේ වෙයි.

මනා යහපත් සිහියෙන් හා නුවණින් යුක්තවූයේ වෙයි, සන්තෝෂයෙන් යුක්තවෙයි.

**20.** "කාශ්‍යපය, භික්ෂුනමක් කෙසේ නම් සීලසම්පන්න වේද? කශ්‍යපය, මේ සස්නෙහිවූ භික්ෂුනමක් ප්‍රාණවධය හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහාතබන ලද ආයුද ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ කරුණාවන්ත වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතුව වාසය කෙරේ, මෙයද ඔහුගේ සීලයක්වේ. නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ. දුන්දෙයම ගන්නේ, දුන්දෙයම කැමතිවන්නේ, සොර නොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේද මෙයද ඔහුගේ සීලයෙකි. අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන්වූයේ බ්‍රහ්මචාරීවේ මෙයද ඔහුගේ සීලයකි. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, සැබෑතෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ ලොකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේද මෙයද ඔහුගේ සීලයෙකි. පිසුණු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද, මෙසේ භෙදවූවන් ගළපන්නේ සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මේද ඔහුගේ සීලයෙකි, ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, යම් වචනයක් නිදොස් වේද, කණට සැපද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේද, කාලයට සුදුසු කථා කරන්නේද, සිදුවූ තෙපුල්ම කියන්නේද, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කියන්නේද, සුදුසු

කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේද මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්මද දියුණුවට හේතුවන වචන කීමද, මෙයද ඔහුගේ සීලයෙකි.

"තණ, ගස්, වැල්, සිඳීම් බිඳීම්, ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන කෑම ඇත්තේද, රාත්‍රි කෑමෙන් හා අවේලෙහි කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේය මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම්, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් සම්පූර්ණයෙන්, වැළැක්කේද, උස්අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේද, රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් වැළැක්කේද, අමුවූ ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද, අමුමස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනු ළමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද වේ. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද, එළුවන් හා තිරළුවන් පිළිගැනීමෙන් තොරවූයේද, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද, සම්පූර්ණයෙන් තොර වූයේද, ගිහීන්ගේ දූත මෙහෙවරය. ගෙන්ගෙට යන පහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේද, ගනු දෙනු කිරීමය, තරාදි ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මිශ්‍ර වඤ්චා කිරීමය, වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය. නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළක්කේය. කැපීම, මැරීම, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය, යන මෙයින්ද සම්පූර්ණයෙන් වැළැක්කේය, මෙයද ඔහුගේ සීලය වේ.

**සුළු සිල් නිමියේය.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**21.** "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මූලබීජය, ඛන්ධබීජය, ඵළුබීජය, දලුබීජය, පස්වැනිවූ බීජබීජය යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේ නම් මෙයද ඔහුගේ එක් සීලයක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, නොඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛ්‍යාත වහන් දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත් කොට තබා ප්‍රයෝජන ගැන්මයයි කියනලද පසුවට තබා ප්‍රයෝජන ගැන්මෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේද, මෙයද ඔහුගේ සීල සම්පත්තියකි.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය බෙර ආදිය වැයීමය, රඟමඩුලු සැරසීමය, වැඩක් නැති කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනි නැංවීමය, සතරැස් හෝ කළ බෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණදොවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය. මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මීවුන් හා පොරය, ගවයින් හා පොරය, එළුපොරය මෙණ්ඩක එළුපොරය, කුකුළුපොරය, වටුපොරය, දඬු (පොලු) පොරය, තොරතුරු (අතමිට මොලවා) ඇනීමය, මල්ලව යුද්ධය යුද්ධය, ඇත් අස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත්ද මෙසේ මෙබඳු විසුලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළක්කේද, මෙයද ඔහුගේ සීල සම්පත්තියකි.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා (දූ පෝරු ආදිහි කෙළිම්වූ) ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩා කිරීමය, බිම මණ්ඩල

වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා තියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටමිටි ගසා ඇත් අස් ආදී රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, නළා පිඹීමය, ක්‍රීඩා නඟුල් ගෙන සෙල්ලම් සීසෑම්ය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන්ගුරුවා තනා ක්‍රීඩාකිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැණ කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය ඒ ඒ දෝෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්ද මෙසේ මෙබඳුවූ කෙළියෙන් සම්පූර්ණයෙන් වළකීද, මෙයද ඔහුගේ සීල සම්පත්තියකි.

**22.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දික්හගලා පුටුය, පලඝ්ය, සතරඟුලෙන් දිග ලොම් ඇතිරිය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළුලොම් සුදුඇතිරිය, එළු ලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදී රූපයෙන් විසිතුරු එළුලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති ඇතිරිය. දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය, රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එක්විට නැට්ටුක්කාරියන් දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහ ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරන ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබනලද රතුපාට කොට්ට ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කෙරෙත්ද මෙසේ මෙබඳුවූ උස් අසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වළකීද, මෙයද ඔහුගේ සීල සම්පත්තියකි.

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, මූනබලන කන්නාඩි, අඳුන් තෙල් පාවිච්චිය හා සුවඳ, මූණේ ගානා සුවඳ කුඩු, මූණේ ගානා සුවඳ ද්‍රව්‍ය, අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය,

විසිතුරු දඬුගෙන හැසිරීමය, බෙහෙත් නළ එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙනයෑම, විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය, නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය, දික්වූ දහවලු ඇති සුදුරෙදි ඇඳීමදැයි මෙසේවූ සැරසීම් හා අඩුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්ද මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වළකීද මෙයද ඔහුගේ සීල සම්පත්තියකි.

**23.** "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය මහ ඇමතියන් පිළිබඳ කථාය, සෙනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය, මාලා පිළිබඳ කථාය, ගන්ධ ද්‍රව්‍යයන් පිළිබඳ කථාය නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි දරුවන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ තේරුම් නැති කථාය, ලොකය පිළිබඳ කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්ද මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වළකීද මෙයද ඔහුගේ සීලසම්පත්තියකි.

**24.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි. 'ඔබ මේ ධර්ම විනය කුමකැයි දන්නෙහිද? ඔබ වරදවා පිළිපදින්නෙහිය. මම මනාකොට පිළිපදින්නේ වෙමි.' 'මාගේ වචන යහපත්ය, හෝ අර්ථ සහිතය, ඔබගේ වචන අර්ථ රහිතය. පළමු කිය යුත්ත පසුව කීයෙහිය. පසුව කිය යුත්ත පළමුව කීයෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල නිෂ්ඵල විය. ඔබට වාදාරොපනය කරණ ලදී.

නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව' යන ආදී දොෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්ද මෙසේ මෙබඳු දොෂාරොපණ කථාවෙන් සම්පූර්ණයෙන් වළකීද මෙයද ඔහුගේ සීලසම්පත්තියකි.

**25.** "එසේ සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියන්ගේ, බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යව අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යව, එතැනින් අසවල් දෙය ගෙණෙව'යි දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්ද මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වළකීද මෙයද ඔහුගේ සීලසම්පත්තියකි.

**26.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා කුහකයෝද, සිව්පසය උදෙසා කථා කරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන් කරන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද ලාභයකින් ලාභයක් සොයන්නෝද වෙත්. මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග ආදියෙන් වළකීද මෙයද ඔහුගේ සීල සම්පත්තියකි.

### මැදුම් සිල් නිමියේය

**27.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, හෙනගැසීම ආදී මහනිමිති බලා කියන ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන ශාස්ත්‍රය, ගිනිදෙවියා පිදීමය, දබ්බිහොමය, ථුස හොමය, තණ්ඩුල හොමය, කණ හොමය, සප්පි හොමය, තෙල හොමය, මුඛ හොමය, ලේ හොමය, ශරීර විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යා, භූත විද්‍යා, නාග විද්‍යා, විෂ විද්‍යා, ගෝනුසු විද්‍යා, මී විද්‍යා, කුරුලු විද්‍යා, කපුටු විද්‍යා, ජීවිත කාලය කීම, ආයුධ වැළැක්ම, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම

වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා, හේතුකොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්ද මෙසේ මෙබඳු පහත් විද්‍යා හේතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ සීල සම්පත්තියකි.

**28.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මිණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය, ස්ත්‍රී ලක්ෂණය, පුරිස ලක්ෂණය, පිරිමිදරු ලක්ෂණය, ගෑණුදරු ලක්ෂණය දාස ලක්ෂණය, දාසි ලක්ෂණය, ඇත් ලක්ෂණය, අශ්ව ලක්ෂණය, කැස්බෑ ලක්ෂණය, එළුලක්ෂණය, මීහරක් ලක්ෂණය, ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය කුකුළු ලක්ෂණය, වටු ලක්ෂණය, තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය, මුව ලක්ෂණයයි, මෙබඳු පහත් විද්‍යාවන් කරණ කොට ගෙණ, වැරදි ජීවිකාව කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීල සම්පත්තියකි.

**29.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැර යෑම වන්නේය. අසවල් දින ඇතුළු නුවරට එන්නේය. අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හේතුකොට ලාමක ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීල සම්පත්තියක් වේ.

**30.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'චන්ද්‍රග්‍රහණය වන්නේය, සූර්ග්‍රහණය වන්නේය

තාරකා සමාගමය වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමග යෑම වන්නේය, තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය, තාරකාවන්ගේ නොමග යෑම් වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළොව කම්පාව වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම හා බැහීමද කෙළෙසීමද පිරිසිදු වීමද වන්නේය, චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය චන්ද්‍ර සූර්යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇති වන්නේය, ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇති වන්නේය, තාරකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය, දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම මෙබඳු විපාක ඇති වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටුවීම හා පිරිසිදු වීම මෙබඳු විපාක ඇතිවන්නේයයි' කියා මෙසේ පහත් විද්‍යා හේතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හේතු කොට ගෙණ කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීල සම්පත්තියකි.

**31.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය, යහපත් ආහාරපාන ඇතිවන්නේය, ආහාර පාන නැති වන්නේය, නිර්භය ඇතිවන්නේය, භය ඇතිවන්නේය, රොග ඇතිවන්නේය, නිරෝගි බව ඇතිවන්නේයයි' කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන් කිරීමය, කොටස්කර ගණන් කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණකොට වැරදි ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හෙතුවෙන් වන වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීලසම්පත්තියකි.

**32.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ

කථාකිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇතිකිරීමය, දුර්භගකරණය, ගර්භවිරොධි කරණය, දිව් තද කිරීමය, නූල් බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්න ඇසීමය, ගෑනුදරුවන්ගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණය කොට ප්‍රශ්න ඇසීමය, හිරු වැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම් කිරීමය, කටින් ගිනිදැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීල සම්පත්තියකි.

33. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීම කාර්යය සමෘද්ධි කටයුතු කර්මය, මන්ත්‍ර කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මූන සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩු කය විරේකය. යටිකය විරේකය, හිස විරේකය, කන්තෙලය, ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍ය කිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකමය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකම්ය, මූලික බෙහෙත් දීමය, සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට වැරදි ජීවත්වීමෙන් ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ සීල සම්පත්තියයි.

34. "කාශ්‍යපය, මෙසේ ශීලසම්පන්නවූ භික්ෂුහට භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ ශීලසංවරය හෙතු කොට ගෙණ කිසි තැනකදී නොඋපදන්නේය. කුමක් මෙන්ද යත්:- කාශ්‍යපය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම්

සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම, කාශ්‍යපය, ශීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ශීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය. ආර්යවූ (උතුම්වූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂු තෙම, තමන් තුළ පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. කාශ්‍යපය, මෙසේ දැක්වූ ශීලයෙන් යුක්තවූ භික්ෂුව ශීලසම්පන්න නම් වේ.

## මහ සිල් නිමියේය.

**35.** "කාශ්‍යපය, භික්ෂුව කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේද? කාශ්‍යපය, මේ සස්නෙහි භික්ෂුතෙමේ, ඇසින් රූපයක් දැක එහි නොඇලේද එහි නොපෙළඹෙන්නේද, ඇස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදීද ඔහු තමාගේ ඇස් ඉන්ද්‍රියය රකී, ඇස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ කනින් ශබ්දයක් අසා එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය කන් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ කන් ඉන්ද්‍රියය රකී. කන් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. නාසයට ගඳ සුවඳ දැනී එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. නාස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ නාස් ඉන්ද්‍රියය රකී. නාස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. දිව් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ දිව් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ශරීර ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී

අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ ස්පර්ශ ඉන්ද්‍රියය රකී. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. සිතින් (ධර්මයක්) අරමුණක් දැන එහි නොඇලේ, එහි නොපෙළඹෙන්නේය. සිත් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් නිසා දැඩි ආසාව හා කලකිරීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. හෙතෙම සිත් ඉන්ද්‍රිය රකී. සිත් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ භික්ෂුව උතුම්වූ ශීල රාශියෙන් යුක්තවූයේ අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ අධිචිත්ත සැපය විඳියි. කාශ්‍යපය, මෙසේවූ භික්ෂු තෙමේ ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තේ වේ.

**36.** "කාශ්‍යපය, භික්ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද?

"කාශ්‍යපය, මේ සස්නෙහි භික්ෂුතෙම ඉදිරියට යෑමෙහිද, ආපසු යෑමෙහිද, නුවණින් දැන කරන්නේය ඉදිරි බැලීමෙහිද, වටපිට බැලීමෙහිද නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහිද, දිගුකිරීමෙහිද, මනා නුවණින් දැන එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන එසේ කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය. වැළඳීමය, රස විඳීමය යන මෙහිද මනා නුවණින් යෙදී එසේ කරන්නේය. මල මුත්‍ර පහකිරීමද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්දව සිටීම යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. කාශ්‍යපය, මෙසේ කරන්නාවූ භික්ෂු තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි.

**37.** "කාශ්‍යපය, භික්ෂු තෙමේ කෙසේ සතුටු වූයේ වේද?

"කාශ්‍යපය, භික්ෂු තෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද, සතුටු සිත් ඇත්තේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳවූ දේ) පමණක් ගෙන යයි. කාශ්‍යපය, යම්සේ

පක්ෂියෙක් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, කාශ්‍යපය, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය ආරක්ෂාවට ප්‍රමාණවූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු වන්නේ වේ. ඔහු යම් තැනක යා නම් අටපිරිකර පමණක් රැගෙණ බැහැර යයි. කාශ්‍යපය, මෙසේවූ භික්ෂු තෙමේ සන්තෝෂයෙන් යුක්ත වේ.

38. "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, මේ උතුම්වූ සන්තෝෂයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, කඳු පලාත්ද, කඳුරැලි ගල්ගුහාවන් හෝ මහාමගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ ඉඩකඩ ඇති තැන් සහ තණ ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය කෙරේද ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළැක්කේ, පර්යංකය බැඳ, කකුල් අකුලුවා හිඳ ශරීරයේ උඩු කොටස කෙලින් තබා නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවාගෙණ හිඳී.

39. "ඔහු ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේද ලොභ සිත වෙන් කොට පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව පණ ඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වාසය කෙරේද, ක්‍රොධ දොෂයෙන් වෙන්ව සිත පිරිසිදු කෙරේද, කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේද, අලස බව දුරුකොට සිත පිරිසිදු කෙරේද, උඩඟු බව හා කුකුස දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේද, ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, සිත උඩඟු බව හා කුකුසෙන් පිරිසිදු කෙරේද, විචිකිච්ඡාව (සැකය) දුරුකොට, පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේද; විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේද.

**40.** "කාශ්‍යපය, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්තයන්හි යොදන්නේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණුවන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් ආරක්ෂා කරණ පිණිස වැඩි යමක් ඉතුරුවූයේ නම් ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. 'මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පොෂ්‍ය කිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය'කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

41. "කාශ්‍යපය, යම්සේ රොගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේද, ඔහුට ආහාර රුචිනොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම් ඔහුගේ ශරීර බලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය, කෙබඳුද යත්: 'මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන් බව ඇති කෙනෙක් වීමි. මට බත් රුචියද නොවීය, ශරීර බලයද නැතිවිය, ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය කාය බලයද තිබේය' කියායි. ඔහු ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසටද පැමිණෙන්නේය.

42. "කාශ්‍යපය, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසු කලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය. සතුටට පැමිණෙන්නේය.

43. "කාශ්‍යපය, යම් සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත්වූ, තමා කැමති ගමනක් ඒවූ පරිදි යා නොහැකි වැඩකරුවෙක් (දාසයෙක්) වන්නේද, ඔහු, පසු කලක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර සිය කැමති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපති කොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත්නූන කෙනෙක් වීමි. අනුන්ට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමති තැනෙක යා හැක්කේද වෙමි'යි කියායි. ඔහු ඒ දාසභාවයෙන් මිදීම හේතුකොට බලවත් සතුටක් ලබන්නේය එසේම සතුටටද පැමිණෙන්නේය.

44. "කාශ්‍යපය, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේද, ඔහු මඳ කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොර සතුරන්ගෙන් පීඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්: 'මම පෙර ධනවත් වූයෙමි. භොග සම්පත් සහිත වූයෙමි. දුර්ලභ භික්ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණියෙක් වූයෙමි එසේවූ මම දැන් එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගය එතර කිරීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සතුටටද පැමිණෙන්නේය.

45. "කාශ්‍යපය ණය යම්සේද, රෝගය යම්සේද, හිරගේ යම්සේද, දාසභාවය යම්සේද, දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂු තෙමේ පහනොකළ (පඤ්චනීවරණ) කුසල් වලක්වන කරුණුපහ තමා කෙරෙහි ලා නුවණින් දකීද කාශ්‍යපය,

ණය නැති බව යම්සේද, නිරෝගී බව යම්සේද, සිරගෙන් මිදීම යම්සේද, අනුන්ට යටහත් නැති බව යම්සේද, භයනැති භූමිය යම්සේද, එපරිද්දෙන්ම කාශ්‍යපය, භික්ෂු තෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ නැති බව නුවණින් දකින්නේය.

**46.** "පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ භික්ෂුහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසහගත සිත් ඇත්තහුගේ නාම කය (වේදනාදී ස්කන්ධ හතර) සංසිඳෙයි, සංසිඳිනු කය ඇති තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) පැමිණෙයි.

**47.** "ඒ භික්ෂු තෙමේ වස්තුකාම ක්ලෙශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුසල ධර්මයන් කෙරෙන්ද වෙන් වූයේම අරමුණෙහි සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම සහිතවූ, සිතෙහි විවේකයෙන් උපන් ප්‍රීතියම සැපකොට ඇති, පළමුවෙනි ධ්‍යාන කුසල චිත්තය තමා තුළ ඉපදවීම් වසයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරෙයි.

මෙයද ඒ භික්ෂුහුගේ සමාධි සම්පත්තියයි.

**48.** "කාශ්‍යපය, නැවතද භික්ෂු තෙමේ අරමුණට සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම යන මොවුන්ගේ සන්සිඳීමෙන් අද්ධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති දෙවැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කරයි.

කාශ්‍යපය, මෙයද ඒ භික්ෂුහුගේ සමාධි සම්පත්තියයි.

**49.** "නැවතද කාශ්‍යපය, ඒ භික්ෂු තෙමේ ප්‍රීතියෙහි නොඇල්මෙන් මැදහත් බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (උපෙක්ෂා) සැප දුක් දෙකට මැදහත් විඳීම ඇත්තේය, සිහි

ඇත්තේය, සැපයෙන් විසීම ඇත්තේයයි ආර්යයෝ කියත්ද ඒ තුන්වැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කරයි.

කාශ්‍යපය, මෙයද ඒ භික්ෂුවගේ සමාධි සම්පත්තියයි.

**50.** "නැවතද කාශ්‍යපය, ඒ මහණතෙමේ සැප දුරු කිරීමෙන්ද, දුක් දුරු කිරීමෙන්ද පළමුකොටම සැපදුක් වෙදනා නැතිව යාමෙන් දුක්ද නොවූ, සැපද නොවූ උපේක්ඛා-සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, හතරවෙනි ධ්‍යාන (කුසල) චිත්තයට පැමිණ වාසය කරයි.

කාශ්‍යපය, මෙයද ඒ භික්ෂුවගේ සමාධි සම්පත්තියයි.

කාශ්‍යපය, මේ වනාහි සමාධි සම්පත්තිය නම් වේ.

**51.** "නැවතද, කාශ්‍යපය, ඒ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි. ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඔහු මෙසේ දැන ගණී. 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තය. සතර මහාභූතයන්ගේ හේතුවෙන් හටගත්තේය. මව්පියන් නිසා හටගත්තේය. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඇඟ ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඤ්ඤාණය ශරීරය ආශ්‍රය කෙරේ. මෙහිම බැඳුනේ වෙයි' කියායි.

**52.** "කාශ්‍යපය, යම්සේ යහපත්වූ, පිරිසිදු ආකාරයෙන් උපන්නාවූ, අටැස්වූ, ගල් ආදී දොස් බැහැර කිරීමෙන් හොඳ ලෙස සකස් කරණ ලද්දාවූ, නිර්මලවූ විශේෂයෙන් ප්‍රසන්නවූ, කැලැල් නැතිවූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෛඩූර්ය මැණිකක් වේද, එහි නිල්වූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේ, ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේය 'මේ වෛඩූර්ය මැණික මනාසේ කාන්තිමත් හෙයින් යහපත් වේ, පිරිසිදු ආකාරයෙන් උපන්නේය, අටැස් ඇත්තේය, දොස්

දුරුකිරීමෙන් මනාකොට සකස් කරණ ලද්දේය. නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, කැලැල් නැත, සියලු ආකාරයෙන් සම්පූර්ණය. ඒ මැණිකෙහි මේ නීලවර්ණවූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේය' කියායි.

"කාශ්‍යපය, එපරිද්දෙන්ම යෝගීවූ මේ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇතිවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස සිත එලවා තබයි, ඒ සඳහා විශෙෂයෙන් සිත නමයි. ඒ භික්ෂු තෙමේ මෙසේ දන්නේය, කෙසේද යත්: මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තවේ, සතර මහාභූතයන්ගෙන් හටගත්තේය, මව්පියන් නිසා හටගත්තේය. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඉලීමය, පිරිමැදීමය බිඳීමය, විනාශය යන මේ ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඥ්ඥාණය මේ ශරීරය. ආශ්‍රය කෙළේ වෙයි, මෙහිම බැඳී සිටියේය' කියායි.

**53.** "ඔහු මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, නොසැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ රූපයක් මනා කොට නිපදවීම පිණිස සිත එලවා තබයි වෙසෙසින් නමයි. ඔහු ආකාරවත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවනලද) ශරීරය හා අත පය ආදී අවයව ඇති, විකලනුවූ ඉඳුරන් ඇති, මේ ශරීරයෙන් අන්‍යවූ ශරීරයක් හොඳ ලෙස සාදයි.

**54.** "කාශ්‍යපය, යම්සේ පුරුෂයෙක් මුදු තණ ගසින් තණබඩය උදුරා ගැනීම කරන්නේද, මේ තණ ගසය, මේ තණ බඩය, තණගස අනිකෙක, තණබඩය අනිකෙක, තණ ගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය, තනන ලද්දේය යන වැටහීම ඔහට පහල වන්නේය.

මෙයද ඔහුගේ ප්‍රඥා සම්පත්තියකි.

"කාශ්‍යපය, යම්සේ පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේද ඔහුට මෙබඳු අදහසක් වන්නේය. 'මේ කඩුවය, මේ කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන් කඩුව ඉවත්කරණ ලද්දේය' කියායි.

"කාශ්‍යපය, යම් පුරුෂයෙක් සර්පයෙකු සැවයෙන් පහ කරන්නේද ඕහට මේ සර්පයාය, මේ සැවය, සර්පයා එකෙකි. සැව අනිකකි, සැවයෙන් සර්පයා වෙන්කරණ ලද්දේයයි වැටහීමක් ඇතිවන්නේය.

"කාශ්‍යපය, එසේම භික්ෂු තෙමේ මෙසේ සිත සමාධිගතවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සිතින් උපදවන කය මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට ඊට නමයි. ඔහු මේ කයින් රූ ඇති, සිතින් මවනලද, සියලු ශරීරය සහ අතපය ආදී අවයව ඇති, නොපිරිහුනු ඉන්ද්‍රිය ඇති වෙන කයක් මවයි.

**55.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, නැවතීමට පැමිණි කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට දක්වයි. එකෙක්ව බොහෝසේ වෙයි. බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට පර්වතය හරහට නොහැපෙමින් යයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පරියන්කයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹ ලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වයි.

56. "කාශ්‍යපය, දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරු අතවැසියෙක් හෝ යහපත්සේ පදම්කළ මැටියෙන් කැමති කැමති වලන් ආදී වර්ගයන් යම්සේ කරන්නේද, නිපදවන්නේද, මහරජ, දළ කැටයම් කරුවෙක් හෝ අතවැසියෙක් හෝ සකස්කළ දළයෙහි යම්සේ කැමති කැමති දළ කැටයම් වර්ගයක් කරන්නේද, නිපදවන්නේද, කාශ්‍යපය, දක්ෂ රන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ පදම්කළ රණින් කැමති කැමති රන් අබරණ ජාතීන් යම්සේ කරන්නේද, නිපදවන්නේද- කාශ්‍යපය, එසේම භික්ෂුව සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධි විධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් ඍද්ධි විධි වෙන් වෙන් කොට දක්වයි එකෙක්ව බොහෝ සේ වෙයි, බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වත හරහට නොහැපෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කරයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යෙයි. මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව කෙරෙයි. මෙයද ඔහුගේ ප්‍රඥා සම්පත්තියයි.

57. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, දිව්‍යමය කණ සම්බන්ධ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඒ භික්ෂුව පිරිසිදුවූ මිනිස් බව ඉක්මවූ දිව්‍යමය කණ සම්බන්ධ ඥාණයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද, දෙයාකාර ශබ්දයන් අසයි.

58. "කාශ්‍යපය, දික් මගට පැමිණි පුරුෂයෙක් බෙර හඬද, මිහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද, යම්සේ

අසාද, ඔහුට මේ බෙරහඬයයිද, මිහිඟු බෙරහඬයයිද, සක්, පණාබෙර, ගැට බෙර හඬයයිද සිතෙන්නේය. කාශ්‍යපය, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇති කල්හි, මෘදුවූ කල්හි, ස්ථිරබවට පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, දිව්‍ය කණෙන් ලබන ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු මෙසේ පිරිසිදුවූ, මිනිස් කණ ඉක්මවූ දිව්‍ය කණ සම්බන්ධ ඥානයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද දෙයාකාර ශබ්දයක් අසයි. මෙයද ඔහුගේ ප්‍රඥා සම්පත්තියයි.

**59.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශ ඇති කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුවූ කල්හි, ස්ථිර බවර පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පරසිත් දැනගන්නා ඤාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තම සිතින් පිරිසිඳ දනියි. රාග සහිත සිත රාග සිතයයි දනියි. රාගය පහවූ සිත රාගයෙන් තොරවූ සිතයි දනියි. ද්වෙෂ සහිත සිත දොස සිතයයි දනියි ද්වෙෂය පහවූ සිත ද්වෙෂයෙන් තොරවූ සිතයයි දනියි. මොහ සහිත සිත මොහ සිතයයි දනියි, මොහය පහවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුනු සිත හැකුලුනු සිතයයි දනියි, විසුරුණු සිත විසුරුණු සිතයයි දනියි. මහත් බවට ගිය සිත, මහත් බවට ගිය සිතයයි දනියි. මහත් බවට නොගිය සිත, මහත් බවට නොගිය සිතයයි දනියි. කාම සහිත සිත කාම සහිත සිතයයි දනියි. ලෞකික හිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනියි. සමාධිගතවූ සිත සමාධිගත සිතයයි දනියි. සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනියි (ක්ලෙශයෙන්) මිදුනු සිත, මිදුනු සිතයයි දනියි. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දනියි.

**60.** "කාශ්‍යපය, සැරසෙන ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ලමාවයසෙහි සිටියෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු, නොකිළිටි

කැඩපතෙක හෝ පිරිසිදු දිය භාජනයෙක්හි හෝ තමාගේ මූනේ ශොභාව පරීක්ෂා කරන්නේ යම්සේ කැලල් සහිත නම් කැලල් සහිතයයි දැනගනීද, කැලල් රහිත නම් කැලල් රහිතයයි දැනගනීද,

"කාශ්‍යපය, එසේම භික්ෂුතෙම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පරසිත් දැනගන්නා ඤාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් දැන ගනියි. රාග සිත රාග සිතයයි දනියි. රාගයෙන් තොරවූ සිත රාගයෙන් තොරවූ සිතයයි දනියි. දොස සිත දොස සිතයයි දනියි. දොසයෙන් තොරවූ සිත දොසයෙන් තොරවූ සිතයයි දනියි. මොහසිත මොහ සිතයයි දනියි, මොහයෙන් තොරවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුණු සිත හෝ විසුරුණු සිත හෝ මහත් බවට ගිය සිත හෝ මහත් බවට නොගිය සිත හෝ කාම සහිත සිත හෝ අනුත්තර සිත හෝ එකඟවූ සිත හෝ එකඟ නොවූ සිත හෝ දනියි. මිදුණු සිත හෝ මිදුණු සිතයයි දනියි. නොමිදුණු සිත හෝ නොමිදුණු සිතයයි දනියි.

කාශ්‍යපය, මෙයද ඔහුගේ ප්‍රඥා සම්පත්තියයි.

**61.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ, කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක්ද, දෙ ජාතියක්ද, තුන් ජාතියක්ද, හතර ජාතියක්ද, පස් ජාතියක්ද, දස ජාතියක්ද, විසි ජාතියක්ද, තිස් ජාතියක්ද, සතළිස් ජාතියක්ද, පනස් ජාතියක්ද, සියක් ජාතියක්ද, දහස් ජාතියක්ද, සියක්දහස් ජාතියක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක්

හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි, අසුවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි, මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් විදියේ පෙර ජීවිත සිහි කෙරෙයි.

**62.** "කාශ්‍යපය, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් තමන්ගේ ගමට එන්නේද, 'මම, සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. එගමිනිදු අසවල් ගමට ගියෙමි, එහිද මෙසේ සිටියෙමි. මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට පැමිණියෙමි'යි හෙතෙම දන්නේය.

"කාශ්‍යපය, එපරිද්දෙන්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි පෙර ජාති සිහි කිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් පෙරවිසීම් සිහි කෙරෙයි. කෙසේද යත්ඃ 'එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද, නොයෙක් කල්ප විස්සකින් යුත් කල්පයන්ද, නොයෙක් අන්තඃකල්ප රාශියකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්පයන්ද, අසුවල් තැන වීමි, මෙබඳු නම් ඇත්තෙමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු පාට ඇත්තෙමි, මෙබඳු ආහාර

ඇත්තෙමි, මෙබඳු සැප දුක් වින්දෙමි, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු පාට ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සුව දුක් වින්දෙමි, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිත, (පෙරවිසූ පිළිවෙළ) දැක්වීම් සහිත, නොයෙක් ආකාරවූ පෙරවිසීම් සිහි කෙරෙයි.

"කාශ්‍යපය, මෙයද ඔහුගේ ප්‍රඥා සම්පත්තියයි.

**63.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ මරණින් පසු උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ පිරිසුදුවූ, මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී, පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොව ගියාවූද නරකලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී. 'මේ පින්වත් සත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය. වචන දුශ්චරිතයෙන් යුක්තය. හිතේ දුශ්චරිතයෙන් යුක්තය. උත්තමයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය. මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ, නිරයට පැමිණෙත් නැතහොත්, මේ පින්වත් සත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබණින්නෝය, සත්‍යය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. මරණින් මතු යහපත් පැමිණීමවූ, ස්වර්ග ලොකයට පැමිණියෝය' මෙසේ පිරිසුදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳලොවට ගියාවූද නරක ලොවට ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී.

**64.** "කාශ්‍යපය, යම්සේ පාරේ හන්දියක ප්‍රාසාදයක් වේද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට ඇතුල්වෙන, ගෙයින් නික්මෙන වීථියෙහි හැසිරෙණ පාර හන්දියේ හිඳින මනුෂ්‍යයන් දක්නේද, ඔහුට මෙසේ සිතෙයි: 'මේ මිනිස්සු ගෙට ඇතුළු වෙති, මොහු නික්මෙති. මොහු වීථියෙහි හැසිරෙති, මොහු පාර හන්දියේ ඉඳිති'යි කියායි. කාශ්‍යපය, එසේම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, සිත ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්මවූ දිවඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී: මේ පින්වත් සත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය, වචන දුශ්චරිතයෙන් යුක්තය හිතේ දුශ්චරිතයෙන් යුක්තය, උත්තමයින්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු ශරීරයෙන් වෙන්ව, මරණින් මතු අපායවූ දුර්ගතියවූ, දුකවූ, නිරයට පැමිණෙත්.' නැතහොත්, මේ පින්වත් සත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබණින්නෝය, සත්‍යය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. ශරීරයෙන් වෙන්ව මරණින් මතු සුගතියවූ, ස්වර්ග ලෝකයට පැමිණියෝ'යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද සුගතියට පැමිණියාවූද දුර්ගතියට පැමිණියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී. මෙයද ඔහුගේ ප්‍රඥා සම්පත්තියයි.

**65.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිතස්ථිරවූ

කල්හි, කම්පානොවන භාවයට පැමිණි කල්හි සිතේ පැසවන කෙලෙස් පහකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයි තතුලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී, මේ පැසවන කෙලෙස්යයි තතු ලෙස දැනගණී, මේ පැසවන ක්ලේශයන්ගේ හේතුයයි තතු ලෙස දැනගණී, මේ ඒ කෙලෙස් නැතිකිරීමයයි තතුලෙස දැනගනී, මේ ඒ කෙළෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගනී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ, සංසාරයට (භවයට) ඇති ආශාවන් කෙරෙන්ද සිත මිදේ, දැඩි මෝහය කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැතිවිය. උතුම් හැසිරීමෙහි වසන ලදී. කටයුත්ත කරනලදී. මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ'යිද දැනගණී,

**66.** "කාශ්‍යපය, යම්සේ පර්වත මුදුනක පිරිසිදු, සිත් සතුටු කරන නොකැළඹුනු දිය විලක් වේද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ නැවතී තිබෙන්නාවූ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන්ද කැබලිති කැටද, එහා මෙහා යන්නාවූ මසුන් රැන්ද, දක්නේ වේද, ඔහුට මෙසේ සිතෙන්නේය: මේ දිය විල පිරිසිදුය, මනාසිත් ප්‍රිය කරන්නේය, නොකැළඹුනේය. එහි මේ සිප්පි බෙල්ලන් සක් බෙල්ලන්ද, කැටකැබලිතිද, නැවතී තිබේ. මසුන් රැන් හැසිරෙත්ය' කියායි කාශ්‍යපය, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි බොහෝ කල් සිට එන ක්ලෙශයන් නැතිකිරීමේ ඥානය පිණිසසිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක්නැතිකිරීමේ

මාර්ගයයි තතුලෙස දැනගණී. මේ කෙලෙස් යයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් හේතුයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ. භවයට ඇති ආශාවන් කෙරෙන්ද මිදේ, මෝහය කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැති විය, උතුම් හැසිරීමෙහි වසනලදී, කටයුත්ත කරනලදී මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ'යිද දැනගනී.

කාශ්‍යපය, මෙයද ඔහුගේ ප්‍රඥාසම්පත්තියි. මේ වනාහි කාශ්‍යපය, ප්‍රඥාසම්පත්තිය වේ.

**67.** "කාශ්‍යපය, ශීලවාදීවූ සමහර මහණ බමුණු කෙනෙක් වෙත්ද ඔහු නොයෙක් ආකාරයෙන් ශීලයෙහි ගුණ කියත්. කාශ්‍යපය, යම් පමණ ඉතා පිරිසිදුවූ උතුම් ශීලයෙක් වේද, මම ඒ ශීලයෙහි තමාගේ ශීලය වැනි ශීලයකින් සම වූවෙකු නොදැක්කෙමි. ඊට වැඩි කෙනෙක් කොයින්ද? එසේවූ කල යම් මේ උත්තම ශීලයෙක් වේද ඒ ශීලයෙහි මමම උතුම් වෙමි. කාශ්‍යපය, කෙලෙස් නැතිවීම් ගැරහීම් වාද ඇත්තාවූ සමහර මහණ බමුණෝ ඇත්තාහ. ඔව්හු නොයෙක් ආකාරයෙන් කෙලෙස් නැවීම් ගැරහීම්හි ගුණ කියත්. කාශ්‍යපය, යම් පමණ දෝෂ නැතිවූ උතුම්වූ කෙලෙස් තැවීම් ගැරහීම් වෙත්ද, මම එහි තමහට සම වූවෙකු නොදත්තෙමි. ඊට වැඩි යම්කෙනෙක් කොයින්ද? එසේවූ කල යම් ඒ අධිකවූ කෙලෙස් ගැරහීමක් වේද මමම එහි උතුම් වෙමි කාශ්‍යපය, ප්‍රඥාවාදිවූ සමහර බමුණෝ ඇත්තාහ. ඔව්හු නොයෙක් ආකාරයෙන් ප්‍රඥායෙහි ගුණ කියත්. කාශ්‍යපය, යම් පමණ පිරිසිදුවූ කෙලෙස් නැති උතුම්වූ ප්‍රඥාවක් වේද, මම එහි තමන්ගේ ප්‍රඥාව වැනි ප්‍රඥාවෙන් සමවූවෙකු නොදැක්කෙමි. ඊට වැඩි වූවෙක් කොයින්ද? එසේවූ කල යම් මේ පිරිසිදුවූ ඉතා උසස් ප්‍රඥාවක් වේද එහි මමම උතුම්වූයේ වෙමි. කාශ්‍යපය, කෙලෙසුන්ගෙන් මිදීම ගැන වාද ඇති සමහර බමුණෝ ඇත්තාහ. ඔහු නොයෙක් ආකාරයෙන්

කෙලෙසුන්ගෙන් මිදීම ගැන ගුණ කියත් කාශ්‍යපය, යම් පමණ උතුම්වූ සහමුලින් කෙලෙසුන්ගෙන් මිදීමක් වේද, මම එහි තමාගේ සහමුලින් කෙලෙසුන්ගෙන් මිදීම වැනි මිදීමකින් සමවූ කෙනෙක් නොදක්නෙමි. ඊට වැඩි වූවෙක් කොහේ වේද? එසේවූ කල යම් මේ උසස් මිදීමක්වේද එහි මෙම අතිශයින් උතුම්වූයේ වෙමි.

**68.** කාශ්‍යපය, ශ්‍රමණ ගෞතම තෙම සිංහනාද, කෙරෙයි. ඒ නාදය ජනයා නැති ස්ථානයක තනිව හිඳ කෙරෙයි. පිරිස් මැද නොකෙරෙයි. 'අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහුය. යම්කාරණයක් ඇද්ද එසේවූ නමුත් ඔව්හු මෙසේ කියනු හැක්කෝ නොවන්නාහුමය කාශ්‍යපය, 'ශ්‍රමණ ගෞතම තෙම සිංහනාද කෙරෙයි. පිරිස් මැද නාද කෙරේයයි' මෙසේ කිය යුතු වන්නාහුය. "කාශ්‍යපය, ශ්‍රමණ ගෞතම තෙම සිංහනාද කෙරෙයි. පිරිස් මැද නාද කෙරෙයි. එහෙත් නිර්භයව නාද නොකෙරෙයි' අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ මෙසේ කියන්නාහුය යන යම් කාරණයක් වේද මේ කාරණය ඇත්තේමය. එසේවූ නමුත් ඔව්හු මෙසේ කියනු හැක්කෝ නොවන්නාහුය කාශ්‍යපය, 'ශ්‍රමණ ගෞතම තෙම සිංහනාද කෙරෙයි. පිරිස් මැද නාද කෙරෙයි, නිර්භයව නාද නොකෙරේයයි' මෙසේ කියනු හැක්කෝ නොවන්නාහුමය. කාශ්‍යපය, ශ්‍රමණ ගෞතම තෙම සිංහනාද කෙරෙයි. පිරිස් මැද නාද කෙරෙයි, නිර්භයව නාද කෙරෙයි. ඒ ශ්‍රමණ ගෞතමයන් අතින් පණ්ඩිත දිව්‍ය මනුෂ්‍යයෝ ප්‍රශ්න නොඅසත්, කාශ්‍යපය, ශ්‍රමණ ගෞතම තෙම සිංහනාද කෙරෙයි. පිරිස් මැද නාද කෙරෙයි, නිර්භයව නාද කෙරෙයි' ඒ ශ්‍රමණ ගෞතමයන් අතින් පණ්ඩිත දිව්‍ය මනුෂ්‍යයෝ ප්‍රශ්න නොඅසත්. ඔවුන් විසින් ප්‍රශ්න අසන ලද්දේ නොවිසඳයි. ඔවුන් විසින් ප්‍රශ්න අසන ලද්දේ විසඳයි. ප්‍රශ්න විසඳීමෙන් සිත් නොගනී. ප්‍රශ්න විසඳීමෙන් සිත් ගැනීමද කෙරෙයි. මොහුගේ වචන ඇසිය යුතුයයි නොහඟිත්. මොහුගේ වචන ඇසිය යුතුයයි හඟිත්. අසා නොපහදිත්, අසා පහදිත්. පැහැදුනු ආකාරයක් නොකෙරෙත්, පැහැදුනු ආකාරයක්ද කෙරෙත්. දෙසූ ධර්මය අනුව නොපිළිපදිත් දෙසූ ධර්මය අනුව පිළිපැදීමද කෙරෙත්.

දෙසූ ධර්මය සේ පිළිපදින්නාහු ශ්‍රමණ ගෞතමයන්ගේ හිත් නොගනිත්'යයි ඔව්හු මෙසේ කියයුත්තේ නොවන්නාහුය.

"අර්හත්වූ ශ්‍රමණ ගෞතම තෙම සිංහනාද කෙරෙයි. පිරිස් මැද නාද කෙරෙයි. විශාරදවද නාද කෙරෙයි. ඒ ශ්‍රමණ ගෞතමයන් අතින් පණ්ඩිත දිව්‍ය මනුෂ්‍යයෝ ප්‍රශ්න අසත්. ඔවුන් විසින් ප්‍රශ්න විචාරණ ලද්දේ විසඳීම කෙරෙයි. ප්‍රශ්න විසඳීමෙන් සිත් ගැණීම කෙරෙයි. ඔහුගේ වචන ඇසිය යුතු යයිද හඟිත්, අසාද පහදිත්, පැහැදුනු ආකාරය කෙරෙත්. දෙසූ ධර්මය සේ පිළිපදිත්, දෙසූ ධර්මය සේ පිළිපදින්නාහු ශ්‍රමණ ගෞතමයන්ගේ සිත් ගණිත්යයි,' කාශ්‍යපය, මෙසේ කිය යුත්තෝ වන්නාහුය.

**69.** "කාශ්‍යපය, මම එක් කාලයෙක්හි මෙහි රජගහනුවර සමීපයෙහිවූ ගිජු කුළු පර්වතයේ වාසය කෙළෙමි. එහි නිග්‍රොධ නම්වූ තපස් බ්‍රාහ්මණ ගුරුවරයෙක් අධිජෙගුච්ඡ වීර්යය පිළිබඳව මාගෙන් ප්‍රශ්න ඇසුවේය. ඔහු විසින් අධිජෙගුච්ඡ වීර්යයෙහි ප්‍රශ්න අසන ලද්දාවූ මම විසඳුයෙමි. මා විසින් විසඳූ කල්හි ඉතා වැඩියක්ම සතුටු සිත් ඇත්තේ වූයේයයි කීයේය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා කවරෙක් ඉතා වැඩියක් සතුටු සිත් ඇත්තේ නොවන්නේද? ස්වාමීනි, මමද භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා ඉතා වැඩියක්ම සතුටු සිත් ඇත්තේ වීමි. ස්වාමීනි, ධර්ම දේනාව ඉතා යහපත්ය, ස්වාමීනි, එය ඉතා යහපත්ය. ස්වාමීනි, යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වසන ලද්දක් එළිදරව් කරන්නේ හෝ, මංමුලාවෙකුට මාර්ගය කියන්නේ හෝ ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල් පහන් දරන්නේ හෝ යම්සේද, එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කාරණයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, භික්ෂු සංඝයාද සරණකොට යමි. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මහණකම ලබන්නෙමි, උපසම්පදාව ලබන්නෙමියි" කියාසිටියේය.

**70.** කාශ්‍යපය, අන්‍ය තීර්ථකවූ යමෙක් මේ ශාසනයෙහි මහණ වීමට කැමති වේද උපසම්පදාවට කැමති වේද ඔහු මාස හතරක් පුරුදුවීම (පිරිවෙස් කෙරේ. හාර මාසයක් ගතවූකල සතුටුකරණු ලැබූ භික්ෂූහු ඔහු මහණ කෙරෙත්, භික්ෂු භාවය පිණිස උපසම්පදා කෙරෙත්. එසේ නමුත් මවිසින් මෙහි පුද්ගල වෙනස දක්නා ලද්දේයයි කීසේක.

"ස්වාමිනි, ඉදින් අන්‍ය තීර්ථකවරු මේ ශාසනයෙහි මහණ වීමට කැමති වන්නෝද ඔහු මාස හතරක් පුරුදු කරත්ද, මාස හතරක් ගතවීමෙන් සතුටු වනලද සිත් ඇති භික්ෂූහු ඔහු මහණ කරද්ද, භික්ෂු භාවය පිණිස උපසම්පදා කරත්ද මම අවුරුදු හතරක් පිරිවෙස් කරමි. අවුරුදු හතරක් ගතවීමෙන් සතුටු වන ලද සිත් ඇති භික්ෂූහු මා පැවිදි කෙරෙත්වා. භික්ෂු භාවය පිණිස උපසම්පදා කෙරෙත්වා"යි කීයේය.

අචෙල කාශ්‍යප තෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මහණකම ලැබුයේමය. උපසම්පදාවද ලැබුයේමය. මෑත උපසම්පදාවූ ආයුෂ්මත් කාශ්‍යප තෙම, තනිවූයේ, සමූහයාගෙන් තොරවූයේ, අප්‍රමාද වූයේ කෙලෙස් නැති කරණ වීර්ය ඇත්තේ ආත්ම ආශාව පහකර වාසයකරන්නේ යමක් සඳහා කුලපුත්‍රයෝ ගිහිගෙයින් නික්ම ශාසනයෙහි හොඳාකාර මහණ වෙත්ද බ්‍රහ්මචර්යාව කෙලවර කොට ඇති උත්තමවූ ඒ අර්හත් භාවයට නොබෝ කලකින් පැමිණ තමන්ගේ මේ ජීවිතයෙහි උසස් ඥානයෙන් දැන අවබෝධ කොට වාසය කෙළේය. උත්පත්තිය නැතිවිය. මාර්ග බ්‍රහ්මචර්යාව වාසය කොට අවසාන කරණ ලද්දීය. කළයුතු දේ කොට අවසාන විය, මින්පසු කළයුතු අනිකක් නැත්තේ යයි දැන ගත්තේය. ආයුෂ්මත් කාශ්‍යප තෙම රහතන් වහන්සේලාට ඇතුළත් කෙනෙක්ම වූයේය.

**අටවෙනිවූ කස්සප සිහනාද සූත්‍රය නිමියේය.**

# 9. පොට්ඨපාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. (මාගේ ඇසීම මෙසේය.) එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඩු මහසිටාණන් විසින් කරවා පිළිගන්වන ලද දෙව්රම් වෙහෙර වාසය කළහ. එකල්හි පොට්ඨපාද නම් පරිබ්‍රාජක තෙම සමයප්පවාදක*' නම්වූ (තිඹිරිගස් වලින් වටවූ) තින්දුකාචිර† 'එකසාලක' නම්වූ මල්ලිකා ආරාමයෙහි තුන් දහසක් පරිබ්‍රාජකයන් ඇති මහත් පරිබ්‍රාජක පිරිස සමග වාසය කෙරෙයි.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි ඇඳ පොරවා සිවුරු හා පාත්‍රය ගෙන සැවැත් නුවරට පිණ්ඩ පාතය පිණිස පිටත්වූහ. එවිට භාග්‍යවතුන් වහන්සේට මෙවැනි සිතක් පහළවිය. සැවැත් නුවර පිණ්ඩපාතය පිණිස හැසිරීමට කල් වැඩිවෙයි. එබැවින් ඉදින් මම සමයප්පවාදක නම්වූද, තින්දුකාචිර නම්වූද, එකසාලක නම්වූද මල්ලිකා ආරාමය යම් තැනෙක්හිද පොට්ඨපාද පරිබ්‍රාජක තෙම යම් තැනෙක්හිද එතනට එළඹෙන්නෙම් නම් ඉතා යහපතැයි' කියායි. එවිට භාග්‍යවතුන් වහන්සේ 'සමයප්පවාදක'නම්වූද තින්දුකාචිර නම්වූද එකසාලක නම් වූද මල්ලිකා ආරාමය යම් තැනෙක්හිද එතනට පැමිණිසේක.

3. ඒ කාලයෙහි පොට්ඨපාද පරිබ්‍රාජක තෙම විශාල පරිබ්‍රාජක පිරිසක් සමග උස් මහත් හඬින් මහත්සේ නාද කරමින් නොයෙක් පහත් කථා කරමින් සිටියේය. එනම්:- රජ දරුවන් ගැන කථාය, සොරුන් ගැන කථාය, මහ ඇමැතියන් ගැන කථාය, සේනා ගැන කථාය, භය ඇති කරන කථාය, යුද්ධ ගැන කථාය, ඇඳුම් ගැන කථාය, ඇඳන් ගැන කථාය, මාලාගැන කථාය, සුවඳවර්ග ගැන කථාය, නෑදෑයින් ගැන කථාය, රථ ගැන කථාය, ගම් ගැන කථාය, නියම් ගම් ගැන කථාය නගර ගැන කථාය, ජනපද ගැන කථාය, ස්ත්‍රීන් ගැන කථාය, යෝධයින් ගැන කථාය, වීථි ගැන කථාය, කුම්භ ස්ත්‍රීන් ගැන කථාය, මැරුණු නෑයන් ගැනකථාය, නොයෙක් අර්ථ නැති කථාය, ලෝකය ගැන කථාය,

* රැස්වී කථාකරණ ස්ථානය † එකම ශාලාවක් වැනිවූ

මුහුදු ගැන කථාය, මෙසේ දියුණුව වෙයි. මෙසේ පිරිහීම වෙයි. යනාදීන් නිරර්ථක කරුණු දක්වමින් කරන කථායයි මෙසේ පැවති කථායි.

4. පොට්ඨපාද පරිබ්‍රාජක තෙම එහි පැමිණෙන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දුටුයේය. දැක ස්වල්ප ශබ්ද ඇත්තෝ වව්, පින්වත්හු ශබ්ද නොකරව්, මේ ශ්‍රමණ ගෞතම තෙම එයි. ඒ ආයුෂ්මත් තෙම ශබ්දයට නොකමැත්තේ ශබ්ද නොකිරීමෙහි ගුණ කියන ස්වභාවය ඇතිවූයේ වෙයි. පිරිස ශබ්ද රහිත වූවා දැන පැමිණිය යුතුයයි සිතන්නේ නම් යහපතැයි" තමන්ගේ පිරිස හික්මවාලූයේය. මෙසේ කී කල්හි ඒ පරිබ්‍රාජකයෝ නිශ්ශබ්දවූහ.

5. එවිට භාග්‍යවතුන් වහන්සේ පොට්ඨපාද පරිබ්‍රාජක තෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියෝය. එකල්හි පොට්ඨපාද පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය දැනුම් දුන්නේය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මෙහි වඩිනා සේක්වා ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ පැමිණීම යහපත්ය. භාග්‍යවතුන් වහන්සේගේ පැමිණීම අපට ප්‍රීතියකි ස්වාමීනි, මෙහි යම් මේ පැමිණීමක් වීනම් මේ පැමිණීම භාග්‍යවත් තෙම බොහෝ කලකින් කෙළේය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, වැඩහිඳිනා සේක්වා. මේ ආසනය පණවන ලද්දේය." කියායි.

භාග්‍යවතුන් වහන්සේ පණවනලද ආසනයෙහි වැඩහුන් සේක. පොට්ඨපාද පරිබ්‍රාජක තෙමේද එක් පහත් ආසනයක් ගෙන එකපැත්තක උපන්නේය. එකපැත්තකටවී උන්නාවූ පොට්ඨපාද පරිබ්‍රාජකයාගෙන් භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය ඇසුවේය. "පොට්ඨපාදය, දැන් මෙහි කුමන කථාවකින් යුක්තවද උන්නහුද, කිනම් කථාවක් කරමින් සිට අතරතුර නැවැත්තුවාහුද?"

6. මෙසේ කීකල පොට්ඨපාද පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේට මේ වචන කීවේය. "ස්වාමීනි, අපි දැන් යම්

කථාවකින් යුක්තව උන්නමෝද, ඒ කථාව තිබුණාවේ. ස්වාමීනි මේ කථාව භාග්‍යවතුන් වහන්සේට පසුවත් අසන්ට අපහසු නොවේ. ස්වාමීනි, පසුගිය දවස්වල 'මෙතෙම කුමක් කියාද මේ තෙම කුමක් කියාදැ'යි අසනු කැමති කථා පවත්නා බැවින් කොතුහලක නම්වූ ශාලාවක රැස්ව උන්නාවූ නොයෙක් තීර්ථකයන් හා මහණ බමුණන් අතර පින්වත කෙසේ (සංඥා නිරොධය) හැඟීම් නැතිවීම වේදැයි, සංඥා නිරොධ (ඇඟීම නිරුද්ධවීම) පිළිබඳ කථාවක් පහළවිය. එහි සමහරු මෙසේ කීහුඃ 'පුරුෂයාගේ හැඟීම හේතුවක් ප්‍රත්‍යයක් නැතුව උපදින්නාහුද බිඳීයන්නාහුද වෙත් යම් කලක ඇඟීම් උපදින්නාහුද එකල ඇඟීම් සහිත වේ. යම්කලක නූපදින්නාහුද එකල ඇඟීම් නැත්තෙක් වේය'යි මෙසේ සමහරු ඇඟීම් නැතිවීම ප්‍රකාශ කෙරෙත්. ඔහුට අනිකෙක් මෙසේ කියයිඃ 'පින්වත, මේ කාරණය වනාහි මෙසේ නොවන්නේය. පින්වත, ඇඟීම් පුරුෂයාගේ ආත්මය වෙයි. ඒ ඇඟීම් ඉවත්වන්නේද පැමිණෙන්නේද වෙයි. යම් කලක ඇඟීම ඉවත් වන්නේද, එකල ඇඟීම් නැත්තෙක් වෙයි. යම් කලක ඇඟීම පැමිනෙන්නේද එකල ඇඟීම ඇත්තෙක් වේය'යි මෙසේ සමහර කෙනෙක් ඇඟීම් නිරොධය ප්‍රකාශ කරත්. ඔහුට අනිකෙක් මෙසේ කියයි. "පින්වත, මේ කාරණය වනාහි මෙසේ නොවන්නේය. මහත් ඍද්ධි ඇති මහත් ආනුභව ඇති මහණ බමුණෝ ඇත්තාහුය. ඒ මහණ බමුණෝ මේ පුරුෂයාගේ හැඟීම මේ පුරුෂයාය වෙතට අදිත්. මේ පුරුෂයාගෙන් ඉවතට අදිත්. යම් කලක පුරුෂයා වෙතට, අදිත්ද, එකල පුරුෂයා හැඟීම් ඇත්තේ වේ. යම් කලක ඉවතට අදිත්ද එකල පුරුෂයා ඇඟීම් රහිත වේය'යි මෙසේ සමහරු ඇඟීම් නිරොධය ප්‍රකාශ කරත්. ඔහුට අනිකෙක් මෙසේ කියයි පින්වත, මහත් ඍද්ධි ඇත්තාවූ මහානුභාව ඇත්තාවූ දේවතාවෝ ඇත්තාහුය. ඒ දේවතාවෝ මේ පුරුෂයාගේ ඇඟීම් මේ පුරුෂයා වෙතට අදිත්. මේ පුරුෂයාගෙන් ඉවතටද අදිත්. යම් කලක පුරුෂයා වෙතට අදිත්ද එකල ඇඟීම් ඇත්තේ වෙයි. යම් කලක ඉවතට අදිත්ද එකල ඇඟීම් රහිත වේ'යයි මෙසේ සමහරු ඇඟීම් නිරොධය ප්‍රකාශ කෙරෙත්. එකල්හි සුගතවූ භාග්‍යවතුන්

වහන්සේ මේ කාරණයන්හි ඉතා දක්ෂ නොවේදැ'යි මට භාග්‍යවතුන් වහන්සේ මතක්විය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ඇඟීම් නිරොධය කිරීමෙන්ම දන්නාසේක. ස්වාමීනි, කෙසේ නම් ඇඟීම් නිරෝධය වේදැයි ඇසුවේය.

7. "පොට්ඨපාදය, යම් ඒ මහණ බමුණෙක් පුරුෂයාගේ ඇඟීම හේතුවක් ප්‍රත්‍යයක් නැතුවක් ප්‍රත්‍යයක් නැතුව උපදිත්යයිද, නිරුද්ධ වෙත්යයි කියත් නම් ඔවුන් විසින් පළමුකොට අපරාධයක් කරණ ලද්දේය. ඊට හේතු කවරේද? පොට්ඨපාදය, පුරුෂයාගේ හැඟීම හේතු ප්‍රත්‍යය සහිතවම උපදින්නාහුද නවතින්නාහුද වෙත්. හික්මීමෙන් සමහර ඇඟීම් උපදිත්. හික්මීමෙන් සමහර ඇඟීම් නවතිත්. හික්මීම කුමක්දැයි ඇසුවේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ කීය.

"පොට්ඨපාදය, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනාඥානය ආදී විද්‍යා අට සීල සංවරය ආදී හසුරුවන ධර්ම පහළොව යන අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙව් මිනිසුන්ට ගුරුවරයෙක්වූ, (චතුරාර්ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්මසතර අවබොධකළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් සහ මිනිසුන් සහිතවූ, සත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැක පැහැදිලි කොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, අර්ථ සහිතවූ, දස ආකාරයෙන් නියම විදියට වචන ශබ්ද කරන්නාවූ (ව්‍යඤ්ජන සහිත) සියලු ලෙසින් සම්පූර්ණ, පිරිසිදු සියලු ශාසනමාර්ග බ්‍රහ්මචර්යාව ගෙන හැර දක්වති.

8. "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති

කෙරෙයි, ඔහු ඒ ශ්‍රද්ධායෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය 'ගෘහවාසය පීඩා සහිතයි. රාගාදී කෙලෙස් සහිත මාර්ගයෙකි. මහණකම වනාහී කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම හිසකෙස් දැලිරැවුලු කපාදමා සිව්රු හැඳ පොරවා ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැ'යි කියායි.

"ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාසිය හැර, ස්වල්පවූ හෝ බෙහෝවූ නෑ පිරිස් හැර, හිසකෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වේද, මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවරසීලයෙන් යුක්තවූයේ, යහපත් හැසිරීමෙන් හා වරද නැති පැවැත්මෙන් යුක්තවූයේ, ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භය දක්නා ගති ඇත්තෙක් වූයේ, යහපත්වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්තවූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ ජීවිත නැවතුම් ඇත්තේ වෙයි. ශීලයෙන් යුක්තවූයේ වෙයි. ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේ වෙයි, කෑමෙහි පමණ දන්නේ වෙයි, යහපත් සිහියෙන් හා නුවණින් යුක්තවූයේ වෙයි. සන්තෝෂයෙන් යුක්තවෙයි.

**9.** "පොට්ඨපාදය, භික්ෂුනමක් කෙසේ නම් සීලසම්පන්න වේද? පොට්ඨපාදය, මේ සස්නෙහිවූ භික්ෂු නමක් ප්‍රාණවධය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද ආයුද ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ කරුණාවන්තවූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතුව වාසය කෙරේද මෙයද ඔහුගේ සීලයක්වේ. නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමතිවන්නේ, සොරනොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේද, මෙයද ඔහුගේ ශීලයෙකි. අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාමධර්මයෙන් වෙන්වූයේ

බ්‍රහ්මචාරීවේද මෙයද ඔහුගේ ශීලයකි. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ මෙයද ඔහුගේ ශීලයෙකි. පිසුණු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද, මෙසේ භෙදවූවන් ගළපන්නේ සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ තෙපුල් කියන්නේද මෙයද ඔහුගේ ශීලයෙකි, ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, යම් වචනයක් නිදොස් වේද, කණට සැපද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේ වේද මෙයද ඔහුගේ එක් ශීලයෙකි. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේද, කාලයට සුදුසු කථා කරන්නේද, සිදුවූ තෙපුල්ම කියන්නේද, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කියන්නේද, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේද මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්මද දියුණුවට හේතුවන වචන කීමද, මෙයද ඔහුගේ ශීලයෙකි.

"තණ, ගස්, වැල්, සිඳීම් බිඳීම්, ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේද, එක්වේලේ වළඳනකෑම ඇත්තේද, රාත්‍රිකෑමෙන් හා අවේලෙහි කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේද, නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේද, මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම්, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් සම්පූර්ණයෙන්, වැළැක්කේද, උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේද, රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් වැළැක්කේද, අමුවූ ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් සම්පූර්ණයෙන්

තොරවූයේද, අමුමස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනුලමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද වේ. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොර වූයේද, එළුවන් හා තිරෙළුවන් පිළිගැන්මෙන් තොරවූයේද, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද, සම්පූර්ණයෙන් තොර වූයේයද, ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේද, ගනු දෙනු කිරීමය, තරාදි ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මිශ්‍රා වඤ්චා කිරීමය, වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළක්කේද, කැපීමය, මැරීමය, බැඳීමය, සැගවී සිට වස්තු පැහැරගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය, යන මෙයින්ද සම්පූර්ණයෙන් වැළකීයිද, මෙයද ඔහුගේ ශීලයක්වේ.

**සුලු සීලය නිමියේය.**

**10.** "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මූල බීජය, ඛන්ධබීජය, එළුබීජය, දලුබීජය, පස්වැනිවූ බීජබීජය යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේ නම් මෙයද ඔහුගේ එක් ශීලයෙක් වේ.

''එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, නොඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛ්‍යාත වහන් දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත් කොට තබා ප්‍රයෝජන ගැන්මයයි කියනලද පසුවට තබා ප්‍රයෝජන ගැන්මෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ සන්නිධිකාර

පරිභොගයෙන් වැළකී වෙසේද, මෙයද ඔහුගේ ශීල සම්පත්තියකි.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, වැඩක් නැති කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනි නැංවීමය, සතරැස් හෝ කළ බෙර හෝ කළබෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණදොවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මීවුන් හා පොරය, ගවයින් හා පොරය, එළුපොරය, මෙණ්ඩක එළුපොරය, කුකුළුපොරය, වටුපොරය, දඬු (පොලු) පොරය, තොරතුරු (අත මිටමොලවා) ඇනීමය, මල්ලව යුද්ධය, යුද්ධය, ඇත් අස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත්ද මෙසේ මෙබඳු විසුලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකේද, මෙයද ඔහුගේ ශීල සම්පත්තියකි.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙනලද කෑම කා (දූ පෝරු ආදිහි කෙළිම්වූ) ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටමිටි ගසා ඇත් අස් ආදී රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, නළා පිඹීමය, ක්‍රීඩා නඟුල් ගෙන සෙල්ලම් සීසෑම්ය. කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන්ගුරුවා තනා ක්‍රීඩාකිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැණ කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය. ඒ ඒ දෝෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්ද මෙසේ මෙබඳුවූ කෙළියෙන් සම්පූර්ණයෙන් වැළකීද, මෙයද ඔහුගේ ශීල සම්පත්තියකි.

11. එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දික්හගලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇතිරිය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළුලොම් සුදු ඇතිරිය, එළුලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදී රූපයෙන් විසිතුරු එළුලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති ඇතිරිය. දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය, රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එක්විට නැට්ටුක්කාරියන් දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහ ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරන ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබනලද රතුපාට කොට්ට ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කෙරෙත්ද මෙසේ මෙබඳුවූ උස් අසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වළකීද, මෙයද ඔහුගේ ශීල සම්පත්තියකි.

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, මූන බලන කන්නාඩි, අඳුන් තෙල් පාවිච්චිය හා සුවඳ, මූණේ ගානා සුවඳ කුඩු, මූණේ ගානා සුවඳ ද්‍රව්‍ය, අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය, විසිතුරු දඬුගෙන හැසිරීමය, බෙහෙත් නළ එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙන යෑම, විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය. නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය, දික්වූ දහවලු ඇති සුදුරෙදි ඇඳීමයයි මෙසේවූ සැරසීම් හා අඩුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්ද මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වවළකීද මෙයද ඔහුගේ ශීලයෙකි.

12. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය මහ ඇමතියන් පිළිබඳ කථාය, සෙනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය,

මාලා පිළිබඳ කථාය, ගන්ධ ද්‍රව්‍යයන් පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි දරුවන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ තේරුම් නැති කථාය, ලොකය පිළිබඳ කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්ද මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වළකීද මෙයද ඔහුගේ ශීලසම්පත්තියකි.

13. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්මවිනය දනිමි' 'ඔබ මේ ධර්මවිනය කුමකැයි දන්නෙහිද? ඔබ වරදවා පිළිපදින්නෙහිය, මම මනාකොට පිළිපදින්නේ වෙමි'. 'මාගේ වචන යහපත්ය, හෝ අර්ථ සහිතය, ඔබගේ වචන අර්ථ රහිතය' පළමු කිය යුත්ත පසුව කියෙහිය. පසුව කිය යුත්ත පළමුව කීයෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදුකරණ ලද නම් ඒ සියල්ල නිෂ්ඵල විය. ඔබට වාදාරොපනය කරණ ලදී. නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව' යන ආදී දෝෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්ද, මෙසේ මෙබඳු දෝෂාරොපණ කථාවෙන් සම්පූර්ණයෙන් වළකීද මෙයද ඔහුගේ ශීලසම්පත්තියකි.

14. "එසේ සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියන්ගේ, බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යව අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යව, එතැනින් අසවල් දෙය ගෙණෙව'යි දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්ද මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වළකීද මෙයද ඔහුගේ ශීලසම්පත්තියකි.

15. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා කුහකයෝද, සිව්පසය උදෙසා කථා කරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන් කරන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද ලාභයකින් ලාභයක් සොයන්නෝද වෙත් මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග ආදියෙන් වළකීද මෙයද ඔහුගේ ශීලසම්පත්තියකි.

**මැදුම් සිල් නිමියේය.**

16. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, හෙන ගැසීම ආදී මහ නිමිතිබලා කියන ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන ශාස්ත්‍රය, ගිනිදෙවියා පිදීමය, දබ්බිහොමය, ථුස හොමය, තණ්ඩුල හොමය, කණ හොමය, සප්පි හොමය, තෙල හොමය, මුඛ හොමය, ලේ හොමය, ශරීර විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි සාන්ති කරන්නාවූ විද්‍යා, භූත විද්‍යා, නාග විද්‍යා. විෂ විද්‍යා, ගෝනුසු විද්‍යා, මී විද්‍යා, කුරුළු විද්‍යා, කරයි විද්‍යා ජීවිත කාලය කීම, ආයුධ වැළැක්ම, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා හේතුකොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්ද මෙසේ මෙබඳු පහත් විද්‍යා හේතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ ශීල සම්පත්තියකි.

17. "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මිණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය, ස්ත්‍රීලක්ෂණය, පුරිස ලක්ෂණය, පිරිමිදරු ලක්ෂණය, ගැනුදරු ලක්ෂණය, දාසලක්ෂණය, දාසිලක්ෂණය, ඇත්ලක්ෂණය අශ්ව ලක්ෂණය, කැස්බෑලක්ෂණය, එළුලක්ෂණය, මීහරක්ලක්ෂණය ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය. කුකුළු ලක්ෂණය, වටු ලක්ෂණය, තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය, මුව ලක්ෂණයයි, මෙබඳු පහත් විද්‍යාවන් කරණ කොට ගෙණ, වැරදි ජීවිකාව කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි

ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ ශීලසම්පත්තියකි.

18. "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැර යෑම වන්නේය. අසවල් දින ඇතුළු නුවරට එන්නේය. අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඒම වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හේතුකොට ලාමක ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ ශීලසම්පත්තියක් වේ.

19. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'චන්ද්‍රග්‍රහණය වන්නේය, සූර්ය‍ග්‍රහණය වන්නේය තාරකා සමාගමය වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමග යෑම වන්නේය, තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය, තාරකාවන්ගේ නොමග යෑම් වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළොව කම්පාව වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ, හිරු තාරකාවන්ගේ නැගීම හා බැහීමද කෙළෙසීමද පිරිසිදු වීමද වන්නේය, චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය, චන්ද්‍ර සූර්යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇති වන්නේය, ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇති වන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය, දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි

කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම මෙබඳු විපාක ඇති වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටුවීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇතිවන්නේයයි' කියා මෙසේ පහත් විද්‍යා හේතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හේතුකොට ගෙණ කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ ශීල සම්පත්තියකි.

**20.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය, යහපත් ආහාරපාන ඇතිවන්නේය, ආහාර පාන නැති වන්නේය, නිර්භය ඇතිවන්නේය, භය ඇතිවන්නේය, රොග ඇතිවන්නේය, නිරෝගි බව ඇතිවන්නේයයි' කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන් කිරීමය, කොටස්කර ගණන්කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණකොට වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ ශීලසම්පත්තියකි.

**21.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථාකිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇතිකිරීමය, දුර්ගර්භකරණය, ගර්භවිරොධිකරණය, දිව් තද කිරීමය, නූල් බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජපකිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්න ඇසීමය, ගෑනුදරුවන්ගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණය කොට ප්‍රශ්න ඇසීමය, හිරු වැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම් කිරීමය, කටින් ගිනිදැල් පිටකිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ ශීල සම්පත්තියකි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**22.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීම, කාර්යය සමෘද්ධිය කටයුතු කර්මය, මන්ත්‍ර කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මූන සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩු කය විරේකය, යටිකය විරේකය, හිස විරේකය, කන්තෙලය, ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍ය කිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකමය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකම්ය, මූලික බෙහෙත් දීමය, සැර බෙහෙත්දී පසුව එහි බල හැරීමය, කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට වැරදි ජීවත්වීමෙන් ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්මක් නම් මෙයද ඔහුගේ ශීල සම්පත්තියයි.

**23.** පොට්ඨපාදය, මෙසේ ශීලසම්පන්නවූ භික්ෂුහට භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ ශීලසංවරය හෙතු කොට ගෙණ කිසි තැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:- පොට්ඨපාදය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම, පොට්ඨපාදය, ශීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ශීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය. ආර්යවූ (උතුම්වූ) මේ ශීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂු තෙම, තමන් තුළ පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. පොට්ඨපාදය, මෙසේ දැක්වූ ශීලයෙන් යුක්තවූ භික්ෂුව ශීලසම්පන්න නම් වේ.

පොට්ඨපාදය, මේ වනාහි ශීලසම්පත්තියයි.

**මහ සිල් නිමියේය.**

**24.** "පොට්ඨපාදය, භික්ෂුව කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේද? පොට්ඨපාදය, මේ සස්නෙහි භික්ෂුතෙමේ, ඇසින් රූපයක් දැක එහි නොඇලේද එහි නොපෙළඹෙන්නේද,

ඇස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදීද, ඔහු තමාගේ ඇස් ඉන්ද්‍රියය රකී, ඇස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. කන් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ කන් ඉන්ද්‍රියය රකී. කන් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. නාසයට ගඳ සුවඳ දැනී එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. නාස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ නාස් ඉන්ද්‍රියය රකී. නාස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. දිව් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. දිව් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ශරීර ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ ශරීර ඉන්ද්‍රියය රකී. ශරීර ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. සිතින් (ධර්මයක්) අරමුණක් දැන එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. සිත් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් නිසා දැඩි ආසාව හා කලකිරීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. හෙතෙම සිත් ඉන්ද්‍රිය රකී. සිත් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ භික්ෂුව උතුම්වූ ශීල රාශියෙන් යුක්තවූයේ අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ අධිචිත්ත සැපය විඳියි. පොට්ඨපාදය, මෙසේවූ භික්ෂු තෙමේ ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තේ වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**25.** "පොට්ඨපාදය, භික්ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද?

"පොට්ඨපාදය, මේ සස්නෙහි භික්ෂුතෙම ඉදිරියට යෑමෙහිද, ආපසු යෑමෙහිද, නුවණින් දැන කරන්නේය. ඉදිරි බැලීමෙහිද, වටපිට බැලීමෙහිද නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහිද දිගු කිරීමෙහිද මනා නුවණින් දැන එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන එසේ කරන්නේය අනුභව කිරීමය, පානය කිරීමය, වැළඳීමය, රස විඳීමය, යන මෙහිද මනා නුවණින් යෙදී එසේ කරන්නේය. මල මුත්‍ර පහකිරීම්ද නුවණින් (ආදිනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්දව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. පොට්ඨපාද, මෙසේ කරන්නාවූ භික්ෂු තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි.

**26.** "පොට්ඨපාදය, භික්ෂු තෙමේ කෙසේ සතුටු වූයේ වේද?

"පොට්ඨපාදය, භික්ෂුතෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද, සතුටු සිත් ඇත්තේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳවූ දේ) පමණක් ගෙන යයි. පොට්ඨපාදය, යම්සේ පක්ෂියෙක් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, පොට්ඨපාදය, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය ආරක්ෂාවට ප්‍රමාණවූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු වන්නේ වේ. ඔහු යම් තැනක යා නම් අටපිරිකර පමණක් රැගෙණ බැහැර යයි. පොට්ඨපාදය, මෙසේවූ භික්ෂු තෙමේ සන්තෝෂයෙන් යුක්ත වේ.

**27.** "උතුම්වූ මේ ශීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, මේ උතුම්වූ සන්තොෂයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, කඳු පලාත්ද කඳුරැලි ගල්ගුහාවන් හෝ මහා මගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ

ඉඩකඩ ඇති තැන් සහ තණ ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය කෙරේද, ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළැක්කේ, පර්යංකය බැඳ, කකුල් අකුලුවා හිඳ ශරීරයේ උඩු කොටස කෙලින් තබා නිවණෙහිම සිත එළවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවාගෙණ හිඳී.

**28.** "ඔහු ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේද ලොභ සිත වෙන් කොට පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව පණ ඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසයකෙරේද, ක්‍රොධ දොෂයෙන් වෙන්ව සිත පිරිසිදු කෙරේද, කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේද, අලස බව දුරුකොට සිත පිරිසිදු කෙරේද, උඩඟු බව හා කුකුස දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේද, ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, සිත උඩඟු බව හා කුකුසෙන් පිරිසිදු කෙරේද, විචිකිච්ඡාව (සැකය) දුරුකොට, පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේද; විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේද,

**29.** "පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් ණය ගෙන කර්මාන්තයන්හි යොදන්නේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණුවන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් ආරක්ෂා කරණ පිණිස වැඩි යමක් ඉතුරුවූයේ නම් ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. 'මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පොෂ්‍ය කිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

**30.** "පොට්ඨපාදය, යම්සේ රෝගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේද, ඔහුට ආහාර රුචි නොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක්

නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇතිවන්නේ නම්, ඔහුගේ ශරීර බලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳුද යත්: 'මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන් බව ඇති කෙනෙක් වීමි. මට බත් රුචියද නොවීය, ශරීර බලයද නැතිවිය, ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය. කාය බලයද තිබේය' කියායි. ඔහු ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසටද පැමිණෙන්නේය.

**31.** "පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසු කලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සතුටටද, පැමිණෙන්නේය.

**32.** "පොට්ඨපාදය, යම් සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත්වූ තමා කැමති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි, වැඩකරුවෙක් (දාසයෙක්) වන්නේද, ඔහු පසු කලක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: මම පෙර සිය කැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් මා අදහස් පරිදි කිසි තැනෙක යානොහැකි දාසයෙක් වීමි, ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපති කොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත්නූන කෙනෙක් වීමි. අනුන්ට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමති තැනෙක යා හැක්කේද වෙමි'යි කියායි. ඔහු ඒ දාසභාවයෙන් මිදීම හේතුකොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

**33.** "පොට්ඨපාදය, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේද, ඔහු මඳ කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොර සතුරන්ගෙන් පීඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්ඃ 'මම පෙර ධනවත් වූයෙමි. භෝග සම්පත් සහිත වූයෙමි. දුර්ලභ භික්ෂා ඇති භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණියෙක් වූයෙමි. එසේවූ මම දැන් එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගය එතර කිරීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සතුටටද පැමිණෙන්නේය.

**34.** "පොට්ඨපාදය ණයයම්සේද, රෝගය යම්සේද, හිරගේ යම්සේද, දාසභාවය යම්සේද, දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂු තෙමේ පහනොකළ (පඤ්චනීවරණ) කුසල් වළක්වන කරුණුපහ තමා කෙරෙහි ලා නුවණින් දකීද පොට්ඨපාදය, ණය නැති බව යම්සේද, නිරෝග බව යම්සේද, සිරගෙන් මිදීම යම්සේද, අනුන්ට යටහත් නැති බව යම්සේද, භය නැති භූමිය යම්සේද, එපරිද්දෙන්ම පොට්ඨපාදය, භික්ෂු තෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ නැති බව නුවණින් දක්නේය.

**35.** "පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ භික්ෂුහට සතුටු ආකාරය උපදී. සතුටු වුවහුට ප්‍රීතිය උපදී ප්‍රීතිසහගත සිත් ඇත්තහුගේ නාම කය (වේදනාදී ස්කන්ධ හතර) සංසිඳෙයි, සංසිඳිනු කය ඇති තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) පැමිණෙයි.

**36.** "ඒ භික්ෂු තෙමේ වස්තුකාම ක්ලෙශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුල ධර්මයන් කෙරෙන්ද වෙන් වූයේම අරමුණෙහි සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම සහිතවූ සිතෙහි විවේකයෙන් උපන් ප්‍රීතියම සැපකොට ඇති, පළමුවෙනි

ධ්‍යාන කුසල චිත්තය තමා තුළ ඉපදවීම් වසයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරෙයි.

**37.** ඔහුගේ යම් පළමු පැවති කාම හැඟීමක් වේද ඒ කාම හැඟීම නැතිවෙයි. ඒ ප්‍රථම ධ්‍යාන කාලයෙහි විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති කාම හිත් ආදීවූ බරපතල කොටස් පහකිරීමෙන් ලබනලද සියුම් හැඟීම් ඇති වෙයි. ඒ ප්‍රථම ධ්‍යාන කාලයෙහි විවේකයෙන් හටගන්නාවූ ප්‍රීතිය හා සැප ඇති කාමහිත් ආදීවූ බරපතල කොටස් පහ කිරීමෙන් සියුම්වූ හැඟීම් ඇත්තෙක් වූයේම වෙයි. මෙසේ හික්මීම වන ප්‍රථම ධ්‍යානයෙන් සමහර හැඟීමක් උපදී මෙසේ හික්මීම වන ප්‍රථම ධ්‍යානයෙන් සමහර හැඟීමක් නැතිවෙයි. මීට භාග්‍යවතුන් වහන්සේ හික්මීමයයි කීසේක.

**38.** "පොට්ඨපාදය, නැවතද භික්ෂුතෙම (විතර්ක) අරමුණට සිත පැමිණවීම, (විචාර) අරමුණෙහි සිත හැසිරවීම යන දෙකේ සංසිඳීමෙන් තමා තුළ ඒ දෙකින් කැළඹීමක් නැත්තාවූ හිතේ පැහැදීම කරන්නාවූ සිත එකග කරන සමෘද්ධීන් වඩන්නාවූ විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති දෙවෙනි ධ්‍යානය උපදවා වාසය කෙරේද, ඔහුගේ යම් පළමු පැවති විවේකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපයෙන් යුක්තවූ ඖදාරිකංගයන්ගේ ප්‍රහාණයෙන් සියුම්වූ හැඟීමක් ඇත්තීද ඒ හැඟීම නවතියි ඒ දෙවෙනි ධ්‍යාන කාලයෙහි සමාධියෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපයෙන් යුක්තවූ සියුම්වූ හැඟීම ඇත්තේ වූයේම වෙයි. මෙසේද ශික්ෂා සංඛ්‍යාත දෙවැනි ධ්‍යානයෙන් වෙනත් හැඟීමක් උපදියි. වෙනත් හැඟීමක් නතර වෙයි. මෙයද හික්මීමය"යි භාග්‍යවතුන්වහන්සේ වදාළසේක.

**39.** "පොට්ඨපාදය, නැවතද භික්ෂුතෙම ප්‍රීති ඉක්මීමෙන් උපේක්ෂා අතුරෙන් ධ්‍යාන උපෙක්ෂාව ඇත්තේ සිහියෙන් සහ ප්‍රඥාවෙන් යුක්තව වාසය කෙරේද, නාම කායයෙන් ධ්‍යාන සැපයද විඳී. යම් ධ්‍යානයක් හේතු කොටගෙන ධ්‍යාන උපෙක්ෂාවෙන් යුක්තවූ සිහිඇත්තෙක, සැප ඇත්තෙකැයි ආර්ය පුද්ගලයෝ කියත්ද, ඒ තුන්වෙනි ධ්‍යානයෙන් යුක්ත පුද්ගලයා

ඒ තුන්වෙනි ධ්‍යානය උපදවා වාසය කෙරෙයි. ඔහුගේ යම් පළමු සමාධියෙන් උපන්නාවූ ප්‍රීති සැපය ඇතුව සියුම් හැඟීමක් ඇතිවීද ඒ හැඟීම නවතියි. ඒ තුන්වෙනි ධ්‍යානකාලයෙහි පළමුවෙන් තිබුණු සමාධියෙන් හටගත් ප්‍රීතිසුවය ඇති සියුම් නොවූ හැඟීම දුරුවෙයි. ධ්‍යාන උපෙක්ෂා සැපය ඇති සියුම් සංඥාව උපදියි. මෙසේද ශික්ෂායෙන් ඇතැම් හැඟීමක් උපදී. ඇතැම් හැඟීමක් දුරුවෙයි. මෙයද ශික්ෂාය"යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

**40.** "පොට්ඨපාදය, නැවතද භික්ෂුතෙම සැප වෙදනාව දුරුකිරීමෙන්ද දුක් වෙදනාව දුරුකිරීමෙන්ද සොම්නස් දොම්නස් දෙකම පහකිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂාවෙන් හටගත් සිහියේ පිරිසිදුභාවය ඇත්තාවූ හතරවෙනි ධ්‍යානය උපදවා වාසය කෙරේද, ඔහුගේ යම් පෙර උපෙක්ෂා සැපයෙන් යුක්තවූ සියුම් නොවූ හැඟීම් නැතිවීමෙන් සියුම්වූ හැඟීමක් ඇතිවීද ඒ හැඟීම් නවතියි. ඒ හතරවෙනි ධ්‍යාන කාලයෙහි දුක් නුවූ සැපනුවූ මැදහත් සැපයෙන් යුක්තවූ යම් හැඟීමෙක් ඇතිවීද ඒ හැඟීම් නවතියි. ඒ හතරවෙනි ධ්‍යාන කාලයෙහි දුක් නුවූ සැප නුවූ මැදහත් සැපයෙන් යුක්තවූ සියුම්වූ හැඟීම වෙයි. ඒ හතරවෙනි ධ්‍යාන කාලයෙහි දුක් නුවූ, සැප නුවූ මැදහත් සැපයෙන් යුක්තවූ සියුම් නොවූ හැඟීම් නැතිවීමෙන් සියුම්වූ හැඟීම් ඇතිවූයේම වෙයි. මෙසේද ශික්ෂායෙන් ඇතැම් හැඟීමක් උපදී. ඇතැම් හැඟීමක් නැතිවෙයි. මෙයද ශික්ෂාය"යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

**41.** "පොට්ඨපාදය, නැවතද භික්ෂුතෙම හැම ආකාරයෙන් රූප හැඟීම් දුරුවීමෙන්, තරහ හැඟීම් දුරුවීමෙන් නොයෙක් හැඟීම් සිහි නොකිරීමෙන් ආකාශය නිමක් නැතැයි සිහි කිරීමෙන් ආකාසානඤ්චායතන ධ්‍යානය උපදවා වාසය කෙරේද, ඔහුගේ යම් පෙර හැඟීමක් වීනම් ඒ හැඟීම නැතිවෙයි. එකල (ආකාසානඤ්චායතන) නිමක් නැති ආකාශයෙන් ලබන ධ්‍යානයෙන් යුක්තවූ නොසියුම් කරුණු පහකිරීමෙන් සියුම්වූ හැඟීම් ඇත්තෙක් වෙයි. මෙසේද හික්මීමෙන් සමහර හැඟීමක්

උපදී. සමහර හැඟීමක් නැතිවෙයි. මටද භාග්‍යවතුන් වහන්සේ 'හික්මීමය'යි වදාළසේක.

42. "පොට්ඨපාදය, නැවතද, භික්ෂුතෙම හැම ආකාරයෙන්ම (ආකාසානඤ්චායතනය) නිමක් නැති ආකාසය භාවනා කිරීමෙන් ලබනලද ධ්‍යානය දුරුකොට එම (ආකාශානඤ්චායතන) හිත භාවනාකොට (විඤ්ඤාණඤ්චායතනය) නිමක් නැති විඤ්ඤාණය භාවනා කිරීමෙන් ලබන ධ්‍යානය උපදවා වාසය කෙරේද, ඔහුගේ යම් පළමු පැවති ආකාසානඤ්චායතනයන්ගේ යුක්තවූ නොසියුම් කොටස් පහ කිරීමෙන් සියුම්වූ හැඟීමක් ඇතිවීද, ඒ හැඟීම නැති වෙයි එකල විඤ්ඤාණඤ්චායතනයන්ගේ යුක්තවූ නොසියුම් කොටස් පහකිරීමෙන් සියුම්වූ හැඟීම් ඇතිවෙයි. එකල විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන සැපයෙන් යුක්තවූ නොසියුම් කොටස් පහකිරීමෙන් සියුම්වූ හැඟීම් ඇත්තෙක් වෙයි. මෙසේද හික්මීමෙන් සමහර හැඟීමක් උපදී. සමහර හැඟීමක් නැතිවෙයි. මටද භාග්‍යවතුන් වහන්සේ හික්මීමයයි වදාළසේක.

43. "පොට්ඨපාදය, නැවත භික්ෂුතෙම හැම ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය දුරු කොට කිසිවක් නැතැයි භාවනාකොට දැන ආකිඤ්චඤ්ඤායතන ඒ හිතේ කිසිවක් නැතැයි යන භාවනාවෙන් ලබන ධ්‍යානය උපදවා වාසය කෙරේද, ඔහුගේ යම් පළමු පැවති (විඤ්ඤාණඤ්චායතන) ධ්‍යානයෙන් යුක්තවූ නොසියුම් කොටස් (පහකිරීමෙන්) සියුම්වූ හැඟීමක් ඇතිවීද, 'ඒ හැඟීම් (නිරුද්ධවෙයි) නැතිවෙයි එකල ආකිඤ්චඤ්චායතනයෙන් යුක්තවූ නොසියුම් කොටස් පහ කිරීමෙන් සියුම්වූ හැඟීමක් වෙයි. එකල ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයෙන් යුක්තවූ නොසියුම් කොටස් පහකිරීමෙන් සියුම්වූ හැඟීම ඇත්තේම වෙයි. මෙසේද හික්මීමෙන් සමහර හැඟීමක් උපදී. සමහර හැඟීමක් නැතිවෙයි. මීටද භාග්‍යවතුන් වහන්සේ හික්මීමයයි වදාළසේක.

44. "පොට්ඨපාදය, යම්හේතුවකින් මේ ශාසනයෙහි භික්ෂු තෙම තමන්ගේ ප්‍රථම ධ්‍යාන හැඟීමෙන් හැඟීම ඇත්තේ වේද

ඔහු ඒ ප්‍රථම ධ්‍යානයෙන් වෙන්වූ දෙවෙනි ධ්‍යානයෙහිද එයින් වෙන්වූ තුන් වෙනි ධ්‍යානයෙහි දැයි මෙසේ ඒ ඒ ධ්‍යාන හැඟීමෙන් හැඟීම් ඇත්තේ වීද පිළිවෙළින් හැඟීම්වල මුදුනට පැමිණෙයි. හැඟීම් මුදුනෙහි සිටි ඔහුට මෙබඳු සිතක් ඇති වෙයි. ධ්‍යානයට සමවදින්නාවූ මාගේ සමවැදීම ලාමක වෙයි සම නොවදින්නාවූ මාගේ ඒ සමනොවැදීම උතුම් වෙයි මම ධ්‍යානයට සමවදිම්නෙම් නම් මතු සමවැදීම පිණිස කැමති උපදවන්නේ නම් මාගේ මේ හැඟීම් නවතින්නාහ (විනාශ වෙන්නාහ.) අන්‍යවූ (ඖදාරික භවාංග) හැඟීම් උපදින්නාහුය මම ධ්‍යානයට සම නොවදින්නෙම් නම් මතු සමවැදීම පිණිස කැමති නූපදවන්නෙම් නම් යහපතැයි ඔහු සමනොවදී, මතු සමවැදීම පිණිස කැමති නූපදවයි. සම නොවදින්නාවූ මතු සමවැදීම පිණිස කැමති නූපදවන්නාවූ ඔහුගේ ඒ ධ්‍යාන හැඟීම්ද නවතිත් (විනාශවෙත්) අන්‍යවූද ඖදාරික භවාංග හැඟීම් නූපදිත්. මෙසේ පිළිපදින්නාවූ භික්ෂුතෙම හැඟීමෙන් දත යුතුවූ හැඟීම නිරොධය ලබයි.

"පොට්ඨපාදය, මෙසේ නුවණ-ඇති භික්ෂුහුගේ පිළිවෙළින් හැඟීම (සිත) නිරුද්ධ කරන්නාවූ සමාපත්තිය වෙයි' වදාළසේක.

**45.** "පොඨපාදය, ඒ කුමකැයි සිතන්නෙහිද? කිමෙක් ද? ඔබ විසින් මීට පෙර මෙබඳුවූ නුවණැති භික්ෂුහුගේ පිළිවෙළින් හැඟීම් නැතිවීමෙහි සමාපත්තියක් ඇසුවේදැයි විචාළසේක.

"ස්වාමීනි, නොඇසුවෙමි, ස්වාමීනි, මෙසේ මම භාග්‍යවතුන් වහන්සේගේ කථාව දැනගනිමි."

"පොට්ඨපාදය, යම් හේතුවකින්, භික්ෂු තෙම තමන්ගේ පළමු වෙනි ධ්‍යාන හැඟීම් ඇත්තේ වේද, ඔහු ඒ පළමු වෙනි ධ්‍යානයෙන් වෙනස්වූ දෙවෙනි ධ්‍යානයෙහිද, ඉන් වෙනස්වූ තුන්වෙනි ධ්‍යානයෙහි දැයි මෙසේ ඒ ඒ ධ්‍යාන හැඟීමෙන් හැඟීම් ඇතුව පිළිවෙළින් හැඟීම් මුදුනට පැමිණේද, හැඟීම් මුදුනෙහි සිටියාවූ ඔහුට මෙබඳු සිතක් ඇතිවෙයි. ධ්‍යානයට සමවදින්නාවූ මාගේ සමවැදීම ලාමක වෙයි. ධ්‍යානයට

සමනොවදින්නාවූ මාගේ සමනොවැදීම උතුම් වෙයි. මම ධ්‍යානයට සමවදින්නෙම් නම් මතු සමවැදීම පිණිස කැමති වන්නෙම් නම් මාගේ මේ හැඟීම් නවතින්නාහ. අන්‍යවූ (ඖදාරික භවාංග) හැඟීම් උපදින්නාහුය. මම ධ්‍යානයට සමනොවදින්නෙම් නම්, මතු සමවදින පිණිස කැමති නොවන්නෙම් නම් යහපතැයි ඔහු ධ්‍යානයට සම නොවදියි. මතු සම වදින පිණිස කැමති නොවෙයි. ධ්‍යානයට සමනොවදින්නාවූ මතු සමවැදීම පිණිස කැමති නූපදවන්නාවූ ඔහුගේ ඒ ධ්‍යාන හැඟීම නවතිත්, අන්‍ය වූ ඖදාරික භවාංග හැඟීම්ද නූපදිත්. මෙසේ පිළිපදින්නාවූ ඒ භික්ෂුතෙම හැඟීමෙන් දතයුතුවූ චිත්තනිරොධය ලබයි.

**46.** "පොට්ඨපාදය, මෙසේ නුවණ ඇති භික්ෂුහුගේ, පිළිවෙලින් හැඟීම් නැතිවීමෙහි සමාපත්තිය වෙයි. භාග්‍යවතුන් වහන්සේ එසේයයි වදාළසේක.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ එකම ආකිඤ්චඤ්ඤායතනම හැඟීම් අතුරෙන් කෙළවරට ගිය හැඟීමයයි යම් හැඟීම් පණවනසේක්ද, නොහොත් වෙනත් සමාපත්තීන්හි බොහෝවූ මුදුන් පැමිණි හැඟීම් පණවනසේක්දැ"යි ඇසුවේය.

"පොට්ඨපාදය, මම මුදුන් පැමිණි හැඟීම් එකක් ද පණවමි බොහෝවූ මුදුන් පැමිණි හැඟීම්ද පණවමියි" වදාළසේක.

"ස්වාමීනි, භාග්‍යවත් තෙම කෙසේ නම් මුදුන් පැමිණි එක් හැඟීමක් පණවනසේක්ද, කෙසේ බොහෝවූ මුදුන් පැමිණි හැඟීම් පණවනසේක්දැයි" ඇසුවේය.

"පොට්ඨපාදය, පෘථිවි කසිණාදීන් අතුරෙන් යම් යම් කසිණයකින් හෝ ප්‍රථම ධ්‍යානාදීන් අතුරෙන් යම් යම් ධ්‍යානයකින් හෝ චිත්ත චෛතසිකයන්ගේ නැවතීමට පැමිණේද, ඒ ඒ කසිණයකින් හෝ ඒ ඒ ධ්‍යානයකින් මම මුදුන් පැමිණි හැඟීම් පණවමි. පොට්ඨපාදය, මම එසේ එක් මුදුන්පත් හැඟීමක්ද බොහෝවූ මුදුන්පත් හැඟීම්ද පණවමියි" වදාළසේක.

47. "ස්වාමීනි, චිත්ත චෛතසික නවත්වා එයින් නැගිටින භික්ෂුවට අර්හත්ඵල සිත පළමුව උපදීද, පසුව ප්‍රත්‍යවෙක්ෂා ඥානය උපදීද, නොහොත් ප්‍රත්‍යවෙක්ෂාඥානය පළමු උපදීද, අර්හත්ඵල සිත පසුව උපදීද නොහොත් අර්හත්ඵල සිත හා ප්‍රත්‍යවෙක්ෂාඥානය එක විට උපදීදැයි" විචාළේය.

"පොට්ඨපාදය, අර්හත්ඵල සිත පළමු උපදියි. ප්‍රත්‍යවෙක්ෂාඥානය පසුව උපදියි. අර්හත්ඵල සිත ඉපදීමෙන් පසු ප්‍රත්‍යවෙක්ෂාඥානය ඉපදීම වෙයි. අර්හත්ඵල සමාධි හැඟීම හෙතුකොට ගෙණ මාගේ ප්‍රත්‍යවෙක්ෂාඥානය උපන්නේයයි ඒ භික්ෂුතෙම දනියි. පොට්ඨපාදය, අර්හත්ඵල සමාධි හැඟීම පළමු උපදියි. ප්‍රත්‍යවෙක්ෂාඥානය පසුව උපදියි. අර්හත්ඵල හැඟීම් ඉපදීමෙන් ප්‍රත්‍යවෙක්ෂා ඥානය ඉපදීම වෙයි. මෙසේ මේ ක්‍රමයෙන් මෙය දත යුතුයයි," වදාළසේක.

48. "ස්වාමීනි, හැඟීම් පුරුෂයාගේ ආත්ම වේද නොහොත් හැඟීම් අනිකක් වේද, ආත්මය අනිකක් වේදැයි" ඇසුවේය.

"පොට්ඨපාදය, නුඹ කුමක් නම් ආත්මයයි සළකන්නෙහි දැයි?" ඇසූසේක.

"ස්වාමීනි, මම මහත්වූ සතර මහා භූතයන්ගෙන් උපන්නාවූ ආහාර ගන්නාවූ මේ කය ආත්මයයි සලකමි"යි කීයේය.

"පොට්ඨපාදය, මහත්වූ, සතර මහාභූතයන් ගෙන් උපන්නාවූ ආහාර ගන්නාවූ මේ කය ආත්මයයි නුඹේ දැනගැනීම් වන්නේද, පොට්ඨපාදය, එසේ ඇති කල නුඹට හැඟීම අනිකක් වන්නීය. ආත්මය අනිකක්ම වන්නේය. පොට්ඨපාදය, යම්සේ හැඟීම අනිකක් වන්නීද, ආත්මය අනිකක් වන්නේද මේ ක්‍රමයෙන්ද ඒ මේ කාරණය දැනගත යුතුයි. පොට්ඨපාදය මේ මහත්වූ සතර මහා භූතයන්ගෙන් උපන්නාවූ ආහාර ගන්නාවූ ඒ මේ ආත්මය නවතීවා.

එසේ කල මේ පුරුෂයාට වෙනත් හැඟීම් උපදිත්. වෙනත් හැඟීම් නැති වෙත්. පොට්ඨපාදය, යම්සේ හැඟීම් අනිකක්ම

වන්නීද, ආත්මය අනිකක්ම වන්නේද, මෙසේ මේ ක්‍රමයෙන් මේ කාරණය දත යුතුයයි” වදාළසේක.

**49.** “ස්වාමීනි, මම ආත්මය සියලු අංග කොටස් ඇත්තාවූ ඉඳුරන් ගෙන් නොපිරිහුනාවූ හිතෙන් හටගත් දෙයකැයි දැන ගතිමියි” කීයේය.

“පොට්ඨපාදය, ආත්මය සියලු අංග කොටස් ඇත්තාවූ ඉඳුරන් ගෙන් නොපිරිහුනාවූ හිතින් හටගත් දෙයකැයි කියාත් නුඹේ දැන ගැනීම වේද, පොට්ඨපාදය, එසේ ඇති කලත් ඔබට හැඟීම අනිකක් වන්නීය. ආත්මය අනිකක් වන්නේය. පොට්ඨපාදය, යම් සේ හැඟීම් අනිකක්ම වන්නීද ආත්මය අනිකෙක් වන්නේද, මෙසේ මේ ක්‍රමයෙන්ද ඒ මේ කාරණය දැන ගත යුතුය. පොට්ඨපාදය’ ඒ මේ ආත්මය සියලු අංග කොටස් ඇත්තාවූ ඉඳුරන් ගෙන් නොපිරිහුනාවූ හිතින් කරනලද්දේය යනු තිබුනාවේ. එකල මේ පුරුෂයා හට අන්‍යවූ හැඟීම් උපදිත්, අන්‍යවූ හැඟීම් නැතිවෙත්ය”යි වදාළසේක.

**50.** “ස්වාමීනි, මම ආත්මය රූපයක් නැති හැඟීම් යයි දනිමි”යි කීයේය.

“පොට්ඨපාදය, ඔබට ආත්මය රූපයක් නැති හැඟීම් වේද, පොට්ඨපාදය, එසේ ඇති කලද ඔබට හැඟීම අනිකක් වන්නීය. ආත්මය අනිකෙක් වන්නේය. පොට්ඨපාදය, යම්සේ හැඟීම අනිකක්ම වන්නීද ආත්මය අනිකක්ම වන්නේද මෙසේ මේ ක්‍රමයෙන්ද, ඒ මේ කාරණය දත යුතුය. පොට්ඨපාදය, මේ ආත්මය රූප නැති හැඟීම්ය යනු තිබුනාවේ එසේ ඇති කල මේ පුරුෂයාට අන්‍ය හැඟීම් උපදිත්. අන්‍ය හැඟීම් නැතිවෙත්. පොට්ඨපාදය, යම්සේ හැඟීම අනිකක්ම වන්නීද, ආත්මය අනිකෙක්ම වන්නේද මෙසේ මේ ක්‍රමයෙන්ද ඒ මේ කාරණය දැන ගත යුතුයයි” වදාළසේක.

**51.** “ස්වාමීනි, හැඟීම පුරුෂයාගේ ආත්මය දැයි කියා හෝ හැඟීම අනිකක්මය, ආත්මය අනිකෙක් දැයි කියා හෝ මා විසින් දැනගත හැක්කේදැයි” ඇසුයේය.

"පොට්ඨපාදය, අන් ආකාරයකින් පැවති ඇදහීම් ඇත්තාවූ, අනිකක් කැමැත්තාවූ අනිකක් රුචිවූ අන්‍ය ප්‍රතිපත්තියක යෙදුනාවූ, අන්‍ය තීර්ථක ඉගැන්වීමක ගුරුවරයෙක්වූ ඔබ විසින් හැඟීම පුරුෂයාගේ ආත්මය දැයි කියා හෝ හැඟීම අනිකක් ආත්මය අනිකෙක් දැයි කියා හෝ මේ කාරණය දැනගනු නොහැක්කේයයි" වදාළසේක.

**52.** "ස්වාමීනි, ඉඳින් අන් ආකාරයකින් පැවති ඇදහීම් ඇත්තාවූ, අනිකක් කැමතිවූ අනිකක් රුචිවූ අන්‍ය ප්‍රතිපත්තියක යෙදුනාවූ අන්‍ය තීර්ථායතනයක ගුරුවරයෙක්වූ මා විසින් හැඟීම පුරුෂයාගේ ආත්මය දැයි කියා හෝ හැඟීම අනිකක ආත්මය අනිකෙක් දැයි කියා හෝ මේ කාරණය දැන ගනු නොහැකි වේ නම්, කිමෙක්ද ස්වාමීනි, ලොකය සදාකාලිකය යන මේ කීමම සත්‍යද සදාකාලික නොවෙයි යන අනික් කීම අසත්‍යදැ"යි ඇසුවේය.

'පොට්ඨපාදය, ලොකය සදාකාලිකය යන මේ කීමම සත්‍යය සදාකාලික නොවේයයි යන අනිත් කීම අසත්‍යයයි මා විසින් ප්‍රකාශ නොකරණ ලද්දේය"යි වදාළසේක.

"කිමෙක්ද, ස්වාමීනි, ලොකය සදාකාලික නොවෙයි යන මේ කීමම සත්‍ය, සදාකාලිකය යන අනික් කීම අසත්‍යදැ?"යි ඇසුවේය.

"පොට්ඨපාදය, ලොකය සදාකාලික නොවෙයි යන මේ කීමම සත්‍යය, සදාකාලිකය යන අනික් කීම අසත්‍යය යන මේද මා විසින් ප්‍රකාශ නොකරණ ලද්දේය"යි වදාළසේක.

"කිමෙක්ද, ස්වාමීනි, ලොකය කෙළවර ඇත්තේය යන මේ කීම සත්‍යයද කෙළවරක් නැත්තේය යන අනික් කීම අසත්‍යයදැ"යි ඇසීය.

"පොට්ඨපාදය, ලොකය කෙළවරක් ඇත්තේය යන මේ කීම සත්‍යය, කෙළවරක් නැත්තේය යන අනික් කීම අසත්‍ය යයි මා විසින් ප්‍රකාශ නොකරණ ලද්දේය"යි වදාළසේක.

"කිමෙක්ද ස්වාමීනි ලොකය කෙළවරක් නැත්තේය, යන මේ කීම සත්‍යයද, කෙළවරක් ඇත්තේය යන අනික් කීම අසත්‍යයදැ"යි ඇසීය.

"පොට්ඨපාදය, ලොකය කෙළවරක් නැත්තේය යන මේ කීම සත්‍යය, කෙළවරක් නැත්තේය යන අනික් කීම අසත්‍යයයි මා විසින් ප්‍රකාශ නොකරණ ලද්දේය"යි වදාළසේක.

"ජීවය හා ශරීරය එකම වෙයි, ජීවය අනිකක් වෙයි. ශරීරය අනිකක් වෙයි. සත්ත්වයා මරණින් මතු උපදින්නේය, සත්ත්වයා මරණින් මතු උපදින්නේ නැත, සත්ත්වයා මරණින් මතු නූපදින්නේය, සත්වයා මරණින් මතු උපදින්නේත් නොවෙයි, නූපදින්නේත් නොවෙයි. යනමේ කීමම සත්‍යද අනික් කීම අසත්‍යදැ"යි ඇසුවේය.

"පොට්ඨපාදය, සත්ත්වයා මරණින් මතු උපදින්නේ නොවෙයි, නූපදින්නේ නොවෙයි යන මේ කීමම සත්‍යය අනික් කීම අසත්‍යය යන මේද මා විසින් ප්‍රකාශ නොකරණ ලද්දේය"යි වදාළසේක.

**53.** "ස්වාමීනි, කවර කාරණයකින් භාග්‍යවතුන් වහන්සේ විසින් මේ කාරණය ප්‍රකාශ නොකළසේක්දැ"යි ඇසුවේය.

"පොට්ඨපාදය මේ ලොකය සදාකාලිකය යන (දැක්ම) ඇදහීම තමාට හෝ අනුන්ට යහපතක් සහිත නොවෙයි. උත්තම ධර්ම සහිත නොවෙයි. ශාසනයේ උතුම් හැසිරීමේ (බ්‍රහ්මචර්යාවේ) උසස් සීල අනුව හැසිරීමේ සුලු කොටසක්වත් නොවෙයි. සංසාරයෙහි කලකිරීම පිණිස නොවෙයි, නොඇලීම පිණිස නොවෙයි, නිදහස්වීම පිණිස නොවෙයි, සංසිඳුවීම පිණිස නොවෙයි, විශෙෂයෙන් දැන ගැනීම කරගැනීම පිණිස නොවෙයි, අවබොධය පිණිස නොවෙයි නිවන් අත්කර ගැනීම පිණිස නොවෙයි. එබැවින් ඒ මා විසින් ප්‍රකාශ නොකරණ ලද්දේය'යි වදාළසේක.

**54.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කුමක් ප්‍රකාශ කරණ ලද්දේදැ"යි විචාළේය.

පොට්ඨපාදය, මා විසින් දුක මේයයි ප්‍රකාශ කරණ ලද්දේය. පොට්ඨපාදය, මවිසින් දුක් ඇතිවීමට හේතු මේයයි ප්‍රකාශ කරණ ලද්දේය. පොට්ඨපාදය, මා විසින් දුක් නැතිකිරීම මේයයි ප්‍රකාශ කරණ ලද්දේය. පොට්ඨපාදය, මා විසින් දුක් නැතිකිරීමට

පමුණුවන්නාවූ පිළිපැදීම (මාර්ගය) මෙයයි ප්‍රකාශ කරණ ලද්දේය”යි වදාළසේක.

**55.** “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ කුමක් නිසා ප්‍රකාශ කරණ ලද්දේදැ”යි ඇසුවේය.

මෙය තමන්ට යහපත සහිත වෙයි. ලොකයෙන් එතර වන ධර්ම නවය සහිත වෙයි. ශාසනයේ උතුම් හැසිරීමේ (බ්‍රහ්ම චර්යාවෙහි) උසස් ශීල අනුව හැසිරීම වෙයි. සංසාරයට කලකිරීම පිණිස පවතියි, එහි නොඇලීම, නිදහස්වීම, සංසිඳුවීම, විශෙෂයෙන් දැනගැනීම, අවබෝධය, නිවන් අත්කර ගැණීම පිණිස පවතී. එබැවින් මාවිසින් මෙය ප්‍රකාශ කරණ ලද්දේය”යි වදාළසේක.

භාග්‍යවතුන් වහන්ස, ඒ එසේය. සුගතයන් වහන්ස, ඒ එසේය, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම් ගමනකට කැමැත්තේ නම් දැන් ඊට කාලයයි” කීයේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ හුන් ආසනයෙන් නැගිට වැඩියෝය.

**56.** එවිට භාග්‍යවතුන් වහන්සේ වැඩමවා නොබෝ කලකින් ඒ පරිව්‍රාජකයෝ පොට්ඨපාද පරිව්‍රාජකයාහට වචන නැමැති කෙවිටවලින් ඇන්නෝය. “ශ්‍රමණ ගෞතම තෙම යමක් කියාද මේ ශ්‍රමණ ගෞතමයින්ගේ ඒ ඒ කීම, ‘භාග්‍යවතුන් වහන්ස, ඒ එසේය, සුගතයන් වහන්ස, ඒ එසේය’ය මේ පින්වත් පොට්ඨපාද තෙම සතුටු වෙයි. එසේම ලොකය සදාකාලිකයයි කියා හෝ ලොකය සදාකාලික නොවේයයි කියා හෝ, ලොකය කෙළවරක් ඇත්තේයයි කියා හෝ, ලොකය කෙළවර නැත්තේ යයි කියා හෝ, ජීවයත් ශරීරයත් එකමයයි කියා හෝ, ජීවය අනිකක, ශරීරය අනිකෙකැයි කියා හෝ, මරණින් මතු සත්වයා උපදින්නේය කියා හෝ මරණින් මතු සත්වයා නූපදින්නේය. කියා හෝ, මරණින් මතු සත්වයා උපදින්නේත් නොවෙයි, නූපදින්නේත් නොවෙයි කියා හෝ ශ්‍රමණ ගෞතමයන්ගේ ඒකාන්තකොට දේශනාකරණ ලද්දාවූ කිසි ධර්මයක් අපි නොදනිමු’යි.

මෙසේ කී කල පොට්ඨපාද පරිබ්‍රාජක තෙම ඒ පරිබ්‍රාජකයන්ට මේ කාරණය දැන්වීය.

"පින්වත්නි, ශ්‍රමණ ගෞතමයන් විසින් ලොකය සදාකාලිකයයි හෝ ලොකය සදාකාලික නොවේය කියා හෝ, ලෝකය කෙළවර ඇත්තේ යයි කියා හෝ. ලොකය කෙළවර නැත්තේයයි කියා හෝ, ජීවයත් ශරීරයත් එකමයයි කියා හෝ, ජීවය අනිකෙක ශරීරය අනිකෙකැයි කියා හෝ මරණින් මතු සත්වයා උපදින්නේය, කියා හෝ මරණින් මතු සත්වයා නූපදින්නේය කියා හෝ, මරණින් මතු සත්වයා උපදින්නේත් නොවෙයි කියා හෝ ශ්‍රමණ ගෞතමයන්ගේ ඒකාන්තකොට දෙශනා කරණ ලද්දාවූ කිසි ධර්මයක් මමද නොදනිමි, එසේ වුවත් ශ්‍රමණ ගෞතම තෙම ස්වභාවයෙන් පැහැදිලිවූද, සත්‍යවූද, ලොකයෙන් එතරවන ධර්ම නවයෙහි (නවලොකොත්තර ධර්මයෙහි) පිහිටියාවූද ලොකයෙන් එතරවූ ධර්මනවයෙහි ස්ථිරවූ මාර්ගයක් පණවයි. ස්වභාවයෙන් පැහැදිලිවූ සත්‍යවූ ලොකයෙන් එතරවූ ධර්ම නවයෙහි පිහිටියාවූ ලොකයෙන්එතර ධර්ම නවයෙහි ස්ථිරවූ මාර්ගයක් පනවන්නාවූ ශ්‍රමණ ගෞතමයන් විසින් යහපත පිණිස කියනලද ධර්මය මා වැනි නුවණැත්තෙක් යහපත පිණිස කියනලද්දක් වශයෙන් කෙසේ නම් සතුටු නොවන්නේදැයි" කීයේය.

**57.** එවිට දෙතුන් දවසක් පසුවූ කල ඇතුන් බලන්නාගේ පුත්‍රවූ චිත්‍රද පොට්ඨපාද පරිබ්‍රාජකයාද භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ, ඇතුන් බලන්නාගේ පුත්‍රවූ චිත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකපැත්තකටවී උන්නේය පොට්ඨපාද පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට එක පැත්තකටවී උන්නේය. එක පැත්තකටවී උන්නාවූ පොට්ඨපාද පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මේ වචන කීවේය.

"ස්වාමීනි එකල්හි භාග්‍යවතුන් වහන්සේ වැඩ නොබෝ වේලාවකින් ඒ පරිබ්‍රාජකයෝ මට වචන නමැති කෙවිටිවලින් නැවත නැවත ඇන්නෝය."

ශ්‍රමණ ගෞතම තෙම යමක් කියාද, මේ ශ්‍රමණ ගෞතමයින්ගේ ඒ ඒ කීම, 'භාග්‍යවතුන් වහන්ස, ඒ එසේය සුගතයන් වහන්ස, ඒ එසේයයි' මේ පින්වත් පොට්ඨපාද තෙම සතුටු වෙයි. එසේම ලෝකය සදාකාලිකයයි කියා හෝ ලෝකය සදාකාලික නොවේයයි කියා හෝ, ලොකය කෙළවර ඇත්තේ යයි කියා හෝ, ලෝකය කෙළවර නැත්තේයයි කියා හෝ ජීවයත් ශරීරයත් එකමයයි කියා හෝ, ජීවය අනිකක, ශරීරය අනිකකැයි, කියා හෝ මරණින් මතු සත්වයා උපදින්නේය කියා හෝ මරණින් මතු සත්වයා නූපදින්නේ නොවෙයි කියා හෝ ශ්‍රමණ ගෞතමයන්ගේ ඒකාන්තකොට දේශනා කරන ලද්දාවූ කිසි ධර්මයක් අපි නොදනිමු"යි

"ස්වාමීනි, මෙසේ කී කල මම ඒ පරිබ්‍රාජකයන්ට මෙසේ කීවෙමි.

"පින්වත්නි, ශ්‍රමණ ගෞතමයන් විසින් ලොකය සදාකාලිකයයි හෝ ලොකය සදාකාලික නොවේය කියා හෝ ලොකය කෙළවර ඇත්තේයයි කියා හෝ, ලොකය කෙළවර නැත්තේයයි කියා හෝ, ජීවයත් ශරීරයත් එකමයයි කියා හෝ, ජීවය අනිකෙක ශරීරය අනිකෙකැයි කියා හෝ මරණින් මතු සත්වයා උපදින්නේය කියා හෝ, මරණින් මතු සත්වයා නූපදින්නේය කියා හෝ, මරණින් මතු සත්වයා උපදින්නේත් නොවෙයි, නූපදින්නේත් නොවෙයි කියා හෝ ශ්‍රමණ ගෞතමයන්ගේ ඒකාන්තකොට දේශනාකරන ලද්දාවූ කිසි ධර්මයක් මමද නොදනිමි. එසේ වුවත් ශ්‍රමණ ගෞතම තෙම ස්වභාවයෙන් පැහැදිලිවූද සත්‍යවූද ලොකයෙන් එතරවූ ධර්ම නවයෙහි (නවලොකොත්තර ධර්මයෙහි) පිහිටියාවූද ලොකයෙන් එතරවූ (එම උතුම්) ධර්ම නවයෙහි නියමිතවූ ස්ථිරවූ මාර්ගයක් පණවයි. ස්වභාවයෙන් පැහැදිලිවූ සත්‍යවූ ලොකයෙන් එතරවූ ධර්ම නවයෙහි පිහිටියාවූ ලොකොත්තර ධර්ම නවයෙහි ස්ථිරවූ මාර්ගයක් පණවන්නාවූ ශ්‍රමණ ගෞතමයන් විසින් යහපත පිණිස කියනලද ධර්මය මා වැනි නුවණැත්තෙක් යහපත පිණිස කියන ලද්දක් වශයෙන් කෙසේ සතුටු නොවන්නේදැ"යි කීයේය.

58. "පොට්ඨපාදය, මේ සියලු පරිබ්‍රාජකයෝ නුවණ ඇස් නැති අන්ධයෝය. එහෙයින් ඇස් නැත්තෝය. ඔවුන් අතුරෙන්

ඔබම (සුභාෂිතය) යහපත පිණිස කියන ලද්ද, (දුර්භාෂිතය) යහපත පිණිස නොවන කියමන දන්නාවූ එකම ඇස් ඇත්තෙහිය පොට්ඨපාදය, මා විසින් ඒකාන්ත කොට (ස්ථිරව) දේශනා කරන ලද්දාවූ පණවන ලද්දාවූ ධර්මයෝද වෙත්. මා විසින් ඒකාන්තකොට (ස්ථිරව) දේශනා නොකරණ ලද්දාවූ නොපණවන ලද්දාවූ ධර්මයෝද වෙත්. පොට්ඨපාදය, මා විසින් ඒකාන්තකොට දේශනා නොකරණලද නොපණවනලද ඒ ධර්මයෝ කවරහුද? පොට්ඨපාදය, ලෝකය සදාකාලිකය කියා හෝ මා විසින් ඒකාන්ත (ස්ථිර) නොකොට ධර්මය දේශනා කරන ලද්දේ පණවන ලද්දේ වෙයි. ලෝකය සදාකාලික නොවේය කියා හෝ මා විසින් ඒකාන්ත (ස්ථිර) නොකොට ධර්මය දේශනා කරනලද්දේ පණවන ලද්දේ වෙයි. පොට්ඨපාදය, ලොකය කෙළවරක් ඇත්තේය කියා හෝ මා විසින් ඒකාන්ත (ස්ථිර) නොකොට ධර්මය දෙශනා කරන ලද්දේ පණවන ලද්දේ වෙයි. ලොකය කෙළවරක් නැත්තේය කියා හෝ මා විසින් ස්ථිර නොකොට ධර්මය දේශනා කරන ලද්දේ පණවන ලද්දේ වෙයි. පොට්ඨපා, ජීවයත් ශරීරයත් එකමය කියා මා විසින් ධර්මය දෙශනා කරණ ලද්දේ පණවන ලද්දේ නොවෙයි. ජීවය අනිකක ශරීරය අනිකකැයි කියා හෝ මා විසින් ධර්මය දෙශනාකරන ලද්දේ පණවනලද්දේ නොවෙයි. පොට්ඨපාදය, සත්ත්වයා මරණින් මතු ඉපදීම වන්නේය කියා මා විසින් ධර්මය දෙශනාකරන ලද්දේ පණවන ලද්දේ නොවෙයි. සත්වයා මරණින් මතු උපදින්නේ නැත (නොවන්නේය) කියා හෝ පොට්ඨපාදය, මරණින් මතු සත්වයා උපදින්නේද (වන්නේද) නූපදින්නේද (නොවන්නේද) වේයයි කියා හෝ පොට්ඨපාදය, සත්වයා මරණින් මතු වන්නේත් නොවෙයි. නොවන්නේත් නොවෙයි කියා හෝ මා විසින් ඒකාන්ත (ස්ථිර) කොට ධර්මය දේශනා කරණ ලද්දේ පණවන ලද්දේ නොවෙයි.

"පොට්ඨපාදය, කවර කාරණයකින් ඒ ධර්මය මා විසින් ඒකාන්ත (ස්ථිර) කොට දේශනා නොකරණ ලද්දේද, නොපණවන ලද්දේද, පොට්ඨපාදය, මේ ධර්ම තමන්ගේ යහපත උදෙසා හෝ අනුන්ගේ යහපත උදෙසා යුක්ත නොවෙත්. මේ ධර්මයෙන් යුක්ත නොවෙත්. උසස් හැසිරීමෙන් යුක්ත

නොවෙත්. සංසාරයට කලකිරීම පිණිස නොවෙත්. සංසාරයෙහි නොඇල්ම පිණිස නොවෙත්. සංසාරයෙන් නිදහස්වීම පිණිස නොවෙත් සංසාරයේ සංසිඳුවීම පිණිස නොවෙත්. සංසාරය පැහැදිලි කරන්ගැනීම පිණිස නොවෙත්. සංසාරය අවබෝධකර ගැනීම පිණිස නොවෙත්. නිවන් ලැබීම පිණිස නොවෙත්. එබැවින් මා විසින් ඒ ධර්ම ඒකාන්ත (ස්ථිර) කොට දේශනා නොකළාහු නොපණවන ලද්දාහු වෙත්.

පොට්ඨපාදය මාවිසින් ඒකාන්ත (ස්ථිර) කොට දේශනා කරණ ලද්දාවූ පණවන ලද්දාවූ ධර්ම කවරහුද? පොට්ඨපාදය, මා විසින් දුක මෙයයි ස්ථිරකොට ධර්මය දේශනාකරණ ලද්දේ පණවන ලද්දේ වෙයි. පොට්ඨපාදය, මා විසින් දුක හටගැනීම මෙයයි ස්ථිරකොට ධර්මය දේශනාකරණ ලද්දේ පණවන ලද්දේ වෙයි. පොට්ඨපාදය, දුක් නැතිකිරීම මෙයයි මා විසින් ස්ථිරකොට ධර්මය දේශනාකරණ ලද්දේ පණවන ලද්දේ වෙයි. පොට්ඨපාදය, දුක් නැතිකිරීමේ පිළිපැදීම මෙයයි ස්ථිරකොට මා විසින් ධර්මය දේශනාකරණ ලද්දේ පණවන ලද්දේ වෙයි. පොට්ඨපාදය, කවර කාරණයකින් ඒ ධර්ම ස්ථිරකොට මා විසින් දේශනාකරණ ලද්දාහුද පණවන ලද්දාවූද පොට්ඨපාදය, මේ ධර්ම තමන්ගේත් අනුන්ගේත් යහපත පිණිස වෙත්. මේ ධර්ම උතුම් ධර්මයෙන් යුක්ත වෙත්. මේ (බ්‍රහ්මචර්යාව) උතුම් හැසිරීමෙන් යුක්ත වෙත්. මේ සංසාරයෙහි කලකිරීම පිණිසද, නොඇලීම පිණිසද, සංසිඳීම පිණිසද, විශෙෂයෙන් දැනගැනීම පිණිසද, අවබෝධය පිණිසද, නිවන් ලැබීම පිණිසද පවතිත්. පොට්ඨපාදය, එබැවින් මා විසින් ඒ ධර්ම ස්ථිරකොට දේශනා කරණ ලද්දාහු පණවන ලද්දාහු වෙත්.

**59.** "පොට්ඨපාදය, ආත්මය වෙනස් නොව සදාකාලිකවූ සැප ඇති, මරණින් මතු සදාකාලික වේය යන මත ඇති සමහර මහණ බමුණෝ වෙත්. මම ඔවුන් වෙත පැමිණ මෙසේ කියමි. ආයුෂ්මතුනි, ඔබලා 'ආත්මය වෙනස් නොව සදාකාලිකව පවත්නා සැප ඇති මරණින් මතු සදාකාලික වූයේ වෙයි' යන මෙවැනි වාද ඇත්තාහුය, මෙබඳු දෘෂ්ටි ඇත්තාහුය යනු සැබෑදැයි මෙසේ මා විසින් අසනු ලැබූ ඒ මහණ බමුණෝ ඉදින් 'එසේය'යි

උත්තර දෙත්ද ඔවුන්ට මම මෙසේ කියමි. ආයුෂ්මතුනි, ඔබලා ඇත්තෙන්ම සැප ඇති ලොකය නැගෙනහිර දිසාවෙහි හෝ බස්නාහිර ආදී දිශාවන්හි හෝ වේදැයි දන්නාහු දක්නාහු වෙසෙත් දැයි මෙසේ අසන ලද්දාහු "නොදක්නෙමු"යයි කියත්. ඔවුන්ට මම මෙසේ කියමි. ආයුෂ්මතුනි, එක් රැයක් මුලුල්ලේ හෝ එක් දවාලක් මුලුල්ලේ හෝ රෑ බාගයක් මුලුල්ලේ හෝ එක් දාවල් බාගයක් මුලුල්ලේ හෝ ඒකාන්ත සැප ඇති ආත්මයක් ඔබලා දනිව් දැයි මෙසේ අසන ලද්දාහු 'නොදනිමු' යයි කියත්ද ඔවුන්ට මේ මෙසේ කියමි. ආයුෂ්මතුනි, කිමෙක්ද? ඒකාන්ත සැප ඇති ලොකය අවබොධ කරගැණීමට මාර්ගය මේය, පැවතුම් පිළිවෙළ මේයයි ඔබලා දනිත් දැයි මෙසේ අසන ලද්දෝ නොදනිමු'යි කියත්. ඔවුන්ට මම මෙසේ කියමි. ආයුෂ්මතුනි, යම් ඒ දේවතාවෝ ඒකාන්ත සැප ඇති ලොකයෙහි උපන්නාහු දුක් නැත්තානෙනි, ඒකාන්ත සැප ඇති ලොකය අවබොධ කරණු පිණිස පිළිපදින්නාහු වව්, අවංකව පිළිපදින්නාහු වව්, දුක් නැත්තානෙනි, අපි එසේ පිළිපදින්නාහු ඒකාන්ත සැප ඇති ලොකයෙහි උපන්නෙමුයයි කියන්නාවූ ඒ දේවතාවන්ගේ ශබ්දය අසව්දැයි මෙසේ අසන ලද්දාවූ 'ඒ ශබ්දයක් නොඇසුවෙමු'යයි කියත්.

**60.** "පොට්ඨපාදය, ඒ කුමකැයි සිතන්නෙහිද? මෙසේ ඇති කල ඒ මහණ බමුණෝ නැතැයි කීමෙන් උත්තර නැති බවට පැමිණෙන්නෝ නොවෙත්දැයි ඇසූසේක.

"ස්වාමීනි එසේවූ කල ඒ බමුණන්ගේ නැතැයි කීමෙන් උත්තර නැති බවට ඒකාන්තයෙන් පැමිණෙත්මය"යි කීයේය.

"පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් මෙසේ කියන්නේද, මේ ජනපදයෙහි යම් ස්ත්‍රියක් ඉතා රූප ලක්ෂණ වේද මම ඈ ඕනෑ කරමි, කැමති වෙමි'යි ඔහුට මෙසේ කියන්නාහුය. 'ඔබ කියන ලද ඉතා ලක්ෂණ ඇති ස්ත්‍රිය ජනපද කල්‍යාණිය ඕනෑ කෙරෙහිද කැමැත්තෙහිද? ඒ ජනපද කල්‍යාණිය ක්ෂත්‍රිය කුලයෙහි හෝ බමුණු කුලයෙහි හෝ වෙළඳ කුලයෙහි හෝ සුද්‍රකුලයෙහි හෝ කියා දන්නේදැ"යි ඇසූ කල ඔහු 'නොදනිමි' කියයි. ඒ මේ පුරුෂයාහට මෙසේ කියන්නාහුය, 'පුරුෂය, ඔබ යම් ජනපද

කල්‍යාණියක් ඕනෑ කෙරෙහිද කැමැත්තෙහිද ඒ ජනපද කල්‍යාණි මේ නම් ඇත්තීය, මේ ගොත්‍ර ඇත්තීය කියා හෝ උසස් හෝ, මිටිය හෝ, මධ්‍යමය කියා හෝ කළුය හෝ, රන්වන්ය හෝ දුඹුරුවන්ය හෝ නියම් ගමෙහි හෝ නුවරෙහි හෝ කියා දන්නෙහිදැ'යි මෙසේ අසන ලද්දේ 'නොදනිමි'යි කියන්නේය. ඒ මේ අයට මෙසේ කියන්නාහුය. 'පුරුෂය, ඔබ යම් ස්ත්‍රියක් නොදන්නෙහිද නොදක්නෙහිද ඔබ ඈ ඕනෑ කෙරෙහි කැමැත්තෙහිදැ'යි මෙසේ ඇසූ කල 'එසේය'යි කියන්නේය. පොට්ඨපාදය ඒ කුමකැයි සිතන්නෙහිද? මෙසේ ඇති කල ඒ පුරුෂයාගේ කීම උත්තර නැති බවට පැමිණේ නොවේදැයි" ඇසූසේක.

"ස්වාමීනි, එසේ ඇති කල ඒ පුරුෂයාගේ කීම ඇත්තෙන්ම උත්තර නැති බවට පැමිණේමය"යි කීයේය.

**61.** "පොට්ඨපාදය, එසේම එකාන්ත සැප ඇති මරණින් මතු සදාකාලික ආත්මයක් ඇත්තේය' යන මෙවැනි වාද ඇත්තාවූ මෙවැනි ඇදහීම් ඇත්තාවූ යම් ඒ මහණ බමුණු කෙනෙක් ඇද්ද ඔවුන්ට මම මෙසේ කියමි.

"ආයුෂ්මතුනි, ඔබලා 'එකාන්ත සැප ඇති මරණින් මතු සදාකාලික ආත්මයක් ඇත්තේය' යන මෙවැනි වාද ඇත්තාහු මෙවැනි ඇදහීම් ඇත්තාහුය යන කීම සැබෑදැයි මා විසින් ඇසූ කල 'එසේයයි' කියන්නවුන්ට මම මෙසේ කියමි. කිමෙක්ද ආයුෂ්මතුනි, ඔබලා එකාන්ත සැප ඇති ලොකය නැගෙනහිර දිසාවෙහි හෝ බස්නාහිර දිසාවෙහි හෝ වේදැයි දැන හෝ දැක වාසය කරව්දැයි මෙසේ අසන ලද්දාහු නොදනිමුයයි කියත්ද මම ඔවුන්ට මෙසේ කියමි. 'කිමෙක්ද? ආයුෂ්මත්හු එක් රාත්‍රියක් මුළුල්ලේ හෝ එක් දවාලක් මුළුල්ලේ හෝ එක් රාත්‍රි බාගයක් මුළුල්ලේ හෝ එක් දාවල් බාගයක් මුළුල්ලේ හෝ ඒකාන්ත සැප ඇති ආත්මයක් දනිව්දැ'යි මෙසේ ඇසූ කල 'නොදනිමුය'යි කියත් ඔවුන්ට මම මෙසේ කියමි. 'කිමෙක්ද? ආයුෂ්මතුනි, ඒකාන්ත සැප ඇති ලොකය අවබොධකිරීම පිණිස මාර්ගය මෙය, පිළිපැදීම මේයයි දනිව්දැයි' මෙසේ ඇසූ කල ඔව්හු නොදනිමුයයි" කියත්. ඔවුන්ට මම මෙසේ කියමි කිමෙක්ද?

ආයුෂ්මතුනි, ඔබලා යම් ඒ දේවතාවෝ ඒකාන්ත සැප ඇති ලොකයෙහි උපන්නාහු දුක් නැත්තානනි, ඒකාන්ත සැප ඇති ලොකය අවබොධ කරගැනීම පිණිස හොඳින් පිළිපදිව් අවංකව පිළිපදිව් දුක් නැත්තනි, අපිද මෙසේ පිළිපදින්නාහු ඒකාන්ත සැප ඇති ලොකයෙහි උපන්නෙමුයයි කියන්නාවූ ඒ දේවතාවන්ගේ ශබ්ද අසව්දැයි මෙසේ ඇසූ කල "මෙවැනි ශබ්දයක් නොඇසුයෙමුයයි, කියත්. "පොට්ඨපාදය, ඒ කුමකැයි සිතන්නෙහිද? එසේවූ කල ඒ මහණ බමුණන්ගේ කීම උත්තර නැති කීමක් බවට පැමිණෙන්නේ නොවේදැයි' ඇසූසේක.

"ස්වාමීනි, එසේ ඇති කල ඒ මහණ බමුණන්ගේ කීම උත්තර නැති කීමක් බවට ඒකාන්තයෙන් පැමිණේය"යි කීයේය.

**62.** 'පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් ප්‍රාසාදයකට නගිනු පිණිස සතරමංසන්ධියෙහි හිණිමගක් කරන්නේය. ඔහුට මෙසේ කියන්නාහුය. පින්වත් පුරුෂය, ඔබ යම් ප්‍රාසාදයකට නගිනු පිණිස හිණිමගක් කෙරෙහිද ඒ ප්‍රාසාදය නැගෙනහිර දිසාවෙහිය කියා හෝ, දකුණු දිසාවෙහිය කියා හෝ බස්නාහිර දිසාවෙහිය කියා හෝ, උතුරු දිසාවෙහිය කියා හෝ දන්නෙහිද, උස්ය මිටිය මධ්‍යමය කියා හෝ දන්නෙහිදැයි අසනලද්දේ "නොදනිමි"යි කියන්නේය. ඔහුට මෙසේ කියන්නාහුය. පින්වත් පුරුෂය, යම් ප්‍රාසාදයක් ඔබ නොදන්නෙහිද නොදක්නෙහිද ඒ නොදන්නා නොදක්නා ප්‍රාසාදයට ඔබ හිණිමගක් කරන්නෙහිදැයි අසන ලද්දේ එසේයයි කියන්නේය. පොට්ඨපාදය, ඒ කුමකැයි සිතන්නෙහිද? එසේ කල ඒ පුරුෂයාගේ කීම උත්තර නැති කීමක් බවට පැමිණෙන්නේ නොවේදැයි ප්‍රකාශ කළසේක. ස්වාමීනි, එසේ කල ඔහුගේ කීම උත්තර නැති කීමක් බවට පැමිණේමයයි කීයේය.

**63.** "පොට්ඨපාදය, එපරිද්දෙන්ම යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් 'මරණින් මත්තෙහි සදාකාලිකවූ ඒකාන්තයෙන් සැප වන්නාවූ ආත්මයක් ඇත' යන මෙබඳු වාද ඇත්තාහු. මෙබඳු දැකීම් ඇත්තාහු වෙත්ද මම ඔවුන් කරා පැමිණ මෙසේ කියමි. ආයුෂ්මතුනි, තොපි මරණින් පසු සදාකාලිකවූ ඒකාන්ත සැප

ඇති ආත්මයක් ඇත යන මෙබඳු වාද ඇත්තාහුය මෙබඳු දැකීම් ඇත්තාහුය යනු සැබෑදැයි මා විසින් අසනු ලැබූ ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඉදින් 'එසේය'යි උත්තර දෙත් නම් ඔවුන්ට මම මෙසේ කියමි. ආයුෂ්මතුනි, තෙපි ඒ ඒකාන්ත සැප ඇති ලොකය නැගෙනහිර දිග්භාගයෙහි හෝ බස්නාහිර ආදී දිග්භාගයන්හි හෝ ඇත්තේයයි දන්නෝව දක්නෝව වාසය කරව්දැයි අසන ලද්දාහු 'නොදන්නෙමු'යයි කියත්. ඔවුන්ට මම මෙසේ කියමි. කිමෙක්ද ආයුෂ්මතුනි තෙපි එක් රාත්‍රියක් මුළුල්ලේ හෝ එක් දවාලක් මුළුල්ලේ හෝ රාත්‍රි වරුවක් මුළුල්ලේ හෝ දවල් වරුවක් මුළුල්ලේ හෝ ඒකාන්ත සැප ඇති ආත්මයක් දනිව්දැයි මෙසේ අසන ලද්දාවූ ඔව්හු 'නොදනිමු'යයි කියත්. ඔවුන්ට මම මෙසේ කියමි. කිමෙක්ද ආයුෂ්මතුනි, ඒ ඒකාන්ත සැප ඇති ලොකයට පැමිණීම පිණිස මාර්ගය මේය ප්‍රතිපදාව මේයයි දනිව්දැයි මෙසේ අසනලද්දාහු නොදනිමුයයි කියත්. ඔවුන්ට මම මෙසේ කියමි. කිමෙක්ද ආයුෂ්මතුනි, යම් ඒ දේවතා කෙනෙක් ඒකාන්ත සැප ඇති ලොකයෙහි ඉපද සිටින්නාහු තෙපි, "නිදුකානෙනි, ඒකාන්ත සැප ඇති ලොකයට පැමිණීම පිණිස හොඳින් පිළිපදිව්, අවංකව පිළිපදිව්, නිදුකානෙනි, අපිද එසේ පිළිපැද ඒකාන්ත සැප ඇති ලොකයට පැමිණ සිටිමුය" කියන ඒ දේවතාවන්ගේ ශබ්දයක් අසව්දැයි අසන ලද්දාහු 'නොඇසුවෙමු'යි කියත්. පොට්ඨපාදය, ඒ කුමකැයි සිතන්නෙහිද එසේ ඇති කල්හි ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ කීම උත්තර නැති බවට පැමිණියේ නොවේදැ'යි කීසේක. "ස්වාමීනි, එසේ ඇතිකල ඔවුන්ගේ කීම උත්තර නැති බවට පැමිණේමය"යි කීයේය.

**64.** පොට්ඨපාදය, කාමභවයෙහි ආත්ම භාවයක් ලැබීම රූපභවයෙහි ආත්ම භාවයක් ලැබීම අරූප භවයෙහි ආත්ම භාවයක් ලැබීමයයි ආත්මභාව ලැබීම් තුනක් වෙත්. පොට්ඨපාදය, කාම භවයෙහි ආත්මභාව ලැබීම කවරේද? රූප සහිතවූ සතර මහාභූතයන්ගෙන් උපන්නාවූ කන බොන ආහාර ගන්නාවූ යම් ආත්මයක් ලැබීමක් වේද? මෙය කාම භවයෙහි ආත්ම ලැබීම වේ. රූපභවයෙහි ආත්ම ලැබීම කුමක්ද? රූපීවූ සිතින් උපන්නාවූ සියලු අංගකොටස් ඇත්තාවූ නොපිරිහුණු ඉඳුරන් ඇත්තාවූ

යම් ආත්මයක් ලැබීමක් වේද? මෙය රූපභවයෙහි ආත්ම ලැබීම වෙයි. අරූපවූ ආත්ම ලැබීම කවරේද? අරූපීවූ හැඟීමෙන් උපන්නාවූ ආත්ම ලැබීම කවරේද? අරූපීවූ හැඟීමෙන් උපන්නාවූ ආත්ම ලැබීමක වේද, මෙය අරූපවූ ආත්ම ලැබීමවේ.

**65.** පොට්ඨපාදය, මම කාමභවයෙහි ආත්ම ලැබීම නැති කිරීම පිණිස ධර්ම දෙශනා කරමි. යම්සේ පිළිපැද්දාවූ තොපගේ ක්ලේශ ධර්ම පහවන්නාහුද ශමථ විදර්ශනා ධ්‍යාන සංඛ්‍යාත සිත පිරිසිදුකරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද මාර්ගඵල ප්‍රඥාවන්ගේ පිරීමද මහත්භාවයද මේ ආත්මයෙහි තමන්ම උසස් ඥානයෙන් දැන අවබොධකොට පැමිණ වාසය කරන්නාහුයයි පොට්ඨපාදය, ක්ලෙශ සහිත ධර්ම පහවන්නාහුද සිත පිරිසිදු කරන්නාවූ ධර්මයෝ වැඩෙන්නාහුද මාර්ගඵල ප්‍රඥාවන්ගේ පිරීමද මහත් භාවයද මේ ආත්මයෙහි තමන්ම උසස් ඥානයෙන් දැන අවබොධකොට පැමිණ වාසය කරන්නේද ඔහුගේ වාසයකිරීම දුක්යයි ඔබට මෙබඳු කල්පනාවක් වන්නේද? පොට්ඨපාදය, මේ කාරණය එසේ නොදතයුතුය. කෙලෙස් සහිත ධර්ම පහවන්නාහුද සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද මාර්ග ඵල ප්‍රඥාවන්ගේ වැඩීමද මහත් භාවයද මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධකොට පැමිණ වාසය කරන්නේනම් මහත් සන්තෝසයද ප්‍රීතියද සිත හා ශරීරයේ සංසිඳීමද යහපත්ව පිහිටි සිහියද සියලු වාසය කිරීම් අතුරෙන් සැපවූ වාසය කිරීමක්ද වන්නේය.

**66.** "පොට්ඨපාදය, යම්සේ පිළිපදින්නාවූ ඔබගේ කෙලෙස් සහිත ධර්ම පහවන්නාහුද සිතපිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද, මාර්ගඵල ප්‍රඥා වැඩීමද මේ ආත්මයෙහි තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කරන්නේ වේද, මම රූප භවයෙහි ආත්ම ලැබීම පහකිරීම පිණිස ධර්ම දෙශනා කරමි.

"පොට්ඨපාදය, කෙලෙස් සහිත ධර්ම පහවන්නාහුද සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද, මාර්ගඵල ප්‍රඥාවන්ගේ පිරීමද මහත් බවද මේ ආත්මයෙහි තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කරන්නේද ඔහුගේ වාසය

කිරීම දුක්යයි ඔබට මෙවැනි කල්පනාවක් වන්නේද මේ කාරණය එසේ නොදත යුතුය. කෙලෙස් සහිත ධර්ම පහවන්නාහුද, සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද, මාර්ගඵල ප්‍රඥා වැඩීමද මහත් බවද මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කරන්නේ නම් මහත් සතුටද, ප්‍රීතියද සිත හා ශරීරයේ සංසිඳීමද යහපත්ව පිහිටි සිහියද සියලු වාසය කිරීම් අතුරෙන් සැපවූ වාසය කිරීමද වන්නේය.

**67.** "පොට්ඨපාදය, යම්සේ පිළිපදින්නාවූ ඔබගේ කෙලෙස් සහිත ධර්ම පහවන්නාහුද සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද, මාර්ගඵල ප්‍රඥාවන්ගේ පිරීමද මහත් බවද මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කරන්නේද, මම අරූපවූ ආත්ම ලැබීම පහකිරීම පිණිස ධර්ම දෙශනා කරමි. පොට්ඨපාදය, කෙලෙස් සහිත ධර්ම පහවන්නාවූද සිතපිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාවූද මාර්ගඵල ප්‍රඥා පිරීමද මහත් බවද මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කරන්නේද ඔහුගේ දුක්වූ වාසය කිරීමක් වේයයි ඔබට මෙවැනි කල්පනාවක් වන්නේද?

"පොට්ඨපාදය, මේ කාරණය එසේ නොදත යුතුයි. කෙලෙස් සහිත ධර්ම පහවන්නාවූද, පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාවූද, මාර්ගඵල ප්‍රඥාවන්ගේ පිරීමද මහත් බවද මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරන්නේ නම් මහත් සතුටද, ප්‍රීතියද සිත හා ශරීරයේ සංසිඳීමද සිහියද ඥානයද සැපවූ වාසයද වන්නේය.

**68.** "පොට්ඨපාදය, යම්සේ පිළිපදින්නාවූ ඔබගේ කෙලෙස් සහිත ධර්ම පහවන්නාවූද, සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාවූද මාර්ගඵල ප්‍රඥා පිරීමද මහත් බවද මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරව් යයි යම් කාම භවයෙක්හි ආත්ම ලැබීම පහ කිරීම පිණිස ඔබවහන්සේ ධර්ම දෙශනා කරණ සේක්ද, ඇවැත්නි, කාම භවයෙහි ආත්ම ලැබීම කවරේදැයි ඉදින් අන්‍යයෝ අපගෙන් මෙසේ අසනකල එසේ අසන ලද්දාවූ අපි

යම්සේ පිළිපදින්නාවූ ඔබගේ කෙලෙස් සහිත ධර්ම පහවන්නාවූ, සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාවූද, මාර්ගඵල ප්‍රඥා පිරීමද, මහත් බවද, මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරව්යයි මෙසේ කාම භවයෙහි ආත්ම ලැබීම පහකිරීම පිණිස අපි ධර්ම දෙශනා කරමුද, ඇැත්නි, ඒ ආත්ම ලැබීම මේ හෝ වේයයි ප්‍රකාශ කරන්නෙමු.

**69.** "පොට්ඨපාදය, යම්සේ පිළිපදින්නාවූ ඔබගේ කෙලෙස් සහිත ධර්ම පහවන්නාහුද, සිත පිරිසිදු වන්නාවූ ධර්ම වැඩෙන්නාහුද, මාර්ගඵල ප්‍රඥා පිරීමද, මහත් බවද, මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කරව්යයි ඔබවහන්සේ යම් රූප භවයෙක්හි ආත්ම ලැබීමක් දුරුකිරීම පිණිස ධර්ම දෙශනා කරණ සේක්ද, ඇවැත්නි, ඒ රූප භවයෙහි ආත්ම ලැබීම කවරේදැයි ඉදින් අන්‍යයෝ අපගෙන් මෙසේ අසන කල, මෙසේ පිළිපදින්නාවූ ඔබගේ කෙලෙස් සහිත ධර්ම පහවන්නාවූද, සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද මාර්ගඵල ප්‍රඥාවන්ගේ පිරීමද, මහත් බවද මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කරව්යයි යම් රූප භවයෙක්හි ආත්ම ලැබීම දුරුකිරීම පිණිස අපි ධර්ම දෙශනා කරමුද, ඇවැත්නි, ඒ රූපභවයෙහි ආත්ම ලැබීම මේ හෝ වේයයි මෙසේ ප්‍රකාශ කරන්නෙමු.

**70.** "පොට්ඨපාදය, යම්සේ පිළිපදින්නාවූ ඔබගේ කෙලෙස් සහිත ධර්ම පහවන්නාහුද, සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද, මාර්ග ප්‍රඥා පිරීමද මහත් බවද, මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරව්යයි යම් අරූප ආත්ම ලැබීම පහකිරීම පිණිස ඔබවහන්සේ ධර්ම දේශනා කරණ සේක්ද? ඇවැත්නි, ඒ අරූපාත්ම ලැබීම කවරේ දැයි, ඉදින් අන්‍යයෝ අපගෙන් මෙසේ අසන්නාහුද, එසේ අසන ලද්දාවූ අපි යම්සේ පිළිපදින්නාවූ ඔබගේ කෙලෙස් සහිත ධර්ම පහවන්නාහුද, සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද මාර්ගඵල ප්‍රඥාවන්ගේ මහත්

බවද මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කරව්යයි යම් අරූප ආත්ම ලැබීම දුරුකිරීම පිණිස අපි ධර්ම දෙශනා කරමුද? ඇවැත්නි, ඒ අරූප ආත්ම ලැබීම මේයයි ඔවුන්ට අපි ප්‍රකාශ කරන්නෙමු. පොට්ඨපාදය, ඒ කුමකැයි සිතන්නෙහිද? එසේ ඇති කල මා දෙසූ ධර්මය උත්තර සහිත බවට පැමිණෙන්නේ නොවේ දැයි කී සේක.

"ස්වාමීනි, එසේ ඇති කල ඔබ වහන්සේ දෙසූ ධර්මය උත්තර සහිත බවට ඒකාන්තයෙන් පැමිණේමයයි කීයේය.

**71.** "පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් ප්‍රාසාදයකට නගිනු පිණිස ඒ ප්‍රාසදය යට ඉණිමගක් කරන්නේය. ඒ මේ පුරුෂයාහට, පුරුෂය, ඔබ යම් ප්‍රාසාදයකට නගිනු පිණිස ඉණිමගක් කරන්නෙහිද, ඒ ප්‍රාසාදය නැගෙනහිර දිසාවෙහි දැයි කියා හෝ දකුණු දිසාවෙහිදැයි කියා හෝ උතුරු දිසාවෙහි දැයි කියා හෝ උස් දැයි කියා හෝ මිටි දැයි කියා හෝ මධ්‍යම දැයි කියා හෝ දන්නෙහි දැයි මෙසේ කියන්නාහුද, ඇවැත්නි, යම් ප්‍රාසාදයකට නගිනු පිණිස ඒ ප්‍රාසාදයේම යට ඉණිමගක් කෙරෙම්ද ඒ මේ ප්‍රාසාදයයි ඉදින් ඔහු මෙසේ කියන්නේද, පොට්ඨපාදය, ඒ කුමකැයි සිතන්නෙහිද? එසේ ඇති කල ඒ පුරුෂයාගේ කීම උත්තර සහිත බවට පැමිණේ නොවේදැ"යි ඇසූසේක.

"ස්වාමීනි, මෙසේ ඇති කල ඒ පුරුෂයාගේ කීම උත්තර සහිත බවට පැමිණේමයයි" කීයේය.

**72.** පොට්ඨපාදය, එසේම ඉදින් අපෙන් මෙසේ අසන්නාහුද, ඇවැත්නි, යම්සේ පිළිපදින්නාවූ ඔබගේ සිත කිලුටු කරන්නාවූ ධර්ම පහවන්නාහුද, සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද, මාර්ගඵල ප්‍රඥාවන්ගේ පිරීමද, මහත් බවද, මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කරව් යයි ඔබවහන්සේ යම් ආත්ම ලැබීමක් පහකිරීම පිණිස ධර්ම දෙශනා කරණසේක්ද, ඇවැත්නි, ඒ කාමභවයෙහි ආත්ම ලැබීම කවරේද? එසේ අසන ලද්දාවූ අපි යම්සේ පිළිපදින්නාවූ ඔබගේ කෙලෙස් සහිත ධර්ම පහ වන්නාහුද සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද, මාර්ග ඵල ප්‍රඥා පිරීමද, මහත්

බවද මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කරව්යයි යම් කාමභවයෙක්හි ආත්ම ලැබීමක් දුරුකිරීම පිණිස අපි ධර්ම දෙශනා කරමුද, ඇවැත්නි, ඒ කාමභවයෙහි ආත්ම ලැබීම මේයයි ඔවුන්ට අපි ප්‍රකාශ කරන්නෙමු. පොට්ඨපාදය, ඒ කුමකැයි සිතන්නෙහිද? එසේවූ කල මා දෙසූ ධර්මය උත්තර සහිත බවට පැමිණෙන්නේ නොවේදැයි" ඇසූසේක.

"ස්වාමීනි, එසේවූ කල ඔබවහන්සේ දෙසූ ධර්මය උත්තර සහිත බවට එකාන්තයෙන් පැමිණෙන්නේයයි" කීයේය.

"පොට්ඨපාදය, එසේය. ඉදින් අපෙන් මෙසේ අසන්නාහුද, ඇවැත්නි, යම්සේ පිළිපදින්නාවූ ඔබගේ කෙලෙස් සහිත ධර්ම පහවන්නාහුද, සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද, මාර්ගඵල ප්‍රඥාවන්ගේ පිරීමද, මහත් බවද මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධකොට පැමිණ වාසය කරව්යයි ඔබවහන්සේ යම් රූපභවයෙක්හි ආත්ම ලැබීමක් පහකිරීම පිණිස ධර්ම දේශනා කරණසේක්ද ඇවැත්නි, ඒ රූපභවයෙහි ආත්ම ලැබීම කවරේද? එසේ අසන ලද්දාවූ අපි යම්සේ පිළිපදින්නාවූ ඔබගේ කෙලෙස් සහිත ධර්ම පහවන්නාහුද සිත පිරිසිදු කරන්නාවූ ධර්ම වැඩෙන්නාහුද මාර්ග ඵලප්‍රඥා පිරීමද මහත් බවද මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කරව්යයි යම් රූපභවයෙක්හි ආත්ම ලැබීම දුරුකිරීම පිණිස අපි ධර්ම දෙශනා කරමුද, ඇවැත්නි, ඒ රූපභවයෙහි ආත්ම ලැබීම මේයයි ඔවුන්ට අපි ප්‍රකාශ කරන්නෙමු. පොට්ඨපාදය, ඒ කුමකැයි සිතන්නෙහිද? එසේ වූ කල මා දෙසූ ධර්මය උත්තර සහිත බවට පැමිණෙන්නේ නොවේ දැයි" ඇසූසේක.

"ස්වාමීනි, එසේවූ කල ඔබවහන්සේ දෙසූ ධර්මය උත්තර සහිත බවට ඒකාන්තයෙන් පැමිණේමයයි" කීයේය.

73. මෙසේ කී කල (හස්ත්‍යාචාර්ය) ඇතුන් හික්මවන්නාගේ පුත්‍රවූ චිත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට මේ වචන කීයේය. "යම් කලෙක කාමභවයෙහි ආත්ම ලැබීමක් වේද එකල ඔහුට රූපභවයෙහි ආත්ම ලැබීමක් නැත්තේ වෙයි. අරූපවූ ආත්ම

ලැබීමක් නැත්තේ වෙයි. එකල මොහුට කාමභවයෙහි ආත්ම ලැබීම ඇත්තේ වෙයි. ස්වාමීනි, යම් කලක රූපභවයෙහි ආත්ම ලැබීමක් වේද, එකල මොහුට කාමභවයෙහි ආත්ම ලැබීමක් නැත්තේය, අරූපවූ ආත්ම ලැබීමක් නැත්තේය. එකල මොහුට රූපභවයෙහි ආත්ම ලැබීම ඇතිවූයේ වෙයි. ස්වාමීනි, යම් කලක අරූපවූ ආත්ම ලැබීමක් වේද, එකල මොහුට කාමභවයෙහි ආත්ම ලැබීමක් නැත්තේය. රූපභවයෙහි ආත්ම ලැබීමක් නැත්තේ වෙයි. එකල මොහුට අරූපවූ ආත්ම ලැබීම ඇත්තේ වෙයි."

**74.** "චිත්‍රය, යම් කලක කාමභවයෙහි ආත්ම ලැබීමක් වේද, එකල රූපභවයෙහි ආත්මභාව ලැබීම යන කොටසට නොපැමිණෙයි. අරූපවූ ආත්මභාව ලැබීම යන කොටසට නොපැමිණෙයි. එකල කාමභවයෙහි ආත්ම භාව ලැබීම යන කොටසට පැමිණෙයි. චිත්‍රය, යම් කලක රූප භවයෙහි ආත්ම ලැබීමක් වේද, එකල කාමභවයෙහි ආත්ම භාව ලැබීම යන කොටසට නොපැමිණෙයි. අරූපවූ ආත්ම ලැබීම යන කොටසට නොපැමිණෙයි. රූපභවයෙහි ආත්ම ලැබීම යන කොසට පැමිණෙයි. චිත්‍රය යම් කලක අරූපවූ ආත්ම ලැබීමක් වේද, එකල කාමභවයෙහි ආත්ම ලැබීම යන කොටසට නොපැමිණෙයි. රූපභවයෙහි ආත්මයක් ලැබීම යන කොටසට නොපැමිණෙයි. අරූපවූ ආත්ම ලැබීම යන කොටසට පැමිණෙයි. චිත්‍රය, ඉදින් ඔබගෙන් මෙසේ අසන්නාහු නම් ඔබ අතීත කාලයේ වූයෙහිද නුවූයේ නොවෙහිද, ඔබ මතු කාලයෙහි නොවන්නෙහිද, ඔබ නොවන්නේ නොවන්නෙහිද, ඔබ දැන් ඇත්තෙහිද, ඔබ නැත්තේ නොවෙහිදැ"යි චිත්‍රය, මෙසේ අසන ලද්දාවූ ඔබ කුමකැයි ප්‍රකාශ කරන්නෙහිද?"

"ස්වාමීනි, ඉදින් මාගෙන් මෙසේ අසන්නාහු නම් ඔබ, අතීත කාලයෙහි වූයෙහිද ඔබ නුවූයේ නොවෙහිද, ඔබ මතු කාලයෙහි නොවන්නෙහිද, ඔබ නොවන්නේ නොවන්නෙහිද, ඔබ දැන් ඇත්තෙහිද, ඔබ නැත්තේ නොවෙහිදැයි, ස්වාමීනි, මෙසේ අසන ලද්දාවූ මම මෙසේ ප්‍රකාශ කරන්නෙමි. මම අතීත කාලයෙහි වීමි. මම නුවූයේ නොවෙමි. මම අනාගතයෙහි වන්නෙමි. මම නොවන්නේ නොවෙමි. මම දැන් ඇත්තේ වෙමි. මම නැත්තේ

නොවෙමි. ස්වාමීනි, මෙසේ අසන ලද්දාවූ මම මෙසේ ප්‍රකාශ කරන්නෙමියි" කීයේය.

**75.** "චිත්‍රය, ඔබගෙන් මෙසේ අසන්නාහු නම්, 'ඔබගේ යම් අතීත ආත්මයක් ලැබීමක් වූයේද එයම ඔබට ඇත්තේ නොවේද? එකල අනාගත ආත්මය නැත්තේ නොවේද වර්තමාන (දැන් පවත්නා) ආත්මය නැත්තේ නොවේද? ඔබගේ යම් අනාගත ආත්මයක් වන්නේ නම්, එයම ඔබට ඇත්තේ නොවේද? අතීත ආත්මය නැත්තේ නොවේද? වර්තමාන ආත්මය නැත්තේ නොවේද? ඔබගේ යම් වර්තමාන ආත්මයක් වේද? එයම ඔබට ඇත්තේ නොවේද? අතීත ආත්මයක් නැත්තේ නොවේද? අනාගත ආත්මයක් නැත්තේ නොවේදැ"යි චිත්‍රය, මෙසේ අසන ලද්දාවූ ඔබ කිමෙකැයි කියන්නෙහිදැ"යි ඇසීය.

"ස්වාමීනි, මාගෙන් මෙසේ අසන්නාවූ නම්, "තාගේ යම් අතීතයෙහි ආත්මයක් ලැබීමක් වීද ඔබගේ ඒ ආත්මයම ඇත්තේ නොවේද එකල අනාගත ආත්මය සහ වර්තමාන ආත්මය නැත්තේ නොවේද? යම් අනාගත ආත්ම භාවයක් ලබන්නේ වේද, එයම ඔබට ඇත්තේ නොවේද? එකල අතීත සහ වර්තමාන ආත්ම භාවය නැත්තේ නොවේද, ඔබගේ යම් මේ වර්තමාන ආත්මයක් වේද? එයම ඔබට ඇත්තේ නොවේද? අනාගත ආත්මය නැත්තේ නොවේද? වර්තමාන ආත්මයක් නැත්තේ නොවේදැයි මෙසේ අසන ලද්දාවූ මම මෙසේ ප්‍රකාශ කරන්නෙමි, මාගේ යම් අතීතවූ ආත්මය ලැබීමක් වීද, මාගේ ඒ ආත්මය ලැබීම ඒ කාලයෙහි ඇත්තේම විය. අනාගතයෙහි ඒ ආත්මය ලැබීමක් නොවන්නේය. දැන් කාලයේ ඒ ආත්මය ලැබීම නැත්තේය. මාගේ යම් අනාගතවූ ආත්ම ලැබීමක් වන්නේද, ඒ මාගේ අනාගත ආත්මය ඒ කාලයේ වන්නේය. අතීතයෙහි ඒ අනාගත ආත්ම ලැබීම නැත්තේය. දැන් කාලයෙහිද ඒ ආත්මය ලැබීම නැත්තේය. මාගේ යම් දැන් මේ කාලයේ ආත්ම ලැබීමක් වේද, ඒ මාගේ ආත්ම ලැබීම දැන් මේ කාලයෙහි වේ. අතීතයෙහි ඒ ආත්ම ලැබීම නැත්තේය. අනාගතයෙහි ඒ ආත්මය ලැබීම නොවන්නේයයි, ස්වාමීනි, මෙසේ අසන ලද්දාවූ මම මෙසේ ප්‍රකාශ කරන්නෙමි"යි කීයේය.

**76.** "චිත්‍රය, එසේම යම් කලක කාමභවයෙහි ආත්ම ලැබීමක් වේද එකල රූපභවයෙහි ආත්ම ලැබීම නොවෙයි යන කොටසට පැමිණෙයි. අරූපවූ ආත්ම ලැබීම නොවෙයි යන කොටසට පැමිණෙයි. එකල කාමභවයෙහි ආත්ම ලැබීම යන කොටසට පැමිණෙයි.

"චිත්‍රය, යම් කලක රූපභවයෙහි ආත්ම ලැබීමක් වේද එකල කාමභවයෙහි ආත්ම ලැබීම නෙවෙයි යන කොටසට පැමිණෙයි. අරූප ආත්ම ලැබීම නොවෙයි යන කොටසට පැමිණෙයි. එකල රූපභවයෙහි ආත්ම ලැබීම යන කොටසටම පැමිණෙයි. චිත්‍රය, යම් කලක අරූප ආත්ම ලැබීමක් වේද එකල කාමභවයෙහි ආත්මභාව ලැබීම යන කොටසට නොපැමිණෙයි. රූපභවයෙහි ආත්ම ලැබීම යන කොටසට නොපැමිණෙයි. එකල අරූපවූ ආත්ම භාව ලැබීම යන කොටසට පැමිණෙයි.

**77.** "චිත්‍රය, යම්සේ දෙනගෙන් කිරිද, කිරෙන් දීද දියෙන් වෙඬරුද, වෙඬරුවෙන් ගිතෙල්ද, ගිතෙලින් ගිතෙල් මණ්ඩයද වෙයි. යම් කලක කිරිවේද, එකල දිය යන කොටසට නොපැමිණේද, වෙඬරුය යන කොටසට නොපැමිණේද ගිතෙල්ය යන කොටසට නොපැමිණේද, ගිතෙල් මණ්ඩය යන කොටසට නොපැමිණේද එකල කිරිය යන කොටසටම පැමිණේද යම් කලක දී වේද, එකල කිරි යන කොටසට නොපැමිණේද, වෙඬරු යන කොටසට නොපැමිණේද ගිතෙල් යන කොටසට නොපැමිණේද, ගිතෙල් මණ්ඩය යන කොටසට නොපැමිණේද එකල දී කොටසටම පැමිණේද, යම් කලක වෙඬරු වේද, එකල කිරි යන කොටසට නොපැමිණේද, දී යන කොටසට නොපැමිණේද, ගිතෙල් යන කොටසට නොපැමිණේද, ගිතෙල් මණ්ඩය යන කොටසට නොපැමිණේද, එකල වෙඬරු යන කොටසටම පැමිණේද, යම් කලක ගිතෙල් වේද, එකල කිරි යන කොටසට නොපැමිණේද, දී යන කොටසට නොපැමිණේද, වෙඬරු යන කොටසට නොපැමිණේද, ගිතෙල් මණ්ඩය යන කොටසට නොපැමිණේද, එකල ගිතෙල් යන කොටසටම පැමිණේද, යම් කලක ගිතෙල් මණ්ඩය වේද එකල කිරි යන කොටසට නොපැමිණේද, දී යන කොටසට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොපැමිණේද වෙඬරු යන කොටසට නොපැමිණේද ගිතෙල් යන කොටසට නොපැමිණේද, එකල ගිතෙල් මණ්ඩය යන කොටසටම පැමිණේද.

**78.** "චිත්‍රය, එමෙන්ම යම් කලක කාමභවයෙහි ආත්ම ලැබීමක්වේද, එකල රූපභවයෙහි ආත්ම ලැබීමය යන කොටසට නොපැමිණෙයි. අරූපවූ ආත්ම ලැබීමය යන කොටසට නොපැමිණෙයි. එකල කාමභවයෙහි ආත්ම කොටසටම පැමිණෙයි. චිත්‍රය යම් කලක රූපභවයෙහි ආත්ම ලැබීමක් වේද, එකල කාමභවයෙහි ආත්ම ලැබීමය යන කොටසට නොපැමිණෙයි, අරූපවූ ආත්ම ලැබීම යන කොටසට නොපැමිණෙයි, එකල රූප භවයෙහි ආත්ම ලැබීම යන කොටසටම පැමිණෙයි. යම් කලක අරූපවූ ආත්ම ලැබීමෙක් වේද, එකල කාමභවයෙහි ආත්ම ලැබීම යන කොටසට නොපැමිණෙයි. රූපභවයෙහි ආත්ම ලැබීම යන කොටසට නොපැමිණෙයි. එකල අරූපවූ ආත්ම ලැබීම යන කොටසට පැමිණෙයි. චිත්‍රය, යම් නාමයන් තථාගත තෙම ව්‍යවහාර කෙරේද. ලොභ (දෘෂ්ටි) ඇදහීම් වශයෙන් නොගණීද, මේ 'කාමභවයෙහි ආත්ම ලැබීම' යන නාම ලෝකයාගේ නාම වෙත්. ලෝකයාගේ වචන වෙත් ලොකව්‍යවහාර වෙත්. ලෝකයාගේ පැණවීම් වෙත්යයි" කීසේක. "චිත්‍රය, යම් නාමයන් තථාගත තෙම ව්‍යවහාර කෙරේද, ලොභ ඇදහීම් වශයෙන් නොගණීද මේ 'රූපභවයෙහි ආත්ම ලැබීම' යන නාම ලෝකයාගේ නාම වෙත්. ලෝකයාගේ වචන වෙත්. ලොක ව්‍යවහාර වෙත්. ලෝකයාගේ පැණවීම් වෙත්යයි,' කීසේක. " චිත්‍රය, යම් නාමයන් තථාගත තෙම ව්‍යවහාර කෙරේද ලොභ ඇදහීම් වශයෙන් නොගණීද, මේ 'අරූප ආත්ම ලැබීම' යන නාම ලෝකයාගේ නාම වෙත්. ලෝකයාගේ වචන වෙත්. ලොක ව්‍යවහාර වෙත්. ලොකයාගේ පැණවීම් වෙත්යයි" කීසේක.

**79.** මෙසේ කී කල පොට්ඨපාද පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මේ වචන කීයේය. "ස්වාමීනි, ධර්ම දේශනාව ඉතා යහපති. ස්වාමීනි, ධර්ම දේශනාව ඉතා යහපති, ස්වාමීනි, යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේ හෝ යම් සේද, වසන ලද්දක් විවෘත කරන්නේ හෝ යම්සේද, මංමුළා වූවෙකුට මාර්ගය

කියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරෙහි හෝ තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දේශනාකරන ලද්දේය. ස්වාමීනි, මේ මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, භික්ෂු සංඝයාද සරණ යමි. භාග්‍යවත් තෙම මා අද පටන් පණ ඇති තෙක් සරණ ගියාවූ උපාසකයෙකැයි දරා ගන්නාසේක්වා.”

**80.** ඇතුන් හික්මවන්නාගේ පුත්‍රවූ චිත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මේ වචන කීයේය. ස්වාමීනි, ධර්ම දේශනාව ඉතා යහපති. ස්වාමීනි, ධර්මදේශනාව ඉතා යහපති. ස්වාමීනි, යටිකුරු කරණලද්දක් උඩුකුරුකරන්නේ හෝ යම්සේද වසන ලද්දක් විවෘතකරන්නේ හෝ යම්සේද, මංමුළාවූවෙකුට මාර්ගය කියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහන් දරන්නේ හෝ යම්සේද එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරණ ලද්දේය. ස්වාමීනි, මේ මම භාග්‍යවතුන්වහන්සේද ධර්මයද සංඝයාද සරණ යමි. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මහණකම ලබන්නෙමි, උපසම්පදාවද ලබන්නෙමි.

**81.** ඇතුන් හික්මවන්නාගේ පුත්‍රවූ චිත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මහණකම ලැබූයේය. උපසම්පදාවද ලැබූයේය. මෑත උපසම්පදාවූ ඇතුන් හික්මවන්නාගේ පුත්‍රවූ ආයුෂ්මත් චිත්‍රතෙම සමූහයාගෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් තවන වීර්ය ඇතුව ආත්ම ආලය දුරුකර වාසය කරමින් කුලපුත්‍රයෝ (යහපත් ගති ඇත්තෝ) යමක් සඳහා හොඳින් ගිහිගෙයින් ගොස් ශාසනයෙහි මහණ වෙත්ද, ඒ උතුම්වූ මාර්ග බ්‍රහ්මචර්යාව අවසන්කොට ඇත්තාවූ නිවණ මේ ආත්මයෙහිම තමන් උසස් ඥානයෙන් දැන අවබෝධකොට ඊට පැමිණ වාසය කළේය. උත්පත්තිය නැති විය, මාර්ග බ්‍රහ්මචර්යාව වැස නිමවන ලද්දේය. කටයුතුකොට නිවෙන ලද්දේය. මේ ස්කන්ධසන්තානය පිණිස අනිකක් නැතැයි දන්නේය. ඇතුන් හික්මවන්නාගේ පුත්‍රවූ ආයුෂ්මත් චිත්‍ර තෙම රහතුන් අතුරෙන් එක් රහත් නමක් වූයේයි.

**නවවෙනිවූ පොට්ඨපාද සූත්‍රය නිමියේය.**

# 10 සුභ සූත්‍රය.

1. "මා විසින් මෙසේ අසනලදී. (මාගේ ඇසීම මෙසේය.) එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පා නොබෝකලක් වූ කල ආයුෂ්මත් ආනන්දතෙරුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඬු මහසිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරයි. එකල තොදෙය්‍ය බ්‍රාහ්මණයාගේ පුත්‍රවූ සුභ තරුණයා යම් කටයුත්තක් සඳහා සැවැත් නුවර වාසය කෙරෙයි.

2. එවිට තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයා එක්තරා තරුණයෙක් තමා ඉදිරියට කැඳවූයේය. "තරුණයා, මෙහෙ එන්න, ඔබ ශ්‍රමණ ආනන්ද තෙරුන්වහන්සේ යම් තැනකද එතැනට පැමිණෙව, උන්වහන්සේ ඉදිරියට පැමිණ, 'තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයා පින්වත්වූ ආනන්ද තෙරුන් වහන්සේ දුක් නැතුව නිරොගිව, සැහැල්ලු පැවතුම් ඇතුව ශරීරබල ඇතුව, සැප පහසු ඇතුව වෙසේදැයි අසන්නේයයි මාගේ වචනයෙන් ශ්‍රමණ ආනන්ද තෙරුන් වහන්සේ දුකක් නැතිව, නිරොගිව, සැහැල්ලු පැවතුම් ඇතුව, ශරීර බල ඇතුව, සැප පහසු ඇතුව වෙසේදැයි අසව්, මෙසේද කියව්. පින්වත් ආනන්ද තෙරුන්වහන්සේ තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයාගේ නිවස යම් තැනකද අනුකම්පාකොට එතැනට පැමිණෙත් නම් ඉතා යහපත."

3. ඒ තරුණයා, "පින්වත එසේය"යි කියා තොදෙය්‍ය පුත්‍රවූ සුභ නම් තරුණයාගේ වචන පිළිගෙණ, ආයුෂ්මත් ආනන්ද තෙරුන්වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. එසේ පැමිණ ආයුෂ්මත් ආනන්ද තෙරුන්වහන්සේ සමග සතුටු වූයේය. සතුටු වියයුතුවූද සිහිකටයුතු වූද කථාව කොට නිමවා එක පැත්තකටවී උන්නේය. එක පැත්තකටව උන්නාවූ ඒ තරුණයා ආයුෂ්මත් ආනන්ද තෙරුන්වහන්සේට මේ කාරණය කීයේය. "තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයා පින්වත්වූ ආනන්ද තෙරුන්වහන්සේ දුක් නැතුව, නිරොගිව, සැහැල්ලු පැවතුම් ඇතුව, ශරීර බල ඇතුව, සැප පහසු ඇතුව වෙසේදැයි අසයි, මෙසේද කියයි. 'ආනන්ද තෙරුන් වහන්සේ තොදෙය්‍ය පුත්‍රවූ

සුභ තරුණයාගේ නිවස යම් තැනකද අනුකම්පාකොට එතැනට පැමිණෙත් නම් ඉතා යහපති”

4. මෙසේ කී කල ආයුෂ්මත් ආනන්ද තෙරුන්වහන්සේ ඔහුට මෙසේ කීයේය. “තරුණය, මෙය කාලය නොවෙයි. මා විසින් අද සුලු බෙහෙතක් බොන ලද්දේය. පැමිණිය යුතු කල් වේලා නුවණින් සලකාගෙණ හෙටවත් පැමිණෙම් නම් යහපතැ”යි කීයේය. එකල ඒ තරුණයා, පින්වතුන් වහන්ස, එසේය”යි කියා ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේගේ වචන පිළිගෙණ ආසනයෙන් නැගිට තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයා යම් තැනකද එතැනට පැමිණියේය පැමිණ තොදෙය්‍ය පුත්‍රවූ සුභ නම් තරුණයාට මෙසේ කීයේය. “අපි පින්වත්හුගේ වචනයෙන් ආනන්ද තෙරුන් වහන්සේට මෙසේ කීවෙමු.

“තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයා පින්වත්වූ ආනන්ද තෙරුන් වහන්සේ දුක් නැතුව, නිරොගිව, සැහැල්ලු පැවතම් ඇතුව, ශරීර බල ඇතුව, සැප පහසු ඇතුව වෙසේදැයි අසයි ආනන්ද තෙරුන් වහන්සේ තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයාගේ නිවස යම් තැනෙකද අනුකම්පා කොට එතැනට පැමිණෙත් නම් ඉතා යහපති.”

මෙසේ කීකල ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේ මට මෙසේ කීයේය. “තරුණය, මෙය කාලය නොවෙයි. මා විසින් අද බෙහෙත් ස්වල්පයක් බොනලද්දේය. පැමිණිය යුතු කල්වේලා නුවණින් සලකාගෙන හෙටවත් පැමිණෙම් නම් යහපතැයි” යම් හේතුවකින් පින්වත් ආනන්ද තෙරුන් වහන්සේ හෙට දිනය පැමිණීමට ඉඩ තැබුවේද (අවකාශ කළේද) පින්වත එපමණකින්ම මේ ආරාධනාව පිළිගැනීම කරණ ලද්දේමය.”

5. එවිට ආයුෂ්මත් ආනන්ද තෙරුන්වහන්සේ ඒ රාත්‍රිය පසුවී පෙරවරු කාලයෙහි ඇඳ පොරවා සිවුරු පාත්‍රා ගෙණ පසු මහණවූ චෙතක නම්වූ භික්ෂුව හා සමග තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයාගේ නිවස යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ පණවනලද ආසනයෙහි වැඩහුන්නේය. එවිට තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයා ආනන්ද තෙරුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය එසේ පැමිණ ආයුෂ්මත් ආනන්ද

තෙරුන්වහන්සේ හා සමග සතුටු වූයේය. සතුටු වියයුතු සිහිකටයුතු කථාව කොට එකපැත්තකටව උන්නේය. එකපැත්තකටව උන්නාවූ තොදෙය්‍යපුත්‍රවූ සුභ තරුණයා ආයුෂ්මත් ආනන්ද තෙරුන් වහන්සේට මේ කාරණය කීයේය.

"පින්වත් ආනන්ද තෙරුන්වහන්සේ ඒ භවත් ගෞතමයාණන් වහන්සේගේ දීර්ඝ කාලයක් මුලුල්ලේ ලඟ සිට උපස්ථාන කරන්නා වෙයි. කිට්ටුව හැසුරුණේ වෙයි ඒ භවත් ගෞතම තෙම යම් ධර්ම පිළිබඳ ගුණ කියන ස්වභාව ඇතිසේක්ද, යම් ධර්මයක මේ ජනසමූහයා යෙදෙවූසේක්ද, තැන්ත් කරවූසේක්ද, පිහිටවූසේක්දැයි, මේ කාරණය පින්වත්වූ ආනන්ද තෙරුන්වහන්සේ දන්නේය පින්වත් ආනන්දතෙරුන් වහන්ස, ඒ භවත් ගෞතමයාණන් වහන්සේ කවර ධර්ම පිළිබඳ ගුණ කියන ස්වභාව ඇතිවූයේද, කවර ධර්මයන්හි මේ ජනසමූහයා යෙදවූයේද, තැන්පත් කරවූයේද, පිහිටුවූයේද?

**6.** තරුණය, ඒ භාග්‍යවතුන් වහන්සේ තුන් ආකාර ස්කන්ධයන්ගේ ගුණ කියන ස්වභාව ඇත්තේය. මෙහිම මේ ජනසමූහයා යෙදවූයේය. තැන්පත් කරවූයේය. පිහිටුවූයේය. මොන ස්කන්ධයන්ගේද යතහොත්, උතුම් ශීල ස්කන්ධයේද, උතුම් සමාධි ස්කන්ධයේද උතුම් ප්‍රඥා ස්කන්ධයේද, යන තුන් වැදෑරුම් ස්කන්ධයන්ගේය. තරුණය, ඒ භාග්‍යවතුන් වහන්සේ මේ තුන් ස්කන්ධයන්ගේ ගුණ කියන ස්වභාව ඇත්තේය. මෙහිම මේ ජනසමූහයා යෙදෙවූයේය තැන්පත් කරවූයේය පිහිටුවූයේය." එකල තරුණයා 'ආනන්ද තෙරුන් වහන්ස, ඒ භවත් ගෞතමයන් වහන්සේ යම් ශීල ස්කන්ධයක් ගැන ගුණ කියන ස්වභාව ඇතිවූයේද, යම් ශීල ස්කන්ධයක මේ ජනසමූහයා යෙදවූයේද, තැන්පත් කරවූයේද පිහිටුවූයේද ඒ උතුම්වූ ශීල ස්කන්ධය කවරේදැයි" ඇසුවේය.

"තරුණය, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, විදර්ශනා ඥාණ ආදී විද්‍යා අට සීලසංවරය ආදී හසුරුවන ධර්ම පසළොස යන අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙව් මිනිසුන්ට

ගුරුවරයෙක්වූ (චතුරාර්ය සත්‍ය) සත්‍යවූ උතුම් ධර්මසතර අවබොධ කළාවූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් සහ මිනිසුන් සහිතවූ, සත්ත්ව වර්ගයා ස්වකීය උසස් ඥානයෙන් දැන පැහැදිලි කොට ප්‍රකාශ කෙරේද, ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූද, මැද යහපත්වූද, කෙළවර යහපත් වූද, අර්ථ සහිතවූද, (දස ආකාරයෙන්) නියම විධියට වචන ශබ්ද කරන්නාවූ ව්‍යඤ්ජන සහිත, සියලු ලෙසින් සම්පූර්ණවූ පිරිසිදුවූ, සියලු ශාසන මාර්ග බ්‍රහ්මචර්යය ගෙන හැර දක්වත්.

7. "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයිද ඔහු ඒ දහම අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය. 'ගෘහවාසය පීඩා සහිතයි. රාගාදී කෙලෙස් සහිත මාර්ගයෙකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම හිසකෙස් දැලිරැවුලු කපාදමා සිවුරු හැඳ පොරවා ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි' කියායි.

'ඔහු පසුකාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් රාශිය හැර, ස්වල්පවූ හෝ බෙහෝවූ නෑ පිරිස් හැර, හිසකෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වේද මෙසේ මහණවූ ඔහු ප්‍රධාන සංවරසීලයෙන් යුක්තවූයේ, යහපත් හැසිරීමෙන් හා වරදනැති පැවැත්මෙන් යුක්තවූයේ, ස්වල්පවූත් අකුසලයන්හි විශෙෂයෙන් භය දක්නා ගති ඇත්තෙක්වූයේ, යහපත්වූ ශරීරයෙන් වචනයෙන් ක්‍රියාවෙන් යුක්තවූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ ජීවිත පැවතුම් ඇත්තේ වෙයි. සීලයෙන් යුක්තවූයේ වෙයි. ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේ වෙයි කෑමෙහි පමණ

දන්නේ වෙයි, යහපත් සිහියෙන් හා නුවණින් යුක්තවූයේ වෙයි. සන්තෝෂයෙන් යුක්ත වෙයි.

8. "තරුණය, භික්ෂුනමක් කෙසේ නම් සීලසම්පන්න වේද? තරුණය, මේ සස්නෙහිවූ භික්ෂුනමක් ප්‍රාණවධය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ බහා තබන ලද දඬු ඇත්තේ, බහාතබන ලද ආයුධ ඇත්තේ, පව්කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවන්තවූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතුව වාසය කෙරේද මෙයද ඔහුගේ සීලයක්වේ. නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළැක්කේ, දුන්දෙයම ගන්නේ, දුන් දෙයම කැමතිවන්නේ, සොරනොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කෙරේද, මෙයද ඔහුගේ සීලයෙකි, අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන්වූයේ බ්‍රහ්මචාරීවේද මෙයද ඔහුගේ සීලයකි, බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේද මෙයද ඔහුගේ සීලයෙකි. පිසුණු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ, මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේද, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේද මෙසේ භෙදවූවන් ගළපන්නේ සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ තෙපුල් කියන්නේද මෙයද ඔහුගේ සීලයෙකි. ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේ යම් වචනයක් නිදොස් වේද, කණට සැපද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රිය කරන්නේද, එබඳු වචනම කියන්නේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළැක්කේද, කාලයට සුදුසු කථා කරන්නේද, සිදුවූ තෙපුල්ම කියන්නේද, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්ත විනය සම්බන්ධවූ තෙපුල් කියන්නේද, සුදුසු

කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේද මෙසේ ඒ හිස් කථාවෙන් වැළැක්මද දියුණුවට හේතුවන වචන කීමද, මෙයද ඔහුගේ සීලයෙකි.

"තණ, ගස්, වැල්, සිඳීම් බිඳීම්, ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේද, එක් වේලේ වළඳන කෑම ඇත්තේද, රාත්‍රි කෑමෙන් හා අවේලෙහි කෑමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේද, නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේද, මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම්, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේද, උස්අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේද, රන් රිදී මසුරන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් වැළැක්කේද, අමුවූ ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද, අමුමස් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද ස්ත්‍රීන් හා ගෑනු ළමයින් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොරවූයේද වේ වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් සම්පූර්ණයෙන් තොර වූයේද, එළුවන් හා තිරෙළුවන් පිළිගැනීමෙන් තොර වූයේද, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද, සම්පූර්ණයෙන් තොර වූයේද. ගිහීන්ගේ දූත මෙහෙවරය. ගෙන්ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් සම්පූර්ණයෙන් වැළැක්කේද, ගනු දෙනු කිරීමය, තරාදි ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මිශ්‍ර වඤ්චා කිරීමය, වී ආදිය මැණීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් සම්පූර්ණයෙන් වැළක්කේද, කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය, යන මෙයින්ද සම්පූර්ණයෙන් වළකියිද, මෙයද ඔහුගේ සීලයෙක්වේ.

**9.** "සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා මූලබීජය, ඛන්ධබීජය, ඵළුබීජය, දලුබීජය, පස්වැනිවූ බීජබීජය

යන මේ ගස් ආදිය වැවීමෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙක්වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, බීම වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, නො ඉටන ලද (අයිතියට නොගත්) සිවුරු ආදිය, යාන සංඛ්‍යාත වහන් දෙකකින් වැඩි සයන, සුගන්ධයන්, තල සහල් ආදිය තැන්පත් කොට තබා ප්‍රයෝජන ගැන්මයයි කියන ලද පසුවට තබා ප්‍රයෝජන ගැන්මෙහි යෙදී වාසය කරත්ද මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේද, මෙයද ඔහුගේ සීලයෙක් වේ.

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟ මඩුලු සැරසීමය, වැඩක් නැති කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනි නැංවීමය, සතරැස් හෝ කළ බෙර ගැසීමය, ශොභන චිත්‍ර විචිත්‍රය, සණදොවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා පොරය, අශ්වයින් යොදා පොරය, මවුන් හා පොරය, ගවයින් හා පොරය, එළුපොරය මෙණ්ඩක එළුපොරය, කුකුළුපොරය, වටුපොරය, දඬු (පොලු) පොරය, තොරතුරු ඇනීමය, මල්ලව යුද්ධය, යුද්ධය, ඇත් අස් ආදිය දැකීමය යන විකාර දර්ශනයෙහි යෙදී වාසය කරත්. මෙසේ මෙබඳු විසුලු දැක්මෙන් සම්පූර්ණයෙන් වැළකේද, මෙයද ඔහුගේ සීලයෙක් වේ,

"එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා (දූ පෝරු ආදියෙහි කෙළිම්වූ) ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටමිටි ගසා ඇත් අස් ආදී රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, නලා පිඹීමය, ක්‍රීඩා නඟුල් ගෙන සෙල්ලම් සීසෑම්ය. කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කන්නන්ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැණ කෙළීමය,

කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය ඒ ඒ දෝෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ කෙළියෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**10.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා දික්හඟලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇතිරිය, විසිතුරු එළුලොම් ඇතිරිය, එළු ලොම් සුදු ඇතිරිය, එළු ලොමින් කළ ඉදිරියට නෙරූ මල් ඇති ඇතිරිය, සිංහාදී රූපයෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති ඇතිරිය. දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය. රත්රන් නූලෙන් කළ පට ඇතිරිලිය, එක්විට නැට්ටුක්කාරියන් දහසය දෙනෙක් නටනා එළුලොමින් කළාවූ මහඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරන ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ ඇතිරිය, කෙසෙල් මුව සමින් කළ උතුම් ඇතිරිය, දෙපස තබනලද රතුපාට කොට්ට ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පාවිච්චි කෙරෙත්. මෙසේ මෙබඳුවූ උස් අසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි,

"එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ඇඟ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, මූනබලන කන්නාඩි, අඳුන් තෙල් පාවිච්චිය හා සුවඳ, මූණේ ගානා සුවඳ කුඩු, මූණේ ගානා සුවඳ ද්‍රව්‍ය, අත්වල බඳින ආභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත්රන් නූල් ආදියෙන් කුඩුම්බි බැඳීමය, විසිතුරු දඬුගෙන හැසිරීමය, බෙහෙත් නල එල්වාගෙන ඇවිදීමය, කඩු විසිතුරු කුඩ ගෙනයෑම, විසිතුරු සෙරෙප්පු හෝ සපත්තු පයලා ඇවිදීමය. නලල්පට බැඳීමය, කොණ්ඩා මාණික්‍ය පැළඳීමය, අවන් දැරීමය, දික්වූ දහවලු ඇති සුදුරෙදි ඇඳීමයයි මෙසේවූ සැරසීම් හා අඩුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳුවූ සැරසීම් අලංකාර කිරීම් ආදියෙහි යෙදීමෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

11. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය මහ ඇමතියන් පිළිබඳ කථාය, සෙනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පාන වර්ග පිළිබඳ කථාය, ඇඳුම් පිළිබඳ කථාය, ඇඳන් පිළිබඳ කථාය, මාලා පිළිබඳ කථාය, ගන්ධ ද්‍රව්‍යයන් පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, ගෑනු දරුවන් පිරිමි දරුවන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, වතුර ගෙන යන දාසීන් හෝ වතුර ගෙන යන තැන් හෝ පිළිබඳ කථාය, මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ තේරුම් නැති කථාය, ලොකය පිළිබඳ කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු පහත් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ පහත් කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

12. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි' 'ඔබ මේ ධර්ම විනය කුමකැයි දන්නෙහිද? ඔබ වරදවා පිළිපදින්නෙහිය, මම මනාකොට පිළිපදින්නේ වෙමි'. 'මාගේ වචන යහපත්ය, හෝ අර්ථ සහිතය, ඔබගේ වචන අර්ථ රහිතය' පළමු කිය යුත්ත පසුව කීයෙහිය. පසුව කිය යුත්ත පළමුව කීයෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල නිෂ්ඵල විය. ඔබට වාදාරොපනය කරණ ලදී. නින්දා කරණ ලද්දෙහිය. වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව' යන ආදී දේෂාරොපන කථාවෙහි යෙදී වෙසෙත්ද මෙසේ මෙබඳු දොෂාරොපන කථාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

13. "එසේ සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා රජුන්ගේ, රජ මහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියන්ගේ, බමුණන්ගේ, ගෘහපතියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ,

'මෙතනින් අසවල් තැනට යව අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණයව, එතැනින් අසවල් දෙය ගෙණෙව'යි දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්ද මෙබඳු දූත භාවය, හසුන් ගෙණ යෑම යන මෙයින් වළකියිද මෙයද ඔහුගේ එක් සීලයෙකි.

14. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා කුහකයෝද, සිවුපසය උදෙසා කථා කරන්නෝද, නිමිති කරන්නෝද නොහොත් ලාභ සත්කාර සඳහන් කරන්නෝද, පරලාභාදිය උදෙසා කියන්නෝද ලාභයකින් ලාභයක් සොයන්නෝද වෙත්. මෙබඳුවූ කුහක වංචා ප්‍රයෝග ආදියෙන් වළකියිද මෙයද ඔහුගේ එක් සීලයෙකි."

15. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, හෙනගැසීම ආදී මහ නිමිති බලා කියන ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන ශාස්ත්‍රය, ගිනිදෙවියා පිදීමය, දබ්බි හොමය, ථුස හොමය, තණ්ඩුල හොමය, කණ හොමය, සප්පි හොමය, තෙල හොමය, මුඛ හොමය, ලේ හොමය, ශරීර විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යා, භූත විද්‍යා, නාග විද්‍යා, විෂ විද්‍යා, ගෝනුසු විද්‍යා, මූෂික විද්‍යා, කුරුලු විද්‍යා, කපුටු විද්‍යා, ජීවිත කාලය කීම, ආයුධ වැළැක්ම, තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන පහත් විද්‍යා හේතුකොට ගෙන වැරදි ජීවිතයෙන් ජීවිකා කෙරෙත්ද මෙසේ මෙබඳු පහත් විද්‍යා හේතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ වේද මෙයද ඔහුගේ එක් සීලයෙකි.

16. "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන ලද කෑම කා මිණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ ලක්ෂණය, කඩු ලක්ෂණය, දුනු ලක්ෂණය, ආයුධ ලක්ෂණය, ස්ත්‍රීලක්ෂණය, පුරුෂලක්ෂණය, පිරිමිදරු ලක්ෂණය, ගෑණුදරු ලක්ෂණය, දාස ලක්ෂණය, දාසිලක්ෂණය, ඇත් ලක්ෂණය, අශ්ව ලක්ෂණය, කැස්බෑ ලක්ෂණය, එළු ලක්ෂණය, මීහරක් ලක්ෂණය, ගව ලක්ෂණය, ලොකු එළු ලක්ෂණය, කුකුළු ලක්ෂණය, වටු

ලක්ෂණය, තලගොයි ලක්ෂණය, කර්ණිකා ලක්ෂණය, මුව ලක්ෂණයයි. මෙබඳු පහත් විද්‍යාවන් කරණ කොට ගෙන වැරදි ජීවිකාව කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

17. "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා අසවල් දිනට රජුන්ගේ බැහැර යෑම වන්නේය. අසවල් දින ඇතුළු නුවරට එන්නේය. අසවල් දින ඇතුළු නුවර රජුන් වෙත පැමිණීම වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළු නුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ගේ ජය වන්නේය. ඇතුළු නුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේයයි කියා මෙසේ පහත් විද්‍යා හේතුකොට ලාමක ජීවිකා කෙරෙත් මෙබඳුවූ පහත් විද්‍යා හෙතුවෙන් කරණ වැරදි ජීවිතයෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙක් වේ.

18. "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා චන්ද්‍රග්‍රහණය වන්නේය. සූර්ග්‍රහණය වන්නේය, තාරකා සමාගමය වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නියම මාර්ග ගමන වන්නේය, සඳ හිරු දෙදෙනාගේ නොමග යෑම වන්නේය, තාරකාවන්ගේ මාර්ග ගමන වන්නේය, තාරකාවන්ගේ නොමග යෑම් වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම වන්නේය, පොළොව කම්පාව වන්නේය, අහස ගිගුරුම් වන්නේය, සඳ, හිරු තාරකාවන්ගේ නැගීම හා බැහීමද කෙළෙසීමද පිරිසිදු වීමද වන්නේය, චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්යග්‍රහණය මෙබඳු විපාක ඇති වන්නේය, තාරකා සමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය චන්ද්‍ර සූර්යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳු විපාක ඇති වන්නේය, ඔවුන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇති වන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන

මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ නොමග ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය, දිගුන් දැවීම මෙබඳු විපාක ඇතිවන්නේය, භූමි කම්පාව මෙබඳු විපාක ඇතිවන්නේය, අහස් ගිගුම මෙබඳු විපාක ඇති වන්නේය, සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටුවීම හා පිරිසිදු වීම මෙබඳු විපාක ඇතිවන්නේයයි' කියා මෙසේ පහත් විද්‍යා හේතුවෙන් කරණ වැරදි ජීවිකාවෙන් ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හේතු කොට ගෙණ කරණ ලාමක ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**19.** "එසේම සමහර මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා 'මනා වැසි ඇතිවන්නේය, මනා වැසි නැතිවන්නේය, යහපත් ආහාරපාන ඇතිවන්නේය, ආහාර පාන නැති වන්නේය, නිර්භය ඇතිවන්නේය, භය ඇතිවන්නේය, රොග ඇතිවන්නේය, නිරෝග බව ඇතිවන්නේයයි කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගණන්කිරීමය, කොටස්කර ගණන්කිරීමය, කාව්‍ය කිරීමය, ලෝකයට සිදුවන දේ ගැන ශාස්ත්‍ර ඉගෙණීමයයි මෙසේ පහත් විද්‍යාවන් කරණකොට වැරදි ජීවිකා කෙරෙත්ද මෙසේවූ පහත් විද්‍යා හෙතුවෙන් වන වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**20.** "එසේම, සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දුන් කෑම කා ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථාකිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, යහපත් ශ්‍රියාව ඇති කිරීමය, දුර්භගකරණය, ගර්භවිරොධි කරණය, දිව් තද කිරීමය, නූල් බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්න ඇසීමය, ගෑනුදරුවන්ගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශ්න ඇසීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන් ආරොපණය කොට ප්‍රශ්න ඇසීමය, හිරු වැඳීමය, මහබඹුට උපස්ථාන හෝ වැඳුම් කිරීමය, කටින් ගිනිදැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීමයයි

කියන මෙබඳු පහත් විද්‍යාවෙන් වැරදි ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ පහත් විජ්ජාවෙන් කරණ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්කේ නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**21.** "එසේම සමහර පින්වත් මහණ බමුණෝ ශ්‍රද්ධාවෙන් දෙන කෑම කා ශාන්ති කිරීම, කාර්යය සමෘද්ධි කටයුතු කර්මය, මන්ත්‍ර කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩක කිරීමය, ගෙවල් නොකළ බිම් ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මූන සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරේක කරවීමය, උඩු කය විරේකය, යටිකය විරේකය, හිස විරේකය, කන්තෙලය, ඇස් බෙහෙත් ගැල්වීමය, නස්‍ය කිරීමය, අඳුන් ගෑමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, ආයුධ කටු ගසා කරන වෙදකමය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකම්ය, මූලික බෙහෙත් දීමය, සැරබෙහෙත් දී පසුව එහි බල හැරීමය කියා හෝ මෙබඳු පහත් විද්‍යා කරණකොට වැරදි ජීවත්වීමෙන් ජීවිකා කෙරෙත්ද මෙබඳුවූ වැරදි ජීවිකාවෙන් සම්පූර්ණයෙන් වැළැක්මක් නම් මෙයද ඔහුගේ එක් සීලයෙකි.

**22.** "තරුණය, මෙසේ ශීල සම්පන්නවූ භික්ෂුහට භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතු කොට ගෙණ කිසිතැනකදී නොඋපදනේය, කුමක් මෙන්ද යත්:- තරුණය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, සතුරන් නැති කළාවූ ක්ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම, තරුණය, ශීලසම්පන්නවූ භික්ෂුතෙමේ භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ශීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය. ආර්යවූ (උතුම්වූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ භික්ෂුතෙම, තමන් තුළ පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. ඇවැත්නි, මෙසේ දැක්වූ සීලයෙන් යුක්තවූ භික්ෂුව සීලසම්පන්න නම් වේ.

**23.** "ඒ භාග්‍යවතුන් වහන්සේ යම් සීල සමූහයක ගුණ කියන ස්වභාව ඇතිවූයේද, යම් සීලයක මේ ජනසමූහයා යෙදෙව්වේද, තැන්පත් කරවූයේද, පිහිටුවූයේද, මේ ඒ උතුම් සීල සමූහයයි. මෙහි මෙයින් මත්තෙහි කටයුතුවූ වෙන දෙයක්ද ඇත්තේමය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, පුදුමයක් වේ. පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, ඉතා පුදුමයක් වේ, පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, ඒ මේ උතුම්වූ සීල සමූහය, සම්පූර්ණවෙයි. අසම්පූර්ණ නොවෙයි. පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, මෙසේ හාත්පසින් පිරුණාවූ උතුම්වූ සීල රාශියක් මේ බුද්ධශාසනයෙන් පිටත අන්‍යවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් අතුරෙහි මම නොදැක්කෙමි. පින්වත්, ආනන්ද තෙරුන් වහන්ස, මෙසේ සම්පූර්ණවූ උසස් සිල් සමූහයක් මේ බුද්ධ ශාසනයෙන් පිටත අන්‍යවූ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් තමන් තුළ දක්නාහු නම් ඔහු එපමණකින්ම සෑහීමට පැමිණෙයි. මෙපමණකින්ම කරණ ලද්දේය. අපට ශ්‍රමණභාවයේ අර්ථය පැමිණියේය. අප විසින් කටයුතු කිසිවක්ද නැත කියා එපමණකින්ම සතුටු සිත් ඇතිවන්නාහුය. නැවතද පින්වත් ආනන්ද තෙරුන්වහන්සේ මෙසේ කීයේය. "මෙහි මෙයින් මත්තෙහිද කටයුතුවූ අනිකෙක් ඇත්තේමය."

(පළමුවෙනි බණ වරයි.)

**24.** "පින්වත් ආනන්ද තෙරුන් වහන්ස, ඒ භවත් ගෞතමයාණන් වහන්සේ යමෙකුගේ ගුණ කියන ස්වභාව ඇත්තේද, යම් දෙයක මේ ජනසමූහයා යෙදෙව්වේද තැන්පත් කරවූයේද, පිහිටුවූයේද ඒ උතුම් සමාධි සමූහය කවරේද?"

**25.** "තරුණය, භික්ෂුව කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේද? තරුණය, මේ සස්නෙහි භික්ෂු තෙමේ, ඇසින් රූපයක් දැක එහි නොඇලේද එහි නොපෙළඹෙන්නේද ඇස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදීද, ඔහු තමාගේ ඇස් ඉන්ද්‍රියය රකී, ඇස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. කන් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී තමාගේ කන් ඉන්ද්‍රියය රකී, කන් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ නාසයට ගඳ සුවඳ දැනී එහි නොඇලේ.

එහි නොපෙළඹෙන්නේය. නාස් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආසාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ නාස් ඉන්ද්‍රියය රකී. නාස් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. දිවෙන් රසයක් විඳ එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. දිව් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ දිව් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට දැඩි ආශාව හා කලකිරීමාදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. තමාගේ ස්පර්ශ ඉන්ද්‍රියය රකී. ස්පර්ශ ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. සිතින් (ධර්මයක්) අරමුණක් දැන එහි නොඇලේ. එහි නොපෙළඹෙන්නේය. සිත් ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් නිසා දැඩි ආසාව හා කලකිරීම ආදී අකුශල ධර්මයෝ හිතට ඇතුල්වන්නාහුද, එබඳු දෙයින් වැළකීම පිණිස ඔහු පිළිපදී. හෙතෙම සිත් ඉන්ද්‍රිය රකී. සිත් ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ භික්ෂුව උතුම්වූ ශීල රාශියෙන් යුක්තවූයේ අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ අධිචිත්ත සැපය විඳියි. තරුණයා, මෙසේවූ භික්ෂු තෙමේ ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තේ වේ.

**26.** "තරුණය, භික්ෂුව කෙසේ නම් සිහියෙන් හා මනා ප්‍රඥාවෙන් යුක්තවූයේ වේද?

"තරුණය, මේ සස්නෙහි භික්ෂුතෙම ඉදිරියට යෑමෙහිද, ආපසු යෑමෙහිද, නුවණින් දැන කරන්නේය. ඉදිරි බැලීමෙහිද, වටපිට බැලීමෙහිද නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහිද, දිගු කිරීමෙහිද, මනා නුවණින් දැන එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන එසේ කරන්නේය. අනුභව

කිරීමය, පානය කිරිමය, වැළඳීමය, රස විඳීමය යන මෙහිද මනා නුවණින් යෙදී එසේ කරන්නේය. මළ මූත්‍ර පහකිරීමද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්දව සිටීම යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. තරුණය, මෙසේ කරන්නාවූ භික්ෂු තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි.

**27.** "තරුණය, භික්ෂු තෙමේ කෙසේ සතුටු වූයේ වේද?

"තරුණය, භික්ෂුතෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද, සතුටු සිත් ඇත්තේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳවූ දේ) පමණක් ගෙන යයි. තරුණය, යම් සේ පක්ෂියෙක් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, තරුණය, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය ආරක්ෂාවට ප්‍රමාණවූ සිවුරෙන්ද බඩ ආරක්ෂාවට ප්‍රමාණවූ පිණ්ඩපාත ආහාරයෙන්ද සතුටු වන්නේ වේ. ඔහු යම් තැනක යා නම් අටපිරිකර පමණක් රැගෙණ බැහැර යයි. තරුණය, මෙසේවූ භික්ෂු තෙමේ සන්තෝෂයෙන් යුක්ත වේ.

**28.** "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, මේ උතුම්වූ සන්තෝෂයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, කඳු පලාත්ද, කඳුරැලි ගල්ගුහාවන් හෝ මහා මගද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑ වාසස්ථානද, බොහෝ ඉඩකඩ ඇති තැන් සහ තණ ගුහාද යන මේ ස්ථාන ආශ්‍රය කෙරේද, ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළැක්කේ, පර්යංකය බැඳ, කකුල් අකුලුවා හිඳ ශරීරයේ උඩු කොටස කෙලින් තබා අරමුණට සිහිය එළවා හිඳී.

**29.** "ඔහු ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේද ලොභ සිත වෙන් කොට පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දුරුවූ සිත්

ඇතිව පණ ඇති සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කෙරේද, ක්‍රොධ දොෂයෙන් වෙන්ව සිත පිරිසිදු කෙරේද, කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරුකොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ පිරිසිදු හැඟීම් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේද, අලස බව දුරුකොට සිත පිරිසිදු කෙරේද, උඩඟු බව හා කුකුස දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේද, ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, සිත උඩඟු බව හා කුකුසෙන් පිරිසිදු කෙරේද, විචිකිච්ඡාව (සැකය) දුරුකොට, පහකළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි සැක නැතිව වෙසේද, විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේද,

30. "තරුණය, යම්සේ පුරුෂයෙක් ණය ගෙන කර්මාන්තයන්හි යොදන්නේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණුවන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් ආරක්ෂා කරණ පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. 'මම පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පෝෂ්‍යය කිරීම පිණිස අතිරේක මුදලක්ද මට ඇත්තේය කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

31. "තරුණය, යම්සේ රෝගයෙන් පෙළෙන දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේද, ඔහුට ආහාර රුචි නොවන්නේද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේද වෙයි. ඒ පුරුෂයා පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීර බලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳුද යත්: 'මම පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන් බව ඇති කෙනෙක් වීමි. මට බත් රුචියද නොවීය, ශරීර බලයද නැතිවිය, ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචියද ඇත්තේය. කාය බලයද තිබේය' කියායි. ඔහු ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසටද පැමිණෙන්නේය.

32. "තරුණය, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඔහු පසු කලක පීඩා නැතුව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ කෑම පිළිබඳ කිසිත් වියදමක්ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය එනම්, මම පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් පීඩා රහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ කෑම පිළිබඳ කිසි වියදමක්ද නොවූයේය' කියායි. ඔහු සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය. සතුටට පැමිණෙන්නේය.

33. "තරුණය, යම් සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත්වූ, තමා කැමති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි, වැඩකරුවෙක් (දාසයෙක්) වන්නේද, ඔහු පසු කලක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්, මම පෙර සිය කැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනෙක්මි. තමා අධිපති කොට ඇත්තෙක් වීමි. අනුන්ට යටත්නූන කෙනෙක් වීමි. අනුන්ට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමති තැනෙක යා හැක්කේද වෙමි'යි කියායි. ඔහු ඒ දාසභාවයෙන් මිදීම හෙතුකොට බලවත් සතුටක් ලබන්නේය. එසේම සතුටටද පැමිණෙන්නේය.

34. "තරුණය, යම්සේ ධනවත්වූ භොග සම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණෙන්නේද, ඔහු මද කලකින් ඒ කාන්තාර මාර්ගය ඉක්මවා යන්නේ සොර සතුරන්ගෙන් පීඩා නැති ගම්මානයකට සැපසේ ක්‍රමයෙන් පැමිණෙන්නේද, ඔහුට මෙබඳු අදහසක් ඇතිවේ. එනම්ඃ මම පෙර ධනවත් වූයෙමි. භොග සම්පත් සහිත වූයෙමි. දුර්ලභ භික්ෂා ඇති භය සහිතවූ, දීර්ඝවූ කාන්තාර මාර්ගයකට පැමිණියෙක් වූයෙමි. එසේවූ මම දැන්

එම කාන්තාර මාර්ගය පසුකෙළෙමි. සැපවත්වූ භය රහිතවූ, ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂයා ඒ කාන්තාර මාර්ගය එතර කිරීම නිමිති, කොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සතුටටද පැමිණෙන්නේය.

**35.** "මාණවකය ණය යම්සේද, රෝගය යම්සේද, හිරගේ යම්සේද, දාසභාවය යම්සේද, දීර්ඝ කාන්තාර මාර්ගය යම්සේද, එපරිද්දෙන් භික්ෂු තෙමේ පහනොකළ (පඤ්චනීවරණ) කුසල් වලක්වන කරුණු පහ තමා කෙරෙහි ලා නුවණින් දකීද මාණවකය, ණය නැති බව යම්සේද, නිරෝගි බව යම්සේද, සිරගෙන් මිදීම යම්සේද, අනුන්ට යටහත් නැති බව යම්සේද, භය නැති භූමිය යම්සේද, එපරිද්දෙන්ම මාණවකය, භික්ෂු තෙමේ පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමන් තුළ නැති බව නුවණින් දක්නේය.

**36.** "පහකළාවූ මේ කුසල් වළක්වන කරුණු පහ තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ භික්ෂුහට සතුටු ආකාරය උපදී සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසහගත සිත් ඇත්තහුගේ නාම කය (වේදනාදී ස්කන්ධ හතර) සංසිඳෙයි සංසිඳිනු කය ඇති තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) පැමිණෙයි.

**37.** "ඒ භික්ෂු තෙමේ වස්තුකාම ක්ලෙශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන්ද වෙන් වූයේම අරමුණෙහි සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම සහිතවූ, සිතෙහි විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති, පළමුවෙනි ධ්‍යාන කුසල චිත්තය තමා තුළ ඉපදවීම් වශයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරෙයි. ඔහු විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් යම් (සකල) ශරීරයම සැපවත් කෙරෙයි. සම්පූර්ණයෙන් පුරවයි. සැමතන්හි පතුරුවයි. ඒ ඔහුගේ පළමුවෙනි විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන් සකල ශරීරයෙහිම පළමුවෙනි ධ්‍යානයෙන් යුත් සැපය පැතිරෙයි.

**38.** "තරුණය, යම්සේ දක්ෂවූ ස්නාන ද්‍රව්‍ය සපයන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ ස්නානයට ගන්නාවූ සුණු ලොහ

තලියක බහා දිය ඉසිමින් අතින් අනමින් පිඩු කරන්නේද, එවිට ඒ මේ ස්නාන කුඩු ගුලිය දියෙන් යුක්ත වේ, ජලය හාත්පසින් කාවැදුනේ වේ. එහි ඇතුළත හා පිටතද සියලු තන්හිම ජලයෙන් පහස්නා ලද්දේ වේ. එහෙත් බින්දු වශයෙන් ජලය ඉන් නොවැගිරේද.

"තරුණය, එපරිද්දෙන් ඒ භික්ෂු තෙමේ, විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි. හාත්පසින් තෙමයි සම්පූර්ණයෙන් පුරවයි, සැමතන්හි පතුරුවයි. ඔහුගේ සියලු ශරීරයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් පැතිරෙයි. මෙයද ඒ භික්ෂුගේ සමාධිය වෙයි.

**39.** "තරුණය, නැවතද භික්ෂුතෙමේ අරමුණෙහි සිත පැමිණවීම, අරමුණෙහි නැවත නැවත යෙදී හැසිරීම යන මොවුන්ගේ සන්සිඳීමෙන් අද්ධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති දෙවැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කරයි. ඒ මහණ තෙමේ මේ කය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි. හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කරයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි දෙවැනි ධ්‍යානයෙන් සැප පැතිරේ.

**40.** "තරුණය, යම්සේ ඇතුළතම හටගත් ජලය ඇති දියවිලක් වේද ඒ විල පිළිබඳ පෙර දිගින්ද, අපර දිගින්ද, උතුරු දිගින්ද, දකුණු දිගින්ද, දිය එන මගක් නැත්තේ වේද වැස්සද කලින් කල මනාසේ වැසි වැසීම් නොකරන්නේද, එසේවූ ඒ විලෙන් සිහිල් දිය දහර පොළොව බිඳ නැගී ඒ මුළු විලම සිහිල් දියෙන් පතුරුවයි, හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි. එහි හැම තැන දියෙන් ස්පර්ශ කෙරෙයි. ඒ සියලු විලෙහි සීත ජලය නොපැතිර පවත්නා තැනක් නම් නැත්තේය. බමුණ, එපරිද්දෙන් මේ භික්ෂු තෙමේ මේ මුළු ශරීරයම සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් සියලු තැන පතුරුවන ලද්දක් කෙරේ, ප්‍රීති සැපයෙන් හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, ඉන් සැමතැනම ස්පර්ශ කෙරෙයි ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි දෙවෙනි ධ්‍යාන සැපයෙන් පැතිරෙයි. මෙයද භික්ෂුවගේ සමාධියකි.

**41.** "නැවතද තරුණය, ඒ භික්ෂු තෙමේ ප්‍රීතියෙහි නො ඇල්මෙන් මැදහත් බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (උපේක්ෂා) සැප දුක් දෙකට මැදහත් විඳීම ඇත්තේ, සිහි ඇත්තේය. සැපයෙන් විසීම ඇත්තේයයි ආර්‍යයෝ කියත්ද ඒ තුන්වැනි ධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ භික්ෂු තෙමේ මේ සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේද ඒ සැපතින් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි. එයින් සැමතැනම පැතිරෙයි. ඒ භික්ෂුහුගේ සියලු ශරීරයෙහි තුන්වැනි ධ්‍යාන සැපයෙන් පැතිරෙයි.

**42.** "තරුණය, යම්සේ නිල්මානෙල් විලක හෝ සුදු නෙළුම් විලක හෝ රතු නෙළුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුනු දියෙන් උඩට නොනැගුනු, දියතුලම ගැලී වැඩෙන්නාවූ සමහර නිල් මානෙල් හෝ සමහර සුදු නෙළුම් හෝ සමහර රත් නෙළුම් හෝ වේද්ද, ඒ නිල් මානෙල් ආදීහු අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, සම්පූර්ණයෙන් වැගුරුණාහු, හාත්පසින් ස්පර්ශ ලද්දාහු වෙත්ද, ඒ නිල්මානෙල් සුදු නෙළුම් රත් නෙළුම්, යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් නොපහස්නා ලද්දේ නොවේද තරුණය, එපරිද්දෙන් ඒ භික්ෂු තෙමේ මේ මුළු ශරීරයම දුරුකළ ප්‍රීතිය ඇති සැපයෙන් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරෙයි, ඉන් හාත්පසින් තෙමෙයි. සම්පූර්ණයෙන් පුරවයි. හාත්පසින් ස්පර්ශ කෙරෙයි. ඔහුගේ සම්පූර්ණ ශරීරයෙහි ප්‍රීතිනැති තුන්වැනි ධ්‍යානයෙන් පැතිරයයි.

තරුණය, මෙයද ඒ භික්ෂුවගේ සමාධියකි.

**43.** "නැවතද තරුණය, ඒ මහණ තෙමේ සැප දුරුකිරීමෙන්ද, දුක් දුරු කිරීමෙන්ද, පළමුකොටම සැපදුක් වේදනා නැතිව යාමෙන් දුක්ද නොවූ, සැපද නොවූ, උපෙක්ඛා-සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, හතරවෙනි ධ්‍යාන (කුසල) චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම, පිරිසිදුවූ, අතිශයින් බබලන (ධ්‍යාන) සිතින්

පතුරුවන්නේය. ඒ ධ්‍යානලාභී භික්ෂූන්ගේ සම්පූර්ණ ශරීරයෙහි පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ හතරවැනි ධ්‍යාන සිතින් පැතිර යයි.

**44.** "තරුණය, යම්සේ කිසියම් පුරුෂයෙක් පිරිසිදුවූ සුදු ඇඳුමකින් හිස සිට පොරවා උන්නේ වේද, ඔහුගේ මුලු ශරීරයෙහි එකම තැනකුදු සුදුවතින් නොවසන ලද්දේ නොවේ. බමුණ, එපරිද්දෙන්ම ධ්‍යානලාභී භික්ෂු තෙමේ මේ සියලු ශරීරයම පිරිසිදුවූ, අතිශයින්ම බබලන්නාවූ හතර වැනි ධ්‍යාන සිතින් පතුරුවා හුන්නේ වේ. ඒ භික්ෂුහුගේ සියලු ශරීරයෙහි පිරිසිදුවූ, බබලන්නාවූ හතර වැනි ධ්‍යාන සිතින් පැතිරයයි.

තරුණය, මෙයද ඒ භික්ෂුවගේ සමාධියකි.

**45.** "තරුණය, භාග්‍යවතුන් වහන්සේ යම් සමාධි සමූහයක ගුණ කියනසේක්ද මේ වනාහි ඒ සමාධි සමූහයයි. මෙහි මේ ජනසමූහයා යෙදවූසේක, තැන්පත් කරවූසේක. මෙහි මෙයින් මත්තෙහි කටයුතු අනිකක්ද ඇත්තේය. පින්වත් ආනන්ද තෙරුන් වහන්ස, පුදුමයක්වේ. පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, ඉතා පුදුමයක්වේ. පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, මේ උතුම් සමාධි සමූහය සම්පූර්ණ වෙයි. අසම්පූර්ණ නොවෙයි. පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, මෙසේ හාත්පසින් පිරුණාවූ උතුම්වූ සමාධි සමූහයක් මේ බුද්ධ ශාසනයෙන් පිටත අන්‍යවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් අතුරෙහි මම නොදැක්කෙමි. පින්වත් ආනන්ද තෙරුන් වහන්ස, මෙසේ සම්පූර්ණවූ උසස් සමාධි සමූහයක් මේ බුද්ධ ශාසනයෙන් පිටත අන්‍යවූ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් තමන් තුළ දක්නාහු නම් ඔහු එපමණකින්ම සෑහීමට පත්වෙයි. මෙපමණකින්ම කරන ලද්දේය. අපට ශ්‍රමණ භාවයේ අර්ථය පැමිණියේය. අප විසින් කටයුතු කිසිවක් නැත කියා එපමණකින්ම සතුටු සිත් ඇති වන්නාහුය. එසේ තිබියදීත් ආනන්ද තෙරුන්වහන්සේ මෙහි මෙයින් මත්තෙහි කටයුතු අනිකක් ඇත්තේයයිද කියත්. පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම් ප්‍රඥා සමූහයක ගුණකියනසේක්ද මේ ජනසමූහයා පිහිටුවනසේක්ද තැන්පත් කරනසේක්ද ඒ උතුම්වූ ප්‍රඥා සමූහය කවරේද?

**46.** "නැවතද, තරුණය, ඒ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි. ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඔහු මෙසේ දැනගණී, 'මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තය. සතර මහාභූතයන්ගේ හේතුවෙන් හටගත්තේය. මවුපියන් නිසා හටගත්තේය. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඇඟ ඉලීමය, පිරිමැදීමය, බිඳීමය. විනාශය යන මේ දේ ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඤ්ඤාණය ශරීරය ආශ්‍රය කෙරේ මෙහිම බැඳුනේ වෙයි' කියායි.

**47.** "තරුණය, යම්සේ යහපත්වූ, පිරිසිදු ආකරයෙන් උපන්නාවූ අටැස්වූ, ගල් ආදී දොස් බැහැර කිරීමෙන් හොඳ ලෙස සකස් කරණ ලද්දාවූ, නිර්මලවූ, විශෙෂයෙන් ප්‍රසන්නවූ, කැලැල් නැතිවූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෛඩූර්ය මැණිකක් වේද, එහි නිල්වූ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේද, ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේය. මේ වෛඩූර්ය මැණික මනාසේ කාන්තිමත් හෙයින් යහපත් වේ. පිරිසිදු ආකාරයෙන් උපන්නේය. අටැස් ඇත්තේය. දොස් දුරුකිරීමෙන් මනාකොට සකස් කරන ලද්දේය. නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, කැලැල් නැත, සියලු ආකාරයෙන් සම්පූර්ණය, ඒ මැණිකෙහි මේ නීලවර්ණ හෝ කහපාටවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූලක් අමුණන ලද්දේය කියායි.

"තරුණය, එපරිද්දෙන්ම යෝගීවූ මේ භික්ෂු තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශයන් ඇතිවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස සිත එලවා තබයි. ඒ සඳහා විශේෂයෙන් සිත නමයි. ඒ භික්ෂු තෙමේ මෙසේ දන්නේය.

කෙසේදයත්, මාගේ මේ ශරීරය වනාහි රූපයෙන් යුක්තවේ සතර මහාභූතයන්ගෙන් හටගත්තේය. මවුපියන් නිසා හටගත්තේය. ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඥ්ඥාණය මේ ශරීරය ආශ්‍රය කෙළේ වෙයි. මෙහිම බැඳී සිටියේය' කියායි.

මෙයද ඒ භික්ෂුවගේ එක් ප්‍රඥාවකි.

**48.** "ඔහු මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ රූපයක් මනා කොට නිපදවීම පිණිස සිත එලවා තබයි, වෙසෙසින් නමයි. ඔහු ආකාර වත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවනලද) ශරීරය හා අත පය ආදී අවයව ඇති, විකලනුවූ ඉඳුරන් ඇති, මේ ශරීරයෙන් අන්‍යවූ ශරීරයක් හොඳ ලෙස සාදයි,

**49.** "තරුණය, යම්සේ පුරුෂයෙක් මුදු තණ ගසින් තණබඩය උදුරා ගැනීම කරන්නේද, මේ තණ ගසය, මේ තණ බඩය, තණගස අනිකෙක, තණබඩය අනිකෙක තණ ගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය, තනන ලද්දේය යන වැටහීම ඔහට පහළ වන්නේය.

"තරුණය, යම්සේ පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේද ඔහුට මෙබඳු අදහසක් වන්නේය. මේ කඩුවය මේ කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන් කඩුව ඉවත් කරණ ලද්දේය' කියායි.

"තරුණය, යම් පුරුෂයෙක් සර්පයෙකු සැවයෙන් පහ කරන්නේද ඔහට මේ සර්පයාය, මේ සැවය, සර්පයා එකෙකි. සැවය අනිකකි, සැවයෙන් සර්පයා වෙන්කරන ලද්දේයයි වැටහීමක් ඇතිවන්නේය.

"තරුණය, එසේම භික්ෂුතෙමේ මෙසේ සිත සමාධිගතවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ

කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සිතින් උපදවන කය මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. ඔහු මේ කයින් රූ ඇති, සිතින් මවනලද, සියලු ශරීරය සහ අතපය ආදී අවයව ඇති, නොපිරිහුනු ඉන්ද්‍රිය ඇති වෙන කයක් මවයි.

තරුණය, මෙයද භික්ෂුවගේ ප්‍රඥාවකි.

**50.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි නැවතීමට පැමිණි කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට දක්වයි. එකෙක්ව බොහෝ සේ වෙයි. බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය හරහට, පවුර හරහට පර්වතය හරහට නොහැපෙමින් යයි දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, මඹ ලොව තෙක් ශරීරයෙන් වසඟ බව පවත්වයි.

**51.** "මාණවකය, දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරු අතවැසියෙක් හෝ යහපත්සේ පදම් කළ මැටියෙන් කැමති කැමති වලන් ආදී වර්ගයන් යම්සේ කරන්නේද, නිපදවන්නේද, තරුණය, දළ කැටයම් කරුවෙක් හෝ අතවැසියෙක් හෝ සකස් කළ දළයෙහි යම්සේ කැමති කැමති දළ කැටයම් වර්ගයක් කරන්නේද, නිපදවන්නේද, තරුණය, දක්ෂ රන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ පදම්කළ රණින් කැමති කැමති රන් අබරණ ජාතීන් යම්සේ කරන්නේද, නිපදවන්නේද-තරුණය, එසේම භික්ෂුව සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහවූ කල්හි, මෘදුවූ

කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් ඍද්ධි විධි වෙන් වෙන් කොට දක්වයි. එකෙක්ව බොහෝ සේ වෙයි, බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට අහසෙයි මෙන් බිත්තිය හරහට, පවුර හරහට, පර්වත හරහට නොහැපෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම්, මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කරයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් හිඳගෙනම යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් ශරීරයෙන් වසඟ බව කෙරෙයි. මෙයද ඔහුගේ ප්‍රඥාවකි.

**52.** ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, දිව්‍ය කණ සම්බන්ධ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඒ භික්ෂුව පිරිසිදුවූ මිනිස් බව ඉක්මවූ දිව්‍යමය කණ සම්බන්ධ ඥාණයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද, සමීපයෙහිවූද, දෙයාකාර ශබ්දයන් අසයි.

**53.** "මාණවකය, දික් මගට පැමිණි පුරුෂයෙක් බෙර හඬද මිහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද, යම්සේ අසාද, ඔහුට මේ බෙරහඬ යයිද, මිහිඟු බෙරහඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬයයිද සිතෙන්නේය. තරුණය, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශ පහවූ ක්ලේශයන් ඇති කල්හි, මෘදුවූ කල්හි, ස්ථිර බවට පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, දිව්‍ය කණෙන් ලබන ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු මෙසේ පිරිසිදුවූ මිනිස් කණ ඉක්මවූ දිව්‍ය කණ සම්බන්ධ ඥානයෙන් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද දුරෙහිවූද, සමීපයෙහි වූද, දෙයාකාර ශබ්දයන් අසයි. මෙයද ඔහුගේ ප්‍රඥාවකි.

54. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, පහවූ ක්ලෙශ ඇති කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුවූ කල්හි, ස්ථිර බවට පැමිණි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පර සිත් දැනගන්නා ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තම සිතින් පිරිසිඳ දනියි. රාග සහිත සිත රාග සිතයයි දනියි. රාගය පහවූ සිත රාගයෙන් තොරවූ සිතයි දනියි. ද්වෙෂ සහිත සිත දොස සිතයයි දනියි ද්වෙෂය පහවූ සිත ද්වෙෂයෙන් තොරවූ සිතයයි දනියි. මොහ සහිත සිත මොහ සිතයයි දනියි, මොහය පහවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුනු සිත හැකුලුනු සිතයයි දනියි, විසුරුණු සිත විසුරුණු සිතයයි දනියි, මහත් බවට ගිය සිත, මහත් බවට ගිය සිතයයි දනියි. මහත් බවට නොගිය සිත, මහත් බවට නොගිය සිතයයි දනියි. කාම සහිත සිත, කාම සිතයයි දනියි. ලෞකික හිත් අතුරෙන් උසස්ම සිත අනුත්තර සිතයයි දනියි. සමාධිගතවූ සිත සමාධිගත සිතයයි දනියි, සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දනියි, (ක්ලෙශයෙන්) මිදුනු සිත, මිදුනු සිතයයි දනියි. නොමිදුනු සිත නොමිදුනු සිතයයි දනියි.

55. "තරුණය, සැරසෙන ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළමා වයසෙහි සිටියෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු, නොකිළිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය භාජනයෙක්හි හෝ තමාගේ මූනේ ශොභාව පරීක්ෂා කරන්නේ යම්සේ කැලල් සහිත නම් කැලල් සහිතයයි දැනගනීද කැලල් රහිත නම් කැලල් රහිතයයි දැනගනීද,

"තරුණය, එසේම භික්ෂුතෙම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පරසිත් දැනගන්නා ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු අන්‍ය සත්වයන්ගේ, අන්‍ය

පුද්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් දැන ගනියි. රාග සිත රාගසිතයයි දනියි. රාගයෙන් තොරවූ සිත රාගයෙන් තොරවූ සිතයයි දනියි. දොස සිත දොස සිතයයි දනියි. දොසයෙන් තොරවූ සිත දොසයෙන් තොරවූ සිතයයි දනියි. මොහසිත මොහ සිතයයි දනියි, මොහයෙන් තොරවූ සිත මොහයෙන් තොරවූ සිතයයි දනියි. හැකුලුණු සිත හෝ විසුරුණු සිත හෝ මහත් බවට ගිය සිත හෝ මහත් බවට නොගිය සිත හෝ කාම සහිත සිත හෝ අනුත්තර සිත හෝ එකඟවූ සිත හෝ එකඟ නොවූසිත හෝ දනියි. මිදුණු සිත හෝ මිදුණු සිතයයි දනියි. නොමිදුණු සිත හෝ නොමිදුණු සිතයයි දනියි.

තරුණය, මෙයද ඔහුගේ ප්‍රඥාවකි.

58. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙෂයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ, කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහි කිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේද යත් එක් ජාතියක්ද, දෙ ජාතියක්ද, තුන් ජාතියක්ද, හතර ජාතියක්ද, පස් ජාතියක්ද, දස ජාතියක්ද, විසි ජාතියක්ද, තිස් ජාතියක්ද, සතළිස් ජාතියක්ද, පණස් ජාතියක්ද, සියක් ජාතියක්ද, දහස් ජාතියක්ද, සියක් දහස් ජාතියක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි, අසුවල් තැන උපන්නෙමි, එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුත වූයෙමි, මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් විදියේ පෙර ජීවිත සිහි කෙරෙයි.

57. "තරුණය, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් තමන්ගේ ගමට එන්නේද, 'මම, සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ ගමිනිදු අසවල් ගමට ගියෙමි, එහිද මෙසේ සිටියෙමි. මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට පැමිණියෙමි'යි හෙතෙම දන්නේය.

"තරුණය, එපරිද්දෙන්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහි කිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේද යත්. එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද, නොයෙක් කල්ප විස්සකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්ප රාශියකින් යුත් කල්පයන්ද, නොයෙක් කල්පයන්ද, 'අසුවල් තැන වීමි. මෙබඳු නම් ඇත්තෙම්, මෙබඳු ගොත්‍ර ඇත්තෙම්, මෙබඳු පාට ඇත්තෙම්, මෙබඳු ආහාර ඇත්තෙම්, මෙබඳු සැප දුක් වින්දෙම්, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිත (පෙරවිසූ පිළිවෙළ) දැක්වීම් සහිත, නොයෙක් ආකාරවූ පෙර විසීම් සිහි කෙරෙයි.

මාණවකය, මෙයද ඔහුගේ ප්‍රඥාවකි.

58. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සත්වයන්ගේ මරණින් පසු උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත්

කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ පිරිසුදුවූ, මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී, පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොව ගියාවූද නරකලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී. 'මේ පින්වත් සත්ත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය වචන දුශ්චරිතයෙන් යුක්තය, හිතේ දුශ්චරිතයෙන් යුක්තය. උත්තමයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය. මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ, නිරයට පැමිණෙත්. නැතහොත්, මේ පින්වත් සත්ත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබණින්නෝය, සත්‍යය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. මරණින් මතු යහපත් පැමිණීමවූ, ස්වර්ග ලොකයට පැමිණියෝය'යි මෙසේ පිරිසුදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද, හොඳ ලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

**59.** "මාණවකය, යම්සේ පාරේ හන්දියක ප්‍රාසාදයක් වේද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට ඇතුල්වෙන, ගෙයින් නික්මෙන, වීථියෙහි හැසිරෙණ පාර හන්දියේ හිඳින මනුෂ්‍යයන් දක්නේද, ඔහුට මෙසේ සිතෙයි, 'මේ මිනිස්සු ගෙට ඇතුළු වෙති. මොහු නික්මෙති. මොහු වීථියෙහි හැසිරෙති, මොහු පාර හන්දියේ ඉඳිති'යි කියායි. තරුණය, එසේම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, සත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, සිත ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී, මේ පින්වත්

සත්වයෝ ශරීර දුශ්චරිතයෙන් යුක්තය, වචන දුශ්චරිතයෙන් යුක්තය, හිතේ දුශ්චරිතයෙන් යුක්තය, උත්තමයින්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු ශරීරයෙන් වෙන්ව, මරණින් මතු අපායවූ දුර්ගතියවූ, දුකවූ, නිරයට පැමිණෙත්.' නැතහොත්, මේ පින්වත් සත්වයෝ ශරීර සුචරිතයෙන් යුක්තය, වචන සුචරිතයෙන් යුක්තය, හිතේ සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබණින්නෝය. සත්‍යය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. ශරීරයෙන් වෙන්ව මරණින් මතු සුගතියවූ, ස්වර්ග ලෝකයට පැමිණියෝ'යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද සුගතියට පැමිණියාවූද දුර්ගතියට පැමිණියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී. මෙයද ඔහුගේ ප්‍රඥාවකි.

**60.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදු කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන භාවයට පැමිණි කල්හි සිතේ පැසවන කෙලෙස් පහකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයි තතුලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී, මේ පැසවන කෙලෙස්යයි තතු ලෙස දැනගණී, මේ පැසවන ක්ලේශයන්ගේ හේතුයයි තතු ලෙස දැනගණී, මේ ඒ කෙලෙස් නැතිකිරීම යයිතතු ලෙස දැනගණී, මේ ඒ කෙළෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ, සංසාරයට (භවයට) ඇති ආශාවන් කෙරෙන්ද සිත මිදේ, දැඩි මෝහය කෙරෙන්ද සිත මිදේ මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැතිවිය උතුම් හැසිරීමෙහි වසන ලදී. කටයුත්ත කරනලදී, මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැ'යිද දැනගණී,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**61.** "මාණවකය, යම්සේ පර්වත මුදුනක පිරිසිදු, සිත් සතුටු කරන නොකැළඹුනු, දිය විලක් වේද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ නැවතී තිබෙන්නාවූ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන්ද, කැබලිති කැටද, එහා මෙහා යන්නාවූ මසුන් රැන්ද, දක්නේද, ඔහුට මෙසේ සිතෙන්නේය, 'මේ දියවිල පිරිසිදුය මනා සිත් ප්‍රිය කරන්නේය, නොකැළඹුණේය. එහි මේ සිප්පි බෙල්ලන් සක් බෙල්ලන්ද, කැටකැබලිතිද නැවතී තිබේ. මසුන් රැන් හැසිරෙත්ය කියායි බ්‍රාහ්මණය, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන භාවයට පැමිණි කල්හි, බොහෝ කල් සිට එන ක්ලෙශයන් නැතිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයිතතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක්නැතිකිරීමේ මාර්ගයයි තතුලෙස දැනගණී. මේ කෙලෙස් යයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් හේතුයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ. භවයට ඇති ආශාවන් කෙරෙන්ද මිදේ, මෝහය කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැතිවිය, උතුම් හැසිරීමෙහි වසනලදී, කටයුත්ත කරනලදී. මේ ආත්ම භාවයෙන් පසු අනික් ආත්ම භාවයක් නැතැයිද දැනගණී.

"මාණවකය, යම් හෙයකින් භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදු කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, බොහෝ කල් සිට එන ක්ලෙශයන් නැති කිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි. ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගණී. මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස

දැනගණී, මේ දුක් නැතිකිරීමයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස්යයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් හේතුයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැති කිරීමයයි තතු ලෙස දැනගණී. මේ කෙලෙස් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශාවන් කෙරෙන්ද මිදේ. භවයට ඇති ආශාවන් කෙරෙන්ද මිදේ. මෝහය කෙරෙන්ද සිත මිදේ මිදුනු කල්හි මිදුනේය. යන සිත වෙයි. ඉපදීම නැතිවිය. උතුම් හැසිරීමෙහි වසනලදී. කටයුත්ත කරණලදී, මෙයින් පසු මේ ආත්මභාවය පිණිස කටයුතු අනිකක් නැතැයි දැනගණී, තරුණය, මෙයද ඔහුගේ ප්‍රඥාවකි.

**62.** තරුණය, ඒ භාග්‍යවතුන්වහන්සේ යම් ප්‍රඥාවකගේ ගුණ කියන ස්වභාව ඇත්තේද, තරුණය, ඒ මේ උතුම්වූ ප්‍රඥාරාශිය වෙයි මෙහිද මේ ජනසමූහයා යෙදවූයේය. තැන්පත් කරවූයේය, පිහිටුවූයේය මෙහි මෙයින් මත්තෙහි කටයුතුවූ අන් දෙයක් නැත්තේය’යි කීයේය.

“පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, පුදුමයි, පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, ඉතා පුදුමයි. පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, උතුම්වූ ප්‍රඥා රාශිය සම්පූර්ණවූයේ වෙයි. අසම්පූර්ණ වූයේ නොවෙයි. පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, මෙසේ හාත්පසින් පිරුණාවූද උතුම්වූ ප්‍රඥා රාශියක් මේ බුද්ධ ශාසනයෙන් පිටත අන්‍යවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් තුළ මම නොදැක්කෙමි. මෙහි මෙයින් මත්තෙහි කටයුතුවූ අන් දෙයක්ද නැත්තේමැයි, පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, ධර්මදේශනාව ඉතා යහපත්ය, පින්වත් ආනන්ද තෙරුන්වහන්ස ධර්මදේශනාව ඉතා යහපත්ය, පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේ හෝ යම්සේද වසන ලද්දක් එලිදරව් කරන්නේ හෝ යම්සේද, මංමුළාවූවෙකුට මග කියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එයාකාරම පින්වත් ආනන්ද තෙරුන්වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශකරණ ලද්දේය.”

පටුන



"පින්වත් ආනන්ද තෙරුන්වහන්ස, මේ මම භාග්‍යවත් ගෞතමයාණන් වහන්සේද, ධර්මයද, භික්ෂු සංඝයාද, සරණ කොට යෙමි. පින්වත් ආනන්ද තෙරුන්වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණගිය උපාසකයෙකැයි මා දරාගන්නා සේක්වා"යි තොදෙය්‍යපුත්‍රවූ ශුභ නම් මාණවකයා කීයේයි.

**(දසවෙනිවූ ශුභ සූත්‍රය නිමියේයි)**